ෂර්ලොක් හෝම්ස්ගේ රහසිගත ලිපිගොනු

# "පුද්ගලිකයි රහසිගතයි"



# THE SECRET FILES OF SHERLOCK HOLMES

චන්දන මෙන්ඩිස්

THE SECRET FILES OF SHERLOCK HOLMES

# පුද්ගලිකයි!
# රහසිගතයි!

## PRIVATE & CONFIDENTIAL !



Reading Purpose Only.. Not For Print.
www.sinhalalibrary.com
http://sherlockholmesinvestigations.blogspot.com

THE SECRET FILES OF SHERLOCK HOLMES

PRIVATE & CONFIDENTIAL

# පුද්ගලිකයි! රහසිගතයි!

අසංක්ෂිප්ත පරිවර්තනය
**චන්දන මෙන්ඩිස්**

ප්‍රකාශක
**චන්දන මෙන්ඩිස්**
141/2, දූව පාර,
බද්දගාන, කෝට්ටේ

Reading Purpose Only.. Not For Print.
www.sinhalaelibrary.com
http://sherlockholmesinvestigations.blogspot.com

## පටුන

1. පැටළුණු ගැටලුව 09
2. වෙස් මුහුණ 64
3. ප්‍රංශ වීණාවාදකයා 96
4. උගා දූපතේ කළු අවතාරය 125
5. වීඩාපත් කපිතාන්වරයාගේ කථාව 161
6. ඇඟිලි හයේ අත 189
7. අතිවිශේෂ දුම්රියේ අභිරහස 238

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.

**මෙම ග්‍රන්ථයේ අඩංගුවන්නේ**
**පහත සඳහන් කථාන්තර වල සිංහල පරිවර්තනය.**

1. The Adventure of the Tangled Skein
2. The Adventure of the Devil's Mask
3. The Adventure of the French Violinist
4. The Singular Adventure of the Grice Pattersons in the Island of Uffa
5. The Adventure of the Tired Captain
6. The Adventure of the Purple Hand
7. The Adventure of the Missing Special Train.



www.sinhalaelibrary.com

Reading Purpose Only. Not For Print.

## පෙරවදන

අවුරුද්දක නිහඬියාවකින් පසු අලුත් පොත් දෙකක් ෂර්ලොක් හෝම්ස් පාඨකයන් වෙත ගෙන ඒමට හැකිවීම සතුටට කරුණකි. "ඔබෙන් සමුගනිමි" පොතේ දී සමුගත් ෂර්ලොක් හෝම්ස් ආපසු ආවේ කෙසේදැයි මගේ හිතවත් පාඨකයෝ බොහෝ දෙනෙක් විමසා එවූහ; විමසා එවති; අනාගතයේදීත් විමසා එවනු නො අනුමානය.

ඔබ හැමදෙනාටම මා දෙන පිළිතුර කොටස් දෙකකින් යුක්තය.

i. කරුණාකර "ෂර්ලොක් හෝම්ස් ආපසු එයි" පොතේ ප්‍රස්තාවනාව කියවන්න. එවිට ඔබට ප්‍රමාණවත් පිළිතුරක් ලැබේවි.

ii. කරුණාකර "බිහිසුණු නිම්නය" පොතේ 220 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට කියවන්න. ඔබගේ පහසුව සඳහා මම එය උපුටා දක්වන්නෙමි.

".... යාළුවා. ඒව ගැන විස්තර ඔහේ නොදන්න තරමට හොඳයි! එතකොට ඔහේගේ හිතත් සැහැල්ලුයි. හොඳට නින්දත් යාවි. ප්‍රශ්න අහන්න එපා!...."

චන්දන මෙන්ඩිස්

15. 09. 2003 දින
141/2 දූව පාර,
බැද්දගාන,
කෝට්ටෙදිය.





Reading Purpose Only.. Not For Print.
www.sinhalaelibrary.com

# පැටළුණු ගැටලුව

1898 වසර මගේ මිත්‍රයාට කාර්යබහුල කාලයක් වූ බැව්, මගේ සටහන් පොතේ සඳහන්ව ඇත. ඒ නොවැම්බර් මාසයේ බ්‍රහස්පතින්දා දවසක උදෑසනකි. හෝම්ස් එදා උදෑසනම අවදිවී අමුත්තෙකු පිළිගැනීමට මෙන් සූදානම් වන අයුරු දැක, මම තරමක් පුදුමයට පත්වීමි. මා උදේ තේ පානයට සැරසෙද්දී, හෝම්ස් රැවුල බා, හොඳින් නාපැළඳ ගෙන ද අවසන්ය.

"හෝම්ස්" මම කීවෙමි. "අද ඔබ හමුවෙන්න අනුග්‍රාහකයෙක් එනවා වගෙයි?"

"ඔව්."

"ඔබ හමුවීමට එන්නේ කාන්තාවක් බවත්, ඇය බොහොම ධනවත් තැනැත්තියක බවත් මට නිගමනය කළ හැකියි" මම කීවෙමි.

"විශිෂ්ටයි වොට්සන්" මගේ මිතුරා කීවේ සතුටෙන් සිනහවෙමිනි. "මගේ ක්‍රම අනුගමනය කරන්න, ඔබත් දැන් පුහුණු වෙලා එහෙනම්. ඔබ ඒ නිගමනයන්ට ආවෙ කොහොමද කියලා මං ඇහුවොත්?"

"ඔව් මිත්‍රයා, මං කියන්නම්" මම පිළිතුරු දුනිමි. "ඔබේ අනුග්‍රාහකයා පිරිමියෙක් වුණා නම්, ඔහු හමුවෙන්න, ඔබ ඔයතරම් මහන්සිවෙලා විශේෂ සූදානමක් වෙන්නෙ නෑ. බොහොම වෙලාවට ඔබේ සුපුරුදු දම්පැහැති පරණ පිටකබායෙන්ම සැරසෙනවා. ඒ මිසක් අල්මාරියෙන් අලුත් කබායක් එළියට ගන්න හිතන්නෙ නෑ."

"එතකොට ඇය බොහොම ධනවත් තැනැත්තියක් කියලා නිගමනය කළේ?"

"ගිනිලදුන් පඩිය මත තිබෙන, මිලෙන් වැඩි රෝස පැහැති ලියුම් කවරය මං දුටුවා. මේ වර්ගයේ ලියුම් කවර දුසිමක් පැන්ස හයයි. මෙක සාමාන්‍ය අය පාවිච්චි කරන වර්ගයේ කවරයක් නෙමෙයි. මෙක ඊයේ තැපෑලෙන් ආවෙත් නෑ. එහෙනම් නිසැකවම මෙක අද

උදේ සාන්දරම විශේෂ පනිවුඩ කරුවෙකු අතේ ඔබ වෙත එවන්න ඇති. උප්පන් කාන්තාවක් නම්, තමාම ඇවිත් ඔබව හමුවෙනවා මිස, මුදල් ගෙවා ඒකට විශේෂ පනිවුඩකරුවෙකු එවන්නෙ නැහැ. ඒ අනුව මං නිගමනය කළා ඔබේ අනුග්‍රාහිකාව ධනවත් තැනැත්තියක් කියලා."

"අනිවාර්යයි වොට්සන්" මගේ මිතුරා කීවේ ඉමහත් උද්යෝගයෙනි. "ඇය ඒමට නියමිත උදේ 9.30ට. ඇය පැමිණෙන්නෙ කුමක් සම්බන්ධයෙන්ද කියල අපට හිතාගන්න පුළුවනි. ඒ මොකද ඇයට අදාළ සිද්ධිය අද හැම පුවත්පතකම පළවී තියෙනවා. ඒවල තියෙන්නේ කෙටි විස්තර පමණයි. සම්පූර්ණ තොරතුරු අපි ඇයගෙන්ම අසා දැනගමු."

මම මේසය උඩ තිබූ "මෝනිං ක්‍රොනිකල්" පුවත්පත අතට ගතිමි. ප්‍රධාන පුවත ලෙස එහි පළවී තිබුණේ ඇය අදාළ කරුණ බව හෝම්ස් පැවසුවේය.

## කෝටිපති ව්‍යාපාරිකයා අභිරහස් ලෙස අතුරුදන්වෙයි!

ඕස්ට්‍රේලියානු ජාතික කෝටිපති ව්‍යාපාරිකයෙකු වූ කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් අභිරහස් ලෙස අතුරුදන්වී ඇති බව වාර්තා වේ. ඔහු විවාහ ගිවිසගෙන සිටියේ පැට්‍රීෂියා බැරිංටන් මෙනෙවිය සමගය. ඇය සමග ගිය සිකුරාදා රාත්‍රියේ මංගල සාදයකට සහභාගි වූ කපිතාන් මිලර්, ඇය නිවසට යවා, තනියම තම නිවස වෙත යාමට පිටත්ව ගොස් ඇත. ඉන්පසු ඔහුට කුමක් සිදුවූවාද යන්න තවමත් අභිරහසකි.

ඕස්ට්‍රේලියානු ජාතික කපිතාන් මිලර් සමග එංගලන්තයේ ජීවත්ව සිටින්නේ, ඔහුගේ සොහොයුරිය පමණකි. ඊයේ එනම් ඉරිදා දහවල් වනතුරුත් තම සොහොයුරා ආපසු නිවසට නොපැමිණි විට බියට පත් ජූලියා මිලර් මෙනෙවිය, බැරිංටන් නිවස වූ හිල්ටන් හවුස් මැදුර වෙත දුරකතනයෙන් අමතා ඇත. පැට්‍රීෂියා බැරිංටන් මෙනෙවිය මේ වනවිට සති අන්තය ගතකිරීම සඳහා නිවසෙන් බැහැර ගොස් සිටියාය. කෙසේ වෙතත් ඇගේ සොයුරු මයිකල් නිවසේ සිට ඇත. මයිකල් බැරිංටන් මහතා පැවසුවේ සිකුරාදා සන්ධ්‍යාවේ තමාට කපිතාන් මිලර් හමුවූ බවත්, ඉන්පසු තමා ඔහු නුදුටු බවත්ය. මේ අනුව ජූලියා මිලර් මෙනෙවිය





තම සොයුරාගේ අතුරුදන්වීම පිළිබඳව ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට පැමිණිලි කර ඇත. මෙය භාරවී ඇත්තේ අභිරහස් රැසක් සාර්ථක ලෙස විසඳූ පොලිස් පරීක්ෂක ජී. ලෙස්ට්‍රේඩ් මහතා වෙතට වීම කාගේත් සතුටට කරුණකි."

පුවත්පත ඉවතට දැමූ උදේ ආහාරවේල ඉක්මනින් ගෙන මම ද අමුත්තා හමුවීමට සූදානම් වූයෙමි. නියමිත වේලාවට මිනිත්තුවකට දෙකකට පෙර මම විසිත්තකාමරය වෙත පැමිණියෙමි. ඇය එවා තිබූ ලියුම හෝම්ස් මා අතට දුන්නේ එවිටය.

හිල්ටන් හවුස් මැදුර,
මේෆෙයා.

ෂර්ලොක් හෝම්ස් මහතාණෙනි,

සිත අවුල්කරන ඉතා භයංකර ගැටලුවකට මුහුණදීමට මට සිදුවී ඇත. මගේ පෙම්වතා වන කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර්ගේ අතුරුදන්වීම ගැන ඔබ දැනටමත් පුවත්පත් මගින් දැනගෙන ඇතුවා නොඅනුමානයි. මේ ගැටලුව විසඳීමට ඔබට භාරකිරීමට මම තීරණය කළෙමි. ඒ සඳහා මට අවස්ථාවක් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි. මගේ බලාපොරොත්තුව අද උදේ 9.30 ට ඔබගේ නිවස වෙත පැමිණීමටයි. එම වේලාව ඔබට අපහසු නම්, ඔබ හමුවිය හැකි වේලාවක් කරුණාකර මෙය රැගෙන එන්නා අත දන්වා එවන්න.

මෙයට හිතවත්
පැට්‍රීෂියා බැරිංටන්,

මා ලියුම කියවා අවසන් වෙද්දීම අපේ නිවහන ඉදිරිපිට අශ්වකරත්තයක් නවතින හඬ ඇසිණි. මම ජනේලයෙන් එබී බැලුවෙමි. එය අශ්වයින් දෙදෙනකු බැඳ තිබූ, අලුත් සුඛෝපභෝගී අශ්වකරත්තයක් බව මට දකින්නට ලැබිණි. මිනිත්තු කිහිපයක් ගතවෙද්දී අපේ අනුග්‍රාහිකාව හඩ්සන් මහත්මිය සමග උඩුමහලට පැමිණියාය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා, මං ඔබට මුළු හදින්ම කෘතඥ වෙනවා, මේ තරම් කෙටි දැනුම්දීමකින් ඔබ හමුවෙන්න අවස්ථාවක් ලබාදීම ගැන" පැවසූ තරුණිය, හෝම්ස් කළ ඉල්ලීම අනුව ගිනි උදුන සමීපයේ වූ සුවපහසු අසුනේ හිඳගත්තාය.



www.sinhalaelibrary.com

"මෙනෙවිය, මගේ හයිප්පය දල්වා ගැනීම ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද?" මගේ මිත්‍රයා ඇසුවේ ඔහුගේ සුපුරුදු අසුනට බරවෙමිනි. "ඔබට මතුවී තිබෙන ගැටලුව ගැන මම පුවත්පත්වල කියෙව්වා. ඒක කෙටි අසම්පූර්ණ පුවතක් පමණයි. දැන් ඉතින් හැමදෙයක්ම සම්පූර්ණ විස්තර සහිතව මට කියන්න. මේ ඉන්නේ මගේ සහකරු දොස්තර වොට්සන්. ඉතාම සංකීර්ණ ගැටලු විසඳන්න ඔහු තමා මට උදව් දුන්නේ."

කරුණු සියල්ලම සිතෙහි පිළිවෙළින් යොමු කර ගැනීමට මෙන් ඇය මඳ වේලාවක් කල්පනාකාරීව නිහඬව සිටියාය. ඇගේ බාහිර පෙනුම ගැන මගේ අවධානය යොමුවූයේ මේ මොහොතේදීය.

පැට්‍රීෂියා බැරිංටන් මෙනෙවිය සතුවූයේ, කලාතුරකින් දකින්නට ලැබෙන ආකාරයේ රූමත් මුහුණකි. සිහින් උස් සිරුර නිසා ඇගේ රූපශෝභාව වඩාත් කැපී පෙනිණි. ඇගේ කෙස් කළඹ තද කළු පැහැති විය. හැඳ සිටි වටිනා ඇඳුම් වලින් ද පැළඳ සිටි ආභරණ වලින් ද ඇය වංශවත් ධනවත් කාන්තාවක් බව පැහැදිලිවම දිස්විය. ඇගේ වයස අවුරුදු විසිඅටක් හෝ තිහක් පමණ වියයුතු යයි මම අනුමාන කළෙමි. කෙසේ වෙතත් මුහුණදීමට සිදුවී ඇති ගැටලුව නිසාදෝ, මේ මොහොතේ ඇගේ මුහුණ සුදුමැලිව තිබූ හැටි මම නිරීක්ෂණය කළෙමි. රාත්‍රියේ හරිහැටි නින්දක් නොලැබීම නිසා, දෑස් යට කළු පැහැති අඳුරු සෙවණැලි තිබිණි. දෙතොල් වල වෙව්ලන ස්වභාවය, ඇගේ සිතේ තිබූ කැලඹීම මනාව ප්‍රදර්ශනය කළේය.

"හෝම්ස් මහත්මයා" ඇය කථාව ඇරඹුවාය. "ඔබ මගේ පියා ගැන අහලත් ඇති. මගේ පියා තමා සර් ජේම්ස් බැරිංටන්."

"හොංකොං දූපතට මහරැජින පත්කළ අලුත් ආණ්ඩුකාරතුමා?"

"ඔව් මහත්මයා" ඇය කීවාය. "හොංකොං වල ආණ්ඩුකාර ධුරයේ වැඩ භාරගැනීමට යාම නිසා, මගේ පියාත් මවත් දෙදෙනාම මේ දිනවල එංගලන්තයේ නැහැ. මගේ බලාපොරොත්තුව තිබුණේත් තව මාස තුනකින් පදිංචිය සඳහා හොංකොං බලා යන්නයි. ආසියාතික රටක සංස්කෘතියට මට හැඩගැසීමට හැකිවේද යන කරුණ හරිහැටි නොදන්නා නිසයි, මං දෙමව්පියන් සමඟ එහි නොගියේ. දැන් ඉතින් මා මගේ ගැටලුවට සම්බන්ධ කාරණා ඔබට කියන්නම්.



www.sinhalaelibrary.com



මගේ පවුලේ මට ඉන්නේ එකම සහෝදරයෙක් විතරයි. ඔහු මට වඩා අවුරුද්දකට බාලයි. ඔහුගේ නම මයිකල්. දැන් අප දෙදෙනා හිල්ටන් හවුස් මන්දිරයේ පදිංචිව ඉන්නේ අපේ නැන්දණියක් සමඟ. මගේ මල්ලී දැනට අවුරුදු දෙකකට පමණ කලින් විදේශ සංචාරයක යෙදී, අවුරුද්දකට පමණ පෙර ආපහු එංගලන්තයට ආවා.

දැනට මාස හතරකට පමණ කලින් ඔහු එක්තරා මහත්මයෙක් අපේ ගෙදරට කැඳවාගෙන ආවා. ඔහු, මල්ලිගේ විදේශ සංචාරයේදී දැන හඳුනාගත්, ඕස්ට්‍රේලියානු පවුලකට සම්බන්ධ කෙනෙක් ලෙසයි මට හඳුන්වා දුන්නේ....."

"..... සමාවෙන්න ඔබේ කථාවට බාධා කරනවට. මේ සිද්ධිය වෙනකොට ඔබේ මව හා පියා එංගලන්තයේ සිටියද?"

"නැහැ මහත්මයා" ඇය පිළිතුරු දුන්නාය. "මගේ මව හා පියා හොංකොං බලා යන්න නැව් නැග්ගේ ඊට දින දහයකට කලින්."

"හොඳයි කථාව දිගටම කියන්න."

"මයිකල් ගෙදරට කැඳවාගෙන ආව තරුණයාගෙ නම කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර්. ඔහු කාලයක් ඕස්ට්‍රේලියානු යුද හමුදාවේ සේවය කරමින් ඉඳලා, තමන්ගේ ව්‍යාපාර සඳහා සේවයෙන් ඉවත්වුණු කෙනෙක්. සේවයෙන් ඉවත් වූ පසු පල්තුරු වගා කරලා එයින් විශාල ආදායමක් ලබාගෙන, පසුව රත්රන් ඇල්ලම් සහිත ඉඩම් මිලයට ගෙන තිබෙනවා. ඔහු ඒ මගින් බොහොම මහන්සියෙන් කෝටිපතියෙක් වුණු බවයි මට අහන්න ලැබුණේ.

මිලර් මහත්මයාගේ වයස අවුරුදු තිස්හතයි. ඔහු ඕස්ට්‍රේලියාවේ ඉඳල එංගලන්තයට සංක්‍රමණය වෙලා තියෙන්නේ ඔහුගේ සොහොයුරිය හා මව සමඟ. එංගලන්තයට පැමිණියාට පස්සේ මව මියගියාලු. මුලින් ඔවුන් සවුත්හැම්ටන් පැත්තෙයි පදිංචිව ඉඳලා තියෙන්නේ. ලන්ඩනයේ හෝටලයක තිබුණු ප්‍රියසම්භාෂණයකදී මගේ මල්ලිට ක්‍රිස් මිලර් මහත්තයා හමුවුණාලු. එතැනදී ඇති කරගත් දැන හැඳුනුම් කම නිසා මිලර් මහත්මයා අපේ ගෙදර ආවා. ඔවුන් ලන්ඩනයේ පදිංචියට එන්න ගෙයක් හොයමින් ඉඳල තියෙන්නේ. ඉතින් මල්ලී තීරණය කළා, අපට අයත් ලොකු ගෙයක් මිලර් මහත්මයාට කුලියට දෙන්න. ඒක අපේ ගෙදරට සමීප, කාසල් වීථියේ හිස්ව තිබූ ගෙයක්.

මිලර් මහත්මයා, නිතර අපේ ගෙදර ආව ගියත්, ඔහුගේ සොහොයුරිය ඉඳහිට වත් කොහේවත් ගියේ නැහැ. ඒකට හේතුව

වුණේ. ඕස්ට්‍රේලියාවේ සිට එංගලන්තයට පැමිණීමෙන් පසු ඇතිවුණු දේශගුණික වෙනස නිසා, කාලයක් තිස්සේ ඇය දුක් විඳි රෝගයක් උත්සන්න වීම. ඇය අධික හිසේ කැක්කුම සහිත ඉරුවාරදයෙන් හා පීනස් රෝගයෙන් පෙළෙනවා. මෙහේ සීතල සුළං ටිකක් වැදුණොත් රෝගී තත්ත්වය වැඩි වෙනවාලු. මිලර් මහත්මයා බොහොම නාගරිකයි, ගුණ යහපත් කෙනෙක්. ඒ වගේම ඔහු බෝල් නැටුම් වලට බොහොම කැමැති කෙනෙක්. මහ රැජිනගේ ජුබිලි උත්සවය වෙනුවෙන් පැවැත්වුණු බෝල් නැටුමට යන්න ඔහු මට ආරාධනා කළා. අප දෙදෙනා අතර ඒ විධියට ඇතිවුණු මිතුරුකම ක්‍රමයෙන් ආදරයකට පෙරළුණා. ඉතින් අවසානයේ අපි විවාහවෙන්න තීරණය කළා. මගේ මේ තීරණයට මල්ලිත් කැමැත්ත දුන්නා. සති කිහිපයකට පෙර මගේ මව්පියන්ටත් මේ ගැන දන්වලා යැව්වා.

මගේ හිතවත්ම මිතුරියක් සිය සිකුරාදා උදේ විවාහවුණා. ඒ වෙනුවෙන් මංගල සාදය පැවැත්වුණේ හැන්දෑවරුවේ. ඒ ග්‍රොව්නර් චතුරශ්‍රයේ ග්‍රෑන්ඩ් හෝටලයේ. ඒකට සහභාගි වෙන්න කියලා මටත් මිලර් මහත්මයාටත් දෙදෙනාටම ඇරයුම් ලැබුණා.

ඒක සිකුරාදා රෑට. ඊළඟට සෙනසුරාදාට මා සහභාගි විය යුතු තවත් කටයුත්තක් යෙදිලා තිබුණා. ඒ ගැනත් මම කියන්නම්. අපේ ඥාති සොහොයුරු සොහොයුරියන් කිහිපදෙනෙක් එකතු වෙලා, නෝර්ෆෝක් ප්‍රාන්තයේ විනෝදයෙන් නිවාඩුවක් ගතකරන්න යන්න අපි කලින් සූදානම් කරගෙනයි තිබුණේ. මේ කටයුත්තට සහභාගිවෙන්න මුලින් නම් මගේ මල්ලීගේ බලාපොරොත්තුවක් තිබුණේ නෑ. ඒත් අන්තිම මොහොතේ ඔහුත් ආවා.

මගේ මේ විනෝද ගමන ගැන මම කලිනුත් මිලර් මහත්මයාට කියලයි තිබුණේ. එවිට ඔහු ඒ ගැන විරුද්ධත්වයක් දැක්වූවේ නැහැ. මංගල උත්සවයට සහභාගි වෙන වෙලාවෙ, සිකුරාදා රෑ යළිත් මං ඒ ගැන ඔහුට මතක් කළා. එතකොට ඔහු මේ විධියට ගමනක් යෑම ගැන විරුද්ධ වුණා. ඔහු එහෙම විරුද්ධ වුණේ මගේ වටිනා ආභරණ දින කිහිපයක් පාළුවට තිබෙන ගෙදර දමා යාම ගැනයි. ඔහු විශේෂයෙන්ම කීවේ මගේ මුතුපළඳනා ගැනයි.

මගේ ඒ මුතුපළඳනා ගැනත් මං ඔබට යමක් කියන්නම්. මේ ආභරණ කට්ටලයට, පොට දෙකක මුතු මාලයක් තිබෙනවා; ඒකටම එල්ලන රන්නූල්ලක එල්ලපු කළු මුතුකැටයක් සහිත පෙන්ඩනයක් තිබෙනවා; ඊළඟට කන් වලට මුතුකැට එල්ලූ වසල් ජෝඩුවක්; දෑත් වලට මුතුඇට එල්ලූ රත්රන් වළලු හතරක් සහ හිසේ පළඳින මුතු ඇට ඇල්ලූ හිස් පළඳනාවක් අයත් වෙනවා. මේ ආභරණ කට්ටලයේ වටිනාකම රන්පවුම් විසිපන්දහසකට වැඩියි. මේක මට මගේ මාමාගෙන් ලැබුණු තෑග්ගක්. ඔබ ඔහු ගැනත් අසා ඇති. ඔහු තමා ඉන්දියාවේ ඩාජිලිං හි තේ අක්කර ලක්ෂ ගණනක් හිමිව සිටි සර් බ්‍රයන් ක්ලිෆර්ඩ්. ඔහු කෝටිපතියෙක්ව සිටියත් විවාහ වුණේ හුඟක් වයසට ගිහිං. ඔහු විවාහ වෙද්දී මනාලියට දුන් තෑග්ග මේ මුතු පළඳනා කට්ටලය. ඔවුනට දරුවන් නොසිටි නිසා ඇගේ මරණයෙන් පසු මේක මට අයිතිවුණා.

මෙතරම් වටිනා ආභරණ කට්ටලයක්, පවුලේ කිසිවෙකු නොමැති නිවසේ දමා නිවාඩුවක් ගතකරන්න යන එක ගැන, මිලර් මහත්මයා මට දොස් කිව්වා. ඔහු කීවා උදේ පාන්දරම බැංකුවට ගිහින්, ආභරණ සියල්ල බැංකු සුරක්ෂිතාගාරයේ තබලා මගේ ගමන යන්න කියලා. නමුත් ඒක කරන්න මට විධියක් තිබුණේ නැහැ. ඒ මොකද නියම විනෝද ගමනක් ලෙස, එකම දුම්රිය මැදිරියක අපි කවුරුත් එකට පිටත්වෙන්නයි, සූදානම් කරගෙන තිබුණේ. ලිවර්පූල් වීදියේ දුම්රියපොළෙන් දුම්රිය පිටත්වීමට නියමිතව තිබුණේ උදේ නවයයි කාලට. ඒ නිසා බැංකුවට ගිහින් එන්න තරම් කාලයක් මට ඉතිරිව තිබුණේ නැහැ.

මගේ ගෙදර, මගේ කාමරයේ, මට අයිති පෞද්ගලික යකඩ සේප්පුවක් තිබෙනවා. නමුත් ආභරණ ඒකෙ දමා යනවාට වත් මිලර් මහත්මයාගේ කැමැත්තක් තිබුණේ නැහැ. ඔහු කිව්වේ බැංකු වලත් සේප්පු කඩන හොරුන්ට, ගෙවල් වල සේප්පු කඩන එක, සාඩින් ටින් අරිනවා වගේ සුළු වැඩක් කියලයි. අන්තිමට මං කිව්වා අකමැත්තක් නැත්නම්, ආභරණ ටික ගෙනිහින්, ඔහුගේ බැංකු සුරක්ෂිතාගාරයේ තබාගන්න කියලා; මම ආපහු ආවාම සියල්ල භාරදෙන්න කියලා. ඔහු ඒකට කැමැතිවුණා. ඔහු ඒක ඉතාම හොඳින් පරෙස්සම් කරන බවට මගේ විශ්වාසයක් තිබුණා."

"මීට කලින් ඔහු සමග සහභාගි වුණු තවත් උත්සව වලටත් ඔබ මේ ආභරණ පළඳලා තියෙනව ද?"

"ඔව් හෝම්ස් මහත්මයා. කිහිප වතාවක්ම මං මේ ආභරණ කට්ටලය පැළඳුවා., මේ තරම් වටිනා ආභරණ කිසි පරෙස්සමක්

නැතුව නිතර නිතර පළඳින ගැනීම ගැන ඔහු මට දොස් කිව්වා. ඔහු කිව්වේ මේවා හැකිතරම් බැංකු සුරක්ෂිතාගාරයක තිබිය යුතු ඒවා කියලයි.

ඉතින් අශ්වකරත්තයෙන් ආපහු ගෙදර එද්දි, මං ආභරණ නැම ඩක්කම ගැලෙව්වා. ඊළඟට ඒවා ඒකාග ලේන්සුවක දමා ගැටගහලා ඔහු අතට දුන්නා. ඔහු ඒක කබායේ ඇතුළත සාක්කුවක දමා ගත්තා. අපේ ගෙදර ඉදිරිපිට අශ්වකරත්තය නැවැත්වූ පසු, අපි දෙන්නාම කරත්තයෙන් බැස්සා. එවිට මං ඔහුට කිව්වා, මේ ආභරණ දැමීමට විශේෂයෙන් සාදා තිබූ රිදී පෙට්ටිය මං ගෙනැත් දෙන්නම් කියලා.

"නැහැ, ඒක අවශ්‍ය නැහැ" ඔහු කිව්වා. "මං අද රෑට නිදියන්නෙ මේක මගේ කොට්ටය යට තියාගෙනයි. හෙට උදේ මම මුලින්ම කරන වැඩේ, මේවා අරගෙන බැංකුවට ගිහිං සුරක්ෂිතාගාරයේ තැන්පත් කිරීමයි."

"දැන් ඔයා මේ අශ්වකරත්තයෙන්ම ගෙදර යනවද?" මං ඇහුවා.

"නැහැ" ඔහු කිව්වා. "උත්සව ශාලාව ඇතුළේ තිබුණේ පුදුම රස්නයක්. එළියේ සීතල සුළඟ හරි සනීපයි. ගෙදරට ටික දුරයි නේ. ඉතින් මං කාසල් වීථියට මේ ටික දුර පයින් ඇවිදගෙන යනවා. ඔබට ශුභ රාත්‍රියක්."

එහෙම කියූ ඔහු රියැදුරාට මුදල් ගෙවා කුලිරිය යැව්වා. ඊට පසු ගේට්ටුවෙන් එළියට ඇවිදගෙන යන හැටි මං බලාගෙන හිටියා. ඒ තමා ඔහු අන්තිම වරට දකින්න ලැබුණු අවස්ථාව." මෙසේ කියමින් කථාව නිමකළ පැට්‍රිෂියා බැරිංටන් මෙනෙවිය, ලේන්සුව ඇගේ කඳුළු වැගිරෙන දෙනෙත් වලට තබාගත්තාය.

තම පයිප්පයෙන් දුම්වළලු පිටකරමින් හෝම්ස් නිහඬව කල්පනා කළේය. ඔහු ඒ නිහඬතාවය බින්දේ මිනිත්තු කිහිපයකට පසුවය.

"බැරිංටන් මෙනෙවිය, ඔබට හිතෙන්නේ ඔහුට මොකක් හරි කරදරයක් වෙලා තියෙනවා ද?"

"මට එහෙම හිතෙනවා හෝම්ස් මහත්මයා. ඔහුට කරදරයක් වෙලා නැත්නම් මේ විදියට අතුරුදන්වුණේ කොහොමද? දැන් දවස් හයක් වෙනවා ඔහු ගැන කිසිම ආරංචියක් නැහැ. මට වත් ඔහුගේ නංගිටවත් දුරකතනයෙන් ඇමතුවේ නැහැ. විදුලිපුවතක් එව්වේවත් නැහැ."





"ඔහුට ඛේදජනක ඉරණමකට මුහුණපාන්න වුණු බවත් අපට එයින්ම තීරණය කරන්න අමාරුයි" හෝම්ස් කීය. "කපිතාන් මිලර්ගේ අතුරුදන්වීම ඔබ දැනගත් හැටිත් මට කියන්න."

"සිකුරාදා මංගල උත්සවයට ගිය ඔහු, බදාදා ඒ කියන්නේ ඊයේ වන තුරුත් ගෙදර නොපැමිණි නිසා, ජූලියා, ඔහුගේ නංගී කලබලවෙලා තියෙනවා. ඇය දුරකතනයෙන් අපේ නිවසට කතා කළාලු. ඒ වෙලාවෙ මගේ මල්ලි ගෙදර ඉඳලා තියෙනවා. ඔහු කිව්වාලු ක්‍රිස්ව සිකුරාදා හැන්දෑවෙන් පසු දකින්න නොලැබුණු බව. අනෙක ක්‍රිස් මිලර් මහත්මයා අපේ නෝෆෝක් සංචාරය සඳහා සහභාගි නොවුණු බව. එතකොට ජූලියා තීරණය කළාලු වහාම පොලීසියට පැමිණිලි කරන්න. මේ ආරංචිය මට ලැබුණේ ඊයේ හැන්දෑවේ. ඉතින් මම රාත්‍රී දුම්රියෙන්ම නොරිච් සිට ලන්ඩන් බලා ආවා."

"මිලර් මහත්මයලා පදිංචි නිවස තිබෙන්නේ ඔබේ හිල්ටන් හවුස් මැඳුරේ සිට කොයිතරම් දුරින්ද?"

"අපේ නිවසේ සිට සැතපුම් කාලක් පමණ දුරින්."

"නමුත් ඔහු අශ්වකරත්තය ආපසු හරවා යවා, ඇවිදගෙන යන්න පිටත්වුණු බවයි ඔබ කියන්නේ?"

"ඔව් මහත්මයා. මං ඒක මගේ දෑසින්ම දුටුවා."

"මේ සිද්ධිය වෙද්දි වෙලාව හරියටම කීයද?"

"මධ්‍යම රාත්‍රිය පසුවී පැය කාලක් පමණ වෙන්න ඇති."

"සඳ එළිය තිබුණද?"

"නැහැ මහත්මයා. වැහි වලාකුළු නිසා ඝන අන්ධකාරයක් තමයි තිබුණේ."

"නමුත් වැසි පොද වැටෙන ගතියක් තිබුණේ නැහැ?"

"නැහැ. අධික උණුසුම් බවක් හා ඩහදිය දමන බවක් තිබුණා. ඒ නිසා රාත්‍රියේ වහින්න ඉඩ තිබෙන බව කරත්තයේ එද්දී මිලර් මහත්මයා මා සමග කිව්වා."

"හොරුන් හෝ මංකොල්ලකරුවන් ගැන ඔහුගේ හිතේ භයක් තිබුණේ නැද්ද?"

"කිසිම භයක් තිබුණේ නැහැ මහත්මයා" ඇය කීවාය. "ක්‍රිස් ඔස්ට්‍රේලියාවේදී අවුරුදු ගණනාවක් රැකියාව කරලා තිබුණේ ආරක්ෂක හමුදාවේ. ඔහුගේ නිර්භයකම හා දක්ෂකම නිසාලු,



www.sinhalaelibrary.com

ඉක්මනින් කපිතාන් තනතුරට උසස්වෙන්න ලැබුණේ. රත්රන් පතල් වලින් රත්රන් ඉල්ලම් පටවාගෙන යන අශ්වකෝච්චි, මංකොල්ලකන මැරකල්ලි තිබිල තියෙනවා. ක්‍රිස් ඒවට එරෙහිව සටන්කරල තියෙනවා."

"කපිතාන් මිලර් ළඟ නිතර රිවෝල්වරයක් තිබුණද?"

"විශාල මුදල් ප්‍රමාණ එහෙ මෙහෙ ගෙන යද්දි රිවෝල්වරය ළඟ තබාගන්නා බව ඔහු මට කිව්වා. නමුත් අපි මංගල උත්සවයට සහභාගි වෙන්න ආව නිසා මං හිතන්නෙ නෑ, මේ වෙලාවෙ ඔහු ළඟ රිවෝල්වරයක් තියෙන්න ඇති කියල."

"කපිතාන් මිලර්ට එංගලන්තයේ සතුරන් හිටියද?"

"මං දන්න තරමින් කිසිකෙනෙක් නැහැ." ඇය කීවාය. "ඔස්ට්‍රේලියාවේ මැර කල්ලියක් නම් කිහිපවාරයක් ඔහුට මරණ තර්ජන කර තිබූ බව මා සමග කිව්වා. ඒ නිසාලු ඔහු වික්ටෝරියා ප්‍රාන්තය අත්හැර ටැස්මේනියාවේ පදිංචියට ගියේ."

"ඔහුගේ ඒ සතුරන් කවුරුන් හෝ මෑතකදී එංගලන්තයේදී දකින්න ලැබුණු බවක් කිව්වේ නැද්ද?"

එක්වරම පිළිතුරක් නොදුන් බැරිංටන් මෙනෙවිය මදක් කල්පනා කළාය. ඇගෙන් පිළිතුරක් ලැබෙනතුරු හෝම්ස් බලා සිටියේ නොඉවසිල්ලෙන් බව මම දුටුවෙමි.

"මංගල උත්සවයට දින තුන හතරකට කලින් නම් ඔහු ඒ වගේ දෙයක් කිව්වා" ඇය කීවාය. "එදා මං යාළුවන් කිහිපදෙනෙකුට රාත්‍රී භෝජනයට මගේ නිවසට ආරාධනා කරලයි තිබුණෙ. ක්‍රිස්ටත් එන්න කිව්වා. ඔස්ට්‍රේලියාවේ සිට ලන්ඩන් නගරයට ළඟාවූ නැවක නාවිකයන් කිහිපදෙනෙක්, ... කලින් දවසෙ සැවෝයි සමාජශාලාවට ඇවිත් තියෙනවා. ඒ අතර හිටි එක් පුද්ගලයෙක් බොහොම ඕනෑකමින් ක්‍රිස් දිහා බැලුවලු. ඒ මුහුණ නම් ටිකක් දැකල පුරුදුයි වගේ කියල ක්‍රිස් මා සමග කිව්වා."

"කපිතාන් මිලර් සහ ඒ නාවිකයා අතර මොකුත් වචන හුවමාරුවක් ඇතිවෙලා තිබුණේ ද?"

"නැහැ" ඇය කීවාය. "මේ පුද්ගලයන් දුටු වහාම ක්‍රිස්ට හිතුණලු ඔවුන්ව මල්ලිට පෙන්වන්න. මල්ලි ඒ වෙලාවෙ ඉඳල තියෙන්නෙ බිලියඩ් කාමරේ. ක්‍රිස් ගිහින් මල්ලිව කැඳවාගෙන එද්දි ඒ නාවිකයෝ පිටවී ගිහින්ලු."





"කපිතාන් මිලර්ගේ ඡායාරූපයක් ඔබ ළඟ තියෙනවද?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා. මං ඡායාරූප දෙකක්ම රැගෙන ආවා" පැවසූ බැරිංටන් මෙනෙවිය තම අත්බෑගයෙන් ගත් ඡායාරූප දෙක හෝම්ස් අතට දුන්නාය. මම අසුනෙන් නැගිට හෝම්ස්ගේ උරහිසට ඉහලින් ඡායාරූප වෙත මගේ නෙත් යොමු කළෙමි.

කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් ඇමරිකානු නළුවෙකු මෙන් කඩවසම් පුද්ගලයෙකු බව මම දුටුවෙමි. ඔහුගේ තද කළු පැහැති කොණ්ඩය මැදින් දෙකට බෙදා තිබූ අතර, උඩුතොලේ තිබූ සිහින් උඩුරැවුල නිසා තේජාන්විත බවක් ද දිස්විය. මෙවැනි පුද්ගලයෙකු වෙත එංගලන්තයේ සිටි පවුලක තරුණියකගේ සිත ඇදී යාම පුදුමයක් නොවේ.

"හොඳයි බැරිංටන් මෙනෙවිය" හෝම්ස් කීය. "ඔහු ගැන සොයා බැලීම මං භාරගන්නවා. අවසාන වශයෙන් මට තවත් එක ප්‍රශ්නයක් තියෙනවා. ඔහු මුදල් ගැන දැක්වූයේ මොන වගේ ආකල්පයක්ද? ඒ කියන්නේ විවාහවෙද්දි ඔබට, ඔබේ දෙමව්පියන්ගෙන් හිමිවෙන ඉඩකඩම්, දේපළ හෝ මුදල් ගැන ඔහු කවදා හරි ඇහුවද? නැත්නම් ඔබේ නමට බැංකුවල තිබෙන තැන්පත් මුදල් ගැන?"

"කවදාවත් නැහැ හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "පුවත්පත් වල පළවූ අයුරින් ඔහු ඇත්තෙන්ම කෝටිපතියෙක්. මගේ ඉඩකඩම් හෝ මිල මුදල් ගැන ඔහුගේ කිසිම ආශාවක් තිබුණේ නෑ. අප විවාහ වෙලා ඔස්ට්‍රේලියාවේ පදිංචියට යන්නයි බලාපොරොත්තු වුණේ. ටැස්මේනියාවේ තිබෙන පලතුරු වත්තක පදිංචි වෙමු කියලයි ඔහු මට කිව්වේ. විශාල බංගලාවක් සහිත අක්කර හාරසියයක ඇපල් හා දොඩම් වැවූ වත්තක්, ඔහු සතුව හෝබාට් නගරය සමීපයේ තිබෙන බව, ඔහු කලින් මට කියා තිබුණා. ලන්ඩන් නගරයේ මීදුමෙන් පිරුණු, මේ කලබලකාරී පරිසරයෙන් මිදිලා, එහේ ගිහින් පදිංචි වෙන්න මං හරි ආශාවෙන් හිටියේ" පැවසූ බැරිංටන් මෙනෙවිය දිගු සුසුමක් හෙළුවාය.

"මේ විස්තර මට කිව්වාට ගොඩාක් ස්තූතියි බැරිංටන් මෙනෙවිය" හෝම්ස් පැවසුවේ අසුනෙන් නැගිටිමිනි. "අද හැන්දෑවේ ඔබ හමුවෙන්න පුළුවන්ද?"

"ඔව් හෝම්ස් මහත්මයා. ඔබ කැමැති වෙලාවක."

"මට ඔබේ සොහොයුරා- මයිකල් බැරිංටන් මහත්මයා හමුවෙන්නත් උවමනායි. ඒකට අපි වෙලාවක් යොදාගත යුත්තේ කොහොමද?"

"ඔහු සමග කථාකරලා මං ඔබට අවස්ථාවක් ලබාදෙන්නම්."

"එහෙනම් අද හවස හයට හිල්ටන් හවුස් මන්දිරයට අපි එන්නම්. ඔබ හමුවෙන්න" හෝම්ස් කීය. "කපිතාන් මිලර් සොයාගැනීමට, මං මගේ සම්පූර්ණ උත්සාහය යොදන බවට පොරොන්දුවෙනවා."

හෝම්ස්ට ස්තුතිකොට ඇය අපෙන් සමුගත්තාය.

"ඔබට මොනවද හිතෙන්නෙ වොට්සන්, මේ අතුරුදන්වීම ගැන?" හෝම්ස් ඇසුවේ තුරුණිය පිටත්වී ගොස් මඳ වේලාවකට පසුවය.

"කිසි සැකයක් නෑ" මම කීවෙමි. "පුවත්පත් වල තිබුණ වගේ ඔහු භයානක මංකොල්ලකාරයෙකුට අහුවෙලා. වටිනා මුතු ආභරණ ටික මංකොල්ලකෑමේ අදහසින් කපිතාන් මිලර්ව මරාදමන්න ඇති. මළසිරුර කොහේ හරි සඟවා ඇති."

මා කියූ දෙයට කිසිදු පිළිතුරක් නොදුන් මගේ මිතුයා, පයිප්පයෙන් දුම්රැළි නංවමින්, සිවිලිම දෙස බලාගෙන කල්පනා කරමින් සිටියේය. ඔහු ඊළඟ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ඊට පසුවය.

"වොට්සන්. පැට්රීෂියා බැරිංටන්ගේ සොහොයුරා- මයිකල් බැරිංටන් ගැන ඔබ දන්නෙ මොනවද?"

"ඔහු ගැන නම් මං ඒ හැටි දෙයක් දන්නෙ නෑ. ඔහු සුප්‍රකට පුද්ගලයෙක්ද?"

"ඔහු ගැන සුප්‍රකට කියන වචනය මට යොදන්න අමාරුයි වොට්සන්. ඔහු කුප්‍රකට කෙනෙක් කිව්වොත්, වඩාත් නිවැරදියි."

"හැබෑට?"

"මයිකල් බැරිංටන් ඊට කලිනුත් මං කළ අපරාධ පරීක්ෂණ දෙක තුනකදී ගැටී නොගැලී ගිය කෙනෙක්. ඒ නිසා මං ඔහු ගැන විස්තර ටිකක් දන්නවා.

ඔබ දන්නවද වොට්සන්. මේ කෝටිපති ව්‍යාපාරිකයන්ගේ, දේශපාලනඥයන්ගේ, පූජාවරුන්ගේ පුත්‍රයින් බොහොම වෙලාවට නොමඟ යන අය. ඔවුන්ට වියදම් කරන්න ඕනෙවටත් වඩා මුදල්





තියෙනවා. ඒ වගේම දුශ්චරිතයේ ඇළුණු මිතුරන් ඉන්නවා. ඒ නිසා මේ අය ලාබාල වයසේ ඉඳලම ගැවසෙන්නේ සමාජශාලාවල. ආශ්‍රය කරන්නේ සූදු අන්තුවන් නැත්නම් මැරවරයන්. බොහොම වෙලාවට මේ දෙගොල්ලම. මේ කියන මයිකල් බැරිංටනුත් සූදු අන්තුවෙක්, ඒ වගේම මැරවරයෙක්. ඔහු කාඩ් ක්‍රීඩාව සඳහාත් අශ්ව රේස් සඳහාත් බැරිංටන් පවුලේ මහා ධනස්කන්ධයක් විනාශ කළ බව ප්‍රකට කරුණක්. ණයකාරයුන්ගෙන් බේරෙන්න බැරිව, නඩු වැටී, බැරිංටන් හිරේ වැටෙන්න ඔන්න මෙන්න කියා තිබියදී, ඔහුව බේරාගන්න තමයි, ඔහුගේ පියා මයිකල්ව විදේශ සංචාරයක් සඳහා යැව්වේ. අවුරුද්දකින් ආපසු ඇවිත් ඔහු වැටුණේ පරණ වැඩ කටයුතු වලටමයි.

සැවෝයි සමාජශාලාවේ කාඩ් ක්‍රීඩාවේදී මයිකල් කළ වංචාවක් නෝර්ටන් නම් නාවිකයෙකුට අහුවුණා. ඔහු මයිකල් බැරිංටන්ට දරුණු ලෙස පහර දුන්නා. දින දෙකකට පස්සේ නෝර්ටන් පිහියා ඇනුම් තුවාල වලින් මරණයට පත්වුණා. ඔහුගේ මිනිය හම්බවුණේ දුම්රියක තිබී. සැකය එල්ල වුණේ බැරිංටන් තරුණයාට. නමුත් තමා පසුගිය දින කිහිපය අසනීපයෙන් රෝහලක නේවාසිකව සිටිබව ඔප්පු කරන්න ඔහුට හැකිවුණා. ඒකෙන් නඩුව බිඳවැටිලා, බැරිංටන් නිදහස් වුණා....."

මේ අවස්ථාවේ අපේ කථාවට බාධාකරමින්, කිසිවෙකු අපේ තරප්පු පෙළ නැග, උඩුමහලට එන ශබ්දය ඇසිණ.

බලාපොරොත්තු නොවූ ලෙස මේ අවස්ථාවේ අප හමුවීමට පැමිණියේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ ලෙස්ට්‍රේඩ්ය.

"සුභ උදෑසනක් ලෙස්ට්‍රේඩ්. ඔබට මහා අභිරහස් අතුරුදන්වීමක් ගැන හොයන්න භාරවී ඇති බව අපි පුවත්පත් වල දුටුවා" හෝම්ස් කීවේ සුවපහසු අසුනක වාඩිගත් ලෙස්ට්‍රේඩ් වෙත සුරුට්ටු බඳුන දිගු කරමිනි.

"ඔව් හෝම්ස් මහත්මයා. මුලින් මට හිතුණේ මේක මොළේ අවුල් කරන මහා සංකීර්ණ ගැටලුවක් වේවි කියලයි."

කථාවට මදකට නැවැත්වූ පොලිස් පරීක්ෂකයා දල්වාගත් සුරුට්ටුවෙන් දුම්ගුළි කිහිපයක් පිටකළේය. අනතුරුව සුරුට්ටුව අතට ගෙන කථාව යළිත් ඇරඹුවේය. "ඔබතුමා හැමනිස්සෙම කියන්නෙ ලැබී ඇති දත්ත හා නිරීක්ෂණ සියල්ල හොඳින්

විශ්ලේෂණය කරාම නිගමනෙකට එන්න පුළුවන් කියල නේ. ඉතින් මම ඔබතුමාගේ ක්‍රමය ක්‍රියාවට නැංවුවා. එයින් ලැබුණු ප්‍රතිඵලය ඉතාම ඉහළයි."

"හැබෑට?" හෝම්ස් ඇසුවේ තරමක් පුදුමයට පත්වය. "ඔබ එහෙනම් දැනටම ගැටලුව විසඳලාත් ඉවරද? මොකක්ද ලෙස්ට්‍රේඩ් මෙතැන වෙලා තියෙන්නේ? මිනීමැරුමක්ද? කවුද අපරාධකාරයා?"

"කලබල වෙන්න එපා හෝම්ස් මහත්මයා. කලබල වෙන්න එපා" ලෙස්ට්‍රේඩ් කීවේ ශබ්දනගා සිනාසෙමිනි. "මං හැමදෙයක්ම පිළිවෙලින් කියන්නම්. එතකොට ඔබට තේරේවි මං පියවරෙන් පියවර, ක්‍රමානුකූලව ගැටලුව විසඳූ ආකාරය.

ඔබට කථාන්තරය දුනමුත් අහන්න ලැබිල ඇති. සිකුරාදා රාත්‍රී කපිතාන් මිලර්, බැරිංටන් මෙනෙවිය සමග මංගල සාදයෙන් පසු ආපසු ආවා. ඇය හිල්ටන් හවුස් මන්දිරයට ඇරලවා, ඔහු කාසල් වීථියේ තමන්ගේ ගෙදරට එන්න පිටත්වුණා. නමුත් ඔහුට ආපහු ගෙදර යන්න ලැබුණේ නැහැ. මොකද වුණේ? කවුරු හරි මග රැක ඉඳලා, ඔහුව පොඩ්ඩලා, ඔහු ළඟ තිබූ වටිනා මුතු පළඳනා අරගෙන පැනගියා. කවුද අපරාධකාරයා?"

"මට නම් හිතාගන්න අමාරුයි. ඔබ දන්නවද?" හෝම්ස් ඇසීය.

"ඔව්, මම දන්නවා. ඒ මයිකල් බැරිංටන්" ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේ ජයග්‍රාහී ලෙසිනි. එයට කිසිවක් නොකියූ හෝම්ස් ඇසිපිය නොහෙළා ලෙස්ට්‍රේඩ් දෙස බලාසිටියේය.

"මයිකල් බැරිංටන්ගේ වතගොත ඔබට අලුතෙන් කියන්න උවමනා නැහැනේ හෝම්ස් මහත්මයා. ඔහු සූදු අන්තයෙක්, මැරවරයෙක්. බේබද්දෙක්. මිනීමරුවෙක්. අපට කලින් වතාවක ඔප්පු කරගන්න බැරිවුණත්, ඔහු මිනීමරලා පළපුරුදු කෙනෙක්."

"ඒ ඔක්කොම ඇත්ත" මගේ මිත්‍රයා කීය. "ඒ වුණත් මේ වෙලාවෙ මොනවද බැරිංටන්ට විරුද්ධව තියෙන සාක්ෂි?"

"බැරිංටන්ගේ පියා හා මව හොංකොං බලා ගිහින් මාස හතරක් වෙනවා. දැන් ඔහුට හිතේ හැටියට වියදම් කරන්න මුදල් ලැබෙන්නේ නැහැ. සැවෝයි සමාජශාලාවේ සූදු කෙළියෙන් ඔහු හතර අතට ණය වී ඇති බව ප්‍රසිද්ධ කරුණක්. ඔබ දන්නවාද ඔහු මේ කෝටිපති ඕස්ට්‍රේලියානු ජාතිකයාව පවුලට ළංකරගන්නෙ ඇයි කියලා?"





"නැහැ."

"බැරිංටන් තරුණයාට, කපිතාන් මිලර්ව හමුවුණේ ලන්ඩනයේ හෝටලයක සාදයකදී. කපිතාන් මිලර් සිටියේ සවුත්හැම්ටන් හිටපුව. ඔහු පදිංචියට එන්න ලන්ඩන් නගරයෙන් ගෙයක් හොයමිනුයි හිටියේ. තමන්ගේ වසා තිබූ ගෙයක් බැරිංටන්, මිලර් කුලියට ලබාදුන්නේ කිසිම පැකිළීමක් නැතිව. ඒකට අත්තිකාරම් කුලියෙන් බැරිංටන්ට විශාල මුදලක් ලැබුණාලු. ඊළඟට මේ හිතවත්කම උඩ, කපිතාන් මිලර් බැරිංටන්ගේ ගෙදරට යන්න එන්න පටන්ගත්තා. එයින් මිලර් හා පැට්‍රීසියා මෙනෙවිය අතර හාදකමක් ඇතිවුණා. ඒකෙන් ප්‍රයෝජන අරගන්න බැරිංටන් පසුබට වුණේ නැහැ. සැවෝයි සමාජශාලාවේ ඔහු ණය වෙලා හිටි දෙදෙනෙකුට විශාල ණය මුදල් ගෙවා දමන්න, ඔහු කපිතාන් මිලර්ගේ උදව් ලබාගත්තා. මේ තොරතුරු මං හොයාගත්තේ සමාජ ශාලාවෙන්ම, ඉතා විශ්වාසකටයුතු මාර්ගයකින්. නමුත් තවමත් ඔහු නොගෙවූ ණය ප්‍රමාණය ඉතා විශාල බව ආරංචියි. ඊළඟට ඔහුට එදිනෙදා වියදමටත් ඉතා විශාල මුදලක් උවමනායි. ඔහු මේ මුදල් ලබාගන්නෙ කොහොමද කියලා දෙවියො තමයි දන්නෙ."

"ලෙස්ට්‍රේඩ්. ඔබ මයිකල් බැරිංටන් ගැන කියන මේ කාරණා ඇත්ත බවට මට කිසි සැකයක් නෑ." හෝම්ස් කීය. "නමුත් මෙතැන අපරාධයක් වුණාද? එහෙම වුණා නම් බැරිංටන් ඊට වගකිව යුත්තේ ඇයි? කියන ඒව තමා මට හිතාගන්න අමාරු."

"හෝම්ස් මහත්මයා, මට නම් ඒවා හිතාගන්න අමාරු නැහැ. මට ඔහුව අත්අඩංගුවට ගන්න සාක්ෂි මදි තවමත්. ඒකයි ප්‍රශ්නේ."

"කපිතාන් මිලර් අතුරුදන් වුණේ ගිය සිකුරාදා" මම කීවෙමි. "අද බ්‍රහස්පතින්දා. දැන් දවස් හයක් ගතවුණා. ඔහු මරණයට පත්වුණා නම් ඔහුගේ මිනියට මොකද වුණේ?"

"ඒක වෙනත් ප්‍රශ්නයක් වොට්සන් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය. "මං කියන්න හදන්නේ....."

ඔහුගේ කථාවට බාධාකරමින් අපේ විසිත්ත කාමරයේ දොරට තට්ටු කරන හඬක් ඇසිණ.

"ලෙස්ට්‍රේඩ් මහත්මයා හොයාගෙන පොලිස් භටයෙක් ඇවිත් ඉන්නවා" දොර විවෘත කළ හඩ්සන් මහත්මිය කීවාය.

"කරුණාකර ඔහුව මෙහෙට එවන්න හඩ්සන් මහත්මිය" හෝම්ස් කීය.



www.sinhalaelibrary.com

ඇතුළට ආ පොලිස්කරුවා අතේ තරමක පාර්සලයක් විය. සීරුවෙන් සිටගත් ඔහු ලෙස්ට්‍රේඩ්ට ආචාර දක්වා, පාර්සලය ඔහු අතට දුන්නේය.

"මහත්මයා, සැවෝයි සමාජ ශාලාවට යාර දෙසීයක් පමණ ගඟ පහළ, තේම්ස් ගඟේ ඉවුරේ පඳුරක පැටලී තිබී මේ ද්‍රව්‍ය හමුවුණා. අතුරුදන් වීමේ සිද්ධියට අදාළ ඇති කියලා, සාජන්ට් සර්නි මේවා ඔබතුමාට භාරදෙන්න කීවා."

ලෙස්ට්‍රේඩ් පාර්සලය විවෘත කරද්දී අපි දෙදෙනා එතැනට ලංවීමු. එහි වූයේ වතුරෙන් තෙතුණු, මඩ තැවරුණු කබායක් හා හිස්වැස්මකි. හිස්වැස්ම තරුණියන් පළඳින ආකාරයේ කව්බෝයි මෝස්තරයේ එකක් විය.

"දෙයියන්ට සප්පු ලෙව්වාවෙයි" ලෙස්ට්‍රේඩ්ට කියැවිණි. "මං හොය හොය හිටි දෙවොල් දෙවියෝ මගේ අතටම එවල. මං කිසිවක් කියන්න කැමති නෑ හෝම්ස් මහත්මයා. ඔබම මේවා පරීක්ෂා කරල බලල, නිගමනයක් දෙන්න."

නම උත්තල කාචය අතටගත් හෝම්ස්, පළමුවෙන්ම හිස්වැස්ම පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. ඒ සඳහා ඔහු පැය කාලක් පමණ ගතකළේය. අළු පැහැති ලෝම රෙද්දකින් මසා තිබූ කබාය පරීක්ෂා කිරීමට හෝම්ස්ට පැය භාගයක් පමණ ගතවිය.

"හිස්වැස්ම එක්සත් ජනපදයේ ටෙක්සාස්හි නිෂ්පාදනය කළ එකක් බව සඳහන් ලේබලයක් මේකෙ තිබෙනවා. මේක අලුත් පරම්පරාවේ මෝස්තරයක් නිසා, මේක පැළඳූ පුද්ගලයා තරුණියෙක්. කළු හිස කෙස් ඇති තැනැත්තියක්. ඔහු හිසට අලේප කරන්නේ ලැවෙන්ඩර් සුවඳ කැලු ශීර්ෂාලේපයක්. ඔහු කොණ්ඩය මැදින් බෙදා දෙපැත්තට පීරන අයෙක් බව කිව හැකියි. මෙහි අයිතිකරුවා අතේ ගෙඩින් මිලදීගත් ඇති අයෙකු බවට සැක නෑ. මේකෙ ඇතුළ පැත්තෙ ඇති පැල්ලමේ ලේ පැල්ලමක්. නමුත් ඒක හිස්වැස්ම පළඳා සිටිද්දී හිසට ඇතිවුණු තුවාලයක් නිසා නම් නොවෙයි."

"කොහොමද හෝම්ස් මහත්මයා ඔබ ඔය තරමක් කාරණා කියන්නේ?" ලෙස්ට්‍රේඩ් ඇසුවේ පුදුමයෙනි.

"හිස්වැස්ම පළඳා සිටියදී වුණු තුවාලයක් නම්, ලේ ගැලීමක් ඇතිවුණා නම්, මීට වඩා විශාල ලේ ප්‍රමාණයක් මෙය සාදා ඇති





ලෙල්ට රෙද්දට උරාගත්තුවා. නමුත් මෙහි තිබෙන්නේ ලේ ඉතාම ස්වල්පයයි. අනෙක හිස්වැස්මට කිසිම සෙද්දක් සිදුවී නැහැ."

"එහෙනම් ඔහු කොණ්ඩය මැදින් බෙදා දෙපසට පීරූ කෙනෙක් බව?"

"ඒ හැම කරුණක්ම බොහොම පහසුවෙන් කළ හැකි නිගමන. ශීර්ෂාලේපය තුගත්ම හැඩයි තිබෙන්නේ කෙස් තිබෙන හරියේ. ඔමය මිල අධික වර්ගයේ එකක් නිසා, අයිතිකරුවා පොහොසතෙක්."

"එහෙනම් කබාය ගැන මොනවද ඔබට කියන්න පුළුවන්?" මම ඇසීමි.

"කබායත් බොහෝවිට ඒ පුද්ගලයාටම අයත් එකක් වෙන්න පිළිවන්. මෙය මසා තිබෙන්නේ වික්ටෝරියා ප්‍රාන්තයේ, ගීලොංග් නගරයේ, හැමිල්ටන් ඇඳුම් නිර්මාණ ආයතනයේ බව ලේබලයේ සඳහන්. ඒ කියන්නේ ඔහු ඔස්ට්‍රේලියානු ජාතිකයෙක්. උසින් අඩි හයක් පමණ. කබා අතේ දිග ප්‍රමාණයෙන් මට ඒ බව කියන්න පුළුවනි. කබායේ තිබෙනවා දිලාකු ලේ පැල්ලම් දෙකක්. ලේ ගුලි වශයෙන් කබාරෙද්දට උරාගෙන තියෙනවා. වම් සාක්කුවේ තිබෙන රතු පීන්න පටි කැබැලි සහිත කුඩා දුල් රෙදි කැබැලි, මඟුල් කේක් එතීමට ගන්නා වර්ගයේ ඒවා. එම සාක්කුවේම ආමන්ඩ් සුවඳ සහිත සීනි ස්වල්පයක් තිබෙනවා."

"ඒ කොහොමද හෝම්ස් මහත්මයා?" ලෙස්ට්‍රේඩ් ඇසුවේය.

"ඒකෙ පුදුමවෙන්න දෙයක් නැහැ" හෝම්ස් කීය. "ඔහු අතට දුන්නු මඟුල් කේක් කෑබැල්ල අඩක් කෑමෙන් පසු සාක්කුවේ දමාගෙන තිබී, පසුව එය කෑමට ගන්න ඇති. දකුණු සාක්කුවේ තිබුණ සිගරට් අඳුරණය, රිදී-රත්රන් මිශ්‍ර ලෝහයකින් තනා, පිරිසිදු රත්රන් ආලේප කළ එකක්. ඒකෙ කැටයම් කර තිබෙනවා "P.B ගෙන් C.M ට" කියලා."

"වෙනත් වචන වලින් කියනවා නම් පැට්‍රීෂියා බැරිංටන් ගෙන් ක්‍රිස්ටෝෆර් මිලර්ට?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"ඔව්."

"කපිතාන් මිලර් ඛේදජනක ඉරණමකට මුහුණපා ඇති බව, මෙයින් සක්සුදක් සේ පැහැදිලි වෙනවා." මම කීවෙමි.

"ඇත්තෙන්ම ඔව් වොට්සන් මහත්මයා" පොලිස් නිලධරයා කීය. "අපරාධය කළ පුද්ගලයා කවුරු වුණත්, ඔහු මිලර්ට පහර දී

www.sinhalaelibrary.com

කබාය උදුරාගන්න උත්සාහ කරන්න ඇති. ඒ සඳහා වුණු සටනෙදි වෙන්න පුළුවන් ලේ ගලාගිය තුවාලයක් ඇතිවුණේ. කොහොම හරි කබා සාක්කුවේ තිබූ මුතු ආභරණ ආදිය අරගෙන, ඔහුට අනවශ්‍ය දේ ගඟට තල්ලුකරලා තියෙනවා."

"එතකොට හිස්වැස්ම ගඟට වැටුණේ කොහොමද?" මම ඇසීමි.

"හිස්වැස්ම පැළඳ තිබූ නිසත්, කබාය හැඳ තිබූ සිරුරත් ගඟේ අඩුවෙලා යන්න ඇති" ලෙස්ට්‍රේඩ් කීය. "ඇහැල්ලු දේ වතුරේ පාවෙලා ගිහින් ගං ඉවුරට ගොඩ ගැහුවා. බර දේවල් ගඟේ අඩියට කිඳා බැස්සට යළින් මතුවෙන්නෙ නැද්ද බලමු. මේ පිළිබඳව දැන් මම ජුලියා මිලර් මෙනෙවියට දැනුම්දිය යුතුයි."

"මිනිත්තු පහක් ඉන්න ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "කාරණා කිහිපයක් දැනගන්න ඇයව හමුවෙන්න බලාපොරොත්තුවෙන් තමා මමත් හිටියේ. අපි එකට යමු."

රෝද හතරේ කුලීරියක් කැඳවාගෙන, මිලර් පවුල පදිංචිව සිටි ඉම්ගොයා පෙදෙසේ කාසල් වීදිය බලා අපි පිටත්ව ගියෙමු. ඔවුන් පදිංචිව සිටියේ තරමක් විශාල භූමි තට්ටුවේ අලංකාර නිවසකය. එම ගෙය අයත් වන්නේ ද සර් ජේම්ස් බැරිංටන්ට බව ලෙස්ට්‍රේඩ් අපට මතක්කර දුන්නේය.

කිහිපවරක් සීනුව නාද කළ පසු, වයස්ගත සේවකයෙක් පැමිණ දොරටුව විවෘත කළේය. ඔහු අවුරුදු හැටපහක් හැත්තෑවක් පමණ වයස වූ කෙට්ටු මිටි තැනැත්තෙකි. තරමක් කුදු ගැසුණු ඔහු, උකුල් පෙදෙසට වැඩි බරක් නොයොදා ඇවිද යාමට, අත්වාරුවක් භාවිත කළේය.

අප විසිත්ත කාමරයට පිවිසෙද්දී නිවස තුළ සිටි වයස අවුරුදු තිස්පහ පමණ තරුණ කාන්තාවක්, ආචාරකොට අප පිළිගත්තාය. තරමක් තරබාරු සිරුරක් තිබූ ඇය, ඝන වීදුරු සහිත උපැස් යුගලක් පැළඳ සිටි තැනැත්තියකි. නිතර සූර්යාලෝකයට නිරාවරණය වීම නිසා, ඇගේ මුහුණේ රෝසපාට සම මත, තද දුඹුරුපාට තිත් රාශියක් විසිරී තිබිණ. සෙම්ප්‍රතිශ්‍යා රෝගියෙකුගේ ලක්ෂණ පෙන්වමින් අප ඇමතීමට පෙර ඇය සුදු ලේන්සුව නාසයට තබා ගත්තාය.

"වාඩිවෙන්න ලෙස්ට්‍රේඩ් මහත්මයා" ඇය කීවාය. "ඔබ මට සතුටුදායක ආරංචියක් අරගෙනයි එන්න ඇත්තෙ?"

"මට කණගාටුයි මිලර් මෙනෙවිය" ලෙස්ට්‍රේඩ් කීය. "ආරංචිය නම් එතරම් සතුටුදායක නැහැ. ගඟේ පාවී ගිය හිස්වැස්මක් හා





කබායක්, අපට තේම්ස් ගං ඉවුරේ තිබී හමුවුණා. මේක ඔබට හඳුනාගන්න පුළුවන්ද?"

ඔහු පාර්සලය විවෘත කර, ඇතුළත තිබූ දෑ තරුණියට පෙන්වීය. කබාය හා හිස්වැස්ම දුටු අනාම තරුණිය හඬා වැලපෙන්නට පටන්ගත්තාය.

"අම්මාගේ මරණයෙන් පස්සේ, මේ ලෝකෙ මට ඉතිරිවෙලා හිටි එකම නෑදෑයා මගේ අයියා විතරයි" ඇය කීවාය. "ඔහුට විපතක් වුණොත් මං ජීවත්වෙලා වැඩක් නෑ මහත්මයා" ඇය කඳුළු වගුරන අයුරු දුටු අපගේ සිත්වල ද දැඩි ශෝකයක් ඇතිවිය.

"කබාය මේ විදියට හමුවුණාට ඔහුට කරදරයක් වුණු බවට සලකුණක් නැහැ නේද මහත්මයා?" මිලර් මෙනෙවිය ඇසුවේ කඳුළු පිසලාගනිමිනි.

"නැහැ. ඔහුට දරුණු විපතක් වුණු බවට, තවමත් අපට ප්‍රබල සාක්ෂියක් ලැබිල නැහැ" ලෙස්ට්‍රේඩ් කීවේ ඇය සනසනසුලු ස්වරයෙනි. "මේ මගේ හිතවත් ෂර්ලොක් හෝම්ස් මහත්මයා සහ ඩොක්ටර් වොට්සන්. ඔවුනුත් අපේ සිද්ධිය පරීක්ෂා කරන අය. හෝම්ස් මහත්මයාට තිබෙනවාලු ඔබෙන් අසා දැනගන්න කාරණා කිහිපයක්."

"ඕනෑම දෙයක් අහන්න මහත්මයා. මගේ සොහොයුරා සොයාගන්න මං ඔබට ඕනෑම උදව්වක් කරන්නම්" ඇය කීවාය.

"ඔබට ස්තුතියි මිලර් මෙනෙවිය" හෝම්ස් කීය. "ඔබේ සොහොයුරා සොයා දෙන්න, අපි සෑම උත්සාහයක්ම යොදනවා. ඒ සඳහා මට උවමනායි ඔහු පිළිබඳ සම්පූර්ණ තොරතුරු දැනගන්න. ඊළඟට ඔබේ පවුල එංගලන්තයට සංක්‍රමණය වෙන්න තීරණය කළ හේතුව ආදිය දැනගන්න."

"මහත්මයා. අපි ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ අය" ඇය කීවාය. "මගේ පියා සේවය කළේ වික්ටෝරියා යුද හමුදාවේ. ඔහු සේවයේ යෙදී සිටියදී අපරාධකාරයෙකු එල්ල කළ වෙඩි පහරින් මියගියා. එතකොට මං පාසල් යනවා. අයියා පාසලෙන් අස්වුණා විතරයි. අම්මට රැකියාවක් තිබුණේත් නෑ. අපට ජීවත්වෙන්න ක්‍රමයක් තිබුණේ නැහැ. අපට පිහිටවීමක් හැටියට, අවුරුදු විස්ස වෙන්නත් කලින් අයියාව හමුදාවට බඳවාගන්න නිලධාරීන් තීරණය කළා. ඔහු ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන්



www.sinhalaelibrary.com

රාජකාරි කළා. ඒ නිසා අයියාට බොහොම ඉක්මනින් කපිතාන් තනතුර දක්වා උසස් වෙන්න හැකිවුණා.

ඔබ දන්නවා නේ, ඔස්ට්‍රේලියාවේ වැඩියෙන්ම රත්රන් ඉල්ලම් තියෙන්නේ වික්ටෝරියා ප්‍රාන්තයේ බව. රත්රන් ආකර වලින් හාරන ඉල්ලම්, මංකොල්ලකන අපරාධකරුවන් කල්ලියක් හිරභාරයට ගන්න, මගේ අයියා සහ ඔහුගේ සේනාංකය සමත්වුණා. මේකෙන් ඒ පළාතට වුණේ ලොකු සේවයක්. නමුත් ඊළඟට වුණේ අවාසනාවන්ත සිද්ධියක්. අපරාධකරුවන් පොලිස් හිරගෙය කඩාගෙන පැන ගියා. ඊළඟට ඔවුන් උත්සාහ කළේ අයියාව මරා දමන්නයි. ඔහුට දිගින් දිගටම මරණ තර්ජන ආවා. ඉතින් ඔහු හමුදා සේවයෙන් අස්වෙලා, අම්මාත් මාත් රැගෙන ටැස්මේනියා දූපතේ පදිංචියට ගියා. අපි පලතුරු වගාකිරීමෙන් විශාල මුදලක් උපයාගන්න අපට හැකිවුණා. අයියා මුදල් උපයාගෙන පලතුරු වතු මිලට ගත්තා. ඒත් අපට අපේ ගම් ප්‍රදේශය වූ වික්ටෝරියාවට යන්න වාසනාවක් තිබුණේ නැහැ, ඒ මැරකල්ලියෙන් අයියාගේ ජීවිතයට තිබූ මරණ තර්ජන නිසා.

මම කුඩාකාලයේ සිටම ඉරුවාරදයෙන් හා පීනස් රෝගයෙන් පෙළෙන කෙනෙක්. ඉතින් ටැස්මේනියාවේ අධික සීතල දේශගුණය මට හරිගියේ නැහැ. වෛද්‍යවරු මට නියම කළේ, වික්ටෝරියාවට ආපහු යන්න බැරිනම්, එංගලන්තය වැනි සනීපවත් දේශගුණයක් ඇති රටක ජීවත්වීම සුදුසුයි කියලයි. ඒ අනුව හෝබාට් නගරය සමීපයේ ඇපල් හා දොඩම් වත්තක් විකුණාදමලා, අයියා ඒ මුදලෙන් කොටසක්, රත්රන් ඉල්ලම් හාරන සමාගම් වල කොටස් මිලට ගන්න යෙදෙව්වා. ඊට පසු අපි අම්මා සමග එංගලන්තයේ පදිංචියට ආවා. අයියාගේ අරමුණ වුණේ, ලන්ඩන් නගරයේ පදිංචි වෙලා, ඔස්ට්‍රේලියාවෙන් පලතුරු ආනයනය කිරීමේ ව්‍යාපාරයක් පටන්ගන්නයි. නමුත් එංගලන්තයේ ජීවිතය අපට ගෙන ආවේ, අවාසනාව මිසක් වාසනාව නොවෙයි. මෙහේ ඇවිත් මාස දෙකෙන් අම්මා මියගියා. මගේ ලෙඩ රෝග සුව වුණේත් නැහැ. දැන් ඒ හැමටම වඩා මගේ අයියා ලොකු කරදරයක වැටිලා."

"කපිතාන් මිලර් සිකුරාදා රාත්‍රියේ විවාහ මංගල උත්සවයකට යන බව ඔබ දැන හිටියද?"





"ඔව් මහත්මයා. පැට්‍රීෂියා සමග ඇගේ මිතුරියකගේ මංගල උත්සවයකට ග්‍රෑන්ඩ් හෝටලයට යන බව කිව්වා."

"සෙනසුරාදා උදේ වෙනකොට ඔහු ආපසු ආවේ නැතිවුණාම, ඔබ පුදුමයට පත්වුණේ නැද්ද?" හෝම්ස් ඇසීය.

"නැහැ මහත්මයා" ඇය කීවාය. "ඔහු සමහර වෙලාවලට දින දෙක තුනක් මිතුරන් සමග නැවතී ඉන්නවා. ව්‍යාපාර කටයුතු සැලසුම් කරගන්න ඔහු එංගලන්තය පුරා සංචාරය කළා. ඒ නිසා මගේ හිතේ සැකයක් ඇතිවුණේ නැහැ."

"ඒ වුණාට බදාදා වෙන තුරුත් ඔහු ආපසු ආවේ නැතිවුණාම ඔබ කලබල වුණා?"

"ඔව් මහත්මයා. ඔහු කොහේ ගියත් මට විදුලිපුවතක් හරි එවනවා. මෙවර එහෙම කිසිවක් ලැබුණේ නැහැ. අනෙක මට යන්තමට මතක තිබුණා, පැට්‍රීෂියා ඇගේ ඥාතීන් සමග නෝෆෝක් ප්‍රාන්තයට විනෝද ගමනක් යන්න හිටි බව. ඒ බව අයියා මට කලින් කියා තිබුණා. ඉතින් මට හිතුණා අයියා ඇය සමග එහේ ගියාවත්ද කියලා. ඒ වුණත් ඔවුනට ආපහු එන්න කාලය හරි. ඒකායි ඒකටත් මං ඔවුන්ගේ නිවසට දුරකථනයෙන් කථා කළා. එයාට පිළිතුරු දුන්නේ ඇගේ මල්ලී, මයිකල්."

"මං නෝෆෝක් ඉඳලා ආපහු ආවේ ඊයේ. පැට්‍රීෂියා තවමත් ලන්ඩනයට ආපහු ආවෙ නෑ. ජූලියා ඇයි කථා කළේ?" ඔහු ඇහුවා.

"මගේ අයියා ක්‍රිස් තවමත් ගෙදර ආවෙ නැහැ. එයා පැට්‍රීෂියා එක්ක නෝෆෝක් විනෝද ගමනට ගියාද?"

"නෑ නෑ. ඔහු ඒ ගමනට ආවෙ නෑ. සිකුරාදා හැන්දෑවේ දක්කට පස්සේ මට තවමත් ක්‍රිස්ව හමුවුණේ නෑ. ඇයි ජූලියා ක්‍රිස් තවමත් ගෙදර ආවෙ නැද්ද?" ඔහු ඇසුවා.

"අයියාගෙන් කිසිම ආරංචියක් නැතුව මං මේ හොඳටම භයවෙලා ඉන්නේ. වෙනදාට කොහේ ගියත් ඔහු විදුලිපුවතක් නොඑවා ඉන්නෙ නෑ. මයිකල්ට හොඳටම විශ්වාසද සිකුරාදා රැයින් පස්සේ ක්‍රිස්ව දක්කෙ නැහැ කියලා?" මං ඇහුවා.

"එදා හැන්දෑවේ මංගල උත්සවයට ඉස්සර වෙලා, අක්කා ක්‍රිස් එක්ක හෝටලයට එද්දී, මං එතැන හිටියා. ඔවුන් ඇතුළට යද්දී මං සැවෝයි සමාජශාලාවට ගියා. ඊට පස්සෙ මං ගෙදර යද්දී ඒ දෙක විතර වෙන්න ඇති. ඊළඟට සෙනසුරාදා උදේ 9.15 දුම්රියෙන් අපි නෝෆෝක් බලා ගියා." ඔහු කිව්වා.



www.sinhalaelibrary.com

"ඉතින් හෝම්ස් මහත්මයා මගේ හිතේ ලොකු භයක් ඇතිවුණා. අයියාට මොනවා හරි කරදරයක් වෙලාද කියල මට සැක හිතුණා. ඒ නිසයි මම ඊයේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට යන්න තීරණය කළේ."

"ඔබේ අයියා නිතර ආශ්‍රය කරන මිත්‍රයො වෙන කවුරු හරි නැද්ද? ඔහුගේ ව්‍යාපාරික කටයුතුවල හවුල්කාරයො? නැත්නම් සමාජශාලාවේ යාළුවො?" හෝම්ස් ඇසීය.

"එහෙම නමින් කියන්න තරම් අයියගේ යාළුවෝ හෝ හිතවත් අය ගැන මං දන්නෙ නැහැ මහත්මයා" ඇය කීවාය. "ඔහුගේ ළඟම සහ එකම මිත්‍රයා වුණේ මයිකල් විතරයි මම දන්නෙ."

"මෙතැනින් ඉදිරියට කපිතාන් මිලර්ව හොයන්න අප ගතයුත්තේ මොන වගේ ක්‍රියා මාර්ගයක්ද කියල ඔබට යෝජනා කරන්න පුළුවන්ද?" හෝම්ස් ඇසීය.

"මට එහෙම මොකවත් හිතාගන්න බැහැ මහත්මයා. ලෙස්ට්‍රේඩ් මහත්මයාගෙ කීම නිසා මං අද මේ දැන්වීම පුවත්පත් වලට භාරදුන්නා. අද හවස හා හෙට උදේ පුවත්පත් වල මෙය පළවේවි." ඇය පුවත්පත් දැන්වීම සඳහා ලියූ සටහන හෝම්ස් අතට දුන්නාය.

**සොයාදුන් කෙනෙකුට පවුම් දහයක තෑග්ගක්.**

**ඔස්ට්‍රේලියාවේ සිට පැමිණ ලන්ඩනයේ පදිංචිව සිටි කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් හෙතෙම, සිකුරාදා රාත්‍රියේ සිට ආගිය අතක් නැත. ඔහුගේ වයස අවුරුදු තිස්තුනයි. උස අඩි හයක් පමණ. මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් ඇත. හිස කෙස් කළුය. මැදින් බෙදා දෙපසට පීරා ඇත. අන්තිම වරට දකින විට හැඳ සිටියේ....**

"බලමු. මේකට මොනවා හරි ප්‍රතිචාරයක් එන්න ඉඩතියෙනවා." මගේ මිතුරා කීවේ එතැනින් පිටවී යාම සඳහා අසුනෙන් නැගිටිමිනි. ලෙස්ට්‍රේඩ් ආපසු ස්කොට්ලන්ඩ්යාඩ් වෙත යාමට සූදානම් විය. ඔහු [illegible] තිබූ කපිතාන් මිලර්ගේ යයි සැක කළ ඊන්වන් සිගරට් [illegible] පැකැට්ටුව, හෝම්ස් ඉල්ලා ගත්තේය. අපි ආපසු නිවහන බලා ආවෙමු.

"මේ වතාවේදී නම් ලෙස්ට්‍රේඩ් හරි මාර්ගයට වැටිලා වගෙයි" හෝම්ස් කීවේ ඔහුගේ සුපුරුදු පයිප්පය ගිනිදල්වන වෙත ළං කරගනිමිනි.





"මොකක්ද ඔබ එයින් අදහස් කළේ?" මම ඇසීමි.

"කපිතාන් මිලර් අවසන් ගමන් ගිහින්ද? කියල, මගේ හිතේත් සැකයක් ඇතිවෙනවා වොට්සන්" හෝම්ස් කීවේ පයිප්පයෙන් දුම්වැලි හෙළමිනි. "අපට පෙනෙන හැටියට මිලර්ට ඉඳල තියෙන එකම මිත්‍රයා මයිකල් බැරිංටන් විතරයි. ඔහු මොන ආකාරයේ පුද්ගලයෙක්ද කියන එක අපි හොඳින් දන්නවා. ව්‍යාපාර සඳහා මිලර් රටපුරා සංචාරය කර ඇති බව පෙනෙනවා. ඔහු කෝටිපතියෙක්. ආශ්‍රය කළේ සමාජශාලා වලට සම්බන්ධ අය...."

කතාව නැවැත්වූ හෝම්ස් කල්පනා කරන්නට පටන්ගත්තේය. ඔහුගේ සිතුවිලි ගලාගිය ආකාරයට යම් බාධාවක් ඇති වූ අයුරකි.

"හෝම්ස් ඔබ කියන්නේ [illegible] ඔහු ලන්ඩනයේ පාතාල ලෝකය එක්ක සම්බන්ධකම් පැවැත්තුවා; පසුව මැරවරයෙක් අතින්ම මැරුම් කන්න ඇති කියලද?" මම ඇසීමි.

"ආශ්‍රය කළේ මයිකල් බැරිංටන් නිසා එහෙම වෙන්න ඕනෑමත් නැහැ" හෝම්ස් කීවේය. "නමුත් මං හිතන්නේ නෑ පැට්‍රීෂියා මෙනෙවිය මිලර්ට, තමාගෙ යන්න ඉඩදෙන්න ඇති කියලා. මොන කාන්තාවද කැමැති තමන්ගේ සැමියා පාතාල ලෝකයේ මැරවරයෙක් වෙනවා දකින්න. සර් ජේම්ස් බැරිංටන්ගෙන් පැට්‍රීෂියාට විශාල ධනයක් හිමිවෙන බවට සැකයක් නෑ. කපිතාන් මිලර් කොහොමටත් කෝටිපතියෙක්. ඔහුට සමාජයේ වැදගත් තැනක් තියෙනවා. ඒ නිසා ඔහු මුදල් ඉපයීමේ අරමුණෙන් වැරදි මාර්ගයේ යාවි කියල හිතන්නත් අමාරුයි."

කතාව අවසන් කළ හෝම්ස් ගෑස් පහනේ දීප්තිය වැඩිකොට, ඔහු ප්‍රබල උත්තල කාචයෙන් සිගරට් අසුරණය පරීක්ෂා කිරීමට පටන්ගත්තේය. ඒ කටයුත්ත ඔහු ඉක්මනින් අවසන් කළේය.

"අද හවස හයට පැට්‍රීෂියා මෙනෙවිය හමුවෙන්න යන්න ඔබ ලෑස්ති නොවැ වොට්සන්? හඩ්සන් මහත්මිය දවල් කෑම සූදානම් කරන අතරේ මම [illegible]ඩ් වීදියට ගිහින් එන්නම්" මගේ මිත්‍රයා ඇඳුම් මාරුකොට [illegible] නිවසින් පිටවී ගියේය.

ඔහු ආපසු පැමිණෙන විට සවස දෙක පමණ වී තිබිණ. ගිය කටයුතු සාර්ථක වූ බවක් ඔහුගේ මුහුණෙන් නම් නොපෙනිණ. ආපසු පැමිණ දහවල් ආහාරය අනුභව කළ ද, ඔහුගේ සිත තිබුණේ

වෙනත් තැනක බව මට වැටහිණ. හෝම්ස්ගේ සිතුවිලි දාමය නොබිඳ මම සවස පුවත්පත කියවීමට පටන්ගතිමි. කපිතාන් මිලර්ගේ අතුරුදන්වීම පිළිබඳ දැන්වීම එහි පළවී තිබිණ.

තවත් පැයක් ගතවීමට පෙර හෝම්ස් නමට විදුලි පුවතක් ලැබිණ. "ඔක විවෘත කරලා බලන්න වොට්සන්" ඔහු කීවේ හඩ්සන් මහත්මිය එය මා අතට පත්කරද්දීමය.

"අලුත් වැදගත් සාක්ෂියක් මතු වී ඇත. කපිතාන් මිලර්ගේ නිවසට වහාම එන්න.

ලෙස්ට්‍රේඩ්."

"මොනවා?" මගේ මිතුරා හුනස්නෙන් නැගිටමින් අතිශය කුතුහලයට පත්විය. "ඔහු මෙහෙන් නැවතී අපට එහේට එන්න කියලා තියෙන්නේ, ඒ නිවස අවටින් සාක්ෂියක් හමුවෙලාද?"

ඉක්මනින් හැඳ පැළඳගෙන අපි කුලීරියකින් පිටත්වී ගියෙමු. මිලර් නිවසේ ඉදිරිපස ගේට්ටුව විවෘත කර තිබිණි.

"හෝම්ස් මහත්මයා. මං දුරකතනයෙන් ඔබව අමතන්න හැදුවා" ලෙස්ට්‍රේඩ් කීවේ අප පිළිගනිමිනි. "ඒත් ඒක ක්‍රියා කළේ නැහැ. මේ අලුත් යන්ත්‍ර සූත්‍ර ගැන කවදා අපට විශ්වාසය තියන්න පුළුවන් වේවිද මන්දා."

"ඇයි මොනවා හරි අලුත් හෝඩුවාවක් ලැබුණද?"

"ඔන්න, මෙතෙක් සාක්ෂි නොදුන් සාක්ෂිකාරයෙක් අප ඉදිරියට ආවා. ඔහුව හැඳින්වන්න මිලර් මෙනෙවිය" ලෙස්ට්‍රේඩ් කීය. ජුලියා මිලර් සීනුව නාද කළාය. කාමරය තුළට පැමිණියේ උදයේ අප එවුනුවෙන් ගේට්ටුව විවෘත කළ, මදක් කුදු ගැසුණු වයස්ගත සේවකයාය.

"මේ ඉන්නේ ජෝන් රයිෆල්" ලෙස්ට්‍රේඩ් කීය. "කපිතාන් මිලර්ගේ විශ්වාසවන්ත සේවකයා. අප නොදන්නා යමක් ඔහු දැක තිබෙනවා. අප ගෙදරින් ගියාට පස්සෙයි, ඔහු ඒ බව මිලර් මෙනෙවියට කියා තියෙන්නේ. එතකොට ඇය තමා මාව කැඳෙව්වේ. මා සමග කියූ හැම දෙයක්ම මේ මහත්වරුන්ටත් කියන්න රයිෆල්."

ඔහු තරමක් අපහසුවෙන් මෙන් විසිත්ත කාමරය මැදටම ඇවිද ආවේය. මීළඟට ඔහු අසල වූ පුටුවක හිඳගත්තේය.





"ජෝන්. ඔබ දුටුදේ බය නැතුව මේ මහත්වරුන්ට කියන්න" මිලර් මෙනෙවිය කීවාය. "කවුරු හරි ඔබට තරවටු කරාවි කියල කාරණා හංගාගෙන ඉන්න එපා. මට කීව හැමදෙයක්ම ආයෙත් කියන්න."

"මට කෑම කාමරේ නින්ද යන්න ඇති මහත්මයා..... හැන්දෑවේ මට හරි මහන්සියක් දැනුණා." ඔහු කතාව ඇරඹුවේ වෙව්ලන ස්වරයකිනි.

"ඔබ ඔය කියන්නේ කවදා කොයි වෙලාව ගැනද රයිෆල්?" ලෙස්ට්‍රේඩ් කථාවට බාධා කළේය. "මුල ඉඳලම පටන්ගන්න."

"මං කිව්වේ ගිය සිකුරාදා රෑ ගැන මහත්මයා. මං කෑම භාජන ටික මේසෙ උඩින් අස්කරගෙන, කුස්සියට ගෙනිහිං කෑම කෑවා. කාලා හාන්සි පුටුවේ ටිකක් වාඩිවුණා. මට නින්ද යන්න ඇති මගේ හිතේ. එකපාරටම සීනුව නාදකරනවා ඇහිලා මට ඇහැරුණා. මං එතකොට වෙලාව බැලුවා. රෑ දොළහ පහුවෙලා. මං දැනගත්තා ඒ කපිතාන් වෙන්න ඇති කියලා. එතුමා හුඟක් දවස්වලට ගෙදර එන්නෙ රෑ වෙන නිසා, ඉස්සරහ දොර ඇරගෙන එන්න ඔහු ළඟ වෙනම යතුරක් තිබුණා. ඒ වුණත් මේ යතුර ඔහුට අමතක වෙන අවස්ථා බොහොමයි. ඉතින් මං ශාලාවේ ජනේලයෙන් බැලුවා. කපිතාන් කරත්තයෙන් බහින හැටි දුටුවාම මම පිටිපස්සෙ දොර ඇරගෙන එළියට බැස්සා."

"ඒ ඇවිත් හිටියෙ කපිතාන් නම්, ඇයි ඔබ ඉස්සරහ දොර අරින්නෙ නැතුව පිටිපස්සෙ දොර ඇරියෙ?" හෝම්ස් ඇසීය.

"කපිතාන් මට කියල තියෙන්නෙ. රෑට කොයි වෙලාවකවත්, ආවෙ කවුද කියල බලන්නෙ නැතුව, එකපාරටම ඉස්සරහ දොර අරින්න එපා කියලයි. එක් දවසක් එහෙම දොර ඇරලා, මට හොඳටම බැණුම් අහන්න වුණා. ඉතින් මං සාලයේ ජනෙල් වීදුරුවෙන් මුලින්ම බලනවා. ඊට පස්සේ පිටුපස දොර ඇරලා ගිහින් බලලා තමයි ඉස්සරහා දොර අරින්නේ.

ඉතින් මං පිටුපස දොරෙන් ගිහින් බලනකොට ඒ කපිතාන් තමයි. ඔහු ආව කුලී රථය මිදුලෙ හරවාගන්න රියැදුරා උත්සාහ කළා. කපිතාන් එතැනුරු මිදුලෙ බලාගෙන උන්නා කවුරු හරි එතුමාට දකින්න ලැබිලා. ඉතින් කපිතාන් ගෙට ඇතුළුවුණේ නැහැ. ඔහු ගියා ඒ හිටි එක්කෙනා එක්ක කථාකරන්න."



www.sinhalaelibrary.com

"ඔහු මොන වගේ කෙනෙක්ද?"

"මං ඔහුගේ මුහුණ දැක්කෙ නෑ මහත්මයා."

"ඔහු හැඳ පැළඳ සිටියේ කොහොමද?"

"සාමාන්‍ය විධියට කලිසම් කමිස ඇඳලා හිස්වැස්මක් පැළඳ හිටියා. සාමාන්‍ය උස. තරමක් මහත කෙනෙක්."

"ඒ අමුත්තා කපිතාන් සමග කථා කරනවා ඔබට ඇහුණද?"

"අමුත්තා කිව් කිසිදෙයක් මට ඇහුණෙ නැහැ. නමුත් කපිතාන් කිව් දේවල් මට ඇහුණා."

"කපිතාන් මොනවද කිව්වේ?"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මේ මයික් නේද? කපිතන් ඇහුවේ එහෙමයි."

"ඉතින්?"

"ඊකට අමුත්තා පිළිතුරක් දෙන්න ඇති. නමුත් මට ඒක ඇහුණෙ නැහැ. ඇත්තම කියනවා නම් මගේ කන් ඇහීම ඇස් පෙනීම ටිකක් දුර්වලයි මහත්මයා. ඊළඟට කපිතාන් මෙහෙම කිව්වා:

"මයික් ඔබ මේ වෙලාවෙ මෙතන මොකද කරන්නෙ?"

ඊට පස්සෙ කපිතාන් මට මෙහෙම කිව්වා.

"ඉස්සරහ දොර දැන්ම අරින්න උවමනා නැහැ ජෝන්. දොර වහගෙන නිදාගන්න. මං එන්න තව ප්‍රමාද වෙයි."

එහෙම කියූ ඔහු අඳුරේම, ඒ අමුත්තා එක්ක ගේට්ටුව දිහාට ගියා."

"මයික් කියන නමින් ඔහු කථාකළේ කාට කියලද ඔබ හිතන්නෙ?" හෝම්ස් ඇසීය.

"සැකයක් නෑ, මේ ගෙවල් අයිති බැරිංටන් මහත්තයාට වෙන්න ඇති. මහත්තයා 'මයික්' කියල අමතන වෙන කෙනෙක් මම දන්නෙ නෑ."

"මයිකල් බැරිංටන් මහත්මයා වෙනදාවත් මධ්‍යම රාත්‍රියට එනවද කපිතාන් හමුවෙන්න?"

"මධ්‍යම රාත්‍රියට නම් ඇවිත් නැහැ. රෑ නවයට දහයට වගේ ඇවිත් තියෙනවා."

"එහෙම ආවම ඉස්සරහ දොර ඇරලා, ඔහුව විසිත්ත කාමරයට කැඳවාගෙන එනවා ද?"

"ඔව්. කපිතාන් ගෙදර නොහිටියොත් විසිත්ත කාමරයේ වාඩිවෙලා ඉන්නවා. දවල් වෙලාවක නම් ජුලියා නෝනා සමග කතාබහ කරනවා."





"බැරිංටන් මහත්මයා එදා රෑ සීනුව නාද කරල ගෙට ඇතුළු නොවුණෙ ඇයි කියල ඔබට කියන්න පුළුවන්ද?"

"මම දන්නෙ නැහැ මහත්මය. සමහර විට අපේ නින්දට බාධා නොකර ඉන්න ඔහුට හිතෙන්න ඇති."

"මේ සිද්ධිය මීට කලින් ජුලියා නෝනාට කියන්න ඔබ නොහිතුවේ ඇයි?"

"ඒකෙ ඒ තරම් වැදගත්කමක් මට පෙනුනේ නෑ මහත්මයා. ඒ දෙන්නා හොඳම යාළුවෝ. මේ ගේ අයිතිත් ඔහුනට. අපේ කපිතාන්, මයික් මහත්තයාට ලොකු මුදල් ප්‍රමාණෙ දෙන බව ජුලියා නෝනාට කිව්වා මට ඇහිල තියෙනවා. අනෙක අපේ මහත්තයා බදින්න හිටියෙත්, මයික් මහත්තයාගෙ අක්කනේ."

"හොඳයි රසල් දැන් ඔයාට යන්න පුළුවන්" ලෙස්ට්‍රේඩ් කීය. "හෝම්ස් මහත්තයා, දැන් ඔබ මොකද කියන්නෙ?"

එයට හෝම්ස්ගෙන් පිළිතුරක් නොලැබිණ. ලෙස්ට්‍රේඩ් යළිත් කථා කළේය.

"හිල්ටන් හවුස් සිට පයින්ම ගෙදර එන්න තීරණය කළ කපිතාන් මිලර්, කුමක් හරි හේතුවක් නිසා කුලීරියක ඇවිත් තියෙන බවයි දැන් පෙනෙන්නෙ. මොකක්ද ඒකට හේතුව? හොර තක්කඩින් කියා සැකකරන්න පුළුවන් මිනිසුන් ඒ හරියේ ගැවසීමද? එහෙමත් නැත්නම් අපට හිතාගන්න අමාරු වෙනත් කාරණයක්ද? ඒ මොනව වුණත් ඔහු මුතු ආභරණ කට්ටලයත් සාක්කුවේ දමාගෙන ගෙදර ආවා. නමුත් ගෙට ඇතුළු නොවී මයිකල් බැරිංටන් සමග කොහේද ගියේ? හෝම්ස් මහත්මයා. ඔබේ උපකල්පන හා සිද්ධාන්ත ඉදිරිපත් කරන්න මේක හොඳ වෙලාවක් ඇයි ඔබ මොකුත් නොකියන්නෙ?"

මඳ වේලාවක් නිහඬව ලෙස්ට්‍රේඩ් දෙසම බලා සිටි මගේ මිත්‍රයා අනතුරුව පොලිස් නිලධාරියා ඇමතුවේය.

"ලෙස්ට්‍රේඩ්. ඔබ කියනවා සිද්ධිය වුණේ මේ පිළිවෙළට; කපිතාන් මිලර්ට අත්වුණු ඉරණම මෙකයි; අපරාධකාරයා අහවලා; ආදී වශයෙන්. සිද්ධිය ඒ ආකාරයට යළි ගොඩනංවාගන්න ඔබට හැකිවුණා. නමුත් මට ඒක තවමත් කරගන්න බැරිවුණා. මෙහෙක අගක් මුලක් මට තවමත් තේරුම් ගන්න බැහැ. තිබෙන පැටලීම ලිහාගන්න මට තවමත් බැරිවුණා. ඉතින් කොහොමද මං උපකල්පන ඉදිරිපත් කරන්නෙ?..."



www.sinhalaelibrary.com

ඒ අවස්ථාවේ හෝම්ස්ගේ කතාවට බාධාකරමින් විසිත්තකාමරය තුළට ඇමිණියේ සේවක රැයිගල්ය.

"මහත්මයා, පත්තරේ දැන්වීමට ආරංචියක් අරගෙන කෙනෙක් ඇවිත් ඉන්නවා."

"ඔහුට ඇතුළට එන්න කියන්න" ලෙස්ට්‍රේඩ් කීය.

කාමරයට ඇතුළුවූයේ තරුණ කුලීරථ රියැදුරෙකි.

"මහත්මයා, මං ආවේ "ස්ටාර්" පුවත්පතේ තිබුණු දැන්වීම ගැන."

"ඔව්" හෝම්ස් තරුණයා ඇමතුවේ කාරුණික ස්වරයෙනි. "අපට ඉස්සර වෙලාම කියන්න ඔබේ නම මොකක්ද කියල. ඊට පස්සේ ඔබ දන්න තොරතුරු කියන්න."

"මහත්මයා, මගේ නම හැරල්ඩ් පෙලාම්. මං ඊගල් කුලීරථ සමාගමේ රියැදුරෙක්. එදා සිකුරාදා රෑ මම ග්‍රෑන්ඩ් හෝටලයේ බාල් නැටුම් ශාලාව ළඟ මගේ රිය නවත්වාගෙන හිටියා. රෑ එකොළහමාර පහුවෙද්දී ජෝඩුවක් එළියට ආවා. මහත්මයා උස කඩවසම් කෙනෙක්. ඔහුගේ අතේ තිබුණා කළුබෝයි තොප්පියක්. ඔහුගේ පෙනුම පත්තරේ තිබුණු විස්තරයට හොඳට ගැළපෙනවා. නෝනත් උසයි ලස්සනයි. ඔවුන් එන්න ඇත්තේ හෝටලයේ තිබුණු මංගල උත්සවයේ බාල් නැටුමට සහභාගි වෙලා. මාව කුලියට කරගත්තේ මේෆෙයා වල හිල්ටන් හවුස් මන්දිරයට යනු කියලා."

"කරත්තයේ එද්දී ඔවුන් කළ කතාබහ ඔබට මොකුත් ඇහුණද?"

"නෑ මහත්මයා මට මොකුත් ඇහුණෙ නෑ."

"කථාව දිගටම කියන්න."

"හිල්ටන් හවුස් මන්දිරයේ ලොකු ගේට්ටුවෙන් ඇතුළුවෙලා අපි ගේ ළඟටම ගියා. දෙන්නාම කරත්තයෙන් බැස්සා. මට මුදල් ගෙව්වෙ නැති නිසා මං හිතුවා මහත්තයා කරත්තයෙන්ම ආපහු යාවි කියල. ඉතින් මං බලාගෙන හිටියා. දෙන්නම අත් වලින් අල්ලාගෙන ගේ ළඟට ගිහිං දිගටම කථාකළා. පස්සෙ නෝනා මහත්මයාට සුබ රාත්‍රියක් පතලා ගෙට ගියා. මහත්මයා ඇවිත් මට කථා කළා.

"රියැදුරු මහත්තයෝ. මං හිතාගෙන හිටියේ කරත්තයෙන්ම ගෙදර යන්නයි. හැබැයි යන්න තියෙන්නෙ ටික දුරයි. ඒ නිසා මං පයින්ම යනවා. කීයද ඔයාගෙ ගාස්තුව?" ඔහු ඇසුවා.





මං කුලිය කිව්වාම ඔහු මුදල් ගෙව්වා. ඊළඟට මම හෙමින් හෙමින් ඉදිරියට ගියා. ගේට්ටුවෙන් පිටවෙලා යාර පහළොවක් විස්සක් යද්දී මගේ කරත්තයේ දෙපැත්තෙ දල්වා තිබුණු පහන් වල එළිය අඩු බව මට පෙනුණා. එහෙම යෑම අනතුරුදායකයි. ඉතින් මං කරත්තය නවත්වලා, ලාම්පු වල දැල්ල සකස් කරන්න පටන් ගත්තා. එහෙම කරද්දී අන්ධකාරයේ මට අඩි ශබ්දයක් ඇහුණා. ඒ බලද්දී අර මහත්මයාමයි.

ඔහු කිව්වා "මං හිතාගෙන හිටියේ පයින් යන්නයි. පාර නුහුරු නාඑයි. හරිම අන්ධකාරයි. ඒ නිසා කරත්තෙන් යන එක පරෙස්සම්. මාව කාසල් වීථියේ අංක 73 ගෙදරට ගිහිං දමන්න."

මං ඔහුව කැඳවාගෙන ආවෙ මේ ගෙදරට. ගේට්ටුව ඇරලයි තිබුණෙ. මං කරත්තය වත්ත ඇතුළට ගත්තා. අර ඉස්සරහ මල්පාත්ති ළඟ කරත්තය නැවැත්තුවා. ඔහු කරත්තයෙන් බැහැලා මට සුභරාත්‍රියක් කියලා ගිහින් ගෙදර සීනුව නාද කළා. මං කරත්තය හරවාගන්න හැදුවා විතරයි, අන්ධකාරයේ මල්පඳුරු අස්සෙ ඉඳල මහත්මයෙක් එළියට ආවා."

"මොන වගේ මහත්තයෙක්ද?"

"කලිසම් කබා ඇඳලා, හිස් වැස්මක් දමා ගනිපු ටිකක් මහත මහත්තයෙක්. එච්චරම උස නෑ."

"එයා මොනවද කිව්වෙ?"

"එයා මොකුත්ම කිව්වෙ නෑ. මං එක්ක ආව මහත්මයා කථාකළා.

"දෙයියන්ට ඔප්පුවෙච්චාවෙ. මේ මයික් නේද?"

එතකොට අර අනික් මහත්තයා බොහොම හෙමින් මොනවද කිව්වා. ඒක මට ඇහුණෙ නෑ.

ඊළඟට මං පිටත්වෙලා යන එක විනාඩියක් ප්‍රමාද කළා. ඒ මොකද මේ දෙන්න මගේ කරත්තෙන් ආපහු නගරයට හෝ වෙන කොහේ හරි යන්න කථාකරන්න ඉඩ තියෙන නිසා. මා එක්ක ආව මහත්තය කළුවරේ ඉඳගෙනම මෙහෙම කියනවා මට ඇහුණා.

"මෙතන මොනවා කරනවද මයික් මේ වෙලාවෙ?"

මේ මයික් කියන නම මට හොඳට මතක හිටියා මහත්මයා. ඒ මොකද මගේ ලොකු පුතාගෙ නම මයිකල්. අපි ඔහුට ගෙදරට කතාකරන්නෙ මයික් කියලා."



www.sinhalaelibrary.com

"ඉතින්?"

"ඔවුන් දෙදෙනා අන්ධකාරෙට වෙලා සාකච්ඡාවක් පටන් ගත්තා. මං තවත් එතැන රැඳී හිටීමෙන් වැඩක් නැහැ කියල මට හිතුණා. ඉතින් මං යන්න ගියා."

"කළුවරේ ඉඳල ආව අනෙක් මහත්තයා ආයෙමත් දැක්කොත් ඔබට හඳුනන්න පුළුවන්ද?" හෝම්ස් ඇසීය.

"ඔහුගේ මුහුණ මට කොහොමටවත් පෙනුණේ නැහැ මහත්මයා. ඒ නිසා මට විශ්වාසෙට අඳුනාගන්න බැරිවෙයි."

"ඔබට තියෙනවද වෙන මොනාව හරි කියන්න?" හෝම්ස් ඇසීය.

"වෙන මොනවත් නැහැ මහත්මයා."

"හොඳයි ඔබට ස්තුතියි මැඩම්" හෝම්ස් කීය. "අපට උවමනාවුණොත් අපි ඔබව යළි හමුවෙනවා. කරුණාකර ඔබේ ලිපිනය අපට දෙන්න."

පොරොන්දු වූ තෑග්ග මුදල මිලර් මෙනෙවියගෙන් ලබාගත් වියැදුරා පිටත්වී ගියේය. ඒ සමගම මහලු සේවකයා ද කාමරයෙන් පිටවිය.

ගෘහසේවිකාව විසින් රැගෙන ආ තේ පානය කිරීමෙන් පසු, තමාට මිලර් මෙනෙවියගෙන් තවත් ප්‍රශ්න කිහිපයක් ඇසීමට ඇති බව හෝම්ස් ඇයට පැවසුවේය.

"ඔබේ මේ වයස්ගත සේවකයා කොහේ කෙනෙක්ද? ඔහු ඔබ ළඟ ඉන්නේ කොයි තරම් කාලයක ඉඳලද?"

"මං පුංචි කාලෙ ඉඳලම ඔහු අපේ පවුලෙ සේවකයෙක්" ඇය පිළිතුරු දුන්නාය. "මං හිතන්නේ අවුරුදු පහළොවක විතර කාලයක්, නැත්නම් ඊටත් වැඩියා ඔහු අපේ ළඟ. අපි ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා වල ඉන්න කාලෙත් ඊට පස්සේ ටැස්මේනියාවට යද්දීත් අපි එක්ක ආවා. බොහොම විශ්වාසවන්ත කෙනෙක්."

"ඒ වුණත් ඇයි ඔහු කපිතාන් පිළිබඳ කරුණ මීට කලින් ඔබට නොකිව්වේ?"

"ඒ ගැන මට අදහසක් නෑ හෝම්ස් මහත්මයා." ඇය කීවාය. "ඔහු කවදාවත් එතරම් බුද්ධිමත් කෙනෙක් නෙමෙයි. නමුත් අපට හරිම පක්ෂපාත, කීකරු සේවකයෙක්."

"ඔව් ඒක හරි" ලෙස්ට්‍රේඩ් කීය. "එහෙම පක්ෂපාත අය තමා, දීර්ඝ කාලයක් ස්වාමියාට ලැදිව සේවය කරන්නේ."





"ඔබට මේ ගෙදර ඉන්න අනික් සේවකයො කවුරුන්ද?"

"දැන් තේ අරගෙන ආ ස්මිත් මහත්මිය ඉන්නවා. එපමණයි. ඇයත් සේවයට බැඳුණේ ළඟදී. අපට එංගලන්තයේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමා සේවක ප්‍රශ්නය. ඔවුන් වැඩ කරන්නේ අඩුවෙන්; නමුත් වැටුප් වැඩි වැඩියෙන් ඉල්ලනවා. සති අන්තයට දවස් එකහමාරක් නිවාඩු ඕනලු. ඒ වුණත් ස්වාමියාට ගරුසරුවක් ඇතිව කථාකරන්නවත් ඔවුන් දන්නෙ නෑ." මිලර් මෙනෙවිය මෙය කියද්දී ඇය තරමක් කෝපයට පත්ව සිටි බැව් අපි දුටුවෙමු.

"හොඳයි" හෝම්ස් කීවේ සාකච්ඡාව අවසන් කිරීමට සූදානම් බව හඟවමිනි. "මට අවංකව, නිර්භයව කියන්න. ඔබේ සොයුරාගේ අතුරුදන්වීම ගැන ඔබට සැක කවුද? ඔබ හිතන්නේ මේ මයිකල් බැරිංටන් වගකිව යුතුයි කියලද?"

"මට ඒක හරියට කියන්න අමාරුයි මහත්මයා" ඇය කීවේ අතේ තිබූ ලේන්සුවෙන් දෙනෙත් පිස දමමිනි. "මගේ අයියා සමග ගනුදෙනු කළ, ළඟින් ආශ්‍රය කළ හිතවතුන් ඔහුට හිටියා නම්, ඒ මේ බැරිංටන් මහත්මයා පමණයි. ඔහු චරිතය ඒ තරම් හොඳ කෙනෙක නෙමෙයි කියල නම් මම අහල තියෙනවා. ඔහු සමග කතාබහට යන්න අයියා මාව ධෛර්යමත් කළේ නෑ. මට දැන් හැඟෙන්නෙ අයියාගේ අතුරුදන්වීමට ඔහු මොනයම් ආකාරයකින් හරි සම්බන්ධ වගේ කියලයි."

"එතකොට පැට්‍රීෂියා බැරිංටන් මෙනෙවිය? ඇය ගැන මොනවද ඔබ හිතන්නෙ?"

"ඇය මයිකල්ට ඉඳුරාම වෙනස් කෙනෙක් මහත්මයා" ඇය කීවාය. "පැට්‍රීෂියා හරි අවංක ගුණගරුක තැනැත්තියක්. කිසිම කපටි කෛරාටික කමක් නෑ. ඇය මගේ අයියට හරි ආදරයෙන් හිටියේ. ඔහුට මොනවා හරි බිහිසුණු අනතුරක් වෙලාදෝ කියල මං වගේම ඇයත් කම්පාවෙනවා."

අපි මිලර් මෙනෙවියගෙන් සමුගෙන පිටත් වී ආවෙමු. වෙලාව සවස හයට ළංව තිබිණ.

මයිකල් බැරිංටන්ට එරෙහිව අලුත් සාක්ෂි මතුවී තිබීම නිසා ලෙස්ට්‍රේඩ් සිටියේ දැඩි උද්යෝගයකිනි. හෝම්ස්ගේ උදව්වක් නොමැතිව මේ පරීක්ෂණය ආරම්භක ලෙස ඉදිරියට ගෙන යෑමට හැකි බැව් ඔහුට වැටහී තිබිණ. මේ පිළිබඳව අපේ පොලිස්

www.sinhalaelibrary.com

නිලධරයන්ගේ උපදෙස් ලබාගැනීමට ඔහු බලාපොරොත්තු විය. නමාට ආපසු ස්කොට්ලන්ඩ්යාඩ් බලා යාමට අවශ්‍ය බැවි නී පොලිස් පරීක්ෂකයා තුලීරියකින් පිටත්ව යද්දී, අපි හිල්ටන් හවුස් මන්දිරය වෙත ගමන් කළෙමු.

විශාල උද්‍යානයක් මැද පිහිටි හිල්ටන් හවුස් මන්දිරය, දවැන්ත මාලිගයක් බඳු ගොඩනැගිල්ලක් විය. මෙය දහනව වන සියවස මුලදී ඉදිකරන ලද්දේ, මහා ධනකුවේරයකුව සිට නැඟීගිය සර් ජෙරොමියුලස් බැරිංටන් විසින් බව් අපට අසන්නට ලැබිණ. ඔහුගේ වැඩිමහල් පුතුයා වූයේ සර් ජේම්ස් බැරිංටන්ය.

දුක්මුසු මුහුණෙන් අප පිළිගත් පැට්‍රීෂියා මෙනෙවියට අප සමග පවසන්නට අලුත් යමක් නොතිබිණ.

"හෝම්ස් මහත්මයා." ඇය කීවාය. "මං බලාපොරොත්තු වුණා ජුලියාගේ දනවීමට වත් මොනවා හරි අලුත් ආරංචියක් ලැබෙවි කියල."

"අපට ගං ඉවුරේ තිබී කබායක් හා හිස්වැස්මක් හම්බවුණා" හෝම්ස් කීය. "මෙන්න මේ සිගරට් අසුරණය ගැන ඔබට මොනවද කියන්න පුළුවන්?"

"දෙවියනේ!" පැට්‍රීෂියා මෙනෙවිය කීවේ අතිශය පුදුමයට පත් දෙනෙතිනි. "මේක ක්‍රිස්ගෙ උපන්දිනේට මං දුන්නු උපන්දින තෑග්ග. මේ තියෙන්නේ අපේ නම්වල මුලඅකුරු කැටයම් කරලා. මේක ඔහු කොයි වෙලේත් තබාගත්තේ කබායේ වම්පැත්තේ උඩසාක්කුවේ. එදා මංගල උත්සවය වෙලාවෙත් මේක ඔහුගේ අතේ තිබුණා. ඇත්ත කියන්න හෝම්ස් මහත්තයා. ඔබට ඔහුව හමුවුණාද? ඔහු ජීවතුන් අතර ඉන්නවද? ඒක මට කියන්න."

"ඔබ කලබල වෙන්න එපා" හෝම්ස් කීය. "ඔහු ජීවතුන් අතර ඉන්නවද නැද්ද කියන එක අපට තවමත් හිතාගන්න බැහැ. මේ සිගරට් අසුරණය සමග ඔහුගේ කබාය තේම්ස් ගං ඉවුරේ තිබී හමුවුණු බව ඇත්තයි. නමුත් ඒකෙන් කිසිදෙයක් නිගමනය කරන්න හැකියාවක් නැහැ. අපට ඔබේ සොහොයුරා හමුවෙන්න පුළුවන් වෙයිද?"

"ඔහු ඉන්නවා ඔහුගේ කන්තෝරු කාමරයේ" ඇය කීවාය. "වැඩ කටයුතු රාශියකට ඔහුට එළියට යන්න තියෙනවා කියල මයිකල් කිව්වා. නමුත් හවස ෂර්ලොක් හෝම්ස් මහත්තයා හමුවෙලා, ඊට පස්සේ ඕන වැඩකට යන්න කියා මං ඔහුව නවත්වා ගත්තා."





අප ඔහුගේ කන්තෝරු කාමරය වෙත කැඳවාගෙන යාම, ඇය නිවසේ සේවකයෙකුට පැවරුවාය. මෙතෙක් බොහෝ තොරතුරු අසා තිබුණත්, ඡායාරූපයකින් හෝ මා දැක නොතිබූ මයිකල් බැරිංටන් දැකීමට මම නොඉවසිල්ලෙන් සිටියෙමි.

සේවකයා දොරට තට්ටු කොට අප කැඳවාගෙන ඇතුළුවෙද්දී, බැරිංටන් කාමරයේ ඉහළ පහළ සක්මන් කරමින් සිටියේය. සම්මුඛ සාකච්ඡාව ඉක්මනින් අවසන් කර අප පිටත්කර හැරීමට, ඔහුට ද තිබුණේ නොඉවසිල්ලක් බව මම තේරුම් ගතිමි.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා, වොට්සන් මහත්මයා වාඩිවෙන්න" ඔහු කීවේ මේසය ඉදිරිපස වූ පුටු දෙක වෙත අත දිගු කරමිනි.

වයස අවුරුදු තිහට ළංව තිබුණත් ඔහුගේ මුහුණේ තිබුණේ නොමේරූ සුදුමැලි ඉරියව්වකි. උසින් අඩි අගමාරකට වැඩි නොවූ ඔහු මදක් තරබාරු වූ අතර, දුත් උම්බෙල කහටින් දුර්වර්ණ වී තිබිණ. ඔහුගේ බිඟාල රතු දෙනෙත් වලින් පිළිබිඹු වූයේ නොසාරධික කම්ද බිහිසුණු බවද නැත්නම් ඒ දෙකමද යන්න මට තේරුම් ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් ඒ වෙලාවේ නම් ඔහුගේ මුහුණේ තිබුණේ අපගේ පැමිණීම ගැන අප්‍රසාදය පළකරන හැඟීමකි.

"මං වැඩකටයුතු බොහොම අධික කෙනෙක්" ඔහු කීය. "පොලිස් පරීක්ෂකයන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් නාස්ති කරන්න මට කාලයක් නෑ. කරුණාකරලා ඔබට අහන්න තියෙන දෙයක් ඉක්මනින් අහන්න. පැට්‍රීෂියාගේ තර්ජනය නිසයි මං මෙපමණ වෙලාවක් වත් බලාගෙන හිටියේ."

"ඔව්. බැරිංටන් මෙනෙවිය ඒ බව කිව්වා." හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි. "මගේ ප්‍රශ්න මං ඉක්මනින් ඉදිරිපත් කරන්නම්. ඔබ මේ කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් හඳුනාගත්තේ කොහොමද?"

"මාස 4 කට කලින් ලැංහැම් හෝටලයේ පැවැත්වුණා සාදයක්. ඔහු මට මුලින්ම හමුවුණේ එහේදි."

"ඔබේ විදේශ සංචාරයෙදි, ඕස්ට්‍රේලියාවෙදි නෙමෙයි ද?"

"නැහැ නැහැ" බැරිංටන් කීය. "මං ඕස්ට්‍රේලියාවට ගිය වෙලේ අසනීපයකට මිලර් නම් වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ගත්තා. සාදයේදි හෝටලයේ කළමනාකරු මට මේ අමුත්තාව හඳුන්වා



www.sinhalaelibrary.com

දුන්නේ, මෙල්බෝන් නුවරින් පැමිණි කපිතාන් මිලර් කියල. එතකොට මං එක්වරම ඇහුවේ "ඔබ මෙල්බෝන් නුවර විශේෂඥ වෛද්‍ය කීත් මිලර්ගේ ඥාතියෙක්ද?" කියල. ඒකෙන් අප දෙදෙනා අතර හිතවත්කමක් ඇතිවුණා."

"ඔබ දෙදෙනා නිතර නිතර සැවෝයි සමාජ ශාලාවට ආව ගියා?"

"ඔව්."

"ඔහු ඔබේ මේ ගෙදරටත් නිතර ආව ගියා?"

"ඔව්."

"ඔහු ඔබේ සොයුරිය සමග පෙම් සබඳතාවක් ඇතිකරගෙන ඇය සමග විවාහ ගිවිසගත්තා?"

"ඔව්."

"ඒකට කැමැතිවෙලා ඒ දෙදෙනාට ඔබේ ආශිර්වාදය ලබාදුන්නා?"

"ඔව්."

"ඔබේ ණයතුරුස් ගෙවා දමීමටත් ඔහු විශාල වශයෙන් මුදලෙන් ආධාර කළා?"

"හෝම්ස් මහත්තයා, මං එකක් කියන්නම්" බැරිංටන් කීවේ තර්ජනාත්මක හඬෙනි. "ඔබ මේ හාරා අවුස්සන්නේ මගේ සහ මගේ පවුලේ පෞද්ගලික දේවල්. ඔහු අතුරුදන්වෙලා නම් මහන්සිවෙලා ඔහුව හොයාගන්න. මොකටද මගේ ණය තුරුස් ගැන, මං කන බොන ඒව ගැන හොයන්නේ?"

"කලබල වෙන්න එපා බැරිංටන් මහත්මයා." හෝම්ස් කීවේ නිවුණු ස්වරයෙනි. "අපි මේ හැමදෙයක්ම කරන්නේ ඔබේ සොහොයුරිය වෙනුවෙන් සහ රටේ නීතිය වෙනුවෙන්. මං ඇසූ ප්‍රශ්නයට ඔබෙන් සතුටුදායක පිළිතුරක් ලැබුණේ නෑ?"

"ක්‍රිස් මිලර් මට රන්පවුම් විශාල ගණනක් දුන්නා. ඒක ඇත්ත ඒවායේ ගණන් හිලවුත් ඕනෙද? ඒවත් ඕන නම් මං කියන්නම්" බැරිංටන් කීවේ කෝපයෙනි.

"ගණන් හිලවු දාන්න උවමනා නැහැ මහත්මයා" හෝම්ස් කීය. "ඔබ ඔහුව අන්තිමට දුටුවෙ සිකුරාදා බව මට අහන්න ලැබුණා. ඒ කොයි වෙලාවෙද?"

"රෑ හතට මම ග්‍රෑන්ඩ් හෝටලය ළඟට ගියා. එතැනදී."





"අන්තිම වරට ඔබ ඔහුව දුක්කේ එතැනදී බව හොඳට විශ්වාසද?"

"ඔව්."

"ඔබ එහි ගියේ මංගල උත්සවයට සහභාගි වෙන්නද?"

"නැහැ. මට ඒ උත්සවයට ආරාධනා තිබුණේ නැහැ. මං ගියේ හදිසි උවමනාවකට මුදලක් ඉල්ලා ගන්න, ක්‍රිස්ව හමුවෙන්න. උත්සවය පටන්ගන්නේ හතට බව මං දැනගෙන හිටියා."

"ඔබට ඔහුව හමුවුණාද?"

"ඔව්. ඔහු අක්කත් එක්ක කුලීරියකින් ඇවිත් බහිද්දී මට හමුවුණා. ඒ හතයි පහට නැත්නම් හතයි දහයට විතර. මගේ උවමනාව ඉටුකරගෙන මං යළිත් සැවෝයි සමාජශාලාව වෙත ගියා."

"ඔබේ පවුල සතු සුඛෝපභෝගී අශ්වකරත්ත තිබෙනවා" හෝම්ස් කීය. "එහෙම තියෙද්දී ඔවුන් මංගල උත්සවයට කුලීරියකින් ආවේ ගියේ ඇයි කියල ඔබට කියන්න පුළුවන්ද?"

"ඒක අහන්න ඕන ක්‍රිස්ගෙන්. මගෙන් නොවෙයි."

"ඒ වෙලාවෙ දුටුවට පස්සෙ ඔබ කපිතාන් මිලර්ව දුටුවෙම නෑ."

"නැහැ. මං දූන් සැරයක් කිව්වෙ."

"රාත්‍රී දොළහට, දොළහයි කාලට පමණ ඔබට ඔහු හමුවුණේ නැහැ?"

"නැහැ."

"ඔබ ඒ වෙලාවේ ඔවුන්ගේ ගෙදරට ගියෙත් නැහැ?"

"නැහැ."

"නමුත් රාත්‍රී දොළහට පමණ ඔබගේ පෙනුම තිබුණු කෙනෙක්, කාසල් වීථියේ මිලර් නිවස අසල ගැවසුණු බවට සාක්ෂියක් තිබෙනවා. ඒ ගැන ඔබ මොකද කියන්නෙ?"

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ මේක යකාගෙ වැඩක්නේ. කවුද ඔය බොරුව ගෙතුවේ? ජුලියාද? නැත්නම් අර නොණ්ඩි ගහන රයිගල් ද?"

"කවුරු කිව්වත් කමක් නෑ" හෝම්ස් කීය. "ඔබ ඒ වෙලාවෙ කාසල් වීථිය පැත්තෙ ගියේ නැද්ද?"

"කොහොමටවත් නෑ හෝම්ස් මහත්මයා. කවුරු හරි එහෙම කියනවා නම් ඒක පට්ටපල් බොරුවක්. මට උවමනා කරන මුදල රෑ හතට මගේ අතට ලැබුණා. ආයෙත් මං රෑ දොළහට ඔහු හමුවෙන්න යන්නෙ අහවල් දේකටද?"

"රෑ දොළහට පමණ ඔබ හිටියේ කොහේද කියල මං ඇහුවොත්?"

"ඒකට පිළිතුරු දීම මං ප්‍රතික්ෂේප කරනවා."

"ඔබ සැවෝයි සමාජශාලාවට ගිය බව කිව්වා." හෝම්ස් තීරෙව සන්සුන් අයුරෙනි. "අපි හිතමු ඔබ එහි කාඩ් ක්‍රීඩාවේ යෙදී හිටියා. නැත්නම් බිලියඩ් කාමරේ. නැත්නං අවන්හලේ. ඒ තැනක ඒ වෙලාවෙ ඔබ සමග හිටි මිත්‍රයින් කවුරුන් හෝ සඳහන් කරන්න. එතකොට ඒක ඔබට වාසියක්. අපට පහසුවක්."

"මහත්මයා. මේ සාකච්ඡාව අපි මෙතැනින් අවසන් කරමු. මං දැනටමත් ඔබ සමග ගත කළ කාලය හොඳටම ඇති."

"මගේ වැදගත්ම ප්‍රශ්නයට ඔබ පිළිතුරු නොදී හිටීම, ඔබට අවාසියට හිටින්න පුළුවන් බැරිංටන් මහත්මයා."

"එහෙම හිටපුවාවේ. ඔබට ශුභ රාත්‍රියක්!"

අපගේ සාකච්ඡාව එතැනින් අවසන් විය. අප ආපසු බේකර් වීථියේ නිවහන වෙත එන අතරදී ද, මගේ මිත්‍රයාගේ තිබුණේ දැඩි නිහඬබවකි. අපරාධකාරයා මයිකල් බැරිංටන් විය යුතුයයි ලෙස්ට්‍රේඩ් දිගින් දිගටම පැවසුවේය. එහෙත් සතුටුදායක සාක්ෂි නොමැතිව එය පිළිගැනීමට හෝම්ස් දක්වූයේ මැලි බවකි. නමුත් දැන් අපට පැහැදිලිවම පෙනී යන්නේ ලෙස්ට්‍රේඩ්ගේ නිගමනය නිවැරදි බවයි. නිවහන වෙත ආපසු පැමිණි පසු ද, මගේ මිත්‍රයා රාත්‍රී ආහාර ගැනීම පසෙක තබා දිගටම කල්පනා කළේය. රාත්‍රී නවයහමාර වෙද්දී ඔහු පයිප්පය පසෙකින් තබා සෝපාවෙන් නැගිට්ටේය.

"ඔබ ඉන්නේ ලොකු අසහනයකින්. එහෙම නේද හෝම්ස්?" මම ඇසීමි.

"ඔව් වොට්සන්. මේ ගැටලුව හරිහැටි නිරාකරණය කරගන්නා තුරු මගේ හිතට සහනයක් නැහැ. අපි කොයිතරමක් කාරණා ඇහුවද දැනුවද? ඒත් මේ හැමදේකම කොහේ හරි, පොඩි නොගැළපෙන තැනක් තියෙනවා. ඒක මොකක්ද කියල වෙන්කරගන්න මට අපහසුයි. නමුත් එහෙම අස්වාභාවික තැනක් තියෙනවා කියල මට හොඳටම විශ්වාසයි."

"ඇයි ඔබට එහෙම හිතෙන්නෙ?"

"අන්න ඒක තමා ප්‍රශ්නෙ. මොකක් නිසා මට එහෙම හිතුණද කියල පෙන්වා දෙන්න තවමත් මට හැකියාවක් නෑ. හොඳයි. මේක





අපටම තවත් පැහැදිලි කරගන්න, සිද්ධියේ එක් එක් අවස්ථා වුණු පිළිවෙළින් අපි යළි ගොඩනංවා බලමු.

කපිතාන් ක්‍රිස් මිලර් සහ පැට්‍රිෂියා මංගල සාදය සඳහා ග්‍රෑන්ඩ් හෝටලයට ළඟාවුණු තැනින් පටන්ගමු. එතැන බලාගෙන ඉන්නවා ඇගේ සොහොයුරා මයිකල්. ඔහු ඇවිත් ඉන්නේ තමාගේ අනාගත මස්සිනාගෙන් ණය මුදලක් ඉල්ලා ගන්න. ඒ කාරිය සාර්ථකව ඉටුකරගෙන ඔහු එතැනින් පිටත්වෙලා යනවා. ඔහු මේ සල්ලි ඉල්ලාගත්තේ මොකටද කියල අපි දන්නෙ නෑ. භාගවෙලාවට සූදු කෙළියට වෙන්න පිළිවන්. කොහොම හරි රෑ එකොළහමාරත් දොළහත් අතරේ කපිත්‍රාන් මිලර් හා ඔහුගේ පෙම්වතිය හෝටලයෙන් පිටවෙනවා. එවුන් කුලීරියකින් හිල්ටන් ගාඩ්ස් මැඳුරට ළඟාවෙන්නෙත් රෑ දොළහට, දොළහයි කාලට පමණ. දැන් පැට්‍රිෂියා බැරිංටන් මෙහෙවිහ මොකද කරන්නේ? ඇගේ වටිනා මුතු පළඳනා සියල්ල ලේන්සුවක ගැටගහලා, මිලර් අතට දෙනවා, කරත්තයෙන් බහින්න කලින්. මං හිතන්නෙ නෑ කරත්තයේ රියැදුරා මේ ගැන දැනගෙන හිටියා කියල. ඒ මොකද ඔහුගේ ඔත්තුවකින් මේ අපරාධය සිදුවුණා නම්, ඔහු පුවත්පත් දැන්වීමට කොහොමටවත් ඉදිරිපත් වෙන්නේ නෑ."

"මෙච්චර දුරට කාරණා පැහැදිලියි. ඊළඟට මොකක්ද වුණේ?" මම ඇසීමි.

"කපිතාන් මිලර් සහ පැට්‍රිෂියා කරත්තයෙන් බැහැලා ගිහින් මඳවෙලාවක් කතාබහ කරනවා. ඊටපසු තරුණිය තරුණයාට ශුභ රාත්‍රියක් පතලා ගේ තුළට යනවා. තරුණයා ආපසු එනවා කරත්තය දෙසට. ඔහු මෙතැනදී කුලිය ගෙවලා, කරත්තය හරවා යවනවා. එහෙම යවන්නේ ඔහු කාසල් වීථියේ ගෙදරට යන ගමන පයින් යන්න. නමුත් අතරමගදී අඩි දහයක් යන්න කලින් ඔහුට හිතෙනවා කුලීරියෙන් ම ගෙදර යන්න. අන්න ඒකට හේතුව මොකක්ද? ඒක අපි දන්නෙ නෑ."

"මේ ආභරණ වල විශාල වටිනාකමක් ඇති නිසා ඔහුගේ හිතේ භයක් ඇතිවෙන්න ඇති" මම කීවෙමි.

"එහෙත් එකටම භයක් ඇතිවෙන්න ඇති" හෝම්ස් මගේ අදහස ස්ථිර කළේය. "අනේ ගිනිඅඩියක් නැතුව, පවුම් විසිපන්දහසක් වටිනා ආභරණ රැගෙන අන්ධකාරයේ යන ඔහුට, භයක් ඇතිවීමේ

පුදුමයක් නැහැ. අනික අපි අමතක කරන්න තරකයි අපට අහන්න ලැබුණු තවත් කරුණක්. දින කිහිපයකට කලින් සමාජ ශාලාවේදී ඔහු දැක තිබුණු හඳුනන මුහුණ ගැන ඔහු පැටරිසියා මෙනෙවියට කියා තිබුණා."

"අර නාවිකයාන්ද?"

"අන්න හරි. කවුද මේ පුද්ගලයෝ? ඕස්ට්‍රේලියාවේ මංකොල්ල කල්ලියක පුද්ගලයන්ද? නැත්නම් දෙවනත් සතුරන්ද? ඔය මංකොල්ල කල්ලියෙන් මරණ තර්ජන තිබුණු බව අපට අමතක කරන්න බැහැ. කපිතාන් මිලර් වික්ටෝරියා ප්‍රාන්තයෙන් තමාගේ රැකියාවත් අත්හැරල ටැස්මේනියාවට පලාගියා. ඒ මරණ තර්ජනවලට භයෙන්. මේ තරම් නිර්භය පුද්ගලයෙක් තමන්ගේ ගමරට අත්හැරල පලායන්න තරම් භයවුණා නම්, මේ කොල්ල කල්ලිය මොන තරම් දරුණු එකක්ද කියල අපට ඒකෙන්ම හිතාගන්න පුළුවනි."

"ඒ වුණත් හෝම්ස් ඔය නාවුකයෝ, සාගර තරණය කරගෙන ලෝකයෙන් භාගයක් මග ගෙවාගෙන, මිලර්ගෙන් පළිගන්න එංගලන්තයට ආව කියල හිතන්න පුළුවන්ද?" මම ඇසීමි.

"ඇයි බැරි?" හෝම්ස් ඇසීය. "ඔබට අමතකද K.K.K. කල්ලිය? ඇයි ටෙඩ් බෝල්ඩ්වින්? ඒ නිසා මෙම නාවුරු කල්ලිය ගැන අපට අමතක කරන්න බැහැ. ඔවුන් හිරබාරයට ගැනීම ගැන ඔවුන්ගේ හිතේ, මිලර් ගැන ඇතිවෙන්න ඇත්තේ දරුණු වෛරයක්. අපි නොදන්නවට උන් අත් අඩංගුවට ගන්න ගිහින්, මිලර්ගේ වෙඩිපහරෙන් උන්ගේ කල්ලියේ අය මැරුම්කන්නත් ඇති. අපි ඒ අයගේ පරීක්ෂණ වල මීට කලින් යෙදිල තියෙනවා. ඔබට ඇත්තම කියන්න වොට්සන්. මගේ හිතේ සැකයක් ඇතිවෙන්නේ, මයිකල් බැරිංටන්ට වඩා, අන්න ඒ නාවුරු අප තවමත් නොහඳුනන අපරාධකාරයෙක් ගැන."

"හොඳයි අපි කථාවේ ඉතුරු හරියත් ගොඩ නගමු" මම කීවෙමි. "කපිතාන් මිලර් සාසල් වීථියේ නිවසට ගියා. නමුත් ඔහුට කරත්තෙන් බැහැලා ගේ ඇතුළට යන්න හම්බවුණේ නැහැ. අමුත්තෙක් ඇවිත් හිටියා. ඔහු කථා නොකළත්, මිලර්ගේ කථාවෙන් තහවුරු වෙනවා අමුත්තා කවුද කියන එක."

"අන්න ඒක බැරිංටන්ට විරුද්ධ ප්‍රබල සාක්ෂියක්" හෝම්ස් කීය.



www.sinhalaelibrary.com



"අනික ඔය වෙලාවට තමන් හිටියේ කොහේද, කළේ මොකක්ද කියන එක සඳහන් කරන්නවත් බැරිංටන් උත්සාහයක් ගත්තේ නැහැ" මම කීවෙමි. "බාගවෙලාවට ඒක තහවුරු කරන්න ඔහුට සාක්ෂි නැතුව ඇති."

කතාබහ එතෙකින් නැවැත්වූ මගේ මිත්‍රයා යළිත් වරක් කල්පනා කරන්නට පටන්ගත්තේය. එදා රාත්‍රී එකොළහ පමණ වනවිට මා නින්දට ගියත්, ඔහු හාන්සි පුටුවට වී දිගටම කල්පනාවේ නිමග්න වූ බව මම දුටුවෙමි.

පසුවදා උදේ මා අවදිවෙද්දී හෝම්ස් නිවසෙන් බැහැර ගොස් සිටියේය. තේ මේසයට වාඩිවී මම උදෑසන පුවත්පත් කියවීමට පටන්ගතිමි. මගේ අවධානය එක්වරම යොමුවූයේ "ඩේලිගැසට්" පුවත් පතේ ප්‍රධාන පුවත්තිය වෙතය.

## තේම්ස් ගඟෙන් නාඳුනන මළසිරුරක්!

ඊයේ රාත්‍රි වරුව සේවකයෙකුට තේම්ස් ගඟේ පාවී ආ මළසිරුරක් හමුවී ඇත. ඒ ගං ඉවුරේ වාප්පු පිහිටා ඇති ඩෙප්ට්ෆර්ඩ් ප්‍රදේශයෙනි. දින කිහිපයක් වතුරේ තිබීම නිසා, ඉදිමී විරූපී වී ගිය මළසිරුර අවුරුදු 30 ත් 40 ත් අතර පිරිමියෙකුගේ බව පැහැදිලිය. ගඟෙන් මළසිරුරේ මුහුණ සතුන් විසින් කා දමා විනාශකර තිබීම නිසා එය හඳුනාගැනීමට නොහැකි තත්ත්වයේ පවතින බව පොලිස් ප්‍රකාශකයෙක් අපට පැවසීය.

මෙය සතියකට පමණ පෙර අතුරුදන් වූ කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් නම් ඕස්ට්‍රේලියානු ජාතික කෝටිපතියාගේ මෘත ශරීරය විමට ඉඩ ඇතැයි බොහෝදෙනා පවසති. මීට දින කිහිපයකට පෙර ඔහුගේ හිස්වැස්ම හා ලේ තැවරුණු කබාය ගං ඉවුරේ තිබී හමුවිය. මරණයට හේතුව කුමක්දැයි යන්න තවමත් තීරණය කර නැත. වැඩිදුර පරීක්ෂණ සඳහා මළසිරුර, පොලිස් මෘත ශරීරාගාරයේ තබා ඇත."

මේ පුවත අනෙක් පුවත්පත් වල ද සඳහන්ව තිබිණි. දැන් අපරාධකාරයා හඳුනාගෙන ඇතැයි ද, ඔහු අද හෙටම අත් අඩංගුවට ගැනීමට නියමිත බව ලෙස්ට්‍රේඩ් පැවසුවේ යයි ද "ලන්ඩන් ඔබසර්වර්" පුවත්පතේ පළවිණි.

හෝම්ස් ආපසු එනවිට දහවල් දොළහට ලංවී තිබිණ. ඔහු බොහෝ විඩාපත්ව සිටි බැව් මම දුටුවෙමි.

"හෝම්ස් ඔබ දන්නෙද අද පත්තරේ? කපිතාන් මිලර්ගේ කියල සැක හිතන මිනියත් හමුවෙලා නේද?" මම ඇසීමි.

"මමත් වැඩකරන අතරේ ඒ බව පුවත්පතක කියෙව්වා. මං හිතුව මේ වෙනකොට අපරාධකාරයාව අත්අඩංගුවට අරගෙන ඒ බව දැනුම්දෙන්න, ලෙස්ට්‍රේඩ් මෙහේ එන්න ඇති කියල."

"ඔහු ආවෙ නැහැ. අපරාධකාරයා කවුරු කියලද ඔබට හිතෙන්නේ?"

"මං හිතන්නේ මොකක් වුණත්, අපරාධකාරයා බැරිංටන් බව...."

හෝම්ස්ට ඒ වැකිය සම්පූර්ණ කිරීමට ඉඩක් නොලැබිණ. එක්වරම අපේ තරප්පු පෙළ ඉහළට කවුදෝ දිව එන ශබ්දයක් ද ඒ ගැන තම විරෝධය පළකරමින් හඩ්සන් මහත්මිය කෑකෝ ගසන හඬ ද අසන්නට ලැබිණි. අපේ කතාබහ නවත්වා අපි එයට සවන්දුන්නෙමු. කිහිපදෙනෙකු දොරට තට්ටු කළ අතර, අපිරිසිදු කොලු රැනක් අපේ විසිත්ත කාමරය තුළට කඩාවැදිණ. ඒ හෝම්ස්ගේ බේකර් වීදියේ අවිධිමත් රහස් පරීක්ෂක කණ්ඩායම බව මම හඳුනාගතිමි.

"විගින්ස්!" හෝම්ස් කෑගැසුවේ තරවටු කරන හඬෙනි. "මොකද මේ ඔක්කොම ටික මෙතැනට කඩා වැදුණේ? මං මීට කලිනුත් කියල තියෙනව නේද තමුසෙල ඔක්කොම මෙහේ දුවගෙන එන්න එපා කියල?"

"සමාවෙන්න මහත්මයා" විගින්ස් කීය. "හුඟ කාලෙකට පස්සෙයි රහස් හොයන වැඩක් මහත්තයා අපට භාරදුන්නේ. ඒකට කොල්ලන්ට හරි සන්තෝෂයි. පාරේ වෙලා ඉන්න කිව්වට අහන්නෙ නෑ."

"හොඳයි කමක් නෑ. මෙන්න මං පොරොන්දු වුණු ගාස්තුව" හෝම්ස් කීවේ සිනාමුසු මුහුණිනි. ඔහු සිලිමේ කාසි කිහිපයක් විගින්ස් වෙත භාර දුන්නේය. "මොනවද ලැබුණු ආරංචි?"

"අපි හුඟක් මහන්සිවුණා මහත්මයා. ඒත් මොනුත් හොයාගන්න බැරිවුණා."

"කමක් නෑ. මං කිව්ව ඒව මතකයි නේ. ආරංචියක් දැනගත්ත ඉක්මනින් මට ඇවිත් කියන්න."

හෝම්ස්ට ආචාර කළ කොලු හඩයේ නායකයා පිටවී යාමට ආපසු හැරුණේය. දොරපුව ළඟට වී අපේ කාමරය වෙත මුහුණ





යොමුකරගෙන සිටි ඔහුගේ මිතුරෝ, මහ ශබ්දයක් නංවමින් තරප්පු පෙළ පහළට දිවගියහ.

"මාන ශරීරය හමුවුණත්, ඔබ මේ ගැන කරන පරීක්ෂා තවමත් අත්හැරලා නැහැ වගෙයි හෝම්ස්?" මම ඇසීමි.

"මෘත ශරීරය ලැබුණත් නැතත්, අපරාධය ඔප්පුකරන්න සාක්ෂියක් හොයාගැනීම අමාරු වැඩක් වේවි වගේ" ඔහු කීය. "ඒකට අපට හුඟක් මහන්සිවෙන්න සිදුවෙනවා. මං ඔබට කලිනුත් කියලා තියෙනවා වගේ, මිනිසුන්ගේ කතාබහට රහසින් කන්දෙන එක මේ කොල්ලන්ට පහසුවෙන් කරන්න පුළුවනි. මං ඊයේ වරුවේ පැය දෙකතුනක් මහන්සි වුණා. ඒත් ලැබුණු ප්‍රතිඵල වලින් සෑහීමකට පත්වෙන්න බෑ. මගේ නමට විදුලිපුවතක් මොකවත් ආවෙත් නැහැ නේද?"

"නැහැ."

"ඈ මේක මං හිතුවාට වඩා අවුල් ජාලයක් වෙන බවයි පෙනෙන්නෙ." මගේ මිතුරා කීවේ නළලට තට්ටුකරමිනි.

ටිකවේලාවක් ගතවීමට පෙර අප නිවස ඉදිරිපිට කුලීරියක් නවත්වන හඬ ඇසිණ. ඒ ලෙස්ට්‍රේඩ් විය යුතුයයි මම අනුමාන කළෙමි. මගේ සිතිවිල්ල නිවැරදි විය.

"ආයුබෝවන් හෝම්ස් මහත්මයා. මොනවද අලුත් ආරංචි?" ලෙස්ට්‍රේඩ් දොර හැරගෙන කාමරයට ආවේ අතිශය කලබලයෙනි. "ඔබට ආරංචිද මළසිරුර හමුවුණා කියල?"

"ඔව්. මම පුවත්පතේ ඒ බව දුටුවා. ඔබ ළඟදීම අපරාධකාරයා අත්අඩංගුවට ගන්න බලාපොරොත්තු වෙන බවත් සඳහන්වුණා....?"

"පුවත්පත් වලට මං එහෙම කිව්ව තමයි. ඒත් කෝ මට ඒකට ඉඩක්" ලෙස්ට්‍රේඩ් කීවේ සෝපාවේ හිඳගනිමිනි. "මං දන්නවා අපරාධකාරයා කවුද කියලා."

"කවුද?"

"මයිකල් බැරිංටන්. වෙන කවුද?"

"ඉතින් ඔහුව අත්අඩංගුවට නොගන්නෙ?"

"ඒ ගැන කොහොම කියන්නද හෝම්ස් මහත්මයා. මට ඉහළින් එනවා දේශපාලන බලපෑම්. සර් ජේම්ස් බැරිංටන්- හොංකොංහි ආණ්ඩුකාරයාගේ පුතා සිරභාරයට ගන්නවා කියන්නේ, මහ භයානක වැඩක්. නොසෙල්වෙන, ඇසින් දුටු සාක්ෂි නැතුව ඒක කරන්න බෑ. මේ වගේ ලොකු ලොකු පවුල් වල තරුණයින්



www.sinhalaelibrary.com

වෙනුවෙන් කථාකරන්නේ ඉහළපෙළේ අධිනීතිඥයින් එව් පොරකනා. පොඩි වැරැද්දක් වුණොත් මට රස්සාවත් නැතිවෙනවා. නමුත් මට සහතිකයි ඔහු තමා අපරාධකාරයා."

"අර හෝම්ස් ගෙගේ තිබිල හමුවුණු මිනිය කපිතාන් මිලර්ගේ කියල හඳුනාගත්තද ලෙස්ට්‍රේඩ්?"

"ඒක හඳුනාගන්න නැහැ හෝම්ස් මහත්මයා. ඒ තරමට නරක් වෙලා. පොලිස් ශල්‍යවෛද්‍යවරයා කියනවා, ඒ පුද්ගලයා මියගිහින් තියෙන්නේ පෙණහැල්ල විනිවිද ගිය පිහි ඇනුම් තුවාල වලින්ලු. ඔහු හැඳසිටි ඇඳුම් වල වත් හඳුනාගන්න තරම් ලකුණක් නෑ."

මීළඟ දින කිහිපයම ගෙවී ගියේ අලුත් ආරංචි කිසිවක් නොමැතිවය. මගේ මිතුයා සෑම දිනකම උදේ පාන්දරින්ම නිවසෙන් පිටවී ගියේය. විටෙක ඔහු දහවල් ආහාරය සඳහා පැමිණි අතර විටෙක සවස ඇඳිරි වැටෙන තුරු නිවසට පැමිණියේ නැත. දින හතරක් පහක්ම මෙම තත්ත්වය පැවැතිණ. හෝම්ස් මේ සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය විමසීමට වරක් දෙවරක් මම උත්සාහ කළෙමි. එහෙත් තම කටයුතුවල සාර්ථකත්වයක් නොතිබුණු නිසාදෝ, මගේ මිතුයා සිටියේ කිසිවෙකු නොරුස්සන ස්වභාවයකිනි. විගින්ස් ප්‍රමුඛ හිඟන කොලු රැළ ද හෝම්ස් ඔහු වෙනුවෙන් ඔත්තු සෙවීමේ කටයුතු වල නිරත වූ බැව් මම දැන සිටියෙමි. ඊට අමතරව බැස්කවිල් රැදුරු සුනඛයා පිළිබඳ පරීක්ෂණයේදී අපට සහාය වූ කාට්‍රයිට් නම් තරුණයා ද කිහිපවරක් හෝම්ස් හමුවීමට පැමිණියේය.

"කපිතාන් මිලර් අතුරුදහන් වෙලා අදට දවස් 12 ක් වෙනවා" මම කීවෙමි. "විසඳන්න ඔබට මේ තරම් කාලයක් ගතවුණු පරීක්ෂණයක් ගැන මට මතක් කරගන්නත් අමාරුයි."

"අතුරුදහන්වෙලා දවස් දොළහක් ගත වෙලා ඇත්තයි. ඒත් මේක අපට භාරවෙලා තවම සතියයි නෙ ගතවුණේ, වොට්සන්" හෝම්ස් කීය. "ඒ ගතවුණු කාලයත් බොහොම වැඩිබව මම පිළිගන්නවා. කොහොම වුණත් මේක විසඳාගන්න අමාරු අභිරහසක් බවට පෙරළෙන ලකුණුයි තියෙන්නෙ. අද මම පැට්‍රීෂියා මෙනෙවිය හමුවෙන්න ගියා. අර මිනිය හඳුනාගන්න ඔවුනට හැකිවෙලා නැහැ. දැඩි ශෝකයෙන් හිටි පැට්‍රීෂියා දැන් බොහොම දුරට හිත හදාගෙන."

"ඇගේ මල්ලි මෙහි ප්‍රධාන සැකකාරයා වෙලා ඉන්න එක ඇයට තවත් ප්‍රශ්නයක් වෙන්න ඇති?" මම කීවෙමි.





"නැහැ වොට්සන්" හෝම්ස් කීය. "මල්ලිගේ චරිතය හොඳින් දන්නා නිසා ඇය කිසිසේත් ඔහු ගැන කම්පා වෙන්නෙ නැහැ. ඔහු මේකට පැටලී ඇති එක ගැන ඇය පුදුමවෙන්නෙත් නැහැ. මට ආරංචියි දැන් ඇය මයිකල් හැරිංටන් සමඟ කතාබහ කරන එකත් මුළුමනින්ම නවත්වලා කියල. මං හිතන්නෙත් ඇය ඉක්මනටම මව්පියා සමඟ එකතුවෙන්න හොංකොං බලා යාවි."

නිවසෙන් පිටවී යාමට සූදානම් වෙද්දී හෝම්ස් නමට විදුලිපුවතක් ලැබිණි. එය කියවීමට පමා නොවී ඔහු එය සාක්කුවේ දමාගත්තේය. එදා දහවල් නිවසෙන් පිටවී ගිය හෝම්ස්, පැයක් ගතවීමට පෙර ආපසු ආවේ මහත් කලබලයෙනි.

"වොට්සන්. අපට අලුත් යමක් දැනගන්න ලැබිල තියෙනවා" ඔහු කීය. "ඔබට හැමදෙයක්ම විස්තර කරන්න දැන් වෙලාවක් නෑ. අපි යන ගමන් කථාකරමු. වහාම සූදානම් වෙලා එන්න."

"කුලීරියක් කැඳවන්න කියලා මම හඩ්සන් මහත්මියට කියන්නද?"

"එමනා නෑ. මං රථයකට දැනුම්දීලයි ආවෙ."

ඔහු කී අයුරින්ම අශ්ව කරත්තයක් වේගයෙන් පැමිණ අපේ නිවස ඉදිරිපිට නැවැත්වූයේ මා සූදානම් වී අවසන් වීමටත් පෙරය. දිගු රෝද හතරේ තරමක් විශාල රියක් බව දැක මම පුදුමයට පත්වීමි. අප කරත්තයට නගිද්දී ඒ තුළ සිටියේ පොලිස් පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ය.

"ආයුබෝවන් හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබේ පණිවුඩය ලැබුණු ගමන් ආවෙ. අපි දැන් යන්න ඕන කොහේටද?"

"වහාම යමු වරායට" හෝම්ස් කීය. "මට ලැබුණු දූසමාන ආරංචියක් උඩයි යන්නෙ. ඒ නිසා ඔබට ලබාදෙන ප්‍රතිඵල සාර්ථක වෙයිද කියල මට සියයට සීයක් සහතික වෙන්න බැහැ. "මොන්රෝවියා" නම් නෞකාව නිව්යෝර්ක් බලා පිටත් වෙන්න නියමිත 3.30 ට දැන් වෙලාව 2.40 යි. අපි සම්පූර්ණ උත්සාහය යොදමු රියැදුරු උන්නැහේ. ඔබ 3.30 ට පෙර අප වරායට ගෙන ගියොත් අමතර ගිනී 2ක් දෙනවා."

හෝම්ස්ගේ ඒ වචනත් සමඟ රියැදුරා කරත්තය ඉතා වේගයෙන් ධාවනය කිරීමට පටන්ගත්තේය. අපරභාගයේ මුල් කොටස නිසා මේ වෙලාවේ පාරේ එතරම් වාහන නොතිබිණි.



www.sinhalaelibrary.com

අපගේ ගමනේ අරමුණ කුමක්ද, හෝම්ස් මේ එලවන්නේ කවුරුන් පිටිපසද, කියා ලෙස්ට්‍රේඩ් ඇසුවේය. එහෙත් සතුටුදායක පිළිතුරක් නොදුන් මගේ මිත්‍රයා පැවසුවේ ඉවසිල්ලෙන් බලාසිටිය යුතු බවයි.

අපේ අශ්වකරත්තය වරායේ දොරටුව අසලදී නවත්වනු ලැබිණ. ලෙස්ට්‍රේඩ්ගේ පොලිස් හැඳුනුම්පත නිසා අපට ඇතුළට යාමට අවසර ලැබිණ. එවිට වේලාව හරියටම සවස 3.30 බව මගේ සාක්කු ඔරලෝසුවේ සටහන් විය. නැව් පිටත්වීම සඳහා පිඹිනු ලබන සංඥා නළා හඬ අපට පැහැදිලිවම ඇසිණ.

අපි ජැටිය වෙත දිවගියෙමු. මගී නෞකාවක් වූ එස්.එස්. මොන්රෝවියා නෞකාව එංගලන්තයෙන් පිටත්ව යාමට සූදානම්ය. නැව් තට්ටුව මත සිටි මගීහු, පහළ ජැටියේ සිටි තම ඥාති මිත්‍රාදීනට අත වනා සමුගනිමින් සිටියහ. එම සෙනග අතරින් අපි ඉදිරියට දිව ගියෙමු. ජැටියේ සිට නැවට නැගීමට තිබූ ඉණිමගක් වැනි පාලම ඉවත්කිරීමට සේවකයෝ දෙදෙනෙක් සූදානම් වූහ. ලෙස්ට්‍රේඩ් ඒ දෙදෙනා ඉවතට තල්ලුකරන අතරේ අපි එය දිගේ ගොස් නැවට නැගුණෙමු. නෞකාව යාත්‍රා කරවීමට සූදානම් වෙමින් සිටි කපිතාන්ගේ කාමරයට අප කඩා වැදුණේ අන්තිම මොහොතේදීය.

"නැවේ ගමන ප්‍රමාද කරන මෙන් මහරාජිනියගේ නාමයෙන් මං ඔබෙන් ඉල්ලා සිටිනවා. මම ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ්. මිනීමැරුමකට සම්බන්ධ අපරාධකරුවෙකු මේ නැවෙන් පලායන බව අපට දැනගන්න ලැබුණා. රාජනීතිය ක්‍රියාත්මක කිරීමට අපට සහය වෙන මෙන් මං යළිත් ඔබෙන් ඉල්ලා සිටිනවා."

ලෙස්ට්‍රේඩ්ගේ ඉල්ලීමෙන් නැව්පතියා කෝපයට පත්වුවත්, ඒයට කීකරුවීම හැර මුහුට වෙනත් විකල්පයක් නොතිබිණ.

"මහත්මයා" කපිතාන් කීය. "එක මිනිත්තුවකින් පිටත්වීම ප්‍රමාදවුණොත් ඒක අපේ ගමනට විශාල හිරිහැරයක්. නමුත් මහාරාජිනිය වෙනුවෙන් කෙරෙන රාජකාරී කටයුත්තක් නිසා මම ඔබට ඉඩදෙන්නම්. නමුත් ඔබේ කටයුතු මිනිත්තු පහළොවක් ඇතුළත අවසන් කරන්න."

නැවේ ගමන ප්‍රමාද කිරීමට තම නිලධරයනට කපිතන් උපදෙස් දුන්නේය. ඒ අතර හෝම්ස් නැවේ මගී කාමර වෙන්කිරීම භාර නිලධරයා සොයමින් දිවගියේය.





දීර්ඝ මගී ලේඛනයයි ඔහුට අවශ්‍ය නම සොයාගැනීමට හෝම්ස්ට ගතවූයේ මිනිත්තුවක් පමණි.

"කාමර අංක 81 හා 82 තියෙන්නෙ කොහේද මහත්මයා?" හෝම්ස් ඇසීය.

"එය පෙන්වන්න මං ඔබට සේවකයෙක් එවන්නම්."

සේවකයා අප කැඳවාගෙන ගියේ නැවේ ඉහළ තට්ටුවක් වෙතය.

"මෙන්න මහත්මයා කාමර අංක 81 හා 82" සේවකයා පැවසුවේ දොර අසලට ළංවෙමිනි.

"බොහොම ස්තුතියි" හෝම්ස් කීය. "අංක 81 කාමරයේ දොරට ඔබ සාමාන්‍ය විධියට තට්ටුකරන්න. කියන්න ඔබ රාත්‍රී ආහාරය සඳහා ඇණවුම් ලබාගන්න ආවා කියල. මොනව හරි කියල අපට දොර ඇරවා දෙන්න. එතකොට නැවට මුහාම ගමන් අරඹන්න පුළුවනි."

ප්‍රතිචාරයක් ලබාගැනීමට තුන්වරක් දොරට තට්ටුකිරීමට සේවකයාට සිදුවිණි.

"කවුද? මොකද?" ඇතුළතින් ඇසිණ.

"මහත්මයා. මම කාමර සේවයෙක්" සේවකයා කීය. "ඔබේ අද රාත්‍රී කෑම හා හෙට උදේ කෑම ඇණවුම දුන්ම අපට උවමනායි."

"දැන් ගිහින් පස්සෙ එනවා" ඇතුළතින් කියනු අසන්නට ලැබිණ.

"මහත්මයා, මේ නැවේ මගීන් විශාල ගණනක් ගමන්කරනවා. දැන්ම අපි භාර නොගත්තොත් ඔබේ ඇණවුම මඟ හැරෙන්න පුළුවනි. එතකොට ඔබට නිසි පරිදි කෑමබීම ලැබෙන එකක් නැහැ. කෑම ඇණවුම දුන්ම නොදුන්නොත් අපි කොහොමද ඔබට අද රාත්‍රියේ කෑම දෙන්නෙ?"

දොරේ යතුරු ඇතුළතින් කරකැවෙන හඬ අපට ඇසිණ. අඩක් විවෘත වූ දොරෙන් අපට දක්නට ලැබුණේ සුදු ලෝගුවක් හැඳ, කළු පැහැති පුළුල් පටියක් හිණ වටා බැඳි තරුණ ක්‍රිස්තියානි පූජකවරයෙකි. දොර විවෘත වූ විගසම එය වැසිය නොහැකි වන සේ හෝම්ස් තම සපත්තුව උළුවස්සට හිරකර ගත්තේය.

"සමාවෙන්න පියතුමනි" හෝම්ස් කීවේ සේවකයා පසෙකට කර ලෙස්ට්‍රේඩ් සමග කාමරයට ඇතුළුවෙමිනි. "මං විශ්වාස කරනවා මේ ෆ්‍රාන්සිස් එමැනුවෙල් පියතුමා ය කියල?"



www.sinhalaelibrary.com

"ඔව්. නමුත් මං දොර විවෘත කළේ මගේ රාත්‍රී කෑම ඇණවුම දෙන්නයි. ආරාධනයක් නැතුව මගේ කාමරයට කඩාවැදෙන්න ඔහේලට තියෙන අයිතිය මොකක්ද?"

"කණගාටුයි ඔබට කරදර කරන්න වීම ගැන. ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට ඔබව උවමනා කරල තියෙනවා" හෝම්ස් කීවේ ලෙස්ට්‍රේඩ් දෙසට අත දිගු කරමිනි.

"මං මොන වැරැද්දක් කළාටද ඒ?"

"පවුම් විසිදහසක් වටිනා මුතු ආභරණ සොරකම් කිරීම, කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් අතුරුදන් කිරීම, නිදොස් තරුණියකු අපරාධයකට පටලැවෙන සේ පොලීසිය නොමග යැවීමට තැත්කිරීම" හෝම්ස් කීය.

"මට..... මට..... මේ කුමාකුත් තේරුම්ගන්න බෑ" සුදුමැලි වූ පියතුමා කීවේ ගොත්ගසමිනි. "මේක ඔහේලට වුණු ලොකු වැරැද්දක්."

"මං හිතන්නේ වැරැද්ද වෙලා තියෙන්නේ ඔබතුමාටයි" කී හෝම්ස් සාක්කුවෙන් ඡායාරූප දෙකක් සහිත කවරයක් එළියට ගත්තේය. ඒ එදා බැරිංටන් මෙනෙවිය ඔහු අතට පත් කළ ඡායාරූප දෙකය.

"මෙන්න බලන්න ලෙස්ට්‍රේඩ්" හෝම්ස් එයින් එක් ඡායාරූපයක් පියතුමාගේ මුහුණට ළං කළේ අපට දැකගත හැකිවන අයුරෙනි.

පුදුමයකි! ඡායාරූපයේ සිටි කපිතාන් මිලර්ගේ හා පියතුමාගේ මුහුණු සෑම අයුරකින්ම එක සමානවිය! මේ දෙදෙනෙකු නොව එකම පුද්ගලයෙකු බව වටහා ගැනීමට දෙවරක් ඒ දෙස බැලීමට අවශ්‍ය නොවීය.

"දෙයියෝ සාක්කි! හෝම්ස් මහත්මයා, ඔබ කියන්නෙ ඇත්ත තේත්තාම. මේ ඡායාරූපයේ ඉන්න නැනැත්තාගේ උඩුරැවුල කපාදමලා හිසකෙස් පිටිපසට පීරුවොත්, පියතුමාගේ මුහුණ මතුවෙන බවට කිසිම සැකයක් නෑ" ලෙස්ට්‍රේඩ් පිළිතුරු දුන්නේ ඡායාරූපය දෙසත් පියතුමා දෙසත් මාරුවෙන් මාරුවට බලමිනි.

"ඔහේලට පිස්සු?" කෝපයෙන් ගිගිරූ පියතුමා ඡායාරූපය හෝම්ස්ගේ අතෙන් උදුරාගෙන එය කැබලි කැබලි වලට ඉරා දැම්මේය.

"ඔබට අමතන්න ඕනේ කපිතාන් මිලර් කියලද පියතුමා කියලද මම දන්නෙ නෑ. කරුණාකරලා යටත්වෙන්න" ලෙස්ට්‍රේඩ් කීවේ





විලංගු යුගලය අතට ගනිමිනි. පියතුමාගේ මුහුණෙන් ඩහදිය වැගිරෙද්දී ඔහුගේ දෑතට විලංගු හිරකිරීමට ලෙස්ට්‍රේඩ් පමා නොවීය.

"කවුද..... කවුද කියන්නෙ මං මිනීමැරුවා කියල? කෝ ඒවට සාක්කි?"

"ඔබ මිනීමැරුවා කියල කවුරුවත් කියන්නෙ නෑ" හෝම්ස් කීය. "අපි කියන්නේ ඔබ කපිතාන් මිලර්ව අතුරුදන් කළා කියලයි. ඒ කොහොමද? ඔහුගේ නිල්ඇඳුම හා කඩුව ගඟට විසිකර දමා කතෝලික පූජකතුමෙකු සේ වෙස් වළාගෙන ගරු ෆ්‍රාන්සිස් එමැනුවෙල් පියතුමා යන නම ආරූඪ කරගැනීමෙන්. ඔබ කළ අපරාධය පැට්‍රීෂියා බැරිංටන් මෙනෙවියට අයත් පවුම් විසිදහසක් වටිනා ආභරණ සොරකම් කිරීම."

"කෝ ඔය චෝදනාව ඔප්පු කරන්න සාක්කි?"

"සාක්කි? අපට තියෙනවා සාක්කි" හෝම්ස් කීවේ අංක 82 දරන මිලර්ගේ කාමරයේ දොර දෙසට ඇඟිල්ල දිගුකරමිනි. "ලෙස්ට්‍රේඩ්. ඔබ අර දොර ඇරල බැලුවොත් ඔබට හමුවේවි සොහොයුරාගේ වියෝවෙන් කම්පාවෙන ජූලියා මිලර් මෙනෙවිය. ඇය එංගලන්තය ගැන කලකිරීමට පත්වෙලා. කාටත් හොරෙන් නිව්යෝක් බලායන්න නැව් නැගලා. මේ දෙන්නාගේ සේවකයා වයස්ගත ජෝන් රයිගල් කොහේ ඉන්නවද මම දන්නෙ නෑ. නමුත් ඔහුත් මේ නැවේම කොහේ හරි ඇති."

"තව ටිකෙන් මේ මිනිහව ඝාතනය කළා කියල මං අර බැරිංටන්ව හිරභාරයට අරගෙන ඔහුව එල්ලුම්ගස් යවන්නත් සූදානම් කරනවා" ලෙස්ට්‍රේඩ් කීවේ අප්‍රමාණ සතුටෙනි. "ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං ඔබේ හපන්කම් කොතෙකුත් දැකල තියෙනවා. ඒත් අපරාධකාරයෙක් මේ තරම් පුදුමාකාර විධියට මගේ අතටම අල්ලා දුන්නේ අවස්ථා කිහිපයයි. එකක් අර නෝවුඩ් වල ඩ්‍රවාකර තක්කඩියා අල්ලා දුන් අවස්ථාව. මේ හොර දෙටුවා මේ නැවේ ඉන්නා බව ඔබ කොහොමද දැනගත්තේ?"

"ඒක දිග කතාවක් ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "අපේ රාජකාරී ඉක්මනින් අවසන් කරමු. නැවේ කපිතාන් අපට දුන් මිනිත්තු පහළොවෙන් තව ඉතිරි මිනිත්තු දෙකයි."

මුතු ආභරණ පාර්සලය සඟවාගෙන, නැවේ සැඟවී සිටි ජූලියා මිලර් මෙනෙවිය, කපිතාන් මිලර් නොහොත් ෆ්‍රාන්සිස් එමැනුවෙල්

පියතුමා සහ ජෝන් රනෝල්, ලෙස්ට්‍රේඩ්ගේ අණින් වරාය පොලීසිය මගින් හිරභාරයට ගන්නා ලදී. එම කටයුතු අවසන් වූ වහාම "මොන්රෝවියා" නෞකා තොමෝ එක්සත් ජනපදයේ නිව්යෝක් බලා ගමන් ඇරඹුවාය.

* * *

"මට තවමත් මෙතෙක අගමුල තේරුම් ගන්න බැහැ හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් පැවසුවේ එදා රාත්‍රී බේකර් වීථියේ අපේ නිවහනට පැමිණ සුරුට්ටුවක් දල්වා ගනිමිනි. "ඔබ කොහොමද මේ හැම දෙයක්ම තේරුම් ගත්තේ?"

දුම්කොළ පිරවූ පයිප්පය දල්වා ගැනීමට තත්පර කිහිපයක් ගතකළ හෝම්ස්, කතාව පටන්ගත්තේ මිනිත්තු කිහිපයක් ගතවූ පසුය.

"මගේ හිතේ මුලින්ම සැකයක් ඇතිකළ කරුණ තමා, ක්‍රිස් මිලර් මංගල උත්සවයේ ඉඳල ආපහු එද්දී, මුළු ආභරණ කට්ටලයේ ප්‍රවේසම ගැන දක්වූ උනන්දුව" හෝම්ස් කීය. "මේ තරම් වටිනා ආභරණ තොගයක් පාළු නිවසක තියලා, සති අන්තයක් ගතකරන්න පිටපළාතකට යාම එක්තරා විධියකින් මෝඩකමක් තමයි. නමුත් බැරිංටන් මෙනෙවියට ඇගේ කාමරේ යකඩ සේප්පුවක් තිබුණා. නිවස මුරකරන්න ආරක්ෂක මුරකරුවෙක් සිටියා. පවුලේ අය නොසිටියත් ගෘහ සේවක සේවිකාවන් ගැවසුණා. මෙහෙම තත්ත්වයක් උඩ ඇයි ඔහු ආභරණවල ප්‍රවේසම ගැන මේ තරම් උනන්දු වුණේ? ඊළඟට පැට්‍රීෂියා මෙනෙවිය යෝජනාවක් කළා, මොකක්ද? ආභරණ ටික ගෙනිහිං ඔහුගේ බැංකු සුරක්ෂිතාගාරයේ තබාගන්න කියල. මෙකට ඔහු එක්වරම කැමැතිවුණා. එනිසා මගේ සැකය වඩාත් තීව්‍ර වුණා. ඒ නිසා මේ පුද්ගලයාගේ අතුරුදන්වීම ගැන, මං බැලුවේ ඔබ කවුරුවත් නොබැලූ කෝණයකින්; විවෘත මනසකින්.

ඊළඟට මගේ හිතේ පැටලීමක් ඇතිකළ සිදුවීම තමා වයස්ගත සේවකයා රයිනෝල් හා අර කුලීරථ රියැදුරා දුන් සාක්ෂි. ඒ සාක්ෂි වල හැටියට නම් මධ්‍යම රාත්‍රියේ මිලර්ලාගේ නිවසට පැමිණ හිටියේ මයිකල් බැරිංටන් එහෙම නේද?"





"ඔව්" මම කීවෙමි. "එතකොට ඔබ කියන්නේ බැරිංටන් එතැන හිටියා කියන එක, සේවකයා ගෙතූ බොරුවක් කියලද? මහත්මයෙක් එතැන හිටි බව කුලීරථ රියැදුරාත් දකල තිබුණා නේ?"

"එතැනදී ඔබ නිවැරදියි වොට්සන්" හෝම්ස් කීය. "ඔවුන් දෙදෙනාම දුටුවා මහත්මයෙක් ඇවිත් ඉන්නවා. කලිසම් කබා ඇඳලා, බැරිංටන් පළඳින වර්ගයේ හිස්වැස්මක් දාලා හිටි මහත්මයෙක්. නමුත් මේ දෙදෙනාගෙන් කවුරුහරි ඒ අමුත්තාගේ මුහුණ හරි හැටි දුටුවද? නැහැ. සේවකයා දකිනකොට අමුත්තා හිටියෙ ගෙදරට පිටුපාලා, අන්ධකාරයට වෙලා. කුලීරථ රියැදුරාත් අන්ධකාරයේ ගස් අස්සේ ඉඳල ආව මහත්මයෙක් දුටුවා. එපමණයි."

"ඒක හැබෑව" මම කීවෙමි. "නමුත් මේ පුද්ගලයා බැරිංටන් කියල තේරුම් ගන්න පුළුවන් වචන හුවමාරුවක් මෙතැන කෙරුණා නේ. හොඳයි නැද්ද?"

"එතැනදී ඔබ වැරදියි වොට්සන්" හෝම්ස් කීය. "වචන හුවමාරුවක් කෙරුණේ නෑ. කතාව කෙරුණේ එක් පක්ෂයකින් පමණයි, මොනවද මිලර් කිව්වේ. "දෙයියන්ට ඔප්පුවෙච්චාවෙ! මේ මයික් නේද?" ඊළඟට "ඔබ මේ වෙලාවේ මෙතන මොනව කරනවද?" එක් පුද්ගලයෙක් ප්‍රශ්න ඇහුවා මිසක්, අනික් තැනැත්තා පිළිතුරු දුන්නේ නෑ. ඇයි?"

"ඔහුට හිතෙන්න ඇති කිවයුතු දේවල් මිලර්ට රහසේම කියන්න" මම කීවෙමි.

"එහෙම කියලත් උපකල්පනය කරන්න බැරි කමක් නෑ. නමුත් මට හිතුණේ අඳුරේ සිටි අමුත්තා කතා කළා නම් ඔහුගේ කටහඬේ අමුත්ත, රියැදුරාට හා සේවකයාට තේරෙනවා."

"කටහඬේ අමුත්ත?" ලෙස්ට්‍රේඩ් හා මා දෙදෙනාම ප්‍රශ්නකළේ එක්වරමය.

"පැහැදිලිවම මෙතැන හිටියේ බැරිංටන් නෙමෙයි."

"එහෙනම් කවුද?"

"බැරිංටන් විධියට සැරසී හිටි වෙනත් කෙනෙක්."

"ඒ මොකටද?" මම ඇසීමි.

"මධ්‍යම රාත්‍රියේ බැරිංටන් එතැන හිටි බවත්, කපිතාන් මිලර් අන්තිමට සාකච්ඡාවක් පැවැත් වූයේ බැරිංටන් සමග බවත් තහවුරු

කිරීමේ අරමුණෙන්. ඒක හිතාමතා, හපුරු වෙහෙසාවෙන් සකස් කළ සාක්ෂියක්" හෝම්ස් කීය.

"මට ඔබ කියන දේ තේරුම් ගන්න අමාරුයි හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීය.

"හොඳයි. මං ඔබට හැමදෙයක්ම සරලව, මුල ඉඳලම කියන්නම්. කපිතාන් ක්‍රිස්ටෝෆර් මිලර් නමින් පෙනීහිටි මේ පුද්ගලයා කපිතාන් කෙනෙකුත් නෙමෙයි. ඔහුගේ ඇත්ත නමත් ඒක නෙමෙයි. ඔහු ඕස්ට්‍රේලියාවේ හොර තක්කඩියෙක්. ක්‍රිස් මිලර් කියන්නේ ඔහු ආරූඪ කරගත් බොරු නමක් විතරයි."

"එතකොට ඔහුගේ සොයුරිය, ජූලියා මිලර්?"

"ඒකත් බොරුවක්. ඇගේ ඇත්ත නම ජූලියාත් නෙමෙයි. ඒ ඔහුගේ සොහොයුරිය නෙමෙයි, බිරිඳ!"

"දෙයියනේ සාක්කි!" මට කියැවිණි.

"හොර මංකොල්ල මගඩි හැම දෙයක්ම මේ ජෝඩුව කරන්නේ එකට. ඔහුගේ කඩවසම් රූපයෙන්, මෝඩ, අසරණ, එහෙත් ධනවත් තරුණියන් රවටා ගන්නවා. ඒ අරමුණෙන් ඔහු පෙනී ඉන්නේ අවිවාහකයෙක් වගේ. ඇය ඔහුගේ නැගණිය ලෙස රඟපානවා.

පැට්‍රීෂියා මෙනෙවිය කොයිතරම් ධනවත් වුණත්, රූමත් වුණත් අවුරුදු තිහක් වෙනතුරු ඇයට විවාහ වෙන්න සුදුසු තරුණයෙකු ලැබුණේ නැහැ. තරුණ විය ගෙවී යද්දී ඇය කඩවසම් ධනවත් තරුණයෙක් හොයමිනුයි හිටියේ. ඒ නිසා ඇයව රවටා ගන්න ක්‍රිස් මිලර්ට අපහසු වුණේ නැහැ. ඔහු ඕස්ට්‍රේලියාවේ දූරවා කියන කපිතාන් තනතුරේ කථාවටත්, ඇපල් වතු, රත්රන් ඉල්ලම් සහිත ඉඩම් කතාවටත්, අත්කාත් මල්ලිත් රැවටුණා. ඔහු හොර තක්කඩිකම් කිරීමෙන් උපයාගත් මුදල් ඇලෙන්න, ඔහු ඔය කියන ආකාරයේ ධනවතෙක් නොවෙයි. මං මිලර්ගැන විස්තර කියලා විදුලිපුවතක් යැව්වා වික්ටෝරියා රහස්පරීක්ෂක ප්‍රධාන ක්ලයින්ට. ඔහුගෙන් පිළිතුරක් ලැබෙන්න ටිකක් ප්‍රමාද වුණා. ඒ අතරේ මගේ පරීක්ෂණ කටයුතු වල මං දිගින් දිගටම යෙදුණා.

ක්ලයින් කියා තිබුණු විදියට මේ ජෝඩුව මෙවර ඕස්ට්‍රේලියාවෙන් පැනලා ඇවිත් තියෙන්නේ පොලීසිය නොමග යවලා. ඔවුන් විශාල වශයෙන් හොර මුදල් නෝට්ටු මුද්‍රණය කරලා, අහුවෙන්න ඔන්න මෙන්න කියා තිබියදී රටෙන් පැන්නාලු. ඒ මුදල්





මෙහේ රන්පවුම් බවට හරවාගෙන මෙහේ කෝටිපතියන් හැටියට ගතොලා.

මයිකල් බැරිංටන් හිටියේ හතර අතට ණය වෙලා. ඔහුගේ ණය ගෙවන්න ලෝභ නැතුව වියදම් කරලා ඔහුව තම වසඟයට ගන්න මිලර් සමත්වුණා. ඔහු එහෙම මුදල් වියදම් කරන්න ඇත්තේ යටි අරමුණක් හිතේ තියාගෙන. ඒ තමයි අවිවාහක පැට්‍රීෂියා මෙනෙවියට විවාහ යෝජනාවක් කරන්න. නමුත් ඒ ඇත්තටම ඇය විවාහකරගන්නා අරමුණෙන් නෙමෙයි. ඇය සතු රන්රිදී, ආභරණ, මුදල් හැකිතරම් එකතුකරගෙන රටෙන් පැනල යන්න.

පැට්‍රීෂියා මෙනෙවිය තිහිපවාරයක්ම මේ තක්කඩියා සමඟ ප්‍රිය භෝජන වලට සහභාගිවුණා. ඒ හැමවෙලාවකම තමන් මේ මුතු ආභරණ කට්ටලය පැළඳි බව ඇය අපට කිව්වා. සැකයක් නෑ. මේවා වටිනාකම කොපමණද කියලා ඔහු දැනගෙන ඉන්න ඇති. මේ අවස්ථාවක් ලැබෙනතුරු ඔහු සූදානමින් හිටියේ. සිකුරාදා උත්සවයෙන් පසු සෙන්සුරාදා විනෝද ගමනක් යන බව පැට්‍රීෂියා ඔහුට කියා තිබුණා. මේක ඉතාම අනර්ඝ අවස්ථාවක් බව ඔහුට වැටහුණා. ආභරණ ටිකත් අරගෙන අතුරුදන්විය හැකි ක්‍රමය ඔවුන් සැලසුම් කළා.

පොලීසියට පහසුවෙන් අපරාධ කාරයෙක් හොයාගන්න ඇකිළුණොත්, මේක දිගටම හාරා අවුස්සන බව ඔවුන් දැනහිටියා. ඒ නිසා ඔවුන්, අල්ලා ගත හැකි අපරාධකාරයෙකු, සැලැස්මට ඇතුළු කළා. මැතකදී මිනීමැරීමේ චෝදනාවක් එල්ල වූ දුෂ්ට චරිතය වන මයිකල් බැරිංටන් මෙතැනට කඳීමට ගැළපෙන බව ඔවුන් තේරුම් ගන්න ඇති."

"හොඳයි. එදා මධ්‍යම රාත්‍රියේ අභ්‍යන්තරයෙන් ගෙදර ආව මිලර් හමුවෙන්න ඇත්තෙන්ම කෙනෙක් මිදුලේ හිටියා නොවැ?" මම ඇසීමි. "ඒ බැරිංටන් නෙමෙයි නම් වෙන කවුද?"

"ඔව් වොට්සන් පුද්ගලයෙක් හිටියා තමයි. ඒ කවුරු කියලද ඔබ හිතන්නේ?"

"මට හිතාගන්න අමාරුයි."

"ඒ පිරිමියෙක් ලෙස වෙස්මාරු කරගත් ජූලියා මිලර් මිස වෙන සැකයක් නෑ."

"දෙයියෝ සාක්කි!" ලෙස්ට්‍රේඩ්ට කියැවිණි.

"ඔව්" හෝම්ස් කීය. "ඇය කලිසම් කබාවලින් සැරසිලා හිස්වැස්මක් දමාගෙන අඳුරට වෙලා ඉඳගෙන පිරිමියෙක් ලෙස රඟපෑවා. කථා කළොත් කටහඬෙන් හොරේ අහුවෙන නිසා කථා කළේ නැහැ. නමුත් ක්‍රිස් මිලර් ඔහුගේ දෙබස් කියලා, තමන්ගේ භූමිකාව හොඳින් රඟපෑවා. මේක ඉතා ස්වාභාවිකව සිදුවෙන්න ඕනෑ නිසා, තමන්ගේ සේවකයාට පමණක් නොවෙයි, කුලීරියේ රියැදුරාටත් හොඳින් ඇහෙන්න සැලැස්සුවා."

"මේක බොරු රඟපෑමක් බව ඔබ තේරුම් ගත්තේ කොහොමද හෝම්ස් මහත්මයා?"

"තමන්ගේ එකම සොහොයුරා අතුරුදන්වුණු වෙලාවේ ජූලියා මිලර් හැසිරුණු පිළිවෙළ ගැන මගේ හිතේ සැකයක් ඇතිවුණු බව මං ඔබට කලින් කිව්වා" හෝම්ස් කීය. "ඉතින් මං මගේ බේකර් වීථියේ අවිධිමත් රහස්පරීක්ෂකයන් යොදෙව්වා, කාසල් වීථියේ මිලර් නිවස ගැන සෝදිසියෙන් සිටීමට. ඔවුන් හිඟාකන බව පෙන්වමින් දවල් දවස පුරාත්, රාත්‍රිය පුරාත් ඔත්තු බැලුවා. මුලින් ජූලියා මෙනෙවිය ගෙදරින් පිටවෙලා ගියේ නැහැ. අන් වාරුවේ උදව්වෙන් යන සේවකයා මධ්‍යම රාත්‍රිය ළංවෙලා ගෙදරින් පිටවෙලා ගිය බව මට දැනගන්න ලැබුණා. ඔහු කුලීරියකින් ගමන්කළ නිසා, ගියේ කොහේටද කියන එක විගින්ස්ලාට සොයාගන්න බැරිවුණා.

මගේ නිරීක්ෂණ අනුව මං උපකල්පනයක් ගොඩනැඟුවා. ක්‍රිස් මිලර් අතුරුදන් වෙලා. මේ කණගාටුදායක අවස්ථාවේ මේ වයසක ජෝන් රයිගල් හැරමිටිය ගහ-ගහ කොහේද ඊ පාමෙ යන්නෙ? ජූලියා මිලර් අවිවාහක නිසා ඇය පෙම්වතෙකුට පණිවුඩ යවනවා කියල හිතමු. ඒත් ඒ පණිවුඩ මධ්‍යම රාත්‍රිය ළංවෙලා අරගෙන යන්නෙ ඇයි? පහුට මේ ගෙදරට එන්න කාගෙන් තහනමක්ද? ඉතින් මං නිගමනය කළා ක්‍රිස් මිලර් නියැකවම ජීවතුන් අතර ඇති. ඔහු ඇත්තේ මේ අවට කොහේ හරි සැඟවිලා.

මේ අවටම සැඟවුණා නම්, මුදල් තියෙන කෙනෙකුට ඒ සඳහා හෝටලයක්, හොඳ තරම් පහසු තැනක්ද. ඒ උපකල්පනය උඩ මං මේ අවට හෝටල් දහයක අමුත්තන්ගේ නාමලේඛන පරීක්ෂා කළා."





"ඔහු වහාම රටින් පැනගියේ නැත්තෙ ඇයි?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"එකත් ජූලියා මෙනෙවියත් වහාම ගෙදරින් අතුරුදන්වුණා නම් පොලීසියේ සැකය වහාම ඔවුන් වෙත එල්ල වෙනවා. අනික මේ දිනවල නෞකාවල කාමර වෙන්කර ගැනීම හරි අපහසුයි. ඒකට දින දහයක් දොළහක් බලාගෙන ඉන්න වෙනවා. ඇත්තෙන්ම ඔවුන් මොන්රෝවියා නැවේ කාමර වෙන්කරවා ගත්තේ මීට දින අටකට කලින්."

"ඔහු ගෙදර සැඟවුණේ නැත්තේ ඇයි?" මම ඇසීමි.

"එකත් ඉංග්‍රීසි ජාතික සේවිකාව. අනෙක සැකයක් ඇතිවුණොත් පොලීසිය මුලින්ම සෝදිසි කරන්නේ ඔවුන්ගේ ගෙදර" හෝම්ස් කීය.

"ඉතින් ඔබේ කථාව කියාන්න."

"මං කිය කිය හිටියේ හෝටල්වල අමුත්තන්ගේ ලේඛන ගැන....

ඔව්. ක්‍රිස් මිලර් අතුරුදන් වුණු සිකුරාදා මධ්‍යම රාත්‍රියට පසුව, හෝටල්වල නවාතැන් ගැනීමට පැමිණි අමුත්තන් ගැන, මගේ අවධානය යොමු වුණා. හෝටල් වල සේවකයන් හමුවෙලා මම නේවාසිකයන් ගැන තොරතුරු හොයන්න මට උදව්වුණේ කාට්රයිට්. සිකුරාදා සිට දින දහයක්ම රැඳී සිටි අමුත්තන්ගෙන්, හතරදෙනෙක් හැර, අනික් හැමෝම නිතර නිතර හෝටල වලින් එළියට ගියා. දිගටම කාමර වලටම වෙලා හිටියේ හතරදෙනයි. ඔවුන්ගෙන් දෙදෙනෙක් වයස්ගත, ආබාධිත කාන්තාවන්. එක් අයෙක් අන්ධභාවයට පත් වයස්ගත මහත්මයෙක්. අනෙක් තැනැත්තා තරුණ පියතුමෙක්. ඔහු හැනෝවියානු ජාතික ෆ්‍රාන්සිස් එමැනුවෙල් නම් පියතුමා බව මම සොයාගත්තා. කිසිම ආබාධිත බවක් නොතිබුණත් කෑම කෑවේ කාමරයට ගෙන්වාගෙන. අනෙක එක් මොහොතකට වත් කාමරයෙන් එළියට ගියේ නෑ. මගේ විශේෂ අවධානයක් යොමුවුණා ඔහු ගැන.

ඔහු නවාතැන් ගෙන හිටියේ එක්සෙල්සියර් හෝටලයේ. තවදුරටත් හොයා බලද්දී මට තවත් දේ දැනගන්න ලැබුණා. ඔහු හෝටලයට නවතින්න ඇවිත් තිබුණේ, අර මංගල උත්සවය තිබුණු සිකුරාදාට පසු සෙනසුරාදා උදේ පහට. මීට අමතරව තවත් තොරතුරක් මට සේවකයන්ගෙන් දැනගන්න ලැබුණා. ඒ මධ්‍යම රාත්‍රිය ළංවෙලා පියතුමා හමුවෙන්න එන වයස්ගත මහත්මයෙක් ගැන. ඔහුගේ විශේෂත්වය, ඔහු පැමිණියේ අත්වාරුවක උදව්වෙන්.

ඊළඟට මට විගින්ස්ගේ කොලුරැළෙන් තවත් ආරංචියක් ලැබුණා. ඒ මිලර් නිවසේ ඉඳලා කලිසම් කබා හිස්වැස්මෙන් සැරසුණු මහත්මයෙක් පාපැදියෙන් පිටවී ගිය බව. රාත්‍රියේ ගිය මොහු රාත්‍රියේම ආපහු ආවාලු. මේ කලිසම් කබා වලින් සැරසුණු ජූලියා මිලර් බවට සැක නෑ.

මොවුන් ඊළඟට කරන්නේ රටින් පැනයාම බව මම නිගමනය කළා. ඕස්ට්‍රේලියාවෙන් පැනපු ආ ඔවුන් ඊළඟට යන්නේ කොහේටද? ඒකට රටවල් බොහොමයක් තිබුණත්, ඔවුන් තෝරාගනීවි කියල මට හිතුණේ රටවල් තුනක් පමණයි. ඒ දකුණු අප්‍රිකාව, කැනඩාව නැත්නම් එක්සත් ජනපදය. මේ රටවලට යන නැව් වල මගී ලේඛන පරීක්ෂා කරල ඔවුන් හඳුනාගැනීම ඉතාම දුෂ්කර කාර්යයක්. (ඒ මොකද රටෙන් පැනයාමට ඔවුන් යොදාගන්නේ ඇත්ත නම් නොවෙන නිසා).

අද උදේ මම පිටත්වෙලා ගියේ මිලර්ලාගේ නිවසට, නිකං ගොඩවැදිලා, අලුත්ම තොරතුරු විමසන අරමුණෙන්. නමුත් මගේ ඉස්සරහට හම්බවුණේ විගින්ස්. ටික වෙලාවකට පෙර මිලර් නෝනා සහ සේවකයා රෝද හතරේ අශ්වකරත්තයකින් ගමන් මලු කිහිපයක් රැගෙන පිටවෙලා ගිය බව ඔහු කීවා. මං වහාම ගියා නැව් කටයුතු කාර්යාලයට. අද හවස 3.30 ට පිටත්වීමට නියමිත මොන්රෝවියා නෞකාව යාත්‍රාකරන්නේ නිව්යෝක් බලා බව ඔවුන් පැවසුවා. එතැනින් ඉදිරියට සිද්ධවුණේ මොනවාද කියල ඔබ දන්නවා."

"හෝම්ස් මහත්මයා. එතකොට මේ කපිතාන් මිලර් හා ඔහුගේ සොයුරිය ජූලියා නමින් පෙනී සිටියේ ඇත්තෙන්ම කවුද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

"රේ නොරිස් සහ රූත් නොරිස් නම් අපරාධකාරයින් ජෝඩුව" හෝම්ස් කීය. "රත්රන් සිගරට් අසුරණය සහිත කබාය හා හිස්වැස්ම ලේ පැල්ලම් සහිතව ගඟ ඉවුරේ රැඳිලා, පොලීසිය සැහෙන දුරට නොමඟ යවන්න ඔවුන් සමත්වුණා. ඔවුන්ගේ හොඳ වෙලාවට හඳුනාගන්න බැරි මළසිරුරකුත් තේම්ස් ගඟෙන් හමුවුණා. මොවුන් කර ඇති අපරාධ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඔබට අද හෙටම ඕස්ට්‍රේලියාවෙන් ලැබේවි ලෙස්ට්‍රේඩ්."





"ඇගේ අතුරුදන්වූ පෙම්වන්තයා සොයාදීම කෙසේ වෙතත්, ඇගේ පවුම් විසිදහසක් වටිනා මුතු ආභරණ සොයාදීම ගැන පැට්‍රීෂියා බැරිංටන් මෙනෙවිය ඔබට තෑග්ගක් දෙනවාට සැක නෑ හෝම්ස්" මම කීවෙමි.

"නියම අපරාධකාරයින් අල්ලාදීම ගැන මං ඔබට කෘතඥ වෙනවා හෝම්ස් මහත්මයා" ලෙස්ට්‍රේඩ් කීවේ අසුනෙන් නැගිටිමිනි. "තව ටිකෙන් හොඳකොට ආණ්ඩුකාරයාගේ පුතාට නිරපරාදේ නඩුපවරලා, මාව ලොකු අමාරුවක වැටෙන්න ඉඩතිබුණා."

"මිතුරන් අමාරුවේ වැටෙන්න යන වෙලාවක ඔවුනට පිහිටවීම තමා මිතුරන්ගේ යුතුකමක් එහෙම නේද ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීවේ තම සුරත දිගුකර අල්ලගෙන ස්තුතිය පුදකළ පොලිස් නිලධාරියාගේ පිටට අනෙක් අතෙන් තට්ටුකරමිනි.



www.sinhalaelibrary.com
Reading Purpose Only

# වෙස් මුහුණ

එද 1888 අප්‍රේල් මාසයේ දෙළොස් වැනිදාය. මෙය මගේ බිරිඳ සොම්ප්‍රතිගාගෙන් පිටා විඳි දිනයක් ලෙස මගේ දිනපොතේ සටහන්ව ඇත. මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් හා සමග යෙදුණු අපරාධ පරීක්ෂණ අතුරෙන්, මේ පරීක්ෂණයට මා එදින යොමුවුණේ, ඉතාම පුදුමසහගත ආකාරයකට බැව් කිවයුතුය.

මීට පෙර ද මා සඳහන් කර ඇති අයුරෙන්, විවාහ වූ අලුත මම පැඩිංටන්හි වෛද්‍ය චිකිත්සාගාරයක් ඇරඹුවෙමි. මේ කාලය වන විටත් එය මහජනයා අතර එතරම් ප්‍රසිද්ධ වී නොතිබිණි. හැකිතරම් රෝගීන් කැඳවා ගැනීමේ අරමුණෙන්, උදෑසන අට වෙද්දී මම ශල්‍යාගාරයේ දොර විවෘත කිරීමට පුරුදුව සිටියෙමි. එද මා විසිත්ත කාමරයට පැමිණ ගිනි උදුන දල්වද්දීම, එක්වරම අපේ සීනුව නාදවෙන හඬක් මට අසන්නට ලැබිණි.

මේ තරම් උදේ ජාන්දරින් ප්‍රතිකාර සඳහා කිසිවෙකු පැමිණ ඇත්නම්, ඒ ඉතා නදින් රෝගාතුර වූ අයෙකු විය යුතුය. මම ඉක්මනින් ගොස් ඉදිරි දොර විවෘත කළෙමි. දොර අසල සිටගෙන සිටියේ තරුණ, රූමත් කාන්තාවකි. එහෙත් මගේ අවධානය එක්වරම යොමුවූයේ ඇගේ රූමත් බව වෙත නොවේ. අතිශයින්ම සුදුමැලි වූ මුහුණෙන් ඇය සිටියේ, දැඩි කැලැඹීමකට පත්ව බව එක්වරම මම දුටුවෙමි.

"මේ දොස්තර වොට්සන්ද?"

"ඔව්?"

"මේ තරම් උදෑසනින් ඔබට කරදර කිරීම ගැන මට සමාවෙන්න. මං ආවේ..... මං ආවේ....." කිසිවක් කියාගැනීමට නොහැකිව ඇය ගොතගැසීමට පටන්ගත්තාය.

"තරුණිය මගේ චිකිත්සාගාරය ඇතුළට එන්න" මම කීවෙමි. "අවුරුද්දේ මේ කාලෙට කාලගුණයේ තිබෙන්නෙ උණුසුම් බවක්. ඒ වුණත් ඇතුළට සුළං නොඑන විධියට කාමරය හොඳින් වසා නොතිබුණොත්, රෑට ශීතල සුළං හමා ඇවිත් අසනීප වෙන්න ඉඩ තියෙනවා."





මා මෙසේ කියද්දී ඇය මා දෙස බලා සිටියේ ඇගේ අළු පැහැති දෙනෙත් ඉතා විශාල කරගෙනයි.

"..... හොඳින් වැසූ කාමරයක්?" ඇය උස් හඬින් කීවාය. "දෙවියනේ! සම්පූර්ණයෙන්ම වැසූ කාමරයක්....!" ඇගේ කෑගැසීම විලාපය දක්වා වැඩිවිය "දෙවියනේ!!" ඇගේ විලාපය මුළු නිවස පුරාම පැතිරගියේ එය දෙවතාවක් වන අයුරෙනි. ඒ මොහොතේම ඇය සිහි මූර්ඡාවී, කපාගෙහෙළූ ගසක් මෙන් විසිත්ත කාමරයේ බිඳ වැටුණාය.

මම දැඩි භීතියකට පත්වූයෙමි. තරමක් අසීරුවෙන් ඇය ඔසවා, සෝපාව මත හාන්සි කරවූයෙමි. මිනිත්තුවක් ගතවෙද්දී මගේ බිරිඳ උඩ තට්ටුවේ සිට පහළට දුව ආවේ කෑගසමිනි. "දෙයියන්ට ඔප්පු වුනාවේ! මොකක්ද ජෝන් ඒ විලාපෙ? ඇය ඇසුවාය.

එහෙත් සෝපාව උඩ සිහි විසඥව සිටි තරුණිය දුටු මගේ බිරිඳ, එක්වරම හුස්මක් ඉහළට අල්ලා නිහඬවූවාය. තරුණිය මඳක් යථා තත්වයට පත්වෙද්දී බරැන්ඩි කෝප්පය ඇගේ මුවට තබා, උගුරක් බීමට සැලැස්වීමි.

"දෙවියනේ! මේ කෝරා මයර් නේද?" මගේ බිරිඳ ඇසුවේ විමතියෙනි.

"මේ තරුණ කාන්තාව කවුද කියල ඔයා අඳුනනවද මේරි?" මම ඇසීමි.

"මං හිතන්නේ මං ඇයව අඳුනනවා. ඉන්දියාවේ හිටි කෝරා මයර් මං දනගෙන හිටියා. ඇගේ පියාත් මගේ පියාත් අවුරුදු ගණනාවක් තිස්සේ හොඳ මිතුරන් ලෙස සිටි අය. අපි දෙන්නා විවාහවුණු වෙලේ, මා ඇයට ලියුම් පවා යැව්වා"

"ඔයා ලියුම් යැව්වේ ඉන්දියාවටද?"

"නෑ නෑ. දැන් ඇය ජීවත්වෙන්නේ එංගලන්තයේ. කෝරා තමයි එලිනර් ග්‍රෑන්ඩ්ගේ හොඳම මිතුරිය. එලිනර් තමයි අර ටිකක් වයස්ගත තර්නිහල් රොචෙස්ටර් සමග විවාහවුණේ. කෝරා පදිංචි වෙලා ඉන්නේ කේම්බ්‍රිජ් ටෙරසයේ ඔවුන්ගේ ඉඟෙඩරමයි."

මගේ බිරිඳ ඒ වාක්‍යය අවසන් කරද්දී, තරුණිය දෑස් විවෘත කොට බැලුවාය. මගේ බිරිඳ අමුත්තියගේ අතට තට්ටු කළේ

"කලබල වෙන්න දෙයක් නෑ කෝරා. මා මේ මගේ මහත්තයාට කිය කිය හිටියේ ඔයා තර්නිහල් රොචෙස්ටර් හා ඔහුගේ බිරිඳ සමග කේම්බ්‍රිජ් ටෙරසයේ පදිංචි බව"



www.sinhalaelibrary.com

"ඒ ඉස්සර" මගේ මෙහෙවිය උස් හඬකින් කෑගැසුවාය. "කර්නල් රොචෙස්ටර් ඊයේ රෑ මියගියා. ඔහුගේ බිරිඳ බරපතල තුවාල ලැබුවා. මේ මොහොත වෙනකොටත් ඇය මියගිහින්ද ජීවතුන් අතරද කියන්න මං දන්නෙ නෑ. ඔවුන් දෙදෙනා අර භයානක වෙස්මුහුණ ළඟ වැටිලා ඉන්න හැටි දුටුව ගමන්, මම ඔක්කොම තේරුම් ගත්තා. වෙස්මුහුණේ බිහිසුණු, කුරිරු පෙනුම නිසා, කර්නල් රොචෙස්ටර්ට පිස්සු හැදෙන්න ඇති. ඔහුගේ මොළේ නරක් වුණා. ඔහු ඒ විධියට උමතුවුණේ නැත්නම් මෙහෙම දෙයක් කරගනීවිද? හොඳින් වැසූ කාමරයක් ඇතුළට වෙලා බිරිඳටත් වෙඩි තියලා, තමන්ටත් වෙඩි තියාගනීවිද? ඒ වුණත් මේ වගේ භයානක ක්‍රියාවක් කර්නල් රොචෙස්ටර් අතින් වුණා කියල කොහොම හිතන්නද?"

මගේ බිරිඳගේ අත දෑතින්ම බදාගෙන සිටි තරුණිය, මා වෙත හෙළුවේ බැගෑපත් බැල්මකි.

"අනේ දොස්තර වොට්සන්! ඔබ අපට උදව් කරන බව මං දැනගෙන හිටියා. ඔබේ යාළුවා ෂර්ලොක් හෝම්ස් මහත්තයට අප වෙනුවෙන් කරන්න පුළුවන් දෙයක් නැද්ද?"

නිවසක සිදුවූ ඛේදවාචකයක් ගැන මේ තරුණිය සිහිවිකලෙන් මෙන් නැගූ විලාපය, මමත් මගේ බිරිඳත් විමතියට පත්ව අසා සිටියෙමු.

"ඒ වුණත් ඔබ කියන්නේ කර්නල් රොචෙස්ටර් මියගිහින් කියල නේද?" මම ඇසීමි.

"එයින් වෙන්නේ අපරාධකාරයෙක් ලෙස ඔහුගේ නාමේ දූලි ගෑවෙන එකයි. එහෙම නේද? මං මෙහෙම ආව එකෙන් දැන් කිසිම ප්‍රයෝජනයක් නැද්ද?"

"එහෙම හිතන්න එපා කෝරා" මගේ බිරිඳ සිය යෙහෙළිය අස්වැසුවාය. "අපි පුළුවන් උත්සාහයක් ගමු. ජෝන් ඔයා මොකක් කරන්නද හිතුවෙ?"

"කුලීරියක නැගලා අපි යමු බේකර් වීදියට" මා කීවේ ඔරලෝසුව දෙස බලමිනි. "ඔහු උදේ කෑම කන්න කලින් අල්ලාගන්න අපට හැකිවේවි"

මා සිතූ අයුරින්ම හෝම්ස් සිටියේ ඔහුගේ උදේ ආහාරය සපයන තුරු නොඉවසිල්ලෙනි. මගේ මෙහෙවිය සමග මෙතරම් උදෑසනින් ඔහු හමුවීමට පැමිණීම ගැන, මගේ මිත්‍රයා එතරම් පුදුමයකට පත්වූ බවක් මම නුදුටුවෙමි.



www.sinhalaelibrary.com



"ප්‍රශ්නය වුණේ හෝම්ස්" මම කථාව ඇරඹීමි. "අද උදේ මං සූදානම් වුණේ....."

"ඔව් මිත්‍රයා. ඔබ සූදානම් වුණේ ඔබට පුරුදු විධියට විසිත්ත කාමරයේ ගිනිඋදුන දල්වන්න. ඔබේ වම් අතේ මහපටැඟිල්ලෙන්, මට ඒ බව කියන්න පුළුවනි....."

මීළඟට ඔහුගේ අවධානය යොමුවුණේ තරුණියගේ ශෝකාකුල මුහුණ වෙතය.

"මේ කාන්තාව දැඩි කම්පනයකට පත්වෙලා ඉන්න බව මට පැහැදිලිවම පෙනෙනවා" හෝම්ස් කීය. "මෙමහෙවිය. හැමදේටම කලින් ඔබ උදේට කෑමබීම මොනවා හරි අරගෙන සිටිය යුතුයි. ඊට පස්සේ අපි කථා කරමු."

මා ආහාර ස්වල්පයක් ගිල දමනතුරු, මට එක වචනයක් හෝ කථාකිරීමට හෝම්ස්ගෙන් අවසර නොලැබිණි. කෙසේ වෙතත් කෑම ප්‍රතික්ෂේප කළ මගේ මෙහෙවිය, කෝපි කෝප්පයක් පමණක් පානය කළාය.

කෝරා මගේ මෙහෙවිය මට දැන්වූ තොරතුරු ස්වල්පයම, මගේ මිතුරා සමග ද පැවසුවාය.

"හ්ම්. මෙතැන මහා ඛේදවාචකයක් සිදුවෙලා බවයි මට පෙනෙන්නේ" ඔහු කීය. "නමුත් මං ඔබට පිහිට විය යුත්තේ මොන ආකාරයකටද කියල මට හිතාගන්න අමාරුයි. කර්නල් රොචෙස්ටර් කියල කෙනෙකුගේ සිහි විකල් වෙනවා. ඔහු තමන්ගේ බිරිඳට වෙඩි තියනවා. ඊළඟට තමාටම වෙඩි තියාගන්නවා. ඒකේ මොකුත් සැකයක් නැහැ නේද?"

"අවාසනාවකට වගේ සැකයක් හිතන්න තරම් කරුණු මොකුත් නැහැ" මගේ මෙහෙවියට කෙඳිරි ගෑවිණි. "මුලින් නම් අපට හිතුණේ මේක ගෙවල් බිඳින හොරෙකුගේ වැඩක් කියලයි."

"මෙහෙවිය. කරුණාකර මුල ඉඳලාම මේ සිද්ධවුණු දේවල්, පිළිවෙළින් පැහැදිලිව කියන්න" හෝම්ස් ඉල්ලා සිටියේය. "කාරණා එහෙම කිව්වොත් හුගක් ප්‍රයෝජනවත් වේවි. ඔබ කාගෙ කවුද, ඔබ මෙතැනට සම්බන්ධ වෙන්නෙ කොහොමද කියලත් කිව්වොත් වඩාත් හොඳයි"

මඳ වේලාවක් නිශ්ශබ්දව අප දෙදෙනා දෙස බලාසිටි තරුණිය, සිතේ දැඩි අධිෂ්ඨානයක් ඇතිකරගත් අයුරෙන් කථාකිරීමට පටන් ගත්තාය.

"හෝම්ස් මහත්මයා—මගේ තාත්තා කපිතාන් මරේ. ඔහු සේවය කළේ, ඉන්දියානු කැරැල්ල මැඩපැවැත්වීම සඳහා එංගලන්තයෙන් යැවූ සේනාංකයේයි. මං ඒ කාලයේ ඉන්දියාවේ ජීවත්වුණා. එහේ ඉඳිද්දී මගේ හොඳම මිතුරිය වුණේ එලිනර් ගේන්ඩ්. ඇය ඉතාම සුරූපී තරුණියක්. මේ කාලයේම ඉන්දියාවේ බ්‍රිතාන්‍ය සේනාංකයේ සේවය කළ කර්නල් රොචෙස්ටර්, ඇයගේ සිත දිනාගැනීමට සමත්වුණා. ඔහු දක්ෂ, අවංක, නිර්භීත සේනාධිපතියෙක් හැටියට කීර්තියක් ලැබූ කෙනෙක්. මැදිවියට ළංවුණු කර්නල් රොචෙස්ටර් සමග එලිනර් විවාහවුණාම, සමහරු ටිකක් පුදුමයට පත්වුණා. එංගලන්තයට ආපසු ආවාම ඔවුන් පදිංචි වුණේ, කේම්බ්‍රිජ් ටෙරසයේ අංක 9 දරන නිවසේ. මේ වගේ හොඳ සැප පහසු නවීන නිවාස, ඔබ හයිඩ්පාක් පෙදෙසේ ඕනෑතරම් දැකලා ඇති."

"මේ සිද්ධිය වෙන වෙලාවේ ගෙදර හිටි අනෙක් අය කවුද?" හෝම්ස් ඇසීය.

"මේජර් අර්න්ශෝ නම් කර්නල් රොචෙස්ටර්ගේ මිත්‍රයෙක් සිටියා. ඔහු සෑහෙන කාලයක් සිට මේ ගෙදර නැවතී ඉන්නා අමුත්තෙක්. ඔහු වයස අවුරුදු පනස්පහක් පමණ කෙනෙක්. තවත් හිටියා කපිතාන් හැරල්ඩ් බැඩ්බරි. ඔහු මේ ගෙදරට ආවේ ඊට කලින් දවසේ"

"ඔහු කවුද?"

"කපිතාන් බැඩ්බරි තරුණයෙක්. ඔහු තමා කර්නල් රොචෙස්ටර්ගේ බෑනා. ඇත්තෙන්ම ඔහු තමා කර්නල්ට මෙලොව ඉන්න එකම ඥාතියා."

"ඔහු වයස කීයක කෙනෙක්ද?"

"වයස අවුරුදු විසිඅටක තිහක විතර කෙනෙක්."

"කර්නල්වරයා හා ඔහුගේ බිරිඳ අතරේ විවාහ ජීවිතය, බොහොම සාමදානයෙන් ගෙවී ගිය එකක්ද?"

හෝම්ස් ඇසූ මේ ප්‍රශ්නයට, මරේ මෙනෙවියගෙන් එක්වරම පිළිතුරක් නොලැබිණි. මඳ වේලාවක් කල්පනා කළ ඇය කථාව පටන්ගත්තාය.

"ඔවුන් දෙදෙනා අතර තිබූ වයස් පරතරය නිසා වෙන්න ඇති; නිතර නිතර නොවුණත් දෙදෙනා අතර සුළු සුළු අඬදබර ඇතිවුණා. ජෝජ් රොචෙස්ටර් කීර්තිමත් හමුදා නිලධාරියෙක් බව ඇත්තයි. හැබැයි





ඔහු සමග බිරිඳකට ජීවත්වීම නම් අමාරු බව මා කිවයුතුයි. ඒයේ රාත්‍රිත් දෙදෙනා අතර සණ්ඩුවක් ඇතිවුණා. ඒ වුණත් මට සහතික වෙන්න පුළුවනි. ඒක මේ වගේ බිහිසුණු ප්‍රතිඵල ගෙන එන ආකාරයේ සණ්ඩුවක් නොවෙයි.

ඔවුන් ඉන්දියාවෙන් පිටවෙලා එංගලන්තයට එද්දී, මාත් ඔවුන් සමග ඇවිත් කේම්බ්‍රිජ් ටෙරසයේ නිවසේ පදිංචි වුණා. ගෙදර වැඩ කටයුතු කිරීමට සිටින ප්‍රධාන මෙහෙකාරයා ඉන්දියන් ජාතිකයෙක්. කර්නල් ඉන්දියාවේ රාජකාරි කරද්දී, ඔහුට බොහොම හිතවත්, පක්ෂපාතව හිටි මේ [illegible] සිං නම් ඉන්දියානු ජාතිකයා, එංගලන්තයටත් කැඳවාගෙන ආවා. ඔහු ඉතා හොඳින් තමන්ට භාර වැඩ කටයුතු ඉටු කළා. කර්නල් රොචෙස්ටර් කාලයක් ඉන්දියාවේ ජීවත්වුණු නිසා, ඔහු ඉන්දියානු සංස්කෘතිය හා එහි කලා ශිල්ප වලට කැමැත්තක් දැක්වූවා. ඒ නිසා ගෙදර හැම තැනකම දකින්න ලැබුණේ හින්දු දෙවිවරුන්ගේ පිළිම, වෙස්මුහුණු, ඉන්දියානු සුවඳ විලවුන්. ඉන්දියාවේ ආග්‍රා නගරයේ නිවසක පරිසරය තමයි, කේම්බ්‍රිජ් ටෙරසයේ අපි පදිංචි නිවසේ තිබුණෙත්.

නිවස තිබෙන්නේ කේම්බ්‍රිජ් ටෙරසයේ ප්‍රධාන පාරට මායිම වෙලා. නිවසේ ඉදිරිපස දොර සහිත බිත්තිය හා ප්‍රධාන පාරට අතර කුඩා උද්‍යාන තීරුවක් තිබෙනවා. මෙය තණකොළ වවා නොයෙක් හැඩයේ හා ප්‍රමාණ වල, ගල් හා දුර්ලභ පාෂාණ වර්ග තැබූ උයනක්. මේ උයනට මුහුණ දල කාමර දෙකක් තිබෙනවා. ඉදිරි දොරට වම් පසින් තිබෙන්නේ එක් කාමරයක්. එහි තිබෙන්නේ ජනේල දෙකයි. ඒ ජනේල දෙකම ප්‍රංශ මාදිලියේ ඒවා. මං එයින් අදහස් කළේ පොළොවේ මට්ටමේ සිට අඩි පහමාරක් හයක් උසට ඇති ජනේල..."

"මේ ජනේලයක පළල කොපමණද කියලා ඔබට කිව හැකිද?"

"මං හිතන්නේ අඩි දෙකක් හෝ ඊට වැඩියි. කෙනෙකුට ඒ ජනේලයෙන් පහසුවෙන් ගෙට ඇතුළුවිය හැකියි."

"ස්තුතියි. ඔබේ කථාව දිගටම කියන්න"

"මම කලින් කිව කාමරය හැඳින්වුණේ අරුමෝසම් බඩු කාමරය නමින්. ඒ මොකද කර්නල් රොචෙස්ටර් ඉන්දියාවෙන් නොයෙකුත් අරුමෝසම් බඩු තබා තියෙන්නේ මේ කාමරයේ. ලෝහයෙන් තැනූ දේවල්, ලී වලින් හැදූ, කැටයම් කළ දේවල් බුමුතුරුණු, පොරාණික බඩු ආදී නොයෙක් දේ මෙවාට අයත්වෙනවා.

Reading Purpose Only. Not For Print.

## කර්නල් ගොවෙස්ටර්ගේ නිවසේ සැලැස්ම







ඊයේ රෑ කෑමෙන් පසුව එලීනර් කිව්වා ඇයට ඇගේ සැමියා එක්ක කළ යුතු කතාබහක් තියෙනවා කියලා. ඉතින් ඔවුන් ඒ සඳහා ගියේ අරුමෝසම් බඩු කාමරයට. මේ අතරේ මේජර් අර්න්ෂෝ සහ මම, ලොබිය නමින් හැඳින්වෙන කුඩා කාමරයට වෙලා වාඩි වෙලා හිටියා.

"මොහොතක් ඉන්න" යයි කී හෝම්ස් එම කරුණ ඔහුගේ කමිස අත් සටහන් කරගත්තේය. "මොහොතකට කලින් ඔබ කිව්වා, ගෙදර උද්‍යානයට මුහුණදලා කාමර දෙකක් තියෙනවා කියල. එකක් කර්නල්ගේ අරුමෝසම් බඩු කාමරය. ලොබිය කියන්නේ මේ අනික් කාමරයද?

"නැහැ. උයනට මුහුණ දී තිබෙන අනික් කාමරය, කෑමකන කාමරය. ලොබිය තියෙන්නේ එහාපැ පිටුපසින්. ඒ දෙක එකිනෙකට සම්බන්ධ වෙන්නේ නැහැ" යැයිද යුතු කිසිම වැඩක් නැතුව, කම්මැලියි කිය කිය තමා, මේජර් අර්න්ෂෝ හිටියේ. එතකොට තමා හැරල්ඩ් ආවේ"

"ඔබ අදහස් කළේ කපිතාන් හැරල්ඩ් බැරඩ්ඩබරිද?"

"ඔව්. ඔහු කීවා ඔහු සාලය හරහා එනකොට අහන්න ලැබුණා කියල. ඔහුගේ මාමා සහ එලිනර් අතරේ ලොකු සණ්ඩුවක්. හැරල්ඩ් මේ ගැන හරිම කම්පාවකට පත්වෙලයි හිටියේ.

"මං කෙන්සිංටන් ඉඳල මෙතරම් දුරක් ආවෙ මගේ වයසක මාමා එක්ක කතාබහ කරල යන්න" හැරල්ඩ් කිව්වා. "ඒත් දැන් බලනකොට ඔවුන් අතර සණ්ඩු. ඔවුනට බාධා කරන්න මං කැමැති නෑ. එයාලා හැමදාමත් මේ විදියට සණ්ඩුසරුවල් වෙනවද?" හැරල්ඩ් මගෙන් ඇහුවා.

"ඉඳහිට ප්‍රශ්න ඇතිවෙනවා තමයි" මං කීවා. "ඒ වුණාට හැමදාමත් සණ්ඩුවෙන්නෙ නෑ. හැරල්ඩ් ඔබ ඔහොම කථාකරන එක හරි අසාධාරණයි"

"අනේ මං දන්නෙ නෑ" හැරල්ඩ් කීවා. "සණ්ඩු සරුවල් කියන ඒවා මට පෙනෙන්න බෑ. කොහොම වුණත් මට නම් හිතෙන්නේ, මාමා ගැන සලකලා එලිනර් මීට වඩා ඉවසුවොත් හොඳයි"

"ඇය හරිම ඉවසිලිවන්තයි" මං කීවා. "ඇය ඔබේ මාමාට හරිම ආදරෙයි. ඇය ගෙවන්නේ ඔහු වෙනුවෙන්ම කැප කළ ජීවිතයක්"

කපිතාන් හැරල්ඩ් ගැන, එලිනර්ගේ හිතේ කැමැත්තක් තිබුණේ නැහැ. ඒ බව ඔහු දැනගිටින්න ඇති. ඔහු නිදහසේ මුදල් වියදම් කරමින් ගෙවුවේ විනෝදකාමී ජීවිතයක්.

www.sinhalaelibrary.com

"ඕකා අමතක කරලා දමන්න. අපි විස්ට් ක්‍රීඩා කරමු" මේජර් අර්න්ෂෝ කිව්වේ කාඩ්දසී කුට්ටම අනමින්. "අපට පුළුවනි තුන්දෙනාගේ විස්ට් අතක් ගහන්න. එක ලකුණට පැන්ස දෙකක් ගණනේ ඔට්ටු අල්ලමු"

"මට කාඩ්ගහල ඇති වැඩක් නෑ." හැරල්ඩ් කිව්වා. "මං යනවා කෑම කාමරේට වෙලා වයින් ටිකක් බොන්න"

ඔහු එතැනින් පිටවී යන්න ගියා. ඒ අතරේ අප දෙදෙනා කාඩ්දසී කුට්ටමෙන් 'බෙසීක්' ක්‍රීඩාව කළා.

"ඔබ හරි, මේජර් අර්න්ෂෝ හරි, ඊට පස්සේ එතැනින් පිටවී එළියට ගියා ද?" හෝම්ස් ඇසුවේය.

"ඔව්. මේජර් කිව්වා ඔහුගේ දුම්කුඩු හෙප්පුව කොහේ දලද දන්නෙ නෑ. ඔහුට මතක නැටියද ඒක උඩතට්ටුවෙයි ඇත්තෙ කියල. ඔහු තවදුරටත් කිව්වා නහයට දුම්කුඩු ටිකක් දුරන්නෙ නැතිව, ඔහුට කාඩ් ක්‍රීඩාවට සිත යොමු කරන්න අමාරු බව. ඉතින් මේජර් අර්න්ෂෝ දුම්කුඩු හෙප්පුව හොයාගෙන එන්න ලොබියෙන් පිටවෙලා ගියා.

මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. මම කාඩ් ටිකත් අල්ලාගෙන බලාගෙන හිටියා. කිසිම ශබ්දයක් නොතිබුණු මේ පාළු කාමරේ ඉද්දී මට මතක්වුණේ අර භයානක යක්ෂ වෙස්මුහුණ. ඒකෙන් ගලා ආ භයානක දේවල්; මං වමට් කරකැවෙන්න පටන්ගත්ත දෝ කියල මට හිතුණා. මේ මලයක්ෂ වෙස් මුහුණ ගෙදරට ගෙනාවිත් අරුමෝසම් බඩු කාමරේ කබඩ්වර අල්මාරිය උඩ තැබූ දවසෙ ඉඳල, මරණය ඒ ගෙදර සැරිසැරුවා හෝම්ස් මහත්තයා. ඉන්දියන් සේවක විරේන්දර් සිංගේ මුහුණෙත් පිළිබිඹු වුණේ, මරණයේ සේයාවමයි"

"ඉතින් ඔබ ඊළඟට මොනවද කළේ?" හෝම්ස් ඇසීය.

"මට කරන්න කිසිම දෙයක් තිබුණේ නෑ. මා නිශ්ශබ්දව කල්පනා කර කර හිටියා. එතකොට හිස්වරම මට ඇසුණා, කන් දෙදරවන වෙඩි හඬ දෙකක්" කියූ මගේ මෙනෙවිය ඇය මහාදුනුවත්වම වාඩිවී සිටි පුටුවෙන් ඉහළට එසවුණාය.

"හෝම්ස් මහත්තයා හිතන්න එපා, මේක මට වුණු වැරැද්දීමක් කියලා..." දීප්ත හුනුමක් ඉහළට ගත් ඇය යළිත් අසුන මතට ඇද වැටුණේ අප්‍රාණික විලසිනි. "එක මොහොතකට මං භයෙන් ගල්ගැහුණා. ඊළඟට මං දිව්වා විසිත්ත කාමරයට. තව ටිකෙන් මං





මේ පැත්තට දුවගෙන ආවා මේජර් අර්න්ෂෝගේ ඇගේ හැප්පෙනවා. මං ඇසූ ප්‍රශ්නයට ඔහු දුන්නේ කිසිම සම්බන්ධයක් නැති පිළිතුරක්. එතකොටම හැරල්ඩ් කෑමකාමරයේ ඉඳල විසිත්ත කාමරයට ආවෙ පෝට්වයින් සහිත ඩිකැන්ටරයක් අතේ අරගෙන. ඔහු කිව්වා "කෝරා. ඔබ ඉන්න තැන එහෙමම ඉන්න. එළියේ හොරෙක් ගැවසෙනවා වගෙයි"

ඊළඟට පිරිමි දෙන්නා අරුමෝසම් කාමරයේ දෙර වෙත වහාම දුව ගියා. නමුත් ඒක ඇතුළු පැත්තෙන් අගුළු දමල බව එතකොටයි තේරුණේ.

"ෂා මේක ඇතුළෙන් අගුළු දමාගෙන." මේජර් අර්න්ෂෝ කිව්වේ බලාපොරොත්තු කඩවුණු හඬින් "ඉලන්ද්‍රියා. මට උදව් කරනවා. අපි දෙන්නා එකතුවුණොත් අගුල කඩාගෙන දෙර අරින්න පුළුවන්."

"මේ බලන්න මහත්තයා" හැරල්ඩ් කිව්වා "ඔය වගේ ශක්තිමත් දොරක් කඩන්න නම්, ඔබට වෙඩිබෙහෙත් දමලා පුපුරුවන්න සිදුවේවි. මං අනෙක් පැත්තෙන් දුවල ගිහින්, දිග ජනේලයක පියන ඇරගන්න පුළුවන්ද කියල උත්සාහ කරල බලන්නම්."

"ඒ කථාවට අපි ඔක්කොම එළියට දිව්වා."

"අපි ඔක්කොම කියන එකෙන් ඔබ අදහස් කළේ කවුද?" හෝම්ස් ඇසීය.

"මේජර් අර්න්ෂෝ, හැරල්ඩ්, විරේන්දර් සිං සහ මම. ළඟම තිබූ ජනේලයෙන් අපි එබිල බැලුවා. එහෙම බැලීමට හැකිවුණේ ජනේල ආවරණය කිරීමට ඇති ජනෙල් රෙදි පැත්තකට ඇදලයි තිබුණේ. ඒ නිසා එළියේ ඉඳලා කාමරයේ ඇතුළත හොඳින් පෙනුණා.

බැලූ බැල්මටම පෙනුණා, කර්නල් සහ එලිනර් දෙදෙනා, රතු පැහැති බෙල්ජියම් පළස මත උඩුබැලි අතට වැටී සිටි හැටි. එලිනර් ගේ පපුවේ තිබූ තුවාලයකින් ඒ වෙලාවේ ලේ ගලමින් තිබුණු හැටි මට පෙනුණා"

"ඊළඟට?"

"ඔබට මතකද මං කිව්වා ගේ ඉදිරිපස උයනක් ඇතිබව. ඒකෙ නොයෙකුත් අලංකාර හැඩවල ගල් හා පාෂාණ කැබලි තියෙනවා කියලා?"

"ඔව්. මට මතකයි"

"හැරල්ඩ් අනික් අයට කිව්වා ගේ ඇතුළට ගිහින්, විසිත්ත කාමරේට විවෘත වෙන, දැනට අගුළු දමා ඇති දෙර ළඟ සූදානමෙන්



www.sinhalaelibrary.com

ඉන්න තියලා. කාමරේ ඇතුළෙ ඉන්න හොරා ඒ පැත්තෙන් පැන යන්න ඉඩ ඇති නිසා, ඒ පැත්තෙන් මුරකරන්න කිව්වා.

හැරල්ඩ් එළියට දිව්වා. උද්‍යානයෙන් ගලක් අරගත්තා. ඒකෙන් ජනේලයක වීදුරුව කඩා බිඳ දමලා කාමරයට ඇතුළුවුණා. නමුත් හෝම්ස් මහත්මයා. කාමරය ඇතුළේ හොරෙක් හිටියේ නැහැ. ඒක මට බැලූ එක බැල්මෙන්ම පෙනුණා. මේ දිග ජනේල වල ඉහළින් හා පහළින් අගුළු තිබුණා. ඒවා කිසි එකක් බුරුල් කරලා නැහැ. අනික් කවුරුත් දෙර ළඟට යන්න කලින් මං ගිහින් බැලුවා. කාමරේ තිබුණා ඉවසා දරාගන්න බැරි තරම් සුරුට්ටු ගඳක්. දෙර තිබුණෙත් ඇතුළතින් අගුළු දමලා. හොරෙකුට ඒ කාමරයට ඇතුළට එන්න විධියක් නැති බව මා දැනගිටියා."

"ඔබ එය දැනගිටියා?"

"ඔව්. ඒ මොකද නමත් එකතුකරගත් අරුමෝසම් බඩුවල පරෙස්සම ගැන කර්නල් හිටියේ හිතේ සැකයෙන්." මගේ මෙනවිය පිළිතුරු දුන්නාය. "ඒ නිසා වැඩි ආරක්ෂාවක් ඇතිවෙන විධියට මේ කාමරේ සකස් කර තිබුණා. වීරේන්ද්‍ර සිං ඇසිපිය නොහෙළා බලා හිටියේ වෙස්මුහුණේ තද නිල්පාට ඇස්දෙක දිහා. මේජර් අර්ත්හෝගේ කකුල වැදුණා. කර්නල් රොචෙස්ටර්ගේ අත ළඟ වැටිලා තිබුණු රිවෝල්වරයේ. ඔහු කිව්වා "මේක මහා දරුණු අපරාධයක්. අපි වහාම වෛද්‍යවරයා කැඳවමු." ඉතින් හෝම්ස් මහත්මයා, මට කියන්න තියෙන්නෙ එපමණයි"

"හ්ම්, දැන් එතකොට මොකක්ද ඇතිවී තිබෙන තත්ත්වය?" ඔහු ඇසීය.

"අසරණ එලිනර්ට බරපතළයි. ඇය මන්චෙස්ටර්හි පෞද්ගලික රෝහලකට ඇතුළු කළා. ඇයගේ ජීවිතය බේරාගැනීමට හැකිවේද කියන එක සැක සහිතයි. කර්නල් ජෝජ් රොචෙස්ටර්ගේ මළසිරුර මෘතශරීරාගාරයට ගෙනගියා. මං මෙහෙට එන්න පිටත්වුණේ ඔබගෙන් උදව් ලබාගැනීමේ අපේක්ෂාවෙන්. නමුත් මේ වෙනකොටත් මැක්ඩොනල්ඩ් නම් පොලිස් නිලධරයෙක් පරීක්ෂණ සඳහා නිවසට ඇවිත්. නමුත් ඔහු මොනවා කරන්නද?"

"ආ... පොලිස් පරීක්ෂක මැක්ද? ලෙස්ට්‍රේඩ් සහ ග්‍රෙග්සන් දැකල දැකල මට එපාවෙලයි ඉන්නේ. මේ උදෑසන මැක්ඩොනල්ඩ් දකින්න ලැබෙන එක එපා නොවෙයි. මා කබාය හැඳගෙන හිස්වැස්ම





පළඳිනතුරු ඔබට සිටිය හැකිද? එහෙනම් ඊළඟට අපි යමු කේම්බ්‍රිජ් ටෙරසයට"

අප රැගත් අශ්වකරත්තය ලන්ඩන් නගරයේ වීථි මගින් ඇදී ඇදී යද්දී, හෝම්ස් තොල සපාගෙන දිගින් දිගටම කල්පනා කරමින් සිටියේය. අප්‍රේල් මාසයේ ඒ උදෑසන කේම්බ්‍රිජ් ටෙරසය පාළු මෙන්ම නිහඬ බවක් ද ඉසිලීය.

නිවස සහිත ඉඩම පාරෙන් වෙන්වූයේ අඩි 3 කට වඩා උස් නොවූ ගලින් තැනූ තාප්පයකිනි. ඊට ඇතුළතින් මගේ මෙනෙවිය විස්තර කළ පටු උද්‍යානය තිබිණි. ඇය පැවසූ අන්දමින්ම, තණකොළ වවා තිබූ උයනේ තැනින් තැන, ලොකු කුඩා ගල් හා නොයෙක් හැඩ හා වර්ණවල පාෂාණ කැබැලි විය. නිවස තිබුණේ එයටත් ඇතුළතිනි. සුදු තීන්ත ආලේප කළ නිවසේ ඉදිරි දෙර කොළ පැහැති විය. මේ දෙරට වම්පසින් පිහිටි ජනේලය අසල සිටි අමුතු ඇඳුමක් හැඳගත් තැනැත්තෙකි. ඉන්දියානු ඇඳුමකින් සැරසී හිසේ තලප්පාවක් පැළඳ සිටි ඔහු, ඉන්දියානු සේවක වීරේන්ද්‍ර සිං බව මම හඳුනාගතිමි. එක්වරම මගේ සිහියට දැනුණේ ක්ෂණික ගැස්මකි. ඉන්දියානු දේව ප්‍රතිමාවක් මෙන් මදකුදු නොසෙල්වී අප දෙස බලා සිටි වීරේන්ද්‍ර සිං, එක්වරම උස ජනේලයෙන් ගෙට ඇතුළු වී නොපෙනී ගියේය.

මේ දර්ශනයෙන් ෂර්ලොක් හෝම්ස්ගේ සිතේ ද කැලැඹීමක් ඇති වූ බැව් මට සිතිණ. ජනේලයෙන් අතුරුදන් වුණු සේවකයා දුටු විගස, කබායට ඇතුළතින් හෝම්ස්ගේ උරහිස් හැකිළුණු සැටි මම දුටුවෙමි.

ඉදිරිදෙරට ළඟින්ම වම්පසින් පිහිටි ජනේලයේ වීදුරුව නොබිඳී හොඳ තත්ත්වයේ තිබිණි. උයනේ තිබූ සෑහෙන තරම් ලොකු ගලක් ගලවා ඉවත්කළ තැන අපට පැහැදිලිව දැකගත හැකිවිය. එමෙන්ම වම් කෙළවරේ තිබූ අනෙක් ජනේලයේ වීදුරුව සම්පූර්ණයෙන්ම බිඳී ගොස්ය. පාවහන් නොපැළඳි ඉන්දියානු සේවකයාට මෙම ජනේලයෙන් ඇතුළුවීමට හැකිවූයේ එහෙයිනි.

මෙම ජනේලය දුටු හෝම්ස්ට සිනාරුහන් කෙරිණි. එහෙත් කෝරා මගේ එතැනින් ඉවත්වී යනතුරු ඔහු කිසිවක් කීවේ නැත.

"වොට්සන් මෙන්න මේක මට කියන්න" හෝම්ස් කීය. "මගේ මෙනෙවිය අපට කිව්ව කතාවේ අද්භූත බවක් හෝ නොගැළපෙන බවක් ඔබට පෙනුණාද?"

www.sinhalaelibrary.com

"අද්භූත, භයානක ඔහුගෙ ඉතිහාසයක් තිබුණු බව නම් ඇත්තයි" මම කීවෙමි. "ඒ වුණත් නොගැලපෙන කිව්වේ? එහෙම දෙයක් මට නම් පෙනුණේ නෑ!

"ඔබට පෙනෙන්නෙ එහෙමද?" හෝම්ස් ඇසීය. "ආ..... මැක්ඩොනල්ඩ් මහත්මයා. තවත් ගැටලුවකට මුහුණදෙන්න යලිත් වරක් අපි දෙන්නා හමුවුණා නේද?"

ජනෙල් වීදුරුව බිඳී තිබුණු තැන, වීදුරු කැබැලි වලට ඉහලින් එරෙස්සමින් පා තබමින් ඉදිරියට ආවේ, කුඩාහැඩැති හිසකෙස් තිබූ තරුණ පොලිස්පරීක්ෂකවරයාය.

"මොකද හෝම්ස් මහත්මයා? ඔබ මෙක හඳුන්වන්නෙත් ගැටලුවක් හැටියටද?" මැක්ඩොනල්ඩ් ඇසුවේ තම දෙබැම ඉහළට එසවා නළල රැලි කරමිනි. "කර්නල් රොවෙස්ටර්ට මෙහෙම දෙයක් කරන්න තරම, එක්වරම මොළේ නරක්වුණේ ඇයිද කියන එක නම් ගැටලුවක් තමා"

"ඔව් ඒකත් හරි" හෝම්ස් පිළිතුරු දුන්නේ සිනාමුසු මුහුණෙනි. "මොකද කියන්නේ. ඔබ අපව ගෙදරට ඇතුළුවෙන්න අවසර දෙනවද?"

"අපොයි ඔව්. ඇත්තෙන්ම ඔව්-ඔබව ආදරයෙන් පිළිගන්නවා" පොලිස් නිලධරයා පිළිතුරු දුන්නේ සිනහවක් මුව රඳවාගෙනය.

අප පිවිසියේ ඉතා උස වහලක් තිබූ, එහෙත් එතරම් විශාල නොවූ කාමරයකටය. ලී බඩු තබා එය සුවපහසු ලෙස අසුන්ගත හැකි තැනක් බවට පත්කර තිබිණි. එහෙත් එය එක්වරම දිස්වූයේ වනචාරී සංස්කෘතියක් ප්‍රදර්ශනය කෙරෙන කෞතුකාගාරයක් ලෙසිනි. කළුවර ලීයෙන් තනා තිබූ අල්මාරියක් ජනේලය දෙසට මුහුණ ලා තිබිණි.

එය මුදුනේ මා දුටුවේ තරමක් දුරට මිනිස් මුහුණකට සමාන යක්ෂයෙකුගේ මුහුණකි. එහි එළියට නෙරා ආ ඇස්ගෙඩි වලට තිල්පැහැති මැණික් සවිකොට තිබිණි. පිලිස්සා ගත් දත් දෙපෙළත්, නළල වටේ එතී සිටි නාගයෙකුගේ පෙණ ගොබයත්, ඕනෑම කෙනෙකු බියෙන් මුසපත් කිරීමට සමත්විය.

"බොහොම ලස්සන මුහුණක්. එහෙම නේද හෝම්ස් මහත්මයා?" තරුණ පොලිස් නිලධරයා ඇසීය. "මේ වෙස් මුහුණ මේ ගෙදරට ගෙන ආ [illegible] පණිවුඩය නිසාලු, මෙහෙම දෙයක්





සිදුවුණේ. මේජර් අර්න්ෂෝ සහ කපිතාන් බයිඩ්බරි ලොබියට වෙලා තවමත් මේ ගැන වාද විවාද කරගන්නවා"

හෝම්ස් ඒ වෙස්මුහුණ දෙස එක බැල්මක් හෝ නොහෙළූ අයුරු දුටු මම පුදුමයට පත්වූවෙමි.

හෝම්ස් කාමරයේ එහා මෙහා සක්මන් කරමින්, වීදුරු අල්මාරි වල හා එළියේ තිබූ අනෙක් අරුමෝසම් බඩු දෙස පරීක්ෂාවෙන් බැලුවේය. අනතුරුව ඔහු කථා කළේ මැක්ඩොනල්ඩ් වෙතයි.

"ඔබ දැනටමත් මේ ගෙදර ඉන්න හැමකෙනෙකුගෙන්ම ප්‍රශ්න කරලා අවසන් ඇති කියලා මං විශ්වාස කරනවා?"

"ඒක තමයි මං කළ එකම දේ" මැක්ඩොනල්ඩ් පිළිතුරු දුන්නේය. "ඒ වුණාට හැමකෙනෙකුම කියන්නෙ මොකක්ද? කාමරය සම්පූර්ණයෙන්ම වහලා දොරටු දමලා. අපරාධය කළ තැනැත්තා තමාවත් වෙඩි තබාගෙන, බිරිඳටත් වෙඩිතබලා. ඔහු දැන් මියගිහින්. පොලිසිය පැත්තෙන් බැලුවොත්, අපේ රාජකාරි දැන් අවසානයි. ඉතින් හෝම්ස් මහත්මයා, ඔබ මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

මගේ මිත්‍රයා එක්වරම ඉදිරියට දිගාවී, පොළොව අතගා යමක් අහුලා ගත්තේය.

"කර්නල් රොවෙස්ටර් උරමින් හිටි චුරුට්ටුවේ කොටය. ඒක වැටුණු තැන බුමුතුරුණු පිළිස්සිලා, සිදුරක් හැදිලා"

"ඒක ඇත්තයි" මැක් ඊට එකඟ විය.

මේ මොහොතේ කාමරයේ දොර හැරගෙන කිහිපදෙනෙක් ඇතුළට පැමිණියහ. තරමක් උස මහත, මැදිවියේ තැනැත්තා මේජර් අර්න්ෂෝ වියයුතු යයි මම අනුමාන කළෙමි. ඊට පිටිපසින්, කෝරා ලේඩි මෙනෙවියගේ අතින් අල්ලාගෙන ඉදිරියට ආවේ තරුණයෙකි. උස එහෙත් හැඩිදැඩි සිරුරක් තිබූ ඔහුගේ මුහුණේ, සම තඹ පැහැයට හැරී තිබිණි. උඩු තොලේ ලොකු කළු උඩුරැවුලකි. මේ කපිතාන් හැරල්ඩ් බයිඩ්බරි වියයුතු බව මට සිතාගත හැකිවිය.

කාමරයට පිවිසි විගසම මේජර් අර්න්ෂෝ මගේ මිත්‍රයා ඇමතුවේය.

"මට අහන්න ලැබුණා ඔබ ෂර්ලොක් හෝම්ස් මහත්මයා බව. පිටකෙනෙකුගේ කිසිම සම්බන්ධයක් නැති මේ ඛේදවාචකයට, ලේඩි මෙනෙවිය ඔබ කැඳෙව්වේ මොකටද? ඒක මට තේරුම් ගන්න අමාරුයි මහත්මයා"



www.sinhalaelibrary.com

"සමහරවිට අනෙක් අයට හැකිවේවි ඒකට හේතුව තේරුම් ගන්න" පිළිතුරු දුන් හෝම්ස් හැරුණේ තරුණයා දෙසටයි.

"කපිතාන් බියුඩබරි. ඔබේ මාමා හැමවිටම පානය කළේ එකම සුරුට්ටු වර්ගයමද?"

"ඔව් මහත්මයා" තරුණයා පිළිතුරු දුන්නේ පුදුමයට පත් බැල්මක් හෙළමිනි. "අර මේසය උඩ තියෙනවා ඔහුගේ සුරුට්ටු පෙට්ටිය"

හෝම්ස් එතැනට ගොස් සුරුට්ටු පෙට්ටිය අතට ගත් අයුරු අපි බලා සිටියෙමු. එය තුළ වූ සුරුට්ටු දෙස මොහොතක් නෙත් යොමු කළ මගේ මිත්‍රයා, මීළඟට එය නාසයට ළං කොට එහි සුවඳ ආඝ්‍රාණය කළේය.

"හිලන්ද සුරුට්ටු" හෝම්ස් කීය. "මේරේ මෙනෙවිය ඔබ කිව් කාරණය ඉතාම නිවැරදියි. කර්නල් රොචෙස්ටර්ගේ සිහිවිකල්වීමක් වෙලා නෑ"

කෝපයෙන් රතුවූ මේජර් අර්න්ෂෝ ගේ මුවෙන් පිටවූයේ, එම ප්‍රකාශය ගැන අප්‍රසාදය පළකරන හඬකි. ඒ සමගම ඔහුගේ තියුණු දෑස් අනායන් වෙත යොමුවිය. ඒ එම ප්‍රකාශය තමා විශ්වාස නොකරන බව හඟවමිනි. තරුණ බියුඩබරි, වැඩිමහල්ලාට වඩා ආචාරශීලී බවක් පෙන්නුම් කළේය. ඔහු තම මවිතය ප්‍රකාශකළේ උඩුරැවුල පිරිමැදීමෙනි.

"ඔබ එහෙම කියනවා අහන්න ලැබීමත් අපේ හිත්වලට සැනසීමක් හෝම්ස් මහත්මයා" බියුඩබරි කීය. "මාමාගේ නමට ඇතිවන අපකීර්තිය වළක්වන්න ඒක කොයිතරම් වැදගත්ද, සැකයක් නෑ. ඔබ මේ කාරණය සොයාගන්න ඇත්තේ, මාමා ඔහුගේ සුරුට්ටු තෝරා ගැනීමට දක්වා ඇති කැමැත්ත අනුව?"

"තරමක් දුරට" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මේ දෙස්තර වොට්සන් ඔබට කියාවි විස්තර. මං සුරුට්ටු සිගරට් ගැන, දුම්කොළ වර්ග ගැන, සෑහෙන තරම් අධ්‍යයනයක යෙදිල තියෙනවා. එකිනෙකට වෙනස් දුම්කොළ වර්ග 140ක් ඒවායේ අළු මගින් හඳුනාගත හැක්කේ කොහොමද කියල, මං කුඩා පොත් පිංචක් ලියල තියෙනවා. කර්නල් රොචෙස්ටර් සුරුට්ටු තෝරා ගෙන ඇති ආකාරයෙන්, වෙනත් සාක්ෂින් තහවුරු වෙනවා. ඔව් මැක්ඩොනල්ඩ්. මොනවද ඔබට කියන්න තියෙන්නේ?"





ස්කොට්ලන්ඩ්යාඩ් නිලධරයා නළල රැළිකරගෙන බලාසිටියේ හෝම්ස් පැවසූ දෙයට තමාට එකඟවිය නොහැකි බව හඟවමිනි.

"සාක්ෂි? මොන සාක්ෂි ගැනද හෝම්ස් මහත්මයා ඔබ මේ කථාකරන්නේ?" මැක්ඩොනල්ඩ් ඇසුවේය. "මෙතැන සිද්ධවෙලා තියෙන්නේ මොකක්ද කියන එක, ඕනෑම කෙනෙකුට පැහැදිලිව දැනෙනවා. දොර සහ ජනේල තුනම එකක්ම ඇතුළතින් යතුරු දාල අගුළුත් දාල. මේ කාමරය ඇතුළේ කර්නල්ට හා ඔහුගේ බිරිඳට වෙඩි වැදිලා. ඔබ කියන්නේ ඒකේ කොතැන හරි වැරැද්දක් තියෙනවා කියලද?"

"නැහැ"

"එහෙනම් අපි ඒ කාරණයෙන් පිටපනින්නේ නැතිව, පැහැදිලිව පෙනෙන දේ ගැන කතා කරමු හෝම්ස් මහත්මයා"

මීළඟට මගේ මිත්‍රයා කාමරය හරහා ගමන් කළේ කළුවර අල්මාරිය වෙතයි. එය මුදුනේ තබා තිබූ වෙස්මුහුණ වෙත ඔහු තම දෑනෙත් යොමු කළේ හිස මඳක් ඉහළට ඔසවමිනි.

"ඔබ කියන දේ සම්පූර්ණ ඇත්ත මැක්." හෝම්ස් කීය. "ඒ වුණත් ඔය දොර කර්නල් යතුරු දමා තබාගත්තේ මොන හේතුවක් නිසා කියලද හිතෙන්නේ?"

"ඒ තමන්ට අවශ්‍ය පෞද්ගලික කරුණක් කතාබහ කරගැනීමේ අරමුණෙන්" මැක් පැවසීය.

"ඔව් ඒක හරි. ඒකෙන් අපට පෙන්වා දෙනවා,....." හෝම්ස් පටන්ගත් වාක්‍යය ඔහුට අවසන් කිරීමට ඉඩ නොලැබිණි.

".....ඒකෙන් පෙන්වා දෙන්නේ, ඒ වෙලාවේ කර්නල්ගේ සිහි විකල් වූ හැටි" මේජර් අර්න්ෂෝ කීය. "මේ වගේ භයානක මිනීමැරුමක් කරලා සිය දිවි නසාගන්න තරම් ඔහු පත්වුණු බිහිසුණු උමතු තත්ත්වය"

"හෝම්ස් මහත්මයා. මේ ඔබේ දක්ෂකම් පෙන්විය යුතු වෙලාව" තරුණ කපිතාන් කීය. "සියුම් කරුණු මගින් අභිරහස් ගැටලු විසඳීම ගැන ඔබට ලැබිල තියෙනවා සුවිසල් කීර්ති නාමයක්. මේ ශෝචනීය සිද්ධියෙන්, මගේ මාමාගේ නාමයටත් අපේ පවුල් වලටත් ඇතිවන්නේ ලොකු කැළලක්. ඒ වුණත් මැක්ඩොනල්ඩ් මහත්මයා කියන්න වගේ, අපට වෙන විකල්පයක් ඉතිරි වෙලා නෑ. කර්නල් රොචෙස්ටර් තමන්ගේ උමතු භාවයේම ගොදුරක් කියන එක අපට පිළිගන්න වෙනවා"



www.sinhalaelibrary.com

ෂර්ලොක් හෝම්ස් ඔහු අත් ඒසවූයේ තම අවසන් නිගමනය, රැස්ව සිටි අයට දනුම් දෙන ආකාරයෙනි.

"කර්නල් රොචෙස්ටර් ගොදුරක් වුණේ සිහිවිකල්වීමක නොවෙයි. ඔහු ගොදුරක් වුණේ, ඉතා සූක්ෂම අයුරෙන් අමු අමුවේ කළ මිනීමැරීමක!"

එතැන පැතිරගියේ දැඩි නිශ්ශබ්දතාවයකි. අපි එකිනෙකාගේ මුහුණට මුහුණ බලාගත්තෙමු. මිනිත්තු කිහිපයක් යනතුරු සියල්ලෝම තුෂ්ණිම්භූතවූහ.

"දෙයියෝ සාක්කි!" උස් හඬින් කෑගැහුවේ වයස්ගත මේජර් අර්න්ෂෝය. "ඔහේ ඔය කාටද චෝදනා එල්ල කරන්නේ? මේ රටේ තියෙනවා අපහාස නීතිය කියල එකක්. වරදක් නොකළ මනුස්සයිනට නිකරුණේ අපහාස කරන්න, මොකක්ද ඔහේට තියෙන අයිතිය?"

"කලබල වෙන්න එපා මේජර්" හෝම්ස් කීවේ සන්සුන් ස්වරයෙනි. "මෙය මිනීමැරුමක් බව මං තීරණය කළේ ඇයි කියල ඔබට කියන්නම්. මෙතැන තියෙන අභිරහසට, මගේ සම්පූර්ණ විසඳීම රැඳී තිබෙන්නේ, අර ජනේලය ළඟ බිම තිබුණු වීදුරු කටු ගොඩේ. ඔබට පෙනෙනවා ඇති මම ඒක දැන් කාමරය ඇතුළේ ගිනිඋදුන ළඟට එකතු කර ඇති බව. හෙට උදේ මං මෙහේට ආවාම, ඔය වීදුරු කැබැලි හැම එකක්ම එකිනෙක ළං කරලා, වීදුරුව තිබුණු පිළිවෙළට සකසනවා. එතකොට ඔබ සෑහීමකට පත්වෙන අයුරෙන් මේ ගැටලුව විසඳා දෙන්න පුළුවනි. ඒක මට හොඳටම විශ්වාසයි. ඒක නෙමෙයි මැක්. ඔබ බෙල්ලන් කෑමට ගන්නවාද?"

මැක්ඩොනල්ඩ්ගේ මුහුණ රතුපැහැයට හැරිණි.

"හෝම්ස් මහත්මයා, පුද්ගලිකව මං ඔබට හරි කැමතියි." මැක් පිළිතුරු දුන්නේය. "ඔබ ගැන මගේ හිතේ තියෙනවා විශාල ගෞරවයක්. ඒ වුණත් වෙලාවකට ඔබ සමහර දේවල් කියන්නේ හොඳ සිහිකල්පනාවෙන්ද කියලා මට හිතෙනවා. බෙල්ලන් කෑමට ගැනීමෙයි මේ සිද්ධියයි තියෙන සම්බන්ධය මොකක්ද?"

"ඒ සම්බන්ධය බොහොම සරලයි මැක්. බෙල්ලන් කෑම සඳහා ඔබ අරගන්නේ, ඔබේ අත ළඟින්ම තියෙන ගැරුප්පුව නේද? එහෙම නොකර ඔබ ළඟ ඉන්න නැනැත්තාගෙ පිඟානටත් එහා





පැත්තේ තිබෙන ගැරුප්පුව අරගත්තොත් මොකද වෙන්නෙ? සියුම් දේවල් නිරීක්ෂණය හුරුපුරුදු වුණු නැනැත්තාට හොඳින් පෙනේවි, ඔබ කළ ක්‍රියාවේ නොගැළපෙන බව. එහෙම නේද? මං මේ ඔබට කිව්වේ හොඳින් කල්පනා කර බැලිය යුතු කාරණාවක්"

සෑහෙන වේලාවක් යනතුරු පොලිස් නිලධරයා මගේ මිත්‍රයාගේ මුහුණ දෙසම බලාගෙන සිටියේය.

"ඔබේ කථාව ඇත්ත හෝම්ස් මහත්මයා" ඔහු කීවේ මඳවේලාවකට පසුවය. "බොහොම සිත්ඇදගන්නාසුලුයි. මෙහෙම දෙයක් මගේ මොළේට දැමීම ගැන, මං ඔබට කෘතඥ වෙනවා"

"හොඳයි" හෝම්ස් කීය. "දැන් මගේ මීළඟ උපදෙස මං දෙන්නම්. වීදුරු බිඳුණු ජනේලයට ලෑලි කිහිපයක් ඇව්කරලා වසා තබන්න. ඒ ඇමරෙන්න වෙන කිසිම දෙයක් අල්ලන්න එපා. හෙට උදේ අප හමුවෙනතුරු කිසිදෙයකට අත තියන්න එපා. වෙලාව දවල් එකත් පහුවුණා. අපි යමු වොට්සන් දවල් කෑම ටිකක් කන්න. පෙලිග්‍රිනිගේ හොටල් අවන්හලේ, රෝස්ට් කළ කුකුළුමස් මිශ්‍ර ලසඤ්ඤා, බොහොම කාලයකින් අපට රසබලන්න බැරිවුණා"

එද අපරභාගයේ මම මගේ වෛද්‍ය කටයුතු සඳහා පිටත්ව ගියෙමි. මා අතින් බැලීම අතපසු වූ රෝගීන් කිහිපදෙනෙකුම පරීක්ෂා කොට, ප්‍රතිකාර කිරීම සඳහා මගේ කාලය ගතකළෙමි. මා බේකර් වීථියේ නිවහන වෙත යද්දී සැන්දෑවී තිබිණි. දොර විවෘත කළේ හඩ්සන් මහත්මියයි. එද රාත්‍රී ආහාරය සඳහාත් මා නවතිනවාද යන්න ඇය මගෙන් විමසුවාය. එයට පිළිතුරක් දීම සඳහා මා පහළ තට්ටුවේ රැඳෙන්නට ඇත්තේ මිනිත්තු කිහිපයක් පමණි. එක්වරම උඩතට්ටුව දෙසින් වෙඩිහඬක් ඇසිණි. තැතිගත් හඩ්සන් මහත්මිය තරප්පු වැට බැඳගත්තාය.

"බලන්න වොට්සන් මහත්මයා" ඇය කීවේ කම්පනයට පත් හඬිනි. "ඔහු ආයෙමත් ඒ වැඩේ පටන් අරගෙන. ගේ ඇතුළෙ පිස්තෝල වලින් වෙඩි තැබීම අත්හදා බලන වැඩේට, මං කොහොමටවත් කැමැති නෑ. හෝම්ස් මහත්මයා ගිනිඋදුන් පඩිය කෑලි කෑලි වලට කැඩෙන්න වෙඩි තියලා, මාස හයක් ගතවුණේ නෑ. ඔහු කියනවා මේවා කරන්නේ, යුක්ති ධර්මයේ හා සාධාරණත්වයේ නාමයෙන්ලු. අනේ වොට්සන් මහත්මයා. ඉක්මන් කරලා උඩට යන්න. අර ලොකු මිලක් දීල ගෙනාව සෝඩා වතුර



www.sinhalaelibrary.com

හදන උපකරණය තියෙනවා. ඒ ළඟට ඔහු ඒකට වෙඩි තියාවිද දන්නේ නෑ."

වයසක කාන්තාව සැනසීමට වචන කිහිපයක් කියා, මම අඩියට දෙකට උඩතට්ටුවට දිව ගියෙමි. මා අපේ විසිත්ත කාමරයේ දොර හැරදමුවා පමණි. තවත් වෙඩිල්ලක් නිකුත් විය. වෙඩි බෙහෙත් දැල්වීමෙන් සෑදුණු හරපැහැති ඝන දුම්වලාවකින් කාමරය වැසී තිබිණි. මගේ මිත්‍රයාගේ ඡායාව ඒ මැදින් මම දුටුවෙමි. සිටකබායකින් සැරසී හාන්සි පුටුවේ දිගාවී සිටි ඔහුගේ මුවේ, මා දුටුවේ දැල්වෙන සුරුට්ටුවකි; අතේ දුම් දමන රිවෝල්වරයකි.

"ආ වොට්සන්!" ඔහු කීවේ මා දැකීමෙන් එතරම් පුදුමයකට පත්නොවූ අයුරෙනි.

"දෙයියෝ සාක්කි හෝම්ස්! ඔබව කොහොමද මනුස්සයෙක් ඉවසා දරාගන්නේ?" මට කෑගැසිණ. "මේ මුළුගේම වෙඩිබෙහෙත් ගඳයි. හරියට වෙඩි තැබීම පුහුණුවෙන පිටියක් වගේ. සිදුවෙන අලාභහානිය ගැන ඔබට ගණනක් නැති බව ඇත්තයි. ඒ වුණත් මේ වෙඩි ශබ්ද වලින් අසරණ හඩ්සන් මහත්මියගේ ස්නායු වලට ඇතිවෙන කම්පනය ගැන හිතන්න." මම ජනෙල් සියල්ල විවෘත කළෙමි. නොනවත්වා පාර දිගේ ධාවනය කළ අශ්වකරත්ත වල ශබ්දය නිසා, වෙඩි හඬ එතරම් තදින් පිටතට නොඇසෙන්නට ඇත. "මෙතැන වාතාශ්‍රය නම් ඉතාම අපිරිසිදුයි" මම කීවෙමි.

අතදිගු කළ හෝම්ස් රිවෝල්වරය මේසය උඩින් තැබුවේය.

"ඇත්තමයි වොට්සන්. මං දන්නෙ නෑ, ඔබ නැතුව මේ දේවල් කොහොම කරන්නද කියලා" ඔහු කීය. "පුහුණු වූ මනසක් ඇත්තකුගේ දුෂ්කර කටයුතු වලට ඔබගෙන් උදව් ලැබෙන බව මං අත්දුටු දෙයක්"

"ඒ දුෂ්කර කටයුතු වලට උදව් කරන්න; මට මතක හැටියට, මං තුන්පාරක් නීතිවිරෝධී වැඩ කළා" පුටුවේ වාඩිවෙමින් මා කීවේ එතරම් සතුටකින් නොවේ. "හෝම්ස්. ඔබ සුරුට්ටුවක් බොනවා මං දුටුවේ බොහොම කාලෙකට පස්සේ"

"එක එක වෙලාවට හිතට එන දේවල් මිත්‍රයා. මේ වෙලාවේ නම් මං බලුවේ, කර්නල් රොචෙස්ටර්ගේ සුරුට්ටු පෙට්ටියෙන් ගෙන ආව සුරුට්ටුවක්" කී හෝම්ස් බිත්ති ඔරලෝසුව වෙත නෙත් යොමුකළේය. "හ්ම්, අපිට තවත් පැයක විතර කාලය ඉතිරි වෙලා



www.sinhalaelibrary.com



තියෙනවා. වොට්සන්, ඔබේ පුටුව ළඟ තිබෙන මගේ ස්ට්‍රැඩිවේරියස් වයලීනය මා අතට දෙන්න"

රාත්‍රී අට පමණ වෙද්දී, මම ගෑස් ලාම්පුව දැල්වූයෙමි. තවත් පැය භාගයක් පමණ ගෙවීයද්දී අපේ දොරට තට්ටු කරන හඬක් ඇසිණි. විසිත්ත කාමරයට ඇතුළුවූයේ පොලිස් පරීක්ෂක මැක්ඩොනල්ඩ්ය.

"ඔබේ පණිවුඩය මට ලැබුණා හෝම්ස් මහත්මයා" ඔහු කීය. "ඔබ යෝජනා කළ විධියට හැම කටයුත්තක්ම සූදානම් කළා. අද මධ්‍යම රාත්‍රියට, කර්නල් රොචෙස්ටර්ගේ ගෙදර ඉස්සරහ පාරේ පොලිස්භටයෙක් මුරට ඉඳීවි. ඒ ජනේලය ගැන ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. අපට පුළුවනි ගෙදර අය අවදි නොකර අරුමෝසම් බඩු කාමරයට ඇතුළුවෙන්න."

හෝම්ස් තම දෑත් පිරිමැද්දේ ඉමහත් සතුටට පත්වය.

"විශිෂ්ටයි මැක්. මා දෙන උපදෙස් හරියටම පිළිපදින්න. ඔබට තියෙනවා හොඳ හැකියාවක්" හෝම්ස් කීවේ ප්‍රීතියට පත් හඬෙනි. "තව ටිකකින් හඩ්සන් මහත්මිය අපට රාත්‍රී භෝජනය පිළිගන්වාවි. ඊට පස්සෙ පයිප්පයක් දෙකක් ඉරුවාම අපට හැකිවේවි, ඉතිරි කාලය ගෙවාගන්න. අපට තියෙන්නේ හැන්වලට යායුත්තේ මධ්‍යම රාත්‍රියටයි. මං විශ්වාස කරන්නේ ඊට කලින් ගියොත්, අපේ සැලසුම් සියල්ල සම්පූර්ණයෙන්ම අසාර්ථක වේවි කියලයි. මැක් මහත්මයා. ඔබේ පුටුව ටිකක් මේ ලෑන ළඟට කිට්ටු කරගෙන, මේ දුම්කොළ කොහොමද කියලා බලන්න"

සැන්දෑකාලය ඉක්මනින් ගෙවී ගියේය. ස්කොට්ලන්ඩ්‍යාඩ් පොලිස් නිලධරයා, ඔහුගේ පොලිස් දිවියේ අත්දැකීම් පිළිබඳව අපට විස්තර කළේය. ප්‍රංශ මහ බැංකුවේ ස්ථාවරත්වයට තර්ජනයක්ව පැවැති ප්‍රංශ හොරකාසි අච්චු ගසන්නන් කණ්ඩායමක්, එංගලන්තයේදී අල්ලාගත් අයුරු මැක්ඩොනල්ඩ් විස්තර කරද්දී අපි එය ආශාවෙන් අසා සිටියෙමු. හෝම්ස් ද තමාගේ අත්දැකීම් කිහිපයක් තරුණයාට පැවසීය. ඒ කතා බොහොමයක්ම මගේ පාඨකයන් දැනටම දන්නා නිසා, මම ඒවා මෙහි සඳහන් නොකරමි. මේ කතාබහ අවසන් වෙද්දී රාත්‍රී දොළහ නාදවෙනු ඇසෙන්නට ලැබිණි.

කාමරය හරහා ගිය හෝම්ස් ලාච්චුවක් විවෘත කොට රිවෝල්වරයක් එළියට ගත්තේය.

"මෙක ඔබෙ කතාගෙනහැකුවට දමාගන්න වොට්සන්. මෙකෙ කාණු හයේම පතපොම පුරවලයි තියෙන්නෙ" ඔහු පවසද්දී හෝම්ස්ගේ මුහුණේ තිබූ බැරෑරුම් ස්වභාවය මම දුටුවෙමි. "අපේ මිනිහා බාගවෙලාවට, බොහොම දරුණු අතට හැරෙන්න ඉඩ තියෙනවා. මැක් මහත්මයා. ඔබ සූදානම් නම් අපි පිටත්වෙමු"

බේකර් වීථියෙන් කුලීරියක් අල්ලාගැනීමට එතරම් වේලාවක් ගත නොවිණි. එය වලාකුළෙන් තොර රාත්‍රියක් වුවත්, අඳුර මැකීමට වැඩුණේ තරු එළිය පමණි. මුලින්ම එඩ්ග්වෙයා පාර දිගේ ගමන්ගත් රථය, මීළඟට කුඩා වීථි ගණනාවක් හරහා ගමන් කළේය. ඒ හෝම්ස් විසින් රියැදුරාට දෙන ලද උපදෙස් අනුවය. කේම්බ්‍රිජ් ටෙරසය ඈත පෙනෙනතෙක් මානයේ තිබියදී, රිය නවත්වන මෙන් රියැදුරාට දන්වනු ලදී. එතැන් සිට අප ඉදිරියට ගියේ පා ගමනෙනි.

හාත්පස සම්පූර්ණයෙන්ම අඳුරෙන් වැසී තිබිණි. මුළු නිවසම වෙළාගෙන තිබුණේ දැඩි නිහඬතාවයකිනි. අපි ගේට්ටුවෙන් ඇතුළු වී නිවස දෙසට ගමන් කළෙමු. වීදුරු කැඩීගිය ජනේලය ලෑලි වලින් ආවරණය කර තිබූ අයුරු මම දුටුවෙමි.

"මෙවා එක් පැත්තකින් විතරයි ඉබිකුළේ. පරෙස්සමින් ඇද්දෙත් ගැළැවී එනවා" මැක් මහතා කීය. ශබ්දයක් නොනැගෙන සේ ලෑලි කෑබලි කිහිපය ඉවත්කළේ ද ඔහු විසිනි. අනතුරුව අපි කර්නල් ෆ්‍රොවෙස්ටර්ගේ අරුමෝසම් බඩු කාමරයට රිංගාගතිමු. හෝම්ස් තමාගේ ගමන්කබායේ සාක්කුවෙන්, කුඩා ලන්තෑරුමක් එළියට ගත්තේය. දල්වූ පසු එයින් නිකුත්වූයේ කහමැදිරි ආලෝකයකි. කාමරයේ තැන් තැන්වල තබා තිබූ බඩුවල නොගැටී මග සොයා ගැනීමට, ඒ එළිය ප්‍රමාණවත් විය. කාමරයේ එක් කෙළවරක බිත්තියට හේත්තුකොට තිබූ කවිච්චියක් විය. අපි එතැනට ගියෙමු.

"මෙක අපට හොඳටම ඇති" මගේ මිත්‍රයා පැවසුවේ එහි අසුන්ගනිමිනි.

රාත්‍රිය බොහෝ නිශ්ශබ්ද විය. ඒ නිසාම මේ බලාසිටීම සිතේ ඇතිකළේ වීඩාපත් බවකි. පාරේ ගමන් කළ අශ්වකරත්ත වල ශබ්දය ඉඳහිට අපට ඇසිණි. ඒ අතරතුර තැබෑරුම් වල කාලය ගතකොට, කුලී රථ වලින් නිවෙස් බලාගිය සුරාසොඩුන්ගේ ගී නාදය අපට අසන්නට ලැබිණ. ඒ අශ්වයින්ගේ "ක්ලිප් ක්ලොප්" කුරහඬ ද





සමගයි. ඒ ශබ්දය කෙසිඩ්පාක් දෙසට ක්‍රමයෙන් අඩුවී ගොස් නොඇසී ගියේය. තවත් පැයකට පමණ පසු බොහෝ ඈත එඩ්ග්වෙයා පාරේ වේගයෙන් ගමන්කළ, ගිනිනිවන හමුදා රථයක සීනු හඬ අපට අසන්නට ලැබිණ. ඒ අශ්වකරත්තය පැදවූ රියදුරා, අශ්වයිනට පහරදෙද්දී කසය පිපිරුණු හඬ, පිස්තෝලයකින් නිකුත් වූ වෙඩිහඬක් මෙන් තියුණු ශබ්දයක් විය. ඒ හැරුණු විට හතරවටේම තිබුණේ නිශ්චලතාවයකි. එය බිඳී ගියා නම් ඒ, බිත්ති ඔරලෝසුවේ 'ටික් ටික්' ශබ්දයෙන් පමණි.

කාමරය පුරාම පැතිර තිබුණේ ඉන්දියානු දෙවොලක ආඝ්‍රාණය කරන්නට ලැබෙන, පෙණගැල්ල චීසිවිද යන පෙරදිගටම ආවේණික සුගන්ධයකි. එමගින් මගේ මනසට තරමක අපහසු බවක් ගෙන ආ නිසාදෝ මට නිදිමතක් දැනිණ.

සෑම තැනකම පැවැතියේ ඝනාන්ධකාරය බව මම මුලින් සඳහන් කළෙමි. එහෙත් මගේ දෑස් අඳුරට හුරුවෙද්දීම, කාමරය තුළට ඈතින් ආලෝකයක් වැටුණු බැව් දුටුවෙමි. ඒ මහපාරේ පහන් කණුවකින් නිකුත් වූ එළිය ස්වල්පයකි. උද්‍යාන තීරුවට වැටුණු එළිය, ලෑලි ඉවත්කළ නිසා ජනේලය හරහා කාමරය ඇතුළට ද යන්තමින් ගලා ආවේය. ආලෝකය නිසා මම හිස කරකවමින් වටපිට බැලීමට පටන්ගත්තෙමි. එක්වරම මගේ දෑසින් දුටු දෙයින් මගේ මුළු ඇඟම හිරිවැටී ගියේය. කාමරයේ කෙළවරකින්, කුරිරු දෑස් විවෘත කරගෙන, දත් විලිස්සාගෙන සිටි මුහුණේ තිබුණේ භයානක වියරු සිනාවකි. මම එක්වරම තිගැස්සුණෙමි. ඒ බව හෝම්ස්ට ද දැනෙන්නට ඇත.

"ඒ වෙස්මුහුණ" හෝම්ස් මගේ කනට කෙඳිරුවේය. "මං දකින්න බලාගෙන ඉන්න මුහුණෙන් නම්, මේකෙන් වගේ ඔබ භය වෙන එකක් නැහැ. නමුත් ඒක වෙස්මුහුණට වඩා බොහොම බිහිසුණුයි!"

සෝපාවේ පිටුපසට හේත්තු වී මම මගේ හිත සන්සුන් කරගැනීමට උත්සාහ දැරුවෙමි. එහෙත් වෙස්මුහුණ දකීමෙන් කැලැඹුණු මගේ සිත, තැන්පත් කරගැනීමට නොහැකි විය. මගේ සිතේ දිගින් දිගටම මතුවී ආවේ කර්නල්ගේ ඉන්දියානු සේවක වීරේන්ද්‍ර සිං ගේ මුහුණය. මේ භයානක වෙස්මුහුණ දකින සෑම මොහොතකම ඔහුගේ ස්වභාවය වෙනස්වූ බව මගේ මෙනෙවිය

අපට විස්තර කළාය. මම කාලයක් ඉන්දියාවේ ජීවත්වූයෙමි. ඇදහීමෙදී අන්තවාදී ස්වභාවයක් ගන්නා ආගම්, ඉන්දියාවේ නොතෙකුත් ඇත. මේ ආගම් අදහන බැතිමත්හු, නොයෙක් විට අන්ධභක්තියෙන් කටයුතු කරමින්, බිහිසුණු ක්‍රියාමාර්ගවලට එළඹෙති. ක්‍රිස්තියානි ආගම මිථ්‍යාවක් ලෙස සිතන ඔවුනට, දෙවියන් වෙනුවෙන් කරන බිලිපූජාවක් ලෙස, මිනිසෙකු මරාදැමීම අපහසු කටයුත්තක් නොවේ. මේ අංශය ගැනත් වැඩිදුර සිතා බැලිය යුතු බවට, මගේ මිතුරාට පැවසීමට මා සිතුවා පමණි. දොරක් විවෘත වෙද්දී සරනේරුවකින් නැගෙන "ක්‍රීස්" හඬක් මගේ දෙසවණට වැටිණි. කිසිවෙකු අප සිටිනා කාමරයට ඇතුළුවීමට සූදානම් වෙන බව නිසැකය. මේ බව වහා හෝම්ස්ට දැනුම් දිය යුතුය. මගේ මිත්‍රයාගේ අතින් ඇල්ලීමේ අරමුණෙන් මම ඒ දෙසට අත දිගුකළෙමි. එහෙත් ෂර්ලොක් හෝම්ස් මා අසල නොසිටියේය.

මීළඟට එළැඹුණේ සම්පූර්ණ නිශ්චල නිහඬ බවක් පැවැති මිනිත්තු කිහිපයකි. ඈත පහන්කණුවේ මඳ ආලෝකය, බිඳුණු ජනේලය හරහා නවමත් කාමරය තුළට වැටිණි. අනතුරුව කවුරුන් හෝ සෙමින් අඩි තබන ශබ්දයකි. ඒ සමඟම නිවස ඇතුළතින් වූ දොර විවෘත කරගෙන, කිසිවෙකු අප සිටි කාමරයට ඇතුළුවිය. ඔහුගේ ඡායාව මම පැහැදිලිවම දුටුවෙමි. එහෙත් ඔහු හඳුනාගැනීමට මට හැකියාවක් නොවීය. ඔහු කවුරුවුවත් උස් කොලරයක් තිබූ වැහිකබායක් හැඳ සිටියේය. ඔහුගේ අඩක් එසවූ දකුණු අතේ, මඳ ආලෝකයට දිලිසුණු සිහින් දිගු යමක් විය. මොහොතකට පසු ගිනිදළුණේ ආලෝක කිරණක් දැල්විණි. එය ගිනිදළුන නොව, ආලෝකය ආවරණය කර තිබූ ලන්තෑරුමක් නිරාවරණය කිරීම බව, මොහොතකින් මම වටහා ගත්තෙමි. ඉන්පසු යමකට සෙමින් සෙමින් තට්ටුකරන්නාක් වැනි ශබ්දයක් ද "ටිංක්ලිං" හඬක් ද නිකුත්විය.

එක්වරම කාමරය තුළින් නැගුණේ ලොමු දැහැගන්වන විලාපයකි. ඊළඟට ඇසුණේ හෝ පොරබදන හඬකි.

"වොට්සන්! වොට්සන්!!"

අඩක් හුස්ම හිරවූ අයුරෙන් මේ ඇසුණේ, මගේ මිත්‍රයාගේ කටහඬ බව මම තේරුම් ගත්තෙමි. දැඩි බියකට පත්වූවත් මා කළේ, අඳුරේ මා ඉදිරියේ පොරබදමින් තිබුණු පොදිය වෙත කඩා පැනීමයි.





මිනිත්තුවක් ගතවෙද්දී කිසිවෙකුගේ අතක් මගේ බෙල්ල වටා එතිණි. යකඩ අඬුවක් වැනි එය ක්‍රමයෙන් තදවෙද්දී මට හුස්මගැනීම අපහසු විය. වහාම මම මගේ දකුණු අත මිට මොළොවා, මට ග්‍රහණය යෙදූ එකාගේ මුහුණට එල්ල කළෙමි. වියරු වැටුණු බල්ලෙකු මෙන් ඔහු මගේ දකුණු අතේ බාහුව සපාගත්තේය. අප හා සටන් වැදුණු සතුරාට තිබුණේ, තිරිසන් සතෙකුගේ වැනි දැඩි ශරීර ශක්තියකි. මීළඟට අපේ සහයට ආවේ පොලිස් පරීක්ෂක මැක්ඩොනල්ඩ්ය. ලන්තෑරුමක් දල්වා සිටි ඔහු, අප පොරබදන තැනට පැන, සතුරාට මාරක ග්‍රහණයක් යෙදුවේය. සතුරාගේ බලය ක්‍රමයෙන් පිරිහී, ඔහු අඩපණ විය. හෝම්ස් ද ඔහුගේ ග්‍රහණයෙන් අතහැරිණි. මදවේලාවකින් බලද්දී මගේ මිත්‍රයා සුදුමැලි වූ මුහුණින් යුතුව බිත්තියට හේත්තු වී සිටියේ ක්ලාන්තවීමට ආසන්නවය. ඔහු තම දකුණු අතින් වම් උරහිස අල්ලාගෙන සිටියේය.

"මැක්ඩොනල්ඩ්, මෙන්න ඉන්නවා ඔබට උවමනා කරන මිනිහා" හෝම්ස් කීය. "කර්නල් ෆොරෙස්ටර් මරාදැමීම හා මහත්මිය මරාදැමීමට තැත්කිරීම ගැන ඔබට පුළුවනි මූව හිරභාරයට ගන්න."

හිරකාරයා ආවරණය සඳහා පැළඳ සිටි වැහිකබාය ගළවා දැමුවේ පොලිස් නිලධරයායි. ලන්තෑරුමේ එළියෙන් අපරාධකාරයා දුටු මට එක්වරම කථාකරගත නොහැකි විය. මම ගල්ගැසී බලාසිටියෙමි. ඊළඟ මොහොතේ මවිතයට පත් මට කෑගැසිණ. මෙතෙක් වේලා අප සමඟ පොරබැදූ, හෝම්ස්ගේ උරහිසට දරුණු පහරක් එල්ල කළ ඒ අපරාධකරුවා කවුද? ඒ කඩවසම් සිරුරක් තිබූ කපිතාන් හැරල්ඩ් බ්‍රැඩ්බරිය!

* * *

හෝම්ස් සහ මා ආපසු බේකර් වීදියේ අපේ නිවහනට පැමිණෙන විට, පෙරදිගින් උදාවූ හිරුගේ මුල් කිරණ පොළොවට වැටෙන්නට ආසන්න වෙමින්, අහසේ ආලෝකයක් නිකුත් විය.

වීදුරු දෙකකට සෝඩා සමග බ්‍රැන්ඩි සූදානම් කළ මම, ඉන් එකක් මගේ මිත්‍රයා අත තැබුවෙමි. ඔහු තම සුපුරුදු හාන්සිපුටුවේ පිටුපසට හේත්තු වී සිටියේය. කලින් සුදුමැලිව තිබූ ඔහුගේ මුහුණ ක්‍රමයෙන් රත්පැහැවෙන බව දැකීම මට සතුටක් විය.

"ඇත්තෙන්ම මං ඔබෙන් සමාව ඉල්ලන්න ඕන වොට්සන්" ඔහු කීය. "කපිතාන් බියර්ඩ්ස්ලි බොහොම භයානක මිනිහෙක්. ඔහු ඔබේ අත හපාකෑ තැන කොහොමද දැන්?"

"ටිකක් රිදෙනවා" මම කීවෙමි. "ඒ වුණත් අයඩින් ටිකක් දමලා, වෙළුම් පටියකින් ඔතලා තැබුවාම ඒක හරියාවි. මගේ හිතවත් මිත්‍රයා, ඊට වඩා මගේ හිතට අමාරු ඔබේ උරහිස ගැන. ගිනි අඟුරු අල්ලන අඬුවෙන් ඔහු ඔබේ උරහිසට එල්ල කළ පහරින්, අස්ථියක් බිඳී ගියාද දන්නේ නෑ. මට ඒක ටිකක් බලන්න ඕන"

"පස්සෙ බලමු වොට්සන්, පස්සෙ බලමු. මට නම් හිතෙන්නේ එතැන ඇත්තෙ තැල්මක් විතරයි. සම යටට ලේ ගලාගිහින් ඇති. ටික දවසක් යද්දි ඒක හොඳ වෙයි. ඒක එහෙමයි වොට්සන්. මගේ හිතේ ලොකු සැකයක් තිබුණා, අපරාධකාරයා මං ඇටවූ උගුලට අහුවෙයිද කියලා"

"උගුලට?" මම ඇසීමි.

"ඔව් වොට්සන්, ඇමක් සහිතව මං උගුලක් ඇටෙව්වා. ඔහු මෝඩයෙක් වගේ ඒ ඇම ගිල්ලා. එහෙම නොවෙන්න, හැරල්ඩ් බියර්ඩ්ස්ලිට විරුද්ධව චෝදනා ඔප්පු කර ගැනීම, අපට අමාරුවෙනවා. මිනීමරන අපරාධකාරයන් කොයිතරම් බුද්ධිමත් වුණත්, සමහර වෙලාවට ඔවුන්ගේ සිතේ ඇතිවෙන භීතියට, බුද්ධිය පරාජය වෙනවා. ඔහු බොහොම හිතාබලලා යම් අපරාධයක් කරන්නේ, තර්කානුකූලව තමන් ඒකට පටලැවෙන්න විදියක් නැහැ කියල හිතාගෙන. නමුත් ඔහු කලින් නොහිතූ ඉතා සුළු දෙයක්, කවුරු හරි මතුකර පෙන්නුවා කියල හිතමු. අපරාධකාරයා ඒකට කලබල වෙනවා. ඔහු දැඩි භීතියකට පත්වෙනවා. මෙතැන වුණත් ඒකයි"

"මට තවමත් ඔබ කියනදේ තේරුම් ගන්න අමාරුයි හෝම්ස්"

"මගේ හිතවත් මිත්‍රයා. මෙතැන ඉතාම බරපතල, පැටළුණු ගැටලුවක් තිබුණේ නෑ. තමන් කරන නිරීක්ෂණ තර්කානුකූලව විශ්ලේෂණය කිරීමෙන්..."

".....මම නම් මොකුත් දුටුවේ නෑ" මම කීවෙමි.

"ඔබ හැමදෙයක්ම දුටුවා වොට්සන්. ඒත් ඒවායින් තර්කානුකූලව නිගමනයකට එන්න ඔබට බැරිවුණා. හෝරා මරේ මෙහෙවිය ඇගේ කතාවේ කියද්දී හෙළිකළ දේ මතක් කරගන්න. ඇය කිව්වා





"..... අරුමෝසම් බඩු කාමරයේ දොර සම්පූර්ණයෙන් යතුරු දමා වහල තිබුණා. නමුත් ජනේල ආවරණය කිරීමට තිබූ ජනෙල් රෙදි සම්පූර්ණයෙන්ම පැත්තකට ඇදල තිබුණේ; කාමරයේ ඇතුළත ආවරණය කරලා තිබුණේ නැහැ" මේ කරුණ හිතාබලන්න වොට්සන්. මේක බිම්මහලේ කාමරයක්. මහජනයා ඉහළ පහළ ගමන්කරන වීථියකට මුහුණලායි තියෙන්නේ. ඉතින් ඒක ඉතාම අසාමාන්‍ය සිදුවීමක් නොවෙයිද? එදා ඇය සමග අප කළ කතාබහ මතක් කළොත් ඔබට සිහිවේවි, මං ඇයගෙන් ඇහුවා "කර්නල් රොචෙස්ටර්ගේ දිනචරියාවේ සාමාන්‍යයෙන් කෙරෙන කටයුතු මොනවාද කියල. කර්නල් සිරිතක් වගයෙන් රෑ කෑමෙන් පස්සේ මේ කාමරේට වෙලා බිරිඳ සමග සාකච්ඡා කරනවාද යනුවෙන්. එතකොටයි මට නිගමනය කරන්න පුළුවන් වුණේ, කර්නල් මේ කාමරේ හිටියේ, කවුද හරි අමුත්තෙක් එන බලාපොරොත්තුවෙන්. ඒ වගේම කර්නල්ට උවමනා වුණා, ඒ අමුත්තාව ගේ ඇතුළෙ දොරෙන් කාමරයට නොගෙන, උස් ජනේලයකින් කාමරයට ගන්න. ඒ කුමන හේතුවක් නිසාද කියන්න අපි දන්නේ නෑ. මේ මැදිවියේ සේනාධිපතියා විවාහ වෙලා හිටියේ තරුණ බිරිඳකට. ඒ නිසා ඔහුගේ හැසිරීම ගැන වරදවා හිතන්න දෙයක් නැහැ. මේ ජනේලයෙන් කාමරය ඇතුළට කැඳවාගන්න හිටි අමුත්තා පිරිමියෙක්. කර්නල් රොචෙස්ටර්ට උවමනා වෙන්න ඇති, මොනවා හරි සාකච්ඡාවක් හොර රහසේ කරන්න. කාට රහසේද? මේ ගෙදරට එකතුවෙලා ඉන්න පිට මිනිස්සුන්ට රහසේ"

"නමුත් ඒ උස් ජනේල දෙකේ පියන්, ඇතුළතින් අගුළු දමා තිබුණේ"

"ඔව්. ඒකෙ පුදුමයක් නෑ. මරේ මෙහෙවිය අපට කිව්වා, රෑ කෑමෙන් පස්සේ, රොචෙස්ටර් මහත්මිය සහ ඇගේ සැමියා අරුමෝසම් බඩු කාමරයට ගියා කියලා. එතැනදී ඔවුන් දෙදෙනා අතර ලොකු සණ්ඩුවක් ඇතිවුණා. එතකොට මගේ හිතට නැඟුණේ මෙන්න මේ කාරණය. කර්නල් අමුත්තෙකු බලාපොරොත්තුවෙන් සිටියේ. ඒ නිසා ඔහු ජනෙල් රෙදි පැත්තකට ඇදල තියෙන්න ඇති, තමා ඉන්නෙ තනියෙන් නොවන බව අමුත්තාට දැනගන්න. මේ මම මුලදී කාරණා වලට ගැළපෙන විදියට කළ අනුමානයක් පමණයි."

"එතකොට මේ අද්භූත අමුත්තා කවුද කියන එක?"



www.sinhalaelibrary.com

"ඒකත් අනුමාන කිරීමක්. අපි දැනගෙන හිටියා රොචෙස්ටර් මහත්මිය ඇගේ සැමියාගේ බෑනා වන බියිඩබරි ගැන කැමැත්තක් නොදැක්වූ බව. මගේ මෙනෙවිය ඇගේ කථාවේදී කියූ එක් වචනයක් නොවෙන්න, මට නිගමනයකට එම ඒ තරම් පහසු නොවෙන්න ඉඩ තිබුණා. සිතේ ඇතිවුණු සැකය සත්‍යයක් බව තීරණය කරන්න හැකිවුණේ අන්න ඒ වචනයෙන්. එතකොටයි මං තේරුම් ගත්තේ, අප හමුවේ තියෙන්නේ බොහොම සියුම්ව සැලසුම් කළ, අමු අමුවේ කළ මිනීමැරීමක් බව"

"මට නම් මතක් කරන්න අමාරුයි"

"ඇයි වොට්සන් ඔබත් පාවිච්චි කළේ ඒ වචන. "..... මෙච කොහොමද තවත් ඉවසා දරාගන්නේ?" කියල.

"දෙවියනේ! මට කෑගැසිණ. එහෙම නම් මගේ මෙනෙවිය ඒ වචන පාවිච්චි කළේ, කර්නල්ගේ සුරුට්ටු දුමේ දුර්ගන්ධය විස්තර කරන්න?"

"ඔබ කල්පනා කරල බලන්න වොට්සන්. කාමරය තිබුණේ සම්පූර්ණයෙන්ම ජනෙල් දොරවල් වහලා. රොචෙස්ටර් ඒ කාමරය ඇතුළේ වෙඩි දෙකක් පත්තු කළා නම්, එතැන තිබෙන වාතාශ්‍රය මොන වගේද? ඉවසන්න බැරි තරම්දුරට වෙඩි බෙහෙත් දුල්වීමෙන් සැදුණු සැර දුමාරයක්, සෑහෙන වෙලාවක් යනතුරු එතැන රැඳෙනවා"

"ඒ වුණාට වෙඩි ශබ්ද දෙකක් ඇහුණා?"

"හරි. රිවෝල්වරයෙන් වෙඩි පත්තුවුණේ කාමරයෙන් පිටදී. ළුණ්ඩ ගමන් කළේ වහල තිබුණු ජනේලයේ වීදුරුව හරහා. මිනීමරුවා කවුරුවුණත් ඉතාම දක්ෂ වෙඩික්කාරයෙක්. ඉලක්කයට වෙඩි තබන්න ශූරයෙක්. ඒ නිසා බොහොම දුරට යුද්ධහමුද පුහුණුව ලැබූ කෙනෙක්. ඔන්න එතකොට අපට ලැබෙනවා, තවදුරටත් ඉදිරියට උපකල්පන ගොඩනගා ගත හැකි පදනමක්. ඉතින් මම ගත්තා තීරණයක්. මොකක්ද? මේ කාරණය තහවුරු කරගත හැකි සාක්ෂි ඔබේ කාගෙන්ම ලබාගන්න. ඔබ අපේ නිවහනට ඇවිත් පහත දෙරෙන් ඇතුළුවෙන තුරු මං සූදානමෙන් හිටියා. මේ අතරේ මම කර්නල් රොචෙස්ටර්ගේ සුරුට්ටුව අඩක් පමණ බීලා අවසන්. ඔබ හඩ්සන් මහත්මිය හා කතාබහ කරනව ඇහෙද්දී මං එක වෙඩිල්ලක් පත්තු කළා. මිනිත්තුවකට පසු දෙවැනි වෙඩිල්ල. ඒ





සඳහා මං යොදාගත්තේ කර්නල් රොචෙස්ටර්ට මරු කැඳවූ වර්ගයේ රිවෝල්වරයක්"

හෝම්ස් මේසය මත දැමූ රිවෝල්වරය දෙසට අතදිගු කළේය.

"මේ ගැන හිතන්න වොට්සන්. කර්නල් හා බිරිඳ මියගිය අරුමෝසම්බඩු කාමරය බොහොම දුරට මේ ප්‍රමාණයේ කාමරයක්. ජනෙල් දොරවල් ඔක්කොම වහලා මේ විධියටම. මේ කාමරයට ඇතුළුවුණු ඔබට දැනුණේ වෙඩිබෙහෙත් ඇවිළුණු දුම හා ඒකේ දුර්ගන්ධය. හරි නේද? ඒ මොකද කාමරය පිරෙන්න ඒ දුම තිබුණා. සුරුට්ටුව ගැන ඔබ කළේ නිරීක්ෂණයක් පමණයි. සාමාන්‍යයෙන් පයිප්පය උරන මම, මේ වෙලාවේ සුරුට්ටුවක් ඉරුවා. ඒ මිසක් ඔබට තද සුරුට්ටු ගඳක් දැනුණේ නැහැ, එහෙම නේද?"

"ඔව්. ඒක හරි. නමුත් මොකක්ද ඒකෙ තියෙන වැදගත්කම?" මම ඇසීමි.

"වෙඩි ශබ්දයෙන් මිනිත්තු කිහිපයක් ඇතුළත ඒ කාමරයට ගිය මගේ මෙනෙවිය සඳහන් කළේ කුමක් ද? ඇය වෙඩි බෙහෙත් දුමක් හෝ ගඳක් ගැන සඳහන් කළේවත් නැහැ. ඇයට දැනුණේ කාමරය පිරී තිබුණු සුරුට්ටු දුම නිසා ඇතිවුණු දුර්ගන්ධය පමණයි. එතකොට අපට පැහැදිලිවම කියන්න පුළුවනි, වෙඩිල්ල පත්තුවෙලා තියෙන්නේ කාමරය ඇතුළතද්ද පිටතද්ද කියලා"

"ඔබ ඒක කිව්වාට පස්සේ නම් මටත් පැහැදිලිවම පෙනෙනවා" මම කීවෙමි. "ඒ වුණත් මෙච්චර වෙලා ඒක මට සනිටුහන් වුණේ නැහැ"

"ඒක ඇත්ත" හෝම්ස් කීය. "ඒ ගෙදරට ගිය වෙලේ සිද්ධියේ හැම පියවරක්ම වෙන්න ඇත්තේ මේ පිළිවෙළටයි කියලා මගේ සිතේ ඇඳුණා"

"ඒ වුණත් ඉන්දියන් සේවකයා එක්වරම මතුවෙලා, එක්වරම නොපෙනී ගිය හාලෙට ඔබ තිගැස්සුණා. එහෙම නේද හෝම්ස්?"

"නැහැ වොට්සන්. මම තිගැස්සුණේ ඔහු අතුරුදන්වීමට යොදගත් වීදුරුව බිඳුණු ජනේලය දැකලා"

"ඒ වුණාට මගේ මෙනෙවිය ඒ ගැන අපට කලින් කියල තිබුණා නේ. ඇය කිව්වේ කපිතාන් බියිඩබරි ගලක් අරගෙන වීදුරුව බිඳදැමුවා කියල?"

"මේ සාක්ෂිය මං විස්තර කරන්නේ ඉතා අවාසනාවන්ත සාක්ෂියක් කියලයි. ඒ මොකද, සිදුවීමේ හැම පියවරක්ම

අනුපිළිවෙලින් විස්තර කිරීම ඇය පැහැර හැරියා. ක්‍රමානුකූලව පියවරෙන් පියවර උපකල්පනයක් ගොඩනගාවන්නෙකුට, මේ සියුම් තොරතුරු හැමෙතකම ඉතාම වැදගත්. හරියට පෙදෙරේරුවෙකුට සිමෙන්ති හා ගඩොල් වගේ.

ඔබ දැන් මතක් කරලා බලන්න ඇය කිව්වේ මොනවාද කියලා..... කපිතාන් බයිඩබර් එළියට දිව්වා. උද්‍යානයෙන් ගලක් අරගත්තා. ඒකෙන් වීදුරුවට ගහලා, වීදුරුව බිඳලා කාමරයට ඇතුළුවුණා. එහෙම නේද?"

"ඔව්. එහෙම තමයි"

"ඉන්දියානු සේවකයා ජනේලයෙන් කාමරයට රිංගද්දී ඇයි මං තිගැස්සුණේ? ප්‍රධාන දොරට හුඟක්ම ළඟින් තිබූ ජනේලයෙන් ඔහු කාමරයට ඇතුළුවුණේ නැහැ. ඒ මොකද ඒකෙ වීදුරුව බිඳලා නැහැ. නමුත් මං නිරීක්ෂණය කළා, උද්‍යානයෙන් ලොකු ගලක් ඉවත් කරගෙන තිබුණේ මේ ජනේලයට ඉතාම ළඟින්-වීදුරුවට අඩි එක්හමාරක් දෙකක් දුරින්.

එහෙම තිබියදී ඇයි කපිතාන් බයිඩබර් එතැනින් ගලක් අරගෙන ඈතින් තිබෙන ජනේලය වෙත දිවගියේ? ඈතින් තිබෙන ජනේලයේ වීදුරුව බිඳින්න මොකක්ද ඔහුට තිබුණු උවමනාව? මේ ගැන කල්පනා කරද්දී මට වැටහුණා වොට්සන් ඒකට හේතුව. ඒ ඈත ජනේලයේ වීදුරුවේ ලියවී තියෙන්න ඇති කථාව. මේ ඛේදජනක සිද්ධිය වුණු හැටි වීදුරුවේ ලියැවී තියෙන්න ඇති. අන්න ඒ නිසයි මං මැක්ඩොනල්ඩ්ට කිව්වේ, බෙල්ලන් කෑමට ගනිද්දී ළඟම තියෙන ගැරුප්පුව අතට ගන්නවාද? නැත්නම් බොහොම ඈතින් තිබෙන එකක්ද ඔබ ගන්නෙ කියලා. ඊළඟට මම කර්නල් රොචෙස්ටර්ගේ සුරුට්ටු පෙට්ටියේ සුරුට්ටු වල සුවඳ බැලුවා, ඔබට මතක ඇති. ඒවා සැර අඩු ඕලන්ද දුම්කොළ වලින් එතූ ඒවා. මේ තරම් සැර අඩු සුරුට්ටු වර්ගයක දුමක්, මරේ මෙහෙවියට හදිස්සියේ දැනුණා නම්, ඒකට හේතුවත් වසාතිබූ කාමරයෙන් එළියට සුරුට්ටු දුම නොගිය නිසා; එළියෙන් වෙඩිබෙහෙත් ගඳ ඇතුළට නොආව නිසා."

මේ හැම දෙයක්ම දැන් මට පැහැදිලියි." මම කීවෙමි. "ඒ වුණත් ඔබ ගෙදර හැමදෙනාගෙම ඇහෙන්න කිව්වා, ඔබ බලාපොරොත්තුවෙනවා කියලා, හෙට උදේ මේ කැඩුණු වීදුරු





කැබලි එකට එකතුකරලා බලන්න. මට නම් හිතෙන්නේ එහෙම කිව එකේ ලොකු අවදානමක් තිබුණා කියලයි. ඔබේ මුළු පරීක්ෂණයම පදනම් වෙන ප්‍රධාන සාක්ෂිය වෙන්නේ වීදුරුවේ කැබලි. ඒ සාක්ෂිය ඔබ අවදානමකට ලක් කළා නේද?"

"මගේ හිතවත් වොට්සන්. මෙතරම් කුඩාවට කැඩුණු වීදුරු කැබලි ඉතාම නිවැරදිව හිටින්න එකට එකතු කිරීම ඉතාම අපහසු කටයුත්තක්. රිවෝල්වරයෙන් පිටවුණු වෙඩි උණ්ඩ වලින් වීදුරුවේ හැදුණු කුඩා සිදුරු පැහැදිලිව පෙනෙන ලෙස, වීදුරු කැබලි එකතු කිරීම මට මොන විධියකටවත් කරන්න බැහැ. මං කළේ සම්පූර්ණ බොරුවක්. පෝකර් නම් කාඩ් ක්‍රීඩාවේ බයදෙන සුදු අන්තුවා, තමන්ගේ අතේ එක ආසියයක්වත් නැතුව, ප්‍රතිවාදියාට අභියෝග කරන්නේ, හරියට තමන්ට ආසියො හතරදෙනාම ලැබිලා වගේ. මමත් කළේ ඒ වගේ වැඩක්. මං අර විධියේ කථාවක් කිව්වාම කවුරුහරි උත්සාහ කළා කියලා හිතමු, අනෙක් අයට හොරෙන් වීදුරුවේ කැබලි තවත් පුංචි කෑබලි වලට කඩාදමන්න. එහෙනම් අන්න ඔහු තමා මිනීමරුවා. ඒ මොකද, ඔහු හිතන්නේ වීදුරුව කුඩා කෑබලි වලට කඩාදැමීමෙන් සිදුරුවුණු හැටි හංගන්න පුළුවන් කියලා. කථාවේ ඉතිරි හරිය ඔබ දන්නවා. මිනිහා එනකොට ආයුධයකුත් අරගෙන ආවේ, ඔහුට එරෙහිව කෙනෙක් ආවොත් මැරෙන්නම පහරදෙන්නයි. වාසනාවකට වගේ ඒ පහර එල්ලවුණේ මගේ ඔළුවට නෙමෙයි, උරහිසට."

"ඒ වුණත් ඇයි හෝම්ස් ඔහු තමන්ගේ මාමාව මරාදැම්මේ?"

"කර්නල් රොචෙස්ටර් මේ විවාහය කරගත්තේ, තරුණ වයස ඉක්මවලා ටිකක් ප්‍රමාදවෙලා. මෑතකදී ඒ විවාහය සිදුවෙනතුරු, රොචෙස්ටර් මාමාගේ මුළු බූදලයේම එකම උරුමකාරයා වුණේ හැරල්ඩ් බයිඩබර් නම් බෑනා. නමුත් බෑනා බොහොම වියදම් අධික පුද්ගලයෙක් බව මාමාට රහසක් වුණේ නැහැ. බෑනාගේ අශ්වරේස් ඔට්ටු වලටත්, මත්පැන් වලටත්, මාමාගේ මුදල් අධික වශයෙන් වියදම් වුණා. ඒ බව අලුත් නැන්දා, එලිනර් රොචෙස්ටර් මහත්මිය දැනගෙන ඉන්න ඇති. සමහරවිට අර සණ්ඩු සරුවල් වලටත් හේතුව ඒකම වෙන්න ඇති. මේ තරුණ කාන්තාව කර්නල් රොචෙස්ටර්ට දෙන උපදෙස්, තමාගේ අනාගත පැවැත්මට ඉතාම අවාසි සහගත බව හැරල්ඩ් බයිඩබර් තේරුම් ගන්නා.



www.sinhalaelibrary.com

එදා රොචෙස්ටර් අඹුව අරුණෝසම බඩු කාමරයේ සිටියදී, බැරිඩ්ඩරි තරුණයා නායන් පෙනෙන විධියට විසිත්ත කාමරයටත්, එතැනින් ලොබියටත් ආවා. මගේ අමනෙච්චිය හා මේජර් අර්නිෂෝ සමග වචන කිහිපයක් කථා කරලා, ඔහු දයින් ටිකක් බොන්න යන මුවාවෙන් කෑමකන කාමරයට ගියා. නමුත් ඔහු ඇත්තටම කළේ කෑම කන කාමරයේ ජනේලයෙන් උද්‍යානයට පිවිසීම. ඒක දිගේ ඔහු ඇවිදගෙන ගියා අරුණෝසුම් බඩුකාමරයේ, තමන්ට ළඟම ජනේලය ළඟට. ගිහින් වීදුරුව හරහා කර්නල්ට හා ඔහුගේ බිරිඳට වෙඩි තැබුවා. එළඟට ආපහු දුවගෙන ඇවිත් ගිය ජනේලයෙන්ම කෑමකන කාමරයට ආපසු පැනගන්න, අනුව ගනවෙන්න ඇත්තේ තත්පර කිහිපයයි. එහි මේසය උඩ ඔහු කලින් සූදානම් කර තැබූ විසින් ඩිකැන්ටරයක් අරගෙන, ඔහු ගේ ඇතුළෙන් දිව්වා ලොබියට. එළඟට ඔහු කටයුතු කළේ බොහොම සූක්ෂම අයුරින්. සිද්ධිය වුණු තැනට ඔහු ආවේ අනෙක් අයට මොහොතකට පසුව. රොචෙස්ටර්ගේ උමතුවීම නිසා මේ අපරාධය ඔහු විසින් සිදුකළ බව සම්පූර්ණ කරන්න බැරිඩ්ඩරිට තිබුණේ තවත් පියවර දෙකයි. ඒ සිදුරුවුණු වීදුරුව බිඳ දැමීම හා රිවෝල්වරය කර්නල්ගේ අත අස්සින් බිමදැමීම. ඒ දෙක ඔහු ඉතා සාර්ථකව සිදු කළා"

"මේ වෙලාවේ රොචෙස්ටර් මහත්මිය කාමරේ නොහිටියා නම්, ඔහු මාමා සමග යොදාගත් සාකච්ඡාව කරන්න සිදුවුණා නම්, මොකක්ද හෝම්ස් ඇතිවෙන තත්ත්වය?"

"ඒක නම් අපට අනුමාන කරන්න වෙනවා වොට්සන්. ඔහු ආයුධයක් අරගෙන ආව එකෙන් පෙන්නන්නේ, ඔහු ආවේ ඕනෑම දේකට සූදානමින්. මට හිතෙන්නේ එහෙමයි. නඩුව උසාවියට එද්දී ඔය හැමදෙයක්ම එළිවේවි, බොහොම වෙලාවට ඔහුට අතමිට හිඟවෙලා, මුදල් උවමනාවෙලා ඉන්න ඇති. තමාට රිසිසේ තමන්ගේ ජීවිතයේ ඉදිරිගමන යන්න බාධක ඇතිවෙනකොට, ඒවා ඉවත්කරන්න සමහර පුද්ගලයින් ක්ෂණික පියවර ගන්නවා. හැරල්ඩ් බැරිඩ්බරි අප සමග කථාකරද්දී කොහොමද වොට්සන් ඔහුගේ තිබුණු අවිහිංසක ලීලාව? ඔහු අවිහිංසක වෙස්මුහුණක් පැළඳගත් අතිශය භයානක පුද්ගලයෙක් කියලයි මට නම් හිතෙන්නේ. ඒක නෙමෙයි මිතුරා. ඔබේ සුන්දර ගෘහජීවිතය අවුල් කරන විධියට ඔබ මගේ කටයුතුවලට යොදාවා ගැනීම ගැන, මං සමාව අයදින බව බිරිඳට කියන්න"





"එතකොට ඔබේ උරහිස?" මම ඇසීමි. "මං මෙහෙන් පිටවෙලා යන්න කලින් එහි ලිනිමන්ට් ටිකක්වත් ආලේප කරන්නම්?"

"෴ ෴ වොට්සන්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබ මේ වෙනකොට තේරුම් අරගෙන තියෙන්න ඕන, මුළු ශරීරයම පාලනය කිරීමට ප්‍රධාන වෙන්නේ සිත තියෙන එක. ඔබ තියෙනවා, උරහිසේ වේදනාව අමතක වෙන බෙහෙත් ටිකක්. කරුණාකරල ඔය රසායනික ප්‍රතිකාරක බෝතලේ මේ පැත්තට ළංකරන්න වොට්සන්. මේ මුළු ලෝකයම අපට හිතාගන්න බැරි තරම් වර්ණවත්, අලංකාර, සුන්දර, වසත් කිරීමේ හැකියාව තියෙනවා බෙන්සීන් ඩයසෝනියම් ක්ලෝරයිඩ් රසායනික සංයෝගයට. ඇයි අපි ක්ලෝරයිඩ වලට විතරක් මෙක සීමාකරන්නේ. ෆ්ලෝරයිඩ්, බ්‍රෝමයිඩ් හා අයඩයිඩ් යොදාගත්තොත් මොනවද අපට කරන්න බැරි?"

# ප්‍රංශ වීණාවාදකයා.

1893 වසර මගේ හිත මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතාට කාර්ය බහුල වසරක් වූ බැව් මගේ සිහියට නැගේ. විදේශ අමාත්‍ය ධුරය දැරූ ශ්‍රීමත් පෝල් හොලිංවුඩ්ගේ අභිරහස් මරණය පිළිබඳ ගැටලුව හෝම්ස් විසඳුවේ මේ වසරේදීය. ඩෙන්මාක් රජ කුමරියකගේ විවාහ මංගල්‍යයට බාධා කරමින් කප්පම් ඉල්ලමින් සිටි, නෝර්වීජියානු ජාතික රොගට් ලෙමිං නම් ප්‍රකට ලෝකයේ අපරාධකරුවා හෝම්ස් විසින් අල්ලාගන්නා ලද්දේ ද මේ වසරේදීම බව මගේ සටහන් පොත් පරීක්ෂා කිරීමේදී පෙනී යයි. මීට අමතරව එඩිංබ්‍රෝහි මහා බැංකු මංකොල්ලය හා ප්‍රංශ වීණාවාදකයා පිළිබඳ සිද්ධිය 1893 දී මගේ මිත්‍රයා විසින් විසඳන ලද තවත් අභිරහස් දෙකකි. එම අවසන් සිද්ධිය ප්‍රථමයෙන් ඔබ වෙත ගෙන ඒමට මම අදහස් කළෙමි.

එය ගිම්හාන සෘතුවේ දීර්ඝ සති අන්තයක් විය. දහවල් කාලයේ තිබූ දැඩි උණුසුම බව නිසා අතමිට සරුව තිබූ බොහෝ දෙනෙක්, ලන්ඩනය හැරදමා වඩාත් සනීපවත් මුහුදුබඩ පෙදෙස් බලා ගොස් සිටියහ. එදින උදෑසන "මෝනිං ක්‍රොනිකල්" පුවත්පත කියවමින් සිටි මට, පහත සඳහන් පුවෘත්තිය දකගන්නට ලැබිණ.

## සුප්‍රසිද්ධ සංගීතඥ ස්ටීවන්සන් යළිත් ලන්ඩනයේ

සුප්‍රකට වයලීන වාදකයකු ලෙස ලොව පුරා කීර්තියක් දිනා ඇති ජෝන් ස්ටීවන්සන්ගේ සංගීත සංදර්ශනයක් ලබන 10 වැනිදා ලන්ඩනයේ ලයිසියම් නාට්‍යශාලාවේදී පැවැත්වේ. ජාත්‍යන්තර සම්මානවලින් පිදුම් ලැබූ මේ අග්‍රගණ්‍ය සංගීතඥයාගේ සංගීත උළෙලක්, ලන්ඩනයේ පැවැත්වෙන්නේ අවුරුදු දෙකකට පසුය. ඔහු සමග





සැමවිටම සංගීත සංදර්ශන වලදී වාදනයෙන් සහායවන හෙන්රි ස්මිත් සහ වාදක මණ්ඩලය මේ ප්‍රසංගයටද සහභාගි වන ඇව පාර්තා වේ. ජෝන් ස්ටීවන්සන් මහතාගේ තවත් සංගීත ප්‍රසංගයක් 12 වැනිදා බර්මිංහැම්හි වික්ටෝරියා නාට්‍යශාලාවේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මගේ මිත්‍රයාට මා මේ පුවෘත්තිය පෙන්වූයේ ඔහු අතිශයින්ම සංගීතයට කැමැත්තක් දක්වූ පුද්ගලයකු නිසාය. ඔහු මට ප්‍රථම මේ පුවත කියවා ඇති බව මට දැනගන්නට ලැබුණේ එවිටයි.

"අද උදේ පාන්දරම මම මේ පුවෘත්තිය කියෙව්වා වොට්සන්. මං ඔබටත් ආරාධනා කරනවා, මාත් එක්ක මේ සංගීත ප්‍රසංගය නරඹන්න යමු කියලා. මං බලාපොරොත්තු වෙනවා අදම ගිහින් අපට ආසන වෙන්කරවා ගන්න."

නියමිත දිනයේ අපි ලයිසියම් නාට්‍යශාලාව වෙත ගියෙමු. සංගීත ප්‍රසංගය නැරඹීමේ අරමුණෙන් පැමිණි විශාල පිරිසක් ශාලාවෙන් පිටත රැස්ව සිටියහ. ඒ වනවිටත් දොරටු වලින් සෙනග ඇතුළුකිරීම ඇරඹී තිබිණි. ශාලාවට ඇතුළුවීමට නොහැකිව අපි සෙනග අතරේ බලාසිටියෙමු. පොලිස් භටයන් විසින් ශාලාව අසල රැස්ව සිටි මහජනයා, පාර දෙපසට කිරීම පටන්ගන්නා ලදී. ඉතාමත් අලංකාර සුඛෝපභෝගී අශ්වකරත්තයකින් ජෝන් ස්ටීවන්සන් සංගීතඥයා එහි පැමිණියේය. මග දෙපස රැස්ව සිටි ජනයා ප්‍රීතිඝෝෂා කරද්දී ඔහු රථයෙන් බිමට බැස්සේය. ඉතා වටිනා ඇඳුම් පැළඳුම් වලින් සැරසී සිටි ඔහුගේ වයස අවුරුදු හතළිහක් පමණ විය යුතු යයි මම අනුමාන කළෙමි. උසින් අඩි පහකට වැඩි නොවූ ඔහුගේ අතේ තොප්පිය සහ හිස්වැස්මක් ද විය. ඔහු වෙනුවෙන් ප්‍රීතිඝෝෂා කළ මහජනයා වෙත, ජෝන් ස්ටීවන්සන් ප්‍රීතිමත් සිනාවකින් සංග්‍රහකරමින් දෑත් වනමින් ආචාර කළේය.

මීළගට තවත් අශ්වකරත්තයක් පැමිණියේය. එයින් බිමට බැස්සේ ස්ටීවන්සන්ගේ වයසේම සිටි හැඩිදැඩි පුද්ගලයෙකි. ඔහු පැළඳ සිටි උපැස් යුගළ ඉවත්කිරීමේදී, ඔහුගේ දෑස් ඇතුළට ගිලී තිබුණු බව මම නිරීක්ෂණය කළෙමි. මුහුණේ සිනාවක් නොතිබුණද එහි බුද්ධිමත් බවක් දිස්විණ. ඒ ස්ටීවන්සන්ගේ සහායකයා වූ හෙන්රි ස්මිත් බැව් අපට අසන්නට ලැබිණ.



www.sinhalaelibrary.com
Reading Print

රැස්ව සිටි ජනතාවට ආචාර කිරීමට සූදානම් වෙන්ම, සංගීත ප්‍රසංගයේ සංවිධායකයෝ, ස්ටීවන්සන් හා ස්මිත් දෙදෙනා මැදිකරගෙන, වේදිකාව පිටිපස වූ දොරෙන් ඔවුන් ශාලාව තුළට රැගෙන ගියහ.

අප ඉක්මනින් ශාලාවට ඇතුළුවිය යුතු වුවද, මගේ මිත්‍ර හෝම්ස්ගේ තිබුණේ නිහඬභාවයකි. ඔහු පයිප්පය සපාගෙන, නළල රැලිගන්වමින් බලාසිටියේ කල්පනාකාරීවය. ඔහුගේ අවධානය යොමුවී තිබුණේ ශාලාවෙන් පිටතට ගමන්කරමින් සිටි මිනිසුන් තිදෙනකු වෙත බව මම දුටුවෙමි. මම ඔවුන් වෙත නෙත් යොමු කළෙමි. එහෙත් ඒ වෙලාවේ පැවැති අඩ අඳුර නිසා, මා දුටුවේ ඉදිරියෙන්ම ගිය පුද්ගලයාගේ සන උඩුරැවුල පමණි. හෝම්ස් ශාලාවට ඇතුළුවූයේ දිගින් දිගටම කල්පනා කරමිනි.

කල්තබා අප ආසන වෙන්කරවා ගෙන සිටීම වාසියක් විය. අපට ඉදිරිපෙළ අසුන් ලැබිණ. වැඩි ප්‍රමාදයකින් තොරව සංගීත ප්‍රසංගය ඇරඹිණ.

ස්ටීවන්සන්ගේ කලා කෞශල්‍යය අමුතුවෙන් කිවයුතු දෙයක් නොවේ. වේදිකාව මැද අසුන්ගෙන සිටි සංගීතවේදියා දිස්වන සේ, තිර දෙපසට ඇදෙද්දී මුලින් නැගුණේ කන් බිහිරි කරවන අත්පොළසන් නාදයකි. මීළඟට ශාලාව පුරා පැතිරගියේ දැඩි නිහඬතාවයකි. ඉතා සියුම් හඬක් ලෙස ඇරඹුණු සංගීතය ක්‍රමක්‍රමයෙන් උච්ච ස්වරයකට නැගෙද්දී, සෙනග, සංගීතයෙන් සම්මෝහනය වෙමින් එයට සවන්දී සිටියහ. මෙතරම් කන්කලු අන්දමින් වයලීනය වාදනය කළ හැකි ශිල්පියෙක්, ලෝකයේ කොතැනක හෝ ජීවත්ව සිටිදැයි සැක සහිතය. ඔහුගේ සගයා වූ හෙන්රි ස්මිත්ගේ සෙලෝ නම් සංගීත භාණ්ඩයෙන් ලැබුණු සහයෝගය නිසාම, ශාලාව පුරා උතුරා ගිය සංගීතයේ මධුර මනෝහර බව දෙගුණ තෙගුණ විය.

මේ කන්කලු සංගීත සන්ධ්‍යාව පුරා දෙපැයක් තිස්සේ පැවැතිණ. එහෙත් එපමණ කාලය ගෙවීගිය බවක් නම් අපට නොදැනිණි. ප්‍රසංගය අවසානයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූ නගරාධිපතිතුමා රැස්ව සිටි පිරිස ඇමතුවේය. එතරම් ප්‍රසිද්ධ නැති කරුණක් සිය කථාවේදී එතුමා මතක්කර දුන්නේය. එනම් ජෝන් ස්ටීවන්සන් මෙන්ම හෙන්රි ස්මිත් ද උපතින් ඉංග්‍රීසි ජාතිකයන්



www.sinhalaelibrary.com



බවයි. ළාබාල කාලයේම සංගීතය හැදෑරීම සඳහා එංගලන්තය හැරදමා ප්‍රංශයට සංක්‍රමණය වූ ඔවුන්, ප්‍රංශජාතිකයන් ලෙස ලොව පුරා ප්‍රසිද්ධියට පත්වූවත්, උපතින් ඉංග්‍රීසි ජාතිකයන් වීම මුළුමහත් ඉංග්‍රීසි ජාතියටම ආඩම්බර විය හැකි කරුණකි. ඒ බව නගරාධිපතිතුමා පවසද්දී නැගුණේ, රැස්ව සිටි ජනතාවගේ ප්‍රීති ඝෝෂා හඬය.

ප්‍රසංගය අවසන් වී අපි ආපසු එමට පිටත්වුණෙමු. අප බේකර් වීදියට ළඟාවෙද්දී ඇඳිරි වැටීමට පටන්ගෙන තිබිණි. එදා රාත්‍රි ආහාරයෙන් පසු අප සාකච්ඡා කළ කරුණ වූයේ, මෙතරම් මධුර මනෝහර ලෙස සංගීත වාදන ඉදිරිපත් කළ හැකි වාදකයින් සිටියදීත් බාල පරම්පරාව [illegible] අශාස්ත්‍රීය සංගීතය වෙත යොමු වීගෙන යන ආකාරයයි.

පසුවදා උදේ අප අවදිවූයේ සේවක ළමයා වූ බිලී දොරට තට්ටු කළ හඬෙනි.

"සමාවෙන්න මහත්මයා. විදුලිපුවතක්."

දොර විවෘත කළ හෝම්ස්ට බිලී කියනු මට ඇසිණ. මම ද වහා එතැනට ගියෙමි. විදුලිපුවත විවෘත කළ හෝම්ස්ගේ මුහුණ මා කිසිදිනෙක දැක නැති අයුරින් 'ශෝකාතුර' බවකට හැරුණේ ඒක්වරමය. කිසිවක් කථාකර ගැනීමට අපහසු වූ අයුරෙන් ඔහු ඒ විදුලිපුවත මා වෙත දිගුකළේය.

"සංගීතඥ ස්ටීවන්සන් ඊයේ රාත්‍රි හෝටලයේදී අභිරහස් ලෙස මියගිහින්. එය මිනීමැරුමක්දැයි මගේ හිතේ සැකයක් ඇත. පාක් රෝයල් හෝටලයට වහාම එන්න.

-ලෙස්ට්‍රේඩ්."

"දෙවියනේ! හෝම්ස් මේක විශ්වාස කරන්න පුළුවන්ද?" මට කෑගැසිණ.

කිසිම පිළිතුරක් නොදුන් මගේ මිතුයා නළල රැලි කරගෙන කල්පනා කරන්නට පටන් ගත්තේය. දැඩි කම්පනයකට පත් හෝම්ස්ට කිවයුතු කිසිවක් සිතා ගැනීමට නොහැකි වූ අයුරකි.

මඳ වෙලාවක් ගතවෙද්දී හඩ්සන් මහත්මිය විසින් අපේ උදේ ආහාරය රැගෙන එන ලදී. උදෑසන ආහාරය ඉක්මනින් අවසන් කොට අපි වැනැම් වීදියේ පාක්රෝයල් හෝටලය වෙත යාමට කුලීරියකට නැගුණෙමු.

"ඔබට මතකද වොෂිංටන් පසුගිය අවුරුදු දෙක තුළ යුරෝපය පුරා ධනවතුන්ට විශාල ප්‍රශ්නයක් මතුවුණා?"

ලෙස්ට්‍රේඩ් ගේ විදුලිපුවත කියවා මෙතෙක් වෙලා සම්පූර්ණයෙන්ම නිහඬව කල්පනා කළ මගේ මිත්‍රයා ඇසුවේය.

"රහස් සංවිධාන කිහිපයක් ධනවතුන්ට මරණ තර්ජන කරමින් කප්පම් එකතුකරන්න පටන්ගත්තා. කප්පම් නොගෙවූ අය පැහැරගෙන ගියා. නමුත් කිසිම රටක පොලිසියකට මොවුන් අල්ලාගන්න හැකිවුණේ නෑ."

"මොකක්ද හෝම්ස් මේ රහස් සංවිධානය?"

"අන්න ඒක තමා ප්‍රශ්නේ. යුරෝපා මහාද්වීපය පුරා තිබෙන හැම රටකම වගේ මුල්බැසගත් රහස් සංවිධාන තියෙනවා. පෘතුගාලයේ රිබෙයිරෝ සංවිධානය, ස්පාඤ්ඤයේ බැස්ක් කල්ලිය, සිසිලි දූපතේ මැලාවිටාඩා, ඉතාලියේ රතුකවය, මාෆියා කල්ලිය ආදී වශයෙන් තිබෙන සංවිධාන ගණන අප්‍රමාණයි. බෝල්කන් රටවල, හංගේරියාවෙ, තුර්කියේ මේ ආදී හැමරටකම මැරකල්ලි තියෙනවා. ඒවා හැම එකක්ම ඔවුන්ගේ අරමුදල් සපයාගන්නේ ක්‍රම දෙකකට. එකක් කප්පම ලබාගැනීමෙන්. අනෙක බැංකු මංකොල්ල කෑමෙන්."

"ඉතින් ජෝන් ස්ටීවන්සන්ගේ හදිසි මරණයත් මේ කප්පම් කල්ලියක වැඩක් කියලද ඔබ හිතන්නේ?" මම ඇසීමි.

"ඔව්. සමහරවිට එහෙම වෙන්නත් පුළුවනි. කොහොම වුණත් අපි තවමත් හරියට දන්නෙ නෑ මේක ස්වාභාවික මරණයක්ද කියලා. අධික වශයෙන් මහන්සි වෙන පුද්ගලයෙකුට, අවිවේකී කම නිසා වැලඳෙන හෘදයාබාධයක්, ස්ටීවන්සන් මහත්මයාට වැලඳුණාද කියල අපි දන්නෙ නෑ," හෝම්ස් කීය. "ඒ වුණත් මට ඉවෙන් වගේ වැටහෙනවා මේක මිනීමැරුමක් කියලා."

"ඇයි එහෙම කියන්නේ?"

"කුමක් හෝ රහස් සංවිධානයක් ජෝන් ස්ටීවන්සන්ටත් කිහිපවාරයක් මරණ තර්ජන කර කප්පම් ඉල්ලා තිබුණා. ඔහු ඒවා ගණන් ගත්තේ නෑ. ඒවාට හිස නමලා ඔහු කිසිම අවස්ථාවක මුදල් ගෙව්වේ නැහැ. එයට පළිගැනීමේ අරමුණෙන් මෙහෙම කළා වෙන්නත් පුළුවනි."

"ඒ වුණත් හෝම්ස් ඔය පිටරටවල රහස් සංවිධාන ලන්ඩනය තුළ ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? එංගලන්තය කියන්නේ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වෙන රටක්."





"වොට්සන්" හෝම්ස් ප්‍රීතිමත් සිනාමුසු මුහුණෙනි. "අපේ පාතාල ලෝකයේ කටයුතු ඔබට කොහොමද මේ තරම් ඉක්මනට අමතක වුණේ? අපරාධ ගැන කතාකරන කොට, නැපෝලියන් නම් අධිරාජ්‍යයාගේ බලවත් කමට මං සමාන කරන මහාචාර්ය මොරියාටි ඔබට අමතකද? ඔහුගේ දෙවැනියා කර්නල් සෙබස්ටියන් මොරාන්. ඔහුට මොරියාටි ගෙවන වැටුප ගැන මං ඔබට මීට කලින් කියල ඇති. මහාචාර්ය මොරියාටි කර්නල් මොරාන්ට ගෙවනවා එංගලන්තයේ අගමැතිට ලැබෙන වැටුපට වඩා ලොකු වැටුපක්. ඔවුන් සතු ජාත්‍යන්තර සබඳතා අප්‍රමාණයි. විදේශීය ත්‍රස්තවාදී කල්ලියකට, කර්නල් සෙබස්ටියන් මොරාන් ලවා, එංගලන්තයේ කෙනෙක් මැරවීම කොයි තරම් පහසු කටයුත්තක්ද?"

"ඇයි ඔබට මොරාන් ගැන සැක හිතෙන්නේ?"

"අපි ඊයේ ජෝන් ස්ටීවන්සන් මහතුරු ලයිසියම් ශාලාව ළඟ හිටි වෙලාව ඔබට මතකද?" හෝම්ස් ඇසීය. "ඒ වෙලාවෙ විශාල සෙනඟක් රැස්වෙලා හිටියා නේ. ඔබේ දැස් සංගීතඥයන් වෙත යොමුවෙලා තිබෙද්දි මට අහම්බෙන් දකින්න ලැබුණා වෙනත් පුද්ගලයෙක්."

"සෙබස්ටියන් මොරාන්ද?"

"ඔව්. ඔහු වෙස්මාරු කරගෙන හිටියේ. නමුත් උසෙන් හා ශරීර ප්‍රමාණයෙන් අන් කිසිවෙක් නොමෙයි මොරාන්. මට ඒක හොඳටම විශ්වාසයි. ඔහුට සාමාන්‍යයෙන් තිබෙන උඩුරැවුළ වැහෙන්න වඩාත් විශාල බොරු උඩුරැවුලක් පැළඳගෙන, රන්වන් පැහැති බොරු කොණ්ඩයක් හිසේ දමාගෙන හිටියත්, මට ඔහු අඳුනාගන්න අමාරුවුණේ නැහැ. බිහිසුණු ව්‍යාඝ්‍රයෙකුගේ වැනි කුරිරු ඇස් දෙකක් මොරාන්ට තියෙනවා. ඒක මට හොඳටම මතකයි."

"මේ සංගීතඥයන් එන වෙලාවෙ මොකක්ද සෙබස්ටියන් මොරාන්ට එතැන තියෙන රාජකාරිය?" මම ඇසුවෙමි.

"මොරාන් සමග වේගයෙන් එතැනින් ඉවතට ගිය තවත් දෙදෙනෙක් හිටියා. මං හිතන්නේ ඔවුන් එන්න ඇත්තේ ජෝන් ස්ටීවන්සන්ගේ පෙනුම හොඳින් බලාගෙන, ඔහුගේ ආරක්ෂාවට ලබාදී ඇති පියවර මොනවාද කියන එක සොඳිසි කර බලන්න වෙන්න ඇති."

මේ වනවිට අප පැමිණි කුලීරිය පාක්රෝයල් හෝටලය වෙත ළඟාවිය. පුවත්පත් වාර්තාකරුවන් හා ආරක්ෂක භටයන් අතරින් රිංගා අපි ලෙස්ට්‍රේඩ් සිටි හෝටල් කාමරය වෙත ගියෙමු.



www.sinhalaelibrary.com

හෝටලයේ කළමනාකරු ලෙස අපට හඳුන්වා දුන් ජෙෆ්රි ඩන්කන් මහතා සිවියේ අතිශයින්ම කැලැඹීමට පත්විය. මදවේලාවක් ගතවන තුරු අප ඇසූ ප්‍රශ්න වලටවත් ඔහුගෙන් කිසිම පිළිතුරක් නොලැබිණි.

"මහත්මයා, හරිම අවාසනාවන්ත දෙයක් සිදුවෙලා තියෙන්නේ" ඩන්කන් මහතා පැවසුවේ ශෝක ගසමිනි. "මේක මට විශ්වාස කරන්නත් අමාරුයි. දෙවියනේ! මේකෙන් අපේ හෝටලයට සිදුවෙන අවමානය! මං ජීවිතේටම මේ වගේ දේකට මුහුණදීල නැහැ මහත්මයා."

කළමනාකරු මදක් සන්සුන් වූ පසු හෝම්ස් ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කළේය.

"මරණය ගැන ඔබ දැනුගත්තේ කොහොමද?"

"ස්ටීවන්සන් මහත්මයාට සහ ස්මිත් මහත්මයාට සේවකයා තේ අරගෙන ගියේ උදේ හතට. මුලින් ස්මිත් මහත්මයා අවදිකරලා තේ දුන්නලු. ඊට පස්සේ ස්ටීවන්සන් මහත්මයාගේ දොරට තට්ටු කළාට දොර ඇරල නැහැ. මිනිත්තු කිහිපයක් දොරට ගහලා බැරි තැන ඔහු ස්මිත් මහත්මයාට දැනුම් දීල තියෙනවා. ඔහුත් ඇවිත් දොරට ගහමින් කථා කළාලු. බැරිම තැන තමයි මට දැන්නුවේ."

"ඔබ මොකද කළේ?"

"මමත් කථාකරල බැලුවා. එයිත් වැඩක් නොවුණු තැන අගුළ කඩලා දොර ඇරියා."

"ඔහු මියගොස් බව එතකොට ඔබට දකින්න ලැබුණා?"

"ඔහු ඇඳ උඩ හිටියේ නිදා සිටින ආකාරයට. පස්සේ ළඟට ගිහින් පරීක්ෂා කරන කොට මියගිහින් බව තේරුණා. ඉතින් මං වහාම පොලීසියට දැනුම්දුන්නා."

"හෝම්ස් මහත්මයා, මේක ජාත්‍යන්තර කතාබහකට ලක්වෙන මරණයක්." ලෙස්ට්‍රේඩ් කීය. "මට නම් හොඳටම විශ්වාසයි මෙතැන අපරාධයක් සිදුවෙලා තියෙලා. ඔබව කල් ඇතුවම කැඳෙව්වේ ඒ නිසයි. ඔන්න හෝම්ස් මහත්මයා, අපි කාමරයේ කිසිදෙයක් එහා මෙහා කළේ නෑ. ඔබට පරීක්ෂා කිරීමට ලවමනා නිසා හැමදෙයක්ම ඒ හැටියෙන්ම තියෙන්න හැරියා."

ඉතා සුඛෝපභෝගී හෝටලයක් වූ පාක්රෝයල්හි, ඉතා සැපපහසු අංගනයක් ජෝන් ස්ටීවන්සන් හා හෙන්රි ස්මිත් වෙන





වෙන්කර තිබිණි. අප මුලින්ම ඇතුළුවූයේ විසිත්ත කාමරයටයි. එහි මේසයක් ඇතුළු අනෙක් ලී බඩු ඒවගේ සෝෆාවක් සහ අසුන් කිහිපයක් විය. සෝෆාව අසලින්ම වූයේ කුඩා ගිනිඋදුනකි. විසිත්ත කාමරයේ සිට දොරටු දෙකක් විය. ඒ ස්ටීවන්සන්ගේ හා ස්මිත්ගේ නිදනකාමර වලට ඇතුළුවන දොරටුය.

හෝම්ස් ඉතා උනන්දුවෙන් විසිත්ත කාමරය සෝදිසි කළේය. ඔහු වැඩි අවධානයක් යොමුකළේ කාමරයේ වූ කුඩා මේසය හා ගිනිඋදුන වෙතය. තම උත්තල කාචය ඉතා සාක්කුවෙන් එළියට ගත් ඔහු, මේසය මත වූ කුඩා සීරීම් පවා පරීක්ෂාවට ලක්කළේය. ඒමෙන්ම නිවා දමා තිබූ ගිනිඋදුනේ වූ අළු හා දැවුණු, නොදැවුණු අනෙක් දේ පිළිබඳව ද සොයා බැලීය. හෝම්ස් ගිනිඋදුන අසල පරීක්ෂා කිරීමේදී තම නළල රැළි ගැන්වූ අතර, ඇස් මදක් අඩවන් කරගෙන, කිසිවක් තමාටම මුමුණන අයුරු අපට දකින්නට ලැබිණ.

ඊළඟට අපි නිදන කාමරයට ගියෙමු. මියගිය සංගීතඥයාගේ මළසිරුර තිබුණේ යහන මතය. එය ඔහුගේ පොරෝනාවෙන්ම වසා දමා තිබිණි. හිස කොටස විවෘත වනසේ පොරෝනාව මදක් පහළට කළ හෝම්ස් ස්ටීවන්සන්ගේ මුහුණ පරීක්ෂා කර බැලුවේය. මම ද එතැනට ළංවීමි.

"ඔබට හොඳටම විශ්වාසද ඔහුගේ ශරීරයේ මොකුත් තුවාල නැහැ කියල?" හෝම්ස් ඇසුවේ ඒ අසලට පැමිණි ලෙස්ට්‍රේඩ්ගෙනි.

"ඔව් හෝම්ස් මහත්මයා." ලෙස්ට්‍රේඩ් කීය. "කිසිම ආකාරයක තුවාලයක් අපට නම් දකින්න ලැබුණේ නැහැ."

"නමුත් ඔබට පෙනෙනවාද ඇති ඔහුගේ බෙල්ල වටේටම තියෙන රතුපාට සිහින් ඉර. ඒකෙන් කියන්න පුළුවනි කිසියම් පටියක් වැනි දෙයකින් ඔහුගේ ගෙල හිරකර ඇති බව" හෝම්ස් කීය.

"ඔව්. ඔබහරි. මටත් හිතෙන්නේ, ඔහුගේ ගෙල හිරකර තියෙනවා" ලෙස්ට්‍රේඩ් එකඟවිය.

"බලන්න ඔහුගේ ඇස් දිහා" හෝම්ස් කීය. "රතු පැහැයට තියෙන සූක්ෂම ලෙස සිදුවුණු ලේ ගැලීම් ඔබට කාචයෙන් දැකගන්න පුළුවනි. මේවා රුධිර කේශ නාලිකා පුපුරායාමෙන් ඇතිවුණු ලේ ගැලීම."

ඊළඟට මගේ මිතුරාගේ අවධානය යොමුවූයේ නිදන කාමරය වෙතය. කාමරය සියුම් පරීක්ෂාවකට ලක් කළ ඔහු, අන්තිමට



www.sinhalaelibrary.com

නැවතුණේ ජනේලය ළඟයි. එය පිහිටියේ ඇඳට පිටිපසිනි. ජනේලයේ අගුළ තිබුණේ විවෘතවය.

"මේ අගුළ දැන් ඇරියද? නැත්නම් තිබුණෙ මේ විධියටමද?" හෝම්ස් ඇසුවේ ලෙස්ට්‍රේඩ් ගෙනි.

"නෑ නෑ අපි මොකුත් කළේ නෑ. අගුළ හැරදමා ඇති බව මමත් දුටුවා."

මීළඟට හෝම්ස් ජනේලය විවෘත කළේය. එතැන් සිට අපට දකිමට හැකිවූයේ පහළින් පිහිටි වීථියයි. පහළ වීථියේ සිට මේ කාමරයට ඇතුළුවිය හැකි පහසුම මාර්ගය ඉණිමගකින් බව මට එක්වරම පෙනී ගියේය. ලෝහිත පරීක්ෂණයේදී ද මේ ආකාරයෙන්ම ඉණිමගකින් හෝටල් කාමරයකට ඇතුළු වූ අපරාධකරුවෙක් නිදි ඇඳෙද්දීම වෙනත් කෙනෙක් ඝාතනය කර තිබූ අයුරු මට සිහිවිය.

අප කාමරයේ රැඳී සිටියදීම පහළට දිව ගිය හෝම්ස්, ජනේලය පහළින් වීථිය අසලබිම පරීක්ෂා කළේය. ඔහු සොයන්නට ඇත්තේ ඉණිමග සහ එයින් පොළොවේ ඇතිවූ ලාංඡනයයි.

මිනිත්තු කිහිපයකින් ආපසු පැමිණි මාගේ මිත්‍රයා මීළඟට ස්ටීවන්සන්ගේ බඩුබාහිරාදිය පරීක්ෂාකිරීමට පටන්ගත්තේය. අල්මාරි තුළ වූ දේ, තවමත් අලියට නොඇගෙන ඇඳුම් බෑග තුළ තිබූ දේ හා ලාච්චුවලට අසුරා තිබූ දේ හෝම්ස්ගේ අවධානයට ලක්විය. සංගීතඥයාගේ වාද්‍ය භාණ්ඩය හා ඒ සමග වූ අනෙක් සංගීත භාණ්ඩ හෝම්ස් පරීක්ෂා කර බැලීය.

"මේ අපරාධය මුදල් පැහැරගැනීමට ආව හොරෙකු විසින් කළ දෙයක් නොවෙයි කියල, මං කියන්නේ මෙන්න මේ නිසයි හෝම්ස් මහත්මයා."

ලෙස්ට්‍රේඩ් කීවේ හෝටල් කාමරයේ අමුත්තන්ගේ වටිනා දේ තැන්පත් කිරීමට තිබූ පෙට්ටිය විවෘත කර පෙන්වමිනි.

එහි ස්ටීවන්සන් මහතාගේ ටයි පටි දෙකක් සමඟ වටිනා ආභරණ රැසක් තිබිණි. පතරන් ඉතා වැඩිවූ ඝනකම් රත්රන් දම්වැල් කිහිපයක්, රත්රන් අතලෝසුවක්, දියමන්ති ඇල්වූ ටයි කටුවක්, රතුකැට හා ඉඳුනිල් මැණික් ඇල්වූ රත්රන් මුදු දෙකක් සහ පැහැති මැණික් වලින් ඔපවූ රත්රන් සිගරට් මංජුසාවක් සහ පවුම් දෙදහස් එකසියයක මුදලක් විය.





"එක්කෝ හොරා මිනීමැරුමෙන් පස්සේ මේ දේවල් ගැන බලන්නේ නැතුව පැනගිහින්. එහෙමත් නැත්නම් මිනීමැරුම කරලා තිබෙන්නේ පළිගැනීමේ චේතනාව ඇති කෙනෙක්. හොරෙක් නෙමෙයි" මම කීවෙමි.

"මට හිතෙනවා වොට්සන් ඔබේ දෙවැනි නිගමනය නිවැරදියි කියලා" හෝම්ස් කීය.

ස්ටීවන්සන්ගේ නිදන කාමරයේ ඇතුළු කෙළවරින් තවත් වසා තිබූ දොරක් දකින්නට ලැබිණි. එතැනින් හෙන්රි ස්මිත්ගේ කාමරයට යා හැකි බව පැවසූ ලෙස්ට්‍රේඩ් අප එහි කැඳවාගෙන ගියේය.

"හෙන්රි ස්මිත් මහත්මයාත් හරි කම්පනයකට පත්වෙලයි ඉන්නෙ" ලෙස්ට්‍රේඩ් කීය. "ඔහු පහළ භෝජනාගාරයේ, හෝටලයේ කළමනාකරු එක්ක පොලිසියට කටඋත්තර දෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ අම්ප මිතුරන් හැටියට සංගීත ප්‍රසංග පවත්වලා තිබෙනවලු. ඒ නිසා ඔහු කම්පනයට පත්වීමේ පුදුමයක් නෑ."

හෙන්රි ස්මිත්ගේ සංගීත භාණ්ඩ ඔහුගේ ඇඳුම් පැළඳුම් සහ කාමරයේ වූ අනෙක් ද්‍රව්‍ය වෙත ද හෝම්ස් අවධානය යොමු කළේය. අවසානයේ ඔහුගේ මුහුණේ තිබුණේ එතරම් සතුටුදායක පෙනුමක් නොවේ.

"මා හිතූ තරම් හෝඩුවාවන් සොයා ගන්න බැරිවුණා ලෙස්ට්‍රේඩ්" හෝම්ස් කීය. "කමක් නෑ. දැන් අපි යමුද පහළ තට්ටුවට. මං කැමැතියි හෙන්රි ස්මිත් මහත්මයා සහ හෝටලයේ කළමනාකරු සමග කථාකරන්න."

ඔවුන් දෙදෙනා භෝජන්ශාලාවේ කෙළවර වාඩිවී බලාසිටියේ අප එනතුරු යයි මට සිතිණි. පොලිසියට කට උත්තරදීම මේ වනවිට අවසන්වී තිබිණි. හෝටලයේ කළමනාකරු වූ ජෙෆ්රි ඩන්කන් අධික වශයෙන් දුම්පානය කරන්නෙකු බව මම නිරීක්ෂණය කළෙමි. ඔහු අසල වූ අළු බඳුනෙන් සිගරට් කොට රාශියක් විය. ලෙස්ට්‍රේඩ් විසින් ඔහු අපට හඳුන්වා දෙද්දී තම දකුණු අතේ වූ සිගරට්ටුව වම් අතටගෙන ඔහු අතට අතදී ආචාර කළේය. කිසිවිටෙකත් සිනාමුසු මුහුණකින් නොසිටි හෙන්රි ස්මිත්ගේ මුහුණේ තිබුණේ ඔහුට සුපුරුදු දුක්මුසු බැල්ම මය.

www.sinhalaelibrary.com

"ස්මිත් මහත්මයා, ඔබ ඉන්නේ ස්ටීවන්සන් මහත්මයාගේ කාමරයට යාබද කාමරයේ නේද?" හෝම්ස් ඇසීය. "ඔහුගේ කාමරය පැත්තෙන් ඊයේ රාත්‍රි මොනවත් සැක කටයුතු ශබ්දයක් ඇහුණේ නැද්ද?"

"කිසිම ශබ්දයක් ඇහුණේ නැහැ මහත්මයා" ස්මිත් කීය. "සාමාන්‍යයෙන් මට බොහොම තදින් නින්ද යනවා. ඒ නිසා වෙන්නත් පුළුවනි කිසිවක් නොඇසුණේ."

"ඔබ ඔහුව අන්තිම වරට දුටුවේ කොයි වෙලාවෙද?"

"අපි දෙන්නා සාමාන්‍යයෙන් ආහාර ගන්නේ එකට. ඒ සඳහා ආහාර ගෙනැත් තබන්නේ විසිත්ත කාමරයේ මේසය උඩ. කෑම කාලා අවසන් වෙලා මම මගේ කාමරයට ආවා. එතකොට වෙලාව රාත්‍රි දහයමාර විතර වෙන්න ඇති."

"ඔහු හෝටලයේ සේවකයෙකු සමඟ ප්‍රශ්නයක් ඇතිකරගත් බව අපට අහන්න ලැබුණා. ඒ මොකක්ද?"

"ස්ටීවන්සන් මහත්මයාට සුළු දේට පවා හරියට කේන්ති යනවා." හෙන්රි ස්මිත් පැවසුවේය. "රාත්‍රි කෑම ඇණවුම ලියාගන්න පැමිණි හෝටල් සේවකයාට, ස්ටීවන්සන් මහත්මයා අපට උවමනා කරන කෑම වර්ග පැහැදිලිවම කිව්වා. ඒවා ඇඟ පිළිවෙළට සුදානම් කළ යුතු බවත්, රාත්‍රි 8.30 ට කෑම ගෙන ආ යුතු බවත්, ඔහු අවධාරණය කළා. නියමිත වෙලාවට කෑම ලැබුණා. නමුත් සේවකයා ගෙනැවිත් තිබුණේ ඇණවුම් කළ ඒවා නොවෙයි. වෙනස් කෑම."

"මෙවැනි දෙයක් අහන්නත් පුදුමයි" හෝම්ස් කීය.

"ලබාදිය යුතු කෑම ගැන සටහන් කරගත් සේවකයාගේ නොසැලකිලිමත් කම නිසයි මේ ප්‍රශ්නය ඇතිවුණේ" කළමනාකරු කීය. "ඔහු කාමර අංක පටලවාගෙන. ප්‍රංශ කෑම වේල ගෙනිහින් තිබුණේ හෝටලයේ අනිත් පැත්තේ කාමරයක ලැඟුම් ගත් ස්විස් ජාතික තරුණ යුවළකට. ඔවුන් හිතලා තියෙන්නේ මෙය හෝටලයේ අමුත්තන් පුදුමයට පත් කිරීමට කරන විශේෂ වැඩ පිළිවෙළක් බවයි. ඔවුන් බොහොම සතුටින් ඒ කෑම වේල වහාම භුක්ති විඳලා තියෙනවා. ස්ටීවන්සන් මහතා වෙත රැගෙන ගොස් තිබෙන්නේ ස්විස් යුවළ ඉල්ලූ මිලෙන් අඩු ඉතාලි කෑමවේල. අපට තව පැය භාගයක් දෙන්නේ නම් ස්ටීවන්සන් මහතාගේ කෑම සුදානම්





කර දෙන්න තිබුණා. අධික බඩගින්නෙන් සිටි නිසාදෝ ඔහු ඒකට කැමැති වෙලා නැහැ."

"ඩන්කන් මහත්මයා මේ විස්තර දැනගත්තේ කාගෙන්ද?" හෝම්ස් ඇසීය.

"මං දැනගත්තේ මේ ආරවුලට පැටලුණු කාල් ග්‍රීන් නම් අපේ සේවකයාගෙන්." කළමනාකරු කීය. "ඔහු අලුතෙන් සේවයට බැඳුණු කෙනෙක්. ඔහු වැඩට දක්ෂයි. කිසි කම්මැලිකමක් නැහැ. එකම වැරැද්ද සුළු දෙයින් පවා කෝප වෙන එක. මීට පෙරත් ග්‍රීන්ට විරුද්ධව අපට අමුත්තන්ගෙන් පැමිණිලි ලැබිලා තියෙනවා. ඒ වෙලාවලදී මං ඔහුට තදින් අවවාද කළා: 'මේ සැරේ නම් ඔහුට රැකියාව අත්හැර ගෙදර යන්න වෙනවා.'"

"වෙන කොහෙවත් යන්න සිදුනොවුණොත්?" ලෙස්ට්‍රේඩ් කීවේ උපහාසාත්මක ලෙස සිනාසෙමිනි.

"ඒ වෙලාවේ ඔය සිදුවීම වුණු ආකාරය අපට විස්තර ඇතිව කියන්න ස්මිත් මහත්මයා" හෝම්ස් ඉල්ලා සිටියේය.

"දීර්ඝ කාලයක් ප්‍රංශයේ වාසය කිරීම නිසා ස්ටීවන්සන් මහත්මයා වයින් පානය බොහොම ප්‍රිය කළා." ස්මිත් කථාව ඇරඹුවේය. "ඔහු ඒකට හුඟක් ඇබ්බැහි වී හිටියා කිව්වොත් වඩාත් නිවැරදියි. ඊයේ රාත්‍රිත් වෙනදා වගේ පැයක් පමණ කාලයක් ඔහු වයින් බොමින් බොහොම සතුටෙන් හිටියේ. පුරුදු වෙලාවට අපි කෑම කන්න වාඩිවෙලා, ඒවා වසා තිබූ ආවරණ ඉවත් කළාමයි දුටුවේ, ගෙනැවිත් තිබෙන්නේ ඇණවුම් කළ ආහාර නොවෙන බව."

"ඉතින්?"

"ස්ටීවන්සන් මහත්මයා දැඩි ලෙස කෝපයට පත්වුණා. ඔහු වහාම සීනුව නාදකොට සේවකයා කැඳෙව්වා. ස්ටීවන්සන් මහත්මයා සේවකයාට දිගින් දිගටම බැණ වැදුණා. සිදුවූ වරද ගැන සමාව ඉල්ලූ සේවකයා කිව්වා, තව පැය භාගයකින් ඉල්ලූ කෑම ගෙන ආ හැකි බව."

"ඒකට මොකක්ද ස්ටීවන්සන් මහත්මයා කිව්වේ?"

"එයින් ඔහු තවත් කෝපයට පත්වුණා." ස්මිත් කීය. "ඔහු සේවකයාට දරුණු විදියට දොස් පැවරුවා. ඒ වෙලාවේ සේවකයාට කේන්ති ගිහින්, ඔහුගේ කටින් කුමක් හෝ නපුරු වචනයක් පිටවුණා."

"මොකක්ද ඒ වචනය?"

"මං ඊට ටික වෙලාවකට කලින් ආහාර නොගෙන මේසයෙන් නැගිට ගියා. ඒ නිසා සේවකයා කිව්ව දේ මට හරියට ඇහුණේ නැහැ. කොහොමවුණත් ඒ වහාම ස්ටීවන්සන් මහත්මයා කෝපාවිෂ්ඨ වෙලා, සේවකයාගේ කමිස කරෙන් අල්ලාගෙන ළඟට ඇදලා අරගෙන, සේවකයාට පහරදෙන්න පටන්ගත්තා. එවිට මං මැදිහත්වෙලා ඔහුව බේරා යැව්වා. මං නොහිටින්න ඔහුට සෑහෙන්න පාර වදිනවා."

"ඊට පස්සේ මොකද වුණේ?"

"සේවකයා කාමරයෙන් එළියට ගියේ ස්ටීවන්සන්ට ශාප කරමින්, තර්ජනය කරමින්. ඔහු කිව්වා "මට කළ මේ හිරිහැරේට තමුසෙට වන්දිගෙවන්න වෙයි" කියලා. ඊට පසු ඔහු යන්න ගියා. වෙනත් සේවකයෙක් ඇවිත් වහාම ඒ කෑම බඳුන් ඉවත් කරගෙන ගියා. මිනිත්තු විස්සකින් විතර ඇණවුම් කළ කෑම අපට ලැබුණා."

තමාගේ සාක්ෂිය අවසන් කළ හෙන්රි ස්මිත්, කබා සාක්කුවෙන් සිගරට්ටුවක් ගෙන එය දල්වා ගත්තේ, ඔහු මුහුණදී ඇති කම්පනයෙන් මිදීමට විය යුතුය.

"මේ ඛේදජනක සිදුවීම නිසා තමුන් ඉතින් බර්මිංහැම්හි හෙට පැවැත්වීමට නියමිත සංගීත ප්‍රසංගය අවලංගු වේවි. එහෙම නේද? ස්මිත් මහත්මයා?" හෝම්ස් ඇසීය.

"හෙට බර්මිංහැම්හි ප්‍රසංගයේ ටිකට්පත් සියල්ල කල්තබාම විකිණී අවසන් වුණු බව අපට ඊයේ දැනගන්න ලැබුණා" ස්මිත් කීය. "ස්ටීවන්සන් මහත්මයා නැතිව මං තනියෙන් මොනවා කරන්නද? සංගීතලෝලීන් එන්නේ ඔහුගේ සංගීතවාදනයට සවන්දෙන්නයි. සංගීත ප්‍රසංගයක් පවත්වන්න තරම් මානසික තත්ත්වයක නෙමෙයි මහත්මයා මම ඉන්නේ."

"ඒ සංවිධායකයන් ලොකු අමාරුවක වැටිල ඇති?" මම කීවෙමි.

"ඔව්. ඔබේ කීම හරි" ස්මිත් කීය. "බර්මිංහැම් වල ප්‍රසංගය සඳහා ගෙවිය යුතු මුදලෙන් භාගයක් ඔවුන් ස්ටීවන්සන් මහත්මයාට ගෙවලායි තියෙන්නේ. මං ඔවුනට විදුලිපුවතක් යැව්වා, මං කළ යුත්තේ මොකක්ද කියල දන්වන්න කියලා. මං හිතන්නේ ඔවුන් කියාවි මට ඇවිත් මට හැකිනම් තනියම සංගීත ප්‍රසංගය ඉදිරිපත් කරන්න කියලා. ඉතින් මං හිතාගෙන ඉන්නේ හෙට උදේ





බර්මිංහැම් බලා යන්නයි. ප්‍රසංගය පැවැත්වුණොත් හෙට රාත්‍රි එහේ නවතිනවා. අනිද්දා උදේ මෙහේ ඇවිත් දින දෙක තුනකින් ප්‍රංශය බලා යනවා."

"ඔබ හිතන්නේ බර්මිංහැම් වල ප්‍රසංගයට ඔබට අනිවාර්යයෙන්ම වාදනයක් ඉදිරිපත් කරන්න වේවි කියලද?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා" ස්මිත් පිළිතුරු දුන්නේය. "මීට කලිනුත් මේ වගේ, නමුත් මේ තරම් බරපතළ නැති ප්‍රශ්නයකට අපි මුහුණදුන්නා. අවුරුද්දකට කලින් අපි ප්‍රාග් නුවර සංගීත ප්‍රසංගයක් පවත්වලා ඊළඟට යන්න නියමිතව තිබුණේ හංගේරියාවේ බුඩාපෙස්ට් නුවරට. නමුත් ස්ටීවන්සන් මහත්මයා ප්‍රාග්හිදී බරපතල ලෙස රෝගාතුර වුණා. ඔහුට නැවත රෝහලකට ඇතුළත් කරන්න සිදුවුණා. බුඩාපෙස්ට්හි ප්‍රසංගය කල් දමන්න කියා අපි සංවිධායකයන්ගෙන් ඉල්ලුවා. නමුත් ඔවුන් කිව්වේ වාදක මණ්ඩලය සමග මට ඇවිත් කොහොමහරි ආකාරයක හෝ සංගීත ප්‍රසංගයක් ඉදිරිපත් කරන්න කියලයි."

"ඔව් ඒකත් ඇත්ත" හෝම්ස් එයට එකඟවිය. "නැත්නම් සංවිධායකයන්ට මහජනයාගෙන් ලාභයක් ලැබෙන්නේ නැහැ. නමුත් මෙහැන තත්ත්වය ඊට වෙනස්."

හෝම්ස් නිශ්ශබ්දව මිනිත්තු කිහිපයක් කල්පනා කළේය. මීළඟට ඔහුගේ ප්‍රශ්න එල්ල වූයේ කළමනාකරු වෙතය.

"ඩන්කන් මහත්මයා, රාත්‍රියට හෝටලයට ඇතුළුවෙන අය ගැන සොඳිසියෙන් සිටීමට මෙහි ආරක්ෂක නිලධරයෙක් ඇති කියල මං විශ්වාස කරනවා?"

"ඔව් මහත්මයා. ඊයේ රාත්‍රිත් ඔහු සේවයේ යෙදී හිටියා."

"රාත්‍රිය පුරා හෝටලයට ඇතුළුවුණු හා පිටවී ගිය පුද්ගලයන් ගැන ඔබ ඔහුගෙන් විමසා බැලුවද?"

"ඔව් මහත්මයා. රෑ 11ට විතර හෝටලයේ නැවතී සිටි අමුත්තෙක් එළියට ගොස්, හෝටලයට ආපසු ඇවිත් තියෙනවා. එපමණයි කළමනාකරු පිළිතුරු දුන්නේය."

"කොහොමවුණත් අපරාධයක් කරන්න බලාපොරොත්තු වන කෙනෙක් ආරක්ෂක නිලධරයාට පෙනී පෙනී ප්‍රධාන දොරටුවෙන් හෝටලයට ඇතුළු වේවි කියල හිතන්න අමාරුයි." හෝම්ස් කීය.



www.sinhalaelibrary.com

"ඒ වගේම ඔහු බිංගෙලා යද්දීත් කිසිවෙකුට නොපෙනී පිටවෙන්න, පරෙස්සම් වෙව්."

හෝම්ස් ඒ ආරක්ෂක නිලධරයා ද කැඳවා විමසා බැලූ නමුත් සතුටුදායක කිසිවක් දැනගැනීමට හැකිවූයේ නැත.

"ඩන්කන් මහත්මයා" හෝම්ස් කළමනාකරු ඇමතුවේය. "මට අවසන් වශයෙන් ඔබෙන් දැනගත යුතු තවත් කරුණක් දෙකක් තියෙනවා.

හෝටලයේ සේවකයා උදේ තේ අරගෙන ගොස් ස්ටීවන්සන් මහත්මයාගේ දොරට තට්ටු කළේ උදේ කීයටද?"

"උදේ හයට."

"ඇයි එපමණ උදේ පාන්දරින් ඒ මහත්මයා අවදිකරන්නේ?"

"ඒ ස්ටීවන්සන් මහත්මයාගේ ඉල්ලීම අනුව" කළමනාකරු කීය. "තේ පානය කළ විගසම ඔහු වයලීන වාදනය පුහුණු වෙන්න පටන්ගන්නවා. මං හිතන්නේ හෙන්රි ස්මිත් මහත්මයාත් ඒ වෙලාවෙම ඔහුට එකතුවෙනවා?"

"ඒ වෙලාවෙම නෙමෙයි" ස්මිත් කීය. "මං ඔහුට එකතුවෙන්නේ හතයි හතලිස්පහට පමණ."

"හොඳයි. තවත් එක කරුණක් තියෙනවා" හෝම්ස් කීය. "ස්ටීවන්සන් මහත්මයාගේ කාමරයේ එක් ජනේලයක අගුළ හැරිලා තිබුණා. නමුත් මෙතැනට හෝටලයෙන් එළියේ සිට ළඟාවෙනවා නම් අඩි දොළහක් පහළොවක් පමණ දිග ඉණිමඟක් අවශ්‍යයි. මං ඒ අවට සොයා බැලුවා. ඉණිමඟක් මට පෙනෙන්න නම් තිබුණේ නැහැ. අලුත්වැඩියා කටයුතු සඳහා ගෙනා ඉණිමඟක් එළියේ කොහේ හරි තබා තියෙනවද?"

"නැහැ මහත්මයා." කළමනාකරු කීය. "අපේ තීන්ත ගෑමේ කටයුතු කළ සමාගමෙන් ඉණිමං එතන ඇවිත් ඔවුන් ඒවා ආපසු ගෙනගියා."

"මේ අවට යාර සියයක් පමණ ඇතුළත මොනයම් ගොඩනැගිල්ලක් හෝ අලුත්වැඩියා කරන තැනක් තිබෙනවාද?"

"අලුතෙන් ගෙයක් හදන තැනක් මේ කිට්ටුව නම් තියෙනවා. මේ දිනවල ඔවුන් එහි වහල සාදනවා."

"ඔවුන් සතු ඉණිමං ඇති?"

"අපොයි ඔව්."





"ඒ කොතරම් දුරකද?"

"යාර පනහක් වත් නැති තරම්."

"හොඳයි. ඔබ දෙදෙනාටම ස්තුතියි" හෝම්ස් කීවේ ජෝන් ඩන්කන් හා හෙන්රි ස්මිත් දෙදෙනාගෙන්ම සමුගනිමිනි.

හෝම්ස් සහ මා හෝටලය ඉදිරිපස වූ උද්‍යානය වෙත එද්දී ලෙස්ට්‍රේඩ් ද අප සමග පැමිණියේය.

"හෝම්ස් මහත්මයා ඔබ මොකද කියන්නෙ?" ලෙස්ට්‍රේඩ් ඇසුවේ අප උද්‍යානය වෙත පැමිණ බංකුවක අසුන්ගත් පසුවය. "මට නම් හිතෙන්නේ මේක අර කාල් ග්‍රීන් නම් සේවකයාගෙ වැඩක්. අපට ඔහු අල්ලාගන්න පුළුවන් වුණොත් ප්‍රශ්නය එතැනින්ම විසඳේවි. ඔබ හිතන්නේ මේ අපරාධයට වග කිවයුත්තා ඔහු නොවෙයි කියලද?"

"කුමක් හෝ නිගමනයකට එන්න තරම් සාක්ෂි මට තවමත් ලැබිල නැහැ ලෙස්ට්‍රේඩ්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ග්‍රීන්ට විරුද්ධව තිබෙන සාක්ෂිය එකම එකක්. ඒ, ඔහු සංගීතඥයා සමග රණ්ඩුවුණු නිසා, ඔහුට තර්ජනය කළ නිසා නමුත් නමුත්....."

තමා කීමට අදහස් කළ දේ නොකියා මගේ මිතුරා කල්පනා කිරීමට පටන්ගත්තේය. ඔහුගෙන් පිළිතුරක් ලැබේවි යයි අපි මිනිත්තු කිහිපයක් බලා සිටියෙමු. එහෙත් ඔහුගෙන් කිසිවක් නොකියැවිණි. අන්තිමේදී ලෙස්ට්‍රේඩ් කථාව ඇරඹුවේය.

"හෝම්ස් මහත්මයා. මං හෝටලයේ සේවකයන් කිහිපදෙනෙකුගෙන්ම ප්‍රශ්න කළා. කාල් ග්‍රීන් කියන්නේ වේල්ස් පළාතේ මිනිහෙක්. ඔවුන් ඉක්මනින් කෝපයට පත්වෙන බොහොම දරුණු මිනිස්සු බව, ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැනේ. ඔහු මේ හෝටලයේ සේවයට බැඳිලා මාස හතරකට වඩා නැහැලු. මේ ටිකට හෝටලයේ සේවකයෙකුට, අරක්කැමියෙකුට සහ ඇඟවකරන්න රියැදුරෙකුට පහරදීල තියෙනවා. මීට කලිනුත් අමුත්තන් සමග කලකෝලාහල කරගෙන තියෙනවා. ග්‍රීන්ගෙන් පහර කෑ අරක්කැමියා සමග මම කථාකළා. ඔහු නම් කියන්නේ ග්‍රීන් බන්ධනාගාරයේ ඉඳල පැන ආව මැරවරයෙක් බවට ඔහුට සැකයක් නැහැලු. කවුද දන්නෙ හෝම්ස් මහත්මයා. ඔහු සමහරවිට මිනීමරල හිරේ ගිය එකෙක්ද අපි දන්නෙ නෑ."

"හොඳයි ලෙස්ට්‍රේඩ්. ඔබ කැමැති විධියට මේ පරීක්ෂණය ඔබ කරගෙන යන්න. මම කරන්නම් මගේ පිළිවෙළට. ලැබෙන අලුත්

www.sinhalaelibrary.com

හෝඩුවාවන් ගැන අපි එකට කතාබහ කරමු. මේ ගැටලුව මං විසඳුවත් ඒකෙ ගෞරවය ලැබෙන්නේ ඔබටයි."

අප බේකර් වීථියේ අපේ නිවහන වෙත එන අතර මගේ මිත්‍රයා සිටියේ සම්පූර්ණ නිහඬතාවයකය. ප්‍රශ්න ඇසීමෙන් ඔහුගේ සිතුවිලි දාමය බිඳී යා හැකි නිසා, මම නිහඬතාවය රැක්කෙමි. හෝම්ස්ගේ මුවේ තිබූ පයිප්පය නිවී ගොස්ය. විටෙක හිස කසමින්, විටෙක තමාටම මුමුණා ගනිමින් ඔහු කල්පනාවේ වෙළී සිටියේය.

මුළු හවස්වරුවමත් හෝම්ස් හාන්සි පුටුවට වී කල්පනා කරමින් සිටියේය. ඉතා සැර දුම්කොළ මෙදූ පයිප්පය උරමින් ඔහු සිටි ඉරියව්ව මට ඉතා හුරුපුරුදු දසුනකි. සිත් ඇදගන්නා ගැටලුවක් ලැබුණු විට මේ අයුරින් සිටීම ඔහුගේ චාරිත්‍රයක් බව මම දැන සිටියෙමි. සවස හයයි තිහට පමණ කිසිවෙකු වේගයෙන් තරප්පු පෙළ නැග එන හඬක් අපට අසන්නට ලැබිණි. මගේ මිත්‍රයා වහා ගොස් දොර විවෘත කළේය.

විසිත්ත කාමරයට ඇතුළුවූයේ වයස අවුරුදු දොළහක් පමණ වූ අපිරිසිදු කොලුවෙකි. දුර්වර්ණ වූ ඉරී ගිය ඇඳුම් වලින් සැරසී සිටි ඔහු, හෝම්ස්ගේ බේකර් වීථියේ අවිධිමත් රහස්පරීක්ෂක කණ්ඩායමේ නායකයා බව මම හඳුනාගතිමි.

"වැඩේ හරිද විගින්ස්?"

"ඔව් මහත්මයා" ඔහු කීය. "ඔබතුමා කිව් මිනිහයි තවත් අඳුන්නෙහුයි කැෆේ රෝයල් අවන්හලට යනවා අපි බලාගෙන හිටියා."

"හැබෑට? ඔවුන් තවමත් එහෙද?"

"නැහැ මහත්මයා. ඔවුන් එතැනිනුත් යන්න ගියා. ඔවුන් පිටවී යන වෙලාවෙ මම දොරටුව ළඟට වෙලා කන්දීගෙන හිටියා. මට ඇහුණා අර රැවුල තියෙන මිනිහ කියනවා, හෙටත් ඒ වෙලාවට එතැනදීම හමුවෙමු කියලා."

"හොඳයි විගින්ස්" හෝම්ස් කීය. "ඔබට දැනට කරන්න පුළුවන් එපමණයි. හෙටත් ඒ වෙලාවට එතැනට ගිහින් පුළුවන් තරම් විස්තර දැනගන්න. ඊළඟට අර රැවුල්කාරයා පිටිපස්සේ ගිහින් ඔහු නැවතී ඉන්නේ කොහේද කියලත් හොයාගන්න. ඔහු කුලීරියකින් ගමන් කළොත් නම් ඔබට ඔහු පසුපස යන්න ක්‍රමයක් නෑ. මෙන්න ඔබේ ගාස්තුව" හෝම්ස් සිලිමේ කාසි කිහිපයක් කොලුවා අත තැබුවේය. ඔහු එය රැගෙන හෝම්ස්ට ආචාර කොට පිටවී ගියේය.





"ඊයේ සංගීත ප්‍රසංගයට ශාලාවට ඇතුළුවෙන්න බලාගෙන ඉන්න කොට, සෙබස්ටියන් මොරාන් අපිව දැක්කා." හෝම්ස් කීවේ පයිප්පයේ කෝවේ තිබූ අළු උදුනට හලමිනි. "මාව හඳුනාගත් බවක් ඔහු පෙන්නුවේ නෑ. කොහොම වුණත් සංගීතඥයාගේ මරණය ගැන මං ඔහු සැක කරන බව, මොරාන් දැනටම තේරුම් අරගෙන ඇති. ඒ නිසා මං තීරණය කළා ඔහු පිටිපස්සේ යන වැඩේට මම නොයන්න. විගින්ස් ඇතුළු හිඟන අයයි ඒ වැඩේ සාර්ථකව කරලා තියෙනවා."

"එහෙනම් හෙට මොරාන් අවන්හලට ආවම, අපට පුළුවන් පොලීසිය යොදවලා ඔහුව අත්අඩංගුවට ගන්න" මම කීවෙමි.

"ඔහු නම් අත්අඩංගුවට ගතයුතු අපරාධකාරයෙක් තමා" හෝම්ස් කීය. "නමුත් මේ වෙලාවෙ ඒක කළොත් අපට අවාසියි. එක් අතකින් සංගීතඥයාගේ මරණය ගැන මොරාන්ට විරුද්ධව සාක්ෂි කිසිවක් අපට නෑ. අනෙක් අතට ඔහු විතරක් අල්ලා ගත්තොත්, ඔහු සමග ගැවසෙන මේකට සම්බන්ධ අනෙක් අය පැන යනවා. යුරෝපීය ත්‍රස්තවාදී සංවිධානයකට සම්බන්ධ, උන්ගෙ නියෝජිතයො මෙහේ ඉන්නවා නම්, අපි උන් එකෙක් නැර අල්ලා ගන්න ඕන. තවදුරටත් විමසිල්ලෙන් ඉඳීම මිසක්, තවමත් අපට ගතහැකි ඉදිරි පියවරක් නෑ."

පසුවදා උදේ සියලුම පුවත්පත් එකතුකරගත් හෝම්ස්, ඒවායේ අවශ්‍ය තොරතුරු ඉක්මනින් කියවා අවසන් කළේය. අනතුරුව තේ පානය නිමකොට හැඳ පැළඳගෙන ගෙදරින් පිටත් වී ගියේය.

මම සෝපාවේ වැතිරී පුවත්පත් පෙරළා බැලුවෙමි. සෑම පුවත්පතකම ප්‍රධාන ප්‍රවෘත්තිය වී තිබුණේ සංගීතඥයාගේ මරණයයි. එය හුස්ම හිරකිරීමෙන් කළ මිනීමැරුමක් බව පොලිස් ශල්‍ය වෛද්‍යවරයා විසින් නිගමනය කොට තිබිණි.

දහවල් ආහාරයට ද නොපැමිණි මගේ මිත්‍රයා ආපසු එද්දී සවස පහ පමණවිය. ඔහුට දවස කාර්ය බහුල එකක් වී තිබූ බැව් මා තේරුම්ගත්තේ ඔහුගේ විඩාපත් මුහුණෙනි. මගේ මිත්‍රයා බලාපොරොත්තුව සිටියේ විගින්ස්ගේ පැමිණීමය. එහෙත් විගින්ස් බේකර් වීථියට පැමිණෙද්දී අප බලාපොරොත්තු වූවාට වඩා බොහෝ සෙයින් ප්‍රමාද වී තිබිණි. ඔහුගේ මුහුණේ තිබුණේ භීතියට පත් ලකුණු බව මම දුටුවෙමි.



www.sinhalaelibrary.com

"මහත්මයා, මාව උස්සා අහුවුණා!"

"මොනවා? ඒ කොහොමද?" හෝම්ස් ඇසුවේ මවිතයට පත්වය.

"උන් තුන්දෙනාට ටික දුරක් යන්න ඇරලා, මං පිටිපස්සෙන් ගියා. ඒ ගමන උන් ලොකු ගෙවල් දෙකක් අතරින් තියෙන අඳුරු පාරකට හැරුණා. මමත් ඒ පාරට හැරුණා. එතකොටයි මං දුටුවේ, උන් වැඩිදුර ගිහින් නැහැ. එතැනම හැංගිලා ඉඳලා. මං ආපහු හැරිලා දුවන්න ගත්තා. ඒත් රැවුල්කාරයා එකපාරටම පැනලා මාව අල්ලාගත්තා.

ඌ මාව හයකරල ඇහුවා, ඇයි හැමදාම අපි පස්සේ එන්නේ කියලා. මං කිසිදෙයක් කිව්වේ නැහැ. අන්තිමට උන් මගේ අතින් අල්ලා අඹරමින් මට බය දෙන්න පටන්ගත්තා. මට වේදනාව ඉවසන්න බැරිවුණා මහත්මයා. බැරිම තැන මං කිව්වා මට එන්න කිව්වේ සර්ලොක් හෝම්ස් මහත්මයා කියලා. එතකොට අර රැවුල්කාරයා එක සැරේම හිනාවුණා. ඊට පස්සේ ඌ මගේ අත අත්හැරලා, කඩදාසියක මොනවද ලියලා දුන්නා, හෝම්ස් මහත්තයාට දෙන්න කියලා. මෙතන තියාගන්න කිව්වා. මීට පස්සේ ඌව පසුපස ආවොත් මාව ඉතුරු කරන්නේ නෑ කිව්වා." විගින්ස් පැවසුවේ බියැදි දෙනෙතිනි.

"මට කණගාටුයි, විගින්ස්, ඔබ මා වෙනුවෙන් කටයුතු කරලා, කරදරයේ වැටීම ගැන" හෝම්ස් කීවේ සිලිමේ කාසි කිහිපයක් ඔහු අත තබමිනි. "භයවෙන්න එපා. ඒ මිනිහ ඔබ හොයාගෙන එන්නේ නැහැ."

කොළුවා පිටත්වී ගිය පසු මගේ මිතුරා ඒ කඩදාසි කැබැල්ල දිගහැරියේය.

"හිතන්න එපා මම මිනීමැරුම්වලට සම්බන්ධයි කියලා. මේ සැරේ ඔබ්බට වැරදිලා. මාව අල්ලාගන්න තැනැත්තාට වැඩක් නෑ.

සෙබස්ටියන් මොරාන්"

"මිනිහ ලියල තියෙන්නේ බොහොම අහිංසකයෙක් විදියට" මම කීවෙමි.

"මේ මිනීමැරුම් ගැන නම් මොරාන් අහිංසකයෙක් වොට්සන්."

"මොනවා?"

"ඔව් වොට්සන්." හෝම්ස් කීය. "මං මේ තරම් දවසක් වෙහෙස මහන්සි වුණේ, මොරාන් මේ අපරාධයට සම්බන්ධද නැද්ද කියන එක නිගමනය කරන්නයි. ලැබී ඇති දත්ත වලින් පැහැදිලි වෙනවා,





මේ මිනීමැරුමට ඔහුගේ සම්බන්ධයක් නැති බව. මිනිහා මෙවර අරඅඳින්නේ වෙනත් වැඩකට. අපට ඒක ළඟදීම දැනගන්න ලැබේවි."

ඇඳිරි වැටෙද්දී හෝම්ස් යළිත් වරක් නිවසින් පිටවී ගියේය. ඔහු ගියේ කොහේද කුමක් සඳහාද යන්න මට පැවසුවේ නැත. ඒ පිළිබඳව විමසීමට ද මම නොසිතුවෙමි. මගේ මිතුරා එනතුරු රාත්‍රී දහයමාර පමණ වනතුරු මම බලාසිටියෙමි. ඔහු නොපැමිණි බැවින් මම නින්දට යෑමට තීරණය කළෙමි.

පසුවදා උදේ මා අවදිවෙද්දී හෝම්ස් නාලා පැළඳගෙන උදේ ආහාරය ද ගෙන අවසන්ය. එදා සම්පූර්ණ උදේ වරුවත් දහවල් කාලයෙන් අඩක් පමණත් ඔහු කළේ තම ස්ට්‍රැඩිවේරියස් වයලීනය අතට ගෙන දිගින් දිගටම වාදනය කිරීමයි. ඔහු නැවත නැවතත් වාදනය කළේ, එදා ජෝන් ස්ටීවන්සන් සංගීත ප්‍රසංගය ආරම්භ කළ හා අවසන් කළ වාද්‍ය ඛණ්ඩ දෙක බව මම තේරුම් ගතිමි. තමාට දුෂ්කර වූ තැන් නිවැරදි කර ගනිමින්, ඔහු ඒ තේමා වාදනය ප්‍රගුණ කොට, ඒවා ඉතා සාර්ථක ලෙස අනුකරණය කරමින් සිටියේය. හෙන්රි ස්මිත්ගේ සහාය ද ඔහුට ලැබුණා නම් ස්ටීවන්සන් තරමට සාර්ථක වාදනයක් පැවැත්වීමට තරම් හෝම්ස්ට නිපුණත්වයක් ලැබී ඇතැයි මට සිතිණි.

හාන්සි පුටුවට වී පයිප්පය බොමින් කල්පනා කිරීමටත්, සංගීත වාදනයටත් සිත යොමුවීම මිස, එදා හැන්දෑවේ හෝම්ස් නිවසෙන් බැහැර යන බවක් නොපෙනිණ. සවස් වරුවේ තිබුණේ සොඳුරු කාලගුණයකි. කිසිදු වැහිවලාකුළක් හෝ මීදුමක් නොතිබුණු නිසා සැන්දෑ හිරුගේ රන්වන් කිරණින්, මුළු ලන්ඩන් නගරයම ආලෝකමත් විය. තරුණ තරුණියන් යුවළයන් නොව වැඩිහිටියෝ ද සතුටෙන් ඔබ මොබ සක්මන් කරමින් සිටියහ. දින කිහිපයක් කාමරය තුළටම වී කාලය ගතකළ නිසා, උද්‍යානය වෙත ගොස් ඇවිද ඒමට මට සිතිණි. සංගීත විනෝදයකට සූදානම් වන්නෙකු මෙන් හෝම්ස් නම් නිදන කාමරය තුළට වී නොනවත්වාම වාදනයේ යෙදෙමින් සිටියි. ඔහුට බාධාකරන්නේ කුමටද? මම හැඳපැළඳගෙන තනිවම නිවසෙන් පිටවූයෙමි.

රීජන්ට් උද්‍යානය වෙත ඇවිද ගොස් මම එහි පැය භාගයක් පමණ සක්මන් කළෙමි. මිළඟට මා ගියේ වින්ඩ්සර් කලා භවන



www.sinhalaelibrary.com

වෙනය. එහි පැවැත්වෙන ඉතාලි සායම් සිතුවම් ප්‍රදර්ශනය ගැන මම වෙලිමෙල් පුවත්පතෙන් කියෙව්වෙමි. වයලීන වාදනයෙන් හෝම්ස්ගේ සිතට සැනසීමක් ලබාගත හැකි අයුරෙන්, සිතුවම් නරඹා සිත සන්සුන් කර ගැනීමට මට හැකියාවක් තිබිණ. සියල්ල නරඹා මා ආපසු එද්දී රාත්‍රී අට පමණ වී තිබිණ. මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් එවිට කාමරයේ නොසිටියේය.

"හෝම්ස් මහත්තයා ඒ හත වෙන්නත් කලින් කෑම කාලා, වැදගත් රාජකාරියකට යනවා කියල පිටවෙලා ගියා" හඩ්සන් මහත්මිය කීවාය. "වොට්සන් මහත්තයට කියන්න කිව්වා ඉක්මනට කෑම කාල සූදානමෙන් ඉන්න කියල."

මා සූදානමෙන් සිටිය යුත්තේ කුමක් සඳහාද යන්න හඩ්සන් මහත්මිය දැනසිටියේ නැත. කෙසේ වෙතත් මම ඉක්මනින් රාත්‍රී ආහාරය ගෙන හැඳ පැළඳ ගෙන බලාසිටියෙමි. මා නොඉවසිල්ලෙන් මග බලමින් සිටියත් හෝම්ස්ගේ සලකුණක් හෝ නොවීය. රාත්‍රී 11.30 වන තුරු බලාසිට, අන්තිමේදී මම නින්දට යෑමට තීරණය කළෙමි. එහෙත් හෝම්ස්ගේ පණිවුඩයෙන් සිතේ ඇතිව තිබූ කැළඹීම නිසා නින්ද මා වෙත ළඟාවූයේ නැත.

ඈත දෙව් මැඳුරක ඔරලෝසුවේ රාත්‍රී දොළහ නාද වෙද්දී අපේ නිවස අසල වීථියේ අශ්වකරත්තයක් නවත්වන හඬ මට ඇසිනි. මම වහාම ජනේලය විවෘත කර බැලීමි. සේවක ළමයා විසින් විවෘත කළ දොරෙන් අපේ නිවසට පැමිණියේ ලෙස්ට්‍රේඩ්ය.

"හෝම්ස් මහත්මයා ස්කොට්ලන්ඩ්යාඩ් එකට මට විදුලිපුවතක් එවල තිබුණා" ඔහු කීය. "ඔහු කියලා තිබුණා වොට්සන් මහත්මයත් කැඳවාගෙන වහාම පාක් රෝයල් හෝටලයට එන්න කියල."

ඉක්මනින් යළිත් හැඳ පැළඳ ගෙන මම ලෙස්ට්‍රේඩ් සමග පිටත්වී ගියෙමි. හෝටලයේ ආලින්දයේ සිටි කළමනාකාර ඩන්කන් මහතා අප දෙදෙනා හෝම්ස් සිටි තැනට කැඳවාගෙන ගියේය. ඒ හෙන්රි ස්මිත් මහතා ලැගුම් ගෙන සිටි අංගනයේ විසිත්ත කාමරයයි.

"ප්‍රමාදය ගැන මට කණගාටුයි වොට්සන්" හෝම්ස් කීය. "ලෙස්ට්‍රේඩ් ඔබත් ඇවිත් මේ සැපපහසු පුටුවක හිඳගන්න. හෙන්රි ස්මිත් මහත්මයා අප නොදන්නා තොරතුරු වගයක් කියන්න පටන්ගත්තා. නමුත් ඔබ දෙදෙනා එනතුරු ඒ කථාව නවත්වන්න කියල මං ඉල්ලීමක් කළා. හෙන්රි ස්මිත් මහත්මයා, ඔබ කියන්න පටන්ගත් කථාව යළිත් මුල ඉඳලම අපට කියන්න."





සිගරට්ටුවක් උරමින් සිටි සංගීතඥ හෙන්රි ස්මිත් මහතා, අප වෙත බැල්මක් හෙළා මඳවේලාවක් නිහඬව සිටියේය. මේ මිනීමැරුම ගැන වැදගත් සාක්ෂියක් විය යුතු බවට මම අනුමාන කළෙමි. අන්තිමේදී සිගරට්ටුව අළු බඳුන තුළට දමා ඔහු කථාව ඇරඹුවේය.

"මහත්වරුනි. මට කියන්න තියෙන්නේ බොහොම දිග කථාවක්. මේක කොයි තරම් දුරට ඔබ විමර්ශනයට උදව් කරාවිද කියන එක නම් මම දන්නෙ නැහැ.

ඔබ දන්නවා මං එංගලන්තයේ උපන් කෙනෙක් බව. මං කෝන්වෝල් ප්‍රාන්තයේ ඈත පිටිසර ගමක, දුප්පත් පවුලක උපන් කෙනෙක්. ගොවිපොළක් පවත්වාගෙන ගිය මගේ තාත්තා, මං කුඩා කාලෙදීම මියගියා. ඉතින් මගේ අක්කවත් මාවත් හදා වඩා ගන්න මගේ අම්මට බොහොම දුක් විඳින්න සිදුවුණා. මට අවුරුදු දහහතර වයසේදී මගේ අම්මා අංශභාග රෝගයෙන් මියගියා. එතකොට අක්කගේ වයස අවුරුදු විස්සයි. අපට පිහිටවෙන්න ඥාතීන් කවුරුවත් හිටියේ නැහැ. කුඩා කාලෙ ඉඳලම ගොවිපොළේ වැඩ ගැන මගේ හිතේ කිසි කැමැත්තක් තිබුණේ නැහැ. මගේ හිත ගියේ සංගීතයට. ඉරිදාට දෙව්මැඳුරේ පියානෝව වාදනය කිරීම දේවගැතිතුමා මට භාරදුන්නා. කාගෙන්වත් [illegible] ආකාරයක හෝ සංගීත පුහුණුවක් මට ලැබුණේ නැහැ. ඒ වුණත් නත්තල් කැරොල් වලට මං ළාබාල වයසෙදීම සංගීත භාණ්ඩ වාදනය කළා. මාව ගොවිපොළේ වැඩට යොදා නොගෙන සංගීත අංශයෙන් ඉගැන්වීමක් කළ යුතු බවට මගේ අක්කට කිව්වේ අපේ දේවගැතිතුමා.

ඇය ඒ උපදෙස් බොහොම සතුටෙන් පිළිගත්තා. ඇය විවාහයක් ගැන හිතුවේ නැහැ. උදව්වට සේවිකාවකුත් කැඳවාගෙන ගොවිපොළේ වැඩවලට බොහොම මහන්සිවුණා. ඇගේ එකම අරමුණ වුණේ කොහොම හරි, මා ඉහළපෙළේ සංගීතඥයෙක් කරන්න. මට සංගීතය ඉගැන්වූ ගුරුතුමා මගේ දක්ෂකම් ගැන පැහැදුණා. එතුමා මට කිව්වා වැඩිදුර පුහුණුව සඳහා මට ප්‍රංශයට හෝ ජර්මනියට යන්න කියල.

පිටරටකට ගිහිං සංගීතය ඉගෙන ගන්න විශාල මුදලක් උවමනායි. ඒකට අපට මුදල් හදල් තිබුණේ නැහැ. නමුත් මගේ අක්කා මාව ධෛර්යමත් කළා. අපේ ගොවිපොළ තිබුණු ඉඩමෙන්

www.sinhalaelibrary.com

කොටසක් විකුණාදමලා ඇය මට මුදල් දුන්නා. ඒ මුදලෙන් තමයි ප්‍රංශයට ගිහින් පැරිසියේ සංගීත ඇකඩමියට බැඳිලා මම උසස් අධ්‍යාපනය ඇරඹුවේ.

මං බලාපොරොත්තු විරීයේ ඉක්මනින් ඉගෙනීම අවසන් කරලා, මගේ අක්කා ගොවිපොළට වෙලා ගෙවන දුක්ඛිත ජීවිතයෙන් ඇයව මුදවා ගන්න. ඇය තමන්ගේ අනාගතයක් ගැන හෝ සැපත් ගැන හිතුවේ නෑ. ඇගේ එකම අරමුණ වුණේ මගේ දියුණුව.

මේ අතරේදී තමයි මට ජෝන් ස්ටීවන්සන් මහත්මයා හමුවුණේ. ලෝකප්‍රකට නොවුණත්, ඔහු එතෙක්ටත් දක්ෂ වයලීන වාදකයෙක්. මගේ වාදන හැකියාව ගැන පැහැදිලා ඔහු මට ඇරයුම් කළා, ඔහුගේ කණ්ඩායමට එක්වෙන ලෙස. ඔහු මට පොරොන්දු වුණා, ඔහුට සංගීත ප්‍රසංග වලින් ලැබෙන මුදලෙන් හතරෙන් එකක් සහ මාසිකව වැටුපක් ගෙවන්න. ඉතින් මං ඔහු ගැන ලොකු විශ්වාසයක් තියලා ඒ රැකියාව භාරගත්තා. නමුත් ඔබට කියන්නත් මට කණගාටුයි මහත්වරුනි. ශ්‍රාවකයින්ගේ හද දිනූ සුප්‍රකට සංගීතවේදියා මට වුණු පොරොන්දු කිසිවක් ඉටුකළේ නැහැ. ඔහු මට වත් අනෙක් වාදන ශිල්පීන්ට වත් සතුටුදායක වැටුපක් ගෙව්වේ නැහැ. සංගීත ප්‍රසංග වලින් ලැබෙන මුදලෙන් හතරෙන් එකක් වෙනුවට ඔහු මට ගෙව්වේ විස්සෙන් එකක් වැනි මුදලක්. ඔහුගෙන් ලැබුණු හිඟන වැටුප් මට යන්තම් ජීවත්වෙන්න ප්‍රමාණවත් වුණා. නමුත් මගේ අක්කා ඇගේ දුක්ඛිත ජීවිතයෙන් ගළවාගන්න මට හැකියාවක් තිබුණේ නැහැ."

"ඔබ ඔහුගේ ළඟ රැකියාව අත්හැරලා වෙනත් සංගීතඥයෙකු ළඟට යන්න නොහිතුවේ ඇයි?" හෝම්ස් ඇසීය.

"මං එහෙම යන්න උත්සාහ කළා," ස්මිත් කීය. "නමුත් ඔහු මට තර්ජනය කළා. ඔහු කිව්වා මට යුරෝපයේ කිසිම සංගීතඥයෙකු ළඟ වැඩකරන්න ඉඩ නොදෙන බව. මං එහෙම ගියොත් මට මෙලොව ජීවත්වෙන්න ඉඩ නොතබන බව ඔහු කීවේ දිවුරමින්. අපේ කණ්ඩායමේ අනික් වාදක ශිල්පීන්ගෙන් අහල බලන්න. අප කාටත් අත්වෙලා තිබුණේ එකම ඉරණම. ඉතින් මහත්වරුනි ඔබට හිතාගන්න පුළුවන් නේද, පහුගිය අවුරුදු දොළහක කාලයක් මං ඔහු ළඟ ගෙව්වේ කොයි තරම් දුක්ඛිත ජීවිතයක්ද කියලා.





මීට අවුරුදු දෙකකට කලින් මගේ අක්කා බරපතල ලෙස අසනීප වුණා. මං වහාම එංගලන්තයට ඇවිත් ඇයව රෝහලකට ඇතුළත් කළා. මේ වෙනකොට උගස්කර තිබුණු අපේ ගොවිපොළ උගසට සින්න වෙලා. ඇය ජීවත්වුණේ මා එවූ සුළු මුදලින්.

අක්කාගේ ජීවිතය බේරාගැනීමට නම් ලොකු ශල්‍යකර්මයක් කළ යුතු බව වෛද්‍යවරු කිව්වා. නමුත් මහත්වරුනි මට ඒකට මුදල් තිබුණේ නැහැ. මම ස්ටීවන්සන් මහත්මයාගෙන් ණයට මුදලක් ඉල්ලුවා. ඔහු ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. විලගට ණයවෙලා, අක්කාගේ ජීවිතය කොහොම හරි බේරාගැනීමේ අරමුණෙන් ඒ වෛද්‍ය ප්‍රතිකාර ලබාදුන්නා. නමුත් හයමාසයක් ගතවෙද්දී ඇය මියගියා.

වෛද්‍යවරු කිව්වේ, ඇය ඒ රෝගයට ප්‍රතිකාර සඳහා නියමිත වේලාවට ආවා නම් ජීවිතය බේරාගන්න තිබුණු බව. මං දන්නවා මගේ තිබුණු දුප්පත්කම නිසා, අක්කා අසනීපයක් තිබුණු බවක් මට දන්වාවේවත් නැහැ. මා වෙනුවෙන් මුළු ජීවිතයම කැපකළ මගේ අක්කාගේ යහපත වෙනුවෙන් මට කළ හැකි දෙයක් තිබුණේ නැහැ." පැවසූ හෙන්රි ස්මිත් හඬා වැලපෙන්නට පටන්ගත්තේ කුඩා දරුවෙකු ලෙසිනි.

අපි නිහඬව බලාසිටියෙමු. මිනිත්තු කිහිපයක් නිහඬව සිටි ඔහු යළිත් කථාව පටන්ගත්තේය.

"ස්ටීවන්සන් මහත්මයා විශාල ධනවතෙක් වුණේ සංගීත වාදනයට ඔහුගේ තිබූ දක්ෂතාවය නිසා බව ඇත්තයි. නමුත් ඔහු ධනවතෙක් කරන්න අපි නිහඬ සේවයක් කළා. ඔහුට ඒ ගැනත් හිතන්න තිබුණා. ඔහුට ඒ මුදල් හොයාදෙන්න අපි අපේ ජීවිතයම කැපකළා.

මං මීට අවුරුද්දකට පෙර ප්‍රංශ ජාතික කාන්තාවක් සමඟ විවාහ වුණා. සුන්දර ජීවිතයක් ගැන සිහින දැක්කත්, අපි ජීවත්වෙන්නේ පැරිසියේ මුඩුක්කු පරිසරයක තියෙන පුංචි ගෙයක. මගේ පඩිය වැඩිකරන්න කියා මං ස්ටීවන්සන් මහත්මයාගෙන් ඉල්ලූ වාර අනන්තයි. නමුත් කවදාවත් එක සෙන්ට් එකකින් ඔහු අපේ වැටුප් වැඩිකළේ නැහැ. එංගලන්තයට එන දවසට කලින් දවසේ මට ගෙදරට ලියුම් හතරක් ලැබිලා තිබුණා. ඒ ඔක්කොම මගේ ණය පිළිබඳව මතක්කරලා ණය කාරයො එවූ ලියුම්.

ලන්ඩනයේ සංගීත ප්‍රසංගයට ඇවිත් හිටි සෙනඟ කොයිතරම්ද කියලා ඔබ දකින්න ඇති. ඒ අනුව ස්ටීවන්සන් මහත්මයාට විශාල මුදලක් ලැබුණා. එදා රාත්‍රි කෑමෙන් පසු, මට ගෙවන්න තිබෙන ණය ගැන මතක් කරලා, මං ඔහුගෙන් වැඩිමුදලක් ඉල්ලුවා. ඔහු කෙලින්ම එය ප්‍රතික්ෂේප කළේ මට බැණවදිමින්. ඔහු අධික ලෙස වයින් පානය කරලා වෙරිවෙලයි හිටියේ. ඒ නිසා මං තවදුරටත් කථා නොකර මගේ කාමරයට ගියා.

මං ඒ ගියේ මගේ වාද්‍ය භාණ්ඩයේ තත් වල අලුත්වැඩියාවක් කරන්න. එදා හවස තිබුණු සංගීත ප්‍රසංගයේදී මගේ වීණාවේ තත්වල අඩුපාඩුවක් ඇතිබව මට වැටහුණා. මං බලාපොරොත්තුවුණු තරමේ මියුරු හඬක් පිටවුණේ නැහැ. තත් දිරණ වීම නිසා එවැන්නක් වෙන්න පුළුවනි.

මං මගේ ඇඳ අසල පුටුවේ වාඩිවෙලා, පරණ තත් ගලවා ඉවත්කළා. ඊළඟට අලුත් තත් අත් දෙකේ පටලවාගෙන, ඒවායේ ශක්තිය හා ආතතිය පරීක්ෂා කරමිනුයි හිටියේ. මේ අතරේ ස්ටීවන්සන් මහත්මයා මගේ කාමරයට කඩාවැදුණා. ඔහු දිගින් දිගටම මට බැණවැදුණා.

"උඹ වැනි දුප්පත් පවුලක නූගත් ගොවියෙකුගේ පුතෙකුට, සංගීතය වැනි උතුම් ක්ෂේත්‍රයක් හරියන්නේ නැහැ" ඔහු කිව්වා.

"බල්ලෙක් වගේ පාරේ හිඟාකන්න හිටි එකෙකුට රැකියාවක් දුන්නාම, දැන් එනවා මගෙන් වැඩි අඩි ඉල්ලන්න. මං උඹලගෙ මුළු පවුලටම ශාප කරනවා."

මං ඔහුට කිව්වා "ජෝන් ස්ටීවන්සන්, කරුණාකරල මගේ කාමරෙන් පිටවෙන්න, මගේ යක්ෂයා අවුස්සන්නේ නැතිව."

"මේ හෝටලේට, මේ කාමරේට කුලී ගෙවන්නෙත් මම. උඹ කොහොමද මාව එළියට දමන්නේ" කියූ ඔහු අත මිට මොළවා මගේ හිසට පහරක් එල්ල කළා. ඒ පහරින් මගේ හිස පැත්තකට තල්ලු වී ගිහින් වැදුණේ මේ මේසයේ උලක් වගේ තිබෙන කෙළවරේ. එයින් මගේ හිස තුවාල වී ලේ වැගිරෙන්න පටන්ගත්තා. මට දැඩි වේදනාවකුත් දැනුණා.

දැඩි වේදනාව සමග ලේ දුටු මට යක්ෂාවේශ වුණා. ඔහු මට යළිත් පහර දෙන්න ඉදිරියට පනිද්දී ඔහුගේ ග්‍රහණයෙන් ගැළවෙන්න මං මගේ අතේ තිබුණු තත් ඉදිරියට දිගු කරලා ඔහුගේ ගෙළ වටා හිරකළා. ඔහු මගේ හිසකෙස් දැත් වලින්ම අල්ලාගෙන





හිටියේ මගේ හිස යළින් මේසෙ හැප්පීමට. නමුත් මගේ ග්‍රහණය ඊට වඩා ප්‍රබලවුණා. ඔහු ක්ලාන්ත වෙලා වගේ බිම ඇදවැටුණේ කිසිවක් කථා නොකර.

ඔහු මියගිහින් කියල මට තේරුණේ විනාඩි කිහිපයක් ගතවුණාට පසුවයි. කළයුත්තේ කුමක්ද කියන එක මට එක්වරම හිතාගන්න බැරිවුණා. ටික වෙලාවක් කල්පනා කරද්දී මට තේරුණා බේරෙන්න තිබෙන එකම ක්‍රමය මළසිරුර ආපහු ඔහුගේ ඇඳටම ගෙන ගොස් තැබීම බව.

මහත්වරුනි, ක්ෂණික කෝපය නිසා වුණත් මගේ අතින් වුණේ ලොකු අපරාධයක්. ඒ ගැන මං හිතෙන් [illegible] දුක්වින්දා. මට ඊට එක මොහොතක් නින්ද ගියේ නැහැ. බර්මිංහැම් වල පැවැත්වූ සංදර්ශනයේදී මගේ ඇඟිලි අප්‍රාණික වී යාම නිසා එය අසාර්ථක වුණා. මං ඊයේ [illegible] ආපහු ආවෙ අදම එංගලන්තයෙන් පිටවී යන අදහසින්. නමුත් කල්තබා දැනුම් දී නොතිබීම නිසා මට බෝට්ටුවෙන් යන්න හැකිවුණේ නැහැ.

අද ඒ නිදා ගන්න ඇඳට ගියාම මට කොහොමවත් දෑස් පියාගන්න බැරිවුණා. ටික වෙලාවක් යද්දී ඔහුගේ කාමරය දෙසින් ස්ටීවන්සන්ගේ ජනප්‍රියම වාදන ඛණ්ඩය මට ඇහෙන්න පටන්ගත්තා. මට පුදුම හිතුණා. මං හිතුවේ මේක මගේ හිතේ ඇතිවුණු විකාර සිතිවිල්ලක් කියලයි. මට යන්තමින් නින්ද යන්න ඇති. ඊළඟට අන්ධකාරයේ තිබුණු මගේ කාමරයෙන් ඒ සංගීතය ඇසුණේ ඉතාම උච්ච ස්වරයෙන්. මං හරි භීතියකට පත්වුණා. ස්ටීවන්සන්ට හැර මේ ලෝකයේ කිසිකෙනෙකුට ඒ සංගීත ඛණ්ඩය වාදනය කරන්න හැකියාවක් නැහැ. මං හිතුවේ ඔහුගේ අවතාරය මා පසුපස එළවාගෙන ඇවිත්, මාව මරාදමන්න සූදානම් වෙනවා කියලයි. මට මගේ හැඟීම් පාලනය කරගන්න බැරිවුණා. මං කළ අපරාධයට සමාව ඉල්ලා කෑගැහුවා. මිනිත්තුවක් දෙකකින් සියල්ල නිහඬවුණා. කාමරය එළිය වුණා. මට දකින්න ලැබුණේ වයලීනයක් අතින් ගත් ෂර්ලොක් හෝම්ස් මහත්මයා."

හෙන්රි ස්මිත් තම කථාව අවසන් කළේය. ලෙස්ට්‍රේඩ් ඔහුගේ සාක්කුවෙන් ගත් විලංගු යුගළය ස්මිත්ගේ දෑත්වලට හිරකළේය. පැය කාලකට පමණ පසු ඔවුන් කුලීරියකින් පොලිසිය වෙත පිටත්ව යන අයුරු අපි බලාසිටියෙමු.

"හෝම්ස්, ඔබ කොහොමද දැනගත්තේ මේක හෙන්රි ස්මිත්ගේ වැඩක් බව?" මා ඇසුවේ අප බේකර් වීදියේ නිවහන වෙත ගිය පසුය.

"මේ අපරාධයට වගකිවයුත්තා කර්නල් මොරාන් කියල මගේ හිතේ සැකයක් ඇතිවුණු බව ඔබ දන්නවා. නමුත් ඔහු මේකට සම්බන්ධ නැති බව මට ඉක්මනින් වැටහුණා. ඊට පස්සේ මගේ අවධානය යොමුවුණේ පැන ගිය හෝටල් සේවකයා කාල් ග්‍රීන් වෙත.

මළසිරුර පරීක්ෂා කිරීමේදී අපට පෙනී ගිය කරුණක් තමයි ස්ටීවන්සන්ගේ මරණය සිදුවෙලා තියෙන්නේ සිහින් කම්බියකින් හෝ ශක්තිමත් නූලකින් ඔහුගේ ගෙල තදවීම නිසා බව. එවැනි දෙයක් නෙහෙත් මිනීමැරීමක් සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා දෙයක් නොවෙයි. මුදල් හොරකම් කරගැනීමේ අරමුණෙන් කාමරයට ආව හොරෙක්, මේ අපරාධය කළා කියල හිතමු. ඔහු මොකටද මේ තරම් කරදරකාරී ක්‍රමයක් යොදාගන්නේ? හොරුන් ගුම් කට්ටුව වගේ එද්දී බොහෝවිට ඔවුන් ළඟ ආයුධ තියෙනවා. කාමරය තුළ තිබූ මුදල් හෝ වටිනා දේ කිසිවක් අතුරුදන් වී නොමැති බව අපි දන්නවා. ඒ නිසා ජනේලයේ අගුළ ඇරලා තිබුණා වුණත්, ඉණිමඟක් තබා පිටතින් කෙනෙක් ආවා කියන අදහස බැහැර කරන්න පුළුවනි; ග්‍රීන් මේ ක්‍රමයට කාමරයට ඇවිත් අපරාධය කරලා ඒ ආව පාරෙන්ම පැන ගියා නම් මිස. නමුත් ඔහු මොකටද ස්ටීවන්සන් මැරීමට මේ තරම් කරදරකාරී ක්‍රමයක් යොදාගන්නේ?

කාල් ග්‍රීන් ගැන මම තොරතුරු හොයා බැලුවා. ඔහු හෝටලයෙන් පැනගොස් තිබුණේ අර සාදය අවසන් වුණු වහාම බවට මට සාක්ෂි හමුවුණා. කාල් ග්‍රීන් හමුවෙන්න ඔහු මුදල් ණයට ගත් යුදෙව් ජාතිකයෙක් හෝටලයට පැමිණ තිබෙනවා. හැන්දෑවේ හතට පමණ ඔහු සමඟ ඇතිවුණු බහින්බස්වීමකින් පසුයි, ග්‍රීන් රාත්‍රිභෝජනය පිළිගන්වන්න ගිහින් තියෙන්නේ. ඒ වෙලාවේ ඔහුගේ හිතේ තිබුණු කැලඹීම නිසාම වෙන්න ඇති, ස්ටීවන්සන් සමඟ ඇතිවුණු වෙන නුවමනාවෙ සිද්ධියක් දක්වා දිග්ගැස්සුණේ. කොහොම වුණත් මට ජෝන් ඩන්කන් පෞද්ගලිකවම සහතික කළා කාල් ග්‍රීන් රාත්‍රී 9.30 ට පමණ හෝටලයෙන් පිටමං කළේ තමා





විසින්ම බව. නමුත් හෙන්රි ස්මිත් ම අපට කිව්වා ඔවුන් රෑ කෑමගෙන අවසන් කරද්දී රාත්‍රී 10.30 වෙමින් තිබුණු බව. හිස් භාජන ඉවත්කරගෙන යාමට පැමිණි හෝටල් සේවකයාත් ඒ බව තහවුරු කළා.

ඔබට මතක ඇති මම ස්මිත්ගේ භාණ්ඩයන් පරීක්ෂා කල බව. එවිට මට දකින්න ලැබුණු දෙයක් තමයි අලුත් තත් සවිකිරීමට වීණාවෙන් ඉවත්කළ පරණ තත්. හිතේ තිබුණු කැලැඹීම නිසා ඒක අපට නොපෙනෙන විදියට හංගන්න ඔහුට අමතකවුණා වෙන්නත් පුළුවන්. නැත්නම් ඒක නොවැදගත් දෙයක් කියලා හිතලා ඔහු එය නොසලකා හිටියා වෙන්නත් පුළුවනි. ඒ නිසා හෙන්රි ස්මිත් වෙත මගේ සැකය යොමුවුණා. මතක තියාගන්න ඔහුට පමණයි පහසුවෙන් ස්ටීවන්සන්ගෙ කාමරයට එන්න හැකියාව තිබුණේ. ඒ ඔවුන් දෙදෙනාගේ නිදන කාමර සම්බන්ධ කරන දොරෙන්.

මං මුළු දවස පුරාම ස්ටීවන්සන්ගේ වාදනය පුහුණු වුණේ හෙන්රි ස්මිත් කොටුකර ගැනීමට හැකිවේවි කියන විශ්වාසයෙන්ම නෙමෙයි. මට නිකමට හිතුණා ස්ටීවන්සන්ගේ කාමරයට හොරෙන් ඇතුළු වෙලා සංගීත වාදනය පැවැත්වූවොත්, ස්මිත් හදාගෙන ඉන්න වෙස් මුහුණ කඩා වැටේවි; මට ටිකෙන් ටික හැකිවේවි ඔහු හිතේ හංගාගෙන ඉන්න කරුණු එළිකරගන්න කියලා. නමුත් මා වත් බලාපොරොත්තු නොවුණු විදියට සිදුවුණේ කුමක්ද? හෙන්රි ස්මිත් හරිම සංවේදී පුද්ගලයෙක්. ශ්‍රේෂ්ඨ කලාශිල්පීන් කවුරුත් වගේ බොහොම සංවේදී අය. ඔහු හිටියේ මානසිකව දැඩි කම්පනයකට පත්වෙලා. මෙතරම් වෙලාවක උච්ච ස්වරයෙන් ස්ටීවන්සන්ගේ සංගීතය ඇසෙන්න ලැබුණාම හෙන්රි ස්මිත්ට තමන්ගේ හැඟීම් පාලනය කරගන්න බැරිවුණා. ඔහු හිතුවා ස්ටීවන්සන්ගේ අවතාරය තමාගෙන් පළිගන්න එනවා කියල. ඔහු මහ හඬින් කෑගැසුවා; "මගෙ ළඟට එන්න එපා! මට සමාවෙන්න! මට සමාවෙන්න!" කියලා. ඔහු අපරාධකාරයා බවට මා කළ නිගමනය තවදුරටත් තහවුරු කරන්න ඒ ටික ප්‍රමාණවත් වුණා."

නඩු විභාගයේදී අනියම් මිනීමැරීමේ චෝදනාවට වරදකරු වූ හෙන්රි ස්මිත් අවුරුදු දහයකට බන්ධනාගාරයට නියම විණි. එහෙත් අවුරුදු දෙකක් ගතවීමටත් පෙර ඔහු හෘදයාබාධයකින්



www.sinhalaelibrary.com

බන්ධනාගාරයේදීම මියගිය බව පුවත්පත් වල පළවිය. හෝම්ස් ඉතා මියුරු ස්වරයෙන් වයලීනය වාදනය කිරීන අයුරු ඉන්පසු මට දහස් වාරයක් අසන්නට ලැබෙන්නට ඇත. එහෙත් ජෝන් ස්ටිවන්සන්ගේ පේමා සංගීත ඛණ්ඩය හෝම්ස් අතින් යළින් වාදනය වෙනු මට කිසිවිටෙකත් අසන්නට ලැබී නැත.



# උගා දූපතේ කළු අවතාරය

1887 වසර ෂර්ලොක් හෝම්ස් මහතාට කාර්ය බහුල වසරක් වූ බැව් මම මීට පෙර ද සඳහන් කර ඇත්තෙමි. එම හේතුව නිසාම ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය ක්‍රමයෙන් ක්‍රමයෙන් අතට හැරුණු අයුරු, මා බලා සිටියේ අතිශය කණගාටුවෙනි. හෘද රෝග විශේෂඥ ශ්‍රීමත් ජෝන් හැන්වෙල් දිගින් දිගටම පැවසුවේ හෝම්ස්ට අවශ්‍ය විවේකය මිස ඖෂධ නොවන බවයි. ඔහුට හොඳ විවේකයක් ලබාදීමේ අරමුණෙන් අපි රටේ විවිධ ප්‍රදේශ වලට ගියෙමු. එහෙත්, ඒ සෑම තැනකදීම ඔහු වෙත විසඳීම සඳහා ගැටලුවක් භාරවීම නොවැළැක්විය හැකි ප්‍රශ්නයක් විය. එය ප්‍රශ්නයක් මෙන්ම හිසරදයක් වූයේ මට පමණි. ඔහුගේ මිත්‍රයා ගැටලු විසඳීම භාරගත්තේ, මුව පුරා සිනාසෙමින්, හද පුරා ඉතිරී ගිය සතුටකිනි. එබැවින් මෙවර ඔහු ලන්ඩනයෙන් බොහෝ දුර බැහැර, ජනශූන්‍ය ප්‍රදේශයකට ගෙන යෑමට මම අන්තිමේදී තීරණය කළෙමි. ඒ සඳහා මා තෝරාගත්තේ බ්‍රිතාන්‍යයේ උතුරු කෙළවරේ පිහිටි ස්කොට්ලන්තයයි.

මෙම පෙදෙස මවිසින් තෝරා ගැනීමට ප්‍රධානම හේතුව වූයේ, ඒ දිනවල මා කියවූ පොතකි. ඒ පොත ලියා තිබුණේ බොස්වෙල් නම් සුප්‍රසිද්ධ ලේඛකයා විසිනි. ඔහු, දේශගවේෂකයෙකු වූ ආචාර්ය ජොන්සන් සමග, ස්කොට්ලන්තයේ සඳුතර ප්‍රදේශ සංචාරය කරමින් හර්බ්‍රයිඩ්ස් පෙදෙස වෙත ගමන් කළ අයුරු, එහි සවිස්තරව සඳහන් විය. ඔහුගේ සංචාරයේ දී ඔහුගේ සිත් ඇදගැනීමට සමත් එක් කරුණක් බොස්වෙල් විස්තර කළේ මෙසේය.

"...මේ කොතරම් ජනශූන්‍ය පාළු භූමියක්ද? මෙය පෙන්නුම් කරන්නේ මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ සම්පර්කයවත් නොපැමිණි බවකි. එහෙත් මෙය පිහිටියේ බ්‍රිතාන්‍ය දූපත් වලය. එවැන්නක් අප කෙසේ නම් විශ්වාස කරන්නද?..."

"හෝම්ස්, 18 වැනි සියවසේ සිටි ශ්‍රේෂ්ඨ දේශසංචාරක ලේඛකයෙක් අපට හොඳ මග පෙන්වීමක් කරල තියෙනවා. මේ සැරේ නිවාඩුවක් ගත කරන්න, ස්කොට්ලන්තයට යන්න මම තීරණය කළා" මම කීවෙමි.

"කෙටි නිවාඩුවක් ඇවිත් යන්න නම් මගේ අකමැත්තක් නැහැ" ඔහු කීවේය. "ඒ වුණත් අපේ අයගේ ගැටලු විසඳා දෙන්න මං භාරගත්තු, අනුග්‍රාහකයින් විශාල පිරිසක් මට ඉන්නවා. මොකක්ද මං ඔවුනට දෙන උත්තරේ වොට්සන්?"

"ඔබට කැමැති දෙයක් කියන්න මිත්‍රයා" මම කීවෙමි. "අද උදේ මම දුම්රිය කාර්යාලයට ගිහින්, උතුරු දිග දුම්රියේ, නිදන කාමර-ආසන දෙකක්, පළල් ගේජ් එකේ වෙන්කරවා ගත්තා. තව දවස් හතරකින් අපි ගමනේ. මා සමග එනවා නැතුව ඔබට කිසිම විකල්පයක් නැහැ හෝම්ස්"

"එතකොට ඒ දවස් වලට අපේ මේ නිවහනට එන අනුග්‍රාහකයන්ට මොකද වෙන්නේ?" හෝම්ස් මෙවර ඇසුවේ තරමක කැලඹීමකට පත්වය.

"මොකුත් වෙන්නේ නැ මිත්‍රයා" මම කීවෙමි. "ඔවුන් එකාම ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගිහින්, රහස් පරීක්ෂක ජී. ලෙස්ට්‍රේඩ්ට පැමිණිලි කරාවි. එතකොට පුවත්පත් වල ප්‍රධාන ප්‍රවෘත්තිය ලොකු අකුරෙන් පළවෙවි. 'හෝම්ස් විසින් සුප්‍රසිද්ධ අපරාධ පරීක්ෂකයා අභිරහස් ලෙස අතුරුදන් වෙයි' කියලා."

"මගේ හිතවත් වොට්සන්, ඔබට නම් [illegible] විහිළු." [illegible] හෝම්ස්, බොරුවට තරහ මුහුණින් සැදුණු ඔහුගේ ප්‍රියතම සංගීත භාණ්ඩය වූ වයලීනය අතට ගත්තේය.

දින හතරකට පසු සැන්දෑ යාමයක, යුස්ටන් දුම්රියපොළෙන්, අපි උතුරු එංගලන්තය බලා යන ශීඝ්‍රගාමී දුම්රියක නැගුණෙමු. පසුවදා උදේ පාන්දරම අපේ ගමන අවසන් වූයේ ස්කොට්ලන්තයේ ඉන්වර්නස් දුම්රියපොළේදීය. එහෙත් පැය ප්‍රමාදයකින් පසු, අපට තවත් දුම්රියක ගමන් කිරීමට සිදුවිය. එය අප රැගෙන ගියේ වයඹ දිශාවටයි. [illegible] අපි ඒ දුම්රියෙන් බැස්සෙමු. ගමනේ අවසන් කොටස යාත්‍රාව තිබුණේ අශ්වකරත්තයකිනි. ඒ සඳහා කුලියක් දුම්රියපොළ අසල නවත්වා තිබිණි.

මෙම [illegible] තිබුණේ ඉතාම අසාමාන්‍ය පිහිටීමක් තිබූ පෙදෙසක [illegible]. තැනින් තැන උස් කඳුගැට පිහිටා තිබූ අතර කඳු බෑවුම් [illegible] තිබුණේ ගල් පර්වත වලිනි. ඊට අමතරව මෙම ප්‍රදේශයේම විශේෂිත ලක්ෂණයක් වූයේ, ජලය එකතු





ව විශාල විල් වැනි ජලාශයන්ය. ප්‍රමාණයෙන් ඉතා විශාල එමෙන්ම ගැඹුරු වූ මේ මිරිදිය විල්, පළාත පුරාම විසිරී තිබිණි. මුහුදු වෙරළ සමීපයේ දී මේ විල්, පටු දියපාර වලින් මුහුද හා සම්බන්ධ විය. ඒ නිසා ඒවා කරදිය මිශ්‍ර කලපු බවට පත්වී තිබිණි.

අප අශ්වකරත්තයෙන් කළ ගමන අවසන් වූයේ ස්කොට්ලන්තයේ බටහිර වෙරළේ පිහිටි කිල්බ්‍රයිඩ් නම් ගම්මානයෙනි. මෙම ගම්මානයට නුදුරුව එකිල් නම් අතිවිශාල විලක් පිහිටා තිබිණි. මෙම විල් අසුරේ වූයේ ඉතා දර්ශනීය ලෙස [illegible] නිර්මාණය කොට තිබූ එකිල් විල හෝටලයයි. [illegible] නවාතැන්පොළ වූයේ ද එයයි. විදක් ඇතින් වූ, ගල් [illegible] ඇදහැළුණු, ඉතා රමණීය එකිල් දියඇල්ල ද හෝටලයට [illegible]. [illegible] මනස්කාන්ත පරිසරයේ තිබුණේ සිත් ප්‍රබෝධමත් කරන [illegible] බවකි. කුඩා ධීවර වරාය අසල බෝට්ටු රැසක් නවත්වා තිබිණි. වෙරළ තීරයේ තැනා තිබූ සුදු පැහැති කුඩා ගෙවල් සමග මහා සාගරය ඈතට දිස් වූයේ දක්ෂ චිත්‍රශිල්පියෙකුගේ තෙලිතුඩින් නිමවුණු සිතුවමක් ලෙසය.

ශීත සෘතුවේ දී ස්කොට්ලන්තය කඳුකරය හරහා හමා එන්නේ [illegible] හිම කුණාටුවක් [illegible] ලෙස එකිල්විල හෝටලය ඉතා ශක්තිමත් අයුරෙන් [illegible] තිබිණි. එහි කාමර ඉතා සුවපහසු ඒවා විය. අපේ ගමන දීර්ඝ එකක් වූ නිසා හෝම්ස් වෙහෙසට පත්වී සිටි බැව් මම දුටුවෙමි. ගමන්මලු වල තිබූ අපේ බඩු බාහිරාදිය එළියට ගෙන, මම ඒවා කාමරයේ නිසි තැන්වල තැබීමි. මගේ මිත්‍රයාට කාමරය තුළට වී විවේක ගැනීමට ඉඩහැර, වටපිටාව ගැන සොයා බැලීමට, තනිවම හෝටලයෙන් එළියට යෑමට මම තීරණය කළෙමි.

එවේලේ කාලගුණය ඉතා ප්‍රසන්න එකක් විය. එකිල් විල මට දැනුණේ, ඇත කඳු [illegible] හෝටලය දක්වාම විහිදුණු [illegible] කැටපතක් වැනිසිනි. මෙම ප්‍රදේශයේ දී විලේ පළල [illegible] වැඩිවිය [illegible] මම අනුමාන කළෙමි. එහෙත් නැගෙනහිර පැත්තට යන්නට, එහි පළල අඩුවූ අතර, විල සැතපුම් භාගයක් පමණ දුරට ඇතුළට විහිදිණි. බටහිර දෙසට වන්නට එය එකාත් පුළුල් වූයේ [illegible] ගත්තාක් සාදමිනි. ඒ පැත්තේ විල නොපෙනී ගියේ මුහුද හා සම්බන්ධ ගැඹුරු, රළ ගසන දිය කඩක් සාදමිනි. මේ ප්‍රදේශයේ තැනින් තැන දූපත් සහ කළුගල්

පර්වත ද තිබූ බැව් මගේ නැව් කෙනිඹියෙන් දුටුවෙමි. එහි සිරි නැරඹීමට මට පැයක පමණ වේලාවක් ගතවිය. ධීවරයින් මාළු ඇල්ලීමට දැල් එලා තිබූ අයුරු, නොනවත්වාම කෑගසමින්, දිය මතුපිට මසුන් ආහාරයට ගත් මුහුදු ලිහිණියන් දෙස, මම ඉතා ආශාවෙන් බලා සිටියෙමි. අත්ලාන්තික් සාගරය හරහා හමා ආ ඒ සීතල සුළගේ තිබුණේ මුහුදටම සුවිශේෂ ලුණු මිශ්‍ර සුගන්ධයකි.

දූපත් හැම එකක්ම පාෂාණ, ගස්කොළන් හෝ ගොඩනැගිලි නොතිබුණු මුඩුබිම් බව මම දුටුවෙමි. එහෙත් තරමක් විශාල එක් දූපතක පමණක්, අඳුරු පැහැති, මඳ වශයෙන් එක් පැත්තකට ඇල වූ කුළුණක් විය. ඒ දැක මම පුදුමයට පත්වීමි; ඒ ගැන කිසිවකුගෙන් විමසා බැලිය යුතු යයි මම එවෙලේ සිතිමි. මා ආපසු හෝටලයට ඇවිද එද්දී මට හමුවූයේ හෝටලයේ කළමනාකරු වූ මැක්ලියෝඩ් මර්ඩොක් මහතාය.

"මර්ඩොක් මහත්මයා, අර බටහිර පැත්තේ මුහුදු තීරයට වෙන්න තියෙන දූපත් වලින් එකක විතරක් විශාල කුළුනක් වගේ දෙයක් තියෙන බව මං දුටුවා. ඒ දූපත මොකක්ද?"

"දෙස්තර මහත්මයා, ඒ තමයි උගා දූපත. මැග්ලෙවින් නම් මහත්මයා පදිංචි ගෙදර කොටසක් තමයි, ඒ ඔබට පෙනුණේ"

"මොනවා? ඔබ කියන්නේ ඒකෙ කවුරු හරි පදිංචි වෙලා ඉන්නවා කියලද?" මා ඇසුවේ අතිශය පුදුමයට පත්වය.

"ඔය දූපතේ ඉස්සර තිබුණලු බොහොම ඉපැරණි ශිෂ්ටාචාරයක්" මර්ඩොක් කීය."ඒ නිසාම එහි ගොඩනැගූ තිබුණලු බලකොටුවක්. දැන් ඒක ගරා වැටිලා.

මැග්ලෙවින් මහත්මයා ඒක අලුත්වැඩියා කරගෙන දැන් එහි පදිංචි වෙලා ඉන්නවා. ඒකෙ කොටසක් ඔහු කෞතුකාගාරයකුත් පවත්වා ගෙන යනවා. ශතවර්ෂ ගණනාවකට පෙර විසූ ආදිවාසීන්ගේ පෞරාණික දේවල්, අරුමෝසම් බඩු ආදිය එහේ ප්‍රදර්ශනය කරල තියෙනවා. ඒක මහජනයාට විවෘතයි. අපේ හෝටලයට එන අමුත්තෝ හොයාගෙනම ඒක නරඹන්න යනවා. මේ ඇවිත් ඉන්න අමුත්තන්ගෙන් කිහිප දෙනෙක්ම ඊයේ කෞතුකාගාරය බලන්න ගියා. හොඳ බලන්න වටින තැනක්"

"මොනවද ඒකෙ බලන්න තියෙනවා කියලා ඔබ කිව්වේ?"

"මැග්ලෙවින්ලා ස්කොට්ලන්තයේ පෞරාණික සෙල්ටික් පරපුරේ අය" මර්ඩොක් කීය," ඔහුගේ මුතුන්මිත්තන්ගේ පෞරාණික ශ්‍රී විභූතිය,





ශිෂ්ටාචාරය, පිළිබිඹුවෙන නොයෙක් බඩු එතැන තියෙනවා. හුඟක්ම රිදී හා රත්තරන් වලින් තැනූ ආභරණ. ඔබ අහල ඇති සුප්‍රසිද්ධ මැග්ලෙවින් රිදී ගාංචුව ගැන. අහල නැ? මහත්මයා, ඒක තනිකරම රිදී තහඩුවක කළ, පෞරාණික ඇඳුම් කැටයමක්. ඒක මිල කළ නොහැකි වටිනා වස්තුවක් ලෙසයි සැලකෙන්නේ. ඔබ ඒ කෞතුකාගාරය නරඹන්න ගියොත් මැග්ලෙවින් මහත්මයා, ඒ ගැන ඔබට සම්පූර්ණ විස්තරයක් කියාවි.

ඔය මැග්ලෙවින් මහත්මයාට එඩින්බරෝ නගරයේ විශාල ගෙයක් තියෙනවා. ඔහු ඒක කාට හරි කුලියට දීලා. අවුරුද්දේ වැඩි කාලයක් ඔහු පදිංචිව ඉන්නේ ඒ උගා දූපතේ තියෙන තටබුන් මාලිගාවේ"

"ඔහු එතැන ඉන්නේ තනියමද?"

"නැහැ, ඔහුගේ දුවයි, ගෙදර සේවකයින් වන වයසක ජෝඩුවක් ඉන්නවා"

"ඔහු ටිකක් අමුතු විදියේ හිතුම් පැතුම් තියෙන කෙනෙක් වගේ. එහෙම නේද?"

"ඔව් මහත්මයා. නැත්නම් මේ වගේ පාළු තැනක කාලය ගතකරන්න එපැයැ. සමහර විට ඔබට ඔහු අද හෙටම දකින්න ලැබේවි. මිනිහ ළඟ තියෙනවා "ඇල්බා" කියලා වාෂ්ප බලයෙන් ක්‍රියා කරන බෝට්ටුවක්. ආහාර ද්‍රව්‍ය අරගෙන යන්න ඔහු වරින් වර බෝට්ටුවෙන් ගමට එනවා. ඔහු අඩි හයහමාරක් විතර උස, ඒ වගේම මහත යෝධයෙක් වගේ කෙනෙක්. මුහුණ පුරා වැඩුණු නැඹිලි පාටට හුරු රැවුලක් තියෙනවා. කොණ්ඩෙත් ඒ පාටයි. ඔබට ඔහුව ලෙහෙසියෙන් වරදින්නෙ නෑ"

පසුව ඒ හමුවීම සිදුවූයේ මා කිසිසේත්ම බලාපොරොත්තු නොවූ ආකාරයටය.

එකිල්විල හෝටලයට ඇතුළු වූ තැන්හම, ඉතා පුළුල් විසිත්ත කාමරයක් විය. එහි ඉදිරියෙම වූයේ උස් ජනේල පේළියකි. එතැන සිට බටහිර දිග මුහුදු වෙරළත්, වරායත්, ඉදිරියෙන් එකිල් විලත් ඉතා දර්ශනීය ලෙස දැකගත හැකිවිය. අහස වලාකුළෙන් බරවී, වැහි පොද වැටෙන වේලාවලදී හෝටලයෙන් එළියට යාමට හෝම්ස් කැමැත්තක් දැක්වූයේ නැත. මෙවැනි අවස්ථාවල, අපි මේ විසිත්ත කාමරය තුළට වී, ජනෙල් කවුළු තුළින් භාත්පස දර්ශනය නැරඹුවෙමු. උස් කඳුමුදුන් වල බෑවුම් දිගේ පහළට පාවී ආ වලාකුළු, එකිල්

විලේ දිය මතු පිටින්, ඈල හරහා සුළඟේ ගසාගෙන අයුරු බලා සිටීමට සුන්දර දසුනක් විය. හෝටලයේ ලැගුම් ගෙන සිටි අමුත්තන්, බෝට්ටු වලට නැගී විලේ මාළු අල්ලන අයුරු මම බලා සිටියෙමි.බෝට්ටුවක නැගී ගොස් එවැනි කටයුත්තක යෙදීමට මට ද ආශාවක් ඇතිවිය. මා වරක් දෙවරක් ඒ ගැන සඳහන් කළත් මගේ මිත්‍රයා එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළේය.

අප සමග හෝටලයේ ලැගුම් ගෙන සිටි අමුත්තෝ සමාජයේ විවිධ තරාතිරම්වල අය වූහ. සෙන්ට් ඇන්ඩ්රූස් නගරයෙන් පැමිණ සිටි වෛද්‍යවරයෙකු වූ නීල් ඔලිෆන්ට්, තට්ටය පැදුණු, මුහුණ පුරා වැවුණු සුදු රැවුලක් තිබූ වයස්ගත පුද්ගලයෙක් විය. ඔහු පෞරාණික බඩු ගැන උනන්දුවක් දැක්වූ පුරාවිද්‍යාත්මක දැනුමක් තිබූ අයෙකු බව මට අසන්නට ලැබිණ. ඔලිෆන් ගේ කටහඬේ තිබූ උච්ච ස්වරය නිසාම, ඔහු පැවසූදේ එක්වරම තේරුම් ගැනීමට මට අපහසු විය.

කහ පැහැති කෙස් තිබූ, පෙනුමෙන් එක සමාන තරුණයෝ දෙදෙනෙක් ද අපේ අමුත්තන් අතර වූහ. නිතරම එකට සිටි ඔවුන්, දවසේ වැඩි කාලයක් ගතකළේ බෝට්ටුවක නැගී එකිල් විලේ බිලි බාමිනි. ඔවුන් දෙදෙනාගේ නම් ඇන්ගස් හා ෆර්ගස් ජොන්ස්ටන් බව ඔවුහු පැවසූහ.

අනෙක් අය සමග වැඩි කතාබහක් නොකළ, වාම ඇඳුමෙන් සැරසුණු මැදිවියේ ජෝඩුවක් ද හෝටලයේ නවාතැන් ගෙන සිටියේය. ග්ලාස්ගෝ නගරයෙන් පැමිණ සිටි ඔවුන් හැමිෂ් මෝටන් මහතා හා එම මහත්මිය ලෙස අපට හඳුන්වා දෙන ලදී.

ඉතිරි අමුත්තා වූයේ කන් දෙකම හරිහැටි නොඇසුණු බෙයාඩ් ධූති මහත්මියයි. සැරයටියක උදව්වෙන් එහා මෙහා ගමන් කළ ඇය වයස්ගත වැන්දඹු කාන්තාවක් වූවාය.

මෙම ආකාරයේ අමුත්තන් පිරිසක් අතර, හිතවත් මිත්‍රශීලී බවක් හෝ සුහද කතාබහක් ඇති නොවීම පුදුමයක් නොවේ. කෙසේ වෙතත් විනෝදයට මසුන් ඇල්ලීම ගැන ජොන්ස්ටන් සහෝදරයන් අතර කතාබහක් ඇතිවූ විට, තරමක් නිශ්ශබ්ද මෝටන් යුවළ ද එයට හවුල් විය. ඔවුන්ගේ කතාබහේ මාතෘකාව වූයේ, මසුන් ඇල්ලීම සඳහා යොදාගන්නා උපකරණ වල, සාර්ථක අසාර්ථක භාවයයි.

මෝටන් මහත්මිය මේ සාකච්ඡාවට අපහසුවෙන් සවන්දීගෙන සිටියා මිස, එයට උනන්දුවක් නොදැක්වූ බව මම තේරුම් ගතිමි.





එකිල් විල හෝටලයේ නැවතී සිටි කාලය තුළ, චිත්‍ර කිහිපයක් සිතුවම් කිරීමට තමා බලාපොරොත්තු වන බව මෝටන් මහත්මිය මා සමග පැවසුවාය. කෙසේ වෙතත් කාලගුණය මේ දක්වාම එතරම් යහපත් නොවූ බැවින්, එළිමහනට වී චිත්‍ර ශිල්පයේ යෙදීමට, ඇයට ඉඩක් නොලැබුණු බැව් ඕ කීවාය. මෙහිදී වෛද්‍ය ඔලිෆන් ද අපේ කතා බහට එක්විය. කලා නිර්මාණ සඳහා මිනිසා උනන්දු වීමට පටන්ගත්තේ, මනුෂ්‍යයින් ලෙස දෙපයින් ඇවිදීම පටන්ගත් කාලයේම සිට යයි ඔහු මතයක් පළ කළේය. ඉන්පසු අපි තිදෙනා එක්වී චිත්‍ර ශිල්පීන් හා ඔවුන්ගේ සුප්‍රසිද්ධ සිතුවම් ගැන බොහෝ දේ කථා කළෙමු. මෝටන් මහත්මියට එම ක්ෂේත්‍රය ගැන පුළුල් අවබෝධයක් තිබූ බව මම වටහාගතිමි.

මේ කිසිදු කතාබහකට සහභාගී නොවූයේ ෂර්ලොක් හෝම්ස් පමණකි. ඔහු හාන්සි පුටුවකට වී දෑස් පියාගෙන සිටියේය. එහෙත් ඔහු කතාබහට සවන් දුන් බව මම දැනසිටියෙමි.

මඳ වේලාවකට පසු තම බිලිපිති, තංගුස් රෝල්, නොයෙක් ප්‍රමාණයේ හා වර්ග වල බිලි කොකු සහ අනෙකුත් මසුන් මරන ආම්පන්න, විසිත්ත කාමරය වෙත ගෙන එනු ලද්දේ ජොන්ස්ටන් සොයුරන් හා මෝටන් මහතා විසිනි. ඒවා සංසන්දනය කරමින් ඔවුහු ඒවායේ ගුණාගුණ ගැන සාකච්ඡා වල යෙදුණහ. මෙම විෂය ගැන මා දැන සිටියේ කරුණු ඉතාම ස්වල්පයක් බව මෙහිදී පැවසිය යුතුය. ඒ කතාබහට හවුල් වීමට මට හැකියාවක් නොතිබිණි. ඔවුන්ගේ කතාබහෙන් මා තේරුම් ගත්තේ, මොවුන් මසුන් ඇල්ලීම පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති අය ලෙසයි. ඉතින් පසුද, මෙම ක්‍රීඩාවේ යෙදීමට ගොස්, ඔවුන් ප්‍රශ්න වලට මුහුණ දුන් බව අසා, මම ඉමහත් පුදුමයට පත්වීමි.

බෝට්ටුවේ නැගී බිලිබෑමට එදෙන්ම පිටත් වී ගිය ජොන්ස්ටන් සොහොයුරෝ, සවස තේ වේලාවට ආපසු පැමිණියහ. ඔවුන්ගේ මුහුණු වලින් දකින්නට ලැබුණේ ලැජ්ජාවට පත් වූ ලකුණුය. ඇංගස් ජොන්ස්ටන්ගේ බිලි පිත්ත මැදින්ම දෙකට කැඩී ගොස් ඇත. මේ අතර ඔවුන් මාළුන් සඳහා දමා තිබූ බිලිකොකු රැගත් තංගුස් නූල් කිසියම් දෙයක පැටලී ඇත. ඒවා නිදහස් කරගැනීමට කළ උත්සාහයේ දී ෆර්ගස් ජොන්ස්ටන් බෝට්ටුවෙන් පෙරළී වතුරට වැටී ඇත. ඔහු බේරා ගැනීමට ඇංගස් කළ උත්සාහයේ දී ඔවුන් සතුව තිබූ දිගම යොත් රෝල වතුරට වැටී ගිලියාමෙන් එය ද අහිමි වී ඇත.



www.sinhalaelibrary.com

හැමිෂ් මෝටන් මහතා මුහුණදී තිබුණේ මීටත් වඩා බියකරු අත්දැකීමකටයි. එයින් පසුව ද තුවාල නොලබා හෝටලයට පැමිණීමට ලැබීම ඔහුගේ වාසනාවකි.

"මත්සායින් කිහිපදෙනෙකු අල්ලා ගැනීමේ අරමුණෙන්, මා තීරණය කළා බිලී බාන්න උදෙන්ම යන්න" මෝටන් කීය. "මගේ බිරිඳ මා සමග එන්න කැමැති වුණේ නැහැ. ඇයට උවමනා වුණා දිය ඇල්ල තියෙන තැනට ගිහින් චිත්‍ර අඳින්න.

මං ගියේ දුපත් තියෙන පැත්තට. සෑහෙන තරම් ජලාශය මැදට ගියාට පස්සේ දුටු දෙයින්, මං තරමක් භයවුණා. එකපාරට මං දුටුවා බෝට්ටුවේ අඩියෙන් ඇතුළට වතුර කාන්දු වෙන බව. මිනිත්තු පහක් ගියේ නෑ. වතුර කාන්දු වෙන වේගය බොහොම වැඩිවුණා. බෝට්ටුව ඇතුළට පිරුණු වතුර ඉවත් කරන්න, මා ළඟ කිසිම භාජනයක් තිබුණේ නෑ. වතුර ඇතුළට එන එක නවත්වන්න විධියක් තිබුණෙත් නැහැ. මා පුළුවන් තරම් වේග දමලා, විලේ ඉවුරට බෝට්ටුව පැද්දා. ඒත් ඉවුරට ළඟාවෙන්න මට හැකියාවක් තිබුණේ නෑ. වතුර පිරිලා බෝට්ටුව ගිලුණා. පස්සේ මං කොහොම හරි බේරී පීනාගෙන ඉවුරට ගියා.

"දෙවියෝ සාක්කි!" කළමනාකරු මර්ඩොක්ට කෑගැසිණ. "ඔබේ පණ බේරාගන්න හැකිවුණු එකත් ලොකු වාසනාවක්"

"බෝට්ටුව ගිලෙන්න යන බව පෙනුණොම ඔබට දෙවියන් සිහිවෙන්න ඇති?" වෛද්‍ය ඩලිංගන් ඇසීය.

"නෑ මහත්මයා" මෝටන් පිළිතුරු දුන්නේය. "ඉවුරට තිබුණේ අඩි විස්සක විසිපහක දුරක්. ඒත් මට කොහොම හරි පීනාගන්න පුළුවන් බව මං දැන හිටියා. මගේ හිතේ තැතියක් තිබුණේ මට පයින් යන්න සිදුවෙන දුර ගැන. මං එතෙර වුණේ හෝටලේට සම්පූර්ණයෙන්ම අනිත් පැත්තට නොවැ. ඉතින් මට විලේ ඉවුර දිගේ මහා වටයක් ඇවිදගෙන යන්න සිද්ධ වුණා. හැතැක්ම කීයක් ද මා දන්නේ නෑ. මගේ කකුල් දෙකේ ආබාධ කරගැට හා තුවාල. ඒවා කවද හොඳ වේවිද මං දන්නේ නෑ."

"ඔබේ උපකරණ හැම දෙයක්මත් ඔබට අහිමි වුණා, එහෙම නේද?" මර්ඩොක් ඇසීය.

"ඔව් හැම දෙයක්ම"

"ඒ ගැන කණගාටු වෙන්න එපා, මෝටන් මහත්මයා. අපි ඒ උපකරණ වල අලාභය ගෙවන්නම්" මර්ඩොක් කීය.





"ඒ ගැන අපි පස්සේ කතා කරමු. දැන් මම ගිහින් උණු වතුර ටිකක් නාලා, ටිකක් නිදාගන්න ඕනෙ." පැවසූ මෝටන් එතැනින් පිටවී ගියේය.

"මේ සංචාරක සමය අපට හරිම අවාසනාවන්ත කාලයක් තමයි" කළමනාකරු පැවසුවේ මෝටන් එතැනින් පිටවී ගිය පසුවය.

"මේ විධියට ගියොත් අපේ හෝටලයේ නවතින්න කිසිම සංචාරකයෙක් එන්නේ නැතිවෙයි. [illegible] සති දෙකකට කලින් බ්‍රිටන් නගරයෙන් ආවා තරුණ [illegible]. ඇය තරප්පුවේ ලිස්සා වැටුණා. ඇයට සෑහෙන්න තුවාල සිදුවෙලා, ඇයව රෝහල් ගත කරන්න සිදුවුණා. ඔබ මෙහේ එන්න දවසකට කලින් තමයි අනෙක් දේ වුණේ. හිල්ඩා [illegible] මෙහෙත් නිවාඩුවක් ගත කරන්න ආවේ ස්වින්ඩන් ඉඳලා. ඇය මෙහෙන් යන්න පෙර දවසේ, ඇගේ හිසට පළඳින, ඔහු ඇල්ලූ හිස් පළඳනාවක් නැතිවුණා. ඊළඟට අද මේ සිද්ධිය. මට හොඳටම විශ්වාසයි බෝට්ටු හැම එකක්ම ඉතාම හොඳ තත්ත්වයෙන් තිබුණු බවට. එඩිංබරෝ වලින් කාර්මිකයෙක් එනවා බෝට්ටු පරීක්ෂා කරන්න. මට ඔහු ගිය සතියෙ සහතික කළා බෝට්ටු හැම එකක්ම ඉතා හොඳ තත්ත්වයේ බවට. අනතුර මීට වඩා බරපතල නොවුණු එකට අපි දෙවියන්ට ස්තුති කරන්න ඕන" පැවසූ කළමනාකරු එතැනින් පිටවී ගියේය.

"බොහොම කලාතුරකින් වෙන දෙයක්. ඔහු බේරුණේ හොඳ වෙලාවට" මා කීවේ මෙතෙක් වේලා නිහඬවම සිටි මගේ මිත්‍රයාටයි.

"ඇත්තෙන්ම ඔව්" ශ්‍රී ලී හෝම්ස් නිහඬ විය.

මා බලාපොරොත්තුව සිටියේ තව දිනකින් හෝ දෙකකින් මසුන් ඇල්ලීම සඳහා බෝට්ටුවක නැගී එකිල් විලේ සංචාරයක යෙදීමටය. දැන් ඉතින් ඒ ගැන හෝම්ස්ට මතක් කිරීමවත් නිශ්ඵල ක්‍රියාවක් බව මගේ මිත්‍රයාගේ මුහුණ දුටු මට පැහැදිණි.

එදා රාත්‍රියේ ධාරානිපාත වර්ෂාවක් කඩා හැළිණි. එහෙත් පසුද උදෑසන වෙද්දී වැස්ස සම්පූර්ණයෙන්ම නැවතී තිබිණ. තවත් පැයක් පමණ ගතවෙද්දී හිරු පායා ආවෙන් අපට දීප්තියෙන් බබලන්නට විය.

එක් එක් අය එද දවස තුළ යෙදීමට බලාපොරොත්තු වන කටයුතු පිළිබඳව ප්‍රකාශ රැසක්, උදේ තේ මේසයේ දී අපට අසන්නට ලැබිණ. බොහෝ දෙනෙක් නිවාඩුව අවසන් කර සිතුරාද, ගම්වරවල් බලා



www.sinhalaelibrary.com

ආපසු යාමට නියමිත සිටි අයයි. එහෙයින් කිල්බුයි ගමේ අවසන් දිනය, අත්දැකීම් වලින් සපිරුණු එකක් කරගැනීම, කාගේත් අරමුණ විය.

"ඊයෙ අපට නොයෙක් ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිද්ධවුණු බව ඇත්තයි" ජොන්ස්ටන් සොයුරෙක් කීය. "ඒ වුණාට හැතිවුණු ශේඩ්වල් අලුතෙන් සපයාගෙන, කැඩුණු බිඳුණු ඒවා අලුත් වැඩියා කරගෙන අදත් අපි යනවා මාළු අල්ලන්න."

"අද අපි යන්නෙ දූපත් තියෙන පැත්තට" අනෙක් සොයුරා කීය. "මොනවා වුණත් ඊයේ තරම් අවාසනාවන්ත දෙයක් සිදුවෙන එකක් නැහැ"

තරුණ අය මෙසේ වික්‍රමාන්විත කටයුතු වලට සූදානම් වෙද්දී, වයස්ගත කෙනෙක් ද එබඳු කටයුත්තක යෙදීමට අදහස් කරන බව අසා, මම අතිශය පුදුමයට පත්වීමි. ඒ මෙතෙක් දිනක් හෝටලයටම වී කාලය ගතකළ වෛද්‍ය ඔලිෆාන්ය.

"මං කල්පනා කළා අද බෝට්ටුවකින් ස්ටැල්වා දූපත ගවේෂණය කරන්න. මේ යුරෝපයේ බොහෝම ආදිකල්පික ආදිවාසීන් නමා එලිසිංවරු. මට දැනගන්න ලැබුණා ස්ටැල්වා දූපතේ වයිකිං වරුන්ගේ සොහොන් ගැබ් කීපයක් තියෙනවා කියලා. ඒ ගැන ගවේෂණයක් කරන්න ලැබුණොත්, වැදගත් යමක් සොයා ගන්න බැරිවෙන්නෙ නෑ."

"මෝටන් මහත්මයයි. නෝනයි අද මොකද කරන්නෙ?" කළමනාකරු ඇසීය.

"අද අපි හිතාගෙන ඉන්නවා විරුයිමා දියඇල්ල බලන්න යන්න. මං කැමතියි දියඇල්ලේ අලංකාර දර්ශනයක් චිත්‍රයට නගන්න" මෝටන් මහත්මිය පැවසුවේ තම සැමියාට කථා කිරීමටවත් ඉඩක් නොතබමිනි.

"ඒක හැතැක්ම දහයක් දොළහක් දුර තැනක් නේ. ඔබ කොහොමද යන්නෙ?" කළමනාකරු ඇසීය.

"මං සේවකයෙකුට කිව්වා කුලී අශ්ව කරත්තයක් සූදානම් කරන්න කියලා" මෝටන් මහතා කීය.

"ඒක හරි අගේ ඇති විනෝද ගමනක්" කළමනාකරු මර්ඩොක් කීය. "ඔබට දවාලට කන්න සැන්ඩ්විච් පාර්සලයක් හා බොන්න දෙඩම් යුෂ බෝතලයක් අපි දෙන්නම්. පිටත්වෙන වෙලාවට කියන්න."





දීප්තිමත් දිනයක් වූ එදින අහසේ කිසිදු වැහි වලාවක් නොවීය. විල මතින් හමා ආ සිසිල් සුළඟේ පහස විඳිමින් හෝම්ස් සහ මම කිල්බුයි කඩ වීදියේ ඇවිද්දෙමු. අනතුරුව වරායත් තරණා එකිල් විලේ ඉවුර දිගේ ද සැහෙන දුරක් ඇවිද ගියෙමු.

තම අමුත්තන්ට මුහුණපාන්නට සිදුවූ හිරිහැර නිසා, කලින්ද රාත්‍රියේ මර්ඩොක් සිටියේ සෑහෙන කණස්සල්ලෙන් බව සැබෑය. එහෙත් මෙදින තිබුණේ ඊට ඉඳුරාම වෙනස් තත්ත්වයකි. එළියට ගිය කවුරුත් ආපසු හෝටලය වෙත පැමිණියේ සතුටෙනි. ආපසු එද්දී තරමක් රෑ බෝවී තිබුණත්, අවාසනාවන්තව මෙන් කිසිවෙකුට හෝ අනතුරු වලට මුහුණ දීමට සිදුවී නොතිබිණ.

අපි රාත්‍රියේ ආහාර වේල සඳහා කෑම ශාලාවට එකතු වූයෙමු. එහි තවත් අමතර මේසයක් සූදානම් කර තිබෙනු දැක අපි පුදුමයට පත්වීමු. එහෙත් එහි කෑම ගැනීමට අලුතෙන් කිසිවෙකු පැමිණි බවක් නොපෙනිණ. හෝටලයේ කළමනාකරු බිත්ති ඔරලෝසුව දෙස බලමින් සිටියේ, පැමිණීමට නියමිත අමුත්තන් ප්‍රමාද බව හඟවමිනි. එම අමුත්තන් කවුරුන් වුවත්, ඔවුන් ඉන්වනස් දුම්රියපොළේ සිටම එනවා ඇත්තේ කුලීරියකින් විය යුතුය. කුමක් නිසාද යත්, ඉන්වනස් සිට අප පැමිණි සම්බන්ධක දුම්රිය, මේ වන විට පිටත්වී ගොස් බොහෝ වේලාවක් ගතවී තිබූ බැවිනි.

රාත්‍රී ආහාරයෙන් පසු අප විසිත්ත කාමරයට වී කෝපි බොමින් සිටියදී, අමුත්තෝ දෙදෙනෙක් හෝටලයට ඇතුළුවූහ. කළමනාකරු බලාපොරොත්තුව සිටියේ මේ අමුත්තන් දෙදෙනා බව අපට අසන්නට ලැබිණ.

"මේ ඇලෙක්සැන්ඩර් ග්‍රයිස් පැටසන් මහත්මයා. මේ ඔහුගේ පුතුයා ඩොනල්ඩ්" කළමනාකරු අමුත්තන් අපට හඳුන්වා දුන්නේය.

"සන්තෝෂයි ඔබ හඳුනාගන්න ලැබීම් ගැන. කොහොමද මේ මහත්වරු දෙන්න මේ වෙලාවෙ ආවේ? විශේෂ අශ්වකරත්තයක් ඉන්වනස් ඉඳලම කුලියට ගත්තද?" මම ඇසීමි.

"නෑ මහත්මයා. අපි ආවෙ අපේම රුවල් යාත්‍රාවෙන්. ඒක අපි මෙහේ වරායේ නැංගුරම් දැම්මා" වැඩිමහල් ග්‍රයිස් පැටසන් පිළිතුරු දුන්නේය. ඔහු වයස අවුරුදු පනහක් පමණ වූ කෙට්ටු, සාමාන්‍ය උස ප්‍රමාණයේ පුද්ගලයෙක් විය. කළු පැහැති කොණ්ඩයක් තිබූ ඔහුගේ මුහුණේ, රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකොට තිබිණි. ඇලෙක්

ග්‍රයිස් පැටසන්ට තිබුණේ හරිවෙකු වැනි කපටි පෙනුමකි. ඔහුගේ පුත්‍රයා ඩොනල්ඩ් අවුරුදු විසිදෙකක පමණ තරුණයෙක් විය. තම පියාට වඩා අඟල් දෙකක් පමණ උසින් වැඩිවූ ඔහුගේ, කළු උඩුරැවුලක් තිබිණි. කෙසේ වෙතත් ඔහු පෙනීමෙන් ද දිස් වූයේ හරිවෙකු වැනි කෙරාටික පෙනුමකි.

ඔවුන් වෙනුවෙන් විස් සහ සැන්ඩ්විච්ස් ගෙන එන ලදී. සෙසු අමුත්තන් සමග කතාබහට මඳක් හෝ පමා නොවූ ඔවුන්, එවා ගිල දැමුවේ අධික කුසගින්නෙන් සිටි බැව් පෙන්වමිනි. කා බී අවසන් වෙද්දී, ඔවුනට කතාබහ කිරීමට බොහෝ දේ තිබූ බැව් පෙනිණ.

"මම එඩිංබ්‍රෝ නගරයේ නීතිඥයෙක්" වැඩිමහල් ග්‍රයිස් පැටසන් පැවසුවේ වෛද්‍ය මුලිගන්ගේ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙනි.

"අපි නීති උපදේශක කාර්යාලයක් පවත්වාගෙන යනවා. මගේ පුතාත් නීතිඥයෙක්. ඔහු තමයි මගේ තනිකර හවුල්කරුවා. අපි ව්‍යාපාර සම්බන්ධ නඩුවලටයි පෙනී ඉන්නේ"

"ඔබේ වෘත්තිය හුඟක් සිත් ඇදගන්නාසුලු එකක් වෙන්න ඇති?" මෝටන් මහත්මිය ඇසුවාය.

"එහෙම කියන්නත් බැහැ නෝනා" ඇලෙක් පැටසන් පිළිතුරු දුන්නේය. "වෙලාවකට අපේ නීති ක්ෂේත්‍රයේ වැඩ අපටම එපා වෙනවා. ඒ නිසා අපි අවුරුද්දකට සැරයක් නිවාඩුවක් ගන්නවා. මං පුතාත් එක්ක රුවල් නැවකට වෙලා මුහුදේ කාලය ගත කරනවා. අපට තියෙනවා "පෆින්" කියලා අඩි විසිපහේ පුංචි රුවල් නැවක්. හැම අවුරුද්දෙම සතියක් දෙකක් ඒ යාත්‍රාවේ අපි එහෙ මෙහෙ සංචාරය කරනවා.

පහුගිය කාලෙ අපි ක්ලයිඩ් මුහුදු බොක්ක පුරාම රුවල් නැවෙන් සංචාරය කළා. අයර්ෂයර් මුහුදු වෙරළෙන් පටන් අරගෙන, අපි කින්ටයර් දක්වා යාත්‍රා කළා. මේ අවුරුද්දේ අපි හිතාගෙන ආවෙ, ඉස්සරට වඩා හුඟාක් දුර යාත්‍රා කරන්නයි. අපි සැලසුම් කරගෙන ඉන්නේ බටහිර වෙරළ තීරය දිගේ ආගයිල් දක්වාම, නැත්නම් ඊටත් එහාට යන්නයි. මේ දක්වාම් නම් අපට සුළඟෙන් ඒ තරම් සහයෝගයක් ලැබුණේ නෑ. ඒ වුණත් තිබුණු පහසුකම් වල හැටියට අපට යාත්‍රා කරන්න හැකිවුණු තරම හොඳයි. අපි ගමන් කළේ බොහොම හෙමින්. කලබලේට ආවෙ නෑ. වෙරළ දිගේ තියෙන සිත්ගන්නාසුලු, හැම අස්සක් මුල්ලක්ම පරීක්ෂා කරල බැලුවා. අපි





හිතාගෙන හිටියේ අද ඉර බහින්න කලින් හිල්බුයි වලට ළඟාවෙන්න. ඒ වුණාට රුවල් පිරෙන්න තරම් හොඳ හුළඟක් හැමුවෙ නෑ. අන්තිම හැතැක්ම කීපය අපි ආවෙ හබල් ගාගෙන.

කොහොම හරි ඇඳිරි වැටෙද්දී, අන්තිමට අපි ඊකිල් බොක්කට ළඟාවුණා. ඔන්න එතකොට තමා මට මුහුණ දෙන්න වුණේ, මං ජීවිතේටම මුහුණ දීලා නැති විදියේ අමුතු අත්දැකීමකට. අපි ගමන පටන්ගනිද්දීම දැනගෙන හිටියා, අපි මේ දූපත්වල නොයෙකුත් අද්භූත දේවල් නිතර සිදුවෙන, ඉන්ද්‍රජාලික විශ්වාස බහුල, අරුම පුදුම ප්‍රදේශයකට බව. ඒත් අපි කිසි දවසක හිතුවෙ නෑ, අපිම ඒ අද්භූත ඒවලට ගොදුරු වේවි කියල."

කථාව මඳකට නවත්වපු ඔහු තමා ළඟ තිබූ විස්කි වීදුරුව අතට ගත්තේය. එයින් උගුරක් බී දමූ ඔහු ඉන්පසු වටපිට බැලුවේ, තම වචන වලින් ඇතිවුණු ප්‍රතිඵලය විමසා බැලීමට මෙනි. මීළඟට ඔහු කථාවේ ප්‍රධානම කොටස විස්තර කිරීමට පටන්ගත්තේය.

"අපි යාත්‍රා කළේ දූපත් වලට මැදින්. ඒ වෙලාවෙ ඒ තරම් සුළඟක් හැමුවෙත් නැහැ. ඒ නිසා අපේ ගමන කෙරුණේ බොහොම හෙමින්. ඉර බැහැගෙන ගියේ අපේ පිටිපසින්. ඔන්න අපට එක්වරම දකින්න ලැබුණා එක් දූපතක, පැරණි මාලිගා තුන්නක නටබුන්. ඒක තිබුණේ තරමක් ලොකු දූපතක. ඩොනල්ඩ් මොකද කළේ වහාම අපි ළඟ තිබුණු සිතියම් පරීක්ෂා කරල බැලුවා. ඔහු කිව්වා මේ දූපතේ නම උනා කියල. මේකෙ පුරාණ ආගමික සිද්ධස්ථානයක නටබුන් තියෙන බවත් සඳහන් බව ඔහු කිව්වා. එහෙම තැනක් හමුවුණාම නිකං අත් ඇරලා යන්න පුළුවන් ද? ඉතින් අපි තීරණය කළා දූපතට ගොඩ බැහැල ටිකක් සෝදිසි කරල බලන්න.

අපි අපේ පුංචි රුවල් නැව "පෆින්" මුහුදු වෙරළේ ඉඳල යාර තිහක් පමණ දුරින් නැංගුරම් දැම්මා. ඊළඟට අපි කුඩා බෝට්ටුවක නැගලා වෙරළට ආවා. ඒක වෙරළ අයිනේ, මුහුදු රැල්ලට ගසා ගෙන නොයන තැනක එළෙව්වා. අපි ගොඩබැස්සේ දූපතේ බටහිර පැත්තට. අපි ගොඩබහිද්දී සැහෙන්න කළුවරත් වැටිල. ඒ වුණත් අපි දුටුවා පඳුරු අතරින් වැටුණු අඩිපාරක්. ඒ හින්ද නටබුන් බලාගන්න හැකිවේවි කියලා අපේ විශ්වාසයක් තිබුණා.

මෙතන අපි හිතුවට වඩා දුෂ්කර ගමනක් බව තේරුණේ, ටික දුරක් ඉස්සරහට යද්දියි. මෝ පපු පාරෙ විසෙන කන්ද ඉහළට නැගීම.



www.sinhalaelibrary.com

විටෙක පල්ලෙහාට බැළුණ නටබුන් වුණු කුළුනත් පේන්නෙ නැතුව ගියා. දූපතේ බටහිර ඉඳන් නැගෙනහිරට යන්න, අපි හිතුවාට වඩා කාලයක් ගතවෙන බව දැන් අපට තේරුණා. දැන් ඉතින් අපට හිතිලා මේක නම් අපට වුණු ලොකු වැරැද්දක් කියල. නමුත් ආපහු හැරුණොත් මෙච්චර දුර ආව එකෙන් වැඩක් නැහැ නේද කියලා, ඉදිරියටම ගියා. පුතා ඩොනල්ඩ් කතාවේ ඉතිරි කොටස කියන්න." ජේෂ්ඨ ග්‍රයිස් පැටසන් තම පුතුයාට පැවසුවේය.

"ඒ වෙනකොට හොඳටම කළුවර වැටිලා." තරුණයා කථාව ඇරඹුවේය. "අපට කිසිම දෙයක් හරිහැටි පෙණෙනන්නේ නැහැ. අපට පෙනුණේ, හැම පැත්තකටම පාරවල් තියේනවා වාගේ. මෙකෙන් අපි යා යුත්තේ මොන පාරෙද කියන එකත් අපට හිතාගන්න බැරිව ගියා. අන්තිමට එක පාරක් පෙනුණා, නටබුන් තියෙන්නෙ අප ඉන්න තැනට බොහොම ළඟින්, ඉදිරියෙන් බව. විශාල කුළුන තිබුණා වම් පැත්තට වෙන්න. දකුණට වෙන්න ගරා වැටුණු ගොඩනැගිලි රාශියක්ම. ඉතින් ළඟට..."

ඔහු කථාව නවත්වා කෙළ ගිල්ලේය. කථාව යළි පටන් ගත්තේ ඉක්පසුවය.

"අපි ඒවාට තවත් ළං වෙද්දි, බොර ගල් කැබැලි වලින් සැදුණු බොහොම කඩතොලු සහිත එකක් බව අපි දුටුවා. අපි අන්ධකාරයෙම දුටුවා අප ඉදිරියෙන් යම් සෙලවීමක්. කළු පැහැති අවතාරයක් වැනි රූපයක් පාර හරහා ගමන් කළා!"

"කළු ඌරාගේ අවතාරය!" කළමනාකාර මර්ඩොක්ට කෑගැසිණ.

"මොකක්?" ඒ ප්‍රශ්නය වැඩිමහල් ග්‍රයිස් පැටසන් ගෙනි.

"ඔබ ඉන්නා මේ පළාත අද්භූත හොල්මන් ගැවසෙන, ඒවා අදහන රටක්" වෛද්‍ය ඔලිෆන් කීය. "යම් කෙනෙක් කළු ඌරාගේ අවතාරය දුටුවොත්, ඒ කියන්නේ එක දුටු පුද්ගලයාට දරුණු විධියට අවාසනාව ගෙන එන පෙර නිමිත්තක්".

"සමහර මිනිසුන් අතර මතයක් තියෙනවා කළු ඌරාගේ අවතාරය දුටුවොත් එය දුටු තැනැත්තා ඒ මොහොතෙම මරණයට පත්වෙනවා කියල" මර්ඩොක් තවදුරටත් පැහැදිලි කළේය.

"අපි දුටු අවතාරෙට නම් කොහොමටවත් ඌරෙකුගේ පෙනුමක් තිබුණේ නෑ." වැඩිමහල් ග්‍රයිස් පැටසන් කීය" ඒක අන්ධකාරයේ පෙනුණේ බිම වකුටුවෙලා හිටි මනුස්සයෙක් වගෙයි"





"ඒකෙ පුදුමයක් නෑ" මර්ඩොක් කීය. "අවතාරෙට පුළුවන් නොයෙක් වෙස් මවාගන්න"

"මට නම් පෙනුණේ අවතාරය මොනවා හරි ඇඳුම් ඇඳගෙන හිටියා, නැත්නම් රෙදි පොරවාගෙන හිටියා වගෙයි; නැත්නම් ලෝගුවක් වගේ එකක් ඇඳගෙන. කොහොම වුණත් ඒ ඇඳුම් බිම ඇතිල්ලෙද්දී, බිම දණගාගෙන වගේ, හතර ගාතෙන් ගියා කියලයි මට හිතුණේ" ඩොනල්ඩ් ග්‍රයිස් පැටසන් කීය.

"මේ දර්ශනයෙන් අපේ සිත් වල ලොකු භීති ගැනීමක් ඇතිවුණු බව අමුතුවෙන් කියන්න උවමනා නැහැ" පියා කීය. "අපි ගල් ගැහිලා වගේ නොසෙල්වී එහෙමම බලාගෙන හිටියා. අවතාරය නොපෙනී යද්දී අර කුළුනේ ඉහළ ජනේලයකින් එළියක් දැල්වුණා. මං හිතන්නේ මේ වෙලාවේ, භීතියට පත්වුණු මගේ පුතාගේ කටෙන් විලාපයක් නැගුණා"

"...තරහ වෙන්න එපා තාත්තේ කිව්වට" පුතා කථාවට බාධා කළේය. "ඒ වෙලාවේ විලාපෙ නැගුණේ තාත්තාගේ කටින්"

"හොඳයි හොඳයි කමක් නෑ. කාගෙ කටින් හරි කමක් නෑ, විලාපයක් නැගුණා කියමුකෝ. එක් මොහොතකින් කුළුන පහළ දොරක් ඇරුණා. ලන්තෑරුමක් අතින් අරගත්තු යෝධ මිනිහෙක් අප දිහාට ඇවිදගෙන ආවා"

"මැග්ලෙවින්" කළමනාකරු කීය.

"කවුද ඔහේ ඉන්නේ?" මේ යෝධයා ඇහුවෙ පළාතම දෙදරන හඬින්.

ඇංගස් ජොන්සන් තරුණයා කථාවට බාධා කළේය. "ඇයි මනුස්සයෝ මේක එන්න එන්නම, ග්‍රිම් සහෝදරයන්ගේ සුරංගනා කථාවක් වගේ වෙනවා නොවැ" කී ඔහු සිනාසුණේය.

"සම්පූර්ණ ඇත්ත" ග්‍රයිස් පැටසන් තාත්තා කීවේ තම කථාවට බාධා කිරීම ගැන අමනාපයෙනි. "නමුත් ඒ වෙලාවේ නම් අපට එහෙම හිතුණේ නැහැ. ඉදිරියට ගිහිං අපි කවුද කියලා ඔහුට හඳුන්වා දුන්නා"

"ඔහේලා දූපත නරඹන්න ඇවිත් තියෙන්නේ හොල්මං වෙලාවක නේ" යෝධ මිනිහා කිව්වා. ඉතින් මං ඔහුට තේරුම් කරල දුන්නා මේ දූපතේ මිනිසුන් ඉන්නා කරුණ අප දැන නොහිටි බව.

"අපේ සිතියමේ නම් තියෙන්නේ මේ දූපතේ තියෙන්නේ ගරා වැටුණු මාලිගාවක නටබුන් කියලයි" මං කිව්වා.



www.sinhalaelibrary.com

"හා එහෙමද?" ඔහු ඇසුවා. "ඒ කියන්නේ ඔහේලාගෙ සිතියම වැරදියි. විසිකරනවා ඔය කබල් සිතියම. ගන්නවා අලුත් එකක්. කමක් නෑ. තමුන්ගේ දෙපා ළඟට ආව මිනිහා කවුරු වුණත්, ඔහුව ආපහු හරවලා යැවීම කරන්නෙ නෑ. මැග්ලෙවින් කෙනෙක් කවදවත්. මහත්වරුනි. කරුණාකර එන්න මේ පැත්තට"

ඔහු පෙත්තුව පාර දිගේ අපි ඔහු පිටුපසින් ගියා. බොහොම ආගන්තුක සත්කාරශීලීව ඔහු අපව කැඳවාගෙන ගියේ. ඔහුගේ පරපුරේ පුරාවස්තු තැන්පත්ව තිබූ කෞතුකාගාරය වෙත.

"මං මෙතෙ ලාම්පු දල්වන්නේ නැහැ" ඔහු කිව්වා. "ඒ මොකද ඔබ ඉන්නෙ මෙහෙන් පිටවී යන්න හොඳුවසිල්ලෙන් නිසා. ඒ වුණත් මේ ලන්තෑරුම අරගෙන ගිහින්, කෞතුකාගාරය තුළ තිබෙන දේවල් හරගන්න. ඒ අනුවර් ඔබට උණුසුම් කරන්න මං මොනවා හරි සූදානම් කරන්නම්"

ඒක වේලාවකට පස්සෙ හොඳින් දල්වෙන ගිනිමැළයක් ළඟට එකතු වෙලා, අපි ඔහුගේ සුවසෙත පතා සවිදිය පිරුවා. අපි එතැන මිනිත්තු පහක් රැඳෙන්න ඇති. ඊළඟට ආපහු එන්න පිටත්වුණා. ඔහු දුන් ලන්තෑරුමත් අරගෙන අපි අපේ බෝට්ටුව නවත්වා තිබූ දෙසට පා නැඟුවා.

"ඔබට දකින්න ලැබුණු අද්භූත සත්ත්වයා නැත්නම් අවතාරය ගැන ඔබ ඔහුගෙන් ඇහුවද?" කිසිවෙක් ඇසීය.

"එහෙම අහන එක හොඳ නැහැ කියලයි මට හිතුණේ" ග්‍රයිස් පැටසන් පිළිතුරු දුන්නේය.

"ඔවුන් ළඟ බල්ලෙක් ඉන්නවද?" මම ඇසීමි.

"නැහැ. දූපතේ බැටළුවන් හෝ වෙනයම් සතුන් ඇති කරන්නේ නැහැ"

"කිසි සැකයක් නැහැ. ඒ කළු ලාරිගේ අවතාරය තමයි." මර්ඩොක් යළිත් කීය.

"ඔහොම ඉන්න මහත්වරුනි. අපේ කථාව තවමත් ඉවර නැහැ"

"අනේ දෙවියනේ" මෙවදය මලිෆාන් කීය. "ඔය කථාවේ තවත් විකුමාන්විත කියා තියෙනවාද?"

"ඇත්තෙන්ම ඔව්. කථාවේ පුදුමාකාරම කොටස ඔබ ඇහුවේ නැහැනේ. ඉතින් අපි දූපතේ නැගෙනහිර කෙළවරට ආවා. හඳ කළුවරක් තිබුණා වුණත්, ලන්තෑරුමේ එළිය බොහොම දුර්වල වුණත්, අන්තිමට





අපි ගොඩබැහැපු තැනට ළඟා වුණා. එතැන තමයි අපි කුඩා බෝට්ටුව රඳවලා ගියේ..." ඇලෙක් ග්‍රයිස් පැටසන් භය වුවාක් මෙන් දෑස් ලොකු කරගෙන නිහඬවම අප දෙස බලා සිටියේය.

"ඇයි මොකද වුණේ?" මම ඇසීමි.

"අපේ බෝට්ටුව අතුරුදන් වෙලා!"

"මොනවා?"

"ඔව්. මට හොඳටම විශ්වාසයි අපි ඒ බෝට්ටුව බොහොම ආරක්ෂා සහිත තැනක රඳවලයි ගියේ. ඒක මුහුදු රැල්ලෙන් ගසාගෙන යන්න කිසිම ක්‍රමයක් නෑ. එත් බෝට්ටුවට මොනවද වුණේ?

අපට වෙන කරන්න කිසිම දෙයක් ඉතිරි වෙලා තිබුණේ නෑ. අපි ආයෙමත් ගියා මැග්ලෙවින් මහත්මයා හොයාගෙන. අපව තව සැරයක් දකින්න ඔහු කැමැති වුණේ නෑ. කොහොම වුණත් ඔහු අපව ඔහුගේ යාත්‍රාවට නංවාගෙන, අපේ කුඩා රුවල් නැව "පෆින්" වෙත අපව කැඳවාගෙන ගියා. කථාවේ ඉතිරි හරිය කියන්න ඩොනල්ඩ්"

"ඉතින් මැග්ලෙවින් මහත්තයාගේ යාත්‍රාවෙන් අපේ නැවට ළං වෙද්දී, අපි ආපහු හැරිල බැලුවා. දෙවියනේ මෙන්න අපේ බෝට්ටුව තියෙනවා, අප තැබූ තැනම.

ඒක දුටුව මැග්ලෙවින්ට ටිකක් කේන්ති ගියා. ඔහු කිව්වා "පැහැදිලිවම ඔහේලට පාර වැරදිලා. ඔහේලා ගිහින් තියෙන්නේ වැරදි තැනට. මීට පස්සෙ ඔහේලා බෝට්ටු වලින් කරන ගමන් බිමන් එඩිංබ්‍රෝ නගරයේ වීථි වලට සීමා කරන්න"

"ඒක එතැනින්ම ඉවර වෙන්න තිබුණා" පියා යළිත් කථාව ඇරඹුවේය. "මට නම් හොඳටම විශ්වාසයි, අපි කලින් බලද්දී බෝට්ටුව එතැන නොතිබුණු බව. කොහොම හරි අපි අපේ බෝට්ටුව ළඟට ගිහින් ඒකට නැගලා නැවට ගියා. මේ යද්දි බෝට්ටුවේ තිබිලා ඩොනල්ඩ්ට හම්බ වුණා අමුතු මුදයක්. පෙන්වන්න පුතේ ඒක."

තම සාක්කුවට අත දමූ ඩොනල්ඩ් එළියට ගත්තේ විශාල දුනු පිහියකි. එහි නමා තිබූ පිහිතලය ඔහු දිග හැරියේය. තලය පුළුල් ශක්තිමත් එකක් වූ අතර, එහි තුඩ ඉතා අසාමාන්‍ය ලෙස තහරැස් වූ බව අපි දුටුවෙමු.

"මෙක අපේ එකක් නොවෙයි." පියා කීය. "ඉතින් කොහොමද මේක අපේ බෝට්ටුවට ආවෙ?"

"ඒක මට බලන්න දෙනවද?" මෙතෙක් වේලා නිහඬව සියල්ල අසා සිටි හෝම්ස් පිහිය ඉල්ලාගෙන පරීක්ෂා කළේය. "ෂෙෆීල්ඩ්හි

සාදන ලදී කියල මෙහෙ සඳහන් වෙනවා. ඒකෙ නම් පුදුම වෙන්න දෙයක් නැහැ. තලයේ කෙළවර හතරැස් වුණේ පිහියේ තුඩ කැඩී යාම නිසා. එහෙම වුණේ ඇයි? නිසැකවම කවුරු හරි සැහෙන බලයක් පිහිතලයට යොදන්න ඇති"

මෙම පිහිය සෑම දෙනෙකුගේම අතින් අතට ගොස් පරීක්ෂාවට ලක්විණි. කවුරුත් මුමුණමින් යම් යම් ශබ්ද කීවත්, වැදගත් යමක් අපට අසන්නට නොලැබිණි.

"කවුරු හරි ඔහේලාට විජ්ජා පෙන්වලා තියෙනවා" වෛද්‍යවරයා කීය.

"මනුස්සයෙක් ද භූතයෙක් ද?" එසේ ඇසුවේ මර්ඩොක්ය.

"බොහොම දඟකාර භූතයෙක්" මෝටන් මහත්මිය කීවාය.

ෂර්ලොක් හෝම්ස් මේ ගැන කිසිදු මතයක් පළ නොකළේය. පසුව මම මේ පිළිබඳව ඔහුගෙන් ඇසීමි. ඔහු තම හිස සොලවමින් සිනාසුණේය.

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීය. "පහුගිය කාලෙ අපි විවිධාකාරයේ අත්දැකීම් රාශියකට මුහුණදීලා තියෙනවා. ඒ නිසා මං මේ කියන කාරණය ඔබ හොඳින් තේරුම් අරගෙන ඇති. විසඳුමේ නැති අභිරහසක තියෙනවා වොට්සන්, සිත් ඇදගන්නාසුලු අද්භූත, චමත්කාරජනක ගතියක්. නමුත් මේ අභිරහස විසඳුනාම ඒ චමත්කාරය එතැනින් ඉවත්වෙලා යනවා. මේ අභිරහසක් නිසා තමන්ට පෞද්ගලිකව අලාභහානි සිදුවෙලා නම්, සිදුවෙනවා නම් මොකද වෙන්නෙ? එහෙනම් මිනිස්සු කැමැතියි ඒ අභිරහස විසඳා ගන්න. නමුත් එහෙම පාඩුවක් සිදුවෙන්නෙ නැත්නම්? එහෙනම් මිනිස්සු කැමැතියි අභිරහස හෙළි කර නොගෙන, ඒ චමත්කාර බවේ, රසවත් බවේ ආශ්වාදය රස විඳින්න. ග්‍රයිස් පැටසන්ලගෙ අභිරහස විග්‍රහ කරල, පැහැදිලි කළ හැකි විසඳුම්, අඩුම වශයෙන් හතක්වත් මට දිය හැකිව තිබුණා. ඒ වුණත් එතැන රැස්වෙලා හිටි අය විඳිමින් සිටි ආශ්වාදයට, චමත්කාරයට බාධා කරන්න මට හිතුණේ නෑ. අනික් ඒ වෙලාවෙ එහෙම දෙයක් මගෙන් අපේක්ෂා කළේ නෑ වොට්සන්"

එම කතාවෙන් පසු එදා රාත්‍රියේ අපි නින්දට ගියෙමු. ඒ නිසා ග්‍රයිස් පැටසන්ලාගේ අපූරු අත්දැකීම පිළිබඳව කථාන්තරය එතැනින්ම නිමවීමට ඉඩ තිබිණ. එහෙත් මීළඟට ඇති වූ සිදුවීම නිසා, සිද්ධිය වෙනත් අතකට පෙරළිණි.





පසුවදා උදයේ හෝටලයේ භෝජනාගාරයේ අපි උදේ කෑම ගනිමින් සිටියෙමු. කිසිවෙකු උස් හඬින් කෑගෝ බැණ වදින ශබ්දයක් විසිත්ත කාමරය දෙසින් අසන්නට ලැබිණ. මොහොතකට පසු කළමනාකරු පසෙකට තල්ලු කර දමමින්, භෝජනාගාරයේ දොර ඇරගෙන එහි ඇතුළුවූයේ යෝධ පුද්ගලයෙකි. ඔහුගේ අවුල් වූ තැඹිලි පාට කෙස්වැටියත්, තැඹිලි පාට රැවුලත් නිසා, ඒ කවුදැයි අපි පහසුවෙන් හඳුනාගත්තෙමු. ඒ උගා දූපතේ ප්‍රභූවරයා වූ මැග්ලෙවින් මහතාය. ඔහු සමග පොලිස් නිලධාරියෙක් ද විය. උදෑසන ආහාරය ගනිමින් සිටි අපි මේ දසුනෙන් කණිමඳුහ වූයෙමු.

අප සෑම කෙනෙකුගේම මුහුණු පරීක්ෂා කරමින් මැග්ලෙවින් ඉදිරියට පා නැගුවේය. අවසානයේ ඔහු නැවතුණේ ග්‍රයිස් පැටසන් පිය පුතු දෙපළ අසලය.

"මෙන්න ඉන්නවා මහා හක්කඩියෝ" මැග්ලෙවින් ගිගුරුවේය. "මං පහරන හොරු! මැක්ෆර්සන්. ගන්නවා මුං දෙන්න හිරභාරයට"

අනෙක් සැමදෙනාකුම මෙන්ම ග්‍රයිස් පැටසන් දෙදෙනා ද, මේ හදිසි ගෝරනාඩුවෙන් ගල්ගැසී සිටියහ. කෑම සහිත හැන්ද මුවට ළං කරමින් සිටි පියාගේ, හැන්ද ද අතර මග හැමුණි, කට ඇරී තිබුණේ, මේ කිසිවක් තේරුම් ගැනීමට අපහසු වූ අයුරිනි. තත්පර කිහිපයකදී සිහි එළවාගත් ඔහු අසුනෙන් නැගිට්ටේය.

"මොන යක්ෂ කතාවක් ද ඒ?" ඔහු කෝපයෙන් කෑගැසීය. "මොකක් ද ඔහේගෙ කතාවෙ තේරුම?"

"තේරුම?" මැග්ලෙවින් පෙරළා ඇසුවේ එවැනිම කෝපාවිෂ්ඨ ස්වරයකිනි. "මං උඹලට දක්වූ ආගන්තුක සත්කාරයට උඹල කෙළෙහි ගුණ සැලකූ හැටි ද ඒ? අන්ධකාරයේ අතරමං වෙලා හිටි තොපිට පාර පෙන්වලා දුන්නට, තොපි මෙහෙමද මට සැලකුවේ? මං බොහොම ආශාවෙන් [illegible] ආරක්ෂා කළ මගේ මුතුන් මිත්තන්ගේ උරුමය, මැග්ලෙවින් ගාඩුව තොපි හොරකම් කළා!"

"ඔහේ මොන බහුබූතයක් දොඩවනවද මං දන්නෙ නෑ" ග්‍රයිස් පැටසන් පියා පිළිතුරු දුන්නේය. "මං කිසිම දෙයක් හොරකම් කළේ නෑ. මට අයිති නැති දෙයක්, මං මගේ ජීවිතේට හොරකම් කරල නෑ. ඔහේගේ ඔය කියන යක්ෂ පරපුරක ගාඩුවක්, මං මගේ ඇස්දෙකට දැක්කෙත් නෑ."

එම පිළිතුරට මැග්ලෙවින්ගේ මුහුණ කෝපයෙන් කළුවිය. නළල දෙපස ලේ නහර කැපී පෙනෙන ලෙස ඉහළට ඉල්පිණි.



www.sinhalaelibrary.com

"උඹ මහා කාලකණ්ණි හොරෙක්! හොරකම් කළා මදිවට, මගේ ගෞරවනීය පරපුරට අපහාස කරන්න උඹට ලැජ්ජා නැති හැටි. මිනිහෝ උඹ අංක එකේ තක්කඩියෙක්..."

මේ ආකාරයට දෙදෙනා අතර නටගත් අශෝභන, අශ්ලීල වාග් සංග්‍රාමය බොහෝ වේලාවක් පැවැතිණ. හෝටලයේ කළමනාකරු හා පොලිස්භටයා කොපමණ උත්සාහ දැරුවත් එය සමථයකට පත් කිරීමට නොහැකි විය. අන්තිමේ දී මැග්ලෙවින් දෑත් මිට මොලොවා ගෙන සූදානම් වූයේ, නීතිඥයාට පහර දීමටයි. මැක්ෆර්සන් නම් පොලිස්භටයා ඒ මැදට පැන, පොරබැටි සිටි දෙදෙනා දෙපසට කළේය.

"මහත්වරුනි! මහත්වරුනි!" ඔහු කෑගැසුවේය. "මහත්වරුනි, කරුණාකරලා මං කියනදේ අහන්න. අපි මේ ප්‍රශ්නය සාකච්ඡා මගින් විසඳාගමු. ශිෂ්ටාචාර මිනිසුන් කරන විධියට කථා කරලා විසඳාගමු."

පොලිස් භටයාගේ එම මැදිහත් වීම නිසා ඔවුනු මදක් සන්සුන් වූහ. කළමනාකරුගේ බලවත් ඉල්ලීම නිසා මැග්ලෙවින් මහතා පුටුවක වාඩිවිය. මී ළඟට ඔහු තමාගේ පැමිණිල්ල ඉදිරිපත් කළේය. ඒ අනුව කාරණා සියල්ල හෙළිදරව් කෙරිණි.

උණා දූපතේ ප්‍රභූවරයාට තම වටිනා රිදී ගාංචුව අන්තිම වරට දකින්නට ලැබී ඇත්තේ කලින් දවසේ අපරභාගයේදීය. ඒ ඔහුගේ කෞතුකාගාරයේ බඩු යළි සකසමින් සිටියදීය. ග්‍රයිස් පැටසන් මහතා සහ ඔහුගේ පුතුයා උණා දූපතට පැමිණි වෙලේ, මැග්ලෙවින් විසින් ඔවුන් කෞතුකාගාරය ඇතුළට කැඳවා ගෙන ගොස් නොමැත. තමුන් ලන්තෑරුමක් දල්වා දී ඔවුනට කැමැති නම් එය නරඹන ලෙස දැනුම් දුන් බව මැග්ලෙවින් කීය. මිනිත්තු දෙකක් හෝ තුනක් එය නැරඹූ පියා හා පුතා, පසුව මැග්ලෙවින් සමග මධුවිත පානයට එකතුවී ඇත. පසුව පොතක් ගෙන ඒම සඳහා කෞතුකාගාරයට ගිය මැග්ලෙවින්ට, මිල කළ නොහැකි වටිනාම වස්තුව වූ රිදී ගාංචුව, අතුරුදන් වී ඇති බව දකින්නට ලැබිණි.

"ඔබේ වටිනා ගාංචුව, හොරුන්ට ගන්න බැරි විධියට වීදුරු පෙට්ටියක් තුළ ආරක්ෂිතවද තිබුණේ?" වෛද්‍ය ඔලිෆන් ඇසීය.

"නැහැ" මැග්ලෙවින් පිළිතුරු දුන්නේය. "මේසයක් මත නැවු විල්ලුද රෙදි කොට්ටයක් මතයි එය තබා තිබුණේ"





"ඊයේ දවසට ඔබේ කෞතුකාගාරයට ආ අමුත්තෝ කවුද?"

"වෙන කිසිකෙනෙක් ආවෙ නෑ. ග්‍රයිස් පැටසන්ල විතරයි ආවෙ"

"මේ කෞතුකාගාරයේ දොර හැමවිටම වසා දමලද තියෙන්නේ?"

"ඔව්"

"කවුරු හරි දොර අගුළු කඩාගෙන හෝ යතුරකින් විවෘත කරගෙන ආ සලකුණු තිබුණාද?"

"නැහැ"

"ඔබ කියන්නේ මේ රිදී ගාංචුව ගන්න ඇත්තේ ග්‍රයිස් පැටසන් වරුන්මයි කියලා?"

"මහත්මයා, වෙන කිසි කෙනෙක් ඊයේ දවසට මගේ ගෙදරට වත් ආවෙ නැතිකොට, ආවේ ඒ දෙදෙනා පමණක් නම්, ගාංචුවට මොකද වුණේ?" මැග්ලෙවින් ඇසීය.

එයට දියහැකි පිළිතුරක් කිසිවෙකුට තිබුණේ නැත. එඩිංබරෝ නගරයේ නීතිඥයින් දෙදෙනා මේ හොරකම කර ඇති බව වතුව ලැබෙන සාක්ෂි වලින් තහවුරු වේ. කලින් ද හැන්දෑවේ ඔවුන් කළ කතාබහ අනුව, මෙවැනි අවනීත කටයුත්තක යෙදෙන අය යයි සිතීමටත් අපහසුය.

"ග්‍රයිස් පැටසන් මහත්මයා" වෛද්‍ය ඔලිෆන් පියා ඇමතුවේය. "මැග්ලෙවින් මහත්මයා සඳහන් කරන ගාංචුව ඔබ දුටුවාද?"

"ඔය කියන ආකාරයේ ගාංචුවක්, මම දක්ක බවක් වත් මතක නැහැ මහත්මයා. ඔහුගේ ඉල්ලීම නිසා කෞතුකාගාරයේ තිබුණු දේවල් දිහා, අපි යන්තම් බැල්මක් හෙළුවා. එහි වැදගත් යමක් දුටු බවක් මට සිහිකරන්නවත් බැහැ." ඇලෙක් ග්‍රයිස් පැටසන් පිළිතුරු දුන්නේය.

ඒ අනුව ගැටලුව දැන් ලිහාගත නොහැකි තැනකට පැමිණ ඇති බැව් මම වටහා ගතිමි. මෙය පහසුවෙන් විසඳිය හැකි අවුලක් නොවේ. මගේ දෑස් ඉබේටම යොමු වූයේ මගේ මිත්‍රයා වෙතයි.

මෙතෙක් වේලා සියල්ලම නරඹමින් කතාබහට සවන් දීගෙන සිටි හෝම්ස්, තම පුටුව පිටුපසට කරමින්, කෑම මේසයෙන් නැගී සිටියේය. ඔහු කථාකළේ කවුරුත් ඔහු දෙසට අවධානය යොමු කළ පසුවය.

"මහත්වරුනි, ඔබ මා ගැන සමහර විට අහලත් ඇති. අහල නැතුවත් ඇති. මගේ නම ෂර්ලොක් හෝම්ස්. අපරාධ පිළිබඳව



www.sinhalaelibrary.com

කාලයක් තිස්සේ අධ්‍යයනය කිරීම මගින්, ඒවා විසඳීම පිළිබඳව මටත් සුළු දැනුමක් තියෙනවා. ඔබ කාගෙවත් විරුද්ධත්වයක් නොමැති නම්, මං කැමතියි මෙය විසඳන්න මැදිහත් වෙන්න"

"බොහොම හොඳයි මහත්මයා" කළමනාකාර මර්ඩොක් කීය. "ඔබ වැනි කෙනෙකුගේ මැදිහත්වීමක් අවශ්‍යම වෙලාවක් මේක"

"අපි හෝම්ස් මහත්තයාගේ හපන්කම් ගැන පුවත්පත් වල කියවලා තියෙනවා" පොලිස් හට්‍යා කීය. "මේ ගැටලුව විසඳා දිය හැකි නම් ඒ ඔබට අතිශයින්ම [illegible] වෙනවා මහත්මයා"

"හොඳයි" හෝම්ස් කීවේ සතුටෙන් තම දෑත් පිරිමදිමිනි. "මං හිතන්නේ කවුරුන් හෝ අත්අඩංගුවට ගැනීමක් කරන්න පෙර, අපරාධය සිදු වූ තැන හොඳින් පරීක්ෂා කර බැලිය යුතුයි. කවුරුන් හෝ අපරාධකාරයෙක්ද අහිංසකයෙක්ද කියල තීරණය කළ හැක්කේ, හැබැයි අපට දකින්න ලැබෙන හෝඩුවාවන් අනුව"

"මොන විකාර කතාවක්ද ඒ?" මැග්ලෙවින් ඇසුවේ හෝම්ස් ගැන තමාට විශ්වාසයක් නැති බව හඟවමිනි.

"මැග්ලෙවින් මහත්මයා" පොලිස් හට්‍යා කීය. "මේ ෂර්ලොක් හෝම්ස් මහත්තයා කියන දේ අහන්න. අපි මුලින් අපරාධය සිදුවුණු තැන පරීක්ෂා කරල බලන්න ඕන. ඔබ කිව්වා වගේ ක්ෂණිකවම අර මහත්වරු දෙදෙනා සිරභාරයට ගැනීමක් කරන්න බැහැ. හෝම්ස් මහත්මයා ඔබට හැකිද අපට උදව්වෙන්න?"

"ඇත්තෙන්ම ඔව්"

මේ අනුව හෝම්ස් හා පොලිස් නිලධරයා අතර සාකච්ඡාවක් කෙරිණි. ග්‍රයිස් පැටසන්ලාට අයත් යාත්‍රාව, තාවකාලිකව පොලිස් භාරයට ගැනීමටත්, සියලුම අමුත්තන්ට හෝටලයෙන් පිටවී යාම තහනම් කිරීමටත්, පියවර ගැනිණි. එම ප්‍රදේශයේ පොලිස් බලතල තිබූ දෙදෙනකු කැඳවා, ඒ සඳහා යොදවා, අපි උගා දූපත බලා පිටත්වීමට තීරණය කළෙමු.

ගමනට යොදාගත්තේ මැග්ලෙවින් මහතාට අයත් 'ඇල්බා' නම් වාෂ්ප බලයෙන් ධාවනය කරන බෝට්ටුවයි. ගමනට සහභාගි වූයේ ඩෙක්ෆර්සන් නම් පොලිස් නිලධරයා, ඇලෙක් ග්‍රයිස් පැටසන්, මැග්ලෙවින්, ෂර්ලොක් හෝම්ස් සහ මා ය.

අප උගා දූපතට ළං වෙද්දී මැග්ලෙවින්ගේ නටබුන් මාලිගාවේ කළු පැහැති කුළුන පේළියක් දක්නට ලැබිණි. ඒ අවට තිබුණේ





සම්පූර්ණයෙන්ම පාළුවට ගිය භූමියයි. මෙවැනි ජනශූන්‍ය පාළු කාන්තාරයක් වැනි තැනක, මගේ මිත්‍රයා අපරාධ පරීක්ෂණයක මීට කලින් යෙදී තිබුණු බවක්, මට සිහිකළ නොහැක. උගා දූපතෙන් උතුරට වන්නට තවත් කුඩා දූපත් කිහිපයක් විය. මුහුදේ රළගෙඩි ඒ මත වේගයෙන් වැදී, පෙණකැටි වලට හැදී සයුර පුරා විසිරී යන අයුරු අපට දැක ගන්නට ලැබිණි.

මැග්ලෙවින් ඔහුගේ යාත්‍රාව, ඒ වෙනුවෙන් තනා තිබූ ජැටියට ළං කළේය. එය බොහෝ සෙයින් අබලන්ව තිබූ අට්ටාලයකි. ඔහුගේ සේවකයා වූ වයස්ගත මුද්දරයෙක් ජැටියට පැමිණ මැග්ලෙවින් විසිකළ කඹය අල්ලා ගත්තේය. අපි බෝට්ටුවෙන් ජැටිය මතට බැස්සෙමු.

"කෙටි එහෙත් බෑවුම් සහිත මගක අපි ඉහළට නැගුණෙමු. මඳ වෙලාවකදී මැග්ලෙවින්ගේ වාසභවනය වූ නටබුන් වූ මාලිගාවට ළඟාවීමට අපට හැකි විය. එය දිගින් අඩි 20ක් සහ පළලින් අඩි 20ක් පමණ වූ අත්තිවාරමක් මත, ඉහළට ගොඩ නංවා තිබූ කුළුනකි. කුළුනේ තැනින් තැන කුඩා ජනේල ද දැකිය හැකි විය. එයට පිටිපසින් තනි තට්ටුවේ ගොඩනැගිල්ලක් විය. උසින් අඩි දහයක් පමණ වූ එය, පහත් වහලක් සහිත දිගු කාමරයක් වැනි විය. කෞතුකාගාරය වූයේ මෙම ගොඩනැගිල්ලය.

මැග්ලෙවින් අප එහි කැඳවාගෙන ගියේය. එහි බිත්ති තනා තිබුණේ ගල් වලිනි. කලකට පෙර බලකොටුවක් වූ මෙය කඩා බිඳගෙන, කිසිවෙකුට ඇතුළු විය නොහැකි බව අපි දුටුවෙමු. කඩු, කිණිසි, තෝමර, පළිහ ආදී පුරාණ අවි ආයුධ ද සිතියම් හා පැරණි චිත්‍ර ද බිත්ති වල එල්ලා තිබිණි. වම පසින් වූ බිත්තියේ එක දිගටම ජනේල කිහිපයක් විය. ඒවා ඇතුළතින් අගුළු දමා වසා තිබූ අතර, ආරක්ෂාව සඳහා හරස් අතට සවිකළ යකඩ පොලු ද විය.

කෞතුකාගාරය තුළට එළියෙන් ආලෝකමත් වීම සඳහා වහලේ තැනින් තැන වීදුරු සවිකොට තිබිණි. මේවා විවෘත කළ හැකි ඒවා නොව, වහළටම සවි කොට තිබූ ඒවා බව මැග්ලෙවින් අපට පැවසුවේය. අප ඇතුළු වූ ප්‍රධාන දොරටුව හැරුණු විට කෞතුකාගාරයට ඇතුළුවීමට වෙනත් කිසිදු දොරටුවක් නොවූ බව අපි දුටුවෙමු. වීදුරු අල්මාරි සහ මේස කිහිපයක් ශාලාව තුළ විසිරී තිබිණි. ශාලාව මැද වූ අඩි හතරක් පමණ උස් වූ කුඩා මේසයක් මත

රතු පැහැති විල්ලුද කොට්ටයක් විය. වටිනා පෞරාණික ගාංචුව අතුරුදන් වීමට පෙර තබා තිබුණේ මෙහි බව, එහි අයිතිකරුවා අපට පැවසීය. කුඩා ආභරණයක් දීර්ඝ කාලයක් තිබීම නිසා සිදුවන අයුරෙන් විල්ලුද කොට්ටයේ මතුපිට, පහතට එබී ගොස් තිබූ අයුරු පැහැදිලිවම දුටුවෙමු.

අපට පිටිපසට වීමට දැනුම් දුන් හෝම්ස්, එම විල්ලුද කොට්ටය ඉතා සැලකිල්ලෙන් පරීක්ෂාවට ලක් කළේය. විශාලක තමාටම කොඳුරා ගනිමින්, විශාලක තිහඬව කල්පනා කරමින් කළ මේ සොයාබැලීම අවසානයේ, ඔහුගේ ඇස් දීප්තියෙන් බැබළුණු අයුරු මම දුටුවෙමි. නැගැයෙන් ඉවතර බලා ඉවත් අස්වූ විට, සුනඛයෙකුගේ ඇතිවන පිබිදීමට සමාන පිබිදීමක්, හෝම්ස් කෙරෙන් දිස්විය. මේ කිසිවක් තේරුම් ගැනීමට නොහැකි වූ ග්‍රයිස් පැටසන් සුදානම් වූයේ, හෝම්ස් ගෙන් ප්‍රශ්න ඇසීමටයි. මම මගේ දෙතොල් හරහා ඇඟිල්ල තබා, ග්‍රයිස් පැටසන්ට නිශ්ශබ්ද වන ලෙස සංඥා කළෙමි.

"මහත්තයා." හෝම්ස් කතා කළේ මැග්ලෙවින්ටයි. "ඔබේ ගාංචුව මේ කොට්ටයට මොකකින් හරි සවිකරලද තිබුණේ?"

"නැහැ"

"නැහැ? නමුත් මේ විල්ලුද රෙද්දේ මතුපිට යන්තමින් ඉරී ගිය සලකුණක් තිබෙනවා. හරියට එහි සවි කොට තිබූ දෙයක් බලෙන් ඉවත් කළා වගේ"

"කෝ බලන්න" පැවසූ මැග්ලෙවින් ඉදිරියට පැමිණ එය පරීක්ෂා කර බැලුවේය. "මහත්තයා, මම කවදාවත් මීට පෙර දැකලා නැහැ. ඒ කියන්නේ මෙක ඊයේ සිදුවුණු දෙයක්"

මීළඟට පොළව මත දණ ගස්වාගත් ෂර්ලොක් හෝම්ස්, මුහුණ ද පොළොවට ළං කළේ දෑත් බිම තබමිනි. ඒ මේසය අවට වූ පොළොව ඔහු සියුම් ලෙස පරීක්ෂාවට ලක් කළේය. මඳ වේලාවක් ගත වෙද්දී ඔහුගේ මුවෙන් ජයග්‍රාහී හඬක් නැගිණි. තවත් මිනිත්තු කිහිපයකින් පොළොව පරීක්ෂා කොට නැගී සිටි ඔහු, සොයාගත් දෙය තම අතේ තබාගෙන, අප දෙසට දිගු කළේය.

එහි වූයේ අඟලෙකින් 1/8ක් පමණ වූ ලෝහයෙන් තැනූ කුඩා ගෝලාකාර වස්තුවකි.

මෙය තමාට හඳුනාගත නොහැකි බව හඟවමින්, මැග්ලෙවින් දෙඋර හැකිළුවේය. "ඕක නාගෙ හරි සාක්කුවකින් වැටුණු එකක්





වෙන්න ඇති." ඔහු කීය. "ඔබේ ඇති වැදගත්කමක් මට නම් පෙනෙන්නෙ නෑ. බාගවේලාවට මේ කෞතුකාගාරය බලන්න ආව අමුත්තෙකුගේ සාක්කුවකින් වැටෙන්න ඇති"

"මැග්ලෙවින් මහත්මයා" හෝම්ස් කියාව සිනාසෙමිනි. "ඔබේ වටිනා ගාංචුව හොයාගන්න අවශ්‍ය නම්, මේ සාක්ෂිය ඔයතරම් ඉක්මනට නොසලකා හරින්න එපා. මේ කුඩා ලෝහ බෝලය..."

"මේක ඊයම් වලින් හැදූ මුණිස්සමක් වගෙයි" පොලිස් භටයා කීය. "මේ දූපතේ හාවුන් වෙඩි තබන්න හැකි පොඩිවන ලැහැබක් තියෙනවා නේද?"

හෝම්ස්ට යළිත් වරක් සිනා පහළ විය. "ඔච්චර ඈතකට බලන්න දෙයක් නැහැ. අපි යමු එළියට"

අපි හෝම්ස් පසුපස කෞතුකාගාරයෙන් එළියට ගමන් කළෙමු. එහි අවට පොළොව මගේ මිත්‍රයාගේ පරීක්ෂාවට ලක්විය. පොළොවේ ඇතිව තිබූ මඩ සහිත බව නිසා මගේ මිත්‍රයාගේ අවධානය තවත් වැඩි වූ බැව් මම දුටුවෙමි.

"මේ වගේ මිනිසුන් නොගැවසෙන පාළු අඩවියක, මඩ පොළොව පරීක්ෂා කිරීමට මට අවස්ථාවක් ලැබෙන්නේ බොහොම කලාතුරකින්" හෝම්ස් කීය. "ඒ වාසියේ පල මං නෙළාගත් බව කිව යුතුයි. මෙතැන තියෙනවා ඉතාම පැහැදිලි පා සලකුණක්. මැග්ලෙවින් මහත්තයා ඔබේ සපත්තුවේ ප්‍රමාණය මොකක්ද?"

"නහ"

"මාත් එහෙම හිතුවා." හෝම්ස් කීය. "ග්‍රයිස් පැටසන් මහත්තයා. ඔබේ පුතාගේ සපත්තුවේ ප්‍රමාණයත් එකම විය යුතුයි. මේ පා සටහන් මැග්ලෙවින් මහත්තයාගේ පා සටහන් වලට වඩා කුඩායි. නමුත් ඔබේ ඒවාට වඩා විශාලයි. එතකොට මැග්ලෙවින් මහත්තයා ඔබේ සේවකයාගේ කොහොමද?"

"විටිද? ඔහු ප්‍රමාණයෙන් කුඩා මිනිහෙක්. ඔබ දකින්න ඇතිනේ. ඔහුට තියෙන්නේ කුඩා කකුල්"

"එතකොට ඔහුත් මෙතෙන් ඉවත් වෙනවා. බදාදා රාත්‍රියේ තදින් වැස්සා. ඒ නිසා මේ අඩි සටහන් සලකුණු වෙන්න ඇත්තේ ඊට පස්සේ. බ්‍රහස්පතින්දා ඔබේ කෞතුකාගාරය නරඹන්න අමුත්තෝ ආවද?" හෝම්ස් ඇසීය.

"බ්‍රහස්පතින්දා දින වලට මා මගේ කෞතුකාගාරය කිසිකෙනෙකුට අරින්නෙ නැහැ. ඒක මගේ නිවාඩු දවස."

"එහෙම නම් මේ අසිරුවහන් හොරාගේ."

ඒවා පරීක්ෂා කර බැලීම සඳහා අපි එතැනට ළං වීමු. එය ඉතාම පැහැදිලිව පිහිටි දකුණු කකුලේ ලාංඡනයක් විය.

කකුලේ මහපටැඟිල්ල ගොඩනැගිල්ල දෙසට හැරී තිබුණු මෙය හරහා, ගැඹුරට පිහිටි තවත් ලාංඡනයක් විය. එය ද එම සපත්තුවේම සලකුණකි.

"ඔහු ගොඩනැගිල්ලට නැගලා තියන්නේ මෙතැනින්" හෝම්ස් පැවසීය. "අර ගැඹුරට වැදුණු සලකුණ, ඔහු වහළ උඩ සිට ආපසු පනිද්දී වැදුණු පා සටහන. ග්‍රිසන් පැටසන් මහත්තයා. ඔබ අර අවතාරයක් දුටුවා කිව්වා නේද? ඒ කොතැන්දිද?""

"බොහොම වෙලාවට මෙතැනදී වෙන්න පුළුවන්." නීතිඥයා පිළිතුරු දුන්නේය. "මට හරි මට මතකයි. ඒ අවතාරය මෙතැනින් පාර හරහා ගියේ අන්න අර තටබුන් මැදින්."

"ඔබ ඔය කතා කරන්නේ මොන අවතාරයක් ගැනද?" මැග්ලෙවින් ඇසීය.

"අපි අවතාරයක් දුටුවා" නීතිඥයා පිළිතුරු දුන්නේය. "නමුත් ඒ ගැන ඔබට කිව්වෙ නෑ. ඔබ අපි මෝඩයෝ කියල හිතාවි කියල."

ඔවුන් කතාබහ කරන අතරේ හෝම්ස්, ඒ අසල බිත්තිය වටාත් අත්කන්නාඩියෙන් පරීක්ෂා කරන අයුරු මම දුටුවෙමි. හෝම්ස්ගේ හිසේ ඉරියව්වෙන්, බිත්තියේ ගලක් එළියට නෙරා තිබූ බව, ඔහුට දකින්නට ලැබී ඇත. ඒ මතට නැගී ඔහු, එතැනින් කෞතුකාගාරයේ වහළට නැග්ගේය. වහලේ ඇතුරා තිබූ ගල් ලැලි පරීක්ෂා කරමින් ඔහු ඇවිද ගියේ, ආලෝකය ලැබීම සඳහා වහළේ සවිකර තිබූ සෑම වීදුරු තහඩුවක්ම පරීක්ෂා කර බලමිනි.

"මහත්තයා ඔය කිසි ප්‍රයෝජනයක් නැති වැඩක්" මේ වනවිට නොඉවසිල්ලෙන් සිටි මැග්ලෙවින් හෝම්ස්ට ඇසෙන සේ කෑගැසුවේය. "හොරු හරි ඔය වහළට නැගගත්තා කියල අපි හිතමු. ඒ වුණත් ඔය වීදුරු තහඩු එකක් වත් අරින්න බැහැ. ඇරියත් ඇති වැඩේ මොකක්ද? ඒවා කෙනෙකුට ඇතුළු වෙන්න බැරි තරම් කුඩායි. අනෙක ඇතුළතින් යකඩකූරු සවිකරලා, අච්චිර කරලානේ තියෙන්නෙ."

"ඒ කොහොම වුණත්" හෝම්ස් කීවේ එක් වීදුරු තහඩුවක් අල්ලා බලමිනි. "හොරු හරි මේ වීදුරුව ගලවලා වගෙයි. මෙන අයිනෙන්





තිබෙන ඊයම් පටිය ආපහු නවලා. වීදුරු දාරයේ මැලියම් ඉවත් කරලා. ගැලවුනයිස් ඇණ...ආහ්!" ඔහු තම දෙනෙත් මීළඟට යොමු කළේ වැහි පීල්ල වෙතය. එහි තිබූ කුඩා ලෝහමය යමක් අතට ගත්තේය.

"මැක්ෆර්සන් මහත්මයා" හෝම්ස් පොලිස් භටයා කැඳෙව්වේය. "මම කැමතියි ඔබත් මේ වහළ උඩට නගිනවා නම්"

හෝම්ස්ගේ ඉල්ලීම අනුව මැක්ෆර්සන් ද වහළ උඩට නැගුණේය. සැහෙන වේලාවක සිට වැස්සක් ඇදහැලීමට මෙන් අහස කළු කරමින් තිබිණ. එක්වරම වැස්සක් කඩාහැලුණේ වහළ උඩට නැගී දෙදෙනාට පහළට බැසීමටවත් ඉඩ නොතබමිනි. ඔවුන් දෙදෙනා වහළ උඩට වී වැස්සේ තෙමෙද්දී, අපි ලෙවණකොට දිව ගියෙමු.

මිනිත්තු විස්සක් පමණ යනතුරු වැස්ස පැවතිණ. මැග්ලෙවින්ගේ විසිත්ත කාමරය තුළට වී, අපි තේ පානය කළෙමු. වැස්ස අවසන් වූ පසු අපි මිදුලට බැස වහල දෙස බැලුවෙමු! අපේ මිතුරින් තවමත් කුමක් කරනවාද යන්න දැන ගැනීමටයි. පුදුමයකි! ඔවුහු වහළ උඩ නොසිටියෝය. ඔවුනට සිදු වූයේ කුමක් ද යන්න අපට සිතා ගැනීමට නොහැකි විය.

මීළඟට කිසිවෙකු කෑගසන හඬක් අපට අසන්නට ලැබුණේ පහළ මුහුද දෙසිනි. මැග්ලෙවින්ගේ ජැටිය දෙසට ආ කුඩා බෝට්ටුවකි. එය හබල් ගාමින් සිටියේ පොලිස් නිලධාරී මැක්ෆර්සන්ය. හෝම්ස් බෝට්ටුවේ අනෙක් කෙළවරට වී පයිප්පයෙන් දුම්රැළි නංවමින් සිටියේය.

"අපි මේ බෝට්ටුවෙන් එළුවෙක් සිහිං එන්න ගියා" ඔහු කීවේ ජැටිය මතට පා තබන අතරය.

"ඒ මොකටද?"

"ගැටලුව විසඳීමේ අරමුණෙනේ. මන්න ඒක විසඳලා අවසන්"

* * *

අපි වහාම මැග්ලෙවින්ගේ වාෂ්ප බෝට්ටුවෙන් කිල්බුයිහි අප නවාතැන් ගෙන සිටි එකිල් වීල හෝටලය වෙත පිටත් වී ගියෙමු. හෝටලයේ දොරටුව අසල ගමන්මලු හා ගමන්බඩු රාශියක් ගොඩගසා තිබුණේ, කිසිවෙකුට එහි ඇතුළුවීමටත් අපහසු වන අයුරෙනි.

දොරටුව අසලට වී සිටි සේවිකා ඔලිෆාන් අප දෙසට දුව ආවේ කැලැඹීමට පත් මුහුණෙනි.



www.sinhalaelibrary.com

"මොකක්ද මේ වැඩේ තේරුම?" කෝපයට පත්ව සිටි ඔහු පොලිස් නිලධරයා වෙත කඩා පැන්නේය. "අද හැන්දෑ වෙන කොට මං ගෙදර ගිහින් ඉන්න ඕන. හෙට රෑට මට තියෙනවා එඩින්බරෝ විශ්වවිද්‍යාලයේ දේශනයක් පවත්වන්න. මගේ කථාව සූදානම් කරගන්න මට පැය විසිහතරක්වත් උවමනායි. අපට දුම්රියපොළට යන්න තිබෙන අශ්වකරත්තය ඇත්තෙත් නැහැ. මං ඒක ගෙන්වා ගන්න ඇහුවාම කියනවා, පොලීසියේ අවසරය දෙන තුරු මට මෙතනින් යන්න දෙන්න බැරිලු"

ඔහුගේ කෝපය වැඩිවීමට හේතුව අපට තේරුම් ගත හැකි විය. "මේක මහ නීති විරෝධී වැඩක් නෙව. මහජනයාගෙ ගමන් බිමන් අවහිර කරන්න ඔහේට මොකක් ද තියෙන අයිතිය? මං වහාම අශ්වකරත්තයෙන් පිටත්වෙලා නොගියොත් ඉන්වර්නස් කරා යන සම්බන්ධක දුම්රිය අල්ලාගන්න මට බැරිවෙනවා."

හෝටලයේ කළමනාකරු මර්ඩොක් අප පිළිගත්තේ ද අතිශයින්ම කැළඹුණු මුහුණෙනි. "මොනවද මහත්වරුනි දැන් මේ සිද්ධ වෙන්නෙ?"

"අපි කිසි දවසක, කිසි තැනක් අහල නැති නීතියක් නේ මෙතැන ක්‍රියාත්මක වෙන්නෙ" හැමිෂ් මෝට්න් මහතා ඉදිරියට ආවේ තම අප්‍රසාදය පළ කරමිනි. "අද රෑ වෙනකොට මායි භාර්යාවයි ග්ලාස්ගෝවල ඉන්න ඕන. බෙයාඩ් ඩූනි මහත්මියත් නොඉවසිල්ලෙන් බලාගෙන ඉන්නවා ආපහු යන්න. දැන් සිදුවෙලා තියෙන්නෙ අපේ ගමන් පහසුව අපායම සලසා ගන්නද?"

අමුත්තන්ගේ කෑකෝ ගැසීම ගැන පොලිස් නිලධරයා කලබල නොවිය. ඔහු තම සාක්කුවෙන් ඔරලෝසුවක් එළියට ඇද පරීක්ෂා කර බැලීය. අනතුරුව ඔහු අමුත්තන් ඇමතුවේය.

"ඔබ හැමදෙනෙකුටම උවමනා තැනකට යන්න පුළුවනි, ඉක්මනින්ම. කරුණාකර කාටත් පුළුවන්ද මිනිත්තු කිහිපයකට කෑම කාමරයට එන්න?"

සියලුදෙනාම භෝජනාගාරය වෙත පැමිණ අසුන් ගත් පසු, හෝම්ස් ඔවුන් ඇමතුවේය.

"බොහොම ස්තුතියි නෝනාවරුනි මහත්වරුනි. ඔබට කණගාටුවෙන් වුවත් කියයුත්තේ ඉතාම නින්දිත විධියේ සොරකමක් කෙරිලා තියෙනවා, ඉතාම සූක්ෂම ආකාරයකට. උගා දූපතේ කෞතුකාගාරයෙන් මිල කළ නොහැකි පුරාවස්තුවක් වන





කැග්ලෙවින් රිදී ගාංචුව හොරකම් කරලා. ඒක අපි එහි නිසි අයිතිකාරයා වෙත ලැබීමට සලස්වන්න ඕන"

"බොහොම අවාසනාවන්ත සිදුවීමක් නම් තමා" වෛද්‍ය ඔලිෆන් කීය. "ඒත් ඉතින් ඒකට අපි මොනවා කරන්නද?"

"ඒ නැතිවූ වටිනා වස්තුව මේ හෝටලයේ තිබෙනවා" හෝම්ස් කීය.

"දෙයියෝ සාක්කි! මේ හෝටලයේ?" කළමනාකරු ඇසුවේ පුදුමයෙනි.

"ඒ කියන්නේ මේ අපෙන් කෙනෙක් හොරකම් කළා කියලද?" තවෙකෙක් කෑගසා ඇසීය.

"ඔබට වුණු වැරදීමක් වෙන්න ඇති!" වෙනත් කටහඬකින් ඇසිණි.

මගේ සිහිවිලි දිව ගියේ මේ රැස්ව සිටි පිරිසගේ පසුබිම වෙතය. මෙවැනි වැදගත් පිරිසක් අතර එවැනි නින්දිත හොරකමක් කළ හැකි කෙනෙක් සිටිය හැකිද?

වෛද්‍ය ඔලිෆන් නම් පුරාවිද්‍යාව හා පුරා වස්තු පිළිබඳ දැනුමක් ඇත්තෙකු බව අපට කලින් අසන්නට ලැබී තිබිණි. ඔහු දැන් සිටින්නේ හෝටලයෙන් පිටවී යාමට නොඉවසිල්ලෙනි. සැක කටයුතු පුද්ගලයා ඔහුද?

අනෙක් අතට ජොන්ස්ටන් දෙසොහොයුරන් ගැන විශ්වාසයක් තැබිය හැකිද? මෙවැනි හෝටලයක නිවාඩු ගත කිරීමට කොහෙන් ද ඔවුනට මේ හැටි මුදල්?

කාගෙත් රොස් පරොස් හඬ නැගෙද්දී හෝම්ස් යළිත් කථා කළේය. "මහත්වරුනි. පොලිස් නිලධාරි මැකාර්තර් මහත්මයා සහ ඔහුගේ සහකරුවන්, මේ හෝටලයේ හැම තැනක්ම සොදිසි කරන්නයි දැන් සූදානම් වෙන්නෙ"

එක් එක් අය තම අප්‍රසාදය පළ කරන හඬ ශාලාව පුරා පැතිර ගියේය. "ඇයි මනුස්සයෝ ඒකට දවස් ගණනක් ගතවේවිනේ?" ඇන්ගස් ජොන්ස්ටන් ඇසීය.

"එහෙම නම් අපි ඒක වහාම පටන්ගමු" හෝම්ස් කීය "අපි පටන් ගමු අරකෙන්" හෝම්ස්ගේ ඇඟිල්ල දිගු වී තිබුණේ මෝටන් මහත්මිය කරේ එල්ලාගෙන සිටි කුඩා හම් මල්ල වෙතය

"මේකෙ තියෙන්නෙ මගේ චිත්‍ර අඳින සායම්, පින්සල්, පැන්සල් හා අනෙක් උපකරණ විතරයි" පවසමින් අසුනෙන් නැගිටිද්දී මෝටන් මහත්මියගේ මුහුණ කෝපයෙන් රතුවී තිබිණි.

"හෝනා. ඔබ ඒක ඇරලා පෙන්වනවද? නැත්නම් මං අරින්නද?" පොලිස් භටයා ඇසුවේය.

අකැමැත්තෙන් මල්ල අතට ගත් මෝටන් මහත්මිය, එය සිමෙන්ති පොළොවට ළං කළාය. අනතුරුව එහි පියන විවෘත කොට ඇතුළත වූ දෑ බිමට හැළුවාය.

එහි තිබුණේ මොනවාදැයි මම ද කිරපොවා බැලීමි. දිය සායම් අඩංගු වියුබ රාශියක්, පින්සල් හතු අටක්, පින්න පටියකින් ගැටගැසූ පැන්සල්, සායම් මිශ්‍ර කිරීමට යොදගත් පීරිසියක්, දේදුන්නක මෙන් නොයෙක් වර්ණ තැවරී තිබුණු, පින්සල් පිස දැමීමට යොදගත් කිලිටි රෙදි කැබැල්ලක් ආදිය එහි තිබිණි.

"කරුණාකරලා මේ රෙදි කැබැල්ල දිග හරින්න" හෝම්ස් ඉල්ලා සිටියේය.

"ඒක හරි අපිරිසිදුයි" ඇය කීවාය. "මම මගේ පින්සල් පිස දමන්න භාවිත කරන රෙදි කැබැල්ල. දැන් මේක ඇල්ලුවොත් මේකෙ තියෙන සායම් ඔක්කොම ඔයාගේ අත් මේස් වල තැවරෙනවා"

ඇය ඒ වැකිය කියා අවසන් කිරීමටත් පෙර අත දිගු කළ හෝම්ස් රෙදි කැබැල්ල අතට ගෙන, එය කාටත් පෙනෙන සේ දිග හැරියේය. එක්වරම දුටු දසුනෙන් අපි මවිතයට පත්වීමු.

එහි මැද තිබුණේ ඉතාම සියුම් කැටයමකින් අලංකාර වූ විශාල රිදී ගාංචුවකි! ඒ පෞරාණික මැග්ලෙවින් ගාංචුවයි.

කාමරය පුරා කවුරුත් එක්වරම මුව තුළට හුස්ම ඇදගන්නා හඬ ඇසිණි. ඒ සමගම ඇතිවූ නිශ්ශබ්දතාවය තත්පර කිහිපයක් පැවැතිණ. මීළඟට එක් ක්ෂණයකින් තම අසුනෙන් නැගී සිටි හැමිෂ් මෝටන් දොර දෙසට දිව ගියේ, හෝටලයෙන් එළියට පැන ගැනීමේ අරමුණෙනි. එහෙත් ඔහු දොර විවෘත කිරීමට පෙර අඩියට දෙකට එතැනට පිනූ මැග්ලෙවින් මහතා, මෝටන්ව අල්ලා ගත්තේය.

"තමුසේ මහා මෝඩයෙක්!" මෝටන් මහත්මිය තම සැමියා වෙත කඩා පැන්නාය. "තමුසේ කිව්වේ ග්ලාස්ගෝ වලින් පැනලා ඇවිත් ටිකක් කල් ගෙවෙන හරි හැඟිලා ඉමු කියලා නේද? ඒ වුණාට තමුසෙට මේ හැංගිල්ල අත්ඇරගන්න බැරිවුණා. බලපං මෝඩයා දැන් උඹ කරලා තියෙන වැඩේ හැටි..."

කෝපාවිෂ්ට වූ කාන්තාව සිය සැමියාට දිගින් දිගටම බැණ වැදුණේ ඉතා දරුණු අන්දමිනි. මෙය්ඩ මැග්ලෙවින්ගේ දැඩි ග්‍රහණයට





හසුවූ මෝටන්, අසරණව සිටියේ උගුලක හිරවූ මීයෙකු මෙනි. ඔහු කිසිවක් කීමට උත්සාහ නොකෙළේය.

ඊළඟ මොහොතේ අප මුහුණ දුන්නේ හිතියෙන් නැතිගැන්වූ ඇඟ කිළිපොළා ගිය සිදුවීමකටය. තමා ළඟ තිබූ අත්බෑගයෙන් මෝටන් මහත්මිය එක් ක්ෂණයකින් රිවෝල්වරයක් එළියට ගත්තාය. එයට තිබුණේ භයානක පෙනුමකි.

"පැත්තකට වෙයව් නොපි ආක්කෝ!" ඇය ගිගුරුවේ සෑම කෙනෙකු වෙතම රිවෝල්වරයේ කට යොමු කරමිනි. "අපට යන්න ඇරපල්ලා. මෙකෙ තාමු හයවම උණ්ඩ පුරවලයි තියෙන්නේ. කවුරු හරි අපට අවහිර කළොත්, මෙහෙන් වෙඩි තියන්න මං පසුබට වෙන්න නෑ!"

අපි සියලුදෙනාම බියෙන් ගල් ගැසී සිටියෙමු. හෝම්ස්ගේ දෑස් ෆර්ගස් ජොන්ස්ටන් වෙත යොමු වූ අයුරු මම නෙත් කොණින් දුටුවෙමි. ඊළඟ මොහොතේ හෝම්ස් මෝටන් මහත්මිය ඇමතුවේය.

"මෝටන් මහත්මිය!"

ඇය මගේ මිතුරා දෙස ක්ෂණික බැල්මක් හෙළුවාය. ඒ තත්පරයකට පමණි. ඒ අවසරය විසින් ෆර්ගස් ජොන්ස්ටන්ට ඉඩ දුනි. යමක් වේගයෙන් චලනය වන අයුරු අපට පෙනී නොපෙනී ගියේය. මෝටන් මහත්මිය අතේ වූ රිවෝල්වරය ගබ්දයක් නංවමින් බිම වැටී, පොළොවේ විසිවී ගියේය. සිදුවූයේ කුමක්ද යන්න අප තේරුම් ගත්තේ පසුවය. වයස්ගත දූනී මහත්මියගේ සැරයටියෙන්, මෝටන් මහත්මියගේ දකුණු අතට වේගවත් පහරක් එල්ල කර තිබුණේ, ෆර්ගස් ජොන්ස්ටන් විසිනි. මෝටන් මහත්මිය අත බදාගෙන මරහඬ දුන්නාය. අඩියක් ඉදිරියට පා තැබූ හෝම්ස් රිවෝල්වරය සියතට ගත්තේය. ඒ සමගම පොලිස් නිලධරයා සිය නළාව පිඹින හඬ ඇසිණි. එතැනට දුව ආ ඔහුගේ සහායකයෝ මෝටන් යුවළ පිළිවෙලින් ඉවතට කැඳවාගෙන ගියහ.

සියල්ල සන්සුන් වූ පසු ඉදිරියට පා තැබූ මැග්ලෙවින් මහතා තම පරපුරේ පෞරාණික රිදී ගාංචුව කිලිටි රෙදි කැබැල්ලෙන් ඉවතට ගත්තේ ගෞරව සම්ප්‍රයුක්ත අයුරෙනි. ඔහු එය ඉවත් කර ගනිද්දී තවත් පුදුමාකාර සිදුවීමක් විය. එහිම ගාංචුවට යටින් තිබී, ඉතා අලංකාර මුතු ඇල්ලූ කාන්තා හිස් පළඳනාවක් හමුවීමයි.

"දෙයියෝ සාක්කි!" ෆර්ගස්ගෙන් හඬ නැගුණි. "මේ තියෙන්නේ පාකින්සන් ආර්යාවගේ හිස් පළඳනාව!"



www.sinhalaelibrary.com

තවත් පැය දෙකකට පසු දහවල් ආහාරය ගැනීමෙන් ද අනතුරුව, අපි සියලුදෙනාම හෝටලයේ විසිත්ත කාමරයේ අසුන් ගෙන සිටියෙමු. නිරාහාරයට ගත් මෝටන් යුවළ ඉන්වනස් වෙත ගෙන යාම සඳහා පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රැඳවූ බැව් අපට අසන්නට ලැබිණ. වෛද්‍ය ඔලිෆන් හා ඩූනි මහත්මිය හෝටලයෙන් පිටත්ව ගොස්ය. එකිල්හෝට්ලිය යළිත් එහි නිහඬ සන්සුන් ස්වභාවයට පත්ව තිබිණ.

"හෝම්ස් මහත්මයා" ඇලෙක්සැන්ඩර් ග්‍රිසි පැටසන් කීවේ තම දැතින්ම හෝම්ස්ගේ දකුණු අත අල්ලා ගනිමිනි. "මහත්තයා. ඔබට කොහොම ස්තූති කරන්නද කියල මට නම් තේරෙන්නේ නෑ. ඔබ නොහිටින්න මටයි මගේ පුතාටයි අත්වෙන්න තිබුණේ බොහොම භයානක ඉරණමක්. මට ඒක ගැන මතක් වෙනකොටත් භය හිතෙනවා"

"කලබලවෙලා එක්වරම ඔබට දෙස් පැවරීම ගැන මට සමාවෙන්න" මැග්ලෙවින් කීවේ පැටසන් වෙත තම සුරත දිගු කරමිනි. "ඔබ ඇඟේ රත්න වෙන කෙනෙකුත් ඒක ගත්තෙ කොහොමද කියල මට හිතාගන්න බැරි වුණා"

"ආ කමක් නෑ. අපි ඒව අමතක කරමු" නීතිඥයා කීවේ අනෙකාට අතට අත දෙමිනි. "හෝම්ස් මහත්මයා. අපි කැමතියි දැනගන්න, ඔබ මේ අභිරහස මේ තරම් ඉක්මනට විසඳුවේ කොහොමද කියල"

මේ අවස්ථාවේ කථාවට බාධා කරමින් පොලිස් නිලධර මැක්ෆර්සන් අප අතරට පැමිණියේය.

"මට සමාවෙන්න මහත්වරුනි, මගේ ප්‍රමාදය ගැන. මෝටන් යුවළ ගැන විස්තර මම ග්ලාස්ගෝ නුවරට විදුලි පුවතකින් දන්වා යැව්වා. ඔවුන්ගෙන් ඊට ලැබුණු පිළිතුර මෙන්න මා අතේ තියෙනවා. හෝම්ස් මහත්මයා. අපි අල්ලාගෙන තියෙන්නේ හිතුවාට වඩා විශාල මාළු දෙන්නෙක් ගැන. ග්ලාස්ගෝ පොලීසියේ අයට හොඳටම විශ්වාසයි."

"හැබැට? කවුද එහෙනම් මේ පුද්ගලයින්?"

"හැම්ෆ් මෝටන් කියාගන්නා පුද්ගලයාගේ ඇත්ත නම චාලි හෙන්ඩසන්. ඔහු තමයි ළඟම අවුරුද්දේ මුලදී බලයින්ස්වුඩ් චතුරශ්‍රයේ මහා මංකොල්ලයක් කරලා, පොලීසියට උවමනා වී ඉන්නේ..."





"මට ඒක හොඳට මතකයි මැක්ෆර්සන්" හෝම්ස් කීය. "පුරාණ කලාකෘති තැන්පත් කර තිබූ කලාගාරයකට වහළෙන් ඇතුළුවෙලා. ඔවුන් පවුම් දස දහස් ගණනක් වටිනා දේ හොරකම් කරගෙන ගියා. ඒ වෙලාවෙ ඔවුන් එහි අයිතිකාරයාට බරපතල තුවාල සිදුකළා. එහෙනම් අර කාන්තාව මේරි මොන්ටෙයින් බවට සැකයක් නෑ. ඇය ඉතාම දක්ෂ චිත්‍ර ශිල්පිනියක්. නමුත් ඇය ගමන් කළේ වැරැදි මාර්ගයක. තමන්ගේ චිත්‍ර නිර්මාණය කරන්න ඇය කාලය ගත කරන්නේ නෑ. පුරාණ චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර මුලට සෑම අතකින්ම සමාන වන සේ, හොර චිත්‍ර නිර්මාණය කරලා, ඒවාට අර කීර්තිමත් චිත්‍ර ශිල්පීන්ගේ අත්සන යොදලා විකුණනවා. මේ නිසා ඇයත් පොලීසියට උවමනා වී සිටින කෙනෙක්"

"ඉතින් හෝම්ස් මහත්මයා, අපට කියන්න ඔබ මේ ගැටලුව විසඳුවේ කොහොමද කියලා" ඇලෙක්සැන්ඩර් ග්‍රිසි පැටසන් යළිත් ඉල්ලා සිටියේය.

"තමන්ට මුහුණ දෙන්න සිදුවුණු බෝට්ටු අනතුර ගැන එදා රෑ මෝටන් විස්තරයක් කළා ඔබට මතක ඇති" හෝම්ස් කීවේ දල්වා ගත් පයිප්පයෙන් දුම්පයිලි නංවමිනි. "මගේ හිතේ ඒ ගැන අවධානයක් යොමු කළ මුල්ම කාරණාව එයයි. ඔහු කිව්වා ඔහුගේ මාළු අල්ලන සියලුම උපකරණ-බිලිපිති හැම එකක්ම දියේ ගිලී අතුරුදන් වුණා කියල. නමුත් එක කාරණයක් මට හොඳට මතක තිබුණා. ඒ තමයි ඊට කලින් දවසේ ඔහුගේ බිලිපිති මේ කාමරයට ගෙනා වෙලාවේ ඒවායේ ස්වභාවය. ඒ හැම බිලි පිත්තකම මීටේ, වතුරේ පාවෙන "කෝක්" වර්ගයේ සැහැල්ලු ලී කැබැල්ල බැගින් සවිකර තිබුණා. ඒ අනුව ඒ බිලිපිති කොහොමටවත් වතුරේ ගිලී යන්න හැටියක් නැහැ. සමහර වෙලාවට ඒවායේ නංගුරේ නූල කුවත් යමක පැටලී තිබී, ඒ සමග ඇදී ගොස් වතුරේ ගිලුණා නම් මිස. නමුත් මෝටන් එහෙම දෙයක් සඳහන් කළේ නැහැ. ඔහු මේ හිතාමතාම කියන බොරුවක් බව, මම තේරුම් ගත්තා. නමුත් එයෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද? සමහර විට එහි අලාභය ලෙස හෝටලයෙන් මුදලක් වංචා කර ගැනීමද? ඒක සුළු දෙයක් නිසා මං ඒ ගැන වැඩිදුර හිතුවේ නැහැ.

අපරාධය ගැන තවදුරටත් පරීක්ෂා කරන්න අපි උණා දූපතට ගියා. නමුත් සිදුවෙලා තියෙන්නේ මොකක්ද කියලා මොකුත්ම හිතාගන්න පුළුවන් කමක් මට තිබුණේ නැහැ. හැම දෙයක්ම තීරණය



www.sinhalaelibrary.com

වෙන්නේ ග්‍රයිස් පැටසන් මහත්මයා මේ අපරාධය කළාද නැද්ද යන්න ඔප්පු වීම පමණයි.

ඔබ දෙදෙනා හොරු දෙදෙනෙක් කියල බැලූ බැල්මට මට පෙනුණේ නැහැ" හෝම්ස් කීවේ සිනාසෙමිනි. "ඒ වුණත් පහුගිය කාලේ මට හමුවී තිබෙන අපරාධකාරයින් ගෙන් භාගයකම, ඒ බවක් ඔවුන්ගේ බාහිර පෙනුමෙන් කල් ඇතුව මං දුටුවේ නැහැ.

කෞතුකාගාරය සෝදිසි කළාම ගාංචුව තබා තිබුණු විල්ලුද කොට්ටයේ සුළු ඉරී යාමක් මං මුලින් දුටුවා. මැග්ලෙවින් මහත්මයා කිව්වා එවැන්නක් කලින් එහි නොතිබුණු බව. එතකොට මට හිතුණේ මේක යම්කිසි මුවහත් උපකරණයකින්, නැත්නම් කොක්කක් වැනි දෙයකින් සිදු වූ දෙයක් විලසයි. ඒ කියන්නේ නිසැකවම ගාංචුව මෙතැනින් ඉවත් කිරීමට කළ උත්සාහයේ දී යොදගත් උපකරණයක් නිසා. එතකොට අපට තේරුම් ගන්න පුළුවන්, එහෙනම් ඒ වෙලාවෙ මේ හොරා ඉදල තියෙන්නේ ගාංචුව අතින් අරගන්න පුළුවන් තැනක නෙමෙයි. මේ නිරීක්ෂණ අනුව දැන් අපට පහසුවෙන්ම ගතහැකි නිගමනයක් තියෙනවා. ඒ තමයි හොරා වහලේ සිට, වීදුරු තහඩුවක් බුරුල් කළ තැනකින්, කොක්කක් සවි කළ නූලක් පහළට දමන්න ඇති. ඔබට මතක ඇති මට බිම තිබී හමුවුණා, ලෝහයෙන් තැනූ කුඩා ගෝලාකාර වස්තුවක්. ඒක බිලීපිති වලින් මාළු අල්ලන අය බිලී කොක්ක වතුරේ තමන්ට අවශ්‍ය තැනට යැවීමට උදව් කරගන්නා දෙයක්. ඒක හමුවුණාම මං දැනගත්තා මං යන්නේ නිවැරදි පාරක බව. නූලට අමුණා තිබූ බරෙන් හොරාට හැකිවෙනවා කොක්ක සහිත නූල හොඳින් පාලනය කර ගැනීමට. ලෝහ ගෝලය තුළෙන් ගැළවී වැටුණේ, විල්ලුදයේ පැටලුණු බිලීකටුව ගලවාගන්න කළ උත්සාහයේදී.

මීළඟට මම කෞතුකාගාරයේ පිටත පරීක්ෂා කළා. මෙහිදී හොරා බිත්තිය දිගේ වහලට නැග්ග සලකුණු දැකගැනීමට තරම් මම වාසනාවන්ත වුණා. බිත්තියෙන් එළියට නෙරා ආ ගලක් තිබුණා. ඒක මට අල්ලා නැගීමට හැකිවුණේ මා අඩි හයක් උස නිසා. හොරාත් මේ ගල වහලට නැගීමට උදව් කරගෙන තිබුණා. ඒ අනුව ඔහුත් මා මෙන්ම උස පුද්ගලයෙකු විය යුතුයි. ඊළඟට ඔහුගේ අඩි සටහනේ ප්‍රමාණය. එයින් මට පැහැදිලි වුණා හොරා කිසිසේත් ග්‍රයිස් පැටසන් දෙදෙනාගෙන් කෙනෙකු විය නොහැකි බව.





මීළඟට මම පරීක්ෂා කළේ රිදී ගාංචුව තබා තිබූ මේසය කෙළින්ම ඉහළින්, වහලේ තිබූ වීදුරු තහඩුවකි. මේක ළඟදී ගළවා ඉවත් කොට, යළිත් එතැන තබා තිබූ බවට සලකුණු තිබුණා. රියම් පටි හා තමා තිබූ යකඩ ඇණ දිග හැර තිබීම ඊට අයත්. මේ වැඩේ ටිකක් අපහසු වෙන්න ඇති. ඒකට තමා ඔහු දුනු පිහිය පාවිච්චි කළේ. එසේ කරද්දී දුනු පිහි තලයේ තුඩ කැඩී ගියා. ඒ ත්‍රිකෝණාකාර ලෝහ කැබැල්ල තමා වැහිපීල්ලේ තිබී අපට හමුවුණේ.

ග්‍රයිස් පැටසන් දෙදෙනා උගා දූපතට ළඟා වෙලා, මැග්ලෙවින් නිවහන වෙත යද්දී, හොරා තමන්ගේ කටයුත්තේ යෙදිල ඉඳල තියෙනවා. අන්ධකාරයේ පාර හරහා ඇදී ගිය අවතාරයක් ඔබ දුටුවා නේද? ඒ තමා හැමිෂ් මෝටන්. ඔහු ගාංචුවත් හොරකම් කරගෙන, පාර හරහා බිම දිගේ හතරගාතෙන් ගමන් කළා. ඊළඟට අඩි පාරෙන් වෙරළට ඇවිත් බෝට්ටුවෙන් යන්න පිටත්වුණා. නමුත් කළුවරේ ඔහු වැරදි අඩිපාරේ ගමන් කරලා, අරගෙන ගිහිං තිබුණේ ඔබට අයත් බෝට්ටුව. ඔහු වැරදි බෝට්ටුව පදවාගෙන ටික දුරක් ගියාට පස්සෙයි, ඔබ දෙදෙනා එතැනට ගියේ. ඊළඟට ඔහුට වැරැද්ද වැටහිලා ඔහු එතෙන් ආපසු ඇවිත් එය දමලා තමන්ගේ බෝට්ටුවෙන් යන්න ගියා. ඔහු අතින් බැරිවීමකින් ඔබේ බෝට්ටුවේ වැටුණු ඔහුගේ දුනුපිහිය තමා ඔබට හමුවුණේ.

ඒ කාරණා ටිකෙන් හොරකම සිදුවුණු අයුරු මම වටහා ගත්තා. නමුත් කවුද ඒ හොරා? කල්පනා කර බලද්දී මට මතක් වුණා, තමන්ගේ බෝට්ටුව වතුරේ ගිලී අනතුරක් වුණු බවට මෝටන් කිව්ව කතාව. ඒ වෙලාවෙත් මට ඒ ගැන සැකයක් ඇති වුණා. මේ වෙලාවෙ මට හිතුණේ ඔහුගේ බෝට්ටුව හා බිලී පිති කොහොමටවත් වතුරේ ගිලී නැහැ. ඒක දකුණු වෙරළ අයිනේ පඳුරු අතර සඟවා ඇති කියලයි. ඒක එහෙම වුණා නම් තමන් ගැන කිසිම සැකයක් ඇති නොවෙන විධියට, මේ හොරකම කරන්න ඔහුට හැකියාව තිබුණා. ඉතින් මම මැක්ෆර්සන් සමඟ බෝට්ටුව පැදගෙන, උගා දූපතේ සිට මේ ගොඩබිමට ආවා. අප සිතූ අයුරින්ම ගල් පර්වත සහ පඳුරු අතරේ බෝට්ටුව තිබුණා. නැති වුවායි කී බිලීපිති, මාළු මරණ උපකරණ සියල්ල එහි තිබී අපට හමු වුණා.

අපරාධකාරයා හොයා ගත්තු නමුත්, සොරකම් කළ රිදී ගාංචුව සොයා ගැනීම පහසු නොවෙන බව, මට කල්පනා වුණා. ඒක

මෝටන්ලා ළඟ ඇති බව සැකයක් නෑ. නමුත් කොහේ කියලා හොයන්නද? ඔබට මතක් වෙනවා ඇති අපරාධය සිදු කළ දවසේ උදේ, ඔවුන් චිත්‍ර වගයක් සිතුවම් කිරීමට, දියඇලි ප්‍රදේශයට යන බව කිව්වා. උදේ වරුවේ ඇත්තටම ඔවුන් ඒ සඳහා යන්නත් ඇති. නමුත් ඇඳිරි වැටෙද්දී ඔවුන් ළඟ මේ සායම් ටියුබ සහිත බෑගය තිබුණා. එහෙම නම් රිදී ගාංචුව මෙම මල්ලේ සඟවා ගන්නත් ඉඩ තියෙනවා. අනෙක මට දකින්න ලැබුණා, මෝටන් මහත්මිය දිගින් දිගටම මේ මල්ල තමන්ගේ කරේ එල්ලාගෙනම හිටි හැටි. ඒ නිසා හොරකම් කළ දෙය බොහෝ විට මේ මල්ල තුළම තිබිය හැකියි කියා මට හිතුණා. මගේ ඒ උපකල්පනය නිවැරදි බව ඔප්පු වුණා. ඉතින් මහත්වරුනි කථාවේ ඉතිරිහරිය ඔබ දන්නවා. මැග්ලෙවින් මහත්මයාට මිල කළ නොහැකි රිදී ගාංචුව ආපසු ලැබුණා. මැක්ෆර්සන් මහත්මයාට භයානක අපරාධකාරයන් දෙදෙනෙක් අල්ලා ගන්න ලැබුණා. පාකින්සන් ආර්ථාවට ඇගේ මුතු ඇල්ලූ වටිනා හිස් පළඳනාව යථා කාලයේ දී ලැබේවි."

"හෝම්ස් මහත්මයා" මැග්ලෙවින් කථාකළේය. "ඔබ නම් කියන්නෙ මෙක සරල ගැටලුවක් කියලා. නමුත් මට විශ්වාසයි, අපි කෞතුකාගාරය පිරික්සමින් මුළු දවසක් ගත කළත් ඔබ දුටුව සියුම් ලකුණු නම් අපට දකින්න ලැබෙන්නේ නෑ"

"සම්පූර්ණ ඇත්ත" පොලිස් නිලධාරියා ඊට එකඟ විය. "මේ අපරාධකාරයින් අල්ලා ගැනීම උඩ, මට සාජන්ට් තනතුරට උසස් වීමක් ලැබෙනවාට කිසි සැකයක් නෑ. හෝම්ස් මහත්මයා. මං දන්නෙ නෑ ඔබට කොහොම ස්තුති කරන්නද කියලා. ඔබ නොහිටින්න මේ හොර තක්කඩින් අපට කවදාවත් අල්ලගන්න ලැබෙන්නේ නෑ"

"අපරාධකාරයින් අල්ලා ගැනීම සඳහා පොලීසියට උදව් කරන්න ලැබීම මට සතුටක්. වොට්සන් එකිල් වීල අවට නැවුම් සිසිල් සුළඟ ඔබ හිතූ විධියටම, මගේ සිතත් ගතත් ප්‍රබෝධමත් කිරීමට සමත් වුණා. තවමත් ඔබට ආසා නම් අපි යමු එකිල් විලේ බෝට්ටුවෙන් සංචාරයක යෙදෙන්න. හැබැයි මේ සැරේ නම් කුඩා එකෙක් බිලී බා ගන්න, රෑ කෑමට"



# විඩාපත් කපිතාන්වරයාගේ කථාව

මගේ විවාහයෙන් පසුව එළැඹුණු ජූලි මාසය මට අමතක නොවන එකක් වූ බව, මම මීට පෙර ද සඳහන් කර ඇත්තෙමි. එයට හේතුව මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා යෙදුණු අභිරහස් පරීක්ෂණ තුනකටම මා හවුල් වූයේ එම ජූලි මාසයේදී නිසයි. එයින් පරීක්ෂණ දෙකක්ම, මා මෙයට ප්‍රථම ඔබ වෙත ඉදිරිපත් කර ඇත. විඩාපත් කපිතාන්ගේ කථාව නමින් මා සඳහන් කළ තුන්වැන්න මෙයයි.

මගේ හිතවත් වෛද්‍යවරයෙකු හමුවීමට ගොස්, එදා මම ආපසු නිවස බලා එමින් සිටියෙමි. මා ගමන්ගත් කුලීරිය ගමන්කලේ බේකර් වීථියෙන් බව මට හදිසියේ දකින්නට ලැබිණි. මා ජීවිතයේ ගතකළ ප්‍රීතිමත්ම කාල පරිච්ඡේදය මගේ මිත්‍රයා සමග බේකර් වීථියේ නතිකඩව ගෙවූ කාලයයි. හෝම්ස් හමුවීමට ගොස් ඔහු යෙදෙන වත්මන් පරීක්ෂණ ගැන අසාදැනගැනීමට, මට එක්වරම සිතක් පහළවිය. කුලීරිය යවා මම 221 බී නිවසේ සීනුව නාද කළෙමි. දොර විවෘත කළේ අපේ හිතවත් හඩ්සන් මහත්මියයි.

"ආයුබෝවන් වොට්සන් මහත්මයා" ඇය කීවාය. "යන්න උඩ තට්ටුවට. හෝම්ස් මහත්මයා ගෙදර ඉන්නවා. ඔහු බොහොම සන්තෝෂවේවි ඔබව දකින්න. අද උදේ හෝම්ස් මහත්තයා මා එක්ක කථා කරන කොට ඔබව මතක් කළා. ඔහු කිව්වා "මගේ යාළුවා වොට්සන්, දිගටම මෙහේ මා සමග හිටියා නම් කොයිතරම් දෙයක්ද" කියලා. හෝම්ස් මහත්මයා දැන් දවස් ගණනකින් ගෙදරින් එළියට බැස්සේ නැහැ. දොස්තර මහත්මයා දකින්න ලැබෙන එක ඔහුට ලොකු සතුටක් වේවි."

මම තරප්පු පෙළ නැග විසිත්ත කාමරයේ දොර අසලට ළංවීමි.

"කෙළින්ම ඇතුළට එන්න මගේ හිතවත් වොට්සන්" මට හුරුපුරුදු කටහඬෙන් කියනු ඇසිණ. "ඔබේ අසුන හැමදාමත් ඔබ වෙනුවෙන් වෙන්වෙලා තියෙනවා."

"හෝම්ස්" මට කෑගැසිණි. "මං විසිත්ත කාමරයට ඇතුළුවෙන්නත් ඉස්සර වෙලා, ඔබ කොහොමද දන්නෙ මං ආ බව? මගේ පියවර ශබ්දය ඔබට ඔය තරම් හුරුපුරුදුද?"

"ඒ ශබ්දය මට හුඟක්ම හුරුපුරුදුයි. නමුත් දැන් එහි තියුණු බව අඩුවෙලා වොට්සන්. ඒ වුණත් ඒක මට කොහොමටවත් වරදින්නෙ නෑ. විවාහයෙන් ඔබේ ජීවිතයට නව පණක් ලැබිලා වගෙයි. ඉතින් ඔබේ නෝනා මහත්මියගේ සැප සනීප කොහොමද? මං කාන්තා පක්ෂය ඒ හැටි අගය කරන කෙනෙක් නොවෙන බව ඔබ දන්නවා නේ. ඒ වුණත් ෂොල්ටෝලගෙ සිද්ධියේදී ඇය දක්වූ නිර්භීත භාවය මට කවදාවත් අමතක වෙන්නේ නෑ. ඒ ගැන මගේ හිතේ ඇය කෙරෙහි තියෙන්නේ විශාල ගෞරවයක්."

"කාන්තාවන් ගැන ඔබ තියෙන ආකල්පය ගැන අපි එතරම් බැරෑරුම්ව හිතන්නේ නෑ" මම කීවෙමි.

"කාන්තාවන් කියන්නේ ඉතාම සුළු කරුණු වලිනුත් බොහොම චංචල වෙන අය." හෝම්ස් කීය. "මට අද උදේ ලැබුණා ලියුම් කෑල්ලක්. මේ බලන්න. මේකෙනුත් තහවුරු වෙන්නෙ මං කිව්ව කරුණම නේද?"

හෝම්ස් නිල් පැහැති කඩදාසියක ලියූ ලියුමක් මා වෙතට විසි කළේය. එය ලියා තිබුණේ ඉතා කුඩා පැහැදිලි අකුරෙනි.

හිතවත් හෝම්ස් මහතාණෙනි,

මගේ පියාගේ සෞඛ්‍ය තත්ත්වය ගැනත්, ඔහුගේ හැසිරීම ගැනත් මගේ සිත බොහෝ දුරට කැලැඹී ඇත. ඔහුගේ සිහි කල්පනාව නැතිවී ගොස්, ඔහු උමතු බවට පත්වී ඇත්දැයි මට විටෙක සිතේ. හෙට - 28 වැනිදා සවස 3.15 ට ඔබ හමුවීමට පැමිණියහොත්, එය ඔබට කරදරයක් නොවේ යයි සිතමි.

මෙයට හිතවත්,
රේචල් වෙබර්.

"එහෙනම් ඔබට යෙදෙන්න පරීක්ෂණයක් ලැබිලයි තියෙන්නෙ?" මම ඇසීමි. "හඩ්සන් මහත්මිය කිව් දෙයින් මට හිතුණේ, ඔබට යෙදෙන්න වැඩක් නැතුව නිදහසේ ඉන්නවා කියලයි."





"නිදහසේ?" හෝම්ස් උස්හඬින් කිවේ තම සිතේ තිබූ කලකිරීම හඟවමිනි. "මිත්‍රයා. මං නිදහසේ ඉන්නවා කිව්වොත්, ඒකෙන් හැඟෙන්නෙ නෑ නියම තත්ත්වය. අපි අර නාවික ගිවිසුම විසඳන්න දුන්නු මහන්සියට පස්සෙ, ජීවිතය ගෙවී ගියේ හරිම ඒකාකාරීව, අක්‍රියව. මට හිතිලා තියෙන්නේ, දැන් එංගලන්තයේ ඉන්න අපරාධකාරයින්, සූක්ෂම මනසකින් ක්‍රියාශීලී නොවෙන, මෝඩ අලසයින් කියල. මෑතකදී සිදුවුණු හැම අපරාධයක්ම කිසිම සංකීර්ණ හෝ ගැටලු සහගත බවක් නොතිබුණු සරල සිදුවීම්. මේවා සාමාන්‍යයෙන් පොලීසියේ අයටත් විසඳන්න පුළුවන් තරම් සරලයි. ලෙස්ට්‍රේඩ්ලා, ග්‍රෙග්සන්ලා අධිවේගීව තබන්න තරම් ගැඹුරක් මේවායේ තිබුණොත්, උද්දේශක අපරාධ පරීක්ෂකයෙකුට...."

පුටුවේ පිටුපසට හේත්තුවුණු ඔහු ගිනි උදුන දෙස බලාසිටියේ උදාසීන ආකාරයෙනි.

"හරි හරි" මම කීවෙමි. "දැන් ඉතින් මේ ඔබට ලැබිලා තියෙන්නේ ලියුමක්. සමහරවිටවත් ගැඹුරු අරගත යමක් මෙතැන ඇති."

"ඒක මට සැකයි" ඔහු කීය. "මට පෙනෙන හැටියට මේක, මා විසින් භාරගත යුතු එකකට වඩා, ඔබගේ මිත්‍රයාට අයත් වෙන එකක්. කමක් නෑ කියන්න වොට්සන්, මොකක්ද ඔබට මෙයින් හැඟී යන්නේ?"

"මේක ලියල තියෙන්නේ තරුණ කාන්තාවක්" මම කීවෙමි.

"විශිෂ්ටයි!" ඔහුට කෑගැසිණි. "හරිම නිර්භය කියමනක්. පුදුමාකාරයි! ඔබ කිව්වේ කාන්තාවක් කියල නේද? වයස කීයක විතර කෙනෙක්ද? මං කැමැතියි ඒක දැනගන්න."

"ඔහොම කථා කරන එක නැවැද්දියි හෝම්ස්" මා කීවේ ඔහුගේ උපහාසය ගැන අතිශය කෝපයට පත්වය. "ඔබට වටින්නේ නෑ මාව උපහාසයට ලක්කරලා කථාකරන්න. එහෙනම් ඔබම ලියුම කියවලා හොයාගන්න ඒ ගැනිගෙ වයස කීයද කියලා!"

"මට සමාවෙන්න මගේ හිතවත් මිත්‍රයා. වෙලාවකට මගේ හැසිරීම හරිම සහජ විරෝධයි; අකරුණාවන්තයි. ලියුම ගැන කියනවා නම්, ඔබ කිව්වා වගේ ලියල තියෙන්නේ තරුණියක්. ඇය චමත්කාරියක්. කියන්න තියෙන දෙයක් භය නැතුව, කෙළින්ම මුහුණටම කථාකරන තැනැත්තියක්. ඇගේ ඇස් පෙනීම දුර්වලයි. දුර පෙනීම හොඳමදි. ඇය ඉතා ආදරයෙන් ඇති දැඩි කරන පුංචි බලු



www.sinhalaelibrary.com

පැටියෙක් ඉන්නවා. පැහැදිලිව පෙනෙන මේ කරුණු වලට අමතරව වෙනත් කිසිවක් මට කියන්න බැහැ."

මගේ මිත්‍රයා නිරීක්ෂණ මගින් නිගමනයන්ට පැමිණීම සඳහා යොදාගත් ක්‍රම, දීර්ඝ කාලයක් තිස්සේ මම දැක ඇත්තෙමි. ඒ නිසා ඔහු ඒ නිගමන වලට පැමිණියේ කෙසේද යන්න, මට ද සිතාගත හැකි විය. ඇයගේ ප්‍රශ්නය කෙළින්ම සඳහන් කර තිබූ ආකාරය නිසා, ඇය භය නැතුව කෙළින්ම කතාකරන්නියක බව ඔහු නිගමනය කළ හැටි මම තේරුම් ගත්තෙමි.

"ඒ වුණත් ඇය වමත්කාරියක බව? බලුපැටියෙක් ඉන්නා බව? ඔබ කොහොමද දැනගත්තේ?" මම ඇසීමි.

හෝම්ස්ට සිනා පහළවිය. "මගේ හිතවත් වොට්සන්. මට පේනවා මේ ලියුම ලියන අතරතුරේ තැන් කිහිපයකදීම පෑන් තලයේ තුඩට, කොළය ඉරී, තීන්ත විසිරී ඇති අන්දම. මෙහෙම වෙන්නේ වම අතින් ලියන්නකු, වමේ සිට දකුණට පෑන තල්ලුකිරීමේදී පමණයි. කඩදාසියේ සලකුණු දෙකක් තියෙනවා. ඒ ලකුණු දෙක කාචයෙන් පරීක්ෂා කළාම මට කියන්න පුළුවනි, එය බල්ලෙකුගේ කකුලේ නියපොතු දෙකක් කඩදාසියේ වැදීමෙන් සිදුවී ඇති ඒවා බව. ඒ දෙක අතර දුර ප්‍රමාණයේ හැටියට මේ බල්ලා කුඩා එකෙක් විය යුතුයි. මෙතරම් පරෙස්සමෙන් ලියන, ක්‍රමානුකූලව වැඩකරන ගැහැනුකෙනෙකු, මේ ලියුමේ බල්ලෙකුගේ නියපොතු පාර වැදෙන්න ඉඩහැරියේ ඇයි? නිසැකවම ඇය බල්ලාට හුඟක් ආදරෙයි. ඌ උකුල උඩ තියාගෙනයි මේ ලියුම ලියල තියෙන්නෙ. ආ! සීනුව නාදවුණා නේද? මට වැරැදීමක් නොමේයි නම්, මේ එන්නේ අපේ අනුග්‍රාහිකාව, හරියටම කිව්ව වෙලාවට."

"ඇතුළට එන්න" යැයි හෝම්ස් පවසද්දී ඔරලෝසුවේ 3.15 නාදවිය. දොර විවෘත කරගෙන විසිත්ත කාමරයට ඇතුළුවූයේ තරුණ කාන්තාවකි. වයසින් අවුරුදු විසිහතක් විසිඅටක් වූ ඇය, ශරීර ප්‍රමාණයෙන් කුඩා තැනැත්තියක් වූවාය. උපැස් යුගළක් ද පැළැඳ ගෙන සිටි ඇය, පිකිනිස් වර්ගයේ සුරතල් බලුපැටියෙකු ද රැගෙන ආවාය.

මගේ මිත්‍රයා සතුව කාන්තාවන් කෙරේ පැහැදීමක් නොතිබුණු බව සැබෑය. එහෙත් ඔහු සැමවිටම කාන්තාවන්ට බෙහෙවින්





ආචාරශීලී වූ බව මම දැනසිටියෙමි. මේ අවස්ථාවේදී ද එය පැහැදිලිවම පෙනිණ.

"හිතවත් වෙබර් මෙනෙවිය" හෝම්ස් කීය. "කරුණාකරල මෙහෙන් වාඩිවෙන්න. මං ඔබ ඉදිරියේ දුම්පානය කිරීම ගැන ඔබේ විරුද්ධත්වයක් නැහැ කියල විශ්වාස කරනවා. මේ මගේ මිත්‍රයා මෙන්ම, රහස්පරීක්ෂණ කටයුතු වලදී මගේ සහකාරයා වන දොස්තර වොට්සන්. මා සමග පැවසීමට ඇති ඕනෑම දෙයක්, ඔබට ඔහු ඉදිරියේ නිදහසේ පවසන්න පුළුවනි."

තරුණිය හෝම්ස් පෙන්වූ අසුනෙහි හිඳගත්තාය.

"දොස්තර වොට්සන් කෙරෙහි විශ්වාසය තබන්න පුළුවන් බව මම දන්නවා." ඇය කීවාය. "ඇත්තම කියනවා නම් දොස්තර මහත්මයාගේ මාර්ගයෙන් තමයි මං මගේ ගැටලුව ෂර්ලොක් හෝම්ස් මහත්මයාට භාරදෙන්න තීරණය කළේ."

"මගේ මාර්ගයෙන්?" පුදුමයට පත් මම ඇයගෙන් ඇසීමි.

"ඔව් මහත්මයා" ඇය පිළිතුරු දුන්නාය. "ඔබ ලියූ ලෝහිත පරීක්ෂණය කථාව මං ළඟදී කියෙව්වා. එතකොට තමයි මට හිතුණේ මගේ ගැටලුව විසඳාගන්න හමුවිය යුතු පුද්ගලයා ෂර්ලොක් හෝම්ස් මහත්මයා බව."

සිතේ ඇති වූ සන්තෝෂය නිසාම මගේ මිත්‍රයාගේ මුහුණ රත් පැහැයට හැරිණි. "මගේ හිතවත් වොට්සන්" ඔහු කීය. "මගේ පරීක්ෂණ වල තොරතුරු කථාන්තර බවට පත්කර ඇති ආකාරය ගැන, මං ඔබට චෝදනා සහ විවේචන රාශියක් එල්ල කළ බව ඇත්තයි. දැන් ඉතින් ඒ හැම එකක්ම මං ඉල්ලා අස්කර ගන්නවා. ඉතින් වෙබර් මෙනෙවිය, ඔබේ සිතට වධ දෙන ගැටලුව කුමක්ද කියා දැනගන්න අපි ඉන්නේ නොඉවසිල්ලෙන්. එයට අදාල ඉතාම සුළු කරුණක් වත් අත්හැර දමන්න එපා. තොරතුරු හැමදෙයක්ම අපට කියන්න."

ඇගේ උකුලේ වාඩිවී සිට මුහුණ හෝම්ස් වෙත යොමුකරගෙන සිටි බලුපැටියාගේ හිස අතගාමින්, ඇය මදවේලාවක් නිහඬව සිටියාය.

"මගේ නම රේචල් වෙබර්" ඇය කථාව ඇරඹුවාය. "ඇල්ඩර්ෂොට් හි පුරාණ වලව්වේ, කපිතාන් ජෝෂුවා වෙබර්ගේ එකම දරුවා මම. මගේ අම්මා අවුරුදු පහකට පෙර මියගියා.



www.sinhalaelibrary.com

එතකොට තාත්තා හිටියේ මේ රටෙන් පිට. ඔහු ආපසු ආවේ දනට අවුරුද්දකට කලින්. එතෙක් හෙක්ස්ටන් මන්දිරයේ මං ජීවත්වුණේ තනියම. මගේ තනි නොතනියට හා ගෙදර වැඩ කටයුතු ගැන සොයා බැලීමට මාච්මොන්ට් මහත්මිය නම් කාන්තාවක් සිටියා.

හෙක්ස්ටන් වලව්ව බොහොම ඈත අතීතයේ ගොඩ නැංවූ එකක්. මං හිතන්නේ දහත්වන ශතවර්ෂයේ විතර. මට හැමදාමත් හිතුණේ, මේ මහා යෝධ මන්දිරය අපට උවමනාවටත් වඩා විශාල වැඩියි කියලයි. ඇත්තෙන්ම අප මේ ගෙදර ප්‍රයෝජනයට ගත්තේ කාමර කිහිපයක් පමණයි. ඉතිරි සම්පූර්ණ කොටසම වසාදමලයි තියෙන්නේ.

සති හයකට විතර කලින් තමයි මං මුලින්ම අමුතු විධියේ සිදුවීමකට මුහුණ දුන්නේ. දිනය හරියටම කියනවා නම් මැයි මාසේ 21 වැනිදා. මායි තාත්තයි උදේ කෑමට වාඩිවෙලා, තේ පානය කළා. මං හිටියේ එදා උදේ මා වෙත තැපැලෙන් ලැබුණු ලිපියක් කියවමින්. මට එක්වරම ඇහුණා තාත්තාගේ කටින් අමුතු ශබ්දයක් පිටවෙනවා වගේ. මං ලියුම පැත්තකට දමලා ඒ දිහා බැලුවා. ඔහු බටර් දීසිය දිහා බලාගෙන හිටියේ දැඩි අවධානයකින්. හිතන්න හෝම්ස් මහත්මයා මගේ හිතේ ඇතිවුණු මවිතය. ඔහු එකපාරටම බටර් දීසිය අතට අරගෙන, එය නිස්ව තිබුණු ගිනිඋදුනට දමල ගැහැව්වා! ඊළඟට එක වචනයක් වත් කථා නොකර මේසෙන් නැගිටලා යන්න ගියා.

මෙක මගේ හිතේ ඇතිකළේ, එක්තරා විධියක අප්‍රසන්න හැඟීමක් බව ඔබට හිතාගන්න පුළුවන් නේද? හැන්දෑවෙද්දි ඒක ටිකෙන් ටික මගේ හිතෙන් අමතක වෙලා ගියා. නමුත් ඊළඟට තවත් එවැනි සිදුවීමක් වුණා, යළිත් මගේ සිත අවුල්වුණේ ප්‍රදුමාකාර විධියට.

එදා රෑ මම ඇඳේ හාන්සිවෙලා කල්පනා කර කරයි හිටියේ. මගේ හිතේ තිබුණේ තාත්තාගේ අමුතු හැසිරීම. මං කල්පනා කළේ ඒකට හේතුව මොකක් වෙන්න ඇද්ද කියලයි. එතකොට මට ඇහුණා, කවුදෝ මගේ කාමරයේ දොර ළඟින්, ගේ ඇතුළේ යමක් ඇදගෙන යන ශබ්දයක්. මං හොඳින් කන්දීගෙන හිටියා. ඊළඟට යමක් බිම වැටෙනවා වගේ තියුණු හඬක් මට ඇහුණා. මේ ගියේ තාත්තද කියල සෝදිසිකරල බලන්න, මං ශබ්ද නගා කථාකරන්න හිතුවා.





ආයෙමත් මට මතක්වුණා එදා උදේ ඔහුගේ අමුතු හැසිරීම ගැන, ඒ නිසා කථා නොකර මම කාමරයේ දොර යන්තමින් විවෘත කරල බැලුවා.

හෝම්ස් මහත්මයා, මට දකගන්න ලැබුණේ මොකක්ද? තාත්තා තරප්පු පෙළ ළඟ බිම වාඩිවෙලා හිටියා. ඔහු පැරණි නාවික ට්‍රන්ක පෙට්ටියක් ඇරලා, ඒකෙන් මොනවාදෝ ලියවිලි වගයක් එළියට ගනිමින් සිටියා. අර තියුණු ශබ්දය මට ඇහෙන්න ඇත්තේ, ට්‍රන්ක පෙට්ටිය උඩම තරප්පුවෙන් ඊළඟ එකට වැටුණු ශබ්දය වෙන්න ඇති. ඉතින් මං එතැනට ගිහිං ඔහුට කථාකළා. මගේ කටින් පිටවෙන්න ඇත්තේ එක වචනයයි. ඔහු පෙට්ටියේ පියන වේගයෙන් වසා දම්මා. මහ හඬ කරලා "උඹ උඹේ කාමරේට ගිහිං පාඩුවේ නිදාගනිං" කියල උස් හඬින් කෑගැහුවේ ඉතාම අප්‍රසන්න විධියට."

"මොහොතක් ඉන්න" හෝම්ස් කීය. "ඔබ මේ ට්‍රන්ක පෙට්ටිය මීට කලින් දක තිබෙනවාද?"—

"ඔව්. තාත්තා ඒක හැමවිටම තබාගත්තේ ඔහුගේ කාමරයේ, ඔහුගේ ඇඳ අසල. ඒක ඇරල තියෙන වෙලාවක, එහි ඇතුළත නම් මං දකලා නැහැ. නමුත් මං අහල තියෙනවා ඒකෙ තියෙන්නේ තාත්තා නාවිකයෙක්ව හිටි අතීතයේ, ඔහුගේ ලියකියවිලි හා අදාල බඩු බාහිරාදිය බවයි."

"ස්තූතියි වෙබර් මෙනෙවිය. ඔබේ සිත් ගන්නාසුලු කථාව දිගටම කියන්න."

"පහුවදා උදේ" ඇය කීවාය. "මං ඒ සිද්ධිය කිසිදෙයක් මතක් කළේ නැහැ. ඔහු මොකුත් කිව්වෙත් නැහැ. ඒ වුණත් ඔහු වරක් දෙකක් මා දිහා අමුතු විධියට හොරැහින් බලන බව මට තේරුණා. මං හිතන්නේ තාත්තා හිතන්න ඇති, කලින් දා සිද්ධිය ගැන මං ඔහුගෙන් අහවි කියලා. කොහොම වුණත්, වෙනත් විශේෂ සිදුවීමකින් තොරව තවත් දවස් කිහිපයක් ගෙවිලා ගියා. ඊළඟට එක දවසක් දා හැන්දෑවේ තාත්තා උස්හඬින් කථාකරනවා මට ඇහුණා. ඊට පසු කවුරුත් හෝ ඉකිගසා හඬන ශබ්දයකුත් ඇහුණා. ඒ ඉක්මනින්ම මට ඇසුණේ පෙට්ටියක් පත්තුවෙන ශබ්දයක්. මං වහාම ඒ පැත්තට දිවගියා. මට දකින්න ලැබුණේ කඳුළු වගුරවමින් හිටි මාච්මොන්ට් මහත්මිය.



www.sinhalalibrary.com

සිදුවුණේ මොකක්ද කියලා මං ඇයගෙන් ඇහුවා. ඇය ගෙදර සාලයේ ලී බඩුවල දූවිලි පිසදමමින් ඉඳල තියෙනවා. එක්වරම සාලයට ආ තාත්තා ඇයට ඉතාම නරක විධියට බැණවැදී ඇගේ ළඟම පොළොවට පිත්තෝලයෙන් වෙඩි තියලා තියෙනවා. මං එතැනට ගිය වහාම ඔහු පැනල දිව්වා. ඊළඟට ඔහුගේ කන්තෝරු කාමරයට වැදී දොරවසා ගත්තා."

මගේ දෙනෙත් එක්වරම යොමුවුණේ මගේ මිත්‍රයා වෙතය. මෙය කිසිදු වටිනාකමක් නැති සුළු සිදුවීමක් ලෙස ඔහු එය බැහැරකරනු ඇතැයි මට සිතිණ. එහෙත් මා අතිශය පුදුමයට පත්කරමින්, ඔහු ඒ ගැන දැඩි අවධානයකින් කල්පනා කරමින් සිටියේය. මගේ මිත්‍රයා පුටුවේ පිටුපසට හේත්තු වී, දෑතේ ඇඟිලි තුඩු එකට තබාගෙන, පයිප්පයෙන් දුම්වළලු පිටකළේය.

"වෙබර් මෙනෙවිය, ගෙදර මේ කටයුතු මාව්මොන්ට් මහත්මිය අතින් සාමාන්‍යයෙන් සිදුවෙන දෙයක්ද? ගෙදර ඔබට වෙනත් සේවකයින් නැද්ද?"

"නැහැ, හෝම්ස් මහත්මයා. වෙන කිසිම සේවකයෙක් හෝ සේවිකාවක් තබාගන්න තාත්තා ඉඩදෙන්නෙ නෑ. මං කිහිපවාරයක්ම අලුතෙන් සේවකයෙකු ගැනීමට තාත්තාගෙන් අවසර ඉල්ලුවා. ඔහු කිසිවිටෙකත් ඊට කැමැතිවුණේ නැහැ. හැමදෙයක්ම කරන්නේ මේ කාන්තාවමයි."

මගේ මිත්‍රයාගේ සංඥාවක් අනුව තරුණිය යළිත් කථාව ඇරඹුවාය. "එදා ඉඳල මගේ තාත්තාගේ විකාර හැසිරීම හැමදාමත් එන්න එන්නම වැඩිවුණා. අන්තිමට ඊයේ කොයිතරම් උග්‍ර තත්ත්වයකට ආවාද කිව්වොත්, වහාම ඔබ හමුවෙන්න මම තීරණය කළා. මං ඔබට කලින් කිව්වා අපේ වලව්වේ අති විශාල කොටසක් හිස්ව තිබෙන බව. අපි එහි පදිංචියට ගියදා ඉඳලම තිබුණේ ඒ විධියටයි. ඒ වුණත් ඊයේ රාත්‍රී මට මහත් ශබ්දයක් ඇහිලා ඇහැරුණා. ඒ ශබ්දය ආවේ වලව්වේ කිසිකෙනෙකු පදිංචි නැති එක් පාළු පැත්තකින්. මට ඇහුණේ කවුරුන් හෝ මිටියකින් යමක් තලනවා වගේ. මං ඒ මොකක්ද කියා බලන්න යන්න පිටත්වුණා. එතකොට තාත්තා, වලව්වේ නැගෙනහිර කොටසේ සිට එනවා මට හම්බවුණා. ඔහුගේ අතේ තිබුණා මිටියක්. මං ඔහුට කථාකළා. නමුත් ඒකට මට ලැබුණු පිළිතුරවුණේ, "වහාම දුවගෙ කාමරේට ගිහිං නිදාගන්න" යන නියෝගයයි.





පසුව මම වලව්වේ ඒ නැගෙනහිර අංගනයට ගිහින් සෝදිසි කරල බැලුවා. මට දකින්න ලැබුණේ, ඒ අංගයට ඇතුළුවීමට ඇති හැම දොරකටම ඔහු ලෑලිපට් තබා ඇණගසා ඇති බවයි. කිසිවෙකුට එහි ඇතුළුවීමට නොහැකි වනසේ මෙසේ වසාදමා තිබීමෙන්, ගෙදර ඒ කොටස සම්පූර්ණයෙන්ම අපට අහිමි වෙන බවයි මට හැඟුණේ. හෝම්ස් මහත්මයා, දැන් තත්ත්වය ඔන්න ඕකයි. මගේ තාත්තාගේ මේ පුදුමාකාර හැසිරීමට හේතුව කුමක්ද? මං මොකක්ද මෙකට කළයුත්තේ? ඔබ දෙන උපදේශය මං ඉතා ඉහළින්ම අගය කරනවා."

"වෙබර් මෙනෙවිය" මගේ මිත්‍රයා කීය. "ඔබේ තාත්තාගේ තිබුණු අනික් අමුතු හැසිරීම් මොනවාද? ඒවා එතරම් වැදගත් නැහැ කියලා ඔබට හිතෙන්න පුළුවනි. නමුත් මං කැමැතියි ඒ හැම එකක්ම දැනගන්න."

"ඔහු දැන් පටන් අරගෙන...." යි කථාව ඇරඹූ ඇය මදක් පැකිළුණාය. මීළඟට ඉතිරි හරිය කීවේ මදක් අඩුකළ ශබ්දයෙනි. "... ඔහු දැන් තනියෙන් දොඩවන්න පටන් අරගෙන. පැරණි ගීතවල කොටස් තනියෙන් ගායනා කරනවා. මේවා ඇහෙන්නෙ සමහරදාට එළිවෙන පාන්දර. එක දවසක් මගේ මිතුරියක් මා හමුවෙන්න අපේ ගෙදරට ආවා. ඇය ඉදිරිපිටදීම තාත්තා පිහියක් අරගෙන, බිත්තියේ එල්ලා තිබූ පින්තූරයක් කෑලි කෑලි වලට කපා දැම්මා. ඔහු ළඟ තියෙනවා වලිකුකුළන් දඩයම් කිරීමට යොදාගන්නා තුවක්කුවක්. දැන් ඔහු ඒක අරගෙන, ගෙදරට බඩු විකිණීමට එන අය පස්සේ එළවනවා. ඒකෙන් ඔහු ලොකු විනෝදයක් ලබන බවයි මට පෙනුණේ. හෝම්ස් මහත්මයා. මට හාම විශ්වාසයි ඔහු තදබල මානසික රෝගයකට ගොදුරුවෙලා කියලා. මේ කටයුතු ඔහු අතින් සිදුවෙන වෙලාවට, තමන් අතින් වෙන වැරැද්දේ බරපතලකම ඔහුට යන්තමින්වත් වැටහෙන්නේ නැහැ. ඊට පස්සේ ඒවා ඉවරවෙලා මගෙන් අහනවා ඔහුගේ හැසිරීමේ අමුත්තක් මට පෙනෙනවාද කියලා. මං ඒ වෙලාවට කිසිදෙයක් කියන්නේ නෑ."

"හොඳයි. බටර් දීසියේ සිද්ධියට කලින්, ඔහුගේ හැසිරීමේ අමුත්තක් ඔබට දකින්න ලැබුණේ නැහැ නේද?"

"නැහැ.... ඔහොම ඉන්න... දැන් තවත් කල්පනා කරද්දි තවත් දෙයක් මට මතක් වෙනවා. හෝම්ස් මහත්මයා. බටර් දීසියේ

සිද්ධියට දින කිහිපයකට කලින් ඔහුට ලැබුණු ලියුමක් නිසා, තාත්තා හරි තිගැස්මකට පත්වුණා. ඒක මට හොඳට මතකයි. එදා මං ඒ ගැන ඇහුවම ඔහු කිව්වා ඒ ඔහු කළ මුදල් ආයෝජනයක් ගැන නරක ආරංචියක් කියලා. ඒ ගැන ඊට වඩා යමක් කියන්න මං දන්නෙ නෑ."

"ඔබේ කථාන්තරය- මේ ගැටලුව බොහොම සිත් ඇදගන්නාසුලු එකක්" හෝම්ස් කීය. "මේක අප හමුවට ගෙන ඒම ගැන මං ඔබට ස්තුතිවන්ත වෙනවා. දොස්තර වොට්සනුත් මමත් මේ ගැන ඉතාම උනන්දුවෙන් සොයා බලන බවට බලාපොරොත්තු වෙනවා. අලුතෙන් යමක් සිදුවුණොත් මට වහාම දැනුම්දෙන්න! එහෙම නොවුණොත් ඉදිරි දින කිහිපය ඇතුළත අපි එනවා ඔබව හමුවෙන්න."

තරුණ කාන්තාව අපෙන් සමුගත්තේ අතට අතදී ආචාරකරමිනි. යළිත් තම අසුනේ හිඳගත් හෝම්ස්, ඇස් පියාගෙන මඳ වේලාවක් කල්පනා කළේය. යම්කිසි පරීක්ෂණයක් පිළිබඳව දැඩි අවධානයක් යොමුකිරීමේදී, මගේ මිත්‍රයාගේ මෙවැනි හැසිරීමක් මා සැමවිටම දැක තිබිණි.

"හොඳයි වොට්සන්. මොකද්ද ඔබට මේ ගැන හිතෙන්නෙ? කුඩා එකක් වුණත්, අගමුල තේරුම් ගන්න බැරි ගැටලුවක්. එහෙම නේද?"

"මට නම් පැහැදිලිව පෙනෙන එක් කරුණක් තියෙනවා" මම කීවෙමි. "කපිතාන් වෙබර්ගේ මොළේ නරක්වෙලා. ඔහුව පුළුවන් ඉක්මනින් උන්මත්තකාගාරයකට යැව්වොත් හොඳයි."

හෝම්ස් හිස සෙලවූයේ මගේ කීමට එකඟ නොවන බව හඟවමිනි. "මගේ හිතවත් වොට්සන්. මට ඉතාම ඉහළින් අගය කරන්න පුළුවන් ගුණාංග රාශියක් ඔබට තියෙනවා. නමුත් සමහර වේලාවට, යම් සිදුවීමක් මතුපිටින් ගෙන එය විග්‍රහකිරීමේ හැකියාව ඔබට නැහැ. ඔබට හිතෙන්නෙත් කපිතාන්ට පිස්සු හැදිලා කියල. නමුත් මට නම් හොඳටම විශ්වාසයි, අපට මුණගැහිලා තිබෙන පුද්ගලයින් අතරින්, කිසිම පිස්සුවක් නැති පුද්ගලයා ඔහුය කියල. මේ වගේ ඉතාම සියුම් ගැටලුවක් මා වෙත ගෙන ඒම ගැන වෙබර් මෙනෙවියට මං හරිම කෘතඥ වෙනවා. වොට්සන් ඔබට හැකිවේවිද මෙට හැන්දෑවේ මේ පැත්තෙ එන්න? තවමත් ගැටලු සහගත තැන්, ඒ වෙනකොට නිරාකරණය කරන්න හැකිවේවි කියල මං විශ්වාස කරනවා."





මගේ පෞද්ගලික චිකිත්සාගාරයේ වැඩ කටයුතු අධික වූයේ ඉතාම කලාතුරකිනි. නමුත් ඊළඟ දවසේ රෝගීහු විශාල සංඛ්‍යාවක් ප්‍රතිකාර සඳහා මා වෙත පැමිණියහ. හෝම්ස් දැකීමට බේකර් වීථියට යෑමට මට අවස්ථාව ලැබෙද්දී රාත්‍රී අට පමණ විය. කෙසේ වෙතත් මගේ මිත්‍රයා ඒ වනවිට නිවසේ නොසිටියේය. මම මගේ සුපුරුදු හාන්සි පුටුවේ වැතිර, කැප්ටන් මැරියට්ගේ මුහුදු කථා පොතක් කියවීමට පටන්ගත්තෙමි. වැඩිවෙලා ගතවීමට පෙර, තරප්පුව නැග එන කෙනෙකුගේ හඬක් මට අසන්නට ලැබිණ. ඒ මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ය.

"ආ..... වොට්සන්" ඔහු පැවසුවේ දෙකන් ද ආවරණය වනසේ තිබූ හිස්වැස්ම හා කබාය ඉවත්කරමිනි. "ඔබව මෙහේ රස්තියාදු කරන්න සිදුවීම ගැන මට සමාවෙන්න. අද මට හරි ප්‍රයෝජනවත් දවසක් වුණා. මං මුදල් ඔට්ටුවට ක්‍රීඩාවේ යෙදිලා මුදල් ටිකකුත් දිනාගත්තා" ඔහු කීවේ සිනාසෙමිනි.

"මගේ හිතවත් මිත්‍රයා. මගේ සුභ පැතුම් පිළිගන්න" මම කීවෙමි. "ඒ වුණාට මට හරි පුදුමයි. මොනම ආකාරයකට හෝ මුදල් ඔට්ටු අල්ලා කරන සූදු හෝ ක්‍රීඩා වලට, ඔබ හැමදාමත් විරුද්ධවුණා නේද?"

"මේක සූදුවකට යමක් කියල කියන්නත් බෑ වොට්සන්. මං ඩාට්ස් ක්‍රීඩාවේ යෙදුණා."

"ඩාට්ස්?" මා ඇසුවේ මවිතයට පත්වය. "මට තේරුම් ගන්න අමාරුයි ඔබ...."

"ඔබට ඒක තේරුම්ගන්න හැකිවේවි මිත්‍රයා" ඔහු කීය. "මට මොනවා හරි ටිකක් කන්න බොන්න ඉඩදෙන්න. මං ඉන්නෙ ඉවසන්න බැරිතරම් කුසගින්නේ. ඊට පස්සේ මං ඔබට හැමදෙයක්ම කියන්නම්."

හෝම්ස් සීනුව නාදකොට කෑම ඇණවුම් කළේය. එයට පිළිතුරු ලෙස හඩ්සන් මහත්මිය, බදින ලද බිත්තර සහ හැම් අඩංගු ලොකු පිඟානක් සහ තේ පෝච්චියක් ගෙන ආවාය. හෝම්ස්ගේ කුසගිනි නිවාගත් පසු, අපි දුම්පයිප්ප දල්වා ගතිමු. එදා දවසේ තමා යෙදුණු කටයුතු හෝම්ස් විස්තර කිරීමට පටන්ගත්තේ ඉන්පසුවය.

"ඊයේ රෑ ඔබ මෙහෙන් පිටවෙලා ගියාට පස්සේ අපේ අනුග්‍රාහිකාවගේ ගැටලුව ගැන මං දිගින්දිගටම කල්පනා කළා.



www.sinhalaelibrary.com

එතැන තිබෙන ඉතාම පැහැදිලි කරුණ ලෙස මට පෙනුණේ මෙයයි. ට්‍රන්ක පෙට්ටියක් විවෘතකරන්න උවමනා කරන මිනිහා, ඇයි තමන්ගේ කාමරේටම ඒක ගෙනල්ලා කරන්නෙ නැත්තෙ? ඇයි ඔහු මහත් ශබ්දයක් නගමින්, ඒක තරප්පු පෙළ දක්වා බිම දිගේ ඇදගෙන එන්නෙ? කොටහරි තියෙන්න පුළුවන් මේ පෙට්ටියේ තියෙන්නේ, කපිතාන්ගේ බොහොම රහසිගත, පෞද්ගලික ලියවිලි කියලා. එහෙම දේවල් බලන්න උවමනා නැනැත්තා, ඇයි මුළු ගෙදරම අවදිකරන්නේ? මෙතැන එක් සුවිශේෂ කාරණයක් හැංගිලා තිබෙන බව මට වැටහුණා වොට්සන්."

"නමුත් ඔහුට පිස්සු හැදිලා නම්?" මම් හෝම්ස්ගේ කථාවට බාධා කළෙමි.

"ඔහුට පිස්සු හැදිලා කියල නිගමනයකට එමේ හැකියාවක් අපට කොහොමටවත් නෑ මිත්‍රයා" හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඒ මොකද දන්නවද? තමන්ගේ හැසිරීමේ පිළිවෙළේ අමුත්තක් ඇති බව, තමන්ගේ දුවට පෙන්වන්න, මේ මනුස්සයා ලොකු උත්සාහයක් දරනවා. ඒ ඇයි? ඔහුගේ බිත්තියේ එල්ලා තිබූ ඡායාරූපයක් කපාගෙනා දමන්න, ඔහු දියණියගේ ප්‍රාසලේ මිතුරියක් ගෙදරට එනතුරුම හිටියා. ඒ ඇයි? මෙකයි වොට්සන් කාරණේ. ඔහුට උවමනායි සාක්ෂිකාරයෝ. කපිතාන් වෙබර්ගේ මානසික තත්ත්වය හොඳ නැහැ; ඔහුට සම්පූර්ණයෙන්ම නැත්නම් බාගෙට පිස්සු; මේ විධියට සාක්ෂි දෙන්න පිරිසක් හදාගත්තා. වෙබර් මෙනෙවිය, ගෙදර සේවිකාව, වෙබර් මෙනෙවියගේ මිතුරිය, ගෙදරට බඩු අරගෙන එන වෙළෙන්දො."

"නමුත් ඇයි ඉතින් හොඳ සිහිකල්පනාවෙන් ඉන්න කෙනෙක්, තමන්ට පිස්සු කියලා රටට පෙන්වන්න හදන්නේ?" මම ඇසීමි. "කෙනෙක් ඒ විධියට හැසිරෙන්නේ මොන හේතුවකින්ද කියලා මට නම් හිතාගන්න බැහැ."

"අන්න ඒ කාරණය හොයන්න තමයි මිත්‍රයා මම අද උදේ ඇල්ඩශොට් වලට පිටත්වෙලා ගියේ." හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි. "හෙන්ස්ටන් පැරණි වළව්ව කිට්ටුව තිබෙනවා, ඉතාම අනර්ඝ අවන්හලක් සහිත තානායමක්. ඒකෙ නම "බෙයා ඉන්." එහි හිමිකරුවා බෑන්ක්ස් නම් මහත්මයෙක්. ඔහු සමග ඩාට්ස් ක්‍රීඩාවේ යෙදෙමින් මට හැකිවුණා, අපේ මිත්‍ර කපිතාන් ජෝෂුවා වෙබර්





ගැන තොරතුරු ටිකක් දැනගන්න. ඔහු තමන්ගේ වත්තට එන වෙළෙන්දන්ට තුවක්කුව එල්ල කරලා ගින්නෙන් පන්නා දමනවා විතරක් නෙමෙයිලු. කපිතාන් වෙබර් "බෙයා ඉන්" තානායමට ගිහින් එතැනත් මහ කලබලයක් කරල තියෙනවා.

දින කිහිපයකට කලින් වෙබර් ඒ තානායමට ගිහින්, බෑන්ක්ස් මහත්මයාට කියල තියෙනවා, තමන්ගේ මිත්‍රයෙක් හමුවෙන්න පෞද්ගලික කාමරයක් වෙන්කරල දෙන්න කියල. ඒ මිත්‍රයා තානායමට ආවලු නියමිත වෙලාවට. දෙන්නා එක්ක කාමරයට වැදිලා දොරවල් වහගෙන ලොකු සාකච්ඡාවක් කළාලු. නමුත් වැඩිවෙලා යන්න කලින් දෙදෙනා අතර මහා සණ්ඩුවක් ඇතිවුණාලු, මුළු තානායමම දෙවනත් වෙන ආකාරයට. ටිකවෙලාවකට පස්සේ දොර ඇරගෙන ඔවුන් එළියට ඇවිත් තිබෙනවා. ගෙවීමට තිබූ මුදල් ගෙවලා ඔවුන් පිටවෙලා ගියාලු, ගිහින් තියෙන්නේ හෙන්ස්ටන් වළව්ව දෙසට."

"නමුත් මේ අමුත්තා වළව්වට ආව බවක් වෙබර් මෙනෙවිය සඳහන් කළේ නැහැ නේද?" මම ඇසීමි.

"ඇත්තෙන්ම ඔව්." හෝම්ස් එකඟවිය. "මේ බව දැන හිටියා නම්, ඇය ඒක අපට සඳහන් කරනවා. මට හොඳටම විශ්වාසයි, ඇයවත් ගෘහ සේවිකාව මාර්ගරට් මහත්මියවත් මේ කාරණාව දැනගෙන හිටියෙ නැහැ කියල. මං ඒ ගැන හොයල බැලුවා. මොකක්ද ඒකට හේතුව?"

පුටුවේ පිටුපසට හේත්තුවුණු හෝම්ස්, සිවිලිම දෙසට නෙත් යොමුකරගෙන කල්පනා කරන්නට පටන්ගත්තේය. දිගින් දිගටම ඔහු කල්පනා කරද්දී, එයට බාධා කිරීම නුසුදුසු බව මම දැනසිටියෙමි. එක්වරම පුටුවෙන් නැගී සිටි හෝම්ස් ලියන මේසය දෙසට ගමන් කළේය.

"මගේ හිතවත් වොට්සන්. මට විශ්වාසයි මේ කුඩා ගැටලුව අපට ඉක්මනින් විසඳා දෙන්න හැකිවේවි කියල. මං මේ යවන විදුලිපුවතෙන් අපට කාරණා බොහොමයක් පැහැදිලි වේවි. අපි හෙට යමු ඇල්ඩර්ශොට් වලට."

"අපි?"

"ඔව්, මා සමග එන්න ඔයාගේ අකමැත්තක් නොමැති නම්?"

"මම බොහොම සන්තෝෂයෙන් එන්නම්."

"එහෙම නම් අපි මේ ගැන තවත් මොකුත් කථානොකර ඉමු."

පසුවදා උදේ දුම්රියෙන් හෝම්ස් සහ මම හැම්ෂයර් ප්‍රාන්තය බලා පිටත්ව ගියෙමු. අප ගෙදරින් පිටත්වීමට පෙර හෝම්ස් නමට විදුලි පුවතක් ලැබිණ. ඒ කලින්දා රාත්‍රියේ ඔහු යැවූ එකට පිළිතුරුය. එය කියවීමෙන් ඔහුගේ මුහුණ සොම්නසින් රත්පැහැයට හැරී තිබූ බව මම නිරීක්ෂණය කළෙමි. ඒ අනුව අපට ලැබී ඇති ගැටලුව අද දවසේ සාර්ථක ලෙස විසඳාගැනීමට හැකිවෙතැයි විශ්වාස කළෙමි. ප්‍රීති ප්‍රමෝදයට පත්ව සිටි මගේ මිත්‍රයා, ඔහුට අපරාධ පරීක්ෂණ වෘත්තියේදී හමුවූ අපරාධකරුවන් සම්බන්ධව ගැන, නොයෙක් තොරතුරු මා සමග පැවසුවේය. විෂ යොදා මිනීමැරුම් කළ ස්ලැටරි නම් අපරාධකාරයා, හොරබඩු මිලට ගැනීම කළ බිට්කෝම්බ; විකෘති වූ පාදයක් තිබූ රිකොලෙට් ආදීන් ගැන හෝම්ස් විස්තර කියද්දී, කාලය ගතවී ගිය බව මට නොදැනිණ. වෙබර් මෙනෙවිය ගැනවත්, අප දැන් යෙදෙන්නට යන පරීක්ෂණය ගැනවත් ඔහු එක්වරක් හෝ සඳහන් කළේ නැත. කෙසේ වෙතත් අපේ ගමනාන්තයට ළඟාවීමට සැහෙන කලින් හෝම්ස්ගේ කථාබහ නැවතිණ. ඔහු තමන්ට පුරුදු නිහඬතාවයේ ගිලී කල්පනා කරන්නට පටන්ගත්තේය.

ඇල්ඩර්ෂොට් දුම්රියපොළේදී දුම්රියෙන් බැස, අපි කුලීරියකට නැගුණෙමු. හෙක්ස්ටන් වලව්ව දෙසට අප රැගෙන ගියේ එයයි. යෝධ එල්ම් වෘක්ෂ වලින් සෙවණ වූ මාවතක් දිගේ අපි ඉදිරියට පා නැගුවෙමු. එය දීප්තිමත් දිනයක් වුවත්, වලව්වේ තිබුණේ අඳුරු ශෝකාකුල බවක් බව, බැලූ බැල්මට පෙනිණ. ගෘහයේ වහළ කෙළවර හා බිත්ති ගැන සෝයා නොබැලීම නිසා, බොහෝ තැන්වල පිළිල වර්ග රෝපණය වී තිබිණ. ගෘහයේ මැද කොටසේ ජනේල විවෘතව තිබූ අතර බටහිර හා නැගෙනහිර දෙසට යොමුව තිබූ අංගන දෙකේ ජනේල් සියල්ල වසා දමා තිබිණ.

ශරීර ප්‍රමාණයෙන් කුඩා තාන්නාවක් දොරටුව අසලට පැමිණ අප පිළිගත්තාය. ඇය අප කැඳවාගෙන ගියේ විසිත්ත කාමරයටයි. එය ගෘහභාණ්ඩ රැසකින් පිරුණු සුවපහසු එකක් වූ බැව් පෙනිණ.

"අපේ කපිතාන් වෙබර් මහත්මයා නම් තවමත් ඔහුගේ කාමරේ" ඇය කීවේ සමාව අයදින හඬකිනි. "ඔහු මට උපදෙස් දීල තියෙන්නේ මොනම හේතුවක් නිසාවත් ඔහුට බාධාකරන්න එපා





කියලයි. ඔබේ පැමිණීම ගැන මං වෙබර් මෙනෙවියට දැනුම් දෙන්නම්." කී ඇය ගේ ඇතුළට යාමට සූදානම් වූවාය.

"මොහොතක් ඉන්න" හෝම්ස් ඇය නැවැත්වීය. "ඊයේ මං මෙහේ ආ වෙලාවේ දැනගන්න ලැබුණා, කපිතාන් නින්දෙන් අවදිවෙලා නැහැ කියලයි. ඊයේ ඉඳලා තවමත් ඔහු කාමරේට වැදිල දොර වසාගත්තු ගමන්ද?"

"නැහැ මහත්මයා" ඇය පිළිතුරු දුන්නාය. "කපිතාන් මහත්මයා හවස තේ බොන වෙලාවට නැගිට්ටා. ඊට පස්සෙ ඔහු ගෙදරින් එළියට බැහැලා, ගෙවත්තට ගියා. ඒ දහයට විතර ඔහු ආයුධ මඩුවෙන් එළියට බැහැලා ආපහු ගෙට එනවා හැටි මං දුටුවා. ඒ ඇවිත් ඔහු ගියේ ගෙදර නැගෙනහිර පැත්තේ කොටසට. ඔහු ඒ පැත්තට වෙලා මොනවා කරනවාද කියලා එක නම් මට හිතාගන්නවත් බැහැ. ඒ මොකද අලුත්වැඩියා ගණනාවක් නිසයි, ඔය පැත්ත වහල දමල නේ තිබුණේ. ඒ වුණත් බලාගෙන ගියාම ඒකෙ පුදුමයක් නෑ. මෑතක ඉඳන් අපේ මහත්මයා හැසිරෙන පිළිවෙළ හරිම අමුතුයි නේ. මං වෙබර් මෙනෙවියට කියලයි තියෙන්නේ, මහත්තයා වෛද්‍යවරයෙක් ළඟට එක්ක යන්න දැන් කාලෙ හරි කියලා."

"ඔබේ කතාව හරි [illegible]" හෝම්ස් කීය. "මාත් එක්ක ඇවිත් ඉන්න මගේ මේ මිත්‍රයා වෛද්‍යවරයෙක්. ඔහු දොස්තර වොට්සන්. බාගවෙලාවට අපට ඔහුගෙන් ප්‍රයෝජනයක් ලැබෙන්න ඉඩතියෙනවා. මොකක්ද ඔබ ආයුධ මඩුවක් ගැන කිව්වේ? ඔය කියන්නේ පාරෙ ඉඳල මේ ගේ පැත්තට එනකොට වම් අත පැත්තෙන් තිබෙන පුංචි ගේද?"

"ඔව් මහත්මයා ඒක තමයි. වත්ත උදලුගාන උපකරණ, පොළොව හාරන්න, මල් වවන්න යොදා ගන්න උපකරණ ආදී ආයුධ හැම එකක්ම ගබඩාකරලා තියෙන්නේ ඒකෙ තමයි."

ෂර්ලොක් හෝම්ස් එයට පිළිතුරක් දීමට පෙර දොර විවෘත විය. පූඩල් බලුපැටියා ද ඔසවාගෙන, විසිත්ත කාමරයට පැමිණියේ වෙබර් මෙනෙවියයි.

"මගේ ප්‍රමාදය ගැන සමාවෙන්න හෝම්ස් මහත්මයා" ඇය කීවාය. "මට තාත්තා ගැන බලන්න සිදුවුණා. මෑතක ඉඳල ඔහු නිතර නිතර කියනවා විඩාපත් ගතියක් ගැන. ඒ වුණත් ඇඳට වෙලා කොයි වෙලාවකවත් විවේක ගන්නෙ නෑ. ඔන්න ඊයෙ තමයි ඇඳට ගියේ."



www.sinhalaelibrary.com

"ඒ කියන්නෙ මං මෙහාට ආවට පස්සේ" හෝම්ස් ඉතා සිහින් හඬින් කීවේ මට පමණක් ඇසෙන අයුරිනි. ඒ සමගම ඔහු මා දෙස බැල්මක් හෙළුවේය. "වෙබර් මෙනෙවිය. ඔබ තාත්තාට කිව්වාද උපදෙස් ගන්න මාව හමුවෙන්න ගියා කියලා?"

"නැහැ මහත්මයා. ඒ වුණත් ඔහුට ඔබේ කටහඬ ඇහෙන්න ඇති. ඊයේ මෙහේට පිටින් කෙනෙක් ඇවිත්, මනාගෙයක් ප්‍රශ්න ඉදිරිපත් කරමින් යම් යම් දේ සොයා බැලූ බව, ඔහුට වැටහෙන්න ඇති. කොහොම වුණත් මට තේරුම් ගන්න බැහැ, තාත්තා කාමරේ ඇතුළට වෙලා, මේ විධියට දොර යතුරු දමාගෙන ඉන්නෙ ඇයි කියලා?"

"මට තේරෙනවා වොට්සන්, මට තේරෙනවා" හෝම්ස් කීවේ මට පමණක් ඇසෙන ලෙසිනි.

"මොකක්ද හෝම්ස් මහත්මයා කිව්වේ?" තරුණිය ඇසුවාය.

"ඔහුට විඩාව හුඟක් දැනෙනවා ඇති. ඒකට ඉතින් අනික් අය මොනවා කරන්නද? ඒක නෙමෙයි වෙබර් මෙනෙවිය. ඔබෙන් අවසරයක් ලැබෙනවා නම්, මං කැමතියි දොස්තර වොට්සන්ට මේ වලව්ව පෙන්වන්න. මේක ඉතාම අලංකාර පෞරාණික මන්දිරයක්. මේ වගේ මැඳුරු අපට ලන්ඩන් නගරයේ දකින්න ලැබෙන්නෙ වත් නැහැ. ඒ වගේමයි මෙහේ ගෙවත්තත්. විවේක වෙලාවට ඇවිදින්න මේක කොයිතරම් සිත් ගන්නාසුළුද? බේකර් වීථියේ අප කිසිදාක නොදකින තරම්, හිරු එළියේ දීප්තිමත් බව මෙහි ගෙවත්තේ විඳගන්න පුළුවනි."

අතිශය සතුටට පත් වෙබර් මෙනෙවිය හෝම්ස්ගේ ඉල්ලීමට කැමැත්ත පළකළාය.

අපි විසිත්ත කාමරයෙන් ඉස්තෝප්පුවට පා නැගුවෙමු. අපගේ වම්පසින් වූ කාමරයේ දොර මෙතෙක් වේලා තිබෙන්නට ඇත්තේ යන්තමින් විවෘතව වන්නට ඇත. අප ඉස්තෝප්පුවට පා තබද්දීම දොර පියන් උළුවස්සට තදවුණේ සියුම් ශබ්දයක් නගමිනි. ඒ කපිතාන්ගේ [illegible] කාමරයයි.

මේ දසුනෙන් මගේ සිතේ ඇතිවූයේ තිගැස්මකි. මම වහාම මගේ මිතුරාගේ මුහුණ බැලීමි.

"මාත් එය දුටුවා වොට්සන්" ඔහු සිහින් හඬින් කීය. "ඒකෙන් පෙනෙන්නේ කපිතාන් අපි මේ හිතාගෙන ඉන්න තරම් විඩාපත්





වෙලා නැහැ කියන එකයි. අපි යමු හොඳ එළිමහනට. එතකොට කාටවත් බෑ හැංගිලා අපව නිරීක්ෂණය කරන්න."

නිවසෙන් පිටවී ගෙවත්තට පිවිසි වහාම හෝම්ස් පා නැගුවේ ආයුධ මඩුව නමින් හැඳින්වූ කුඩාගෙය දෙසටයි. එය වටේටම ලොකු ගස් හා කුඩා පඳුරු වලින් තදින් ආවරණය වී තිබිණි.

"මේකෙ දොරට ඉබියතුරු දමලයි තියෙන්නෙ" හෝම්ස් කීය. "ඒ වුණත් මේ අගුළු සහ ඉබියතුරු මෑතකදී නිතර නිතර පාවිච්චි වෙලා තියෙනවා. කපිතාන් මේක ඇතුළේ මොනවා හරි ගබඩාකරගෙන ඉන්න බවයි පෙනෙන්නෙ. ඒවා මොනවා වුණත් දවල් කාලයේදී ඔහුට එළිමහනට ගන්න බැරි දෙයක් තමයි ඒ. කිසිම දෙයක් තේරුම් ගන්න බැරි අවස්ථාවකටයි අපි ළංවෙන්නෙ වොට්සන්."

"ඔහු ගෙදර නැගෙනහිර අංගනයේ මොනවා හරි වෙනස් කම් කරනවා වෙන්න බැරිද?" මම ඇසීමි. "ඔහුට හිතෙනවා ඇති ඒකෙ වැඩකටයුතු ඉවර වෙන තුරු එය දියණියට රහසක් හැටියට තියාගන්න. බාගවෙලාවට තරුණියනට විශේෂ, රූප ලාවණ්‍යය සකසන විවේකාගාරයක් වැනි තැනක්?"

හෝම්ස් මහ හඬින් සිනාසුණේය. "නැහැ වොට්සන්. ඒක නම් කොහොමටවත් වෙන්න බැහැ. එහෙම දෙයක් නම් ඇයි දිගින් දිගටම මේ අමුතු විධියේ හැසිරීම්? පිස්සු හැදිලා වගේ පෙන්වන්න විකාර කරන්නේ ඇයි? බාගවෙලාවට ඔබට හිතෙනවා ඇති, කපිතාන්ට 'බෙයා ඉන්' තානායමේදී හමුවුණු පුද්ගලයා- අර පසුව සණ්ඩුවුණු නැනැත්තා, පෙදරේරුවෙක් නැත්නම් ගෙවල් අලුත්වැඩියා කරන කාර්මිකයෙක් වෙන්න ඇති කියලා. නැහැ මිතුරා. කපිතාන් යෙදී ඉන්නේ ඒ වගේ සුළු වැඩක වෙන්න බැහැ. අපි දන්නෙ නෑ. බාගවෙලාවට ඔහු ඊට වඩා බොහොම බරපතල දෙයක් වසන් කරන්න උත්සාහ කරනවා වෙන්න ඇති."

මා මුලින් කී දෙයට හෝම්ස් උපහාසාත්මකව සිනාවීම නිසා මගේ සිත රිදිණ. එහෙත් ඔහු එය පහදා දුන් විට, මා කියූවේ මොන තරම් මෝඩ අදහසක්ද යන්න මට වැටහිණ. මගෙන් ඔහුට පිළිතුරක් ලැබීමට පෙර, හෝම්ස්ගේ සිනාව නැතිවී ගියේය. ආයුධ මඩුව නමින් හැඳින්වූ ගොඩනැගිල්ලේ ජනෙල් වීදුරු වලට දැස් තබා එහි ඇතුළත වූයේ මොනවාදැයි බැලීමට හෝම්ස් තැත් කළේය. එහෙත්

"ඒ කියන්නේ මං මෙහාට ආවට පස්සේ" හෝම්ස් ඉතා සිහින් හඬින් කීවේ මට පමණක් ඇසෙන අයුරෙනි. ඒ සමගම ඔහු මා දෙස බැල්මක් හෙළුවේය. "වෙබර් මෙනෙවිය. ඔබ තාත්තාට කිව්වාද උපදෙස් ගන්න මාව හමුවෙන්න ගියා කියලා?"

"නැහැ මහත්මයා. ඒ වුණත් ඔහුට ඔබේ කටහඬ ඇහෙන්න ඇති. ඊයේ මෙහේට පිටින් කෙනෙක් ඇවිත්, මනාපයෙක් ප්‍රශ්න ඉදිරිපත් කරමින් යම් යම් දේ සොයා බැලූ බව, ඔහුට වැටහෙන්න ඇති. කොහොම වුණත් මට තේරුම් ගන්න බැහැ, තාත්තා කාමරේ ඇතුළට වෙලා, මේ විධියට දොර යතුරු දමාගෙන ඉන්නෙ ඇයි කියලා?"

"මට තේරෙනවා වොට්සන්, මට තේරෙනවා" හෝම්ස් කීවේ මට පමණක් ඇසෙන ලෙසිනි.

"මොකක්ද හෝම්ස් මහත්මයා කිව්වේ?" තරුණිය ඇසුවාය.

"ඔහුට විඩාව හුගක් දැනෙනවා ඇති. ඒකට ඉතින් අනික් අය මොනවා කරන්නද? ඒක නෙමෙයි වෙබර් මෙනෙවිය. ඔබෙන් අවසරයක් ලැබෙනවා නම්, මං කැමැතියි දොස්තර වොට්සන්ට මේ වළව්ව පෙන්වන්න. මේක ඉතාම අලංකාර පෞරාණික මන්දිරයක්. මේ වගේ මැඳුරු අපට ලන්ඩන් නගරයේ දකින්න ලැබෙන්නේ වත් නැහැ. ඒ වගේමයි මෙහේ ගෙවත්තත්. විවේක වෙලාවට ඇවිදින්න මේක කොයිතරම් සිත් ගන්නාසුලුද? බේකර් වීථියේ අප කිසිදාක නොදකින තරම්, හිරු එළියේ දීප්තිමත් බව ඔබේ ගෙවත්තේ විඳගන්න පුළුවනි."

අතිශය සතුටට පත් වෙබර් මෙනෙවිය හෝම්ස්ගේ ඉල්ලීමට කැමැත්ත පළකළාය.

අපි විසිත්ත කාමරයෙන් ඉස්තෝප්පුවට පා නැගුවෙමු. අපගේ වම්පසින් වූ කාමරයේ දොර මෙතෙක් වේලා තිබෙන්නට ඇත්තේ [illegible] විවෘතව වන්නට ඇත. අප ඉස්තෝප්පුවට පා තබද්දීම දොර පියන් උළුවස්සට තදවූයේ සියුම් ශබ්දයක් නගමිනි. ඒ කපිතාන්ගේ [illegible] කාමරයයි.

මේ දසුනෙන් මගේ සිතේ ඇතිවූයේ තිගැස්මකි. මම වහාම මගේ මිතුරාගේ මුහුණ බැලීමි.

"මාත් එය දුටුවා වොට්සන්" ඔහු සිහින් හඬින් කීය. "ඒකෙන් පෙනෙන්නේ කපිතාන් අපි මේ හිතාගෙන ඉන්න තරම් විඩාපත්



www.sinhalaelibrary.com



වෙලා නැහැ කියන එකයි. අපි යමු හොඳ එළිමහනට. එතකොට කාටවත් බෑ හැංගිලා අපව නිරීක්ෂණය කරන්න."

නිවසෙන් පිටවී ගෙවත්තට පිවිසි වහාම හෝම්ස් පා නැගුවේ ආයුධ මඩුව නමින් හැඳින්වූ කුඩාගෙය දෙසටයි. එය වටේටම ලොකු ගස් හා කුඩා පඳුරු වලින් තදින් ආවරණය වී තිබිණි.

"මේකෙ දොරට ඉබියතුරු දමලයි තියෙන්නෙ" හෝම්ස් කීය. "ඒ වුණත් මේ අගුළු සහ ඉබියතුරු මෑතකදී නිතර නිතර පාවිච්චි වෙලා තියෙනවා. කපිතාන් මේක ඇතුළේ මොනවා හරි ගබඩාකරගෙන ඉන්න බවයි පෙනෙන්නේ. ඒවා මොනවා වුණත් දවල් කාලයේදී ඔහුට එළිමහනට ගන්න බැරි දෙයක් තමයි ඒ. කිසිම දෙයක් තේරුම් ගන්න බැරි අවස්ථාවකටයි අපි ළංවෙන්නෙ වොට්සන්."

"ඔහු ගෙදර නැගෙනහිර අංශයේ මොනවා හරි වෙනස් කම් කරනවා වෙන්න බැරිද?" මම ඇසීමි. "ඔහුට හිතෙනවා ඇති ඒකෙ වැඩකටයුතු ඉවර වෙන තුරු එය දියණියට රහසක් හැටියට තියාගන්න. බාගවෙලාවට තරුණියනට විශේෂ, රූප ලාවණ්‍යය සකසන විවේකාගාරයක් වැනි තැනක්?"

හෝම්ස් මහ හඬින් සිනාසුණේය. "නැහැ වොට්සන්. ඒක නම් කොහොමටවත් වෙන්න බැහැ. එහෙම දෙයක් නම් ඇයි දිගින් දිගටම මේ අමුතු විධියේ හැසිරීම්? පිස්සු හැදිලා වගේ පෙන්වන්න විකාර කරන්නේ ඇයි? බාගවෙලාවට ඔබට හිතෙනවා ඇති, කපිතාන්ට 'බෙයා ඉන්' තානායමේදී හමුවුණු පුද්ගලයා- අර පසුව සණ්ඩුවුණු තැනැත්තා, පෙදරේරුවෙක් නැත්නම් ගෙවල් අලුත්වැඩියා කරන කාර්මිකයෙක් වෙන්න ඇති කියලා. නැහැ මිත්‍රයා. කපිතාන් ගෙදී ඉන්නේ ඒ වගේ සුළු වැඩක වෙන්න බැහැ. අපි දන්නෙ නෑ. බාගවෙලාවට ඔහු ඊට වඩා බොහොම බරපතල දෙයක් වසන් කරන්න උත්සාහ කරනවා වෙන්න ඇති."

මා මුලින් කී දෙයට හෝම්ස් උපහාසාත්මකව සිනාවීම නිසා මගේ සිත රිදිණි. එහෙත් ඔහු එය පහදා දුන් විට, මා කියූවේ මොන තරම් මෝඩ අදහසක්ද යන්න මට වැටහිණි. මගෙන් ඔහුට පිළිතුරක් ලැබීමට පෙර, හෝම්ස්ගේ සිනාව නැතිවී ගියේය. ආයුධ මඩුව නමින් හැඳින්වූ ගොඩනැගිල්ලේ ජනෙල් වීදුරු වලට දෑස් තබා එහි ඇතුළත වූයේ මොනවාදැයි බැලීමට හෝම්ස් තැත් කළේය. එහෙත්

එය අසාර්ථක වූයේ වීදුරු සියල්ල ඇතුළතින්, කළු පැහැ තීන්ත ආලේප කර තිබූ බැවිනි. එක්වරම සිටිතැන් හැරවුණු මගේ මිත්‍රයා, කාචය සාක්කුවෙන් ඇදගෙන පොළොව පරීක්ෂා කර බැලීමට පටන්ගත්තේය.

"ඔබට මේ සුවඳ මොකක්ද කියල කියන්න පුළුවන්ද?" ඔහු ඇසුවේ, පොළොවේ තිබූ පැල්ලම් කිහිපයක් මත ඇඟිල්ල අතුල්ලා එය නාසයට ළංකරමිනි.

"භූමිතෙල්?"

"හරියට හරි. භූමිතෙල්. දැන් නම් මගේ හිතට ලොකු සැකයක් ඇතිවෙනවා වොට්සන්. අපි මෙහේට ඒම නිසා කපිතාන් ඔහුගේ වැඩකටයුතු බොහොම කඩිනමින් කරන්න ඉඩ තියෙනවා. නමුත් බොහෙවලාවට ඒකෙන් වෙබර් මෙහෙවියට ලැබෙන්නේ නරක ප්‍රතිඵල වෙන්න පුළුවනි."

"අපි ගිහින් මේ වලව්වේ නැගෙනහිර පැත්තේ අංගනය සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරලා බලමු" මම කීවෙමි. "සැකයක් නෑ. අගිරහසට විසඳුම ඇත්තේ එතැනයි. එහෙම නේද?"

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීවේ තරමක් විදුණු හඬකිනි. "මං ඊයේ මෙහෙන් ආවා නේ. මට පුළුවනි කමක් තිබුණා නම්, කළයුතු ඒ ප්‍රධානම දේ මං නොකර ඉඳීවි කියල ඔබ හිතනවද? ඔබට ඇහුණා නේද වෙබර් මෙහෙවිය කිව්ව දේ? ගේ ඇතුළතින් නැගෙනහිර පැත්තට යා හැකි සෑම දොරක්ම, සම්පූර්ණයෙන්ම අවහිර කර ඇති බව. මාත් සෝදිසි කරල බැලුවා. ඇගේ කතාව සම්පූර්ණ ඇත්ත. ඇතුළත සෑම දොරකටම ඉබියතුරු දමලා විතරක් නෙමෙයි, හරහට ලෑලි තබා ඇණ ගහලා. නමුත් අපි ඉදිරියෙන් පේන්නතන, දැන් අපි ළංවෙන මහ දොරටුව ඇණගහලා අවහිර කරලා නෑ. ඒක නිතර නිතර පාවිච්චියට ගත් තැනක්."

ආයුධ මඩුවෙන් පැමිණි අප දැන් සිටගෙන සිටියේ, නැගෙනහිර අංගනයේ වූ මහ දොරටුව ඉදිරියේය. එය දහහත් වැනි සියවසේ තැනූ යෝධ දොරටුවකි. එය මෑතකදී බෙහෙවින් ප්‍රයෝජනයට ගත් බව දක්වෙන ලකුණු මම දුටුවෙමි. දොර ඉදිරියෙන් පොළොවේ වූ තණකොළ, නිතර නිතර පෑගීම නිසා මැරීගොස් තිබිණි. දොර ලෑල්ලට තදින් හිරවෙන සේ සවිකොට තිබූ අගුළේ, ඉබ්බාට යෙදූ තෙල් නිසා එය කළු පැහැ වී තිබිණි. මෙහි ද ජනේල වල වීදුරු කළු පැහැති කර තිබිණි.





අපි එතැනින් ඉවත්ව තණකොළ තිබූ ගොඩැල්ල වෙත ගියෙමු.

"ඔබට පුළුවන් නම් මට ටිකක් සවන්දෙන්න. මං කියන්නම් කථාව" මගේ මිත්‍රයා කීය. "මේ හැමදෙයක්ම මට පැහැදිලියි. දැන් ඉතිරිවෙලා තියෙන්නේ මේක සතුටුදායක පිළිවෙළකට අවසානයක් කිරීම පමණයි. නමුත් අපට ඒ දේ යටමත් කරන්න බැහැ. ඒ මොකද විඩාපත් කපිතාන්ට ඇඳෙන් නැගිටින්න තරම් සනීපයක් ලැබෙන තුරු අපට බලාගෙන ඉන්න වෙනවා. ඉර බැහැගෙන යද්දී මං හිතන්නේ කුළුණේ කුටියෙන් එළියට ඒවි."

"එහෙනම් ඔබට හිතෙන්නේ භයානක අපරාධයක් සිදුවෙන්න යනවා කියලද?" මම ඇසීමි.

තම සාක්කුවෙන් ඔහුගේ ප්‍රියතම කළු පැහැති පිගන්මැටි පයිප්පය එළියට ගත් හෝම්ස්, එහි කොටුවට දුම්කොළ පිරෙව්වේය.

"මං මේ කතන්දරේ තේරුම් ගත්ත හැටි හරිනම්, ඒ අපරාධය සිදුවෙලා ඉවරයි වොට්සන්. මං ඔබට මුලදී කිව්වා වගේ, කපිතාන් වෙබර්ගේ මේ අමුතු හැසිරීමට හේතුව පැහැදිලි කළ හැක්කේ එකම ක්‍රමයකටයි. යමක් සැඟවීමට අහාඳම තැන, ඒ වර්ගයේ දේවල් රැසක් රඳවා ඇති තැන. උදාහරණයක් කීවොත්, අල්පෙනෙත්තක් හොයාගන්න බැරි විධියට හංගන්න පුළුවන්, තවත් අල්පෙනෙත්ති රැසක් අමුණා තිබෙන කුෂනයක. කපිතාන්ගේ අමුතු විකාර හැසිරීම කොයිතරමක් ප්‍රසිද්ධියට පත්වෙලාද කිව්වොත්, ඔහු අතින් අපරාධයක් සිදුවුණත් ඒකත් අනෙක් අයට නොපෙනී යන්න පුළුවන්. ඔබට මතකද වෙබර් මෙහෙවිය අපට කිව්වා, තාත්තාට ලියුමක් ලැබුණා; ඒකෙන් තාත්තා කැලැඹීමකට පත්වුණා; ඒක ව්‍යාපාර වලට කළ මුදල් ආයෝජනයක් පිළිබඳ ලියුමක් බව? ඒ ලියුම ලැබිලා දවස් දෙකකට පස්සෙයි මේ අවුල්, කලබල හැම දෙයක්ම පටන්ගත්තේ."

"හෝම්ස්" මම කීවෙමි. "මටත් දැන් තේරෙනවා ඔබ කියන දේ. ඔහුට මේ ලියුම එව්වේ කවුද කියලා අපට හොයා ගන්න පුළුවන් නම්...."

මට එතැනින් එහාට කිසිවක් කීමට ඉඩ නොලැබිණි. ඊට හේතුව තමාගේ කථාවට බාධා නොකළ යුතු බවට හෝම්ස් කළ සංඥාවය.

".... ඊළඟ දවසේ මම "බෙඩ් ඉන්" නානායමේ අයිතිකරු සමග 'ඩාට්ස්' ක්‍රීඩාවේ යෙදුණු බව ඔබට කිව්වා නේද? ඔහුගෙන් තමයි

මම දැනගත්තේ, කපිතාන් වෙබර් බලාපොරොත්තුවෙන් හිටි මිත්‍රයා ගැනත් ඔහු අද්භූත අයුරින් අතුරුදන් වූ හැටි ගැනත්. මං මේ කාරණා දෙක එකට එකතු කළා. එතකොට මොකක්ද අපට ලැබෙන පිළිතුර?"

"ලියුම ලැබුණේ මේ මිත්‍රයාගෙන් කියන එක."

"හරියට හරි වොට්සන්. අද ඔබේ නිගමන ඉතාම නිවැරදියි. මේ ලියුම ආවෙ ඔහුගේ මිත්‍රයාගෙන්. ඒකෙ කියල තිබුණා ඔහු අසවල් දිනයේ අසවල් වෙලාවට 'බෙයා ඉන්' තානායමේදී කපිතාන්ව හමුවෙනවා කියල. ඔන්න එතකොට තමයි අපේ වීර කපිතාන් රඟපාන්න පටන්ගන්නේ. ඔහු මාව්මොන්ට් මහත්මිය බියෙන් ත්‍රස්ත කරලා, බාගෙට පිස්සු හැදී ඇති බවට ලොකු ප්‍රසිද්ධියක් ලබනවා. නියමිත දිනයේ අර මිත්‍රයා පැමිණෙනවා. තානායමේදී කළ සාකච්ඡාවේදී ලොකු ආරවුලක් ඇතිවෙනවා. කපිතන් මිතුරාව කැඳවාගෙන යන්නේ හෙක්ස්ටන් වලව්වේ නැගෙනහිර අංගනයට. එතැනදී මොකද වෙන්නේ? කපිතන් වෙබර් අතින් මිත්‍රයා මැරුම කනවා!"

"දෙයියන්ට ඔප්පුවෙච්චාවේ!" මට කෑගැසිණි.

මගේ මිත්‍රයා හිස ඉදිරියටත් පිටිපසටත් සෙලවූයේ එය තමා එකඟවීමෙන් කළ ප්‍රකාශයක් බව හඟවමිනි. "ඔහුගේ ඉතා අසාමාන්‍ය හැසිරීම වෙන කිසිම උපකල්පනයකින් තේරුම් කරන්න බැහැ. ඔවුන් දෙදෙනා තානායමෙන් එළියට බැහැලා වලව්ව පැත්තට යනවා දකින්න ලැබුණා. නමුත් මොවුන් එන බවක් හෝ ආව බවක් වෙබර් මෙනෙවිය වත් සේවිකාව වත් දැක්කේ නැහැ. ඒ මොකද ඔහු මිත්‍රයා කැඳවාගෙන ගියේ, නිවසේ නැගෙනහිර පැත්තට. ඒ මිත්‍රයා මරාදැමුණා. ඒ නාඳුනන පුද්ගලයා දැන් ඇත්තේ ඒ කොටසේ. ඊළඟට කපිතන් කාටවත් එහි දොරවල් අරින්න බැරි විධියට, හැම දොරක්ම වසා දැම්මා, ලෑලි තබා ඇණ ගැහුවා. තමන්ගේ පියා මිටියක් අරගෙන එනවා වෙබර් මෙනෙවිය දැකුවා. ඇය ඒක සැලකුවේ පියාගේ විකාර විධියේ හැසිරීමේ තවත් එක් අවස්ථාවක් ලෙස."

"ඒ වුණත් හෝම්ස් මෙහෙම ප්‍රශ්නයක් මතුවෙනවා නේ." මම කීවෙමි. "මේ අතුරුදන් වුණු පුද්ගලයාගේ පවුලේ අය ඒ බව පොලීසියට දැනුම්දෙන බවට සැක නෑ. ඊළඟට 'බෙයා ඉන්' තානායමේ අයගෙන් අහා බැලුවොත් දෙදෙනා අතර ඇතිවුණු සණ්ඩුව ගැන ඔවුන් කියාවි. කපිතාන්ට ඒ ගැන මතක්වුණේ නැද්ද?"





"නැහැ වොට්සන්. ඒ වෙලාවේ කපිතාන්ට ඒ ගැන කල්පනා නොවෙන්නත් ඇති. මේ හැම සිද්ධියකටම පදනම්වුණු ප්‍රධාන සිද්ධිය වුණේ අවුරුද්දකට කලින්, කපිතාන් වෙබර් එංගලන්තයට ආපහු ආව දින වල. ඔබ දුටුවා මං මගේ පිටලිපුවතක් යැවූ හැටි. අද උදේ මට ඊට ලැබුණු පිළිතුරෙන් කපිතාන් ගැන හුඟක් තොරතුරු එළිවුණා.

1877 අවුරුද්දේ සත් සමුදුරු තරණය කළ "මාරියා ක්‍රිස්ටිනා" නම් නෞකාව භාර ප්‍රධාන කපිතාන්වරයා වුණේ, කපිතාන් ජෝෂුවා වෙබර්. ඒ නැවේ නම කිව්වාම ඔබට මොකක්ද මතක් වෙන්නේ?"

"මාරියා ක්‍රිස්ටිනා ද? අවුරුදු ගණනාවකට කලින් මහා හොරබඩු ජාවාරමක් ගැන ප්‍රසිද්ධියට පත්වුණේ ඔය නැව නේද?"

"අන්න හරි" හෝම්ස් කීය. "මෙරටට ගෙන ඒම තහනම් කළ හා සීමා කළ මත්පැන්, ඖෂධ හා තවත් බඩු එංගලන්තයට ගෙන ඒම ගැන, නැවේ දෙවැනියා වූ ඇඩම් බෙල්ටර්ට චෝදනා එල්ලවුණා. මේ හැම දෙයක්ම සිදුවුණේ නැවේ කපිතාන්ගේ අනුදැනීම ඇතිව බව ඔප්පුවෙන සාක්ෂි රැසක්ම තිබුණා. නමුත් වෙබර් සමත්වුණා එම චෝදනා වලින් බේරී යන්න. ඒක කරගත්තේ කොහොමද කියන්න අපි දන්නේ නෑ. නමුත් නඩු විභාගයේදී ඔහුට විරුද්ධව චෝදනා එල්ලවුණේ නැහැ. අනෙක ඒ වෙලාවේ රජයේ ප්‍රධාන සාක්ෂිකරුවෙක් වුණේ කපිතාන් වෙබර්. හැමදේකටම වැරදිකාරයා, අපරාධ කාරයා වුණේ, වෙබර්ගේ මිත්‍රයෙක්ව මෙන්ම දෙවැනියාව සිටි බෙල්ටර්. ඔහු දොළොස් අවුරුද්දකට හිරේට නියමවුණා."

"දොළොස් අවුරුද්දකට?" මම ඇසීමි. "එහෙනම් දැන් ඔහු නිදහස් වෙලාද?"

"ඔව්. ඔහු සති අටකට කලින් නිදහස් වුණා. ඔන්න ඔය කාලෙ තමයි කපිතාන්ට ලියුමක් ආවෙ. ඔහු ඒකෙන් දැඩි භීතියකට පත්වුණා. තමන්ව හිරේ යැවූ, මිතුරෙකුව හැටියට ඉඳලා එකට අපරාධ කරලා පසුව ද්‍රෝහිවුණු පුද්ගලයා කවුද කියලා ඇඩම් බෙල්ටර් හොඳින් දැනහිටියා. ඔහු හිරදඬුවමේ කාලය අවසන්කර නිදහස්වුණා. බෙල්ටර් ඊළඟට ගන්න පියවර මොකක්ද කියන එක කපිතන් තේරුම්ගන්න ඇති. ඒ හින්දයි ඔහු මේ විධියේ සැලැස්මක් ක්‍රියාත්මක කළේ. මං පිළිගන්නවා මේක මගේ අපරාධ පරීක්ෂණ



www.sinhalaelibrary.com

වලදී මෙහෙත් මට හමුනොවූ ප්‍රයෝගයක් බව. කොහොම වුණත් 1868 දී හෙල්සිංකි වලදීත් මේ ආකාරයේම සටකපට වැඩක් වුණු බව මං කියෙව්වා මට මතකයි."

"මගේ හිතවත් හෝම්ස්" මට කියැවුණේ මේ ශ්‍රේෂ්ඨ අපරාධ පරීක්ෂකයාගේ නිපුණ බුද්ධියෙන් මේ ගැටලුව නිරාකරණය කළ අයුරු වැටහෙද්දීය. "මට හරි පුදුමයි. ඔබ දැනගෙන හිටි හැම දෙයක්ම මාත් දැනගෙන හිටියා. ඒත් මේ ප්‍රශ්නයට විසඳුම තියා, එහි අගක් මුලක්වත් මට තේරුම් ගන්න බැරිවුණා. දැන් කපිතාන්ව නීතිය ඉදිරියට ගෙනියන්න අපි මොකක්ද කළ යුත්තේ?"

වාඩිවී සිටි තැනින් නැගී සිටි මගේ මිත්‍රයා වළව්ව දෙසට පියනැගීමට පටන්ගත්තේය.

"අපි මේ අවට පෙනෙන්න ඉන්න තුරු කපිතාන් ඔහුගේ ගුහාවෙන් එළියට එන්නේ නෑ. ඒ නිසා අපි ඔහුට හිතන්න ඉඩ අරිමු, අපි මෙහෙන් පිටවී ලන්ඩනය බලා යන බව. ඒ වුණත් ඇත්තෙන්ම අපි වැඩි ඈතකට යන්නෙ නෑ."

අපි වෙබ්ර් මෙනෙවිය හමුවූයෙමු. තමාට හදිසි කටයුත්තක් සඳහා ලන්ඩනයට යාමට සිදුවී ඇති බව හෝම්ස් පැවසුවේය. ඇය එයින් කණගාටුවටත්, බලාපොරොත්තු සුන්වූ තත්ත්වයටත් පත්වූවාය. එහෙත් ඊළඟ දිනයේ අප ආපසු එන බව කාරුණික ස්වරයෙන් පවසා ඇය අස්වැසීමට හෝම්ස් සමත් විය.

අප ගමන් කළේ 'බෙයා ඉන්' තානායම දක්වා පමණි. එහි පැමිණ සිටි අපට හුරුපුරුදු මිත්‍රයෙක් අප පිළිගත්තේය. ඒ ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක ලෙස්ට්‍රේඩ්ය.

"අන්න හොඳයි හෝම්ස් මහත්මයා, ඔබ ප්‍රමාද නොවී ආ එක" ලෙස්ට්‍රේඩ් කීය. "ඔබේ විදුලි පුවත ලැබිලයි මං දුවගෙන ආවෙ. මොකක්ද දැන් ඇතිවෙලා තියෙන ප්‍රශ්නෙ?"

"අපිත් එක්ක කෑම මේසෙට වාඩිවෙන්න" හෝම්ස් කීය. "මං ඔබට තේරුම් කරදෙන්නම් හැමදෙයක්ම. මගේ හිතවත් බෑක්ස් මහත්මයාගේ කුකුළු මස් ව්‍යාංජනයේ රස බලමු. අප ඉදිරියට පැමිණීමට නියමිත කටයුත්තේ දුෂ්කරතා වලට, වඩාත් හොඳින් මුහුණ දෙන්න, එතකොට අපට හැකිවේවි. අභිරහස් මිනීමැරුම් විසඳීම ගැන, ඔබට ආයෙනත් ලොකු කීර්ති නාමයක් ලැබිල තියෙනවා නොවැ ලෙස්ට්‍රේඩ්. මට ඒ ගැන ඊර්ෂ්‍යාත් හිතෙනවා.





අන්න ඒ ලැයිස්තුවට තවත් අලංකාර මිනීමැරුමක් එකතුකරගන්න ඔබට හැකිවේවි."

හෝම්ස්ගේ කථාවට සවන්දුන් පසු පොලිස් නිලධරයාගේ මුහුණේ මතුවූයේ, එය විශ්වාසයට ගැනීමට අපහසු බව හැඟවෙන සලකුණුය. එහෙත් හෝම්ස් සතු දක්ෂතාවයන් ගැන මැනැවින් තේරුම් ගෙන සිටි ලෙස්ට්‍රේඩ්, මගේ මිත්‍රයා කියන දේ සැහැල්ලුවෙන් භාර නොගත යුතු බව තෙසිටියේය.

"හරි. මං සූදානම් ඔබ එක්ක එන්න" ලෙස්ට්‍රේඩ් කීය.

"හොඳ මනුස්සයා. කාලෙකින් අපි එකට වැඩ කළ නිසා, මං හිතන්නේ අපේ වැඩකටයුතු පටන්ගන්න වෙලාව හරි. වොට්සන්. ඔබ රිවෝල්වරය අරගෙන ආවා නේද?"

"ඔව්. මගේ රිවෝල්වරය සාක්කුවේ" මම එයට තට්ටුකරමින් කීවෙමි.

"එහෙම නම් අපි පිටත්වෙමු" හෝම්ස් කීය. "අපේ කුඩා ගැටලුවේ අභිරහස හෙළිකරන්න මෙන්න මෙක වේවි කියල මං විශ්වාස කරනවා."

අපි ආපසු පැමිණි මෙක්සිජිරෝ වළව්ව දෙසට ගමන් කළත්, එය ළඟටම නොගියෙමු. මා කලින්ද සඳහන් කළ, කුඩා ගස් හා සනව වැඩුණු පඳුරු සහිත රක්ෂිතභූමිය තුළට ගොස් එහි රැඳුණෙමු. මුළු ගොඩනැගිල්ලේම ඉදිරිපස ද, සැතපුම හයක් පමණ දුරකට විහිදී ඇති නැගෙනහිර කොටසේ දුවැන්ත ඉදිරි දොරටුව ද එතැනට අපට දැක ගතහැකිවිය.

"මං හිතන්නේ නෑ අපට ඒ තරම් වෙලා ඉන්න වේවි කියල" හෝම්ස් කීවේය. "අවදානම් හැමදෙයක්ම මේ වත්තෙන් ඉවත්වෙලා ගිහින් කියල ඔහු හිතනතුරු පමණයි, කපිතන් ප්‍රමාද වෙන්නේ."

"ඒ වුණත් මොකක්ද ඔහු කරන්න සූදානම් වෙන්නේ?" මම ඇසීමි.

"අයි දෙවියනේ අර මනතරීයා!" හෝම්ස් පිළිතුරු දුන්නේය. "නිවසේ ඒ කොටස පාවිච්චි නොකරන බව ඇත්තයි. ඒ වුණත් මළසිරුර හැමදාමත් එහේ තියෙන්න අවිශ්නෙ කොහොමද? ඒක සම්පූර්ණයෙන්ම විනාශකර දමන්න ඔහු යොදා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියල, මට ඉතාම නිවැරදිව කියන්න බැහැ. නමුත් මට යම් අදහසක් තියෙනවා, අද දකින්න ලැබුණු



www.sinhalaelibrary.com

සාක්ෂිවලින්. මං මෙහෙ ආව එකෙන් කපිතාන් ලොකු භයකට පත්වී සිටින බව නම් මං හොඳාකාරවම දන්නවා. කරන දෙයක් වහාම කළ යුතු බව දැන් ඔහුට තේරුම් ගිහිං ඇති. මං හිතන්නේ නෑ ඔහු...." හෝම්ස්ගේ ඒ වාක්‍යය අතරමඟ නැවතුණේ වලව්වේ ඉදිරිදොර විවෘතවෙද්දීය.

එහෙත් අපේ බලාපොරොත්තුව කඩවිණි. එළියට බැස්සේ කපිතාන් වෙබර් නොව ඔහුගේ දියණියයි. ඇය සිය සුරතල් බල්ලා සමඟ ඇවිදින්නට යන බව අපි වටහාගත්තෙමු. මිදුලේ වැලි අතුරා තිබූ කොටස පසුකර ඇය ගමන්ගත්තේ, බොරළු පාරේය. ඒ අප සැඟවී සිටි තැන ඉදිරියෙනි. අප ගැන ඉව වැටුණු බල්ලා, නොනැවතී අප දෙසට බුරන්නට පටන්ගත්තේය.

"සූසී! සූසී! නවත්වනවද ඔය බිරීම" යයි කෑගැසූ ඇය, අප සැඟවී සිටි රුක්ගොමුව දෙස හෙළුවේ කැළඹීමට පත් බැල්මකි. එහෙත් අප සැඟවී සිටියේ කෙනෙකුට පහසුවෙන් දැකගත හැකිවන අයුරින් නොවේ.

"ඇය එව්ද දන්නෙ නෑ මෙන්න හොයා බලන්න" මම කීවෙමි.

"හොඳ වෙලාවට අපේ වාසනාවක්" ලෙස්ට්‍රේඩ් කීය.

මඳවේලාවකට පසු ඇය බලුපැටියාද ඔසවාගෙන ආපසු නිවස තුළට ගියාය.

"දෙවියන්ට ස්තූතිවේවා! මං හිතුවා අපි අහුවෙයි කියල" හෝම්ස් කීවේ සැනසුම් ස්වරයෙනි.

අපට පැයකට වැඩි කාලයක් බලාසිටීමට සිදුවිය. ඇඳිරි වැටෙන්නට පටන්ගත්තේය. අප පැමිණි ගමන නිශ්ඵල එකක් යයි මම මේ වනවිට සිතමින් සිටියෙමි. යළිත් වරක් වලව්වේ ඉදිරිදොර විවෘත විය. මෙවර එළියට ආවේ පිරිමියෙකි. අප සොයා ආ කපිතාන් වරයා මොහු විය යුතුය.

ඔහු එතරම් උස පුද්ගලයෙකු නොවීය. සම්පූර්ණයෙන්ම වාගේ තට්ටය පෑදුණු හිස වටේම, කෙටියට කැපූ සුදු කෙස්ගස් කිහිපයක් තිබිණි. මුහුණ අව්වෙන් පිළිස්සීම් නිසා, කරපැහැ ගැන්වී තිබූ අතර සම රැළි වැටී තිබූ අයුරත් දිස්විය. ඔහු අප සිටි තැන ඉදිරියෙන් ගමන් කරද්දී ඔහුගේ මුහුණේ හැඩතල හොඳින් නිරීක්ෂණය කිරීමට අපට අවකාශ ලැබිණි. ඔහු මුහුණේ, දැඩි විඩාවකට හා කැලඹීමට පත් ලකුණුය. ඔහු ගේට්ටුවේ ඉබියතුරු දමා වසා තිබූ, නිවසේ





නැගෙනහිර කොටස පෙනෙයි. එහි යෝධ දොර අසලට ගිය ඔහු, සාක්කුවෙන් ලොකු යතුරක් එළියට ගත්තේය. ඉබියතුරු විවෘතකොට දොර හැරගෙන ඇතුළුවෙද්දී, දොරෙන් තරමක ශබ්දයක් නැගිණි.

"හඬක් නොනැගෙන්න අපි ඔහු පසුපස යමු" සැඟවී සිටි තැනින් එළියට එමින් හෝම්ස් කීවේ තරමක උස් හඬින් නොවේ. එහෙත් කපිතාන්වරයාට මගේ මිතුරා කියූ දෙය ඇසුණා විය යුතුය. නැතිනම් තමාගේ පරෙස්සම ගැන සිතා කළ යුතුදේ ඔහු සැලසුම් කරගෙන සිටින්නට ඇත. ඔහු ඒ දොර දෙසට වේගයෙන් ළංවෙද්දීම වෙබර් දොර වේගයෙන් වසා දැම්මේය.

"මං වගේ මෝඩයෙක්" හෝම්ස් කියැවිණි. "දැන් ඉතින් මේ දොර අරින්න විදියක් නෑ. අපි අල්ලපු ජනේලයක් කඩාගන්න පුළුවන්ද කියලා."

මිදුලට දිවගිය හෝම්ස් වහා ආපසු ආවේ, විශාල ගලක්ද අතැතිවය. ජනේල වීදුරුවට ඔහු එල්ල කළ වේගවත් පහරෙන් වීදුරු කුඩුවී ගියේය. අපි ජනේල් තුළින් නිවසට ඇතුළුවීමට සූදානම් වූයෙමු. එහෙත් හෝම්ස් එය නැවැත්වීය.

"දැක්කද අරක?" ඔහු තම අත දිගු කළේ දෙවැනි තට්ටුව වෙතයි. දකින්නට ලැබුණු දසුනෙන් මගේ ඇඟ සීතල වී ගියේය.

දෙවැනි තට්ටුවේ වහළෙන් අළු පැහැති දුම්වලාවක් ඉහළට නැගෙන්නට පටන්ගෙන තිබිණි. ඒ, කෙළින්ම අපේ හිස්වලට ඉහළිනි. මිනිත්තුවක් ගතවීමට පෙර මෙම දුමාරය තවත් ඝනවිය මඳ වේලාවක් යද්දී වහළෙන් හා බිත්තියේ කවුළු අතරින් කළු පැහැති දුමක් පිටවීමට පටන් ගත්තේ, උඩුමහලේ ගිනිගොඩක් දල්වූ අයුරෙනි.

ජනේලයක් කඩාගෙන අපි වහාම ගේතුළට පිවිසියෙමු. ඝන තිර රෙදිවලින් ආවරණයකර තිබීම නිසා ඇතුළත අන්ධකාර විය. දෑස් අඳුරට හුරුවෙද්දී, අප සිටින්නේ කාමරයක් තුළ බැව් සිතාගත හැකිවිය. අපි එහි දොරටුවෙන් පිටවී සාලයක් වෙත පැමිණියෙමු. කපිතාන් අල්ලා ගැනීමට අප යා යුත්තේ උඩු මහලටය.

එහෙත් එතැනින් එහාට සිදුවූ දේ කුමක්ද? සිදුවූ සියල්ලක්ම පැටලිලි සහගතය. මග දිගට දොරවල් විවෘත කරමින්, හෝම්ස් හා ලෙස්ට්‍රේඩ් යන පිටුපස, තරප්පු පෙළක් දිගේ උඩුමහලට දිවගිය බව මට මතක ඇත. එහෙත් උඩුමහලට පිවිසෙන දොර විවෘත කළ

විගස හමා ආවේ සහ දුමාරයකි. අපට හුස්ම ගැනීමට පවා අපහසු විය. දුමාරය යටින් බඩගා ගිනි දැල්වෙන දෙසට යාමට අපි කිහිපවරක් උත්සාහ කළෙමු. එහෙත් එය නිශ්ඵල මෙන්ම අඥාන ක්‍රියාවක් බව වැටහී ගියේය. අප සිටි තැනට ද වේගයෙන් හමා ආ කළු ධූම වලාව නිසා, අපට හුස්ම ගැනීම ක්‍රමයෙන් අපහසු විය. දුමාරයෙන් දෙනෙත් වල සැඩුණු දැවිල්ලට අමතරව, පෙණහලු වලින් ද වේදනාවක් දැනිණ. අපි වහාම නිවසෙන් එළියට දුව ආවෙමු. මිනිත්තුවක් දෙකක් ගතවෙද්දී නිවසේ ඒ කොටස බුර බුරා ඇවිලෙන ගිනි මැළයක් බවට පත්විය. වෙබර් මෙනෙවිය හා සේවිකාව ගින්නෙන් බේරා ගැනීමේ අරමුණෙන් හෝම්ස් හා ලෙස්ට්‍රේඩ් ඔවුන් සොයා දිව ගියහ. ගින්න නිවාදැමීමට සහයක් ලබාගැනීමේ අරමුණෙන් මම ගම්මානය දෙසට දිවගියෙමි.

ඒ සඳහා මට කොපමණ වේලා ගතවූයේද යන්න මම නොදනිමි. එහෙත් ගිනිනිවන හටයන් සමග මා ආපසු පැමිණෙද්දී, නිවසේ නැගෙනහිර අංශයට සම්පූර්ණයෙන්ම ගිනි ඇවිළී එය ගිනිජාලාවක් බවට පත්ව තිබිණි. අපට පෙනි පෙනීම වහලේ දැවී ගිය කොටසක් කඩා වැටුණේය. හෝම්ස් අසලට යද්දී මට දකින්නට ලැබුණේ, ශෝකයෙන් වැළපෙමින් සිටි වෙබර් මෙනෙවිය හා මාච්මොන්ට් මහත්මියයි.

"වැඩක් නෑ වොට්සන්" හෝම්ස් කීවේ මා පසෙකට කැඳවමිනි. "මට නම් හිතෙන්නේ මේ මොඩ යක්ෂයා, අනුන්ට පිපිරවූ බෝම්බෙන් තමන්ගේ ජීවිතේ නැතිකරගත්තා කියලයි. මේ වගේ පරණ ගෙයක් ඇතුළෙ ගිනිදල්වන්න භූමිතෙල් යොදා ගැනීම මොන මෝඩකමක්ද? උඩ තට්ටුවට දමල තියෙන ලෑලිත්, ලීබඩුත් අවුරුදු සියගණනක් පරණ වෙලා වේළිලා. ගිලි දල්වන්න සකස් කළ දර වගෙයි. මම ලෙස්ට්‍රේඩ් එක්ක වලව්වේ ඇතුළෙන් නැගෙනහිර පැත්තට දොරක් කඩාගෙන යන්න උත්සාහ කළා. නමුත් ඒක සාර්ථක වුණේ නෑ. බොහෝතාම වෙලාවට කපිතාන් වෙබර් මළසිරුරට භූමිතෙල් දමලා පරණ රෙදි කඩමාලු ටිකක් හා දර කැබලි එක්ක ගිනිදල්වන්න ඇති. ඔහු හිතන්න ඇත්තේ ගෙට ගිනි අවුළුවන්නේ නැතිව පුංචි ගිනිගොඩකින් මළසිරුරක් පුළුස්සා දමන්න හැකිවේවි කියල."

එහෙත් කපිතාන් වෙබර් තවත් වරක් පණපිටින් දකගැනීමට දෛවය අපට ඉඩ ඇලා තිබුණේය. ගිනිදැල් වෙලාගත් උඩුමහලේ





ජනේලයක් අසල, යම්කිසි චලනයක් අපට දක්නට ලැබිණ. මොහොතකින් ගිනි ජාලා මැදින්, ඇඹරෙන, දඟලන, මිනිස් සිරුරක් අපි දුටුවෙමු. එක් ක්ෂණයකින් ඔහු බිමට පැන්නේය. අපි වහා එතැනට ගියෙමු. එහෙත් බිමට පැනීමේදී හිස පොළොවේ වැදීමෙන් කපිතාන් වෙබර් එතැනම මරණයට පත්ව සිටියේය.

"කවුද දන්නේ? ඒ දේ සිද්ධවෙන්න ඇත්තේ ඔහුගේ හොඳට" හෝම්ස් කීය. "ඔහුගේ පිළිස්සුම් තුවාල හැටියට, ඔහු ජීවත්වුණා නම්, මැරෙන්න වෙන්නේ භයානක වේදනා විඳල. දැන් ඉතින් මේක වේදනාවෙන් තොර ක්ෂණික මරණයක්."

තව මට කීමට ඇත්තේ කරුණු ස්වල්පයක් පමණි. ගිනිනිවන හමුදා හටයින් දැඩි උත්සාහයක් දැරුවද, ගින්න මැඩපැවැත්වීමට තවත් පැයක පමණ වෙලාවක් ගතවිය. මුළු නැගෙනහිර කොටසම දැවී විනාශවී ගියත්, නිවසේ ප්‍රධාන කොටස බේරාදීමට ඔවුහු සමත්වූහ. නැගෙනහිර කොටසේ තිබී අපට අඩක් දැවී ගිය මිනිස් හිස්කබලක් හා අස්ථි කිහිපයක් හමුවිය. ඒ ඇඩම් බෙල්ටර්ගේ හස්මාවශේෂය.

ශෝකයෙන් වැළපෙමින් සිටි අපේ අනුග්‍රාහිකාව ඇගේ නිතවත් අසල්වැසියෙකුගේ භාරයට පත්කිරීමෙන් පසු හෝම්ස් සමග මේ ගැන කතාබහ කිරීමට අපට අවස්ථාව ඇලසිණ.

"අපට කාරණා හුඟක් ඉගෙනගන්න පුළුවන් පරීක්ෂණයක් වොට්සන්. ගෙට ගිනිතියන්නෙ නැතිව මිනිය පුළුස්සා දමන්න කපිතාන්ට පුළුවන් වුණා කියලා හිතමු. එහෙම නම් ගෙදර අයට දකින්න ලැබේවි, ඔහුගේ උමතු ගතිය සනීප වෙලා යළිත් යථා තත්ත්වයට පත්වෙලා ඉන්න බව. නමුත් අවසන් වෙලාවෙ ඔහු කටයුතු කරලා තියෙන හැටියට අනුව නම් හිතෙන්නේ, ඔහු ඇත්තෙන්ම යම් ආකාරයක උමතු බවකින් පෙළුණා කියලයි. ඒකට හේතුව ඔහුගේ සිතේ ඇතිවුණු භීතිය වෙන්න පුළුවන්. ඔහුගේ අකල් මරණය ගැන වේදනාව තවමත් මට මගේ පැත්තටත් එල්ල වෙනවා. ඒ මොකද මං මේ සිද්ධිය භාර අවුස්සලා පරීක්ෂණය පටන්ගත්තෙ නැත්නම්, මළසිරුර මේ තරම් ඉක්මනට විනාශකරන්න වෙබර් උත්සාහ කරන්නේ නෑ. ඔහුගේ අපරාධය ඉක්මනින්ම එළිකරන්න මට හැකිවෙන බව, වෙබර් දැනගෙන හිටියා. ඒ නිසා මං මෙහෙන් පිටවෙලා යනතුරු ඔහු කාමරයට



www.sinhalaelibrary.com

වෙලා හැංගිලා හිටියා. එතැනට එනතුරු ඔහු කටයුතු කළේ බොහොම සූක්ෂම ලෙස ප්‍රයෝගකාරී පිළිවෙළකට. නමුත් එතැනදී ඔහුට වැරදුණා. කාමරය ඇතුළට වෙලා හැංගිලා ඉඳීමෙන් මාව මගහරින්න පුළුවන් කියලා ඔහු සිතු එක, ඔහුට වුණු ලොකු වැරැද්දීමක්. ඉතින් මගේ හිතවත් වොට්සන්. ඔබ බලාපොරොත්තුවෙනවා නම් කවදාහරි මේ කථාව ඔබේ පාඨකයනට ඉදිරිපත් කරන්න, ඇයි අහි නම විඩාපත් කපිතාන්වරයාගේ කථාව කියල යොදන්නෙ නැත්තෙ?"



# ඇඟිලි හයේ අත

1890 වසරේදී, මගේ මිත්‍රයා වූ ෂර්ලොක් හෝම්ස් මට හමුවූයේ ඉඳහිට පමණි. මගේ විවාහයට පෙර අප බේකර් වීථියේ නිවහනේ එකට නේවාසිකව සිටියදී ඔහුගේ සෑම පරීක්ෂණයකටම හවුල්වීමට මට අවස්ථාව ලැබිණි. එහෙත් මගේ විවාහය නිසාත්, ඉන්පසුව මා ඇරඹූ පෞද්ගලික වෛද්‍යශාලාව නිසාත් මට විවේකයක් නොවිය. මගේ මිතු හෝම්ස්ගේ කටයුතු විමසා බැලීමට නිතර නිතර බේකර් වීථියට යාමට මට අවකාශයක් නොවිණි. ඔහු යෙදුණු පරීක්ෂණ පිළිබඳ වාර්තා පුවත්පත් වල පළවෙද්දී, මම ඒවා කියවූයෙමි. ෂර්ලොක් හෝම්ස්ට එම දිනයේ වැඩ අධික වූ, ඉතා අවිවේකී කාල පරිච්ඡේදයක් වූ බව එයින් පැහැදිලි විය.

ඒ ජූනි මාසයේ අග ලන්ඩන් නගරයට හොඳින් හිරු එළිය වැටී තිබූ සවස් කාලයකි. එදා ප්‍රතිකාර සඳහා රෝගීන් කිහිපදෙනෙකුගේම නිවාස වලට ගොස්, ඒ වැඩ කටයුතු අවසන්කොට, මම ආපසු ගෙදර එමින් සිටියෙමි. එදිනට නියමිත තවත් වැඩක් නොවූ බැවින්, මගේ හිතවත් මිත්‍රයා දකීමට යාමට මම තීරණය කළෙමි. මා ගමන් කළ කුලීරිය, පෝට්මන් චතුරශ්‍රයේදී හරවා යවා, මම බේකර් වීථියේ අපේ නිවහන වෙත පා නැඟුවෙමි.

"හෝම්ස් මහත්තයා ඔයිලේ දවල් කෑම කාලා ඉක්මනින්" හඩ්සන් මහත්මිය කීවාය. "ඔහු හවස තේ බොන්න එනවා කිව්වා. දැන් එවී. ටිකක් වාඩිවෙන්න වොට්සන් මහත්තයා."

එදා අපරභාගයේදී හෝම්ස් දකීමට පැමිණ ඇත්තේ මා පමණක් නොවන බව මට වැටහිණි. ඔහු හමුවීමට ආ කිසිවෙකුගේ ආගන්තුක පත්‍රය මේසය මත තබා තිබිණි. මම එය අතට ගෙන පරීක්ෂා කර බැලුවෙමි.

| |
|---|
| මාක් ග්‍රිංගල් |
| අයිතිකරු, |
| ස්ටාර් ඔෆ් කැන්ඩි |
| තේ සමාගම |
| 37, කුවඩ් ලේයර්ස් |

www.sinhalaelibrary.com
Reading Purpose Only. Not For

කාඩ් පත අනෙක් පැත්තේ පැන්සලෙන් මෙසේ ලියා තිබිණ.

"ඔබ හමුවීම අත්‍යවශ්‍යයි. පසුව යළිත් එන්නෙමි.

එම්. පී."

හෝම්ස් වැඩි ප්‍රමාදයක් නොවී ආපසු පැමිණියේය.

"ඔබව දකින්නත් සන්තෝෂයි වොට්සන්. අද මේ විසිත්ත කාමරයට අඩුවුණේ මෙවුමෙරියෙකුගේ පැමිණීම විතරයි. ඒ මොකද දන්නවද? අද උඩ සමාජයේ හැම තරාතිරමකම වගේ අය මෙහෙන් ආවා. විශ්වාස කරන්න, උද්දම ආවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. ඊළඟට බෝට්ටු පදවන්නෙක්. ඊට පසු පතල්වලින් ගල් අඟුරු ගොඩ දමන කම්කරුවෙක්, දේවගැතිතුමෙක්....."

"..... ඇයි තවත් කෙනෙක් ඇවිත් තියෙනවා" මා කීවේ මේසය මත වූ ආගන්තුක පත ඔහු අතට දෙමිනි.

"හ්ම්, තේ වෙළෙන්දෙක්. මෙතැන මා එනතුරු බලාගෙන ඉද්දී සුරුට්ටුවක් බීල තියෙනවා. ඇයි තනියෙන්ම වක්කරගෙන බීම වීදුරුවකුත් බීල තියෙනවා..... ආහ්. බීල තියෙන්නේ සෝඩා. ඒ මොකද දන්නෙ නෑ. හ්ම්"

"සැකයක් නෑ. සුඛෝපභෝගී විධියට ජීවත්වෙන නාගරික ධනවතෙක් වෙන්න ඇති" මම කීවෙමි. "පෙරදිගින් එන දේවල් මෙහෙත් අලෙවි කරනවා. ඒ වුණාට ජීවිතේටම ඩිම්ස්ගේට් වලින් එහාට ගිහින් නැහැ. එයාගෙ ගෙවත්තේ ඉබේටම තේ පැලයක් වැවුණොත් පහුට ඒක අඳුනාගන්න වත් බැරිවේවි. මට නම් ඔහුගේ ස්වභාවය හිතේ මවාගන්න අමාරු නෑ හෝම්ස්. රතුපැහැති මුහුණක් තියෙන තරබාරු පුද්ගලයෙක්. එක අතකින් සෝඩා වීදුරුව අරගෙන, අනෙක් අතෙන් දල්වුණු සුරුට්ටුව අරගෙන ඉන්න ඇති. අඩුවෙන් මහන්සිවෙන, හොඳට කකා බිබී සැපට ඉන්න අය. තමන් බොහොම ලොක්කෙක් කියලා හිතාගත්තු, ඉවසිල්ලක් නැති කෙනෙක් බවට සැක නෑ. ඒකනේ ඔබ ආපහු එනතුරු ඔහුට ඉන්න බැරිවුණේ."

"ඒ වගේ අයත් ඉන්නවා වොට්සන්" හෝම්ස් පිළිතුරු දුන්නේ සිනාසෙමිනි. "ඒ වුණත් මට හොඳටම විශ්වාසයි, ප්‍රිංගල් මහත්මයා ඔබ කියන ජාතියේ කෙනෙක් නොවන බවට. මේ වීදුරුවේ ඉතිරි වෙලා තියෙන සෝඩා චුට්ටට ඔබේ ඇඟිල්ල දමලා, ස්වල්පයක් ඔබේ දිවේ ගාලා බලන්න. ඒකේ තියෙනවා නොවරදින තිත්ත





රසයක්. ඒ ක්විනින් ඖෂධයේ රස. ඔහුගේ ආගන්තුක පත්‍රයේ සඳහන් වෙනවා කැන්ඩි තේ සමාගමක් ගැන. කැන්ඩි කියන්නේ ලංකාවේ කඳුකරයේ නගරයක්. ඔහු මෙතැන රැඳී ඉන්න වෙලාවෙත් ක්විනින් බොනවා. වෛද්‍යවරයෙක් හැටියට මොකක්ද එක්වරම ඔබේ හිතට එන්නෙ?"

"මැලේරියාව!"

"හරියටම හරි වොට්සන්. [illegible] වලින් මෙපිට රැඳුණු කෙනෙකුට වැලඳෙන රෝගයක් තමයි මැලේරියාව. ඔබ ඊට එකඟවෙනවා ඇති. ඒ වගේම මැලේරියාව හැදුණු අවාසනාවන්තයෙකු තරබාරුවත් නැහැ. ඔහුගේ මුහුණ රතුපාටත් නැහැ. ඔබ ඒයටත් එකඟවේවි. ප්‍රිංගල් මහත්මයා කාලයක් ලංකාවේ ජීවත්වෙලා තිබුණා බවට සැකයක් නෑ. එහේදි තමා ඔහුට මේ භයානක රෝගය වැලඳෙන්න ඇත්තෙ. ඒ වුණත් ඔහු අද මෙහේ එන්න ඇත්තෙ ඔහුගේ අසනීපය නිසා නොවෙයි. මොකක් හරි බරපතල ගැටලුවක් ගැන කියන්න එය මට නිගමනය කරන්න පුළුවනි."

"ඔබ ඇයි එහෙම කියන්නේ?"

"ඔබ දුටුවද ප්‍රිංගල් මහත්මයා ඔහුගේ සුරුට්ටුව දල්වීමට යොදාගෙන ඉතුරු කර දාපු ගිනිකූරු?"

"ඔහුගේ සුරුට්ටු කොටයත් සමග අළු බඳුනේ එක ගිනිකූරක් මං දුටුවා."

"එකක් නොවෙයි වොට්සන්. ගිනිකූරු පහක් තියෙනවා. එක සුරුට්ටුවට ගිනිකූරු පහයි. ඒ ගැන හිතන්න. කෙනෙකු ඉරීම සඳහා දල්වාගත් සුරුට්ටුව නිවෙන්න ඉඩහරිනවා නම්, ඒකෙන් කියන්නේ මොකක්ද? හිතේ ප්‍රශ්නයක් නිසා ඔහු වෙනස් දෙයක් ගැන කල්පනා කරමින් සිටින කෙනෙක් බවයි තියාගන්න. සුරුට්ටුව එකපාරක් නෙමෙයි, හතරපාරක් නිවිලා තියෙනවා. එහෙනම් කොහොමටවත් ඔහු හිතේ සැහැල්ලුවෙන් සුරුට්ටුවක් බීපු කෙනෙක් වෙන්න බැහැ. අනිත් මේ විසිත්ත කාමරයේ සුරුට්ටු අළු වැටී ඇති හැටි ඔබ නිරීක්ෂණය කරන්න ඇති. ප්‍රිංගල් මහත්මයා සුරුට්ටුව කටේ ගහගෙන, මේ කාමරයේ ඉහළ පහළ ඇවිදලා තියෙනවා. ඒකෙන් පෙන්වනවා ඔහුගේ හිතේ ඇති නොසන්සුන් බව."

"බාගවෙලාවට ඔහු මහාසැලකිලිමත් කෙනෙක් වෙන්න ඇති?"



www.sinhalaelibrary.com

"මම එහෙම හිතන්නේ නෑ. ඒ මොකද ගිනි දැල්වූ අසල කලාලය උඩට ඔහු අතින් වැටුණු හුරුට්ටු අළු ඇඟිලි තුඩෙන් අරගෙන ඉවත්කරන්න, ඔහු උත්සාහයක් දරල තියෙනවා. ඔබ කිව් නොඉවසිලිමත් ගතිය ගැන නම් අපට මොකුත් කියන්න බැහැ. නමුත් මෙහෙම දෙයක් වෙන්න පුළුවනි. බොහොම වෙලාවට ඔහු එළියට යන්න ඇත්තේ, පිරිසිදු වාතය ටිකක් ආශ්වාස කරලා එන්න වෙන්නත් පුළුවනි. ඒ මොකද ක්විනින් ඖෂධයේ ඇති අධික තිත්ත ගතිය නිසා, කෙනෙකුට ඔක්කාරය ඇතිවීමේ පුදුමයක් නෑ. එය මගහැර ගැනීමේ අරමුණෙන්, පිරිසිදු වාතය ටිකක් ආශ්වාස කරලා එන්න ගියා වෙන්නත් පුළුවනි.

වොට්සන්. එහෙනම් ඔබ පිළිගන්න ඕන" මගේ මිත්‍රයා කීවේ ජනේලය අසල වාඩිවී අහළ වීදිය දෙස නෙත් යොමුකරමිනි. "බොහොම දුරට මේ පුද්ගලයා, රෝස පැහැති කම්මුල් තිබෙන පුෂ්ටිමත්, ලන්ඩන් නගරවැසියෙකුට වඩා, මැලේරියාවෙන් කළු පැහැ ගැසී වලගැහුණු කම්මුල් ඇති, තේ වගාකරන්නෙක්."

"සැකයක් නෑ, ඔබ නිවැරදි ඇති" මම කීවෙමි. "මං නිකරුණේ කට ඇරලා කළ දෙඩවීම ගැන දැන් මම පසුතැවිලි වෙනවා. ඒ මොකද ඔබ නිරීක්ෂණ මගින් කරුණු උපකල්පනය කළා." මා කීවේ සිනාසෙමිනි. "හොඳයි. ඔබ ප්‍රිංගල් මහත්මයා ගැන මේ තරම් දුරට කිව්වා. ඔබට පුළුවන් ඒ චිත්‍රය වඩාත් සම්පූර්ණ කරන්න. හපනෙක් නම් කියන්න, ඔහුගේ වයස කීයද? ඔහු අද හැඳපැළඳගෙන ඉන්නේ මොනවාද?"

"මං හිතන්නේ ඔහුගේ වයස අවුරුදු හතළිහක් පමණ විය යුතුයි. අද සිටින්නේ ට්වීඩ් රෙද්දෙන් මැසූ ඇඳුම් කට්ටලයක්."

"දෙයියෝ සාක්කි!" මට කෑගැසුණේ පුදුමයෙනි. "ඔබ කොහොමද ඒ තරමට කාරණා කියන්නේ?"

"බොහොම සරලයි වොට්සන්. මට පෙනෙනවා මේ මොහොතේ ඔහු අපේ නිවස ඉදිරිපිට පාරේ හිටගෙන ඉන්නවා" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේය.

මිනිත්තුවකට පසු අපේ විසිත්ත කාමරය වෙත කැඳවාගෙන එනු ලැබූ පුද්ගලයා, හෝම්ස් කළ විස්තරයට සෑම අයුරකින්ම සමානවිය. උස හැඩිදැඩි සිරුරක් තිබූ ඔහු, කඩවසම් තැනැත්තෙක් විය. කෙසේ වෙතත් මේ මොහොතේ, ඔහුගේ සිරුරේ දුර්වල රෝගී





පෙනුමක් තිබූ බව, මුණගැසුණු වහාම නිරීක්ෂණය කළෙමි. මුහුණ අසාමාන්‍ය ලෙස ඇලිවැටී, කට වටා රැලි වැටී තිබූ අතර, සමේ තිබුණේ නියම වයසට වඩා වයස්ගත පෙනුමකි. දෙකම්මුල් ඇතුළට ගිලී, දැන් සුදුමැලිව තිබූ අතර හිසකෙස් සැලෙන තරම් පැසී තිබිණි. මෙය වයසට නොව, නිදන්ගත රෝගයකින් දීර්ඝ කාලයක් පෙළුණු නිසා ඇතිවූවක් බව, මගේ වෛද්‍ය දැනුමෙන් වටහා ගත්තෙමි. එහෙත් මා සමග අතට අත දෙද්දී ඔහුගේ අතේ තිබූ ශක්තියත්, නිල්වන් දෑසේ දීප්තියත් කියා පෑවේ, රෝගයකින් පෙළුණත් ප්‍රිංගල් මහතාගේ ආත්ම ශක්තිය බිඳවැටී නොමැති බවය.

"ඔබේ දුර්වල ගතිය මගහැරී ගියාද මහත්මයා?" හෝම්ස් ඇසුවේ කරුණාවන්ත හඬකිනි. "එහෙමත් නැත්නම් ඔබට අවශ්‍ය වෙන යමක් තිබෙනවා නම්, අපට එය ලබාදෙන්න පුළුවනි. මං දුටුවා ඔබ මෙතැන ඉන්න අතරේ ක්විනින් ඖෂධය පානය කර ඇති බව. එය උදරයේ ඇතිකරන අප්‍රසන්න තත්වය මොන තරම් බියකරුද කියලා මං හොඳින් දන්නවා."

ප්‍රිංගල් හිස සෙලවූයේ තමාට එතරම් අපහසුවක් නොමැති බව හඟවමිනි. "බෙහෙත් නිසා මට ඇතිවෙලා තිබෙන ලොකුම ප්‍රශ්නය ඔක්කාරය නෙමෙයි. බොහොම ලොකු බලපෑමක් ඇතිවී තිබෙන්නේ මගේ කන්වලට. "හෝ හෝ" ගාන ශබ්දයක් නිරතුරුවම මගේ කන්වල ශබ්ද වෙනවා. මං ටිකක් එළියෙ ඇවිදලා ආවා. සාප්පුවල වීදුරු කවුළු වල ප්‍රදර්ශනය කර තිබූ දේ නරඹමින් මං ඇවිද්දා. මගේ මනස වේදනාත්මක සිතිවිලි වලින් ඉවත්කරගන්න, ඒ මගින් මට හැකිවුණා.

ඔබ දෙදෙනාගෙන් එක්කෙනෙකුට හරි, කවදා හෝ හිතුණද ඔබ අවාසනාවන්තයි කියලා? මැලේරියා රෝගය වැලඳුණා නම් මිස, කෙනෙකුට එහෙම හිතන්න සිදුවෙන්නක් නැහැ. මැලේරියාව තරම් මනුෂ්‍යයාට එරෙහි බිහිසුණු සතුරෙක් තවමත් මේ ලෝකෙට බිහිවෙලා නෑ මහත්වරුනි. වෛද්‍ය විද්‍යාවෙන් එයට දරුණු ප්‍රහාර එල්ල වෙනවා. ඒත් කොච්චර ප්‍රහාරයන් ලැබුවත්, මේ මාරයා මනුෂ්‍යයාට එරෙහි සටන තවමත් අත්හැරලා නැහැ. ඒ ටික ඔබට කියන්න මට පුළුවනි. කොහොම වුණත් මහත්වරුනි. මං මෙහේ ආවේ ව්‍යාධිවිද්‍යාව ගැන ඔබ සමග සාකච්ඡා කරන්න නෙමෙයි. ශරීරයේ ඇතිවෙන රෝග වලට වඩා, මනුස්සයෙකුට බලවත්

පීඩාවක් ඇතිකළ හැකි-කෙනෙක් දේවල් තියෙන බව, දැන් මම තේරුම් අරගෙනයි ඉන්නෙ. හෝම්ස් මහත්මයා, මට ඔබේ උපදෙස් අත්‍යවශ්‍යයි."

"මං බොහොම සන්තෝෂයෙන් ඔබට උපදෙස් ලබාදෙන්නම්" හෝම්ස් කීය. "ඔබේ ගැටලුව හා ඒකට අදාල කාරණා මොනවද කියල මට කියනවා නම්."

"හොඳයි. දැනට අපි ඒවට කියමු අදාල කාරණා කියල. ඒ මොකද මම හරියටම දන්නෙ නෑ ඒවා අදාල ද නැද්ද, ඒවායින් ඔබට ප්‍රයෝජනයක් ලැබේවිද කියලා. දැන් නම් මට කියන්න තියෙන්නේ ඒහෙන් මෙහෙන් මගේ දෙසවණට වැටුණු, කතාබහ සහ සුළු සිදුවීම් කිහිපයක් ගැන විතරයි."

"ඒ කරුණු කොයි තරම් දුරට ප්‍රයෝජනවත්ද කියන එක මං තීරණය කරන්නම්. ප්‍රිංගල් මහත්මයා, ඔබේ කථාව මුල ඉඳලම කියන්න."

"මහත්මයා, මං මගේ ජීවිතයෙන් වැඩිකොටසක් ගතකළේ ලංකාවෙ" අපේ 'අනුග්‍රාහකයා' පැවසුවේ දීර්ඝ කථාවකට මුලපුරමින්. "මගේ තාත්තා ඉතා සාර්ථක ලෙස ලංකාවේ කෝපි වගා කළ කෙනෙක්. ඒ මගින් ඔහු විශාල ධනයක් ඉපැයුවා. මේ අතරේදී තමයි කෝපි වගාවට මහා හෙණයක් පතිත්වුණේ. බ්ලිස්ටර් බ්ලයිට් නම් පුස්රෝගය වැළැඳිලා, මුළු ලංකාවේම කෝපි වගාව විනාශවුණා. ඒ එක්කම රටේ සමෘද්ධියත් බවත් විනාශවුණා. කෝපි වගා විනාශය නිසා ඇතිවුණු කම්පනය, මගේ තාත්තාගේත් අම්මාගේත් සිත්වලට තදින් බලපෑවා. ඒ රටේ කෝපි වගා කළ හැම තැනකම ඊළඟට වගා කළේ තේ බව ඔබට අහන්න ලැබිල ඇති. ඒක බොහොම ඉක්මනින් සාර්ථක වුණා. නමුත් කණගාටුවට වගේ තේ වගාවේ සාර්ථකත්වය දකින්න තරම් කාලයක්, මගේ දෙමව්පියන් ජීවත්වුණේ නැහැ. ඔවුන් අකාලයේ මියගියා. තේ වගාවට හොඳ සාර්ථක යුගයක් උදාවේවි කියල මගේ ලොකු විශ්වාසයක් තිබුණා. ඉතින් මමු ඩීවෝසන් නම් වැවිලිකරුවෙක් සමග හවුලේ තේ වැව්වා. ඊළඟට මගේම ව්‍යාපාරය ඇරඹුවා. බොබ් ජාවිස් හා ඩොනල්ඩ් හඩ්සන් නම් දෙදෙනාත් හවුල්කරගෙන අපි වත්තක් මිලට ගෙන, අලුතෙන්ම තේ වැව්වා. රෑ දවල් නොබලා දවසපුරා අප වුණු මහන්සිය නිසා, මගේ තේ වත්ත ලංකාවේ හොඳම තේ වත්ත බවට පත්වුණා.





මේ ආකාරයෙන් සාර්ථක වෙලා, නොහිතූ තරම් විශාල ධනයක් මා වෙතට ගලා එද්දී තමයි, අවාසනාව මා හොයාගෙන ආවෙ. ඒ තමයි මැලේරියා රෝගය. මගේ හිතමිතුයා ජාවිස්ටත් මැලේරියාව වැලඳුණා. ඒ අසරණයා මැලේරියාවෙන් මියගියේ අසනීප වෙලා සතියකටත් අඩු කාලයකදී. ඒ අතින් මං වාසනාවන්තයි. නමුත් සති ගණනක් මං මරණාසන්න වෙලා හිටියා, මෙලොව ජීවත්වෙන්න ඉඩක් ලැබේවිද නොදැන. අන්තිමේදී මගේ වෛද්‍යවරයා මට උපදෙස් දුන්නා, සම්පූර්ණ සුවයක් ලබනතුරු ලංකාව අත්හැර එංගලන්තයට ගිහින් ඉන්න කියලා. ඒ අනුව මං මගේ වත්ත හඩ්සන්ට භාරදීලා එංගලන්තයට ආවා."

ඒ අවුරුදු තුනකට කලින්. ඊට පස්සෙ බොහොමයක් කාරණා අතින්, මගේ ජීවිතේ ගෙවුණේ සතුටුදායක අයුරින් කියලා මට කියන්න පුළුවනි. මැලේරියා උණ ඇගේ නැවත මතුවීම ක්‍රම ක්‍රමයෙන් අඩුවෙලා ගියා. මාස කිහිපයකට කලින් මට දැනුණේ, ඒක සම්පූර්ණයෙන්ම මගේ සිරුරෙන් ඉවත්වෙලා, ස්ථිර සුවයක් ලැබුණා වගෙයි. ඉතින් මම ලන්ඩනයේ ව්‍යාපාරයක් පටන්ගත්තා. මේක බොහොම කාලයක ඉඳන් මගේ හිතේ තිබුණු දෙයක්. ලංකාවෙන් එවන තේ, එංගලන්තයේ අලෙවිකරන, අපේම සමාගමක් මං පටන්ගත්තා. මේ අතරේ මං විවාහවුණා.

ඇගේ නම ලෙටීෂියා වොඩ්හැම්. ඇය තමා මේ ලෝකයේම ඉන්න ඉතාම ප්‍රියමනාප කාන්තාව. මගේ ව්‍යාපාරික කටයුතු සඳහා මම ග්ලොස්ටර් නගරයට ගිය විටකදියි මං ඈ හමුවුණේ. එතකොට ඇය ක්‍රිස්ස්ටන් ආර්යාවගේ ලේකම්වරියක ලෙස කටයුතු කරමින් සිටියා. අප දෙදෙනා අතර හුගක් සමාන අදහස් හා පවුල් පසුබිමක් ඇතිබව මට තේරුණේ, ඇය සමග කතාබහ කරද්දියි. ඇගේ පියාත් කාලයක් ලංකාවේ සේවය කර තිබුණා, ඒ දිස්ත්‍රික් තඩුකාරවරයෙකු හැටියට. ඒ නිසා ලෙටීෂියා ඇගේ ළමාකාලය ගතකරලා තිබුණේ ලංකාවේ.

ඉතින් අපේ විවාහය සිදුකෙරුණේ ග්ලොස්ටර්හිදී. එය ලොකු උත්සවයක් නොතිබුණු, චාම්, නිහඬ විවාහයක්. ඒකට එක් හේතුවක් වුණේ, ඇයත් මාත් දෙදෙනාම ළඟ ඥාතීන් නොමැති අය වීම. ඇයටත් සහෝදර සහෝදරියන් කිසිවෙක් නැහැ. ඇගේ දෙමව්පියන් මියගිහින්. ලයිම් රෙජිස්හි අපි කෙටි නිවාඩුවක්



www.sinhalaelibrary.com

ගතකළා. ඊළඟට මම අපේ පදිංචිය සඳහා නවීන පහසුකම් ඇතිව තැනූ සුඛෝපභෝගී නිවසක් මිලට ගත්තා. ඒක පිහිටා තියෙන්නේ, ස්ටේන්ස් හා ලේලිහැම් අතර, තේම්ස් ගඟ ඉවුරේ තිබෙන බිමක. "ලෝ මෙඩෝ" නම් වූ මේ නිවස පිහිටි ඉඩම, වර්ග යාර හැටක් පමණ වූ විශාල ලේවත්තක් ඇති එකක්. අපේ වත්ත තේම්ස් ගඟෙන් වෙන්වන්නේ, උස්ව වැඩුණු ගස් පේළියකින්. කුරුල්ලන් ගී ගයන, අලංකාර මල් වැවෙන මේ සුන්දර පරිසරයේ, මගේ ජීවිතේ නැවත වරක් ගෙවුණේ හරිම සතුටෙන්. මගේ සිතේ තිබුණු ඒ සන්තෝෂයට බාධා පමුණුවන්න, මීට පස්සෙ නම් කිසිම දේකට බැරිවේවි කියලයි මට හිතුණේ."

කථාව මදකට නැවැත්වූ අපේ අමුත්තා සාක්කුවෙන් ලේන්සුව ගෙන, ඔහුගේ නළලේ දැකතුව් තිබූ ඩහදිය පිස දමාගත්තේය. මීළඟට ඔහු කථාව පටන්ගත්තේ පෙරට වඩා මෘදු ස්වරයෙනි.

"යළිත් වරක් අවාසනාව මාව හොයාගෙන ආවා. මං හිතාගෙන හිටියේ මිනිහෙකුට එල්ලවෙන්න පුළුවන් දරුණුම ප්‍රහාරය මැලේරියාව කියලයි. නමුත් දෙවියනේ! දැන් මට එල්ල වී තියෙන්නේ ඊට වඩා කොයිතරම් දරුණු ප්‍රහාරයක්ද? ..... ඔබට ස්තූතියි වොට්සන් මහත්මයා. මේ වෙලාවේ වතුර වීදුරුවක් බොන්න ලැබීම මං අගේ කරනවා.

මීට සති හතකට කලින් මං බලාපොරොත්තු නොවූ ලෙස, එක්වරම මට උණ ගැනුණා. අවුරුද්දකින් පමණ අසනීපය යළිත් මතුවී නොතිබුණු නිසා, මම හිතාගෙන හිටියේ ඒක මගේ ඇඟෙන් බැහැරවෙලා කියලයි. හරියට සතුරෙක් ඔහුගේ අවසන් සටන සඳහා, සියලුම බිහිසුණු අවිආයුධ එකතුකරලා, හොසිතන මොහොතක සටන පටන්ගන්නවා වගේ දෙයක් මටත් වුණේ. මං කිසිසේත් නොහිතූ මොහොතක ආ මැලේරියාව, මට දරුණු ප්‍රහාරයක් එල්ල කළා. කොළඹින් පිටවෙලා ආවට පස්සේ කිහිපවරක් උණ ගැනී තිබුණත්, මේ තරම් බරපතල තත්ත්වයකට මං පත්වුණේම නැහැ. මේ වාරයේ මා යළිත් වරක් මරණාසන්න වුණා.

මං අඩසිහියෙන් වගේ ඇඳේ වැතිරිලා හිටියේ, මේ ලෝකයේ සිදුවෙන දේවල් ගැන හරි කල්පනාවක් නොමැතිව. මල් පිබිදුණු වසන්ත සමයේ කුරුල්ලන්ගේ ගීත ගායනා සිරින් පරිදි පැවැත්වුණා. මේ සුන්දර නිසංසල පරිසරයේ තිබුණේ, මගේ නිදනකාමරයේ


http://sherlockholmesinvestigations.blogspot.com



ජනේලයෙන් එළියේ. කොහොම තරම් අවාසනාවක්ද? මේ කිසිදෙයක් මට තේරුණේවත් නැහැ. ඔන්න ඔය කාලෙ තමයි ඉතාම අසාමාන්‍ය සිදුවීමකට මං මුහුණදුන්නේ. මගේ කරදර පටන්ගත්තේ ඔන්න ඔය සිද්ධියෙන් කියලා මට කියන්න පුළුවනි.

එදා මෙය සිදුවෙද්දී වෙලාව මං හිතාගෙන, හවස දෙකට තුනට විතර වෙන්න ඇති. සැහෙන වෙලාවක් අධික උණ තිබිලා, ඊළඟට ඩහදිය ගලා ගිහින් උණ බැහැලා, මං සිරුරේ කෙඩෙත්තු ගතියෙන් හිටි වෙලාවක්. මං ඉන්නා ඇත්තේ අඩක් සිහිමූර්ජා ගතියෙන්, සිහින දකිමින්, නින්දටත් නොගිහින් අතර, ගෙවත්තෙන් හැමූ සිසිල් සුළඟින් මගේ කාමරයේ ජනේල රෙදි ලියාඹද්දී, මං යන්තමට අවදිවුණා. එතකොට මට ඇහුණා ජනේලයෙන් පහළ ගෙවත්තේ, කවුදෝ මෘදු හඬින් කතාබහ කරන හඬක්.

මේ කතාබහ එවෙලේ පටන්ගත්තාද, එහෙමත් නැත්නම් හුඟක් වෙලා ඉඳන් කෙරුණු එකක්ද කියන්න මට තේරුමක් නැහැ. ඒ මොකද මට කලින් නින්ද ගොස් තිබුණු නිසා. කොහොමහරි කථාවට සවන් දෙද්දී මට තේරුණා, මේ කථාකරන එක්කෙනෙක් මගේ බිරිඳ බව. ඇය කථාකළේ කා සමඟද කියල මං දැනහිටියේ නැහැ. ඇත්තෙන්ම ඒක දැනගන්න මට උවමනාවක් තිබුණෙත් නැහැ. බොහොම අඩු ශබ්දයකින්, කෙඳිරිලි හඬින් වගේ කෙරුණු ඒ කතාබහ, මිත්‍රයෙකුගේද නාඳුනන අමුත්තෙකුගේද මම දන්නෙ නෑ. ගැහැනියකගේද මිනිහෙකුගේද කියලත් මං දන්නෙ නෑ. ඒ මොකද ඒ වෙලාවෙ මගේ සම්පූර්ණ අවධානය යොමුවෙලා තිබුණෙ, මගේ සිරුරේ තිබුණු වේදනාව කෙරෙහි. අනික් අයගේ කතාබහකට හොරෙන් කන් දෙන්න, මට ශක්තියක්වත් උවමනාවක් වත් තිබුණේ නැහැ. ටිකවේලාවක් ගතවෙද්දී මට ඇහුණා කෝප්පයක් තුළ හැන්දකින් කලතන, ගැටෙන හඬක්- හරියට දෙහියුෂ පානයක් හදනවා වගේ හඬක්. ඊළඟට කතාබහක කොටස් අතරින් පතර මගේ දෙසවණට වැටුණා.

"ඔහුට කොහොමද දැන්?" එක කටහඬක් ඇහුවා.

"හොඳක් නෑ. තත්ත්වය හොඳ නෑ කියල දොස්තර මහත්තය කිව්වා." අනෙක් කටහඬෙන් පිළිතුරු ලැබුණා. "ඔහු ගැන බලාපොරොත්තු අත්හැරලයි ඉන්නෙ."

"තව කොච්චර කාලයක් අපට මේ කරදරේ ඉවසගෙන, විඳදරාගන්න වෙනවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"වැඩිම වුණොත් තව සති කීපයයි කියලයි මං හිතන්නේ. ඊට පස්සේ අපේ කරදර යන්තොම ඉවරයක් වේවි."

"ඒක හොඳයි. මේ කරදර ඉක්මනින් අවසන් වෙන දිනයක් ළඟාවෙන්න කියල, මං දෙවියන්ට යාච්ඤා කරන තරමක් ඔබ දන්නෙ නෑ. එහෙනම් අපි දෙන්නට ඊට පස්සෙ බොහොම සන්තෝෂදායක කාලයක් උදාවේවි."

ඊළඟට මට ආයෙමත් නින්ද ගියාද, නැත්නම් මේ සාකච්ඡාව එතැනින් නතරවුණාද කියල මට කියන්න අමාරුයි. මට තවත් යමක් අහන්න ලැබුණේ නෑ.

යළිත් වරක් උණ වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස, එදා රෑත් මට හරිහැටි එක දිගට නින්ද ගියේ නැහැ. ටික වෙලාවක් නින්ද ගොස් යළි යළිත් ඇහැරුණා. සමහර වෙලාවට නින්ද ගියත්, මං හිටියේ අඩනින්දේ.

එදා රාත්‍රී මගේ කාමරයේ ජනේලයෙන් පිටත, මොකක් හෝ තියුණු ශබ්දයක් ඇහිලා මං අවදිවුණා. කාමරය තිබුණේ සම්පූර්ණ අන්ධකාරයේ. මගේ අසනීපය නිසා බිරිඳ නිදාගත්තෙත් වෙනත් කාමරයක. ඉතින් මම තනියම, ශබ්දය ආයිත් ඇසේද කියල සවන්දීගෙන හිටියා. නමුත් ඒ වෙලාවේ කිසිම සුළඟක් හැමුවේ නැහැ. ඒ මොකද මගේ ජනේල වල තිරරෙදි නිශ්චලව තිබුණා. මම ඇඳෙන් බැහැලා ජනේලය ළඟට ඇදුණා. ඊට පස්සේ ශබ්දයක් නොනැගෙන සේ ජනෙල් තිරය මෑත්කළා.

මුලින් මට ගෙවත්තේ පෙනුණේ තනිකරම අන්ධකාරය පමණයි. ඊළඟට ටිකෙන් ටික මගේ ඇස් අඳුරට හුරුවුණා. මට ගස්වල ඡායාව හඳුනාගන්න හැකිවුණා. මං මොහොතක් බලාගෙන හිටියා. මං බලාගෙන ඉද්දිම, එක් සෙවණැල්ලක් වඩාත් විශාල එකකින් වෙන්වෙලා, තණබිම හරහා අන්ධකාරයට ගමන් කළා. එතැන තිබුණේ ගල්වලින් තැනූ පරණ ගබඩාකාමරයක් වැනි එකක්. උණෙන් පෙළීම නිසා මේ වෙනකොටත් මගේ ස්නායු දැඩි කම්පනයකට පත්වෙලයි තිබුණේ. ඉතින් මට දකින්න ලැබුණු ඒ සෙලවීම නිසා මගේ ඇඟ කිළිපොළා ගියා. මම තවත් මිනිත්තු දහයක් පමණ බලාගෙන හිටියා. නමුත් මට වෙන කිසිවක් දකින්න ලැබුණේ නැහැ."

"මොහොතක් ඉන්න," හෝම්ස් ඒ කථාවට බාධා කළේය. "ඒ සෙලවුණු සෙවණැල්ල කොයිතරම් ප්‍රමාණයේ එකක්ද?"





"ඒ වෙලාවේ මට පෙනුණේ එක මනුස්සයෙකුට වඩා කුඩා එකක් හැටියටයි. නමුත් සමහරවිට ඒ, මහපොළොවට පහත්වී වකුටුවී ගමන්කළ කෙනෙක් වෙන්න පුළුවන්. ඒ සිව්පා සතෙක් නම් නොවෙයි, ඔබ සැක කළේ එහෙම දෙයක් නම්....."

"එතකොට ඔබ විශ්වාස කරන්නේ ඒ මනුස්සයෙක් කියලද?"

"මට හිතෙන්නේ එහෙමයි" ඔහු පිළිතුරු දුන්නේය. "විශේෂයෙන් ඊට පසු සිදුවුණු සිදුවීම් වල හැටියට. නමුත් මේ මං හමුවෙන්න කැමැති කෙනෙක් නොවෙන බව, මා සඳහන් කළ යුතුයි. ඒ මොකද ඔහු [illegible] මිදුල හරහා ගමන්කළ, වංචාසහගත රහසිගත ආකාරය නිසා."

"හොඳයි ඔබේ ඔය [illegible] කථාව කරුණාකර දිගටම කියන්න."

"ඊළඟ දවසේ මගේ ඇඟට තරමක සනීපයක් දැනුණා. මේ විධියට නිදන කාමරයටම වෙලා ඇඳේ ගුලිවී සිටීම, මට එපාවෙලයි තිබුණේ. ඉතින් මං පහළ තට්ටුවට ගිහින්, මගේ බිරිඳ සමග උදේ කෑමගත්තා. කලින්දා රාත්‍රියේ මට අඳුරේ දකින්න ලැබුණු දේ මං ඇයට විස්තර කළා. නමුත් ඇය ඒක ගණන් ගත්තේ නැහැ. ඇය කිව්වේ එය උණ විකාරයෙන් මගේ මනස අවුල්වීම නිසා, මා දුටු දර්ශනයක් වෙන්න ඇති කියලයි. ඇගේ ඒ කීමට මං එකඟවුණේ නැහැ, බොහොම දුරට මේ රෝගයට මා ගත් ඖෂධ වල බලපෑමෙනුත්, රෝගය නිසාත්, මගේ ඇස් වල පෙනීමේ දුර්වල කමක් ඇතිවී තිබුණා. ඒ නිසා ඒ කරුණු ගැන මං ඇය සමග වාද කළේ නැහැ. කෙසේ වෙතත් මා දුටු දර්ශනය ඇතිවුණේ මේ අයුරින් වියහැකිය කියල උපකල්පනයක් මගේ සිතේ ගොඩනැගුණා. ඒ මොකක්ද කියලා ඔබට කියන්නම්.

අපේ වත්ත ගඟ අයිනෙන් [illegible] වෙන තැන, ගං ඉවුර දිගේ වැටුණු අඩිපාරක් තියෙනවා. සමහර වෙලාවට ගමේ පදිංචි මිනිස්සු මේ අඩිපාර පාවිච්චි කරනවා. බාගවෙලාවට රාත්‍රියේ මත්පැන් බීලා, වෙරිවෙලා අඩිපාරේ යන කෙනෙක්, පාර වැරදිලා අපේ වත්තට ආවා වෙන්නත් පුළුවනි. ඔහු මල්පඳුරු අතරින් ගමන්කිරීමේදී ඒ ශබ්දය නැගුණා වෙන්නත් පිළිවන්. ඒ උපකල්පනයෙන් මට සෑහීමට පත්වෙන්න පුළුවන් වුණා.

උදේ කෑමෙන් පස්සේ මං මගේ සැරයටිය අරගත්තේ ගංඉවුර පැත්තට ඇවිදින්න,යන් අදහසින්....."

"කලින් දවසේ පතා අහුන්න ලැබුණු සංවාදය ගැන ඔබ බිරිඳට සඳහන් කළේ නැද්ද?"

"නැහැ. ඒ වෙලාවෙ මොකුත් කිව්වෙ නැහැ. ඒ මොකද මගේ සිහිකල්පනාව පත්වෙලා තිබුණු තත්ත්වය නිසා, ඒ සංවාදය මට අමතකවෙලයි තිබුණෙ. එදා උදේ ගෙදරින් පිටවෙද්දි මගේ හිතේ තිබුණෙ එක අරමුණයි. ඒ තමා උදෑසන හිරු පායාගෙන එද්දි, ගස් අතරින් පෙරී එන හිරුකිරණ වැටී, ගඟ මතුපිට දියරැලි බැබලෙන හැටි බලාගෙන සිටීම.

අපේ ගෙදර සිට ගංඉවුර දක්වා වැටෙන පාර වැටී තියෙන්නේ ගෙවත්තේ දකුණු පැත්තෙන් අයිනෙන්. එහි මුල් යාර විස්ස හෝ තිහ මායිම් වැටෙන් වෙන්වෙන්නේ, ගරාවැටුණු පැරණි මඩු හා ගබඩාකාමර තිහිපයකින්. ඒ නිසා අපේ ගමන්මග වැටී තිබුණේ හරියටම, කලින් දවසේ රාත්‍රියේ හෙවණැල්ලක් තිබී අතුරුදන්වෙනවා මා දුටු තැනින්මයි. ඉතින් මට දකින්න ලැබුණු දෙයින් මගේ සිතේ ඇතිවුණු පුදුමය ඔබට හිතාගන්න පුළුවන්ද? සුදු හුනුආලේප කර තිබූ අර ගබඩා කාමරයක බිත්තියේ, මට දකින්න ලැබුණා, මිනිස් අතක සලකුණක්!"

"මොන ආකාරයේ සලකුණක්ද?" හෝම්ස් ඇසුවේ පුටුවේ තරමක් ඉදිරියට වී හිඳගනිමිනි. ඔහුගේ මුහුණේ ඇතිවූ කුතුහලයේ ලකුණු ද මට දකින්නට ලැබිණි.

"ඒක කවුරුහරි උවමනාවෙන්ම කළ වැඩක්. ඒ මොකද, එය ඉතා පැහැදිලිව බිත්තියේ මැදින්ම තිබුණා. මොළොවීම හෝ හුනු වැගිරීම කිසිවක් තිබුණේ නැහැ. එය කර තිබුණේ තද දම් පැහැති තීන්තෙන්. මුළු අතේම ලාංඡනය එහි තිබුණා. මං මුලින් හිතුවේ එය ඇඳපු චිත්‍රයක් කියලයි. නමුත් ළඟට ගියාම ඒ අත්ලක තීන්ත තවරා තැබූ මුද්‍රාවක් බව පැහැදිලි වුණා. ඒ මොකද අතේ රේඛා හා ඇඟිලි සන්ධිවූ තැන් පවා සලකුණු වී තිබුණා. මීට අමතරව ඒ මුද්‍රාවේ ඉතා අසාමාන්‍ය විශේෂ ලක්ෂණයක් දකින්න ලැබුණා. මහපට ඇඟිල්ල එය තිබිය යුතු තැන එලෙසම තිබුණා. නමුත් දිග ඇඟිලි පහක් තිබුණා. ඒ කියන්නේ ඒ මුද්‍රාවේ තිබූ අතේ ඇඟිලි හයයි!"

"මේ දකුණු අතද වම් අතද?" හෝම්ස් ඇසීය.

"දකුණු අත."





"ඒක තිබුණේ පොළොවේ සිට කොයිතරම් උසකින්ද?"

"හරියටම කියන්න අමාරුයි. නමුත් මට හිතෙන්නේ අඩි පහක් පමණ උසින්."

"බොහොම හොඳයි" හෝම්ස් කීවේ, ඔහුගේ පයිප්පයට යළිත් දුම්කොළ පුරවාගනිමිනි. "ප්‍රිංගල් මහත්මයා. ඔබේ ගැටලුවට හේතුවෙලා තියෙන්නේ බොහොම විශ්මිත, හොඳින් සැලසුම් කළ කටයුත්තක්. මේ ප්‍රශ්නය මා වෙනට ගෙන ඒම ගැන මං ඔබට ඉතාම කෘතඥ වෙනවා. ඒ වෙනුවෙන් ඔබේ ගැටලුව විසඳීම මං භාරගන්නම්. දැන් කරුණාකර ඔබේ කතාව කියන්න."

"එදා දහවල් කෑම ගනිමින් සිටියදී මං මේ ගැන මගේ බිරිඳට කිව්වා. "අන්න ගිහිං බලන්න" මං කිව්වා. "ඔයා කිව්ව නේ මං උණ විකාරෙන් දුටු හීනයක් කියලා. ඊයේ රෑ අන්ධකාරයේ හෙවණැල්ලක් පෙනුණු තැන, බිත්තියේ, දම්පාට තීන්තෙන් අතක ලකුණක් ඇඳලා."

"ඔව් වෙන්නැති" ඇය කිව්වා. "ඒ වුණත් කවුරු හරි ඒ වගේ මෝඩ වැඩක් කළේ ඇයි කියලා මට හිතාගන්නවත් බෑ."

"කොහොම හරි ඒ වැඩෙත්, බිත්තිය මුළුමනින්ම අවලක්ෂණ වෙලා." මා කිව්වා. "දැන් ඉතින් ඒකට ආයෙත් මට තීන්ත ගාවන්න වෙනවා. ඒක නෙමෙයි ලෙටී. ඊයේ හවස මං කාමරේ නිදාගෙන ඉන්න කොට, කවුදෝ ගෙවත්තේ කතාබහ කරන හඬක් මට ඇහුණා. ඒ ඔයා කවුරු හරි එක්ක කතාබහ කළාවත්ද?"

"ඔයා කියන්නේ මං කළ කතාබහක් ගැන වෙන්න බෑ." ඇය කිව්වේ මොහොතකට පස්සේ. "ලියුම් බෙදන මනුස්සයා එක්ක නම් මං කථාකළා..... ආ.. ඔයා නාම ඉන්න..... ඔව් ඔව්. අසරණ ගැහැනු කෙනෙක් ආවා. ඇය මොකක් හරි කටයුත්තකට මුදල් සම්මාදම් කරන කෙනෙක්. අව්වේ ඇවිත් ඇය හරි මහන්සියෙන් හිටි බවක් මට පෙනුණා. ඉතින් මං දෙහියුෂ වීදුරුවක් හදලා ඇයට බොන්න දීලා මිනිත්තු පහක් හෝ දහයක් ඇය එක්ක හෙවණේ වාඩිවෙලා කතාබස් කළා. ඒක වෙන්න ඇති ඔයාට ඇහෙන්න ඇත්තෙ."

"එහෙනම් ඒක වෙන්න ඇති" මං කිව්වා. මට ඒ වෙලාවෙ අහන්න ලැබුණු වචන මොනවාද කියලා මං මගේ බිරිඳට කිව්වෙ නැහැ. ඒ මොකද ඒ වචනයත් එක්කම, මේ වචන මගේ හිතේ උණ



www.sinhalaelibrary.com

විකාරයෙන් මැඩුණු සම්පූර්ණ බහුබූත කියලා මට වැටහිලා. පහුගිය කාලෙ රාත්‍රියට උණ ගැහෙනදදී, සිතේ භයක් ඇතිකරවන නොයෙක් විකාර සිහින, මට දිගින් දිගටම පෙනුණා. නමුත් පසුවදාට අවදිවුණාමයි මට තේරුණේ, ඒ විකාරවලට මං භයවුණු එක මොන තරම් මෝඩකමක්ද කියලා. ඒ නිසා පසුව ඒ විකාර දේවල් කාටවත් නොකියා නිශ්ශබ්දව ඉන්න මං පුරුදුවුණා.

දවස් කිහිපයකට පස්සේ මගේ ශරීර සෞඛ්‍යය හොඳ අතට හැරුණා. හොඳ පිරිසිදු වාතය ආශ්වාස කිරීමට ලැබීමෙනුත්, හොඳ කාලගුණයක් තිබුණු නිසාත් වෙන්න ඇති, මගේ ඇඟට යළිත් ශක්තියක් දැනුණා. සතියකට පමණ පස්සේ මගේ ව්‍යාපාරික කටයුත්තක් සඳහා ස්කොට්ලන්තයට ගමන් කරන්න මට සිදුවුණා. දින තුන හතරක සංචාරයෙන් පසු මං ගෙදර ආවේ, මැයි 27 වැනිදා නැත්නම් 28 වැනිදා. මගේ බිරිඳ මා සමග කථාකිරීමට බලාගෙන හිටියේ නොඉවසිල්ලෙන්.

"මාක්. මං හිතන්නේ ඔයා–මා එක්ක අමනාප වෙන එකක් නැහැ" ඇය කිව්වා. "ඔයා නැති අතරේ අපේ ගෙවත්තේ වැඩකරන්න, මං උද්‍යාන සේවකයෙකු බඳවාගත්තා."

"ආ... ඒක ප්‍රශ්නයක් නෑ" මං කිව්වා. "ඒක බොහොම හොඳ ආරංචියක්."

පහුගිය කාලෙම අපේ විශාල ගෙවත්තේ වැඩකර උන්නේ, නුවර ගමකින් වැඩට පැමිණි වයස්ගත කෙනෙක්. නමුත් අපේ තරම් විශාල ගෙවත්තක කරන්න තියෙන වැඩ සම්භාරය, ඔහුට කරලා ඉවර කරන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. ඒ මනුස්සයා ගෙවත්තේ වැඩ කරද්දී, ලස්සනට මල් පිපිලා, වර්ණවත්ව තිබුණු බව ඇත්තයි. නමුත් දවසක් දෙකක් මඟහැරුණොත්, හැම තැනම වල්ගස් මතුවෙලා ඔක්කොම අවලක්ෂණ වෙනවා. ඉතින් මගේ බිරිඳ මොන තරම් උත්සාහයෙන් වැඩ කළත්, ගෙවත්ත ලස්සනට තබා ගැනීම කරගන්න විදියක් නැතුවයි අපි හිටියේ.

"ඔහු මේ පළාතේ කෙනෙක්ද?" මං ඇහුවා.

"නැහැ" ඇය පිළිතුරු දුන්නා. "ඔහුගේ නම ඩොබ්සන්. හැම්ෂයර් වල කෙනෙක්. ගෙවතු වගා සඟරාවේ ඔහු දැන්වීමක් පළකරල තිබුණා, රැකියාවක් ඉල්ලලා. මං හිතුවා එහෙම කෙනෙකුගෙන් අපේ වැඩ හොඳට කෙරේවි කියලා. ඒක ඔහුටත් කරන යහපතක්.





ඩොබ්සන් ඉදිරිපත්කළ සහතික බොහොම විශිෂ්ට ඒවා. ඔහු අපට ඉතා හොඳ උද්‍යාන සේවකයෙක් වෙනවාට කිසිම සැකයක් නෑ. ඔහුගේ බිරිඳත් බොහොම දක්ෂ කාන්තාවක් වගෙයි. අපේ ගෙදර වැඩකටයුතු වලට ඇයගෙන්, අපේ මේරිට උදව් ලබාගන්න පුළුවන් වේවි. මට හිතුනා මාක්, අර ගඟ අද්දර වහලය ඇද තියෙන පරණ ගේ ඔවුනට පදිංචියට දෙන්න. මං [illegible] නගරයේ ගෙවල් අලුත්වැඩියා කරන සමාගමකට දැනුම් දුන්නා. ඔවුන් පොරොන්දු වුණා, ඉක්මනින් ඇවිත් ඒ පරණ ගෙයි වහලය හරිගස්සලා, අලුත්වැඩියා කරදෙන්න."

"ඔයාට කිසිම විරෝධයක් තිබිල නෑ" මං කිව්වේ සතුටෙන්. "ඔයාගෙ අදහසත් මගේ අදහසත් එකයි. ගඟ අයිනෙ තියෙන පරණ ගෙයි [illegible] වෙන එක කොයිතරම් හොඳද. ඒක නිකම්ම වහල දාල තියෙන එක අපරාධයක්."

මං ඇයට කලින් කිව්වා අපේ ඉඩමත් තේම්ස් ගඟේ ඉවුරත් වෙන්කරමින තියෙන විශාල ගස්පේළියක් ගැන. මේ කියන පරණ ගේ පිහිටලා තියෙන්නේ, ඒ ගස් පේළියටත් ගං ඉවුරටත් අතර. ඒක අවුරුදු ගණනාවකට ඉස්සර හැදූ බොහොම පැරණි ගෙයක්. අපි පදිංචි ගේ හදන්නත් කලින් ගොඩනැගූ එකක්. නමුත් අවුරුදු ගණනාවක් තිස්සේ නොසලකා හැරීම නිසා, ඒක අබලන්වී කැඩිබිඳී යමිනුයි තිබුණේ. කොහොම වුණත් මගේ බිරිඳ කැඳවූ සමාගමේ අය, දින කිහිපයක් ඇතුළත ඒක හොඳින් අලුත්වැඩියා කළා. වහලේ බිඳුණු ගල්ලෑලි ඉවත්කොට අලුත් ඒවා යොදලා, කැඩුණු වැහිපීලි හරිගස්සලා, ඉතා ලස්සනට අලුතෙන් තීන්ත ආලේප කරලා, හැමදෙයක්ම සැකසුවා. සතියක් ගතවෙද්දී ඔක්කොම වැඩ ඉවරකළා. ඊට පස්සෙ තමයි උද්‍යාන සේවකයයි ඔහුගේ බිරිඳයි එහි පදිංචියට ආවේ.

ඔවුන් දෙදෙනා ප්‍රසන්න පෙනුමක් තිබූ යුවළක් ලෙසයි මට පෙනුණේ. ඒ වුණත්, පෙනුමෙනුත් හැසිරීමෙනුත්, ඒ දෙදෙනා අතර මං දුටුවේ නොගැළපෙන බවක්. සැමියාගේ නම ජෝන් ඩොබ්සන්. සුදුමැලි මුහුණක් තිබූ ඔහුගේ, හිසකෙස් තද කළු පාටයි. ඔහු සතුව තිබුණේ බොහොම රළු ගති පැවතුම් ඇති කෙනෙකුගේ හැසිරීමක්. අපි මොනවා හරි ඇහුවත්, කිසි උත්තරයක් නොදෙන තරමට නිශ්ශබ්දයි. ඒකෙන් කෙනෙකුට හැඟෙන්නේ, ඔහු නපුරු

පුද්ගලයෙකු ලෙසයි. කොහොම වුණත් ජීවිතයේ බොහොම දුක් විත් ද කෙනෙකුගේ ස්වභාවය ඔහු ස්තුව තිබුණා. ඔහුගේ බිරිඳ ඊට සම්පූර්ණයෙන්ම වෙනස් චරිතයක්. ප්‍රමාණයෙන් කුඩා සිරුරක් ඇති ඇය, රෝස පැහැති කම්මුල් ඇති ලක්ෂණ කාන්තාවක්. රන්වන් පැහැති කෙස් ඇති ඇය තරම්, නොනවත්වාම දොඩවන කෙනෙක් මං ජීවිතේටම දැකලා නැහැ. කොහොම වුණත් අපි ඔවුන් රැකියාවට බඳවා ගත්තේ ඔවුන්ගේ පෙනුමටවත්, කතාබස් කිරීමේ හැකියාවටවත් නොවෙයි නේ. ඒ නිසා මං ඔවුන් දෙදෙනාගේ පිළිවෙළ ගැන ඒ තරම් සැලකිල්ලක් දැක්වූයේ නැහැ. ඔවුන් කළයුතු වැඩකටයුතු ගැන උපදෙස් දීම, මං මගේ බිරිඳට පැවරුවා.

මං සිරිතක් වශයෙන් උදේ පාන්දරම නැගිටිනවා. ඉතින් එක දවසක් එහෙම ඇහැරුණු වෙලාවේ මං දුටුවා, මගේ සුරුට්ටු අසුරන කොපුව මා ළඟ නොමැති බව. මේක මං දැම්මේ කොහේද කියලා, මං කල්පනා කළා. කලින්දා හැන්දෑවේ මම ගඟ අයිනෙ තියෙන බංකුවේ වාඩිවෙලා සුරුට්ටුවක් බිව්වා. ඊට පස්සෙ දුම්බිව්වෙ නැහැ. ඒ නිසා සුරුට්ටු අසුරනය මට අමතක වෙන්න ඇත්තේ එතැන විය යුතුයි කියලා මට හිතුණා. ඉතින් මං එවේලේම පිටත් වී ගියා, ඒ බංකුව වෙත යාමට.

මං ගමන් කළේ උද්‍යානය හරහා. උදේ පාන්දරම හැමූ නැවුම් සිසිල් සුළඟ නිසා ගෙලයෙන් තිබුණේ හරි දැනුම්කලු සනීපයක් බවක්. යෝධ හෝස්චෙස්නට් ගසක සෙවණේ තිබූ, සේවකයාට පදිංචියට දුන්, සුදු තීන්ත ආලේප කළ නිවස දුටු මගේ මුහුණට නැගුණේ සිනාවක්. "මොන තරම් අලංකාර ගෙයක්ද?" මම ශබ්ද නගා කිව්වේ උදෑසන සුළඟට. නමුත් මගේ කටෙන් ඒ වචන පිටවුණා විතරයි, මට දකින්නට ලැබුණු දර්ශනයෙන් මං එතැනම ගල් ගැහුණා. මුහුණේ තිබුණු සිනාව නැති ගිහින් මගේ කට ඇරුණා. ඉතා අලංකාර ලෙස සුදු තීන්ත ආලේප කළ බිත්තිය මැද තිබුණේ මොකක්ද? මිනිස් අතක පැහැදිලි දම්පාට තීන්ත මුද්‍රාවක්!

මේක කලින් දවසක අර ගබඩා කාමරයේ බිත්තියේ මා දුටු මුද්‍රාවට සෑම අතකින්ම සමානයි. තද දම් පැහැති තීන්තෙන් තැබූ දකුණු අත්ලක සලකුණ. මේ සැරෙත් සිත කලඹන විධියට ඇඟිලි හයක් සමග."

"කලින් දවසේ හැන්දෑවෙ ඔබ මෙය දුටුවේ නැද්ද?"





"නැහැ. එහෙම තිබුණා නම් අනිවාර්යයෙන්ම මා එය දකිනවා."

"ඔබට ඒ ගැන හොඳටම විශ්වාසයිද?"

"ඇත්තෙන්ම ඔව්."

"හොඳයි කථාව කියන්න."

"මට එක්වරම කේන්ති ගියා. මෙච්චර වියදම් කරලා ගේ අලුත්වැඩියා කළාට පස්සේ, කවුරු හරි ඒ මගේ වත්තට රිංගලා කරලා තියෙන්නේ නින්දිත වැඩක්. ඒ අසලම තිබුණා වතුර බාල්දියක්. තව තිබුණා කවුරු හරි ජනේලය පිස දැම්මට ගෙනා රෙදි කැබැල්ලක්. තරහෙන් සිටි මට ඕනෑ වුණේ, මේ විකාර තීන්ත පැල්ලම බිත්තියෙන් සෝදා දමන්නයි. මං රෙදි කැබැල්ල බාල්දියේ තිබූ වතුරෙන් පොඟවා ගත්තේ ඒ සඳහා. නමුත් රෙදි කැබැල්ල එළියට ආවේ දම්පැහැ වෙලා. මං බාල්දිය ඈල කරලා, වතුර ටික බිමට හැළුවා. මගේ ප්‍රාවහන් වලටත් විසිවුණු ඒ වතුරේ තිබුණේ, තනිකරම තද දම්පැහැය බව, මං බලාහිටියේ භීතියෙන්. මේ අද්භූත සිදුවීමේ තේරුම කුමක්ද? එය තේරුම් ගන්න මට හැකියාවක් තිබුණේ නැහැ. ඒ ගැන හොයා බලන්න මං එතැන රැඳුණෙත් නැහැ. බංකුව උඩ අමතකව ගිය සුරුට්ටු අසුරනය හොයාගෙන, මං ඉක්මනින් ආපහු එන්න පිටත්වුණේ අවුල්වුණු මනසකින්. මේක මගේ හිතේ ඇතිවුණු තවත් විකාර සිහිනයක්ද? ඒක සැකහැර දැනගැනීමේ අදහසින්, උද්‍යානයේ ටික දුරක් ඇවිත් මං හැරිලා, අර ගේ දිහා බැලුවා. එතකොට මං දුටුවා ඒ ගෙදර ජනේලයක තිරරෙද්ද සෙලවෙන හැටි. ඒක හරියට, කවුරු හරි ජනේලය ඇරගෙන මා යනහැටි බලාගෙන ඉඳලා, වහාම ජනේලය වසා දැම්මා වගේ."

"මේක සිදුවුණේ කවදාද?" හෝම්ස් ඇසීය.

ප්‍රිංගල් තම සාක්කුවෙන් කුඩා දින පොතක් එළියට ගත්තේය. ඉන්පසු මොහොතක් නිහඬව ඔහු එහි පිටු පෙරළා බැලුවේය.

"මට විශ්වාසයි ඒ දිනය ජූනි 3 වැනිදා - මීට සති තුනකට පෙර."

හෝම්ස් තමා ළඟ තිබූ කොළ කැබැල්ලක එය සටහන් කරගත්තේය. අනුග්‍රාහකයා කථාව දිගටම කරගෙන ගියේය.

"දවස් ගතවෙලා ගියා. බිත්තියේ තිබූ තීන්ත ලකුණ සෝදා දැම්මා. එයින් ඒ සිද්ධිය අමතක වී ගියා. ඒ වුණත් අලුත් සේවකයා උද්‍යානයේ වැඩට ගැනීම ගැන, මගේ හිතේ ඇතිවුණේ



www.sinhalaelibrary.com

ළතැව්ල්ලක්. ඔහුගේ නිහඬ රළු පිළිවෙතට හැඩ ගැහෙන්න නම් මට හැකිවුණා. ඇත්තෙන්ම ඔහු වරක් දෙවරක් පමණ කතාබස් කළා. ඒකෙන් මට තේරුණේ ඔහු ඉතා පුදුමාකාර චරිතයක් බව. ඔහු බුද්ධිමත් පුද්ගලයෙක්. නමුත් මට ඉවසන්න බැරිම කාරණය වුණේ ඔහුගෙන් වැඩ කෙරුණු පිළිවෙළ. අපි ඔහුට ගෙවූ වැටුප වෙනුවෙන් මේ මිනිහා අතින් උද්‍යානයේ කිසිම ප්‍රයෝජනවත් දෙයක් සිදුවුණේ නෑ. රැකියාව ඉවර වෙලා මම හැමදාම ගෙදර ආවේ, උයනේ මොනවා හරි අලුත් දෙයක් දකගැනීමේ ආශාවෙන්. නමුත් ඒ හැමදිනකම මගේ බලාපොරොත්තු කඩවුණා. අන්තිමට මේ ගැන මගේ බිරිඳට කිව්වා.

"මේ ඩොබ්සන් උද්‍යානවල කටයුතු කිසිදෙයක් දන්න බවක් මට නම් පෙනෙන්නෙ නෑ. ඒකෙ අරුමයට ලැබිල තියෙනවා කිව්, විශිෂ්ට සහතික?"

"අනේ මාත් ඒව මං අතින් නැතිවෙලානේ" ඇය කිව්වේ සමාව අයදින ස්වරයකින්."ඒ වුණාට මං හිතන්නේ නෑ, ඔයා ඒ මනුස්සයා ගැන කථාකරන හැටි සාධාරණයි කියලා. ඔයා වැඩ පටන්ගත්තෙ බොහොම මෑතකදි නේ. අනික අපුරුද්දට මේ කාලෙට හරියට වල්පැල වැවෙනවා. ඉතින් උද්‍යානයේ කොච්චරම් වැඩ ප්‍රමාණයක් තියෙනවාද කරන්න?"

මගේ බිරිඳගේ මුහුණ දුටුවාම මට හිතුණේ, මං කිව් වචන වලින් ඇගේ හිත රිදෙන්න ඇති කියලයි. මොකද සේවකයා ඒ රැකියාව සඳහා තෝරා ගැනීම ඇය අතින් වුණු වැරැද්දක්. ඒ ගැන මං කථාකරනවට ඇය කැමැතිවුණේ නැහැ. ඉතින් මං දෙදරා හකුලා ඒ මාතෘකාව ගැන කථාකිරීම නවත්වා දැම්මා. අපි දෙන්නාගෙ මේ කතාබහ ගැන සිහිකරන කොට, මට එක කාරණයක් හොඳින් හිතට වැදුණා. ඩොබ්සන්ගේ රැකියා සහතික ගැන ප්‍රශ්නෙට, ඇය උත්තරයක් කල්තබා සූදානම් කරගෙන ඉඳලා, වහාම එළියට දැම්මා වගෙයි මට දැනුණේ. හරියට මං ඒ ප්‍රශ්නය අහයි කියලා ඇය බලාපොරොත්තුවෙන් හිටියා වගේ.

මේ සිද්ධියෙන් දවසකට හෝ දෙකකට පස්සේ මං මුහුණදුන් සිදුවීමක් දැන් ඔබට කියන්නම්. එදා මං ගෙදර ඇවිත් කෙළින්ම ගියේ ගෙවත්තට. මට උවමනා වුණා දුම්රියේදී කියවමින් ආ පුවත්පත් වල, තෝරාගත් පිටු කියවා ඉවර කරන්න. මං





බලාපොරොත්තු වුණේ, ඈත එළිය වැටෙන තැනක සවිකර තිබූ උද්‍යාන බංකුවේ වාඩිවෙලා, ඒ වැඩේට මිනිත්තු පහක් ගතකරන්න.

මිනිත්තු කිහිපයකට පස්සේ මට ඇහුණා ඈතින් කතාබහ කරන අයගේ කටහඬක්. මා වාඩිවෙලා හිටි තැන, එක් පැත්තක් එල්ම් ගස් පේළියකිනුත්, අනෙක් පැත්ත රොඩොඩෙන්ඩ්‍රන් පඳුරු පේළියකිනුත් සැදුණු, ස්වාභාවික කොරිඩෝවක් වගේ තැනක්. මේ කෙළවරේ ඉඳගෙන බැලුවාම, මට අනිත් කෙළවර ඉතා හොඳින් පෙනුණා. ඈත කෙළවරේ දෙදෙනෙක් මේ කොරිඩෝවට ඇතුළුවුණු බව මං බලාගෙන ඉඳිද්දි දුටුවා. ඒ මගේ බිරිඳ සහ උද්‍යාන සේවකයා ඩොබ්සන් බව මං හඳුනාගත්තා. ඔවුන් ඉදිරියට ඇවිදගෙන ආවේ බොහොම ළඟින්. ඒ වගේම මොකක්ද ලොකු කතාබහකට වැටිලා. මං හැංගෙන්න ඔවුන්ට කථාකරන්නයි සූදානම් වුණේ. එතකොටයි මං දුටුවේ ඔවුන් ඉදිරියට ආව ඉරියව්ව. ඔහු තමන්ගේ වම් අත ඇයගේ කරට උඩින් දමාගෙන හිටියා. ඇය ඇගේ දකුණු අත, ඔහුගේ ඉණට පිටුපසින්, ඉණවටා දමාගෙන හිටියා. මං කියන්න හැදූ දේ මට කියාගන්න බැරුව උගුරේ හිරවුණා. හිස ඔසවා බලද්දි මගේ බිරිඳ දුටුවා, මං බලාගෙන හිටි හැටි. ඔවුන්ගේ දෑත් පහත වැටුණා. පුදුමයෙන් කට ඇරුණා. තත්පර කිහිපයක් යනතුරු අපි එකිනෙකාගේ මුහුණු දිහා බලාගෙන හිටියේ කිසිවක් කතාකරගන්න බැරිව.

"ඇයි මොකක්ද ප්‍රශ්නේ?" මට එහෙම කියැවුණා. එවේලේ මගේ බිරිඳගේ මුහුණේ හැටි, මට වචනයෙන් විස්තර කරන්න අමාරුයි. ඇය කළ ලොකු වරදක් අල්ලාදරව් වුණාම ඇතිවෙන ලැජ්ජාව, ඇගේ මුහුණේ පිළිබිඹු වුණා කිව්ව හැකි. කොහොම හරි ඒ දිහා තවදුරටත් බලන්නවත් මට හැකියාවක් තිබුණේ නැහැ. ඔවුන්ගෙ රහස තවදුරටත් හොයාගන්න ඕනෙ නැතිව එළිකරන්න කියලා, ඇයට බලකරන්න තරම් උවමනාවක් මට තිබුණේ නෑ.

"ඔහුගේ කකුල පෙර.....පෙරළිලා. ..... වළලු කර හන්දියෙන්" ඇය කියාගත්තේ අමාරුවෙන් ගොතගසමින්. "ආපහු ගෙදර යන්න මං ඔහුට උදව් කරනවා."

මම පුවත්පත අහකට දමා ඔවුන් සිටි තැනට ගියා. ඔහුගේ වළලුකරේ කිසිම ආබාධයක් ඇති බවක් මට නම් පෙනුණේ නැහැ. කොහොම වුණත් මම ඔහුව ගෙදරට කැඳවාගෙන ගිහින්, ඔහුගේ බිරිඳට භාරදුන්නා. .

www.sinhalaelibrary.com

ලෙටී ගෙදරට ආවට පසුව වත් මේ සිද්ධිය ගැන මාත් එක්ක කිසිම දෙයක් කිව්වේ නැහැ. මං හිතුවා මේ ගැන මං කිසිම දෙයක් ඇයගෙන් අහන්නෙ නැහැ; මොනවා හරි කිව්වොත් ඒ වෙලාවට කථාකරනවා කියලා. නමුත් ඇය දිගටම නිශ්ශබ්දව සිටියා. ඔයින් මෙයින් ඒ ගැන කතාබහක් ඇතිවුණේම නැහැ. නමුත් ඇය වරක් දෙකක් මා දිහා හොරෙන් බලන හැටි මං දුටුවා. ඒ මං කල්පනා කරන්නේ මොනවාද කියලා අනුමාන කරන්න වගේ. එම සිද්ධියෙන් පස්සේ, මට ඔවුන් දෙදෙනා එකට ඉන්නවා දකින්න ලැබුණේ නැහැ. නමුත් මම ගෙදර නැති වෙලාවට තත්ත්වය කොහොමද කියලා මට මොකුත් කියන්න බැහැ.

උද්‍යානසේවකයාගේ පිළිවෙළ ගැන මගේ හිතේ කලකිරීමක් ඇතිවුණු හැටි සඩට හිතාගන්න පුළුවනි. ඊළඟට ඔහුගේ බිරිඳගේ පිළිවෙළත් මගේ හිතට මහා හිසරදයක් වුණා. ඒ මොකද මගේ බිරිඳ ඩොබ්සන්ගේ බිරිඳ ගැන සඳහන් කරමින් නොයෙක් දේ කියවන්න පටන්ගත්තා. "ඔයා දන්නවද මාක්, ඩොබ්සන් මහත්මිය කිව්වා අපි මෙහෙම කළොත් හොඳයි කියලා" නැත්නම් "ඇයි මාක් හෙලන් නම් කියන්නේ අපි ඒ විධියට කරන එක හොඳ නැහැ කියල නේ" මේ විධියට හෙලන් ඩොබ්සන්ගේ බලපෑමක් අපේ පෞද්ගලික කටයුතු වෙතත් එල්ල වෙන බව මට වැටහුණා.

එක දවසක් හවස මම ගෙදර ආවේ වෙනදාට වඩා හුඟක් කලින්. මල් උයන දිහායින් මට ඇහුණා, ගැහැනුන්ගේ මහා හිනාහඬක්. මං හෙමින්ම ඒ පැත්තට ගමන් කළා. මල්වැල් යැවීමෙන් අලංකාර වුණු ආරුක්කුවක් තියෙනවා, මගේ උයනේ එක් කෙළවරක. ඒක රෝස මල් පඳුරු වලින් ආවරණය වෙලයි තියෙන්නේ. හිනාහඬ ආවේ එතැනින්. ඒ කටහඬවල් මගේ බිරිඳගේ හා ඩොබ්සන් මහත්මියගේ බව මට හඳුනාගන්න පුළුවන් වුණා.

"මං හිතන්නේ නෑ හෙලන්, ඔයාගෙ අදහසට මට එකඟවෙන්න පුළුවන් කියලා." මගේ බිරිඳ කිව්වා.

"මෝඩ කෙල්ලේ!" ඩොබ්සන් මහත්මිය කිව්වා. "ලෙටී මං කියන දේ අහන්න. ඔය හැමෝම හිතුවක්කාර වෙන්න එපා....."

ඇය දිගටම තව මොනවා හරි කිව්වා. නමුත් තවත් වරක් උස් හඬින් කළ සිනාව නිසා ඒ ටික මට ඇහුණේ නැහැ. මගේ බිරිඳ





බොහොම විනෝදයෙන් කාලය ගෙවන ආකාරය ගැන මට පුදුමත් හිතුණා. මං වහාම එතැනට ගියා.

"ඔහෝයි!" මං උස් හඬින් කිව්වේ ඔවුන්ගේ අවධානය මා වෙත ගන්න. "ඔයාලා බොහොම සන්තෝෂ වෙනවා වගෙයි."

මා දුටු වහාම ඔවුන්ගේ මුහුණු වල තිබූ සිනා සම්පූර්ණයෙන්ම අතුරුදහන් වන අයුරු මං දුටුවා.

"ඔව් මාක්. අපි මේ කථාකළේ වත්ත අලංකාර කරන්න තව මොනවාද අපට කරන්න පුළුවන් කියලා" මගේ බිරිඳ කීවේ මුහුණට සිනාවක් නඟාගැනීමට උත්සාහ දරමින්.

"හැබෑට? මොනවද ඔය තරම් හිනායන්න දෙයක් කිව්වෙ?" මං ඇහුවා.

ඒකට මගේ බිරිඳ යමක් කීවා. නමුත් ඒකෙ ඒ තරම් හාස්‍යය ගෙනදෙන යමක් තිබුණේ නැහැ. ඔවුන්ගේ ඒ කථාවට මා රැවටුණේ නැති බව පෙනී ගිහින්, ඔවුන්ගේ මුහුණු අඳුරු වුණු හැටි මා දුටුවා.

එදා හැන්දෑවේ අපි දෙන්නා විතරක් ඉන්න වෙලාවේ ඩොබ්සන්ලා ගැන මං මගේ බිරිඳට කථාකළා.

"ඔයා ඩොබ්සන් මහත්මිය එක්ක ඔය තරම් ඇඟෑළුම් කමක් පවත්වනවාට මං කැමති නෑ. ඒක එතරම් හොඳ වැඩක් නෙමෙයි." මං කිව්වා.

"අපි දෙන්නා නිකම් කතාබහ කළා විතරයි. මොකක්ද ඒකෙ තියෙන වැරැද්ද?" ඇය ඇහුවා.

"මට ඇහුණා ඒ ගෑනි ඔයාට ලෙටී කියල මුල නමින්ම අමතනවා. එහෙම නේද?"

"ඒ ගෑනි උද්‍යාන සේවකයාගේ බිරිඳ නිසා, ඔයා හිතන්නේ පහත් කෙනෙක් කියලද?" ඇය ඇහුවේ කෝපයෙන්.

"අපි උසස්, ඒ අය පහත් කියලා හැඟීමක් මගේ හිතේ නෑ" මං කිව්වා. "ඔයාට කැමැති කෙනෙක් එක්ක ඔයා හිතවත්කම් පවත්වන්න. ඒ වුණාට ඔයා ස්වාමිදුව, ඔවුන් සේවකයෝ. ඔයා ඔවුන් එක්ක ඕනෙවට වඩා මිතුරුවුණොත් ප්‍රශ්න මතුවෙනවා. ඔවුන්ගෙන් කෙරෙන්න ඕන වැඩ හොඳින ඉටුකෙරෙන්නේ නැහැ. දැනටමත් ඒක පෙනෙන්න තියෙනවා."

"මම හිතන්නේ නෑ එහෙම දෙයක් වේවි කියල" බිරිඳ කිව්වා. "මීට පස්සෙ අපි මේ ගැන කථා නොකර ඉමු" ඇය කිව්වේ තරහෙන්.



www.sinhalaelibrary.com

මගේ බිරිඳ මීට කලින් කවදාවත් මට ඔය විදියට කථාකරල තිබුණෙ නෑ. ඇය මේ ධොබිසන්ගේ බිරිඳ ආශ්‍රය කිරීම ගැන විරුද්ධවෙන්න තරම් හේතුවක් මට නොතිබුණු බව ඇත්තයි. නමුත් උවමනාවට වඩා ඔවුන් මගේ බිරිඳට ළංවෙලා, හිතවත් වෙලා සිටීම ගැන මගේ හිතේ එච්චර කැමැත්තක් ඇතිවුණේ නැහැ. මට හිතුණේ දැන් මගේ ගෙදරම ඔවුන්ට අයිති දෙයක් බවට පත්වෙන බවක්; මා පිට කෙනෙකුගේ තත්ත්වයට පත්වෙන අයුරුත්. ඒකෙන් මගේ හිතට ලොකු වේදනාවක් දැනුණා. ඇයගේ ශේන්තිය නිවුණාම ලෙටී බොහොම ගාන්ත ආත්තව මා එක්ක බොරු කතාබහක් පටන්ගන්න උත්සාහ කළා. නමුත් මං ඒක එච්චර ගණන් ගත්තේ නැහැ. මං කාමරයෙන් පිටවෙලා ගියා.

එදා රෑ මගේ මොළේදී වඩ දූන් සිතිවිලි හැම එකක්ම, මං ඔබට විස්තර කරන්න යන්නේ නැහැ මහත්මයා. ඔහුගේ බිරිඳට විරුද්ධව කිය හැකි දොසක් මට නොතිබුණත්, ධොබිසන්ට විරුද්ධව කීමට මට අප්‍රමාණ දේවල් තිබුණා. ඒ නිසා පහුවදා උදේ මං මගේ තීරණය බිරිඳට කිව්වා.

"නවදුරටත් අපේ ගෙදර ප්‍රශ්න ඇතිකර ගැනීමෙන් පලක් නෑ" මං කිව්වා. "ධොබිසන්ලා මෙහෙන් පිටවෙලා යා යුතුයි. ඔය විදියට පුදුමවෙලා මං දිහා බලන්න එපා ලෙටී. ධොබිසන් මෙමගේ රැකියාවට ඇවිත් දැන් කොයිතරම් කාලයක් වෙනවද? නමුත් මොනවද ඔහු ගෙවත්තට අලුතෙන් කරල තියෙන්නෙ? උද්‍යාන සේවකයෙකුට මේ විදියට බොරු කරන්න ඇරලා, වෙන කිසිම කෙනෙක් මේ තරම් කල් ඉවසන්නේ නෑ. මං මේ ඉවසාගෙන හිටිය හරිය හොඳටම ඇති. අනෙක් දේවල් තිබ්බාවෙ. එයා මල්වැවීම ගැන මොනවද දන්නෙ? ඒ යකා මහ මෝඩයෙක්. මගේ ස්වීට් විලියම් මල් පඳුරු ඔක්කොම, ඒවගේ උදුරා දමල තිබුණා, වල් පැළෑටි කියලා."

"ඔහු අසනීප වෙලානේ හිටියේ" ඇය කීවා. "ඔහුගේ වැඩවල අඩුපාඩුවක් තිබුණා නම් ඒ. තව ටික දවසක් යද්දි ඒවා හරියාවි මාක්. අපි තව ටිකක් ඉවසලා බලමු."

"ඔහුට බොහොම අසනීප බව නම් ඇත්තක්" මං කිව්වා. "ඔහු දකින දකින සැරේට අලුත් අසනීප වෙනවා. ඒ වුණත් මේ ගෙදර අසරණයින්ට පිහිට වෙන පුණ්‍යායතනයක් නෙමෙයි. මිනිහෙකුට





රස්සාවක් හොයාගන්න අමාරු මේ කාලේ, ඔහුව එළියට දමන්න මගේ කැමැත්තක් නැහැ. ඒ වුණාට ලෙටී ධොබිසන් ගැන නම් මට අනුකම්පා කරන්න බැහැ. ඔහු යා යුතුමයි."

මං හිතුවා මගේ ඒ තීරණය ඇය ඒ විදියට පිළිගනියි කියල. නමුත් ඇය නැවත නැවතත් මට ආයාචනා කළා. බැගෑපත්ව ආයාචනා කළා. බැරිම තැන මං මගේ නිවැරදි තීරණය, වැරදි විදියට වෙනස් කරන්න මට සිදුවුණා. ඒක සැකයක් නෑ. මං කළේ මහ මෝඩකමක්. ඒ වුණත් මා ඇගේ දෙපාමුලට වැටිලා ඇය කළ බැගෑපත් ආයාචනය ප්‍රතික්ෂේප කරන්න මට හැකියාවක් තිබුණෙ නෑ. දැන් තත්ත්වය එකයි. මගේ කථාන්තරය ඔබට අසා සිටින්න අමාරු හිරිහැරයක්ද, පෙම්ස් මහත්මයා?"

"නෑ. කොහොමවත් නෑ" මගේ මිත්‍රයා පිළිතුරු දුන්නේ ඔහුගේ පයිප්පයේ අළු උදුන මතට හළමින්. "ඒ වුණත් ප්‍රිංගල් මහත්මයා. මේ ප්‍රශ්නය ගැන මා ඔබට උදව් කළ යුත්තේ මොන ආකාරයෙන්ද කියලා මට තේරුම් ගන්න අමාරුයි. ප්‍රතිපත්තියක් වශයෙන්, මම පවුල් ඇතුළේ ඇති ආරවුල් විසඳන්න මැදිහත් වෙන්නෙ නෑ."

"ඔබ තීරණයකට එන්න කලින් අඩු ගණනේ, මගේ කථාවේ අවසන් කොටසටවත් කන්දෙන්න අවසරයි" අපේ අනුග්‍රාහකයා කීවේ කම්පාවට පත් අයුරෙනි. "දවස ගිය ඉරිදා. මේ ප්‍රශ්නය නිසා මගේ හිතේ තිබුණේ ලොකු බරක්. ඒ අයුරෙන්න යළිත් වරක් මගේ අසනීපය මතුවෙන්න හදන ආකාරයට දැණ ගතියකුත් මට දැනුණා. මට රෑ නින්ද ගියේ නැහැ. හරියට ගෙදිය දැම්මා. රාත්‍රී එකටත් නිදාගන්න අමාරුවුණා. ඉතින් මං නිශ්ශබ්දව ඇඳුම් ඇඳගෙන ගෙදරින් එළියට බැස්සා. මට හිතුණේ ගෙවත්තේ පිරිසිදු වාතය ටිකක් හුස්ම ගත්තාම, මගේ අමාරු ගතිය අඩුවේවි කියලයි. එදා රාත්‍රියේ හරි උණුසුම් ගතියක් තිබුණේ. අහස කළු වලාකුළු වලින් වැහිලා. ගං ඉවුර වෙත වැටී තිබුණු අඳුරු පාර දිගේ, මං ඉදිරියට පා නැඟුවා. මඳ දුරක් යද්දී මගේ මුහුණට වැහි බිඳුවක් වැටුණා. මට තව යාර තිහක් ඉදිරියම යන්න වුණේ නැහැ; මහ වැහි කඩා හැළෙන්න පටන්ගත්තා. වැස්සෙන් බේරෙන්න, ඉදිරියෙන් තිබූ විශාල පැරණි යූ ගසක් වෙත යාමේ අදහසින් මම ඉදිරියට දිව ගියා. අන්ධකාරයේ ඒක තිබෙන තැන වත් මට නොපෙනුණාට, මං පුරුද්දෙන් එතැනට ළඟාවුණා. ඒකෙ ආවරණය ලබමින්,



www.sinhalaelibrary.com

වර්ෂාවෙන් බේරී මං බලාගෙන හිටියේ, කල්පනා කළේ, ඊළඟට මොකද කරන්නේ කියලයි. එතකොට විදුලි කොටමින්, කන් බිහිරි කරන හඬින් ගෙඹි පුපුරන්න පටන්ගත්තා. මං හිටි හරිය නුදුරෙන්ම අකුණක් පුපුරා ගියා. ඒ වගේම නොනවත්වාම විදුලි කෙටුවා. එයින් මුළු උද්‍යානයම දවල් කාලය වගේ ආලෝකමත්වුණා. ඒ එළියෙන්, එක් මොහොතකට මට දකින්න ලැබුණු දර්ශනයෙන් මම භීතියට පත්වී, මගේ ඇඟ කිළිපොලා ගියා. මට යාර තිහක් පමණ ඉදිරියෙන් අඩිපාරේ කෙනෙක් කෙළින්ම මා දිහා බලාගෙන හිටියා!"

"මිනිහෙක්ද ගෑනියෙක්ද?" හෝම්ස් ඇසුවේය.

"මිනිහෙක් වියයුතුයි. මට එය තීරණය කිරීමට තිබුණේ මොහොතක කාලයක් පමණයි. ඒ මොකද ආලෝකය වැටුණා වගේම සැණෙකින් එය නිවී ගොස් අන්ධකාරවුණු නිසා. මං වහාම සිටි තැනින් ඉවත්වෙලා නැවත එහාට ගියේ ආරක්ෂාව සඳහා. මේ කාගෙන් ආරක්ෂා වීමටද කියලා නම් මට කියන්න බැහැ. එතැන ගහට හේත්තුවෙලා, ගල්ගැහිලා වගේ, මං මිනිත්තු කිහිපයක් එහෙමම ඉන්න ඇති. සීතල වැහිබිඳු ටිකක් මගේ ඇඟට වැටුණා හැරෙන්න, මට කිසි හිරිහැරයක් තාම වුණේ නැහැ. මීළඟට යළිත් වරක් විදුලි කොටද්දී මම විමසිල්ලෙන් බලාගෙන හිටියා. එවිට අඩිපාරේ කිසිම කෙනෙක් හිටියේ නැහැ. මං කලින් දුටු පුද්ගලයා සම්පූර්ණයෙන්ම අතුරුදහන් වෙලා.

දුන් දිගින් දිගටම ධාරානිපාත වර්ෂාව කඩා හැළුණා. මං තීරණය කළා වැස්සේම ආපසු ගෙදර එන්න. මට හැකි වේගයෙන් මං ආපහු ගෙදරට දුවගෙන ආවා. ඊළඟට මාව පුදුමයට පත්කරමින් දකින්න ලැබුණේ, නිවසේ ඉඳලා ගෙවත්තට බැසීමට ඇති දොර සම්පූර්ණයෙන්ම ඇර දමලා. වරාන්ඩාවේ පොළොවේ වැස්සට වතුර එකතුවෙමින් තිබුණා. මට හොඳටම විශ්වාසයි මං පිටත්වෙලා යද්දී මේ දොර වසා දාපු බව. සමහරවිට ඒ වෙලාවේ හැමූ වේගවත් කුණාටුව නිසා, සුළං පාරට දොර ඇරුණා වෙන්නත් පිළිවන්. ඒ මොකද දොර වසා තැබීමට සවිකර ඇති අගුළ, ඒ තරම් හොඳ එකක් නෙමෙයි, ඒක පහසුවෙන් ඇරෙන්න ඉඩ තියෙනවා. කොහොම වුණත් ඒ ගැන නොසලකා හිටීම අවදානම් බව මට වැටහුණා. මං වහාම මගේ රිවෝල්වරයට පතරොම් පුරවාගෙන,





සෑම කාමරයක්ම සෝදිසි කළා. නමුත් කිසිම තැනක මොකක් හරි අමුත්තක් මට දකින්න ලැබුණේ නැහැ.

එළියට බැහැලා ඇවිදින්න යාම, මගේ නින්ද නොයෑමට පිළියමක් වුණේ නැහැ. මගේ රිවෝල්වරය ළඟ තියාගෙන හාන්සි වී සිටියත්, එළිවෙන තුරු මට නින්ද ගියේ නැහැ. පසුවදා උදේ මම ගෙවත්තේ සෑම තැනක්ම සෝදිසි කරලා බැලුවා. මට උවමනා වුණේ කලින්දා රාත්‍රියේ මා දුටු අමුත්තා පිළිබඳ මොකක් හෝ සලකුණක් තිබේද කියලා බලන්න. නමුත් කිසිවක් හමුවුණේ නැහැ. ඊළඟට මට හිතුණා ගෙවත්තේ වටේ අර දම් පැහැති අතේ මුද්‍රාව කොහේ හෝ තිබී මට හමුවේවිද කියලා. එය තිබුණේත් නැහැ.

උදේ කෑම ගන්න වෙලාවේ මගේ බිරිඳ කිව්වා මා සමග නගරයට යන්න එයා බෑ, පෙරදිග රටවල නිෂ්පාදිත රෙදි සේල් එකක් ලිබර්ටි ශාලාවේ පැවැත්වෙන බව ඇයට දැනගන්න ලැබිලා. ඇයට උවමනා වුණේ එතැනට ගිහින් රෙදි මිලදී ගන්න. මුළු රෑම නින්දක් නැතුව හිටි නිසා, මට මගේ වෙළඳ ආයතනයට යන්න තරම් සනීපයක් තිබුණේ නැහැ. ඒ නිසා ඇය තනියම පිටත්වෙලා ගියා. ඇඳට වැටුණු මට හැකිවුණා, දවසෙන් භාගයක් පමණ නිදාගන්න. නින්ද ගියාට පස්සේ [illegible] තිබුණු කරදර වලින් මිදෙන්න හැකියාවක් ලැබුණා. ඒ වුණත් නින්දෙන් අවදිවුණාම අර ප්‍රශ්න යළිත් මගේ මොළේට ආවේ පෙරටත් වඩා තදින්.

හෙලන් ඩොබ්සන් කියන ගෑනිට කොහොමද මේ තරම් කෙටි කාලයක් තුළ මගේ බිරිඳ යටත් කරගැනීමට තරම් ශක්තියක් ආවේ? ශෝකාකුල මුහුණක් පෙන්වාගෙන සිටින, හැමවිටම නිශ්ශබ්ද ඇගේ සැමියා මොන විධියේ කෙනෙක්ද? ඔහු උද්‍යාන සේවකයෙක් කියල පෙන්වාගෙන හිටියට, ඔහු ඒ වෘත්තිය ගැන කිසිම දෙයක් නොදන්නා බව මට විශ්වාසයි. ඒ විධියට පෙන්වාගෙන මගේ ගෙදරට වෙලා ඉන්නේ, මොන අරමුණක් මුදුන්පත් කරගන්නද? මහා රාත්‍රියේ මගේ ගෙවත්තේ ඇවිදින භූතයා කවුද? මගේ [illegible] බිත්ති වල දම්පැහැති තීන්තෙන්, තමන්ගේ විකෘති අතේ ලාංඡනය තබන අද්භූත පුද්ගලයා කවුද? කාටහරි උවමනා වෙලා තියෙන්නේ මගේ ජීවිතය විනාශ කරන්නද? මුළු දවස පුරාත්, මහ රෑ වෙනතුරුත්, මේ ප්‍රශ්න ගැන මම මගේ මොළේට වධ දුන්නා. මෙවා විතරක් නොවෙයි තවත් ප්‍රශ්න



www.sinhalaelibrary.com

දහස් ගණනක් මගේ ඔළුවේට ආවා. මට වෙලාවකට හිතුණේ මේවා මැලේරියා උණ නිසා මගේ ඔළුවේට එන, විකාර බිහිසුණු සිහින කියලයි. නමුත් උදේ ඉර පායද්දි නින්දෙන් අවදිවුණාම මට සහනයක් ලැබෙනවා. නමුත් අද උදේ අවදි වෙද්දි මගේ කොට්ටය අසල මා දුටුවේ මගේ රිවෝල්වරය. එතකොට මට හිතුණා මගේ ප්‍රශ්නයට විසඳුමක් සොයාගත යුතු බව.

හෝම්ස් මහත්තයා. මීට කලින් මං ඔබ ගැන අසා තිබුණා. ඒ අවුරුදු කිහිපයකට කලින් ක්ලේගේට් අතුරුදන්වීමේ සිද්ධිය ඔබ ඉතා සාර්ථක අයුරින් විසඳූ වෙලාවෙ. මට හිතුණා දැන් නම් උන්මත්තකයෙකු නොවී බේරෙන්න පුළුවන් එකම ක්‍රමය, ඔබේ පිහිට පැතීමයි කියල. ඔබ ලබා ඇති විශිෂ්ට කීර්ති නාමය නිසා, මගේ සිතේ ලොකු බලාපොරොත්තු ඇතිවුණා. ඒ සමගම මගේ හිතේ සැකයක් ඇතිවුණා. මේ වගේ සියුම් එහෙත් පෞද්ගලික ප්‍රශ්නයක් නිසා ඔබ මේක භාරගනීවිද කියල....."

".....ඒ වුණත් ඔබ මා සොයා එන්න තීරණය කළා?"

"මහත්මයා. අද උදේ තැපෑලෙන් මෙන්න මේක මා වෙත ලැබුණා" ඔහු තමාගේ ඇතුළත් සාක්කුවෙන් තමා තිබූ දිගු නිල් පැහැති කවරයක් එළියට ගත්තේය.

එය අතට ගත් හෝම්ස් ලියුම් කවරය තම දණහිස් මත තබාගෙන විවෘත කරද්දී මම බලාසිටියෙමි. ලියුම් කවරය තුළින් හෝම්ස් අතට ගත් කඩදාසිය දුටු මම තිගැස්සුණෙමි. එහි තිබුණේ එක් චිත්‍රයක් පමණි. ඒ දම් පැහැති තීන්තෙන් කඩදාසිය මත තැබූ, මිනිස් අතක ලාංඡනයකි.

"වොට්සන්. කරුණාකර කාචය මා අතට දෙන්න" මගේ මිත්‍රයා කීය. "මේක පිරිමියෙකුගේ අතක සටහනක්. කෙටි මහත ඇඟිලි සහිත ගොරෝසු අතක්. බරවැඩ කර හුරුපුරුදු කෙනෙක්. එහෙත් ඔහුගේ මුදු ඇඟිල්ලේ මුද්දක් තියෙනවා. ඔබ කලින් දුටු මුද්‍රා මේකට සමානද?"

"ඔව්. මං හිතන්නේ ඒ වගේමයි."

"ප්‍රිංගල් මහත්මයා. ඔබේ හිතට සහනයක් දෙන එක කරුණක් මේ මොහොතෙම මං කියන්නම්. තමන්ගේ අතේ තීන්ත තවරලා මුද්‍රාව තැබූ පුද්ගලයා කවුරු වුණත්, ඔහුගේ අතේ තියෙන්නේ ඔබට සහ මට වගේ අතේ ඇඟිලි පහක් පමණයි. හයවැනි ඇඟිල්ල ප්‍රයෝගකාරීව කළ එකක්. මවාපෑමක්."





"හෝම්ස් මහත්මයා. මොකක්ද ඔබ එයින් අදහස් කළේ?"

"ව්‍යුහ විද්‍යාත්මකව මේක සම්පූර්ණයෙන්ම වැරැද්දියි. ඔබට පේනෙනවා ඇති මෙන්න මේ අමතර ඇඟිල්ල, අත්ල මැදට එන්න ක්‍රමයක් නැති බව. ඔහු කර තියෙන්නේ මේකයි. ඔහු මුලින් මුද්‍රාව තබද්දි සුළැඟිල්ල හා වෙදැඟිල්ල එකිනෙකට වඩා දෙපැත්තට කර, ඉඩක් තබලා තියෙනවා. ඊළඟට ඔහුගේ වෙදැඟිල්ලට අමතර තීන්ත ආලේප කර, අර හිස් ඉඩ ප්‍රමාණයේ තබලා. ඒ මිසක් මේක අස්වාභාවික ලෙස ඇඟිලි හයක් ඇති කෙනෙකුගේ අතක් නෙමෙයි. එක් අතක විකෘති ලෙස හයවන අමතර ඇඟිල්ලක් ඇති අය කලාතුරකින් සමාජයේ දකින්න ලැබෙනවා. මේක එහෙම කෙනෙකුගේ අතක් නෙමෙයි."

"දෙවියනේ! ඇත්ත නේන්නම්" ස්වල්ප වෙලාවක් ඒ දෙස බලාසිටි අපේ අනුග්‍රාහකයා කීය. "මටත් දැන් ඒක පැහැදිලිවම පේනෙනවා. ඒ වුණත් මොන අදහසකින්ද කෙනෙක් මෙහෙම දෙයක් කරන්නේ?"

"ආහ්! ඒක වෙනම ප්‍රශ්නයක්! මේක එවා තිබූ ලියුම් කවරය මං පරීක්ෂා කර බලන්නම්. හ්ම්, සාමාන්‍ය ලියුම් කවරයක්. ඊයේ හවස තැපැල් කරල තියෙන්නේ බටහිර ලන්ඩනයෙන්. පෑනට නම් තිබිල තියෙන්නේ හොඳටම මොට වූ තුඩක්. සැකයක් නෑ, ලිපිනය ලියා තියෙන්නේ තැපැල් කන්තෝරුවකදී නැත්නම් හෝටලයක ලියුම් ලියන කාමරයේදී, ඔවුන්ගේ තීන්තෙන් ඔවුන්ගේ කටු පෑනෙන්. හෝ හෝ! මේක ඔබ දුටුවේ නැද්ද? ඔබේ නම ලියලා තියෙන්නෙ වැරැද්දියට. නමුත් ලිපිනය නම් නිවැරැදි ඇති කියල මට හිතෙනවා. ඔබේ නම PRINGLE කියා ලියනවා වෙනුවට ලියා තිබෙන්නේ PRINGEL කියලා. මොන තරම් වැදගත් කරුණක්ද?" තමාටම කොඳුරාගත් හෝම්ස්, දෑතේ ඇඟිලි දණහිස් මත තබාගෙන නිකට දෑත් මත රඳවාගෙන කල්පනා කරන්නට පටන්ගත්තේය. ඔහු සම්පූර්ණයෙන්ම නිහඬ වූ බැව් මම දුටුවෙමි.

"මොකක් හරි හෝඩුවාවක් ඔබට පේනෙනවාද හෝම්ස් මහත්මයා?" අපේ අනුග්‍රාහකයා ඇහුවේ මගේ මිත්‍රයාගේ නිහඬ බව ඉවසිය නොහැකි තැනය.

"ආහ්? ඔව් ප්‍රිංගල් මහත්මයා. එහෙම යමක් කියන්න පුළුවනි." හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබේ නම වැරැදි අක්ෂර වින්‍යාසයකින් ලිවීම ම සුවිශේෂ කරුණක්. ඒක ලොකු වැරැද්දක්.



www.sinhalaelibrary.com

මට එයින් ගතහැකි නිගමනය මේකයි. මෙය ලියූ තැනැත්තා ඔබේ නම දැනගත්තේ කාගෙන් හෝ කට වචනයෙන්. ඊළඟට මෙය ලියූ තැනැත්තා එක්කෝ නූගතෙක්; නැත්නම් විදේශිකයෙක්; නැත්නම් ඒ දෙකම. ඒ මොකද සාමාන්‍ය උගත්කමක් ඇති ඉංග්‍රීසි ජාතිකයෙකු අතින්, ඔබේ නම ලිවීමේදී මෙවැනි වැරදක් සිදුවෙන්න බැහැ. මේකෙන් තවත් දෙයක් කියවෙනවා." කී හෝම්ස් යළිත් නිශ්ශබ්ද විය.

"ඒ මොකක්ද හෝම්ස් මහත්මයා?"

මඳවේලාවක් කල්පනා කළ මගේ මිතුරා පිළිතුරු දුන්නේ "ඒ ගැන තවදුරටත් හිතල බලන්න ඕන..... තව තවත් දේවල් වෙන්නත් පුළුවනි."

"ඒ මොනවද?"

"මේ ලියුම එවූ තැනැත්තා, ඔබ දන්න කෙනෙක් වෙන්න පුළුවනි. ඔහු ඒ බව සඟවන්න, මෙහෙම වැරදි පිළිවෙළට ඔබේ නම ලියූවා වෙන්නත් පුළුවනි."

"එහෙම නම් ඒක බොහොම වැරදි වැඩක්."

"මං ඔබ සමඟ එකඟවෙනවා මහත්මයා" හෝම්ස් කීය. "දැනට මේක බොහොම සංකීර්ණ ලෙස අවුල්වුණු එකක් බවයි මට පෙනෙන්නෙ. මට කියන්න. ඔබ කවදා හරි යුරෝපයේ බෝල්කන් ප්‍රදේශවල සංචාරය කර තියෙනවද?"

"ජීවිතේට ගිහිං නැහැ" ප්‍රිංගල් පිළිතුරු දුන්නේ පුදුමයෙනි. "මං යුරෝපයේ බෝල්කන් රටක් පැත්ත පළාතක ගිහින් නැහැ. සුවස් ඇළ හරහා නම් නැවෙන් යාත්‍රා කරල තියෙනවා."

"එතකොට ඔබේ බිරිඳ?"

"ඇය ලංකාවෙන් එංගලන්තයට ආවට පස්සේ, මං දන්න තරමින් රටින් පිටවී තිබෙන්නේ දෙවතාවයි. ඒ පැරිසියේ වාසය කරන ඇගේ ඥාති සොයුරියක් හමුවන්න."

"නෑ. ඒකෙ මේකට සම්බන්ධයක් තියෙන්න බෑ" හෝම්ස් කීවේ හිස සලමිනි. "ඔබට හතුරෙක් ලෙස සලකන්න පුළුවන් කෙනෙක් ඉන්නවද? ඔබ නිසා යම් අසාධාරණයකට හෝ විපතකට පත්වුණු කෙනෙක්?"

"මා දන්නා තරමින් කිසිවෙක් නැහැ. නමුත් මං ලංකාවේ ගතකළ කාලයේ, එක්තරා අපරාධකරුවෙකු එල්ලා මරණ අවස්ථාවේ, රජයේ සාක්ෂිකරුවෙකු ලෙස මා කැඳවනු ලැබුවා. ඒ



http://sherlockholmesinvestigations.blogspot.com



දිනවල ඔහුගේ පවුලේ අය කලබල කර තිබුණා. ඇත්තෙන්ම එය පෞද්ගලිකව මට එරෙහිව කළ දෙයක් නොවෙයි. පසුව ඔහුගේ පවුලේ අය විසිනුත් පිළිගත්තා. මේ අපරාධකාරයා භයානක මිනීමැරුම් රැසක් කළ අයෙක්."

"ඔබ කිව්වා ඔබ විවාහවුණේ ග්ලොස්ටර් වලදී කියල. ඒකට හේතුවුණේ ඔබේ බිරිඳ ඒ පළාතේ පදිංචිකාරියක් වීමද?"

"ඒකමත් නෙමෙයි මහත්මයා. ඇගේ පවුල එංගලන්තයට ආවට පස්සේ ජීවත්වෙලා තිබුණේ ලන්ඩනයේ. ඇගේ මවගේ පියා, ඒ කියන්නේ ඇගේ මවගේ පැත්තෙන් සීයා, කාලයක් ග්ලොස්ටර් හි ආසන දෙව්මැදුරේ ප්‍රධාන දේවගැතිතුමා වෙලා හිටියලු. ඒකත් එක කාරණයක්."

"හොඳයි" හෝම්ස් කීවේ ඔහුගේ පුටුවේ පිටුපසට හේත්තු වී දෑත්වල ඇඟිලි තුඩු එකට තබාගනිමිනි. "මහත්මයා ඔබ අප වෙත ගෙන ආ මේ ගැටලුව සිත් අදනසුළු සුවිශේෂ එකක් බව කිව යුතුයි. මෙහෙ තියෙනවා තරමින් මට තේරුම් ගැනීමට බැරි තැන් කිහිපයක්ම. ඔබට මේ කඩදාසිය මෙහි තබා යා හැකි නම්, මං තවදුරටත් සොයා බලලා මගේ අදහස ඔබට කියන්නම්."

"එහෙනම් මේක විසඳාගත හැකිවේවි කියල ඔබ බලාපොරොත්තු වෙනවද?" ප්‍රිංගල් ඇසුවේ නොඉවසිල්ලෙනි. කඩවසම් පුද්ගලයෙකු වූ ඔහුගේ මුහුණෙන් පළවූ, දුක්බර හැඟීම් අපගේ සිත්වල කණගාටුවක් උපදවනසුළු විය.

"සෑම අයුරකින්ම බලාපොරොත්තු තබාගත හැකියි" හෝම්ස් කීය. "මහත්මයා හෙට ඔබ ඉන්නවාද ඔබේ කාර්යාලයේ? ඉන්නවා? හොඳයි. ඔබට කියන්න යමක් අලුතෙන් මට හොයාගැනීමට හැකිවුණොත්, මම එනවා ඔබ හමුවෙන්න. මම නොආවොත්? එහෙම වුණොත් කරුණාකරලා බ්‍රහස්පතින්දාට මේ ගෙදරට ඇවිත් මා හමුවෙන්න."

"සත්තකින්ම හෝම්ස් මහත්මයා සත්තකින්ම. මං ඔබේ ඒ උපදෙස් අනුව කටයුතු කරන්නම්." සතුටට පත්වූ ප්‍රිංගල් මහතා කීය. "මොන වගේ ක්‍රියා මාර්ගයක්ද ඔබ අනුගමනය කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"මගේ හිතවත් මහත්මයා. මං ගන්නා එකම ක්‍රියා මාර්ගය, ඔබ දැන් වාඩිවී ඉන්නා පුටුවේම වාඩිවෙලා, තවත් ගැඹුරට කල්පනා කර බැලීමයි. ඒ කටයුත්තට ඔය අසුන හොඳයි මේකට වඩා."

http://sherlockholmesinvestigations.blogspot.com

"එපමණද?" ප්‍රිංගල් ඇසුවේ බලාපොරොත්තු කඩවූ අයුරෙනි. "ඔබ වෙන මොකුත්ම කරන්නේ නෑ?"

"සැර පයිප්ප දුම්කොළ විශාල ප්‍රමාණයකුත් පාවිච්චි කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේක පයිප්ප හතරක හෝ පහක ගැටලුවක්. හොඳින් නිරීක්ෂණ විශ්ලේෂණය කරලා මිසක්, කලබලේට නිගමනවලට එන්න මං කැමැති නෑ. මතුපිටට පෙනෙන ශුද්ධ පමණක් යොදාගෙන ගැටලු විසඳීමට හැකිවීම, බුද්ධිමත් පිළිවෙළක් නොවෙයි."

ප්‍රිංගල් මා වෙත හෙළුවේ, මම කිසිවක් තුමාට තේරුම් ගැනීමට අපහසු බව හඟවන බැල්මකි. ඊළඟට ඔහු දෙඋර හැකිළුවේ පරාජය පිළිගන්නා අයුරෙනි.

"ඔබ මේ ලියුම් ඔබේ බිරිඳට පෙන්නුවද?" අපේ අනුග්‍රාහකයා පිටවී යාමට සූදානම් වෙද්දී හෝම්ස් ඇසීය.

"මට හිතුණා ඒකෙන් ප්‍රයෝජනයක් නැහැ කියල" ප්‍රිංගල් කීය.

"මමත් හිතනවා ඔබේ ඒ තීරණය නිවැරදියි කියල" හෝම්ස් පිළිතුරු දුන්නේය. "අඩු වශයෙන් දැනටවත්. ඒ වගේම ඔබ මා හමුවෙන්න ආ බවක් කාටවත් කියන්න එපා."

"එහෙම දෙයක් කරන්න මං හීනෙකින් වත් හිතන්නෙ නෑ."

"ඔබට නොදැනීම ඒක කියවෙන්න ඉඩ තියෙනවා. බොහොම පරෙස්සමෙන් අවධානයෙන් ඉන්න ප්‍රිංගල් මහත්මයා! අවසන් වශයෙන් තවත් එක් දෙයක්...."

"ඔව්?"

"මොනම හේතුවක් නිසාවත් අඳුර වැටුණට පස්සේ ඔබේ ගෙවත්තට යන්න එපා! ඔබ වටා ගොඩ නැඟී ඇති අභිරහස තවමත් මම සම්පූර්ණයෙන්ම තේරුම් අරගෙන නෑ. නමුත් ඔබ අන්ධකාරයේ ගෙවත්තට පා තැබීම භයානක දෙයක්. ඒක මට විශ්වාසයි."

ප්‍රිංගල් මහතා අප දෙදෙනාට ආචාර කොට පිටවී ගියේය. හෝම්ස්ගෙන් මා වෙත ප්‍රශ්නයක් යොමුවූයේ තවත් පැය කාලකට පමණ පසුවය.

"හොඳයි වොට්සන්, ඔබ මොකක්ද ඒ කථාවෙන් තේරුම් ගත්තේ?"

"මට නම් මොකුත්ම හිතාගන්න බැහැ" මම අවංකව මගේ හැඟීම් හෙළිකළෙමි.





"ඔබ නම් අපූරු කෙනෙක් ඇත්තමයි" හෝම්ස්ට කියැවිණි. "වොට්සන්. මට වෙලාවකට හිතෙනවා මේ ලන්ඩනයේ ඉන්න අපූරුම මිනිහා ඔබය කියල. ඒ මොකද ඔබ වගේ ඇත්ත කථා කරන අවංක කෙනෙක්, මට මීට ඉස්සර හමුවෙලා නැහැ. මේකෙ අභිරහස තමන්ට හොඳහැටි වැටහෙනවා කියල කවුරු හරි කිව්වොත්, මම නම් ඒක විශ්වාස කරන්නේ නෑ. ඒ මොකද පහුගිය මාස දොළහ ඇතුළත මට ලැබුණු ගැටලුවලින් ඉතාමත්ම සංකීර්ණ, ඒ වගේම අවුල්වුණු ගැටලුව මේක තමා. මාක් ප්‍රිංගල් කිව්වා වගේ මේ සිද්ධීන් එක එක වෙන් වෙන්ව ගත්තොත්, මේ හැම එකක්ම අවිහිංසක, ඉතාම සුළු සිදුවීම්. නමුත් ඒවා හැම එකක්ම එකට සම්බන්ධ කරන්න. එතකොට ලැබෙනවා මහා සංකීර්ණ මෙන්ම බරපතල කුමන්ත්‍රණයක සැලැස්මක්."

"කොහොමවුණත් මේ සිද්ධීන් එකකට එකක් සම්බන්ධ නැතුව ඇති?" මම ඇසුවෙමි.

"නැහැ. එහෙම වෙන්න බැහැ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මගේ හිතේ ඇති ඉවෙන් මට ඒක කියන්න පුළුවනි. මේ සිද්ධීන් මොන යම් ආකාරයකින් හෝ එකට සම්බන්ධයි. ඒ සම්බන්ධය මොකක්ද කියලා හොයා ගැනීම අපේ වගකීමක්. නමුත් එය හෙවීමට අපට ඇති ලොකුම බාධකය තමා, සමහර සිද්ධීන් වල පෙනෙන පරස්පර විරෝධී බව. උදාහරණයක් ගමු. කෙනෙකුට අනුමාන කරන්න පුළුවන් ප්‍රිංගල් මහත්මිය හා ඩොබ්සන් අතරේ අනියම් සම්බන්ධකමක් තියෙනවා කියල. නමුත් ඒකට එරෙහිව නැඟෙනවා තර්කයක්. ප්‍රිංගල් මහත්මිය හා හෙලන් ඩොබ්සන් අතරේ තියෙනවා ඉතාම සමීප මිත්‍රත්වයක්."

"ඩොබ්සන් ගැන නම් මගේ හිතේ තියෙනවා ලොකු සැකයක්" මම කීවෙමි. "ඒ ජෝඩුව මෙහේ නැවතී ඉන්නේ මොකක් හෝ රහස් අරමුණකින්. ඒක මට විශ්වාසයි. නමුත් ඒ අරමුණ මොකක්ද කියලා නම් මට කියන්න බැහැ."

"ඒ වුණත් මෙවැනි සිදුවීම් වෙන්නෙ කොහොමද?" හෝම්ස් ඇසුවේ මා සමග එකඟ නොවන බව හඟවමිනි.

"මොහොතකට හිතන්න වොට්සන්, රහස් අරමුණකින් කටයුතු කරන්නේ ඔබය කියල. එහෙනම් ඔබ හැම දෙයක්ම කරන්නේ මොන තරම් රහසිගතවද? අදාල පුද්ගලයන්ගේ හිත්වල කිසිම සැකයක් ඇති නොවන අයුරින් නේද? නමුත් බලන්න ඩොබ්සන්ල



www.sinhalaelibrary.com

දිහා. කටයුතු රහසිගතව කිරීමට ඔවුනට කිසිම උවමනාවක් නැහැ. ඔවුන් හැසිරෙන්නේ නඩියට නිකං හිතාමතාම, ප්‍රිංගල් මහත්මයාගේ හිත කලකිරවන්න වගේ. එතැනදී ඔවුන්ගේ රහසිගත හෝ ප්‍රයෝගකාරී බවක් නැති බව අපට පෙනෙනවා."

"ඔව් ඒ අතින් නම්, ඔවුන්ගේ හැසිරීම හරිම අමුතුයි" මම කීවෙමි.

"මේ හැම දෙයක්ම තියෙන්නේ අපට පතුලක් නොපෙනෙන ගැඹුරු දියේ වොට්සන්" මගේ මිත්‍රයා කීය. "සමහරවිට ඒ අප හිතනවාටත් වඩා ගැඹුරේ වෙන්න පිළිවන්. මට හිතෙනවා අපි නොදන්නා කාරණා රාශියක්ම මේ ගැටලුවට සම්බන්ධ ඇති කියල. අන්න ඒ සැඟවුණු නූල් පොටක් අපට අල්ලාගන්න හැකිනම්..... එහෙම එකකින් එළියට ඇද්දොත් බාගවෙලාවට ඔක්කොම ටික එළියට ඇදෙන්න පිළිවන්."

"දැනට නම් මේක පැටළුණු නූල් බෝලයක් බව ඇත්තයි" මම කීවෙමි. "මට නම් කියන්න තියෙන්නේ, මේක ගැන කල්පනා කරන්න කරන්න, මගේ මොළේ තව තවත් අවුල් වෙනවා. උදාහරණයක් වශයෙන්, ඔහුගේ අර උද්‍යානය කෙළවර නිවස ළඟ තිබී හමුවුණු, දම්පාට තීන්ත සහිත බාල්දියේ වැදගත් කම මොකක්ද?"

"මගේ හිතවත් මිත්‍රයා" හෝම්ස් කීවේ සිනාසෙමිනි. "එතැනදී නම් ඔබ ගසේ ඇඟිල්ල දිගු කරන්නේ, මෙහි කිසිම අභිරහසක් නොමැති තැනට. තමන්ගේ අතේ තීන්ත තවරා බිත්තියේ මුද්‍රාවක් තැබූ තැනැත්තා, ඊළඟට මොකක්ද කරන්නේ? ළඟම තියෙන වතුර බාල්දියෙන් අත සෝදාගෙන තීන්ත ඉවත්කරගන්නවා. ඒ මොකටද? තමන් කළ කටයුත්ත අන් අයගෙන් සැඟවීමට. මම මුණින් කරන්නේ ඒ ටිකමයි. එහෙම නේද? දැන් අපි අපේ මිත්‍ර පොලිස් පරීක්ෂක ඇතල්නි ජෝන්ස් මගේ, ප්‍රශ්නය වටේ රවුම් ගහනවා මිසක් ඒකෙ ඇතුළට ගමන්කරන්නේ නෑ."

"බොහොම හොඳයි" මම කීවෙමි. "ඔබට මේ ගැන නිදහසේ කල්පනා කරන්න ඉඩදීලා මම යන්නම්" මම පිටත්වී යෑමට සූදානම් වුණෙමි.

"හෙට හවස හෝවරදවාම මේ පැත්තෙ එන්න වොට්සන්. අප කොයිතරම් ඉදිරියට යනවාද කියල, එතකොට විමසල බලමු."

පසුවදා සවස තුනට මම බේකර් වීථියේ නිවසට ගියෙමි. මගේ මිත්‍රයා එහි නොසිටි නිසා, මම ජනේලය අසල පුටුවක වාඩිවී





පුවත්පත කියවමින් කාලය ගතකළෙමි. පැයවේලාවක් ගතවෙද්දී ඔහු ආපසු පැමිණියේය. හෝම්ස්ගේ මුහුණේ විඩාපත් බවක් තිබුණත්, මඳසිනාවක් සහිත තෘප්තිමත් බවක් ද දැකිය හැකි විය. එයින් මා වටහා ගත්තේ, වෙහෙස මහන්සි වුවත් සෑහෙන තරම් සාර්ථක ප්‍රතිඵල අත් කරගැනීමට ඔහු සමත් වී ඇති බවයි.

"ඇඟට හරි වෙහෙසක් ගෙන දෙන කාලගුණයක්" ඔහු කීවේ හිස්වැස්ම ගලවා මේසය මතට විසිකරමිනි.

"ප්‍රිංගල්ගේ ගැටලුව ගැන කොහොමද ඔබ ලැබූ සාර්ථකත්වය?"

"බොහොම සාර්ථකයි. මට හැකිවුණා ඒ ගැටලුව විසඳන්න."

"මොනවා?"

"ඔව් වොට්සන්. ඒකට අදාළ කරුණු හැම එකක්ම දැන් මම දන්නවා. ඒවා ඔබට ඉදිරිපත්කරන්න මම සූදානම්. බලාගෙන ගියාම ඒක බොහොම සරල සිද්ධියක්. ඔබ එනවාද මා එක්ක යන්න? පැය භාගයක් ඇතුළත ගියොත් අපට හැකිවේවි, තුවඩ් ෆුයර්ස්ති ඔහුගේ කාර්යාලයේදී ප්‍රිංගල් හමුවෙන්න. කොහොම වුණත් ඔහුට දියයුතු උපදෙස් ගැන කියනවා නම්....."

හෝම්ස්ගේ කටහඬ කෙමෙන් අඩුවී ගියේය. ඔහුගේ දෑස් අරමුණකින් තොරව ඉදිරියට යොමුවී තිබිණ. වචනයක් හෝ කථා නොකොට තම කබාය ගලවා ඉවතට විසිකළ හෝම්ස්, ඔහුගේ කළු පැහැති පයිප්පය දුම්කොළ වලින් පුරවා ගත්තේය. ඔහුගෙන් ඇසිය යුතු ප්‍රශ්න රාශියක් මගේ සිතේ මතුවිය. එහෙත් ඒවා දැන් ඉදිරිපත් කිරීමෙන් පලක් නොමැත. ඒ බව මම පළපුරුද්දෙන් දැන සිටියෙමි. ඔහුට කැමැති වෙලාවට ඔහු ඒ සියල්ල මට හෙළිකරනු ඇත.

තමන්ගේ වෘත්තිය හා සම්බන්ධ කටයුතු වලදී හෝම්ස් විහිළුවක් කළේ ඉතා කලාතුරකිනි. එමෙන්ම තම හැකියාවන් ගැන ඔහු කිසිදිනෙක අතිශයෝක්තියෙන් පැවසුවේ ද නැත. එහෙයින් හෝම්ස් කීවේ ඇත්තක් විය යුතුය. ගැටලුව, විසඳීමට කොයිතරම් අමාරු එකක් වුවත්, විසඳා අවසන් කළ බව සත්‍යයක් විය යුතුය. ඔහුගේ අවාසනාවන්ත අනුග්‍රාහකයා වටා ගොඩ නැගුණු අභිරහස්, පැය විසි හතරක් ඇතුළත විසඳීමට හැකිවූයේ කෙසේද?

"ඔබේ අනුග්‍රාහක ප්‍රිංගල් මහත්මයාගෙ ගමේ, තව තවත් අභිරහස් ගොඩනැගෙන බවයි පෙනෙන්න තියෙන්නෙ" මා කීවේ පැය වේලාවක් ගතවූ පසුය.



www.sinhalaelibrary.com

"ඇයි ඒ මොකද?" හෝම්ස් ඇසුවේ ඔහුගේ ගැඹුරු කල්පනා ලෝකයෙන් සිත නිදහස් කරගැනීමට අපහසු වූ අයුරෙනි. "මොකක්ද ඔබ කිව්වේ?"

"මෙන්න අද පුවත්පතේ තියෙනවා, උදේ පාන්දරම වර්ටයි පාලම අසල තේම්ස් ගඟේ තිබිල මිනියක් හමුවුණා කියල. ඔහුගේ පසුවෙ පැත්තක ඇමිණී තිබුණලු, ඔහු මරාදැමීමට යොදාගත් පිහිය."

"මොනවා?"

"පොලීසිය විශ්වාස කරනවා මේ මළසිරුර ස්ටේන්ස් ප්‍රදේශයේ ඉඳල ගඟේ පාවී එන්න ඇති කියල."

මගේ අතින් පුවත්පත උදුරාගත් හෝම්ස් එම පුවෘත්තිය වෙත තම දෙනෙත් වහා යොමුකළේය. ඔහුගේ මුහුණේ කැළැඹීමට පත් ලකුණු මම දුටුවෙමි. "මිටි තරබාරු පුද්ගලයෙක්" ඔහු කීවේ සැනසුම් සුසුම් හෙළමිනි. "කළු පැහැති සමක් ඇති අත් බමරු කළු හිසකෙස් ඇති, එක් කනක රන් කරාබුවක් පැළැඳි..... ඒ නම් අපි දන්නා කෙනෙක් නොවෙයි. කොහොම වුණත් ඒක මේ සිද්ධියට සම්බන්ධයි වොට්සන්."

"ඔබට හිතෙන්නේ එහෙමද?"

"මං ඒ බව හොඳාකාරවම දන්නවා. ඔහුගේ සාක්කුවේ තිබූ දේ ගැන පුවත්පතේ සඳහන් තොරතුරු බලන්න.

".... මේ පුද්ගලයා හඳුනාගැනීමට උපකාර විය හැකි ද්‍රව්‍ය, ඔහුගේ සාක්කුවල තිබුණේ ඉතා ස්වල්පයකි. එමෙන්ම ඔහුගෙන් මුදල් පැහැරගැනීමේ අරමුණක් තිබූ බවද සිතිය නොහැක. එකට අමුණා තිබූ පවුමේ නෝට්ටු තුනක්, මාරුකාසි කිහිපයක්, ඌරු සමින් කළ තොපුවක අසුරා තිබූ ඉතා කුඩා සුරුට්ටු හයක්, ගිනිපෙට්ටියක් සහ තීන්ත බෝතලයක්, සාක්කුවේ තිබූ සම්පූර්ණ බඩු ප්‍රමාණය විය. මීට අමතරව ඔහුගේ කබායේ වාටියේ තිබී වයින් බෝතල් වැසීමට යොදන සැහැල්ලු ලී මූඩියක් ද හමුවිණි." හොඳයි වොට්සන්. මිනිහෙක් මොකටද තීන්ත බෝතලයක් සාක්කුවේ දාගෙන යන්නෙ පෑනක් නැතුව?"

"දම් පැහැති අත"

"හරියට හරි. ඔන්න අහගන්න....."

"ඔහුගේ ඇඳුම් වල තිබූ සියලුම ආකාරයේ සලකුණු හා ලේබල් ඉවත් කර ඇති බව පැහැදිලිය. ඒ ඔහු හඳුනාගැනීම වැළැක්වීමටයි.





කෙසේ වෙතත් ඔහුගේ ඇඳුම් කබායේ සාක්කුවක අඩියට මසා තිබූ ලේබලයක් හමුවී ඇත. එහි තිබුණේ තනි වචනයක් පමණි. එහි සඳහන්ව තිබූ අකුරු, නැගෙනහිර යුරෝපීය රටවල භාවිත කරන භාෂාවන් ලිවීමට ගන්නා, සිරිලික් හෝඩියේ අකුරුය. මේ අනුව මැරුම් කෑ පුද්ගලයා ඒ ප්‍රදේශයෙන් පැමිණි අයෙකු බව සිතිය හැක. ඔහු මැරීමට යොදාගත් පිහියෙන්, ඒ බව තවදුරටත් සනාථ වේ. අස්ථි වලින් කපාගත් මිටක් සහිත මේ පිහියේ තිබුණේ ඇකිළිය නොහැකි තලයකි. එහි "බෙල්ගේඩ්" යන වචනය කැටයම් කර තිබිණි."

"ඒකෙන් අදහස් වෙන්නෙ මොකක්ද හෝම්ස්?"

"එයින් අදහස් වෙන්නේ, මං බලාපොරොත්තුවුණාට වඩා වේගයෙන් කාරණා සිද්ධ වෙන බව. තවත් මිනීමැරුමක් සිදුවෙන එක නවත්වා ගන්න නම්, අපි වහාම ක්‍රියාත්මක විය යුතුයි ඔබ එනවද මා එක්ක යන්න?"

"සත්තකින්ම ඔව්. අපි යන්නේ තුවඩ ෆයර්ස්හි ඔහුගේ කාර්යාලයටද?"

"නැහැ ලෝ මෙඩෝස් ලේන ඔහුගේ ගෙදරට."

කබාය ගළවා ඉවත දැමූ වේගයෙන්ම, හෝම්ස් යළිත් එය හැඳගත්තේය. මිනිත්තුවක් ගතවෙද්දී අප කුලීරිය්කියකින් පිටත්වී ගියේ වෝටලූ දුම්රියපොළ වෙතය.

"සැකයක් නෑ. මේ වෙනකොට මෙය සිදුවුණු ආකාරය ගැන ඔබට යම් අදහසක් ඇවිල ඇති?" හෝම්ස් කීවේ අප නැගී දුම්රිය වොක්ස්හෝල් දුම්රිය පොළ පසුකර යද්දීය.

"මං වඩාත් කැමැතියි ඔබ කළ ඇති නිගමන මොනවාද කියල දැනගන්න" මම කීවෙමි.

"ඔබට මතක ඇති...." හෝම්ස් කතාව පටන්ගත්තේ මිනිත්තු කිහිපයක් නිහඬව සිටීමෙන් පසුවය. "අපේ අනුග්‍රාහකයා රාත්‍රියේ දුටු අමුත්තා ගැන විස්තරයක් කියන්න තිබුණේ, කාරණා දෙකයි. එකක් ඔහුගේ අතක විකෘති බව, අනෙක ඔහු ශරීර ප්‍රමාණයෙන් අසාමාන්‍ය ලෙස මිටි බව. නමුත් ප්‍රිංගල්ගේ මේ නිරීක්ෂණ දෙකම වැරැදියි. ඒ මොකද ඇත්තෙන්ම ඒ පුද්ගලයාගේ අතේ විකෘති බවක් නැහැ. අනෙක අතේ මුද්‍රාව බිත්තියේ තාවල තිබුණේ බිම සිට අඩි පහක් පමණ ඉහලින්. එහෙනම් ප්‍රිංගල් එතැනදිත් වැරැදියි."



www.sinhalaelibrary.com

"ඒ කොහොමද?"

"ඒ මොකද යම් පුද්ගලයෙක් තමන්ගේ අතේ මුද්‍රාව බිත්තියක සලකුණු කරනවා නම්, ඔහු ඒක කරන්නේ තමන්ගේ උරහිසේ තරමට උසින්. ඔබ වෙලාවක උත්සාහ කරල බලන්න. හොඳයි එම පුද්ගලයාගේ උරහිස තියෙන්නේ අඩි පහක් උසින් නම් ඔහුගේ ශරීරයට තිබෙන්නේ සාමාන්‍ය උසක්. එහෙකොට රාත්‍රියේ හොරෙන් වත්තට ඇතුළුවුණු තැනැත්තා, විකෘති බවක් ඇති මිටි කෙනෙක් නෙමෙයි; සාමාන්‍ය පෙනුම ඇති මනුස්සයෙක්."

"එහෙකොට ඔහුව හඳුනාගැනීම තවත් අපහසුවෙනවා නේද?" මම ඇසීමි.

"නෑ වොට්සන්. ඒකෙන් මේ අභිරහසේ අඳුරු බව මකාලන්න යම් ආලෝකයක් ලැබෙනවා."

"ඒ කොහොමද කියල මට හිතාගන්න අමාරුයි."

"ඒ තැනැත්තා මේ තීන්ත මුද්‍රාව තියන්නේ කුමන අරමුණකින්ද? යම්කිසි පුද්ගලයෙකුට දෙන පණිවුඩයක් වශයෙන්. ඔබ අහල තියෙනවද වොට්සන්, කවුරු හරි "ඇඟිලි හතේ අත" ගැන කියනවා?"

"කවදාවත් නැහැ."

"ඒකෙ පුදුමයක් නෑ. ඒ මොකද ඒකෙ වැඩකටයුතු ගැන, මේ එංගලන්තයේ ඒ තරම් ප්‍රසිද්ධියක් ලැබිලා නැහැ. ඔබට ඇත්තම කියන්න වොට්සන්, මේ සංගමය ගැන අද වෙනතුරු මං දැන හිටියෙත් කාරණා කිහිපයක් පමණයි. ඒ වුණත් ඒක මගේ විෂය ක්ෂේත්‍රයට අයත්වෙන සංගමයක්. ඒක රහස් සංගමයක්. මනුෂ්‍ය ශිෂ්ටාචාරය කියන නමටත් අපහාසවෙන නින්දිත පාපිෂ්ඨ සංවිධානයක්. එය බෝල්කන් ප්‍රදේශයේ මුල් බැහැගෙන ඉන්නේ මිලේච්ඡ තිරිසන් සතෙක් ලෙසයි. එහි අඩු පඩු ප්‍රදේශයේ සෑම ගමකට නගරයකටම විහිදිලයි තියෙන්නේ. අඩුම වශයෙන් එක් පුද්ගලයෙකු හෝ ඔවුනට පක්ෂපාතිත්වය නොදක්වන පළාතක්, බෝල්කන් අර්ධද්වීපයෙන් හොයාගන්න බැහැ. ඒ හැමදෙයක්ම ඔවුන් දිනාගෙන තියෙන්නේ ත්‍රස්තවාදය හා බිහිසුණු මිනීමැරුම් මගින්."

"මෙක මොන අරමුණකින් පිහිටුවා ගත් එකක්ද හෝම්ස්?"

"මුලින් මෙය පිහිටුවා ගනිද්දි එහි ආරම්භක සාමාජිකයන්ට තිබුණේ ඉතාම යහපත් අරමුණු. දුප්පත් ප්‍රදේශවාසීන්ගේ දුක්





ගැනවිලි ගැන පාලකයින්ට දැනුවත් කිරීම එක අරමුණක්. සහනසේවා කඩිනම් කිරීමට පාලක පක්ෂයට බලකිරීම තවත් එකක්. නමුත් අවාසනාවකට වගේ ආත්මාර්ථකාමීම මෙහි විධායක බලය දරුණු පුද්ගලයන් අතට පත්වුණා. රහසිගත සංගමයක සාමාජිකත්වය ලබාසිටීම ඔවුනට ආශිර්වාදජනක වුණා. ඔවුන් දුප්පත් පොහොසත් හැම කෙනෙකුගෙන්ම කප්පම් ගත්තා. ඊට විරුද්ධ වන අයට අත්වුණේ මරණය.

මොවුනට "ඇඟිලි හතේ අත" යන නම ලැබුණේ මෙහෙමයි. මුලින්ම මේ සංගමය හැදුණේ පළාත් හතක සාමාජිකයන් එකතුවීමෙන්. මේ සංගමයට බැඳෙන සෑම සාමාජිකයෙක්ම එයට පක්ෂපාතිත්වය දක්වල දිවුරුමක් දීම අනිවාර්ය වුණා. එය කරද්දී පක්ෂපාතිත්වය දක්වන ලියවිල්ලක තමන්ගේ සම්පූර්ණ අතේ මුද්‍රාව තබා සහතික කළ යුතුයි. පසුව මේ අතේ මුද්‍රාවට තවත් ඇඟිලි දෙකක් එකතු කරලා "ඇඟිලි හතේ අත" සංගමයේ ලාංඡනය බවට පත්වුණා. තමන්ගේ සතුරනට මරණීය තර්ජන එල්ලකිරීමට ඔවුන් මේ මුද්‍රාව යොදාගත්තා. ඔවුන්ගේ බිහිසුණු ක්‍රියා පිළිවෙත ගැන අපකීර්තිය මුළු අර්ධද්වීපය පුරාම පැතිර ගියේ මිනිසුන් භීතියට පත් කරමින්. අසරණ මනුස්සයෙකු පිටුපස ඔවුන් එන්න පටන්ගත්තාම, ඔවුනට ගොදුරු වෙනවාට වඩා, රුදුරු වෘකයින් දමූ කුඩුවකට යන එක වඩාත් හොඳ බවට කතාවක් තිබුණාලු.

පැය ගණනාවක් තිස්සේ පරණ පුවත්පත් පෙරලා බැලීමෙන් මට හැකිවුණා මේ තොරතුරු හොයාගන්න. මට තවත් කාරණයක් දැනගන්න ලැබුණා. මෙම සංගමයේ නැගෙනහිර රුමේලියාවට අයත් සාමාජිකයන්, අවුරුදු කිහිපයකට කලින් සංගමයේ නීතිරීති කඩ කරලා තියෙනවා. ඒ නිසා ඔවුන් සංගමයෙන් නෙරපා දමල තියෙන්නේ, බිහිසුණු ඇණ-කොටා ගැනීම, මිනීමැරුම් මධ්‍යයේ. ඒ සමගම සංගමයේ ලාංඡනයෙන් ඇඟිල්ලක් ඉවත්කොට, "ඇඟිලි හයේ අත" ඔවුන් ලාංඡනය බවට පත්කර ගත්තලු. මගේ අවාසනාවන්ත අනුග්‍රාහකයාට උදේ තේ මේසයට ලැබුණු ලියුමේ තිබුණේ එයයි."

"නමුත් ඔහු කොහොමද මේකට පැටළුණේ?" මම ඇසීමි.

"බෝල්කන්හි තිබෙන මිනීමරු සංවිධානයක් කොහොමද



www.sinhalaelibrary.com

එංගලන්තයේ බලය පතුරුවන්නෝ? අනිත් ඇයි අවුන් මාක් ප්‍රිංගල් පසුපස එළවන්නේ?"

මේ ප්‍රශ්නයට හෝම්ස්ගෙන් එක්වරම පිළිතුරක් නොලැබිණි. තම අසුනේ පිටුපසට හේත්තු වූ ඔහු, මෝටර් රිය කවුළුවෙන් ඈත බලාගෙන සිටියේය. අප ගමන්ගත් මාර්ගය දෙපසම වූයේ කුඩා පඳුරු වලින් හා විශාල තණබිම් වලින් සැදුණු නිසංසල පෙදෙසකි. ගොපි හා බටර්කප් මල් වලින් අලංකාර වූ, මෙවැනි ගම්බද පෙදෙසකට, අවාසනාව ළඟාවූයේ කෙසේද? තම කවර අරමුණු ඉටුකරගැනීමේ අරමුණෙන්, මුහුදෙන් එතෙර සිට පැමිණි අපරාධකරුවන් ක්‍රියා කරන බව, මට සිතාගැනීමටත් අපහසු විය.

"ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය වුණේ මාක් ප්‍රිංගල් නොවෙයි." මගේ මිතුරා කීවේ මඳ වේලාවකට පසුවය. "ඔබට මතකද ප්‍රිංගල්ට ලැබුණු ලියුමේ කවරය? එහි ඔහුගේ නම ලියා තිබුණේ වැරදි අක්ෂර වින්‍යාසයකින්. ඒකෙන් අපි නිගමනය කළේ, මේ ලියුම එවූ තැනැත්තා ප්‍රිංගල් ගැන පෞද්ගලිකව දැනහිටියේ නැතිබවයි. මේකෙන් අපේ අවධානය යොමු කෙරෙනවා එක් කරුණක් ගැන. ඒ තමයි එදා ඉරිදා රාත්‍රියේ මාක් ප්‍රිංගල් තමන්ගේ ගෙවත්තේ ඉඳලා ඔවුන්ගේ කටයුතු වලට හිරිහැරයක් වුණා. ඒ නිසා තමයි, ඔවුන් මේ අසරණයාට ලියුමක් එව්වේ. ඔහුගේ නම දැනගන්න ඇත්තේ ස්ථානෝචිත අසල්වැසියෙකුගෙන් විමසලා. සංගමයේ වැඩකටයුතු වලට බාධා නොකළ යුතු බවට අනතුරු ඇඟවීමක් ලෙසයි එක එව්වේ. අපේ අනුග්‍රාහකයාගේ අනන්‍යතාවය මුලින් මේ බිහිසුණු පුද්ගලයන් දැන සිටියේ නැහැ. ඒකෙන් අපට තවත් කරුණක් තේරුම් ගන්න පුළුවනි. ඒ තමයි, මේ අපරාධ කල්ලිය මුලින් ප්‍රදර්ශනය කළ හස්ත මුද්‍රා දෙක, ප්‍රිංගල් අරමුණු කරගෙන කළ ඒවා නොවෙන බව."

"මට ඒක තේරුම් ගන්න අමාරුයි" මම කීවෙමි. "ඔබ කියන්නේ ප්‍රිංගල්ට අන්තරායක් නැහැ කියලද?"

"ඔහුට කිසිම අන්තරායක් නැහැ කියන තරම් දුරට මට සහතික වෙන්න බැහැ," හෝම්ස් පිළිතුරු දුන්නේය. "මම ඇත්තෙන්ම හිතනවා ප්‍රිංගල් තවමත් ජීවතුන් අතර සිටීම, ඔහුගේ ලොකු වාසනාවක් කියලා. ඔබේ ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් දෙන්න නම් අපි පසුගිය අවුරුදු දහයකට පමණ කලකට පෙර එංගලන්තයේ වුණු සිදුවීමක් විමසා බැලිය යුතුයි.





ලන්ඩනයේ කිං විලියම් වීදියේ තිබුණා ඇංග්ලෝ හෙලෙනික් නමින් බැංකුවක්. ජේම්ස් ග්‍රීන් නම් පුද්ගලයෙක් මේකෙ විශාල මුදලක් තැන්පත් කරලා තිබුණා. ඔහුගේ වෘත්තිය ඔහු බැංකුවට හඳුන්වා දීල තිබුණා ඒ ග්‍රීසියෙන් හා ඊජිප්තු දූපත් වලින් එංගලන්තයට වයින් ආනයනය කළ සමාගමක හිමිකරුවා ලෙස. බැංකුවේ ලන්ඩන් නගරයේ ප්‍රධාන කාර්යාලයට සහ ඇතැන්ස්හි ශාඛාවේ, මේ ගිණුමට වරින් වර විශාල වශයෙන් මුදල් තැන්පත් වුණා. වරින් වර මුදල් ආපසු ගැනීමත් සිද්ධවුණා.

1882 දී මේ බැංකුව විශාල මූල්‍ය අර්බුදයකට මුහුණපාලා බංකොලොත්වුණා. මේකෙ මුදල් තැන්පත් කර තිබූ අයට සහනයක් ලබාදෙන්න, එංගලන්තයේ මහ බැංකුව උත්සාහයක් දැරුවා. ඒ සඳහා ඔවුන් හොයා බැලුවා, ඇංග්ලෝ-හෙලෙනික් බැංකුවේ ගිණුම් හිමිකරුවන් කවුද කියලා. එතකොටයි ඔවුනට දැනගන්න ලැබුණේ ජේම්ස් ග්‍රීන් කියලා පුද්ගලයෙක් ඇත්තෙන්ම නොමැති බව. ඔහුගේ වයින් ආනයනය කරන සමාගම නමින් ඇත්ත වශයෙන් සමාගමක් තිබුණෙත් නැ. කාගෙද මේ මුදල්? මේ "ඇඟිලි හයේ අත" සංවිධානයේ මුදල්: සංවිධානයේ ලොකු ලොක්කන්ට සුඛෝපභෝගී ජීවිත ගෙවන්න උපයාගත්, මුදල්: සූක්ෂම අයුරින් බිහිසුණු මිනීමැරීම් කිරීමට වෙන්කළ මුදල්. මේ බව හෙළිවුණේ ඇංග්ලෝ-හෙලෙනික් බැංකුව බංකොලොත්වීම ගැන පැවැත්වුණු නඩුවිභාගයේදී. ඒ දවස් වල රටේ මේ ගැන මහත් ආන්දෝලනයක් ඇතිවුණා."

"මං හිතන්නෙ මටත් ඕක මතකයි" මම කීවෙමි. "බැංකුවේ ප්‍රධාන ලිපිකරුවා ගනුදෙනුකරුවන්ගේ මුදල් නොයෙකුත් ආයෝජන වල සහ පෞද්ගලික පරිහරණය සඳහා යොදාගෙන තිබුණා. සෑහෙන කාලයක් තිස්සේමයි ඔහු බැංකුවේ මුදල් වංචාකරල තිබුණේ. මං හිතන්නේ අන්තිමට ගිණුම් වල පැන්සයක් වත් නැති තරමට බැංකුව බංකොලොත්වුණා."

"ඔබේ මතකය ඉතාම නිවැරදියි වොට්සන්. මේ ප්‍රධාන ලිපිකරුවා ආතර් පෙන්ඩිල්ටන් නැමැත්තෙක්. තමන් කළ වංචනික ක්‍රියා ගැන කිසිම ආකාරයකින් පසුතැවිලි වෙන බවක් නඩු විභාගයේදී ඔහු පෙන්නුවේ නැහැලු. අන්තිමේදී මේ තක්කඩියා අවුරුදු පහළොවකට හිරේට නියමවුණාලු. පරණ පුවත්පත් වලයි මං ඒ විස්තර කියෙව්වේ.

පෙන්ඩිල්ටන්ට හසුළු වුණා කියල චෝදනා ලැබූ කනිෂ්ට ලිපිකරුවෙකුත් හිටියා. අපරාධයට ආධාර හා අනුබල දීම ගැන ඔහුට ලැබිල තියෙනවා අවුරුදු දහයක හිරදඬුවමක්. බැංකුව ගොඩනැගිලි ලීබඩු ආදිය පිටින්ම විකුණා දැමුණා. මුදල් තැන්පත් කළ අයට ඔවුන්ගේ මුදල් වලින් සියයට එකක්වත් ලැබුණේ නැතිලු."

"ඔබ අද දවසපුරා සෑහෙන මහන්සියක් වෙලා තියෙනවා මේ විස්තර හොයාගන්න" මම කීවෙමි. "එත් මේ බැංකුවේ සිද්ධිය, ප්‍රිංගල්ගේ ප්‍රශ්නයට සම්බන්ධ වෙන්නේ කොහොමද කියල මට තේරුම් ගන්න අමාරුයි."

"මම අද හවස් වරුවේ සමර්සෙට් නිවසේ පැය කිහිපයක් ගතකළා" හෝම්ස් කීය. "ඒහෙදි මට කියවන්න ලැබුණා වර්ට්සීනි හමුවුණු මිනියේ කබා සාක්කුවක වයින් මූඩියක් තිබුණු බව....."

"මං හිතන්නේ අපි ඒ හරිය පුවත්පත් වල කියෙව්වා."

"ඔව්. ඒ වයින් බෝතල් මූඩිය යොදා ගන්න ඇත්තේ, ඔහු ළඟ තමාගේ පිහියේ තුඩෙන් තමාව ආරක්ෂා වෙන්න."

"ඔබ කියන්නේ ඔහු මැරුම් කෑ පිහිය ඔහුටම අයිතිව තිබුණු එකක් කියලද?"

"හරියටම හරි. මේ මැරුම් කෑ පුද්ගලයා මිනීමරුවෙක්. ඔහු ආවෙ කවුරුන් හරි ඝාතනය කරන්න. නමුත් ඒ නැනැත්තා මොකද කළේ? සතුරා ළඟ තිබූ පිහිය උදුරාගෙන ඔහුටම ඇන්නා. පුවත්පතේ පළවුණා මේ මැරුම් කෑ මිනිහගේ ඇඳුම් වල, හඳුනාගත හැකි ලේබල් හෝ සාක්කුවල සැහෙන යමක් තිබුණේ නැහැ කියල. ත්‍රස්තවාදී සංවිධානය ඔහුව එව්වේ ඒ විධියට සූදානම් කරල. අපරාධකාරයා එන්නෙ මැරාගෙන මැරෙන්න වුණත් සූදානමෙන්. ඔහු යම් සිද්ධියකින් පොලීසියට අහුවුණොත් ඔහු හා මිනීමරු සංවිධානය අතර සම්බන්ධය ඔප්පුවෙන කිසිම හෝඩුවාවක් ලැබෙන්නේ නෑ."

"ඒකෙන් අපට තවත් දෙයක් හිතාගන්න පුළුවනි" මම කීවෙමි.

"අපරාධය කරන්න එන නැනැත්තා හිතනවා, සමහර විට තමාගේ ජීවිතයත් නැතිවෙන්න පුළුවන් කියල."

"ඔව්. ඒක අපරාධකාරයෙකු හැම විටම මුහුණ දෙන අවදානම් තත්ත්වයක්. සංවිධානයෙන් ඔහුට පැවරුණු කටයුත්ත හරිහැටි ඉටු





කරන්න ඔහු අසමර්ථ වුණා කියමු. එතකොට නායකයින්ගෙන් ඔහුට ලැබෙන්නේ මරණ දඬුවම. ඒ ඝාතකයා දන්නවා. ආ වොට්සන්. අපේ දුම්රිය ස්ටේෂන් එකට ඇවිත් නේද? ඉක්මනින් බහිමු."

කුලීරියක නැගී අපි දීප්තිමත් හිරු එළියෙන් නැහැවුණු ගම්මානය හරහා ගමන්කොට, "ලෝ ලොමසෝ" නිවාසයේ ගේට්ටුව අසලට පැමිණියෙමු. කුලීරියට මුදල් ගෙවා හරවා යැවූ, අපි ගේට්ටුවෙන් ඇතුළු වී ගෙවත්ත මැදින් වැටී තිබූ පාරේ නිවස වෙත ගමන්කළෙමු. ගස්වල කොළ සෙලවෙන තරම් මඳ සුළඟක් වත් නොතිබුණු එවේලේ, මල් පඳුරු දෙසින් ආ සුගන්ධය අපේ සිත්වල ඇතිකළේ ප්‍රබෝධයකි.

අප ඉදිරියෙන් එක මට්ටමට කැපූ තණකොළ සහිත නිල්වන් බිඳල පිහිටා තිබිණි. එහි එක් කෙළවරයක මත සුදු ඇඳුමකින් සැරසුණු කාන්තාවක්, රෙද්දක යම්කිසිවක් ගෙත්තම් කරමින් සිටියාය. අප දැක පුදුමයට පත්වූ ඇය බලාසිටියේ විමසිලිමත් මුහුණෙනි.

"මේ ප්‍රිංගල් මහත්මියද?"

"ඔව්. ඇයි?"

"මගේ නම ෂර්ලොක් හෝම්ස්. ඔබේ පෞද්ගලිකත්වයට බාධාකරමින් මෙහෙම කඩාවැදීම ගැන සමාවෙන්න. නමුත් අපි ආවේ ඉතාම හදිසි කාරණයකට."

"ඔව්. ඒ කාරණය මොකක්ද කියලා වහාම කිව්වොත් හොඳයි" සිටි තැනින් නැගිටි ඇය පැවසුවේ එතරම් කාරුණික ස්වරයකින් නොවේ.

"අපට ඒ හැටි වෙලාවක් නෑ නෝනා."

"කරන්න දෙයක් නැහැ. ඔබ මෙහේට ආවේ කුමකටද කියා කියයුතුමයි."

"හොඳයි මම කියන්නම්" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මට මේ කටයුත්ත භාරදුන්නේ ඔබේ ස්වාමිපුරුෂයා. මෑතකදී ඔහුට මුහුණදෙන්න සිදුවුණු ප්‍රශ්න සමහරක්, විසඳාදීමේ රාජකාරිය ඔහු මට භාරදුන්නා. මට මෙතෙක් දැනගන්න ලැබී ඇති කරුණු වලින් පෙනීයන්නේ, ඔහු බිහිසුණු, මාරාන්තික අවදානමකට මුහුණදී සිටින බව."

"මගේ සැමියා?" ඇය ඇසුවේ කිසිවක් විශ්වාස නොකරන හඬකිනි.

"නෑ ඔබේ සොහොයුරා."

එක්වරම තිගැස්සුණු ඈ, හුස්මක් ඉහළට ගත්තාය. මිළඟට හිස පිටුපසට ගස්සමින් මහ හඬින් සිනාසුණාය.

"ඔබට දැනගන්න ලැබී තිබෙන ඔක්කොම බොහුබුත බවයි පෙනෙන්නේ" ඇය කීවාය. "මට සහෝදරයෙක් ඇත්තෙත් නෑ. සහෝදරියක් ඇත්තෙත් නෑ. ඉතින් අවදානමකට මුහුණදුන් සොහොයුරෙක් ඉන්න තැනැත්තිය මම නම් නොවෙයි."

මෙම ප්‍රකාශයෙන් නොසැලී හෝම්ස් ඇය දෙස බලාගෙනම සිටියේය. "මේක සෙල්ලම් කරන්න වෙලාවක් නෙමෙයි ප්‍රිංගල් මහත්මිය" ඔහු කීවේ උස් හඬෙනි. "ඔබේ සහෝදරයාගේ ජීවිතේ අහිමි කරන්නද ඔබ හදන්නේ?"

"මං කිව්ව නේ මට නැහැ කියලා....."

"ප්‍රිංගල් මහත්මිය. ඔබ මේ ආකාරයට බොරු මවාපෑමක් කරන්නේ ඇයි කියල මට හොඳට තේරුම් ගන්න පුළුවනි." හෝම්ස් ඇගේ කථාවට බාධා කරමින් කීය. "බාගවෙලාවට මම දන්න තොරතුරු හෙළිකළොත්, ඔබ තේරුම් ගනීවි මං කියන්නේ ඇත්තක් බව.

ඔබේ සොහොයුරා ජෝන් ඇලෝසියස් වොඩ්හැම් උපන්නේ 1858 ඔක්තෝබර් 15 වැනිදා, ග්ලොස්ටර්හිදී. 1880 දී ඔහු ගිල්ඩ්ෆර්ඩ් පළාතේ තරුණියක වන හෙලන් මොන්ට්ගොමරි සමඟ විවාහවුණා. ඔහු රැකියාව කළේ කිංග් විලියම් වීථියේ තිබුණු ඇංග්ලෝ-හෙලෙනික් බැංකුවේ. 1882 දී බැංකුව මුහුණදුන් විනාශය- බංකොළොත්වීම ඔබට මතක ඇති. ඒකෙදී ආතර් පෙන්ඩල්ටන් නම් ප්‍රධාන ලිපිකරුණේ වැරැදිකරු බව ඔප්පුවෙලා හිරේ ගියා. ඔහුට ආධාර කිරීම උඩ ඔබේ සොහොයුරා, අවුරුදු දහයකට හිරේට නියමවුණා....."

"..... ඒක මහා අසාධාරණ චෝදනාවක්" ඇය කෑගැසුවේ හැඟීම්බරවය. "ඒක පට්ටපල් [illegible] ඔහු හිරේට නියම කළ ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. [illegible] ඔක්කොම කළේ පෙන්ඩල්ටන්. ඒ අකාතයද මිනිහා සමග මගේ අයියාගේ හිතවත් කමක් තිබුණා. ඒ නිසා පෙන්ඩල්ටන් උගුලේ වැටුණු වෙලේ. අයියා ඔහුට





උදව්කරන්න නැත් කළා. ඒ අකාතයද දුෂ්ට පෙන්ඩල්ටන් මොකද කළේ, මගේ අයියාත් අපරාධයට සම්බන්ධ බව ප්‍රකාශකළා. ඒකෙන් ඔහුට ගැළවී යන්න ක්‍රමයක් තිබුණේ නැහැ. අනුන්ගේ මුදල් වංචාකරලා තමන්ට වාසි ලබන්න මගේ අයියා කවදාවත් හිතුවේ නැහැ. අර දුෂ්ටයා එක වචනයකින් ඇත්ත කීවා නම් මගේ අයියාට බේරෙන්න තිබුණා. නමුත් ගල් හිතක් තිබුණු ඒ තක්කඩියා ඇත්ත වසන් කරලා මගේ අයියාවත් හිරේ යැව්වා."

"ඔබ කියන දේ සත්‍ය බවට මට සැකයක් නැහැ නෝනා" හෝම්ස් කීය. "නමුත් මං මෙහේ ආවෙ ඔබේ සොහොයුරාට චෝදනා කරන්න නෙමෙයි; ඔහුගේ ජීවිතය බේරාගන්න. බන්ධනාගාරයේදී බරපතල ලෙස අසනීප වී සිටීම නිසාත්, අනිවාර්ය දඬුවම් කාලය අවසන් වූ නිසාත්, ඔහු බන්ධනාගාරයෙන් නිදහස් වුණා. ඔහු හිරේ ගියත්, දිගටම තම සැමියා ගැන බලාපොරොත්තු තියාගෙන, ඔහු ගැන කැපවෙලා හිටි ඔහුගේ බිරිඳ, සැමියා නිදහස් වෙන්න ටික දවසකට කලින් මේ ගෙදරට ආවා. ඇය ඔබ සමග කතාබහ කළේ ඇගේ සැමියාගේ තත්ත්වය. නමුත් ඔබේ ඒ කතාබහෙන් කොටසක් ප්‍රිංගල් මහත්මයාට අහම්බෙන් අහන්න ලැබුණා. මේ කතාබහ කෙරෙන්නේ තමා ගැනය කියල ඔහු වරදවා වටහා ගත්තා."

"මාක්ට හැමදෙයක්ම එළිකරන්නයි මට උවමනා වුණේ" ප්‍රිංගල් මහත්මිය කීවාය. "ඒ වුණත් අයියා ඒකට කැමැතිවුණේ නැහැ. ඔහු මට ආයාචනා කළා, කිසිම දෙයක් මාක්ට නොකියන ලෙස. ඔහු කිව්වේ තමාට විඳින්න සිදුවුණු නින්දා අපහාස කිසිදෙයක් තමන්ගේ සොයුරියට වත්, ඇගේ සැමියාටවත් උරුමකරන්න තමන් කැමැති නැති බව. මං ඔහුට අහන්න කිව්වා අපි මේක මාක්ට කියමු කියලා. ඉස්සර කාලෙ සිදුවීම් නොදැනුණත් මාක්ගේ ත්‍යාගශීලි බවෙන් අනවශ්‍ය අයුරින් ප්‍රයෝජනගන්න ජෝන් කැමැතිවුණේ නෑ. ඒ නිසා ඔහු ජීවතුන් අතර සිටිනා බව රහසක් ලෙස තබාගන්න මට සිදුවුණා. මෙපමණ දවසක් මං කටයුතු කළේ ඔහුගේ කැමැත්ත අනුව."

"මට ඒක තේරුම් ගන්න පුළුවනි" හෝම්ස් කීය. "ඒ නිසා ඔහු උද්‍යාන සේවකයා ලෙස මෙහේ පදිංචියට එන්න තීරණය කළා. හොඳ පරිසරයක විවේකීව සිටීමෙන්, ඔහුගේ අසනීප තත්ත්වය හොඳ අතට හැරේවි කියා ඔබ බලාපොරොත්තුවුණා. මං නිවැරදිද?"



www.sinhalaelibrary.com

"ඔව්. ඔබ හරි" ඇය කීවාය. "ඔබ මේවා දැනගත්තේ කොහොමද කියල මම දන්නේ නෑ. නමුත් හැමදෙයක්ම ඔබ දන්නා බවයි පෙනෙන්නේ."

"අවාසනාවකට වගේ කථාව එතැනින් ඉවර නෑ. ඔබේ සොහොයුරා වින්ද සිරදඬුවමෙන් සෑහීමට පත්නොවී ඔහුගෙන් පළිගන්න සූදානම් අයත් ඉන්නවා."

"මහත්මයා. මොනවද ඔබ මේ කියන්නේ? මේ ඇත්තක්ද?" ඇය ඇසුවේ භීතියට පත්වය. "ඔහු කළ ඝෝර ක්‍රියාවට මගේ සොහොයුරා ඕනෑවටත් වඩා දඬුවම් විඳලා අවසන්. ඒ දරුණු මිනිසුන්ට විරුද්ධව කටයුතු කරන්න නීතියටවත් බැරිද?"

"ප්‍රිංගල් මහත්මිය, ඔවුනට අවහිර කරන්න කාටවත් බෑ. ඔවුන්ගේ නීතියට ඇරෙන්න, වෙන කිසිම නීතියකට ඔවුන් හිස නමන්නේ නෑ. ඔබ ඔබේ සොහොයුරා මෙහෙන් ඉවත්කරගත යුතුයි. දැනටමත් ඔහු මරාදැමීමට එක්වරක් උත්සාහ කරල තියෙනවා. දෙවැනි උත්සාහය ඒ තරම් ප්‍රමාදවේවි කියල මං හිතන්නේ නෑ. ඔබට මාව විශ්වාස නෑ නේද? අද උදේ ගඟේ තිබිල හමුවුණු මිනිය ගැන, ඔබ පුවත්පත් වල කියෙව්වේ නැද්ද?"

"කියෙව්වා. නමුත් ඒ පුද්ගලයා නැගෙනහිර යුරෝපයේ කෙනෙක්ලු, නේද?"

"අන්න එහේ ඉඳල තමයි භීෂණය මෙහාට එන්නෙ. ඔබේ අයියාගේ බිරිඳ මෙහේට ඇවිත් ගියාට පස්සෙ, ගබඩා කාමරයක බිත්තියේ, දමපාට අහක තීන්ත සලකුණක් දකින්න ලැබුණා, ඔබට මතකද? ඒක මං කිව මිනිසුන්ගේ වැඩක්. ජෝන් ඇලෝසියස් වොඩ්හැම් හිරෙන් නිදහස් වීමට නියමිත බව ඔවුන් දැනහිටියා. ඒ නිසා ඔහුගේ බිරිඳ තබන හැම පියවරක් ගැනම ඔවුන් හිටියේ සෝදිසියෙන්. ඔවුනුත් ළඟින්ම ඉන්නා බව දැනුම්දීමටයි, බිත්තියේ හස්ත මුද්‍රාව සටහන් කරල ගියේ. ඊළඟට ඔබේ සොයුරු ජෝන් හා ඔහුගේ බිරිඳ අර අලුත්වැඩියා කළ නිවසේ පදිංචියට ආවාම, ඔවුන් යළිත් වරක් අනතුරු අඟවලා ගියා. ඒ, පළිගැනීම ළඟදීම සිදුවෙන බව දැනුම්දෙන්න. ඊයේ රාත්‍රී ඔවුන්ගෙන් අයෙක් ඔබේ ගෙවත්තේ ඇවිද යද්දී හදිසියේම ඔබේ සැමියාට දකින්න ලැබුණා. ඒක නිසයි ප්‍රිංගල් මහත්මයාටත් ඔවුන් අනතුරු ඇඟවීමක් එව්වේ. ඔහු මේ කිසිවක් තේරුම් ගත්තේ නැහැ. නමුත් මේ සංවිධානයේ අය





හිතන්නේ, ඔවුන්ගේ දමපාට හස්ත සටහන, කවුරුත් හඳුනාගන්නවා, ඒකෙන් භීතිය වපුරන්න පුළුවන් කියලයි. මම නම් හිතන්නේ මෙහේට ආව ඝාතකයාට තමන්ගේ වැඩකටයුතු සම්පූර්ණ කරන්න බැරිවුණු නිසයි, ප්‍රිංගල් මහත්මයාගේ ජීවිතය බේරුණේ. මේ අපරාධකාරයින් මනුෂ්‍ය ජීවිතයක වටිනාකම තේරුම්ගත් අය නෙමෙයි."

"ඒ භයානක අපරාධකාරයා මරණයට පත්වුණා නම්, දැන් ඉතින් අපට භයවෙන්න දෙයක් නැහැ නේද?" ප්‍රිංගල් මහත්මිය ඇසුවාය.

"මං හිතන්නේ නෑ ඔහු එංගලන්තයට ආවේ තනියම කියල."

හිරු එළියේ ඇබෑර්ණ සුන්දර මිදුල මැද අපි තිදෙනාම නිහඬව බලාසිටියෙමු. ශර්ලොක් හෝම්ස්ගේ වචන අපේ සිත් වල ඇතිකළේ නැතිගැන්මකි. හෝම්ස් කී දෙය එක්වරම තහවුරු කළේ, බිහිසුණු මිනිසෙකුගේ සිතේ මැවුණු විකාර සිතුවිලි ලෙසය. ලෙටීෂියා ප්‍රිංගල් ඉතා සෙමින් තම හිස දෙපසට සෙලවූවාය. ඒ, ඔහු කී දේ තමාට වැටහී දැන් කළ යුත්තේ කුමක්දැයි තීරණය කරගැනීමට අපහසු වූ අයුරෙනි.

"අප වහාම ක්‍රියාත්මක විය යුතුයි. එහෙම නැතුව මේ උවදුර ඉබේටම ඉවත්වන්නේ නෑ" හෝම්ස් කීය.

"මහත්මයා, මොකක්ද මං මේකට කරන්නේ?"

"ඔබ ඔබේ සොයුරා එංගලන්තයෙන් පිටකළ යුතුයි. එංගලන්තයෙන් පමණක් නොවෙයි මුළු යුරෝපයෙන්ම. අනෙක ඔබ හැමදෙයක්ම ඔබේ සැමියාට කියන්නත් ඕන....."

හෝම්ස් ඔහුගේ වාක්‍යය අවසන් කිරීමටත් පෙර, රන්වන් පැහැති කෙස් කලඹක් තිබූ කාන්තාවක් අප සිටි තැනට කඩාවැදුණාය.

"ලෙටී! ලෙටී!!" ඇය කෑගැසුවාය. "ජෝන් කොහේ ගිහින්ද කියල හොයාගන්න බෑ....."

හෝම්ස් හා මා දුටු වහාම ඇගේ කෑගැසීම නැවතිණි. සිටි තැනම නැවතී ගල්ගැසුණු ඈ දෙපසට පැද්දුණේ, ක්ලාන්ත වීමට යන අයුරෙනි. පියවරක් ඉදිරියට තැබූ හෝම්ස් වහාම ඇගේ අතෙන් අල්ලා ගත්තේය.

"භයවෙන්න දෙයක් නැහැ වොඩ්හැම් මහත්මිය. අපි ඇවිත් ඉන්නේ මිතුරයින් ලෙස."

"ඔව් හෙලන්. මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා."

"හැබෑට? ඔබේ නම මට අහල පුරුදුයි මහත්මයා" වොඩ්හැම් මහත්මිය ඇසුවේ මඳක් යථා තත්ත්වයට පත්වෙමිනි. "මං අහල තියෙනවා ඔබට විසඳන්න බැරි ගැටලුවක් නැහැ කියල. ඒ වුණාට මට හිතෙන්නෙ මේ වෙලාවේ නම් ඔබට කළ හැකි හපන්කමක් නැහැ කියලයි. අද උදේ මට පෙනුණේ මගේ සැමියා බොහොම තදබල ලෙස අසනීප වෙලා වගෙයි. මං ඔහුට ඇඳට වෙලා ඉන්න ඉඩහැරියා. ටික වෙලාවක් මම වලව්ව පාත්තියේ වැඩකරලා දැන් ටිකකට කලින් ගෙට ආවා. එතකොට ඔහු අතුරුදන් වෙලා. මේ ලියුම තිබුණා කුස්සියේ මේසය උඩ."

වෙවුලන අතින් ඇය දුන් ලා නිල් පැහැති කඩදාසිය අතට ගත් හෝම්ස් එහි ලියා තිබූ දේ ශබ්ද නඟා කියෙව්වේය.

මගේ ආදරණීය හෙලන්,

ඔබට මතක ඇති පසුගිය කාලේ අපි දෙන්නා එකිනෙකාගේ සිත්වල ධෛර්යය ඇති කළ හැටි; මගේ හිර දඬුවම ඉවරවුණාට පස්සෙ නරක කාලය සහ ඔක්කොම කරදර ඉවරවේවි; එතකොට අතීතය අමතක කරලා අලුත් ජීවිතයක් පටන්ගන්න අපට හැකිවේවි. එහෙම කියල නේද අපි දෙන්නාටම හිතුණෙ? නමුත් අවාසනාවකට මෙන්! ඒ ඔක්කොම බලාපොරොත්තු හිස් බව දැන් මට පෙනෙනවා. ඇංග්ලෝ-හෙලෙනික් බැංකුවේ මුදල් නැතිකරලා, ඒවා අහිමිවූ සමහරක් අය, තවමත් අප සමඟ ක්‍රෝධයෙන් ඉන්නා බව මට දැනගන්න ලැබුණා. ඒ මුදල් විනාශයට වගකිවයුතුයි කියා ඔවුන් හිතන හැමකෙනෙක්ම මරා දමන තුරු, ඔවුන් සෑහීමකට පත්නොවෙන බවයි මට අහන්න ලැබුණේ. හැරී පෙන්ඩල්ටන් අවුරුදු 3 කට කලින් හිරේදී මැරුණු බව ඔයාට මතක ඇති. දැන් ඔවුන් සම්පූර්ණ පළිගන්න හදන්නේ මගෙන්. ඒක හරිම අසාධාරණයි. නමුත් කරන්න දෙයක් නැහැ. මෙව මෙහෙම වේවිද කියල හැමදාමත් මගේ හිතේ භයක් තිබුණා. මේ ශාපය සහ අවාසනාව මගෙන් ඉවත්වෙලා යාවි කියල මං හැමදාමත් දෙවියන්ට යාච්ඤා කළා. ඊයේ රෑ නින්දට යන්න කලින් මං ගං ඉවුරට වෙලා ඉඳිද්දි එක් ඝාතකයෙක් ආවේ. මගේ දණ, දෙපා කොයිතරම් දුර්වල වුණත්, සටනක් නැතිව ජීවිතේ පාවාදෙන කෙනෙක් නොවෙයි මම!





ඔහු එක්වරම මට පිහියක් එල්ල කළා. නමුත් මට හැකිවුණා ඒකෙන් බේරිලා ඔහුට පහරදෙන්න. ඔහු බිම වැටුණා. ඒත් පිහිය තිබුණේ ඔහුගේ අතේ. ඒක උදුරාගන්න මං ඔහු සමඟ පොරබැදුවා. ඒකෙ ප්‍රතිඵලයක් ලෙස අන්තිමට පිහිය ඔහුගෙ පපුව පසාකරගෙන ගියා. ඔහුගේ මළසිරුර මං ගඟට තල්ලුකර දැම්මා. මේ ගැන මං ඔයාට කිසිම දෙයක් කිව්වෙ නැහැ. මා නිසා ඔබට විඳින්න සිදුවුණු කරදර ප්‍රමාණය අප්‍රමාණයි. ඒ වගේමයි මගේ ආදරණීය සොයුරියටත් ඇගේ සැමියාටත් විඳින්න සිදුවුණු කරදර. දැන් ඉතින් මට යන්න වෙලාව හරි. මේ යක්ෂයින්ට උවමනා කරන්නේ මා පමණයි. මං ඔයාගෙන් ඉවත්වෙලා ගියොත්, ඔයාගේ ජීවිතය පරෙස්සම් වේවි. මේ සිද්ධියට ඔයාගෙන් සමුගැනීම ගැන මට සමාවෙන්න. නමුත් ඔයාට කාරණා තේරුම් කරදී යන්න උත්සාහ කළොත් ඔයා මට කවදාවත් යන්න නොදෙන බව මං දන්නවා.

මේ ඔයාගෙ ආදරණීය සැමියා,

ජෝන්.

"මං දැන් මොකද කරන්නේ?" හෙලන් වොඩ්හැම් මහ හඬින් වැලපීමට පටන්ගත්තාය.

"ඔබ ඔබේ සැමියා අන්තිමට දැක්කේ කොයි වෙලාවෙද?" හෝම්ස් ඇසුවේ ලිපිය ඇය අතට ආපසු දෙමිනි.

"දැන් පැයකට විතර කලින්. ඒ වුණත් එයා ගිහින් හුඟක් වෙලා වෙන්න බෑ. මං ගේ අවටමයි හිටියේ. මං ගෙදරින් ඈතට ගිහින් මිනිත්තු විස්සක් ගතවෙන්න ඇති. ඒ වෙලාවෙ තමයි ඔහු පිටත්වෙලා යන්න ඇත්තෙ."

"ඔහු මේ පැත්තෙ එනවා නම් අපි දැක්කෙ නැහැ." හෝම්ස් කීය. "ඒ කියන්නෙ ඔහු යන්න ඇත්තේ ගං ඉවුර දිගේ. අපි ඉක්මන් කරමු වොට්සන්. අපි බලමු ඔහුගේ මේ මෝඩ ක්‍රියාවෙන් ඔහු වළක්වාගන්න පුළුවන්ද කියල. මේ භයානක මිනිසුන්ට තනියම මුහුණදීලා ජීවිතේ බේරාගන්න ඔහුට අවස්ථාවක් ලැබෙන්නේ නෑ."

අපි දෙදෙනා ගඟ දෙසට දිව ගියෙමු. කාන්තාවෝ අප පසුපස පැමිණියහ. ඔවුන්ගේ නිවස අසලදී ඒ තුළට ගිය හෝම්ස් වහා එළියට ආවේය. මීළඟට අපි ගං ඉවුර දිගේ වැටී තිබුණු පාරේ ඉදිරියට දිවගියෙමු. ගං ඉවුරේ පස, සැර අව්ව නිසා වියළී තිබිණ.



www.sinhalaelibrary.com

එහෙයින් එහි පා සටහනක් කිසිවක් දක්නට නොලැබිණි. අපි ගඟ ඉහළ දෙසට නෙත් යොමුකළෙමු. අඩි සියගණනක් පමණ ඈතින් බිම වැටී සිටි පුද්ගලයෙකු අපට ඈත්තෙන් දක්නට ලැබිණි. හෝම්ස් ඒ දෙසට දිවයද්දී මම ඔහු පසුපස ගියෙමි.

ගං ඉවුරේ ඇදවැටී සිටි තැනැත්තාගේ දිවි ගලවා ගැනීමට කිසිවෙකුට නොහැකි බව තේරුම් ගැනීමට, එක් බැල්මක් ප්‍රමාණවත් විය. ඔහුගේ කපුවෙන් ලේ ගලායමින් තිබූ අතර, ඒ මැද පිහියක එක් වූ මිටක් දක්නට ලැබිණි. සිදුරු කළ කඩදාසියක් පිහියේ මිටේ රඳවා තිබිණි. එහි දම් පැහැති තීන්තෙන් සටහන්ව තිබුණේ ඇඟිලි හයේ අතේ මුද්‍රාවයි. මේ මාක් ප්‍රිංගල්ගේ නොදන් මස්සිනා වූ පුද්ගලාකාර උඳුගත සේවකයා බව මම වටහා ගතිමි.

"කාන්තාවන්ට මෙහාට එන්න දෙන්න එපා" යයි උපදෙස් දුන් මගේ මිතුරා, මිනීමරුවන්ගේ අඩි සටහන් තිබේදැයි දැනගැනීමට පොළොව පරීක්ෂා කළේය. ඉදිරියට ආ කාන්තාවෝ මගේ විරෝධය නොතකා මළ සිරුර අසලටම පැමිණියහ.

අප පිටුපසින් කිසිවෙකු කෑගසන හඬ අසා, මම ඒ දෙසට නෙත් යොමුකළෙමි. මා දුටුවේ අපේ අනුග්‍රාහකයා වූ මාක් ප්‍රිංගල්ය.

"සේවකයා කිව්වා ඔබ මේ පැත්තට ආවා කියල..... දෙවියනේ! මේ මොකද මේ?"

මගේ මිතුරා සිදුවී තිබූ සියල්ල වචන කිහිපයකින් ප්‍රිංගල්ට තේරුම් කර දුන්නේය. මේ තරම් කෙටි කාලයක් තුළ කම්පනයට පත්ව, භීතියෙන් ගල්ගැසුණු පුද්ගලයෙකු මා මීට කලින් දැක නැත. තම බිරිඳගේ සොහොයුරාගේ මළසිරුර දෙස, ඔහු මිනිත්තු කිහිපයක්ම ඇසිපිය නොහෙළා බලා සිටියේය.

"ඔහු ජීවත්ව සිටියා නම් මගේ සෙනෙහස ඔහු වෙත ලැබෙන්න ඉඩ තිබුණා" ප්‍රිංගල් කීය. "ඔව්. අපි මළසිරුර ගෙදරට ගෙනියමු. ජීවත්ව සිටියදී ඔහුට ආගන්තුක සත්කාර කිරීම මම ප්‍රතික්ෂේප කළාට, මියගිය පසු ඔහුට එය ලැබෙනවා."

අප නිවෙසට ගිය පසු හෝම්ස් ඒ ප්‍රදේශයේ සිතියමක් පරීක්ෂා කර බැලුවේය. "මෙන්න මෙතැනදී ගඟේ වංගුවක් තියෙනවා. ඒ නිසා ගඟ ගලන දිශාව වෙනස් වෙනවා. අපි ප්‍රධාන පාරෙන් ගියොත්, මිනීමරුවන් පැනයන්න කලින් අල්ලාගන්න අපට හැකිවේවි." හෝම්ස් කීය.





එහෙත් මේ වාරයේදී නම් හෝම්ස්ගේ උත්සාහය සාර්ථක නොවීය. මිනීමරුවාගේ කිසිදු සලකුණක්, එම පෙදෙසේ දක්නට නොලැබිණ. අයිතිකරුවකු නොමැතිව අත්හැර දමනු ලැබූ කුඩා ඔරුවක්, තේම්ස් ගඟේ එහා ඉවුරේ තිබී පසුව හමුවිය. හවුදුරටත් සොයා බැලීමේදී දැනගන්නට ලැබුණේ, අපරාධකරුවා ඔරුවකින් සරේ ප්‍රාන්තයට එගොඩවී, එතැනින් ලන්ඩන් වෙත පැමිණ, ඉන්පසු ලන්ඩනය වෙත දුම්රියෙන් ගොස් ඇති බවයි.

ෂර්ලොක් හෝම්ස් දුන් විස්තර අනුව, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය විසින්, බටහිර ලන්ඩනයේ ග්‍රීන්ස් හෝටලයේ ලැගුම් ගෙන සිටි සර්බියානු ජාතිකයෙකු අල්ලාගන්නා ලදී. ඔහුට විරුද්ධව ප්‍රමාණවත් තරම් සාක්ෂි සොයාගැනීමට අපහසුවිය. මේ අතර සතුටුදායක ලෙස සාක්ෂි නොමැතිව, තම රටේ වැසියෙකු සිරභාරයේ රඳවාගෙන සිටීමට එරෙහිව එම රටේ තානාපතිවරයා, විදේශ අමාත්‍යංශයට බලපෑම් එල්ලකරන්නට විය. අවසානයේ පොලීසියට සිදුවූයේ, සැකකරු නිදහස් කර යැවීමටයි.

"පැහැදිලි ලෙසම මිනීමරුවෙක් ඔන්න බේරිලා යනවා" හෝම්ස් කීවේ ඒ පිළිබඳ විස්තරය පළවූ පුවත්පත කියවමිනි.

"..... යළිත් එංගලන්තයේ පා නොතැබිය යුතු බවට අනතුරු අඟවා එම සර්බියානු ජාතිකයා ප්‍රංශය බලා යන නෞකාවකින් එංගලන්තයෙන් පිටුවහල් කරන ලදී."

යනුවෙන් පුවත්පතේ අවසන් වගයෙහි සඳහන් විය.

මැලේරියා රෝගයෙන් සම්පූර්ණ සුවය ලැබූ මාක් ප්‍රිංගල් සහ ඔහුගේ බිරිඳ, හෙලන් වොඩ්හැම් මහත්මිය ද සමග ලංකාව බලා පිටත්ව ගිය බව පසුව මට අසන්නට ලැබිණ.

# අතිවිශේෂ දුම්රියේ අභිරහස

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා 1892 වසරේ යෙදුණු අපරාධ පරීක්ෂණ රැසක්ම ඇතිබැව් මගේ සටහන් පරීක්ෂා කිරීමේදී පෙනී යයි. පැරඩෝල් කුටියේ අභිරහස, ඇලුමිනියම් කිහිලි කරුවේ වික්‍රමය, අතිවිශේෂ දුම්රිය පිළිබඳ සිද්ධිය මෙයින් සමහරකි. එකල එංගලන්තයේ පමණක් නොව, යුරෝපය පුරා මහත් ආන්දෝලනයක් ඇති කළ අතිවිශේෂ දුම්රියේ කථාව මුලින් ඔබ වෙත ගෙන ඒම සුදුසු යැයි මම විශ්වාස කරමි.

මා පැඩිංටන්හි පෞද්ගලික වෛද්‍යකම් අභ්‍යාස සැහෙන කාලයක් ගතවී තිබිණි. එහෙත් අදේ කාලයේ මා වෙත පැමිණීමට පුරුදුව සිටියේ රෝගීන් ඉතාම සුළු සංඛ්‍යාවක් පමණි. මුලින් මේ කාලය ගෙවාගැනීමට පුවත්පත් කියවීමේ යෙදුනෙමි. එහෙත් මගේ වටිනා කාලය ඊට වඩා ප්‍රයෝජනවත් ආකාරයකට යෙදවිය හැකි බැව් මට ඉක්මනින්ම පෙනී ගියේය. හෝම්ස් හා මා දීර්ඝ කාලයක් තිස්සේ කළ පරීක්ෂණ කටයුතු වල විස්තර, කථාන්තර ලෙස ලියා තැබීමට ඒ කාලය යෙදවීමට මම තීරණය කළෙමි. මගේ මිත්‍රයා මුල් කාලයේ කළ පරීක්ෂණවල, කෙටි සටහන් අඩංගු දිනපොත් සහ සටහන් පොත් කිහිපයක්ම, මේ වනවිට මා අතට පත්වී තිබිණ. ඒවා විමර්ශනය කරමින් කථාන්තරය මතුකර ගැනීමට, දැඩි උත්සාහයක යෙදිය යුතුවිය.

මා හමුවීමට රෝගියකු නොව අමුත්තෙකු පැමිණ ඇති බැව් මගේ ගෙදිය දන්වා සිටියේ මෙවැනි වෙලාවකයි. මා පුදුමයට පත්කරමින් මගේ ශාලාගාරයට ඇතුළුවූයේ ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ රහස් පරීක්ෂක, අපේ හිතවත් ටෝබියස් ග්‍රෙග්සන්ය.

"වොට්සන් මහත්මයා, ඔබට කරදරයක් කළා නම් කණගාටුයි. මං මේ වැදගත් වැඩකට ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවෙන්න යන ගමන්. දුම්රියෙන් එද්දී මට හිතුණා, පැඩිංටන් දුම්රිය පොළෙන් බැහැලා, ඔබවත් කැඳවාගෙන ගියොත් හොඳයි කියලා." ව්‍යාකූලව සිටි ග්‍රෙග්සන් කීවේ, පුටුවක් ඇද හිඳගනිමිනි.





"මොකද මාවත් කැඳවාගෙනම හෝම්ස් හමුවෙන්න හිතුවෙ? මොකක් හරි ඉතාම වැදගත් පරීක්ෂණයක් ඔබට භාරවෙලාද?" සුරුට්ටු අළු බඳුන ඔහු වෙත ළං කරමින් මම ඇසීමි.

"ගැටලුවක් නම් ලැබිල තියෙනවා" ග්‍රෙග්සන් කීවේ අතේ තිබූ සුරුට්ටුවට දල්වාගෙන පුටුවේ හරිබරි ගැසෙමිනි. "මෙක බොහොම සංකීර්ණ එකක්. මට මේකේ අගක් මුලක් කිසිදෙයක් තේරුම් ගන්න බැහැ. ඒ බව ඔබට කියන්න මං ලැජ්ජාවෙන්නෙ නැහැ. කොයිතරම් ගැටලු සහිතවුණත්, ප්‍රමාද වෙලා හරි හෝම්ස් මහත්මයාගෙන් උදව්ගන්න සිදුවෙනවා. ඒක මට සහතිකයි."

එය මඳ වැඩි සහිත අදහසක් විය. නොපැමිණෙන රෝගීන් වෙනුවෙන් නිවසේ බලා සිටීම, කාලය නාස්තිකර දැමීමක් බව මගේ සිත කියන්නට විය. ග්‍රෙග්සන් මේ ගැටලුව හෝම්ස්ට විස්තර කරද්දීම ඉහි සිටීම, වඩාත් ප්‍රයෝජනවත් වෙනු ඇත. එයට සවස් දී පැයකින් පමණ මඳ ආපසු පැමිණීමට හැකිවෙතැයි, මම අනුමාන කළෙමි. ඒ බැව් මගේ සේවිකාවට ද දැනුම් දී, මම ග්‍රෙග්සන් සමග බේකර් වීථියේ නිවහන වෙත බොහෝ සිටක් වී ගියෙමි.

උදෑසන තේ පානය අවසන් කරමින් සිටි මගේ මිත්‍රයා, ඔහුගේ ප්‍රියතම සංගීත භාණ්ඩය වූ ස්ට්‍රැඩිවේරියස් වයලීනයෙන් තත්සර නංවමින් සිටියේය. ඔහු වාදනය කළේ මෑතකදී අප නැරඹූ නෝමන් නෙරූඩාගේ සංගීත ප්‍රසංගයක වාදන ඛණ්ඩයක් බව, මම හඳුනාගතිමි. හෝම්ස්ගේ මියුරු සංගීත වාදනයට ඉඩදී අපි මිනිත්තු කිහිපයක් නිහඬව සිටියෙමු.

"ඔබගේ පැමිණීම ගැන බොහොම සන්තෝෂයි මහත්වරුනි" හෝම්ස් කීවේ වයලීනය පසෙකින් තබමිනි. "දින දෙක තුනකින් විසඳන්න, මොනම ආකර්ෂණීය ගැටලුවක් එන් ආවෙ නැහැ. ඒ නිසා මගේ හිතට දැනුණේ, මහ අලස බවක්. ග්‍රෙග්සන් නම් ඇවිත් ඉන්නේ මොකක් හරි ගැටලුවක් අරගෙන බවට සැකයක් නැ. නමුත් ඒක මං භාරගන්න කලින් ඒ තරම් සංකීර්ණ, නොපැහැදිලි එකක්ද කියන එක මට හිතාගන්න අමාරුයි."

එය ජූනි මාසය වුවත් අසාමාන්‍ය ලෙස කඩා හැළුණු වර්ෂාව නිසා අපට දැනුණේ සීතල කාලයකි. අඳුනෙන් නැගී සිටි හෝම්ස් විස්කි ඩිකැන්ටරය සහ සෝඩා සයිෆනය අප වෙත ළංකළේය.

"ඇත්තම කියනවා නම්" පොලිස් නිලධාරයා කථාව පටන්ගත්තේ විස්කි ස්වල්පයක් තම වීදුරුවට වත්කර ගනිමිනි. "පසුගිය මාස හය ඇතුළත, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට විසඳන්න බැරිවුණු, ඉතාම සංකීර්ණ ගැටලු හතරක් මං හෝම්ස් මහත්මයා වෙත අරගෙන ආවා. ඒ හැම එකක්ම ඔබතුමා ඉතා සාර්ථකව විසඳාදුන්නා. ස්කොට්ලන්ඩ්යාඩ් එකේ, ලෙස්ට්‍රේඩ් ඇතුළු අපි කවුරුත් ප්‍රසිද්ධියේ ඒ බව කියන්න අකමැති නමුත් සත්‍යය ඒකයි. මං අද මේ ගෙනා ගැටලුව, කලින් ඒවා හැම එකකටම වඩා සංකීර්ණ, ඉතා අභියෝගයක් බවයි මට නම් හිතෙන්නේ. අද දවසට මං මොන තරම් වෙහෙස මහන්සි වුණාද? ඒත් එක අබමල් රේණුවක තරම් දෙයක් මට හොයාගන්න බැරිවුණා." ඔහු කීවේ හිස් වීදුරුව මේසය මත තබා සුරුට්ටුවක් දල්වා ගනිමිනි.

දුම් පැහැති පිටකබායකින් සැරසී සිටි මගේ මිත්‍රයා, ඔහුට සුපුරුදු හාන්සි පුටුවේ වාඩිවී දෑතේ ඇඟිලි තුඩු එකට තබාගත්තේය. අනතුරුව පුටුවේ පිටුපසට හේත්තුවුණු ඔහු දෙනෙත් පියාගත්තේ, ග්‍රෙග්සන්ගේ කථාන්තරයට සවන්දීමට තමා සූදානම් බව හඟවමිනි.

"හෝම්ස් මහත්මයා," ග්‍රෙග්සන් කීය. "මං මේ කියන්න යන කාරණාව සිද්ධවුණේ ඊයේ හවස. ඒක අපට දැනුම්දෙන කොට වෙලාව ඒ එකොළහයි. මං ගිහින් කරුණු විමසුවා මිසක්, ඒවා පිළිවෙළකට සකස් කරගන්න මට ඉඩක් ලැබුණේ නැහැ. නමුත් සිද්ධිය මෙන්න මේකයි.

ඔබ හොඳින් දන්නවා ඇති, බටහිර වෙරළබඩ දුම්රිය මාර්ගයේ දුම්රිය අධිකාරී කාර්යාලය පිහිටා තියෙන්නේ, ලිවර්පූල් දුම්රිය ස්ථානයේ බව. මධ්‍යම ලන්ඩනය හා මේ ප්‍රදේශය අතර කෙරෙන දුම්රිය ධාවනය ගැන කටයුතු සියල්ලක්ම, පාලනය වෙන්නේ ලිවර්පූල් වලින්. එතැන ප්‍රධානියා, එනම් දුම්රිය අධිකාරීවරයා ජේම්ස් බ්ලෑන්ඩ් නම් මහත්මයෙක්. ජූනි මාසේ 3 වැනි දා, ඒ කියන්නේ ඊයේ අපරභාගයේ ඔහු හමුවෙන්න මහත්මයෙක් පැමිණියා, බොහොම කලබලයෙන්. මේ නැනැත්තා දුඹුරු පැහැවුණු සමක් තිබූ, සිරුරෙන් කුඩා, මැදිවයසේ කෙනෙක්. නම ලුවී කරටාල්. තමාව හඳුන්වාදුන් ඔහු, විදේශික පෙනුමක් තිබූ





කෙනෙක්. මේ මහතාගේ පෙනුමේ තවත් එක් විශේෂයක් දකින්න ලැබුණා. ඒ තමයි, කොඳු ඇටයේ ආබාධයක් නිසා යයි සිතිය හැකි විධියට, ඉදිරියට කුදු ගැසුණු ගතියක්. කරටාල් මහත්මයා සමග ඔහුගේ මිත්‍රයෙක් හෝ උපකාරයෙක් යයි සිතිය හැකි, තවත් කෙනෙක් සිටියා. ඔහුගේ නමක් සඳහන් නොවුණත්, ඔහුත් විදේශිකයෙක් බව පැහැදිලිවම පෙනුණා. හැසිරීමෙන් හා ඇඳුමෙන් පැළඳුමෙන් සිතාගත හැකිවුණේ, ඔහු ස්පාඤ්ඤ හෝ දකුණු ඇමරිකානු ජාතිකයෙක් විය හැකි බවයි. නමුත් ඔහු කරටාල් මහත්මයා මෙන් නොව, උසින් මහතින් වැඩි, හැඩි දැඩි පුද්ගලයෙක්. ඔහුගේ දැකිය හැකි තවත් විශේෂත්වයක් තිබුණා. ඒ තමයි ඔහුගේ වම් අතේ, පෙට්ටියක හැඩය ගත් තරමක හම්බෑගයක් තිබුණා. දුම්රිය කාර්යාලයේ සේවය කරන ලිපිකරුවෙකුට, තවත් සුවිශේෂ කරුණක් දකින්න ලැබී තිබුණා. ඒ තමයි, අර හැඩිදැඩි මහත්මයා රැගෙන සිටි හම්බෑගය, සම්පටියකින් ඔහුගේ මැණික් කටුවට ගැටගසා ඇතිබව. ඒ වෙලාවේ මේ කරුණේ වැදගත්කමක් නොදුටුවත්, පසුව ඇතිවුණු සිදුවීම් වලට, මෙහි සම්බන්ධ කමක් තිබෙන්න පුළුවන් බව හැඟෙනවා. තමන්ගේ මිත්‍රයා එළියේ රැඳී සිටියදී කරටාල් මහත්මයා, දුම්රිය අධිකාරී කාර්යාලය ඇතුළට කැඳවාගෙන යනු ලැබුවා.

"මහත්මයා" කරටාල් මහතා කීවා. "මම දකුණු ඇමරිකාවේ ඉඳන් නැවෙන් ඇවිත්, ලිවර්පූල් වරායට ළඟාවුණේ අපරභාගයේ. මගේ බලාපොරොත්තුව තිබුණේ ලන්ඩනය බලා යන ශීඝ්‍රගාමී දුම්රිය අල්ලාගන්නයි. නමුත් නැවේ ප්‍රමාදය නිසා, මට ඒක වැරදුණා. වැදගත් කටයුත්තක් සඳහා මම ඉතාම ඉක්මනින් පැරිසියට යා යුතුයි. ඒ නිසා කරුණාකර මට ලන්ඩනය වෙතට විශේෂ දුම්රියක් ලබාදෙන්න. ඒ සඳහා ඔබට කැමැති මුදලක් අයකරන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. අනවශ්‍ය ප්‍රමාදවීම් නොමැතිව හැකි වහාම, මගේ ප්‍රවාහන සේවාව සලසා දිය හැකිනම්, මං ඔබට අතිශයින්ම කෘතඥ වෙනවා."

දුම්රිය අධිකාරීවරයා සීනුව නාද කරලා ධාවන කළමනාකරු වන පොටර් හුඩ් මහතා එතැනට කැඳෙව්වා. ලන්ඩන් බලායන විශේෂ දුම්රියක් සැලසුම් කරන්න, ඔවුනට ගතවුණේ මිනිත්තු පහයි. මෙම දුම්රිය තවත් මිනිත්තු හතළිස් පහකින්, ඒ කියන්නේ

සවස 4.31 ට පිටත් කිරීමට හැකි බව ඔවුන් කරටාල් මහත්මයාට දැනුම්දුන්නා. මෙම අමතර පැය තුන්කාලක කාලය අවශ්‍ය වුණේ, ලන්ඩන් දක්වා ඇති දුම්රිය මාර්ගය වෙනත් දුම්රිය වලින් නිදහස් කරගන්න.

මේ සඳහා ගෙවීමට නියම වූ මුදල, පවුම පනස්පහයි සිලිං පහයි. ඔවුන්ගෙන් අයකෙරුණේ, විශේෂ දුම්රියක් යෙදීමේදී හැතැක්මකට අයකරන සිලිං පහේ ගාස්තුවමයි. මේ ගමන සඳහා රොච්ඩේල් නම් අධිවේගී එන්ජිමක් යොදා ගැනීමට, දුම්රිය අධිකාරී තීරණය කළා. එන්ජිමේ අංකය 247. මෙයට දුම්රිය මැදිරි දෙකක් සහ ගාඩ්වරයාගේ මැදිරිය, පිටුපසින් සම්බන්ධ කළා. මගීන් දෙදෙනාගේ ගමනට එක මැදිරියක් හොඳටම ප්‍රමාණවත්. නමුත් අමතර මැදිරියක් ඈඳුණේ, සැහැල්ලු දුම්රිය වේගයෙන් ගමන් කිරීමේදී ඇතිවිය හැකි දෝලනය අඩුකිරීමටයි.

මෙම දුම්රියට අනුයුක්ත කෙරුණු ගාඩ්වරයා වුණේ ජේම්ස් මැක්ෆර්සන්. ඔහු මේ දුම්රිය සමාගමේ අවුරුදු ගණනක් සේවය කර පළපුරුදු අයෙක්. නමුත් එන්ජිමේ ගල්අඟුරු දමන සේවකයා- ෆයර්මන් අලුත් කෙනෙක්. ඔහුගේ නම විලියම් ස්මිත්.

විශේෂ දුම්රියේ ගමනට කටයුතු සූදානම් කෙරෙන අතරේ, කරටාල් මහත්මයාත්, ඔහුගේ මිතුරාත් හිටියේ බොහොම නොඉවසිල්ලෙන්. තමන්ට නියමිත මැදිරියේ වහාම අසුන් ගැනීමට සළස්වන මෙන් ඔවුන් ඉල්ලා සිටියා. ගමන පිටත්වීමට තවත් පැයකට කිට්ටු කාලයක් ඇති බව මතක් කර දෙමින්, දුම්රිය පොළේ නිලධරයන් මේ දෙදෙනාට මැදිරියට නැගීමට සැලැස්සුවා.

මේ අතරේ, ඉතාම කලාතුරකින් අහන්න ලැබෙන තාලේ අහඹු සිදුවීමකට, දුම්රියපොළේ නිලධරයන් මුහුණ දුන්නා. ලිවර්පූල් වගේ වෙළඳ ව්‍යාපාර බහුලව සිදුවන නගරයක, ලන්ඩනයට විශේෂ දුම්රියක් ඉල්ලා සිටීම එතරම් දුර්ලභ සිදුවීමක් නෙමෙයි. නමුත් එකම දවසක, එකම හවස් යාමයක, තවත් කෙනෙක් තවත් විශේෂ දුම්රියක් ඉල්ලා සිටියොත්? ඒක නම් මෙතෙක් කවදාවත්ම සිදුවී නැති එකක්.

කරටාල් මහත්මයා අධිකාරිවරයාගේ කාර්යාලයෙන් පිටවී ගිය වහාම, තවත් මහත්මයෙක් ඇතුළට ආවා. ඔහු තමාව හඳුන්වා දුන්නේ හොරේස් මුවර් යන නමින් ඔහුගේ තිබුණේ හමුදා නිලධරයකුගේ පෙනුම.





"මහත්මයා" ඔහු කීවා, "මට මේ මොහොතෙම ලන්ඩන් බලා යන්න විශේෂ දුම්රියක් උවමනායි."

"අපි කොහොමද ඒක කරන්නෙ? දැනටමත් අපි....."

"එය කෙසේ හෝ කළ යුතුයි මහත්මයා" අමුත්තා කිව්වා. "මගේ බිරිඳ බරපතල රෝගයකට ගොදුරු වෙලා. ඇය ඉතාම අසාධ්‍ය තත්ත්වයෙන් ලන්ඩනයේ රෝහලකට ඇතුළත් කරලා. එක මොහොතක් හෝ ප්‍රමාද නොවී මං වහාම ලන්ඩනය බලා පිටත්වී යා යුතුයි. ඔබ කැමැති මුදලක් අයකරගන්න."

"මහත්මයා" බ්ලෑන්ඩ් මහතා පිළිතුරු දුන්නා. "දැන් ටිකකට කලින් ආව මහත්මයාට අපි විශේෂ දුම්රියක් දුන්නා. ඒක හතරයි තිස්එකට පිටත්වෙනවා. ඒකෙන් අපේ දුම්රිය කාලසටහන දැනටමත් සෑහෙන තරම් අවුල්වෙලා. තවත් විශේෂ දුම්රියක් නම් කොහොමටවත් දෙන්න හැටියක් නැහැ. ඔබ කැමැති නම් මෙහෙම දෙයක් කරන්න හැකිවේවි. අර කරටාල් මහත්මයා සහ ඔහුගේ මිතුරා යන දුම්රියේ, අනෙක් මැදිරියේ ඔබටත් යෑමට හැකිවේවි."

"හොඳයි. මං කැමැතියි. අහලා බලන්න ඔහු කැමතිද කියල මාව ඒ දුම්රියේ ගෙනියන්න?"

"මං හිතන්නේ නෑ ඔහුට අකමැති වෙන්න හේතුවක් ඇති කියල. කොහොම වුණත් මං අපේ ධාවන කළමනාකාරයා යවල හොයල බලන්නම්" බ්ලෑන්ඩ් මහතා කිව්වා.

ධාවන කළමනාකාර පොටර් හුඩ් ආපහු ආවේ සතුටුදායක ආරංචියක් අරගෙන නෙමෙයි.

"මං කරටාල් මහත්මයාගෙන් ඇහුවා" හුඩ් කිව්වා. "ඔහුවත් ඔහුගේ මිතුරාවත්, කොහොමටවත් ඒ වැඩේට කැමැති නැහැ. මං ඔහුට ආයාචනා කළා. මුදල් ගෙවන්නම් කීවා. මුවර් මහත්මයාගේ බිරිඳගේ අසාධ්‍ය තත්ත්වය ගැන කියලා සලකා බලන්න කිව්වා. නමුත් කරටාල් මහත්මයා ඒක සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළා."

මේක ඇහැව්ව හොරේස් මුවර් දුම්රිය පොළෙන් පිටවී යන්න තීරණය කළේ බොහොම කණගාටුවෙන්. ඊළඟට ලන්ඩනයට යන දුම්රිය තිබුණේ හවස 6ට. ඒකත් මන්දගාමී දුම්රියක්.

ලිවර්පූල් දුම්රියපොළේ වේලාවෙන් හරියටම හවස 4.31 ට කරටාල් සහ ඔහුගේ මිතුරා යන විශේෂ දුම්රිය පිටත්වී ගියා. ලිවර්පූල් සිට මැන්චෙස්ටර් දක්වා ශීඝ්‍රගාමීව යන දුම්රියකට

www.sinhalaelibrary.com

ගතවෙන්නේ පැය එකහමාරකට අඩු කාලයක්. ඒ නිසා සවස 6 ට විශේෂ දුම්රිය මැංචෙස්ටර් පසු කර යා යුතුයි. නමුත් 6.15 වන තුරුත් විශේෂ දුම්රිය මැංචෙස්ටර් වෙත ආවේ නැහැ. එහි නිලධරයන් මේ ගැන දන්වලා ලිවර්පූල් දුම්රියපොළට විදුලි පුවතක් එව්වා. ඒකෙන් ඔවුන් මහත් කලබලයට පත්වුණා. සිදුවෙලා තියෙන්නේ මොකක්ද කියලා ඔවුනට හිතාගන්න බැරිවුණා. යම් හෙයකින් මාර්ගය අවහිරවීමක් වෙලා, විශේෂ දුම්රිය අතරමග නතරවෙලාද? මේ ගැන හොයා බලන්න ඔවුන් ලිවර්පූල් සහ මැංචෙස්ටර් අතර පිහිටි සාන්ත හෙලන් නම් කුඩා දුම්රියපොළෙන් විමසීමක් කළා මෙන්න ඔවුනට ලැබුණු පිළිතුර.

"ජේම්ස් බ්ලෑන්ඩ් වෙත. ලිවර්පූල් සිට ආ විශේෂ දුම්රිය 4.52 ට (නියමිත වෙලාවට) මෙතැන පසුකර ගියා.

සාන්ත හෙලන්ස්."

එම විදුලිපුවත ලිවර්පූල් වෙත ලැබුණේ 6.40ට ඔවුනට 6.50 ට මැංචෙස්ටර් වලින් තවත් විදුලිපුවතක් ලැබුණා.

"ඔබ එවූ විශේෂ දුම්රිය ගැන කිසිදු සලකුණක් නැත."

ඊට මිනිත්තු 10 කට පස්සේ රෑ 7ට මැංචෙස්ටර් වලින් තුන්වැනි විදුලි පුවතත් ආවා.

"ඔබ එවූ විශේෂ දුම්රිය ධාවනයේදී විශාල වැරැද්දක් සිදුවී ඇති බැව් පෙනේ. විශේෂ දුම්රිය ඔවුන් පසුකර ගියාට පසු, ඔබ එවූ මන්දගාමී දුම්රිය මේ දැන් පැමිණියා. ඔවුන් විශේෂ දුම්රිය දැක නැහැ. කළ යුත්තේ කුමක්දැයි දන්වන්න."

කාරණා කටයුතු මහා පුදුමාකාර මුහුණුවරක් ගෙන ඇති බැව් කාටත් පෙනුණා. අන්තිමට ආ විදුලි පුවත එක් අතකින් ඔවුනට සැනසීමට කරුණක් වුණා. විශේෂ දුම්රිය මගදී අනතුරකට ලක්වී නොමැති බව එයින් තහවුරු වුණා. එහෙම අනතුරකට ලක්වුණා නම්, සෙමින් ගිය දුම්රියේ රියැදුරාට එය නොපෙනී යන්න හැටියක් නෑ. එහෙම නම් සිදුවී තිබුණේ මොකක්ද? කුමන හෝ හේතුවක් නිසා, සෙමින් ගිය දුම්රියට යාමට ඉඩදී, විශේෂ දුම්රිය ප්‍රධාන මාර්ගයෙන් ඉවතට ගියාද? කුඩා අලුත්වැඩියාවක් කරගන්න තිබුණා නම් එහෙම දෙයක් වෙන්නත් පුළුවන්.





මීළඟට නිලධරයන් මෙහෙම තීරණයක් ගත්තා. විශේෂ දුම්රිය දකින්නට ලැබුණු සාන්ත හෙලන්ස් සිට, එය නොපැමිණි මැංචෙස්ටර් දක්වා කුඩා දුම්රියපොළ හැම එකකටම විදුලිපුවත බැගින් වහාම යවන්න ඔවුන් තීරණය කළා. ඒ යැවූ පිළිවෙළටම පිළිතුරුත් ලැබුණා. සාන්ත හෙලන්ස් පැත්තේ කෙළවරේ සිට ඒවා ලැබුණේ මෙහෙමයි.

"විශේෂ දුම්රිය සවස 5.00ට මෙතැනින් ගියා.

-කොලින්ස් ග්‍රීන්"

"විශේෂ දුම්රිය සවස 5.06ට මෙතැන පසුකර ගියා

-අර්ල්ස්ටවුන්."

"විශේෂ දුම්රිය 5.20ට ගියා

-කෙන්යොන් හන්දිය."

"විශේෂ දුම්රියක් මෙහෙන් ආවේ නැහැ

-බාටන් මොස්"

අතිශයින්ම පුදුමයට පත් නිලධරයන් දෙදෙනා මුහුණට මුහුණ බලාගෙන තත්පර කිහිපයක් සිටියා.

"මං අවුරුදු 30ක් දුම්රිය සේවයේ රක්සාව කරල තියෙනවා. මේ වගේ දෙයක් මගේ ජීවිතේටම අහල නැහැ." බ්ලෑන්ඩ් මහතාට කියැවුණා. "මෙහෙම දෙයක් වෙන්න කොහොමටවත් හැකියාවක් නැහැ. ඒ වුණත් කෙන්යොන් හන්දිය හා බාටන් මොස් අතර විශාල වැරැද්දක් සිදුවී ඇති බව පැහැදිලියි."

"නමුත් කෙන්යොන් පහුකළාම, අමතර දුම්රිය මාර්ග කිසිම පැත්තකට නැහැ" හුඩ් පැවසුවා. "කෝච්චිය පීලි පැන්නොත් මිසක් වෙන යන්න කොහේවත් තැනක් නැහැ."

"නමුත් එහෙම පීලි පැන්නා නම් එක මාර්ගයේම ගිය මන්දගාමී දුම්රිය කොහොමද කිසිම දෙයක් නුදුටුවේ?"

"මේකට වෙනත් විසඳුමක් නෑ, බ්ලෑන්ඩ් මහත්මයා. අපි වැඩිදුර විස්තර අහල මැංචෙස්ටර් වෙත විදුලි පුවතක් යවමු. ඊට අමතරව කෙන්යොන් හන්දියේ සිට බාටන් මොස් දක්වා දුම්රිය මාර්ගය පරීක්ෂා කිරීමට සේවක කණ්ඩායමක් යවන්න නියමකරමු" හුඩ් යෝජනා කළා.

www.sinhalaelibrary.com




ලිවර්පූල් සහ මැංචෙස්ටර් අතර තුබූ දුම්රිය ස්ථාන පිහිටි අයුරු




දුම්රිය අනතුරුදන් වූ ප්‍රදේශයේ විස්තර සිතියම





පළමු විදුලිපුවතට පිළිතුරු මෙහින්තු කිහිපයකින් ලැබුණා.

"විශේෂ දුම්රිය ගැන තවමත් කිසිදු ආරංචියක් නැත. කෙන්යොන් හා බාටන් මොස් අතර කිසිදු අනතුරක් සිදුවී නැති බවට, මන්දගාමී දුම්රියේ රියැදුරා හා ගාඩ්වරයා සහතික වෙති.

-මැංචෙස්ටර්."

"ඔය රියැදුරා සහ ගාඩ්වරයාගේ අස්කරල දාන්න ඕන" බිලැන්ඩ් මහත්මයා කිව්වෙ තරහෙන්. "විශේෂ දුම්රිය පැහැදිලිවම පීල්ලෙන් ඉවතට පැනල අනතුරට ලක්වෙලා. නමුත් මේ දෙන්න ඒක දකල නැති හැටි. පළමු පුවත ආව භාගයක් යන්න කලින් ඔය ගැන විස්තර ලැබෙන්නෙත් නැද්ද කියල."

කෙන්යොන් හන්දියේ දුම්රිය ස්ථානාධිපති එවූ විදුලි පුවත, පැය භාගයක් යන්න කලින් ලිවර්පූල් ඉවත ලඟාවුණා.

"අනතුරුදන් වූ දුම්රිය ගැන කිසිදු සලකුණක් නැහැ. එය මෙතැන පසුකර ගිය බවට අපට සහතිකයි. නමුත් බාටන් මොස් වෙත පැමිණ නැහැ. මඟ දුම්රිය එන්ජිමක නැගී බාටන් මොස් දක්වා පෞද්ගලිකව ගියා. රේල් පාරේ අමුත්තක්, පරද්දක් කිසිවක් නැහැ. අනතුරක් සිදුවූ බවට සලකුණක් නැහැ.

දුම්රිය ස්ථානාධිපති

කෙනයොන් හන්දිය."

"මේක නම් මහ පුදුමාකාර පිස්සු කථාවක් හුඩ්" බිලැන්ඩ්ට කෑගැසුණා. "මේ එංගලන්තයේ දුම්රියක් කොහොමද මහ දවාලේ අතුරුදන් වෙන්නේ? මොකෝ වාෂ්ප වෙලා අහසට ගියාද? වාත්තු යකඩ දුම්රිය එන්ජිම, මැදිරි දෙකක් ගාඩ් මැදිරිය, මනුස්සයින් පස් දෙනෙක්. මේ හැමදෙයක්ම දුම්රිය පාරේ අතුරුදන් වෙලා! මේක වෙන්න පුළුවන් වැඩක්ද? තව පැයක් යන්න කලින් සතුටුදායක පිළිතුරක් නොලැබුණොත්, මම ම ගිහින් සොයා සොදිසි කරල බලන්න."

ඉතින් හෝම්ස් මහත්මයා, ඔවුන් දුම්රිය මාර්ගය සෝදිසි කරමින්, ලිවර්පූල් සිට මැංචෙස්ටර් දක්වාත්, එතැනින් ඉදිරියටත් පැමිණියා. නමුත් විශේෂ දුම්රියවත්, එහි ගමන්ගත් පුද්ගලයන්වත් ඔවුනට දකින්න ලැබුණේ නැහැ. ජේම්ස් බිලැන්ඩ් ලිවර්පූල් පොලීසියට කළ පැමිණිල්ලක් අනුව, ඔවුන් ස්කොට්ලන්ඩ්යාඩ් වෙත දැන්නුවා. මං ඊයේ රාත්‍රියේම එහි ගියා. මට දැනගන්න ලැබුණු සම්පූර්ණ විස්තරය තමා මං ඔබට කිව්වේ."



www.sinhalaelibrary.com
Reading Purpose Only, Not For Print

ටෝබියස් ෆෙග්සන් නම කිසාව භාර කළේය.

මිනිත්තු කිහිපයක් යනතුරු අප සිටි කාමරය තුළ දැඩි නිහඬතාවයක් පැවතිණි. දැස් පියාගෙන කථාවට සවන්දුන් හෝම්ස් වරින්වර නම සටහන් පොතේ කරුණු සටහන් කරගත් ආකාරය මම දුටුවෙමි.

"දුම්රිය අධිකාරිවරයාගෙන් ඔබට දැනගන්න ලැබුණු කරුණු වලට අමතරව, ඔබ කාගෙන් හෝ ප්‍රශ්න කරල බැලුවද?" හෝම්ස් ඇසීය.

"එහෙම ඇහුවේ නම් නැහැ හෝම්ස් මහත්මයා. නමුත් කාටත් කියන්න තියෙන්නේ ඔය විස්තරය තමා."

"ඔබ කෙන්යොන් සිට බාටන් මොස් දක්වා දුම්රියමාර්ගය පරීක්ෂා කරල බැලුවේ නැද්ද?"

"දුම්රිය නිලධරයන් එසේ කළ බව කිව් නිසා, මම ඒ ගැන හොයා බලන්න හිතුවේ නැහැ," ෆෙග්සන් කීය. "නමුත් මේ දුම්රිය සමාගමේ රහස් පරීක්ෂක කොලින්ස් අද උදෑසනින්ම වැඩකටයුතු පටන්ගන්නවා. ඔහු හට කණ්ඩායමක් අරගෙන ගිහින්, මග දිගටම සෝදිසි කරන්න බලාපොරොත්තු වෙනවා. අලුත් යමක් සොයාගත්තොත්, ඔබේ ලිපිනය භාරේ විදුලි පුවතකින් දැනුම්දෙන්න කියල මං නියමකළා. එහෙම යමක් සොයාගත්තා නම් තව පැය දෙකක් යද්දි අපට තොරතුරු ලැබේවි."

"ඔවුන් ඒ කටයුත්ත නිසි අන්දමින් ඉටුකරනවා නම් හෝඩුවාවක් රැසක් හොයාගැනීමට හැකිවිය යුතුයි" හෝම්ස් ප්‍රකාශ කළේය. "මැදිරි තුනක් ඈඳුණු දුම්රිය එන්ජිමක්, පොළොවේ කිසිම ලකුණක් ඉතිරි නොකර, අහසින් පියාඹා යාවි කියල මම නම් හිතන්නේ නෑ. සෝදිසිය හරිහැටි කෙරුණොත්....."

හෝම්ස්ගේ කථාවට බාධාකරමින් හඩ්සන් මහත්මිය විසිත්ත කාමරය වෙත පැමිණියාය. ඇය අතේ විදුලිපුවතක් විය.

"ඔය තියෙන්නේ මං කිව්වෙ නැද්ද. ඕක නම් කොලින්ස්ගෙන්. මං ඇරල බලන්නම් හෝම්ස් මහත්මයා."

"විශේෂ දුම්රියේ රියැදුරු ජෝන් ස්ලේටර්ගේ මළසිරුර, කෙන්යොන් සිට බාටන් මොස් දක්වා මාර්ගයේ සැතපුම් දෙකයි කාලක් ඉදිරියෙන් පෙවිලි සමීපයේ තිබී හමුවිණි. පොළොව සෝදිසි කළත් අතුරුදන්වූ දුම්රියේ සලකුණක් නැත.

කොලින්ස්."





"දෙයියන්ට ඔප්පුවෙච්චාවේ!" ෆෙග්සන්ට කෑගැසිණි. "ඔන්න මරණයකුත් සිද්ධවෙලා. රියැදුරා මරාදමලා, දුම්රිය මංකොල්ල කාගෙන ගිහින්. ඕක අර කැරටාල්ගෙයි ඔහුගේ මිත්‍රයාගෙයි වැඩක්. ..... ඒත් දෙවියනේ කොහේද?"

අවසන් වාක්‍යය කියද්දී ෆෙග්සන්ගේ කටහඬ ශබ්දය අඩුවී ගියේය. එයින් පැවසුණේ ඔහුගේ පරාජය බව මම වටහා ගතිමි.

"වොට්සන්" හෝම්ස් කීවේ අසුනෙන් නැගිටිමිනි. "යන්න තිබෙන පළමු දුම්රියෙන්ම අපි ඒ ප්‍රදේශයට යා යුතුයි. මිනිත්තු පහකින් මං සූදානම්. අපි දුම්රියපොළට යන අතරේ, ස්ටැම්ෆඩ් වෙතින් ඔය ප්‍රදේශයේ සිතියමකුත් රැගෙන යායුතුයි. ඒ අතරේ ඔබේ බිරිඳට ලියුම් කෑල්ලක් යවන්න ඔබට වෙලා තියේවි."

පැය කාලක් ගතවෙද්දී, බටහිර මුහුදුබඩ දුම්රිය මාර්ගයේ ගමන් කරන ශීඝ්‍රගාමී දුම්රියක් අල්ලාගැනීමට අපට හැකිවිය. දුම්රිය පොළේදී පුවත්පත් රාශියක්ම මිලදී ගෙන මම එකින් එක පෙරළා බැලුවෙමි.

එදින උදයේ පළවූ පුවත්පත් වල, මෙම සිද්ධියට එතරම් වැදගත් තැනක් ලැබී තිබුණේ නැත. මාධ්‍යවේදීන් පැවසූ අන්දමට, බ්‍රිතාන්‍ය ආණ්ඩුව මුහුණපා සිටියේ දැඩි දේශපාලන අර්බුදයකටයි. ප්‍රංශයේ පැරිස් නුවර තත්ත්වය ඊටත් වඩා බරපතල විය. ප්‍රංශ ආණ්ඩුවේ ඇති ඇමැතිවරුන් රැසක් එක්වී තුළ ඝෝර ජාවාරමක් හෙළිදරව් වෙමින් තිබිණි. එයින් ඇතිවූ මහා ආන්දෝලනයෙන්, රජය පෙරළී යන තත්ත්වයක් උදාවිය. මහජනයාගේ අවධානය යොමුවූයේ මේ කලබැගෑනි වෙතයි. දුම්රියක් අතුරුදන්වූ පුවත කවුදෝ ගෙතූ බොරුවක් බව පුවත්පත් කිහිපයකම සඳහන් විය.

දුම්රියේදී මග දිගටම මම පුවත්පත් කියවීමට කාලය ගතකළෙමි. එහෙත් එම සම්පූර්ණ කාලයම මිලයේ මිත්‍යා ගතකළේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සැකසූ, කෙන්යොන්- බාටන් මොස් අතර ප්‍රදේශයේ විස්තර සහිත සිතියම අධ්‍යයනය කිරීම සඳහායි.

"ඔබට ඕනෙද අද පුවත්පත්?" හෝම්ස් සිතියම පරීක්ෂා කර අවසන් බව දුටු මම ඇසීමි.

"එපා. මම දැන් සිතියම අධ්‍යයනය කරලා, අවශ්‍ය කරුණු හැම එකක්ම නිසි පිළිවෙළට මගේ මොළයේ තැන්පත් කරගෙන ඉන්නෙ." ඔහු කීවේ සිනියම ගකුළමිනි. "පුවත්පත් වල තිබෙන

දේවල් කියෙව්වොත් දුන්ඕගේ මොළය අවුල්වෙනවා. ඒක තමයි මං කරගන්න අකමැතිම දේ.

ෆ්‍රෙග්සන්, සමහරවිට අපට මේ පැත්තෙ දවසක් දෙකක් නවාතැන් ගන්න සිදුවෙන්න පුළුවනි. ඒකට සුදුසු තැනක් මේ අවට තියෙනවද? සිතියමේ නම් එහෙම දෙයක් ලකුණු කරලා නැහැ."

"ඇයි හෝම්ස් මහත්මයා, කෙන්යොන් දුම්රියපොළ කිට්ටුවම තමයි කෙන්යොන් ජලාශය තියෙන්නේ" ෆ්‍රෙග්සන් කීය. "ඒකෙ ඉවුරේ මැනකදී ගොඩනැගූ "ද වයිගන්" නම් හෝටලයක් තියෙනවා. ඒකෙ කාමර වෙන්කරගැනීම අසහසුවෙන්නෙ නෑ."

"මෙම අභිරහස සොයා බලන්න කලින්,'අපි මේ අවට ප්‍රදේශය ගැන යම් වැටහීමක් ලබාගතයුතුයි." හෝම්ස් කීවේ සිතියම යළිත් දිගහැර එයට ඇඟිල්ල දිගුකරමිනි. "දුම්රිය අතුරුදන් වූ මෙම ප්‍රදේශය, බොහොම කාලයක සිට කර්මාන්ත ක්ෂෙත්‍රයේ වැදගත් අඩවියක්. හැමතැනකම වගේ යකඩ ඉල්ලම් හාරන පතල්, ඒ ඉල්ලම් උණුකර අමු යකඩ-සාදන විශාල කර්මාන්ත ශාලා සහ ගල් අඟුරු ආකර රාශියක් තිබෙනවා.

මෙවායින් පැරණි යකඩ කම්හල් කීපයක් අග ගල් අඟුරු ආකර කිහිපයක් වසාදමලා. නමුත් තවමත් ඒ කටයුතු කෙරෙන තැන් එසේම තියෙනවා.

මෙම අක්‍රිය සහ සක්‍රිය කම්හල් ආකර වල සිට, ප්‍රධාන දුම්රිය මාර්ගයට සම්බන්ධ වෙන, රේල් පීලි දමූ අතුරු පාරවල් දොළහක් විතර තියෙනවා. නමුත් මේ වෙලාවේ ඒවායින් සමහරක් අපට නොසලකා හරින්න පුළුවනි. ඒ මොකද ඒවා, රේල්පීලි දෙක ළංව පිහිටි පටු දුම්රියමාර්ග. මීට අමතරව සාමාන්‍ය- ඒ කියන්නේ පළලෙන් වැඩි දුම්රිය මාර්ග ඇති තැන් හතක් සිතියමේ සඳහන්ව තියෙනවා. ඒවාත් ප්‍රධාන දුම්රිය මාර්ගයට කලකට ඉහත සම්බන්ධව තිබුණා. තැන්නම් දැනටත් සම්බන්ධයි. මේ අතුරු පාරවල් ඒ අයුරින් සකස් කරලා තියෙන්නේ, ආකර වලින් හාරා ගන්නා ගල් අඟුරු ප්‍රමාදයකින් තොරව බෙදාහැරීමේ මධ්‍යස්ථාන සඳහා එවන්න. මේ හැම එකක්ම දිශගත් සැතපුම් කිහිපයකට නොවැඩි ඒවා. මේ හතෙන් හතරක් සම්බන්ධ වෙලා තියෙන්නේ, දැන් ගල් අඟුරු කැඩීම අත්හැර දමා ඇති ගල් අඟුරු ආකරවලට. ඒවා නමයි, රෙඩ්ගෝන්ලට, හීරෝ, ස්ලැව් සහ හාට්සීස් නම් පතල්.





හාට්සීස් පතල දැනට අවුරුදු හයකට පෙර ගල් අඟුරු හෑරීම අත්හැරදැමූ එකක්. ඒක තමයි ලැංකැෂයර් ප්‍රාන්තයේ තිබූ විශාලම පතල.

මෙම අතුරු දුම්රිය මාර්ග ඉස්සර කාලයේ ප්‍රයෝජනයට ගත්ත බව ඇත්තයි. නමුත් හදිසි අනතුරක් සිදුවීමට ඇති අවදානම ගැන සලකා, ඒවා ප්‍රධාන මාර්ගයෙන් විසන්ධි කර ඇති බව සිතියමට අදාල විස්තරයේ සඳහන් වෙනවා. ඒ නිසා අපට තාවකාලිකව ඒවා අමතක කරන්න පුළුවනි. අපි අපේ අවධානය වහාම යොමු කළ යුත්තේ විසන්ධිකර නැති අතුරු මාර්ග තුන වෙත. ඒ තමයි, i) කාන්ස්ටොක් යකඩ කම්හල, ii) බිග්ගෙන් ගල් අඟුරු ආකරය, iii) පර්සිවියරන්ස් ගල් අඟුරු ආකරය."

හෝම්ස්ගේ දේශනය නිමකිරීමටත් පෙර අපි, කෙන්යොන් මංසන්ධිය දුම්රියපොළ වෙත ළඟාවී ඇතිබැව් දුටුවෙමු. සිද්ධිය ගැන ආරංචි වී විශාල පිරිසක් දුම්රිය පොළ වෙත එකතුවී සිටියේය. අප දුම්රියෙන් බසිද්දී පොලිස් නිලධරයෝ කිහිපදෙනෙක් සහ දුම්රිය නිලධරයෝ පැමිණ අප පිළිගත්හ.

"ඔබේ විදුලි පුවත අපට ලැබුණා, ෆ්‍රෙග්සන් මහත්මයා" දුම්රිය නිලධරයා පැවසීය. "මළසිරුර තිබුණු තැනට යන්න කටයුතු සූදානම් කරලයි තියෙන්නේ."

අප ප්‍රවාහණය කිරීම සඳහා එක් මැදිරියක් පමණක් සවිකළ දුම්රිය ඇන්ජිමක් කළු පැහැති දුම්වලාවක් පිටකරමින් සූදානමින් තිබූ අයුරු දුටුවෙමු. එයට අප සියලුදෙනා නැගුණු වහාම, එය පිටත්විය. අපි නොපමාව අදාල තැනට ළඟාවූයෙමු.

ජෝන් ස්ලේටර් නම් රියැදුරාගේ මළසිරුර තිබුණේ දුම්රිය මාර්ගයෙන් අඩි අටක් පමණ ඈත, ඝනව වැඩී තිබුණු පඳුරු අතරේයි. පොලිස් නිලධරයාගේ ඉල්ලීම මත තවමත් මරණ පරීක්ෂණය පවත්වා නොතිබිණ.

පරීක්ෂණ කටයුතු පැවැත්වීම සඳහා මෘත ශරීරය අසල වූ විවෘත තැනකට ගන්නා ලදී. මළ සිරුර අසල දණගසාගත් හෝම්ස් එය පරීක්ෂා කිරීම ඇරඹුවේය. ජෝන් ස්ලේටර්ගේ හිසෙහි විශාල තුවාලයක් විය. වේගයෙන් ගමන් කළ දුම්රියෙන් ඇදවැටී, හිස ගල් සහිත පොළොවේ වැදීම නිසා, මෙම තුවාලය සිදුවී ඇති බැව් මම වටහා ගතිමි. මරණයට හේතුවන්නට ඇත්තේ ද එයමය. ගලය



www.sinhalaelibrary.com

වෛද්‍යවරයෙකු ලෙස, මුළු මිය පහසුවෙන්ම තේරුම් ගනිමි. එහෙත් මගේ මිතුයා මළසිරුරේ අභිලක් නැර, සියුම් පරීක්ෂාවකට ලක් කළේය.

"ඔහුගේ සාක්කුවල තිබී ඔබට මොනවද ලැබුණේ?" හෝම්ස් ඇසුවේ ප්‍රාදේශීය පොලිස් නිලධරයාගෙනි.

"සාමාන්‍යයෙන් දුම්රිය රියැදුරෙකුගේ දකින්න ලැබෙන, රාජකාරියට අදාළ කඩදාසි කිහිපයක්, පවුම් 1යි සිලිං හයක මුදලක් සහ දුම්බොන පයිප්පයක් තිබුණා. ඒ සියල්ල මගේ භාරයේ තිබෙනවා. ඔබට පරීක්ෂා කිරීමට අවශ්‍ය නම්....."

"දැනට අවශ්‍ය නැහැ, නමුත් මේ මළසිරුර වැටී තිබෙන ප්‍රදේශය අවට පොළොවෙන්, කිසිම හෝඩුවාවක් ලබාගන්න අපහසුයි" හෝම්ස් කීවේ නොසතුටෙනි.

"ඔව් මහත්මයා" පොලිස් නිලධරයා කීය. "සෝදිසි මෙහෙයුම කළ අපේ කණ්ඩායමේ අයගේ පා සටහන්වලින්, සලකුණු සියල්ල මැකී ගිහින් ඇති?"

"දැන් ඒකෙන් කමක් නැහැ," හෝම්ස් පිළිතුරු දුන්නේය. "ඔබ මෙන්න මේ කරුණු ගැන හොයා බැලුවද? නවමත් ප්‍රධාන දුම්රිය මාර්ගයට සම්බන්ධව තිබෙන අතුරු මාර්ග තුනේ, විශේෂ දුම්රිය වැඩිදිමෙකින් හෝ ගමන් කරලද කියල ඔබ සෝදිසි කරල බැලුවද?"

"ඔව්. මෙන්න ඒ පරීක්ෂණය කළ පොලිස් පරීක්ෂකවරයාගෙ වාර්තාව" නිලධරයා ලිඛිත ෆුල්ස්කැප් පිටු කිහිපයක් හෝම්ස්ට පෙන්වා එය කියවීමට පටන්ගත්තේය.

"පළමුවෙන්ම හොයා බැලුවේ බිග්බෙන් මාර්ගය. ඒකෙ දිග හැතැක්ම කාලකටත් අඩුයි. ඒ පාරෙ කෙළවර ආකාරයෙන් හාරා, ගොඩගැසූ විශාල ගල් අඟුරු කන්දකින් අවහිර වෙලා. එය ඉවත්කරන්න දුම්රියක් ගෙන්වා ගන්නයි ඔවුන් බලාඉන්නේ. විශේෂ දුම්රිය ගැන කිසිම දෙයක් ඔවුනට අහන්නවත් දකින්නවත් ලැබිල නැ.

දෙවැනියට බැලුවේ කාන්ස්ටොක් මාර්ගය. ඒකත් තනි මාර්ගයක්. පහලෙන් හැරූ යකඩ ඉල්ලම් පැටවූ බඩුපෙට්ටි 16 ක්, දැන් දින 3ක් තිස්සේ මේ පාරේ නවත්වා තිබෙනවා. විශේෂ දුම්රියට ඒ පාරෙ ඉදිරියට යන්න කිසිම පිළිවෙළක් නෑ.

අනෙක් මාර්ගය පර්සිවියරන්ස් පතලට යන මඟ. මෙක ද්විත්ව මාර්ගයක්. මෙහි දිග හැතැක්ම 2 1/4 යි. ඊයේ දවස පුරාම මේ





මාර්ගය අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුවුණා. දුම්රිය කම්කරුවන් සියයකට ආසන්න ගණනක් රේල් පාර දිගටම පිළිසකර කිරීමේ වැඩවල යෙදී හිටියා. බලාපොරොත්තු නැතිව පැමිණි දුම්රියක්, ඔවුනට නොපෙනී, ඔවුන් පසුකර ගියා කියල හිතන්න අමාරුයි." නිලධරයා වාර්තාව කියවා අවසාන කළේය.

"අනෙක මේ පර්සිවියරන්ස් පතලට යන මාර්ගය තියෙන්නෙත් කෙන්යොන්වලට හුගක් කිට්ටුවෙන්. ජොන් ස්ලේටර්ගේ මිනිය තිබෙන මේ හරියට එන්න කලින් තමා ඒක හමුවෙන්නෙ. එහෙම නේද?" හෝම්ස් ඇසීය.

"ඔව් මහත්මයා. ඔබ කිව් දේ නිවැරදියි."

"එහෙම නම් අපට හිතාගන්න පුළුවන් මෙයයි" හෝම්ස් පැවසුවේය. "දුම්රියට අත්වුණු ඉරණම කුමක් වුවත්, රියැදුරා එයින් ඇදවැටෙන්න ඇත්තේ, පර්සිවියරන්ස් පතුකළාට පස්සෙයි. පළපුරුදු රියැදුරෙක් වන ඔහු එන්ජිමෙන් ඇදවැටුණේ කොහොමද, ඊට පස්සේ දුම්රියට සිදුවුණේ කුමක්ද යන දේවල් අපට හිතාගන්න අමාරුයි."

පරීක්ෂා කර බැලීමට අන් කිසිවක් නොවූයෙන් අපි දහවල් ආහාරය සඳහා ඩිරැගන් හෝටලය දෙසට පිටත්ව ගියෙමු.

"මේ සිද්ධිය ගැන සමහරුන් පළකළ අදහස් කිහිපයක්, මං ඔබට කියන්නද හෝම්ස් මහත්මයා?" දුම්රිය අධිකාරී බ්ලැන්ඩ් විමසුවේ, අප වෙත දහවල් ආහාරය පිළිගැන්වෙන අතරතුරයි.

"ඔව්?"

"එක් අදහසක් වුණේ" නිලධරයා කීය. "වේගයෙන් ගමන් කළ දුම්රිය පීලිපැනලා මාර්ගය අසලින්ම තිබෙන ලැංකැෂයර් ඇළට හෝ ස්ටැෆඩ් ඇළට වැටිලා ගිලෙන්න ඇති කියලයි."

"නමුත් ඒක වෙන්න පුළුවන්ද? මං හිතන්නෙ නෑ, මුළු දුම්රියක්ම සඟවාගන්න තරම් මේ ජලාශ එකක්වත් ගැඹුර ඇති කියල?" හෝම්ස් කීය.

"මෙම ජලාශ දෙකේම වාර්තාවී ඇති ගැඹුර අනුව දුම්රියක් එයට වැටුණත් අපට නොපෙනී තිබෙන්න විධියක් නැහැ" දුම්රිය නිලධරයා පිළිතුරු දුන්නේය.

"තව මොනවද පළවුණු මත?"

"කරටාල් මහත්මයාගේ සහායාගේ බෑගයේ තිබෙන්න ඇත්තේ අතිශයින්ම ප්‍රබල., නවීන පුපුරණ ද්‍රව්‍ය විශේෂයක් විය හැකිලු.

ඒකෙන් මුළු දුම්රියත්, එහි ගමන්ගත් අයත්, හඳුනාගත නොහැකි තරම් කුඩා ධූවිලි වැනි අංශු ලෙස පුපුරවා හැරියා වෙන්න පුළුවන්ලු."

"ඒක නම් කොහොමටවත් වෙන්න බෑ" හෝම්ස් කීය. "දුම්රිය මාර්ගයට සීරීමක හෝ ලකුණක් නොමැතිව, ඔය කියන ආකාරයේ පිපිරීමක් සිදුවෙන්න විධියක් නැහැ."

දහවල් ආහාරයෙන් පසු සිද්ධියට සම්බන්ධ එක් එක් පුද්ගලයා හමුවීමට අපි ගියෙමු. ඔවුන්ගෙන් දීර්ඝ ලෙස විස්තර විමසූ හෝම්ස් ඒවා පොතක සටහන් කර ගත්තේය. එම සටහන් යළි යළිත් කියවා බලමින්, උපකල්පනයක් ගොඩනැගීමට ඔහු තීරණය කළ බැව් මම වටහා ගතිමි. ඒ සඳහා ඔහුට ආපසු ලන්ඩනයට යෑමට අවශ්‍ය විය.

ලන්ඩනය බලා ආපසු එන ගමනේදී, පයිප්පය දල්වාගෙන නළල රැළිකරගත් මගේ මිත්‍රයා සිටියේ සම්පූර්ණයෙන්ම නිහඬවය. මෙවැනි වෙලාවල ප්‍රශ්න නොඅසා, ඔහුට නිදහසේ කල්පනා කරන්නට ඉඩදිය යුතු බැව්, මම හොඳින් දැනසිටියෙමි.

"වොට්සන්. මම හෙට ටිකක් දවල් වෙලා ආයෙමත් ලිවර්පූල් බලා යනවා. ඔබ එනවද මා සමඟ යන්න?" ඔහු ඇසීය.

"හෙට උදේ නම් එන්න හැකිවෙන්නේ නෑ" මම කීවෙමි. "මගේ බිරිඳගේ හිතවත් මිතුරිය සිසිල් ෆොරස්ටර් මහත්මිය ඔබට මතක නේද? අප සමග දින දෙකතුනක් ගතකරන්න එන්න කියල ඇයට අපි ආරාධනා කරමින් ඉන්නේ සෑහෙන කාලෙක ඉඳල. ඇය එන්න නියමිත හෙටයි. ඒ නිසා මට ඔබ සමඟ එන්න අපහසුයි."

"කමක් නෑ වොට්සන්" ඔහු කීය. "අමුත්තන් එනවා නම් ඔබ නිවසින් බැහැර යාම සුදුසු නැහැ. හෙට හවසම මං ආපසු ආවොත්, විස්තර කියන්න ඔබේ නිවසට ගොඩවදින්නම්."

"ඇයි ආපසු ආවොත් කියන්නෙ" මම ඇසීමි. "හෙට රාත්‍රිය ඔබ එහේ නවතින්නත් ඉඩ තියෙනවද?"

"ඔව්. හැන්දෑ වෙනකුරු වැඩ කටයුතු තිබුණොත්, මට එහේ රාත්‍රිය ගතකරන්න සිදුවේවි. එහෙම වුණොත් මං ඔබට විදුලි පුවතක් එවන්නම්."

පසුදා උදයේ අප නිවසට පැමිණි අමුත්තන්ට සංග්‍රහ කිරීමටත්, දවස පුරා පැමිණි රෝගීන්ට ප්‍රතිකාර කිරීමටත් මට සිදුවිණි. එහෙයින් විශේෂ දුම්රියේ අවුල, මට සම්පූර්ණයෙන්ම අමතක වී





ගියේය. එය යළිත් මගේ සිහියට ආවේ රාත්‍රී අටට පමණ මා වෙත ලැබුණු විදුලිපුවත දුටු විටයි. ඒ ෂර්ලොක් හෝම්ස් කැන්යොන් දුම්රියපොළෙන් එවූවකි.

"හෙට උදේ නවයට "ද ඩ්‍රැගන්" හෝටලයේදී ඔබ හමුවීමට බලාපොරොත්තු වෙමි.

එස්. එච්."

"මොනවා හරි වැදගත් දේවල් රැසක් හෝම්ස්ට හොයාගන්න ලැබිල ඇති. ඒකයි ඔහු මාව ලිවර්පූල් වලට කැඳවන්නෙ" මම මගේ බිරිඳට කීවෙමි.

"රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ වැඩ ටිකක් අතපසුවෙනව නේද? ඔයා යන්න ඕනෙමද?" මගේ බිරිඳ ඇසුවේ තරමක් නොසතුටෙන් බව මම වටහා ගතිමි.

"මෙ වැහි කාලෙ නිසා කොහොමටත් ලෙඩ්ඩු එන්නෙ අඩුවෙන්. බාගවෙලාවට හවස්වෙද්දි මට ආපහු එන්නත් හැකිවේවි." බිරිඳ අස්වැසීමට එසේ පැවසුවත්, මුළු දවසම ලිවර්පූල් හි රැඳීසිටීමට සිදුවෙන බව මේ වනවිට මම තේරුම් ගෙන සිටියෙමි.

පසුවදා උදේ හතරට පමණ මම පිටත්වීමි. පැඩිංටන් දුම්රියපොළෙන් පාන්දරින්ම පිටත්වූ ශීඝ්‍රගාමී දුම්රිය අල්ලා ගැනීමට මට හැකිවිය. එය වැඩි ප්‍රමාදයක් නැතිව කැන්යොන් දුම්රියපොළට ළඟාවිය.

"ඔබ හොඳ වෙලාවටයි ආවෙ, වොට්සන් මහත්තයා. අපි තවම උදේ ආහාරය ගත්තෙත් නැහැ" හෝටලයේ දොරටුව ළඟදී මා පිළිගත් අපේ මිත්‍ර පොලිස් පරීක්ෂක ග්‍රෙග්සන් පැවසීය.

"කෝ මගේ මිත්‍රයා, ෂර්ලොක් හෝම්ස් මහත්මයා?" මම ඇසීමි.

"ඔහු කොයි ලෝකෙක ගියාද කියන්න මං දන්නෙත් නෑ වොට්සන් මහත්මයා" ග්‍රෙග්සන් කීය. "ඊයේ රෑට කෑම කාල ඉවරවුණු හැටියෙම කොට්ට ගොඩක් උඩ වාඩිවෙලා, සැර දුම්කොළ අවුන්ස දෙකක් ගෙන්වා ගෙන පයිප්පය බිබී කල්පනා කරන්න පටන්ගත්තා. මං ඇහැව්ව කිසිදේකට උත්තර දෙන්න ඔහු කැමැති වුණේ නැහැ. අද උදේ මං ගිහින් ඔහුගේ කාමරේ දොරට තට්ටු කළා. ශබ්දයක් නෑ. සේවක ළමයා තමයි කිව්වෙ, උදේ පාන්දර එළිය වැටෙන්නත් කලින්ලු හෝම්ස් මහත්තය හෝටලයෙන් පිටවුණේ. ඔහු ගියේ දුම්රියපොළ දෙසටලු."



www.sinhalaelibrary.com

පැය භාගයක් ගතවීමට පෙර මගේ මිත්‍රයා ආපසු හෝටලයට පැමිණියේය. ඩහදිය වගුරුවමින් සිටියත්, දැඩිලෙස වෙහෙසට පත්වුණු බවක් පෙනුණත්, හෝම්ස් සිටියේ සෑහෙන සතුටකින් බව, මම තේරුම් ගතිමි. ඒ ඔහුගේ දෙනෙතේ දැල්වුණු දීප්තිය නිසයි.

"ආ වොට්සන්. ඔබ නියමිත වෙලාවටම ඇවිත්. මං ඉක්මනින් එන්නම්" කී ඔහු කාමරයට රිංගාගත්තේය. මිනිත්තු දහයක් යෑමට පෙර මුහුණ කට සෝදාගෙන ආ හෝම්ස්, අප සමග උදෑසන තේ මේසයට වාඩිවිය.

"හෝම්ස් මහත්මයා. ඔබ උදේ පාන්දරින්ම කොහේ ගියාද හැබෑට?" ග්‍රෙග්සන් ඇසුවේ පාන් පෙත්තක බටර් තවරමිනි.

"ඒක හොඳ ප්‍රශ්නයක් ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "හැම් බේකන් වගේ කෑම අපි නිතර ආහාරයට ගන්නවා නම්, නිතර ශාරීරික ව්‍යායාම කරන්නත් ඕන. නැත්නම් අපිට ඉක්මනට ලෙඩ රෝග වැළඳෙනවා. වොට්සන් ඩර්ගන් හෝටලයේ කෝකියාගේ චීස් දමූ ඔම්ලට් එක අනර්ඝයි. බිත්තර දෙකකින් මේ ඔම්ලට් එක හැදුවේ ඔබටමයි."

හෝම්ස් මගේ පිගානට කෑම බෙදුවේය.

"..... ව්‍යායාම ඕන නිසා මං ගියා ග්‍රෙග්සන් ඇවිදින්න. මං මේ හැතැක්ම හයක් හතක් ඇවිදලයි ආවේ."

"මේ අභිරහස හෙළිකරන්න ඊයේ දවසෙ මොනවද ඔබට හොයාගන්න හැකිවුණේ?" මම ඇසීමි.

"දෙයියො තමයි දන්නෙ" ග්‍රෙග්සන් කීය. "උදේ ඉඳන් රෑ වෙනතුරු අපි දෙන්නා මොන තරමක් ඔය අඩවිය පරීක්ෂා කළාද? නමුත් පෙරේදා අපි හිටි තත්ත්වයෙන් එක පියවරක් ඉදිරියට ගියා කියලා මම නම් හිතන්නේ නෑ."

"ග්‍රෙග්සන්ගේ කීම ඇත්ත" හෝම්ස් ඒ කීමට එකඟ විය. "පහුගිය පැය විසිහතර ඇතුළත, මේ ලිපිය ඇරෙන්න වෙන කිසිම හෝඩුවාවක් අප වෙත නොලැබුණු ගානයි."

තම කබා සාක්කුවෙන් ලිපියක් ගත් ඔහු, එය මා අතට දුන්නේය.

"අතුරුදන්වුණු දුම්රියේ ගාඩ් මැක්ෆර්සන් ඔහුගේ බිරිඳට ලියුමක් එවලා."

මගේ ආදරණීය පොරීන් වෙතයි.

මට නිතර නිතර ඔබ ගැන සිහිවෙනවා. ඔබව අමතක කිරීමට, මට කිසිසේත් හැකියාවක් නැහැ. ලිසී ගැනත් ඒ වගේමයි. මේ සමග





ඔබ වෙත පවුම් 20 ක් එවමි. ජර්මනියේ හැම්බර්ග් සිට අත්ලාන්තික් සයුර හරහා ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් වෙත යාත්‍රා කරන නැව් සේවයක් තිබෙනවා. මේවා එංගලන්තයේ සවුත්හැම්ටන් වරායේ නවතිනවා. ඇමරිකාව බලායන මගීන් ගන්නවා. ලිවර්පූල් වරායෙන් පිටත්වෙන නැව්වලට වඩා මේවායේ අයකිරීම අඩුයි. ඒ වගේම ගමන වේගවත්. ඔබ දෙදෙනාම නිව්යෝක් වෙත එන්න. එහිදී ජොන්ස්ටන් හවුස් හෝටලයේදී මා හමුවන්න. දැනට නම් මං සිටින්නේ කරදර රාශියකට මුහුණ දීලා. දැනට වෙනත් කිසිවක් නොලියමි. මේ ඔබේ ආදරණීය සැමියා.

ජේම්ස් මැක්ෆර්සන්."

"මේක කවදද ලැබුණේ?"

"ඊයේ- ජූනි 6 වැනිදා තමයි ඇයට ලැබිල තියෙන්නේ" හෝම්ස් කීය. "එහි තැපැල් මුද්‍රාව ජූනි 5 වැනිදා සවුත්හැම්ටන් වලින්. මෙහි අත්අකුරු ඇගේ සැමියාගේ අත්අකුරු බවට මැක්ෆර්සන් මහත්මියට හොඳටම විශ්වාසයි. පවුම් 20ක මුදල් නෝට්ටු තිබීමෙන්, මෙක තාංගෙ හරි විහිළුවක් නොවන බව තවදුරටත් තහවුරු වෙනවා."

"මේ අවුලේ අගක් මුලක් මට තවමත් හිතාගන්න බැහැ" ග්‍රෙග්සන් කීවේ උදේ ආහාරය අවසන් කොට සුරුට්ටුවක් දල්වාගනිමිනි.

"මෙකෙන් කියවෙන්නේ ජේම්ස් මැක්ෆර්සන් නිව්යෝක් බලායන්න සූදානමින් මේ ලියුම ලියූ බවයි" හෝම්ස් කීය. "ඇයි ඔහු තමන්ගේ බිරිඳ, නැගණිය හැමකෙනෙක්ම අත්හැරලා අමරිකාවට යන්න තීරණය කළේ ඇයි? මෙතැන තියෙනවා මොකක් හරි වංචාවක් බොහෝවෙලාවට අපරාධයක්. ඒකට වගකිවයුතු එක් පුද්ගලයෙක් ජේම්ස් මැක්ෆර්සන්."

"හෝම්ස් මහත්මයා මෙහෙමත් වෙන්න බැරිද?" ග්‍රෙග්සන් ඇසුවේය. "දකුණු ඇමරිකාවෙ ඉඳල ආව කරටාල් මහත්මයා සහ ඔහුගේ මිත්‍රයා දරුණු අපරාධකාරයින් වෙන්න බැරිද? මැක්ෆර්සන් සහ දුම්රියේ රියැදුරා, කරටාල් ලාගේ හිරකාරයින් බවට පත්වෙන්න ඇති. රියැදුරා ඔවුන්ගෙන් ගැලවෙන්න දුම්රියෙන් පනිද්දී මියගියා. ෆයර්මන්ටත් අත්වුණේ ඒ ඉරණම වෙන්න පිළිවන්. එංගලන්තයේ රැඳුණොත් තමන්ගේ ජීවිතයට තර්ජනයක් ඇතිබව තේරුම් ගත්තා මැක්ෆර්සන්, ඇමරිකාවට පැනගන්න උත්සාහ කරනවා. ඔහු ලිපිය ලියන්නේ කරටාල්ලාගේ හිරභාරයේ ඉඳගෙන වෙන්නත් පුළුවන්."



www.sinhalaelibrary.com

"ඔබේ උපකල්පනයේත් යම්කිසි ගතයුතු දෙයක් තියෙනවා ග්‍රෙග්සන්" මගේ මිත්‍රයා කීය. "නමුත් මොන අරමුණකින්ද කරටාල් මුදල් ගෙවලා, විශේෂ දුම්රියක් අරගෙන, ඒක නමත් සමග අතුරුදන් කරවන්නේ?"

"බැංකුවක් මංකොල්ල කෑමට? ඝාතනයක් සිදුකිරීමට?"

"ඒක කොහොමටවත් වෙන්න බෑ ග්‍රෙග්සන්. ලන්ඩන් නගරයේ සිදුවෙන විධියට අශ්වකරත්තයක් අතුරුදන්වුණා නම් අපට එහෙම හිතන්න පුළුවන්. නමුත් දුම්රියක්? දුම්රියකින් ගිහිං කළහැකි ඝාතන, මංකොල්ලකෑම් මොනවාද? ඒක අනාගෙයි මිත්‍රයා. මෙතැන ඊට වඩා ගැඹුරු දෙයක් තියෙනවා. මං හිතන හැටියට....."

මේ අවස්ථාවේ හෝම්ස්ගේ කථාවට බාධාකරමින් පණිවුඩකරුවෙක් අප වෙත පැමිණියේය. ඒ හෝටලයේ සේවකයෙකි. ඔහු පැමිණියේ හෝම්ස් නමට ලැබුණු විදුලිපුවතක් ද රැගෙනයි. මගේ මිත්‍රයා එය විවෘතකර බැලුවේ නොඉවසිල්ලෙනි.

"ඔබ දන්වා තිබූ විස්තරයට සැසඳෙන සමර්ස් නම් පුද්ගලයෙක් වැනිදා රටින් පිටවුණු බවට සාක්ෂි ඇත. ඒ හැම්බර්ග් සිට පැමිණි සවුත්හැම්ටන් හරහා නිව්යෝක් ගිය 'විස්ටියුලා' නම් නෞකාවෙනි."

හෝම්ස් විදුලිපුවත ගුළිකොට, සාක්කුවට දමාගත්තේය. "මේ සවුත්හැම්ටන්හි සිටින මගේ මිත්‍ර කොලිංවුඩ්ගෙන්. මා ඔහුගෙන් අසා යැවූ ප්‍රශ්නයකට පිළිතුරු තමයි මේ. අනෙක් අය හිතූ ආකාරයට විශේෂ දුම්රිය ලැංකෂයර් ඇළට වැටී නැති බවත්, සියුම් ධූවිලි වලට විනාශ වී නැති බවත් මැක්ෆර්සන්ගේ ලියුමෙන් කියවෙනවා. මේ විදුලි පුවතෙන් ඒක තහවුරු වෙනවා."

"හෝම්ස් මහත්මයා. මෙතැනින් ඉදිරියට අපට කරන්න ඉතිරිවෙලා තියෙන්නේ මොනවද?"

"ඒක නම් මට තවමත් හිතාගන්න අමාරුයි ග්‍රෙග්සන්" හෝම්ස් කීය. "උපකල්පනයක් ගොඩ නැගීමට පෙර, අපට තවදුරටත් දත්ත අවශ්‍යයි. මං බලාපොරොත්තු වෙනවා, වහාම ලිවර්පූල් බලා පිටත්වෙන්න. අපේ පරීක්ෂණය යළිත් මුල් කෙළවරෙන්ම පටන් ගන්න අපට සිදුවෙනවා."

"ඔබට හවුල් වෙන්න මට එන්න හැටියක් නෑ හෝම්ස් මහත්මයා" ග්‍රෙග්සන් කීවේ අසුනෙන් නැගී සිටිමිනි. "මං අපේ පොලිස් මූලස්ථානයට වාර්තා කළ යුතුයි. අද රෑම, නැත්නම් හෙට





උදේ මං ඔබව හමුවෙන්න මෙතැනටම එනවා" ග්‍රෙග්සන් අපෙන් සමුගෙන පිටවී ගියේය.

අපි මදවේලාවක් හෝටලයේ ආලින්දයේ රැඳීසිටියෙමු.

"වොට්සන්. ඔබ දන්නවාද අද උදේ ඉරපායන වේලාවේ, මං යෙදුණේ මොන කටයුත්තකද කියලා?"

"ඔව්. ඔබ ව්‍යායාම පිණිස ඇවිදින්න ගියා."

"හරි. ව්‍යායාමයකුත් ලැබුණු බව ඇත්තයි. නමුත් මං ඇවිද ගියේ කොහේද දන්නවද? රේල් පාර අයිනෙන්, සමහර වෙලාවට, රේල්පාර උඩින්, කෙනිංටන් සිට බාටන් ඉමොස් දක්වාත් එහි සිට ආපසු හෝටලයටත්."

"මොනවද ඔබට අලුතෙන් හොයාගන්න පුළුවන් වුණේ?"

"කරුණු රාශියක් පරීක්ෂණය කිරීමට මට හැකිවුණා. ඒ අනුව මට කල්පිතයකුත් ගොඩනගන්න පුළුවනි. ඒ වුණත් ඒකෙ යම් යම් තැන් හිස්. ඒ හිස්තැන් පුරවා ගැනීමටත් අවශ්‍යයි. ඒ සඳහා තමයි අපි ලිවර්පූල් බලා යායුතු වෙන්නේ."

ලිවර්පූල්හි දුම්රිය අධිකාරී කාර්යාලයේ නිලධරයෝ සිරිත් පරිදි රාජකාරි කටයුතුවල යෙදී සිටියහ.

"වොට්සන්. මං වැදගත් කටයුත්තක යෙදෙන අතරේ ඔබටත් රාජකාරියක් භාරදෙන්න මං කැමැතියි" මගේ මිත්‍රයා කීය. "මේ සිද්ධිය වුණේ ජූනි 3 වැනිදා හවස. ජූනි 1 වැනිදා හවස සිට ජූනි 4 වැනිදා දක්වා, දුම්රියපොළේ සේවය කළ කාර්ය මණ්ඩලයේ, නාම ලේඛනය මෙන්න. ඔවුන්ගේ නම් ඉදිරියෙන් ඔවුන් දරන තනතුරුත් සඳහන් වෙනවා. මේ ලේඛනයෙන් ඉහළ නම් තිබෙන්නේ විධායක මට්ටමේ නිලධරයන්ගේ. ඔවුන් තමා කරටාල් මහත්මයා සහ සගයා හොඳින්ම දුටුවේත්, ඔවුන් දාමගේ කතාබහ කළේත්, ඒ නිසා ඔවුන් සමග කටයුතු කිරීම මං භාරගන්නම්. මේ ලේඛනයේ පහළ ඉන්න අය හමුවීම ඔබට භාරයි. ඔවුන් සමග සාකච්ඡා කර, කරටාල් සහ ඔහුගේ සගයා ගැන දුටුවේ මොනවද, අහන්න ලැබුණේ මොනවද, ආදී හැම දෙයක්ම හොඳින් විමසන්න. ඊළඟට ඒවා මේ පොතේ සටහන් කරගන්න. මේ ලේඛනයේ ඉන්න කවුරු හරි අද වැඩට පැමිණ නැත්නම්, ඔවුන් හොයාගෙන ගෙවල්වලට හරි ගිහින් ප්‍රශ්න කිරීම අප කළයුතුයි."

හෝම්ස් නියම කළ ආකාරයට ඒ රාජකාරියේ යෙදුණෙමි. හියුබර්ට් ක්ලිෆර්ඩ් නම් සේවකයා හැර අන් සියලුදෙනාම හමුවීමට මට

www.sinhalaelibrary.com

හැකිවිණි. එහෙත් ඔවුන් හැමදෙනෙක්ම දනසිටියේ, අප දනටමත් දනසිටි කරුණු පමණකි.

"හියුබට ක්ලිෆඩ් හමුවෙන්න පුළුවන් කොහේදිද?" මම දුම්රිය පොළේ ලිපිකරුවෙකුගෙන් විමසීමි.

"ඔහු තමයි සංඥාකරු- සංඥාකුළුනේ සංඥා දැමීම කරන්නන් අතර ජ්‍යෙෂ්ඨයා. ගමන් කරන දුම්රියක පාපුවරුවෙන් බිමට පනින්න ගිහින් ලිස්සාවැටිලා, ඔහුට බරපතළ තුවාලයි. දන් ඔහු රෝහලේ. එහෙදි ඔහුව හමුවෙන්න ඔබට පුළුවනි."

සංඥා කුළුනේ සිට රැකියාව කළ ක්ලිෆඩ්, වේදිකාවේ හෝ කාර්යාලයේ වුණු සිදුවීම් කිසිවක් දකින්නට නැත. ඔහු වැඩට පැමිණ තිබුණේ ජූනි 1,2 හා 4 වැනි දින වලදීයි. එනම් සිද්ධිය වූ දිනයේ ද ඔහු සේවයට පැමිණ නොසිටියේය. ඒ නිසා රෝහලට ගොස් ඔහුගෙන් ප්‍රශ්න කිරීමට මම නොසිතුවෙමි.

ප්‍රශ්න කිරීම් අවසන් කොට අප ලිවර්පූල් දුම්රිය පොළෙන් එළියට එද්දී දහවල් දෙක පමණවී තිබිණි.

"මොනවද වොට්සන් ඔබට හොයාගන්න හැකිවුණේ?" හෝම්ස් ඇසුවේ දහවල් ආහාරය සඳහා අවන්හලකට යෑමට කුලීරියක් නවත්වා ගනිමිනි. "ඔබට පුළුවන් වුණාද හැමකෙනෙකුගෙන්ම ප්‍රශ්න කරන්න?"

"එක් අයකුගෙන් ඇරෙන්න, අනික් හැමෝගෙන්ම ප්‍රශ්න කළා. නමුත් හැම දෙනාටම කියන්න තිබුණේ එකම කථාවයි. මං ඒවා මේ පොතේ සම්පූර්ණයෙන්ම සටහන් කරගත්තා" මම පොතට තට්ටු කරමින් කීවෙමි.

"කාවද ඔබට අල්ල ගන්න බැරිවුණේ?"

"සංඥාකරුවා- හියු ක්ලිෆඩ්. ඔහු තුවාල වෙලා රෝහලේ."

"තුවාල වෙලා? ඒ කොහොමද?"

"ඔහු අධික ලෙස මත්පැන් පානය කරන කෙනෙක් බවයි මට අහන්න ලැබුණේ. රාජකාරි අවසන් වුණාම, ඔහු ගෙදර නොගිහිං කෙළින්ම යන්නේ නගරයේ තැබෑරුමකටලු. එහෙම යද්දී ගමන්කරන දුම්රියේ පාපුවරුවෙන් පනින්න ගිහිං, බිම ඇදවැටිලා, තුවාලවෙලා කියලයි ලිපිකරුවා කිව්වේ."

"ඔහු යන තැබෑරුම මොකක්ද, ඇතුළත් කර ඉන්න රෝහල මොකක්ද, ඒවා තියෙන්නේ කොහේද කියල අහල ලියාගත්තෙ නැද්ද වොට්සන්?" මගේ මිතුයා ඇසුවේ කලබලයට පත් අයුරෙනි.





"නෑ. මං හිතුවෙ නෑ ඒවා ඒ තරම් වැදගත්වේවි කියල. අනික හෝම්ස් මෙ ක්ලිෆඩ්, සිද්ධිය වුණු දවසෙ දුම්රියපොළේ ඉඳලත් නෑ. ඔහු වැඩට ඇවිත් තියෙන්නේ ජූනි 1,2 හා 4 දවස්වල."

"ෂා ෂා මනුස්සයෝ" හෝම්ස් කීය. "මේ වගේ සංකීර්ණ අභිරහසක් විසඳද්දී හැම සුළු දෙයක් ගැනම අප සැලකිලිමත් විය යුතුයි. ඔහු එදා වැඩට නොපැමිණි නිසාම තමයි අපි වඩාත් හොයාබැලිය යුත්තේ. අපි ආපහු දුම්රියපොළට ගිහින් ඒ කාරණාත් හොයාගෙන එමු."

එදින සංඥා මැදිරිය භාරව සිටියේ වයිට් නම් තරුණයෙකි.

"ඔබට ලැබුණු ආරංචිය හරි." වයිට් කීය. "හියු වේගයෙන් යන දුම්රියේ පාපුවරුවෙන් බිමට පනින්න උත්සාහ කරද්දී, වැටිල තුවාල ලැබුවා කියලයි අපිට දනගන්න ලැබුණේ."

"ඇයි ඔහු වේගයෙන් යන දුම්රියක පාපුවරුවෙන් පැන්නේ?" හෝම්ස් ඇසීය.

"රාජකාරි ඉවරවුණාම සිරිතක් හැටියට ඔහු යන්නේ තැබෑරුමට" වයිට් කීය. "ඒ යන්නේ දුම්රියෙන්. ලිවර්පූල් නගර මායිමේ තියෙනවා අබලන් පාලමක්. පාලමේ අබලන් තත්ත්වය නිසා හැම දුම්රියක්ම එතැනදි වේගය අඩුකරනවා. හියුගේ ඉල්ලීම නිසා රියැදුරු මහත්වරු එත්පිම උවමනාවටත් වඩා වේගය අඩුකරන බවයි සමහරු කියන්නේ. කොහොමවුණත් ඔහු එතැනදී පාපුවරුවෙන් බිමට පනිනවා. මේක ඔහු අවුරුදු ගණනාවක සිට කරගෙන එන වැඩක්. මේ වගේ අන්තරායදායක වැඩ කරද්දී, පය වැරදෙන්නේ කොයි වෙලාවෙද කියල කියන්න බෑ."

"ඔබ ගියාද ඔහු බලන්න?"

"ඔව්. මං ඊයේ උදේ ගියා. ඔහු ඉන්නේ ශාන්ත ඇන්ඩෘ රෝහලේ. හදිසි අනතුරු අංශයේ. හියුට සෑහෙන්න තුවාලයි. හරිහැටි සිහියත් නෑ වගෙයි මට නම් පෙනුණේ. ඔලුවමයි බිම ඇනිලා තියෙන්නේ. මං ඔහුට කථාකරන්න උත්සාහ කළා. වාට්ටුව භාර හෙදිය, මට රැණවැදිල මාව එළවගත්තා." වයිට් කීවේ තමා සතු යුතුකම මැනැවින් ඉටුකළ බව හඟවන අයුරෙනි.

"මොකක්ද ඔහු නිතර යන ඒ තැබෑරුම?"

"දුම්රිය පාලම අසලම තියෙන්නේ, "බ්‍රිජ්විව්" කියල තැබෑරුමක්. ඒක ඒ තරම් හොඳ තැනක් නෙමෙයි."

www.sinhalalibrary.com

හියුබට් ක්ලිෆර්ඩ් වයස අවුරුදු පනස් දෙකක් වූ, මෙම දුම්රියපොළේ ජ්‍යෙෂ්ඨම සේවකයෙකු බව අපට දැනගන්නට ලැබිණි. අනෙක් වෙලාවට යහපත් ගති පැවතුම් තිබුණත්, මත්පැන් පානය කළ විට ප්‍රචණ්ඩකාරී පුද්ගලයෙකු වෙන බවත්, ජේස් ඔට්ටු වලට ඇබ්බැහිවීම නිසා අතමිට හිඟ අයෙකු බවත් වයිට් පැවසීය.

"හියුබට් ක්ලිෆර්ඩ් පස්දෙස් දිහින් දිගටම යෑම කාලය නාස්තිකිරීමක් නේද හෝම්ස්?" මා ඇසුවේ හෝටලයේ අපි දහවල් ආහාරය ගනිමින් සිටිනා අතරයි. "අතුරුදන්වුණු දුම්රියට ඔහු සම්බන්ධවුණු ආකාරයක් මට නම් පෙනෙන්නේ නෑ."

"ඔබ කියන දේ හරි. වොට්සන්. නමුත් මං ඔබට කලිනුත් කිව්වා වගේ හැම සුළුදෙයක් පසුපස්සේම ගිහිං අපි සොයා බැලිය යුතුයි."

"ඉහළ නිලධරයින් සමග සාකච්ඡා කරද්දී ඔබට මොනවා හරි දැනගන්න ලැබුණද?" මම ඇසුවෙමි.

"ඒ හැටි විශේෂ දෙයක් දැනගන්න ලැබුණේ නැහැ..... ඒ වුණත්..... ඒ වුණත් ඔවුන්ගේ කථාවල කොහේ හරි මොනව හරි නොගැළපෙන යමක් තියෙනවා කියල මට නිකං හැඟෙනවා."

"මොනවා හෝම්ස්?"

"ඔව්. ජේම්ස් බිලෑන්ඩ් සහ පොටර් හූඩ් දෙදෙනාටම කියන්න තිබුණේ කලින් කිව්ව කථාවමයි. නමුත් කොහේදනක හරි, මොකක් හරි අස්වාභාවික ගතියක් තියෙනවාදෝ කියල මගේ හිතේ සැකයක් ඇතිවුණා."

"ඔබ කියන්නේ මෙතැන දුම්රිය නිලධරයන්ගේ නොසැලකිල්ලෙන් යම් විශාල අත්වැරැද්දක් වෙලා, ඔවුන් ඒක හංගන්න හදනවා කියලද?" මම ඇසීමි.

"මට එහෙමම කියන්නත් බෑ."

"එහෙනම්?"

"ඔවුන්ගෙන් ලොකු අත්වැරැද්දක් වුණා නම් දුම්රිය අනතුරක් වීමට ඉඩ තිබුණා. එහෙම වුණා නම් මෙතැන ගැටලුවක් නැහැ. නමුත් මෙතැන ගැටලුව තියෙන්නේ අහම්බෙන් හරි හිතාමතා හරි, දුම්රිය අතුරුදන් වීම නිසයි."

දහවල් ආහාරයෙන් පසු අපි විවේක ගැනීම සඳහා හෝටලයේ විසිත්ත කාමරය වෙත ගියෙමු.

"වොට්සන්. අද උදේ පාන්දර ඉඳන්ම අපි හුගක් මහන්සිවුණා." හෝම්ස් කීය. "හවස පහ වෙනතුරු අපි පැයක විවේකයක් ගමු.



http://sherlockholmesinvestigations.blogspot.com



රෝහලේ රෝගීන් බලන්න ඉඩ දෙන්නේ හවස පහට. අපි මේ හියු ක්ලිෆර්ඩ් ගැන තවදුරටත් සොයා බැලිය යුතුයි. ඔබ යන්න ගාන්ත ඇන්ඩ්රූ රෝහලට, ගිහිං ඔහුගෙන් දැනගන්න පුළුවන් මොනවද කියල බලන්න. රෝගියා අසලට යන්න කතාබහ කරන්න සමහරවිට තහනම් කරල ඇති. ඒ වුණත් ඔබ වෛද්‍යවරයෙක් නිසා, වාට්ටුව භාර හෙදියගෙන් ඔබට යම් සහනයක් ලැබේවි කියල මං විශ්වාස කරනවා.

මම යන්නම් "බ්‍රිස්ටල්" මත්පැන් හලට. ක්ලිෆර්ඩ්ගේ යහළුවෝ කීපදෙනෙක් වත් එතැන ඉන්න ඕනෑ සැක නෑ. ඔහු වෙනුවෙන් පැයක් ගතකිරීම, කාලය අපතේ යැවීමක් කියල මම හිතන්නේ නෑ."

රැකියාවක් නොමැතිව නැගෙනහිර වල රස්තියාදු වන්නෙකු ලෙස හෝම්ස් වෙස්මාරු කරගත්තේය. හවස පහට අපි හෝටලයෙන් පිටත්වීමු. තම වැඩ කටයුතු අවසන් කොට හවස හයට පෙර රෝහලට පැමිණෙන බව මගේ මිතුරා කීය.

බරපතල තුවාල ලබා සිටි හියුබට් ක්ලිෆර්ඩ්, ගලහාගාරය අසල වූ විශේෂ කාමරයක රඳවාගෙන සිටින බැව් මට දැනගන්නට ලැබිණි. මා වෛද්‍යවරයෙකු බවත්, නීතිමය කාරණයක් නිසා රෝගියා බැලීමට අවශ්‍ය බවත් මම හෙදියට පැවසුවෙමි. එහෙත් මා කියූ දෙයට සැලැකීමක් නොකළ හෙදිය, රෝගියා බැලීමට මට අවසර නුදුන්නාය.

"වාට්ටුව භාර වෛද්‍යවරයා එන්නේ හෙට උදේ. ඔහුගේ අවසර නැතුව කාටවත් රෝගියාට කථාකරන්න ඉඩ දෙන්න බැහැ."

වෙනත් කළ හැකි දෙයක් නොමැති වූයෙන් මම නිහඬව හෝම්ස් එනතුරු බලා සිටියෙමි. හවස හයවීමට පෙර ඔහු රෝහලට පැමිණියේය.

"අපි වැටී තිබෙන මාර්ගය නිවැරදියි. වොට්සන්. හියු ක්ලිෆර්ඩ් තුවාල ලබල තියෙන්නේ පාපුවරුවෙන් වැටිල නෙමෙයි."

"එහෙනම්?"

"මං තැබෑරුමට ගොඩ වදින කොටම දුටුවා වයස හැටක පමණ මිනිහෙක්." හෝම්ස් කීය. "ඔහු මේසයක් ළඟ වාඩිවෙලා තනියම බොනවා. මමත් එතැනින් වාඩිවුණා. මිනිහට විස්කි දෙකක් අරගෙන දුන්නාම මිනිහා කියවන්න පටන් ගත්තා.

පසුගිය සතියක පමණ කාලයක් ක්ලිෆර්ඩ් ළඟ නොසෑහෙන්න සල්ලි තිබුණලු. මිනිහ හොඳට බීල තියෙනවා. පරණ ණය තුරුස්

http://sherlockholmesinvestigations.blogspot.com

එක්කොම බේරලා, යාළුවන්ටත් සලකලා තියෙනවා. රේස් ඔට්ටු වෙනුවෙනුත් හුගක් සල්ලි වියදම් කිලාලු. හදිසියේ මෙච්චර සල්ලි ලැබුණේ බැංකුවක් වත් කැඩුවද කියල යාළුවෝ විහිළුවට අහල තියෙනවා. මිනිහා ඒකට හරි උත්තරයක් දීල නැහැ. හිනාවෙලා කිව්වලු ඒක රහසක් කියලා.

අනතුර සිද්ධවුණු දවසෙ රෑ මිනිහා මත්පැන් බොන්න, දුම්රියෙන් තැබෑරුමට ආව බව ඇත්තයි. එහෙම එද්දි පාපුවරුවෙන් වැටිල නැහැ. ක්ලිෆර්ඩ් හා ඔහුගේ මිතුරන් සාමාන්‍යයෙන් රෑ එක පමණ වෙනතුරු අවන්හලේ ගතකිරීම සිරිතලු."

"එහෙනම් ඔහු වැටෙන්න ඇත්තෙ දුම්රියෙන් ආපහු එද්දි?"

"කොහොමටවත් නැහැ." හෝම්ස් කීය. "තැබෑරුමෙන් පිටවෙලා ගෙදර එද්දි ඔහු කවදාවත් දුම්රියෙන් එන්නෙ නැහැලු. යහළුවො හතර පස්දෙනෙක් සමග ඒ හැතැක්මක දුර පයින්මලු ගෙදර එන්නෙ. රෑ එකට කාලෙක් තියෙද්දි කොළුවෙන් ලියුම් කැබැල්ලක් අරගෙන තැබෑරුමට ඇවිත් තියෙනවා. ඒක දීල තියෙන්නෙ හියු ක්ලිෆර්ඩ්ට. මිනිහා කියල නැහැ ලියුම කාගෙන්ද මොකක් ගැනද කියලා. නමුත් ඒක කියෙව්ව ගමන් බොහොම සන්තෝෂයෙන් තැබෑරුමෙන් එළියට ආවලු. ඊට පස්සෙ ඔහුට ක්ලිෆර්ඩ් දකින්න ලැබිල නැහැ."

"එහෙනම් කවුරු හරි ඔහුව එළියට කැඳවලා පහරදුන්නා වෙන්නත් පිළිවන්?"

"හරියට හරි වොට්සන්" හෝම්ස් කීය. "ක්ලිෆර්ඩ් රෝහලට ගියේ කොහොමද කියල මට විස්තර කියූ පුද්ගලයා දන හිටියේ නැහැ. කොහොම නමුත් මට හිතෙනවා විශේෂ දුම්රිය අතුරුදන්වීමත් ක්ලිෆර්ඩ් බරපතල තුවාල ලැබීමත් අතරේ සම්බන්ධයක් තියෙනවා කියල."

"ඔබට හිතෙන්නෙ එහෙමද හෝම්ස්? දුම්රිය අතුරුදන් වුණේ මෙහෙට හැතැක්ම ගණනාවක් ඈතින් කෙන්යොන් හා බාටන් මොස් අතර. ලිවර්පූල් වල දුම්රිය සේවකයෙක් කාගේ හරි පහරදීමකට ලක්වූ පමණින්, ඔහු කොහොමද අර අභිරහසට සම්බන්ධ වෙන්නෙ?"

"ඒ හරිය අපි පසුව සලකා බලමු. දැන් ගිහින් බලමු ක්ලිෆර්ඩ්ගෙන් දැනගන්න පුළුවන් මොනවද කියලා."





තමා ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසිය හා අනුබද්ධව ක්‍රියාකරන අපරාධ පරීක්ෂකයකු බව පැවසූ හෝම්ස්, තම ආගන්තුක පත්‍රය හෙදියට පෙන්විය. ඇය ඉන්පසු රෝගියා බැලීමට අපට අවසර දුන්නාය. එහෙත් දින කිහිපයක් සිහි නැතිව සිටි රෝගියාගේ තත්ත්වය තවමත් අසාධ්‍ය නිසා ප්‍රශ්න කිරීම මිනිත්තු කිහිපයකින් අවසන් කළයුතු බැව් ඇය මතක් කළාය.

හියුබර්ට් ක්ලිෆර්ඩ් ඇත්තෙන්ම සිටියේ බරපතල තත්ත්වයේ බව බැලූබැල්මට පෙනිණ. ඔහුගේ වම් අතේ කෙළ පහළ අස්ථි, ඉල ඇට කිහිපයක්, හිස් කබලේ වම් පැත්තේ අස්ථිය, නාසික අස්ථිය, උඩු හනුවේ අස්ථි, යටි හනුව ආදී සෑම අස්ථියක්ම කැබලිවලට කැඩී තිබූ බැව් ඇඳ ඉහළපුවරුවේ සටහන්ව තිබිණ. හළලේ ඇතිවූ තුවාලයෙන් ගැලූ රුධිරයෙන් මුහුණේ වම්පස ඉදිමී, වම් ඇස පියවී තිබිණ. සිරුර පුරා තිබූ බරපතල තුවාළ අනුව, මොහු දිවි ගළවාගෙන තිබීම පුදුමයක් බව ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස මට වැටහිණ. අප එතැනට පැමිණෙද්දී විවෘතව තිබූ ඇස කරකවමින් අප දෙස බැලුවේය.

"ඔහුට සිහිය ඇවිත් වුණත්, මං හිතන්නේ නෑ කථාකරන්න පුළුවන් ඇති කියල. මොහුගෙන් ලබාගන්න තොරතුරු අපට ඉතාම වැදගත්" කී හෝම්ස් තම සටහන් පොත අතට ගත්තේය. ඊළඟට එය තම අතින් අල්ලාගෙන, ක්ලිෆර්ඩ් අතට පැන්සලයක් දී තමා අසන ප්‍රශ්න වලට පිළිතුරු ලියන ලෙස සංඥා කළේය.

"හියු ක්ලිෆර්ඩ්" රෝගියාගේ කනට ළංවූ හෝම්ස් කථා කළේ තරමක් උස් හඬිනි. "මං දන්නවා. ඔබට කවුරුහරි පහරදුන්නා. අපි ආවේ ඒක ගැන හොයන්න. අපි ඔවුන් අල්ලාගෙන දඬුවම් කළ යුතුයි. කවුද උන්?"

ක්ලිෆර්ඩ් නිහඬව මඳ වේලාවක් අප දෙස් බලා සිටියේය. ඒ ඔහුට කිසිවක් තේරුම් ගැනීමට අපහසු වූවාක් මෙනි. හෝම්ස් තම ප්‍රශ්නය නැවත වරක් ඉදිරිපත් කළේය. එයින් රෝගියා සැහීමට පත්වූ බව පෙනිණ.

"කර්නල් සහ ඔහුගේ කල්ලිය" රෝගියා ඉතා අපහසුවෙන් වුවත් සටහන් පොතේ ලීවේ දැඩි උවමනාවකිනි.

"කර්නල්ගේ නම මොකක්ද? කවුද ඒ කල්ලියේ අනෙක් අයගේ නම්?"



www.sinhalaelibrary.com

"කර්නල් කිව්වට තමන් දන්නෙ නෑ. අනෙක් අය- විටගිල්ඩ්, ෆර්ගියුසන්, රිච්ඩ්ස් සහ තවත් අය."

"දුම්රිය සමාගමෙන් මේ වැඩේට හවුල් අය කවුද කියල මං දන්නවා." හෝම්ස් කීය. "නමුත් මං කැමැතියි ඔබගෙන්ම අහල දැනගන්න."

"ජේම්ස් බ්ලැන්ඩ් මහත්තයා." සටහන් පොතේ ලියවිණි. හෝම්ස් මා වෙත හෙළුවේ ජයග්‍රාහී බැල්මකි.

"ඇයි ඔවුන් ඔබට පහරදුන්නේ?"

"වැඩේ හරියට කළොත් මට පවුම් 250ක් දෙන්න උන් පොරොන්දු වුණා. ඒ වුණාට මට ලැබුණේ මුලින් දුන්නු පවුම් 50යි, පස්සේ දුන්නු 50යි විතරයි. මං ඉතුරු සල්ලි ඉල්ලුවාම, මාව තැබෑරුමෙන් එළියට ගෙනිච්චාගෙන පහරදුන්නා."

වේදනාව නිසාදෝ ක්ලිෆර්ඩ්ගේ අත් අකුරු ක්‍රමයෙන් අපැහැදිලි වෙමින යන බැව් මම දුටුවෙමි. එහෙත් තමාට හිරිහැර කළ අයට අඩුවම් ලබාදීමට ඔහුට දැඩි වුවමනාවක් තිබූ බැව්පෙනිණි.

"කොහේදිද පහර දුන්නේ?"

"තැබෑරුමෙන් එළියේ. දුම්රිය සාලෙට පිටුපස."

"මොකක්ද ඔබට භාරවුණු රාජකාරිය?"

එයට පිළිතුරු ලිවීමට ක්ලිෆර්ඩ් තරමක මැලිකමක් පෙන්විය. එවිට හෝම්ස් ඔහුගේ කනට ලංවී යමක් කීවේය. එයට පසු යළිත් තමා දන්නා දේ හෙළිකිරීමට රෝගියා එකඟ වූ බැව් පෙනිණි.

"මොකක්ද රාජකාරිය?" හෝම්ස් යළිත් ඇසීය.

"පාර හදන්න මිනිසුන් සොයාගැනීම. ඔවුනට උවමනා දේවල් ලබාගතහැකි තැන් පෙන්වීම."

"වෙන මොනවද?"

"ඔවුනට කෑමබීම සහ නවාතැන් සැපයීම."

"මේ වැඩේට ඔබට උදව් කළ යාළුවො කවුද?"

"ජෙනිංස් සහ ඇට්වුඩ්."

"කෝ දැන් ඔවුන්?"

"බෙවර්ලි වල ඇති."

මෙතෙක් හෝම්ස් ඉදිරිපත් කළ ප්‍රශ්න වලට රෝගියා පිළිතුරු ලීවේ ඉතා අපහසුවෙනි. එහෙත් මගේ මිත්‍රයාට උදව්කිරීමට රෝගියා තුළ දැඩි අදිටනක් ඇතිබැව් මම වටහාගතිමි. හෝම්ස්ගේ





ප්‍රශ්න අවසන් වූ බව දුටු ක්ලිෆර්ඩ් තවත් යමක් ලිවීමට අවශ්‍ය බවට සංඥා කළේය.

"ඔවුන් අල්ලාගෙන දඬුවම් කරන බවට මට පොරොන්දු වෙන්න."

රෝගියාගේ දකුණු අත තම දෑතින්ම අල්ලා ගත් හෝම්ස්, එය ඉටුකරන බවට පොරොන්දු විය. හෙදියට ස්තුතිකොට අපි වහාම එතැනින් ඉවත්වී ගියෙමු.

"මට නම් මොකක්වත් අගක් මුලක් පේරුම් ගන්න බෑ හෝම්ස්" මා කීවේ කුලීරියක් අල්ලා ගැනීමට, මහාමාර්ගයට පිවිසෙද්දීය. "ක්ලිෆර්ඩ්ට පහරදෙන එකට ජේම්ස් බ්ලැන්ඩ් කොහොමද සම්බන්ධ වුණේ?" මගේ මිත්‍රයාට එය ඇසුණු බවක්වත් නොපෙනිණි.

"අපට ප්‍රමාද වෙන්න වෙලාවක් නෑ", ඔහු කීය. "දැනටමත් අපි ප්‍රමාද වැඩිද කියලත් මට හිතෙනවා. අපි වහාම බෙවර්ලි බලා යායුතුයි."

ලිවර්පූල් දුම්රිය ස්ථානය වෙත අපි එමින් සිටියෙමු. එදිනට රාජකාරි අවසන් කොට පිටවී ඇමට සූදානමින් ජේම්ස් බ්ලැන්ඩ් හා පොටර් හුඩ් මහත්වරු කාර්යාලය වෙත ඇවිද එනු අපි දුටුවෙමු. මගේ අතින් දැඩිව අල්ලා ගත් හෝම්ස් ඉතා කෙඳිරිලි හඬින් යමක් කීවේ එය රහසක් බව හඟවමිනි.

"මතක තියාගන්න වොට්සන්, ඔවුන් අහන, කියන එකම දේකටවත්, ඔබ වචනයක් හෝ කියන්න එපා!"

දෙදෙනාම සිනාමුසු මුහුණින් අපට ආචාර කළහ.

"ආයුබෝවන් ෂර්ලොක් හෝම්ස් මහත්මයා" බ්ලැන්ඩ් කීය. "කොහොමද ඔබ පරීක්ෂණ කටයුතු වල ලැබූ සාර්ථකත්වය? අපේ විශේෂ දුම්රිය ගැන අලුත් ආරංචි මොකුත්ම නැද්ද?"

"මේක නම් කොහොමටවත් විසඳන්න බැරි සංකීර්ණ ගැටලුවක්" හෝම්ස් කීය. "මහත්මයා, මේක විසඳන අදහස මං අත්හැර දැම්මා. අපි දෙන්නා මේ ලන්ඩනයට යන්නයි හදන්නේ."

"හැබෑට?" බ්ලැන්ඩ් ඇසුවේ මවිතයට පත්වෙමිනි. "මටත් හිතුණා, මේක කිසිම කෙනෙකුට විසඳන්න බැරි එකක් කියලා. තව මිනිත්තු දහයකින් ලන්ඩනයට යන ශීඝ්‍රගාමී දුම්රියක් තියෙනවා. ඉක්මන් කළොත් ඔබට ඒකේ යන්න හැකිවේවි." ඔවුහු අපෙන් සමුගෙන තම අශ්වකරත්ත නවතා තිබූ රියගාල වෙත ගියහ.



www.sinhalaelibrary.com

ප්‍රවේශ පත්‍ර කවුළුව වෙත ඇදුණු හෝම්ස්, ලන්ඩනයට ප්‍රවේශ පත්‍ර දෙකක් ඉල්ලුවේ, අවට සිටි කාටත් ඇසෙන තරම් උස්හඬිනි. දුම්රියට නැගුණු පසුත් ඔහු ඈත ආකාශය දෙස බලාගෙන කල්පනා කරමින් සිටියා මිස, මා හා කිසිවක් කීමට උනන්දු නොවීය. අපේ දුම්රිය කෙන්යොන් දුම්රිය පොළ වෙත පැමිණි වහාම හෝම්ස්, නිදාසිට අවදිවූවෙකු මෙන් කලබල විය.

"බහිමු, බහිමු වොට්සන්. තව ටිකෙන් හරි වැඩේ නමයි. මෙහේ තියෙන අපේ ඇඳුම් ඇළඳුම් ඩ්‍රේගන් හෝටලයේ නේද? ඒවත් අරගෙන ඊළඟ දුම්රියෙන් ලන්ඩන් යමු."

අප හෝටලය වෙත එද්දී රහස්පරීක්ෂක ශ්‍රෙග්සන් හෝටලය වෙත පැමිණ අප එනතුරු බලා සිටියේය.

"මං ඇවිත් පැය දෙකක් වුණා හෝම්ස් මහත්මයා" ශ්‍රෙග්සන් කීය. "ඔබ කොහේද ගියේ? මොනවද ඔබට අලුතෙන් දැනගන්න ලැබුණේ?"

"මේ පැටළුණු නූල් බෝලේ, ඉතින් ලිහී ගිය කෙළවරක් මට අහුවුණා ශ්‍රෙග්සන්" හෝම්ස් කීවේ හෝටලයේ ආලින්දයේ අසුන් ගනිමිනි. "නමුත් අවුල් ලිහාගන්න එතැනින් හැකිවේද කියල මට තවමත් විශ්වාසයක් නෑ. නමුත් මට හිතෙනවා හෙට උදේ දහය වෙනකොට, ප්‍රයෝජනවත් හෝඩුවාවන් කීපයක් ඔබට ලබාදෙන්න හැකිවේවි කියලා. මගේ හිතේ යම්කිසි ආකාරයක කල්පිතයක් ගොඩ නැංවෙමින් තියෙන්නෙ. ඒක කොයිතරම් සාර්ථකද කියල, මට තවමත් කියන්න අමාරුයි."

"හෝම්ස් මහත්මයා. ඔබ හිතන්නේ කවුරුහරි විශේෂ දුම්රිය හංගාගෙන ඉන්නවා කියලද? කප්පම් ගැනීමේ හෝ එවැනි ඒවටනික අරමුණකින්?"

"දුම්රිය සඟවා ඇතිබව නිවැරදියි. ඒත් කප්පම් ගැනීමේ අරමුණෙන් කියල කියන්න අමාරුයි" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"ඒක හරි පුදුමාකාර වැඩක්" ශ්‍රෙග්සන් කීය. "මේ තරම් සෝදිසි කරලත් කාගේවත් ඇහැට නොපෙනෙන විදියට කොහේද හැංගුවෙ? අනික ඒ මොන අරමුණකින්ද?"

"අද මුළු දවසම මහන්සිවුණා ශ්‍රෙග්සන්" හෝම්ස් කීය. "රෑ කෑම අපි කල්තියා කාල ඉඳිමු. කෑමෙන් පස්සේ මං බෙවර්ලි වලට දුවලා එන්නම්. එනකොට මට හැකිවේවි ඔබේ ඔය ප්‍රශ්න වලට පිළිතුරු දෙන්න."





රෑ කෑම ගෙන අවසන් කළ මගේ මිතුරා රාත්‍රි හතයි තිහ වෙද්දී, යළි පිටවී ගියේය. යම්කිසි හෝඩුවාවක් ලැබුණු විට එය පසුපස එළවායාමට ඔහුගේ තිබුණේ නොඉවසිල්ලකි. ගොදුරක් පසුපස හඹායන සුනඛයෙකු මෙන් හෝඩුවාවක් පිටුපස ඔහු හඹාගියේ විඩාපත්වීමකින් නොවේය.

හෝම්ස් ආපසු එනතුරු ශ්‍රෙග්සන් සහ මම හෝටලයේ විසිත්ත කාමරයට වී බලාසිටියෙමු.

"මම ලන්ඩනයට ගිහිං ස්කොට්ලන්ඩ්යාඩ් එකට ගියා විතරයි තවත් වැඩක් මට පැවරුණා" ශ්‍රෙග්සන් කීවේ තම කෝප්පයට පෝච්චියෙන් කෝපි වත්කරගනිමිනි.

"ඒ මොකක්ද?"

"දින 20කට කලින් සෙන්ට් ඇල්බන්ස් පැත්තේ ජීවත්වුණු යුදෙව් ජාතික මුදල් පොලියට දෙන්මෙකුත් අතුරුදන්වෙලා. කිසිම හෝඩුවාවක් තිබුණේ නෑ."

"ඉතින්?"

"මට හැකිවුණා ඔහුගේ මළසිරුර හොයාගන්න. ඒක මිනීමැරුමක්" ශ්‍රෙග්සන් කීය. "ලෙස්ට්‍රේඩ්ටයි මේ පරීක්ෂණය භාරදීල තිබුණේ. ඔහු අසනීපෙන් නිසා මං භාරගත්තා. දැන්මට ඒක ගැනත් මහන්සිවෙන්න වෙනවා."

එදා මැදියම් රැය ළංවෙනතුරු අප බලාසිටියත්, මගේ මිතුරා ආපසු පැමිණියේ නැත. එහෙයින් අපි නින්දට යාමට තීරණය කළෙමු.

පසුවදා උදේ අටටත් පෙර හෝම්ස් මා අවදිකළේ මා පුදුමයට පත්කරමිනි. ඒ වනවිටත් ඔහු බැහැරයාමට සූදානමින් ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී සිටියේය.

"ඉක්මන් කරල සූදානම් වෙන්න වොට්සන්" ඔහු කීය. "අද අපට වැඩකටයුතු රාශියක් තියෙනවා. අද අපේ උදව්වට තවත් මිත්‍රයෙකුත් එකතුවෙනවා."

"ඒ කවුද?"

"ඔහු මේ හෝටලයේම නැවතී ඉන්න කෙනෙක්. හමුවුණාම මං ඔහුව හඳුන්වා දෙන්නම්."

උදෑසන ආහාරය ගෙන, හෝටලයෙන් පිටවී යාමට සූදානම්ව හෝම්ස් අප කැඳවාගෙන ගියේ හෝටලයේ ඉහළම මාලයේ ඇති



www.sinhalaelibrary.com

කෙළවරකටයි. හෝම්ස් එහි දොරට යම් සංඥාවක ආකාරයට කිහිපවරක් තට්ටු කළේය. මඳවේලාවකට පසු දොර පියන ස්වල්පයකින් විවෘත විය. ඇතුළේ සිටි පුද්ගලයා දොර විවරයට ඇස තබා සුපරීක්ෂාකාරීව බලාසිටියේ දොර වැසීමට සූදානමෙනි.

"ජෙනිංස් මහත්මයා. මං ෂර්ලොක් හෝම්ස්. මේ මගේ මිත්‍රයෝ."

ඉන්පසු දොර විවෘත කළ අමුත්තා, අප ඇතුළට ගෙන යළිත් දොරවසා එය අගුළු දැම්මේය.

"මේ මගේ මිත්‍රයින් ජෝසෆ් වොට්සන් සහ ටෝබියස් ග්‍රෙග්සන්" හෝම්ස් අප හඳුන්වා දුන්නේය. "මේ මං ඔබට කිව් මිත්‍රයා. ග්‍රේට් වෙස්ටන් දුම්රිය සමාගමේ සේවය කළ අයිවර් ජෙනිංස්."

සුදුමැලි මුහුණක් තිබූ ජෙනිංස් මහතා අප දෙස හෙළුවේ, සැකය මුසු භීතියට පත් බැල්මකි. වයස අවුරුදු පනහක් පමණ වූ ඔහුගේ ගිරා හොටක් මෙන් වූ නාසයක් සහිත මුහුණෙන් ද, උස සිරුරෙන් ද දිස්වූයේ හමකරුවෙකුගේ පෙනුමකි. දකුණු අතේ පිටපැත්තේ කිණිස්සක එතුණු සර්පයෙකුගේ රූපයක් ද, වම් අතේ මාළුවෙකුගේ රූපයක් ද පච්ච කොටා තිබිණි. තද කළු පැහැති කොණ්ඩය හා මුහුණ පුරා වැඩුණු කළු රැවුළ, වෙඩිතා හැඩවත් අළුදින, බොරු කොණ්ඩයක් හා බොරු රැවුළක් දැයි මගේ සිතේ සැකයක් ඇතිවිය. හෝම්ස්ගේ ඉල්ලීම පරිදි ඔහු කාමරයෙන් එළියට ආවේ, බරාඳය දෙපස විමසිල්ලෙන් පරීක්ෂා කළ පසුයි.

අපි ඉක්මනින් හෝටලයෙන් එළියට පැමිණ අශ්වරථ ගාල වෙත ගියෙමු. අශ්වයින් දෙදෙනෙකු බැඳි ලොකු අශ්වකරත්තයක් අප වෙනුවෙන් සූදානමින් තිබිණි. රියැදුරාට රන්පවුමක් දුන් හෝම්ස්, සවස් වරුවේ හෝටලයට පැමිණ තමා හමුවන මෙන් නියම කොට, ඔහු පිටත්කර හැරියේය. හෝම්ස් කලින් කර තිබූ දැනුම්දීම අනුව අශ්වකරත්තය පැදවීම ග්‍රෙග්සන් භාරගත්තේය.

"අශ්වකරත්තය ගෙනයායුතු පාර, මේ ජෙනිංස් මහත්මයා ඔබට කියාවි" මගේ මිත්‍රයා පැවසුවේ කරත්තය හෝටලයේ ගේට්ටුවෙන් එළියට පිවිසෙද්දීය. "අපට මේ සඳහා යොදාගන්න වෙන්නේ අප්‍රසිද්ධ කැලෑ පාරක්. අපි දැන් යන්නේ කෙන්යොන් හා බාටන් මොස් අතර පිහිටි බෝර්ලි වෙතට. මේ පාර තාර නොදැමූ, පටු,





වළගොඩැලි සහිත එකක්. මං මේ පාර යොදාගත්තේ මගේ හිතවත් ජෙනිංස් මහත්මයාගේ ඉල්ලීම නිසයි."

අප ගමන්ගත් පාර ඇත්තෙන්ම ඉතා අයහපත් එකක් විය. කරත්තය පැදවීමට සිදුවූයේ ඉතා සෙමිනි. පාර දෙපසම අඩි හයක් හතක් උසට ලඳු කැලෑ පිහිටා තිබිණ. කලින්දා පැවැති වර්ෂාව නිසා, ගුරුපාරේ සමහර තැන්වල වතුර එකතුවී නොගැඹුරු මඩවළවල් ද දැකිය හැකි විය.

ජෙනිංස් මහතාගේ මඟ පෙන්වීම අනුව පැයකට ආසන්න කාලයක්, වන ලැහැබ් මැදින් පැමිණි ගමන, අවසන් වූයේ ප්‍රධාන දුම්රිය මාර්ගය අසලිනි.

"මහත්වරුනි" හෝම්ස් ප්‍රීතිමත් හඬකින් කීය. "දැන් අප ඉදිරියේ මේ තියෙන්නේ ලන්ඩන් සිට ලිවර්පූල් දක්වා වැටුණු බටහිර වෙරළබඩ ප්‍රධාන දුම්රිය මාර්ගය. දැන් අපි ඉන්නේ කෙන්යොන් හා බාටන් මොස් අතර බෝර්ලි නම් ග්‍රාමාන්තයේ. වෙනත් වචනවලින් කියනවානම්, විශේෂ දුම්රිය අතුරුදන් වූ අඩවියේ. වොට්සන් ඔබේ ඔරලෝසුවේ වෙලාව හරියටම කීයද?"

"නවයයි දහ හතරයි."

"හරියටම හරි" තමාගේ ඔරලෝසුව පරීක්ෂා කළ ග්‍රෙග්සන් කීය.

"හොඳයි. තව මිනිත්තුවකින් නැත්නම් දෙකකින් ලන්ඩනයේ සිට ලිවර්පූල් බලා යන තැපැල් දුම්රිය මෙතැන පසුකර යාවි. ඒක යනතුරු අපි අශ්වකරත්තය ඇතුළට වෙලා ඉවසීමෙන් බලා ඉඳිමු."

මිනිත්තු හතරක් ගතවෙද්දී එම දුම්රිය නළාව හඬවමින් වේගයෙන් අප සිටි තැන පසුකර ගියේය.

"හරි දැන් එන්න" හෝම්ස් කීවේ අශ්වකරත්තයෙන් බිමට බසිමිනි. අප සිටි පාළු අඩවියේ ගී කියමින් ගස්වල ගැවසුණු කුරුල්ලන් මිස, මිනිස් සේයාවක් වත් දක්නට නොලැබිණි.

"අපි දැන් රේල් පාර දිගේ ලන්ඩනය දෙසට ගමන් කරමු." කී හෝම්ස්, ජෙනිංස් මහතාට පෙරමුණ ගන්නා මෙන් ඉල්ලා සිටියේය. "කරුණාකරලා රේල්පීලි දෙක හා එය සවිකර ඇති සිල්පර කොට ගැන අවධානයෙන් ඉදිරියට යන්න."

පියවර විස්සක් පමණ ඉදිරියට ගිය පසු අපට, රේල්පාරේ වම්පසින් යම් වෙනසක් දක්නට ලැබිණි. පාර අයිනේ විශාල පඳුරු නොතිබූ අඩි දොළහක් පමණ පෙදෙසකි ඒ. එහි අත්හැර දැමූ රේල්පාරක සලකුණු අපි දුටුවෙමු.

"ඔබට පෙනෙනවාද කැලෑව වැවී ඇති රේල්පාර? මේ තමයි හීරෝ ගල් අඟුරු ආකරය වෙත දමා තිබූ මාර්ගය. අවුරුදු පහකට කලින් හීරෝ පතලේ වැඩකටයුතු නැවැත්තුවාට පස්සේ මේ රේල් පාර අත්හැර දැමුණා." කී හෝම්ස් මෙතෙක් දල්වාගෙන සිටි පයිප්පය නිවා සාක්කුවේ දමාගත්තේය.

"දැන් මම කියන මෙන්න මේ කරුණ හොඳින් පරීක්ෂාකර බලන්න මහත්වරුනි." හෝම්ස් කීවේ හීරෝ පතල දෙසට වැටී තිබුණු දුම්රිය පාරට අතුඳිගු කරමිනි.

"ඒ රේල් පාර, මේ ප්‍රධාන පාරට සම්බන්ධ කර තිබූ පළමුවැනි රේල් පීලි දෙක සහ ඊට අදාල 'ෆිෂ් ප්ලේට්' නම් තහඩු ඉවත්කර ඇති බව ඔබට පෙනෙනවා ඇති. ඒ වගේම කලින් තිබූ සිල්පර කොට එලෙසම තියෙන හැටිත්, ඒවා මත පෙඳ සෙවෙල් හා කුඩා පැළෑටි වැවී ඇති හැටි බලන්න" හෝම්ස් කථාකළේ මහාචාර්යවරයෙකු තම සිසුන් අමතා දේශනයක් පවත්වන විලසිනි.

"ඊළඟට ඔබ හීරෝ මාර්ගයේ වාගේ රේල්පීලි පරීක්ෂා කර බලන්න. ඒ පීලි සම්පූර්ණයෙන්ම මලකාලා. අවුරුදු පහකින් රෝදයක් ඒ මත ගමන් කර නැහැ. ඒ නිසා මලකඩ තට්ටුවක් බැඳිලා. ඒක හොඳින් නිරීක්ෂණය කළයුතු දෙයක්. ඊළඟට මේ සිල්පර කොට මතත්, ඒ අතරත්, රේල්පීලි අසලත් කුඩා පැළෑටි සාරවත්ව වැඩී ඇති හැටි දුටුවාද?

දැන් අපි යළිත් ප්‍රධාන මාර්ගයට යමු. ඔබට පෙනෙනවා ඇති, නිතර ගමන් කරන දුම්රියවල රෝදවලට කැපීම නිසා, මේ රේල් පීලි උදැසන හිරු එළියෙන් බබලන හැටි."

අපි තවත් යාර හැට හැත්තෑවක් ඉදිරියට ගියෙමු. මීළඟට මඟ දෙපසවූ ලඳු කැලෑව නොමැති වූයේ දකුණු පසිනි. එතැනද පැරණි රේල්පාරක් තිබූ බව අපට දැකගත හැකි විය.

"මේ පාර මොකක්ද ජෙනිංස්?"

"මේක තමා හාට්සීස් ගල්අඟුරු ආකරය වෙත තිබෙන රේල්පාර."

"මේ හාට්සීස් පතල වසාදමල කොයිතරම් කාලයක් වෙනවද?"

"අවුරුදු දහයක් නැත්නම් ඊටත් වැඩි ඇති."

"මහත්වරුනි. ඔබ දුටුවා, අවුරුදු පහකින් දුම්රියක් ගමන් නොකළ මාර්ගයේ රේල් පීලි වල තත්ත්වය. එහෙනම් බලමු අවුරුදු





දහයක් දුම්රියක් ගමන් නොකළ රේල්පීලි වල හැටි" එසේ කියූ හෝම්ස් අපදෙස බලාසිටියේ විජ්ජාවක් පෙන්වීමට සූදානම් ඉන්ද්‍රජාලිකයෙකු විලසිනි.

පුදුමයකි! හාට්සීස් රේල් පාරේ මේ රේල්පීලි මත මලකඩ තට්ටුව කිසිවෙකු විසින් පිරිසිදු කිරීමෙ තැත් කළ අයුරක් දිස්විය. සමහර තැන්වල සියුම් මල පටලය එලෙසම තිබූ අතර, සමහර තැන් තදින් කැපී ගොස්, රිදී පාටින් දීප්තිමත්ව දිස්විණි.

"දෙයියෝ සාක්කි! නිසැකවම මේ පාරේ ඊයේ පෙරේදා දුම්රියක් ගමන් කරලා."

මෙපමණ වේලා නිහඬව සිටි ෆ්‍රෙග්සන්ට කියැවිණි.

"දැන් අපි බලමු මෙන්න මෙතැන" හෝම්ස් අප කැඳවූයේ හාට්සීස් මාර්ගය, ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වෙන තැන වෙතයි. "හදිසි අනතුරක් වෙලා එක වලක්වන්න, අතුරු පාරේ පළමුවැනි රේල්පීලි දෙක ඉවත් කළේ, අවුරුදු දහයකට කලින්. නමුත් දැන් මෙතැන වෙනස ඔබට පෙනෙනවාද? හීරෝ මාර්ගයේ වගේ නොමෙයි. මේ සිල්පර කොට මත තිබූ පැළෑටි ඔක්කොම පොඩිවෙලා කැඩිබිඳී ගිහින්. ඊළඟට මේ අවට සෑම තැනකම පඳුරු තැලී පොඩිවී ගොස් ඇති ආකාරය බලන්න." හෝම්ස් පෙන්වා දුන් දෙය සත්‍යයක් බව අපි පැහැදිලිවම දුටුවෙමු.

"ඊළඟට අන්න අතන තියෙනවා, අවුරුදු දහයකට පෙර ගළවා ඉවත් කළ රේල් පීලි දෙක තිබුණු තැන. රේල් පීලි වල ලාංඡනය ඉහිරී වෙද්දී වටේට තණකොළ වැවී තියෙනවා. නමුත් දැන් ඒ රේල් පීලි දෙක තිබෙන්නේ මෙන්න මේ පැත්තේ."

අපි එම රේල් පීලි දෙක පරීක්ෂා කළෙමු. ඒවායේ මතුපිට අමණක් නොව සිල්පර කොට තුළට සවිකරන තැන් ද ඇණවලට සීරී තිබිණි.

"මේ නිරීක්ෂණ වලින් ඔබට ගත හැකි නිගමනය මොකක්ද මහත්වරුනි?"

"පැත්තක තිබුණු රේල්පීලි දෙක යළිත් මෙතැනට සවිකර තිබෙනවා. ඊට පසු ඊයේ පෙරේදා මෙතැනින් දුම්රියක් ගමන් කළාට පස්සේ ආපහු රේල්පීලි ඉවත් කරලා" ෆ්‍රෙග්සන් කීවේය.

"විශිෂ්ටයි ෆ්‍රෙග්සන් මහත්මයා" හෝම්ස් කීය. "ඔන්න ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ අයත්, නිරීක්ෂණ වලින් නිගමන



www.sinhalaelibrary.com

වලට ඒමට මගේ ක්‍රම අනුගමනය කරනවා. දැන් අපි බලමු මේකෙ ගමන් කළ දුම්රියට මොකද වුණේ කියලා."

අපි සුපරීක්ෂාකාරීව හාට්සීස් ගල්අඟුරු පතල දෙසට වැටී තිබුණු පැරණි දුම්රිය මාර්ගයේ ඉදිරියට ගියෙමු. මෑතකදී දුම්රියක් එහි ගමන් කළ බවට ලකුණු, මග දිගටම පැහැදිලිව දක්නට ලැබිණි. නිරතුරුවම තිබූ රේල්පීලි වල කැඩීම් ලකුණු වලට අමතරව, සිල්පර කොට අතර වැවී තිබුණු කුඩා ගස් හා පඳුරු කැඩී බිඳී ගොස් තිබූ අයුරු අපි දුටුවෙමු. පැයක පමණ ගමනින් පසු අපි හාට්සීස් ගල් අඟුරු ආකරය වෙත ළඟාවීමු.

අප දැකීමට බලාපොරොත්තු වූයේ අත්හැර දමා තිබූ විශේෂ දුම්රිය හා එයට ඈඳුණු පෙට්ටි දෙකය. එහෙත් එවැන්නක් දක්නට නොවීය. ගල් අඟුරු පතල විවෘතවන තැන පිහිටි ආරක්ෂක වැට සහ ලෑලි වලින් තැනූ ආවරණ එලෙසින්ම විය. දුම්රියට සිදුවූයේ කුමක්ද?

"සාමාන්‍යයෙන් ගල් අඟුරු ආකරයක කට මහා යෝධ එකක්. එහි විෂ්කම්භය අඩි දහඅටක් විස්සක් පමණ වෙනවා." හෝම්ස් කීය. "මෙන්න මගේ කාචය අරගන්න වොට්සන්. දැන් බලන්න මේ යෝධ මකර කට වසන්න එකට තබා ඇණ ගැසූ ලෑලි. මුට්ටු වුණු තැන්. ඒ යකඩ ඇණ අවුරුදු කීයක් පරණද බලන්න."

එම ඇණ පරීක්ෂා කිරීමට කාචය අවශ්‍ය නොවිණි. තවමත් දිලිසෙමින් පැවැති ඒ ඇණ අවුරුදු දහයක් තබා මාස දහයක් වත් පැරණි ඒවා නොවන බව පැහැදිලිවම දුටුවෙමු. ඊට අමතරව ලෑලි සම්බන්ධ ද මෑතකදී ලී මෝලක ඉරූ ඒවා බව පහසුවෙන්ම හඳුනාගත හැකි විය. ඒ තවමත් අලුතින් ඉරූ පයින් ලෑලි වල සුවඳ හා දීප්තිමත් රෝස හා කහ මිශ්‍ර වර්ණය රැඳී තිබීම නිසයි.

"එහෙනම් ඔබ කියන්නේ විශේෂ දුම්රිය.....?" ග්‍රෙග්සන් බලාසිටියේ භීතියට පත්වූ විලසිනි.

ඔහු අදහස් කළ දෙය අවබෝධ වූ ඒ මොහොතේ, මගේ සිතේද ඇතිවූයේ දැඩි කම්පාවකි. මෙය විශ්වාස කිරීමටත් අපහසුය. අපි දෙදෙනාම දැඩි විස්මයට පත්ව හෝම්ස් දෙස බලාසිටියෙමු.

"..... ඔව් ඔබ හිතුවා හරි. කරථාල් මහත්මයා ඇතුළු පිරිස රැගත් විශේෂ දුම්රිය මුහුණ දුන්නේ එම බියකරු ඛේදජනක ඉරණමටයි!"


http://sherlockholmesinvestigations.blogspot.com



"හෝම්ස් මහත්මයා, සිදුවුණේ මොකක්ද කියන එක දැන් අපට තේරුම් ගතහැකියි" ග්‍රෙග්සන් කීවේ, අප එදා රාත්‍රී ඩර්ගන් හෝටලයේදී රාත්‍රී ආහාරය ගනිමින් සිටියදීය. "නමුත් ඒක මොන අරමුණකින් සිදුවුණු දෙයක්ද? ඊළඟට කෝ ඒ අපරාධය කළ අපරාධකාරයින්?"

"ඒ හැම දෙයක්ම මං තවමත් හරිහැටි දන්නේ නෑ" හෝම්ස් පිළිතුරු දුන්නේය. "මෙන්න මේ හරිය මං දන්නවා. ඒ ගැන මට සහතික වෙන්න පුළුවන්. කරථාල් මහත්මයා සහ ඔහුගේ මිත්‍රයා එංගලන්තයට ආවෙ මොනවා හරි වැදගත් කටයුත්තකට ප්‍රංශයට යන්න. ඔවුන් බලාපොරොත්තු වුණේ ඒ දේ බොහොම ඉක්මනින් කරන්න. නමුත් කාටහරි වුවමනා වුණා ඔවුන් විනාශකර දමන්න. මේ අයගෙන් කෙනෙක් තමයි, තවත් විශේෂ දුම්රියක් ඉල්ලාගෙන ආව හොරේස් මෝර්. ඔවුන් කල්තියා කටයුතු සූදානම් කරගෙනයි හිටියේ.

හාට්සීස් මාර්ගය පටන්ගන්න තැනම ගලවා ඉවත්කර තිබූ රේල්පීලි දෙක යළිත් ස්ථානගතකර සවි කරලා, විශේෂ දුම්රිය ඒ මාර්ගයට ගන්න, ඔවුන් සේවකයන් රැසක් යෙදෙව්වා. විශේෂ දුම්රිය අතුරු පාරේ ගමන් කළ පසුවම, අලුතෙන් සවිකළ පීලි ගළවලා, ප්‍රධාන මාර්ගය යථා තත්ත්වයට පැමිණෙව්වා. මේ කටයුතු හැම එකක්ම භාරව ක්‍රියා කළේ රෝහලේ මරණාසන්නව ඉන්න අපේ මිත්‍රයා හියුබට් ක්ලිංඩ්."

"ඇයි ඔහුට මොකක්ද වුණේ?"

"මට ඒ හරිය ග්‍රෙග්සන්ට කියන්න බැරි උණානේ. ක්ලිංඩ් කියන්නේ ලිවර්පූල්හි පළපුරුදු දුම්රිය සේවකයෙක්" රෑ කෑම අවසන් කළ හෝම්ස් පයිප්පය දල්වා ගත්තේය. "මේ කටයුත්ත සඳහා ක්ලිංඩ්ට පවුම් 250ක් ගෙවන්න අපරාධකාරයෝ පොරොන්දු වුණා. නමුත් ඔහුට ලැබුණේ පවුම් 100ක් පමණයි. පොරොන්දුවුණු මුදල නොගෙව්වොත් රහස් හෙළිකරන බවට ක්ලිංඩ් තර්ජනය කළා. ඔවුන් ක්ලිංඩ්ට හිතුණු විධියට පහර දුන්නා. ඔවුන් පැනගියේ ක්ලිංඩ් මියගියා, දැන් රහස ආරක්ෂාවේවි යන විශ්වාසයෙන්. නමුත් ඔහු මියගියේ නැහැ. ඔහුට උදව් කළ අනෙක් දෙන්නා අයිවර් ජෙනිංස් හා නිකලස් ඇට්වුඩ් බව මට ක්ලිංඩ් ගෙන් දැනගන්න ලැබුණා. ඊයේ රෑ මං ගියා බෙවර්ලි වලට.

http://sherlockholmesinvestigations.blogspot.com

www.sinhalaelibrary.com

ක්ලිෆඩ්ට අත්වුණු ඉරණම දැනගෙන ඇට්වුඩ් පැනගිහින්. තමන්ගේ ලේලියකගේ නිවසේ සැඟවී සිටි ඇට්වුඩ් ජෙනිංස් එළියට ගන්න මට හැකිවුණා. ඔහු වෙස්වළාගෙන හැංගිලා හිටියේ මරණ භයෙන්. ඇත්ත හෙළිකළොත් තමාට සමාවක් ලබාගත හැකිය කියන විශ්වාසයෙන්, දන්න දේවල් හෙළිකිරීමටත්, අපට මඟ පෙන්වීමටත් ඔහු කැමැතිවුණා."

"විශේෂ දුම්රිය වෙනත් මාර්ගයක ගෙනගිය බව ඔබ දැනගත්තේ ඔහුගෙන්ද?" මම ඇසුවෙමි.

"නැහැ වොට්සන්" හෝම්ස් කීය. "ඔවුන් හමුවෙනකොටත් මං ඒ කාරණාව දන්නවා. මං එදා පාන්දරම ව්‍යායාම පිණිස හැතැක්ම හයක් ඇවිදින්න ගිය බව ඔබට කීවා නේනාවැ. එහෙම යද්දි මම ෂකන්යොහ් සිට ඉදිරියට දිගටම රේල්පාර පරීක්ෂා කරමිනුයි ගියේ. හීරෝ පතලට යන මාර්ගයේ කිසිදු වෙනසක් වෙලා තිබුණේ නැහැ. නමුත් හාට්සීස් පතලට යන මාර්ගයේ වෙනස මගේ නිරීක්ෂණයට හසුවුණා. සිදුවෙලා තියෙන්නේ මොකක් ද කියන එක තේරුම් ගැනීම, මට අපහසුවුණේ නැහැ."

"දැන් මෙතැනින් ඉදිරියට මොකක්ද ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ලුවී කරටාල් ගැන විමසලා මං දකුණු හා මධ්‍යම ඇමරිකාවේ රටවල් කිහිපයකටම විදුලි පුවත් යැව්වා. එයින් වෙනිසියුලාවෙන් මට සතුටුදායක ආරංචියක් ලැබුණා. කරටාල් කියන්නේ එහි ප්‍රකෝටිපති ව්‍යාපාරිකයෙක් සහ බැංකු අධ්‍යක්ෂක වරයෙක්. ඔහු පැරීසියේ ව්‍යාපාරවල විශාල වශයෙන් මුදල් ආයෝජනය කළ කෙනෙක්ලු. එහි සිදුවී ඇති යම් වංචාවක් ගැන සොයා බැලීමට ඔහු ප්‍රංශයට යාමට තීරණය කළාලු. පසුගිය මැයි 19 වැනිදා ඔහු වෙනිසියුලාවෙන් පිටත්වෙලා තියෙන්නේත් ඔහුගේ සේවකයෙකු සමග."

"අපි හිතමු මේක ප්‍රංශයේ ඉන්නා අයගේ උවමනාවෙන් කළ අපරාධයක් කියලා" මම කීවෙමි. "නමුත් එහෙම දෙයක් එංගලන්තයේ සිදු කරන එක බොහොම බැරෑරුම්, දුෂ්කර වැඩක්. එහෙම කටයුත්තක් සංවිධානය කළ පුද්ගලයා පවා ඉතා දක්ෂ, අපරාධකරුවෙක් වියයුතුයි. ඔහු කවුද කියලා ඔබ හොයාගත්තද?"

"ඒ පුද්ගලයා කවුද කියනා එකට මට තවමත් සාක්ෂි නැහැ" හෝම්ස් කීය. "නමුත් ඒ පුද්ගලයා, අපරාධ ලෝකයේ නැපෝලියන්





අධිරාජ්‍යයා ලෙස මා හඳුන්වන, මහාචාර්ය මොරියාටි බව මට හොඳටම විශ්වාසයි.

හොරේස් මුවර් නමින් කරටාල්ට පසුව විශේෂ දුම්රියක් ඉල්ලාගෙන ආව පුද්ගලයාගේ හැඩ රුව, කිහිපදෙනෙක්ම විස්තර කළා. හොරේස් මුවර්ගේ හිසේ තිබූ දුඹුරු පැහැති කොණ්ඩය හා මුහුණේ වවාගෙන හිටියා කියන රැවුල, බොරු ඒවා බව මට හොඳටම විශ්වාසයි. ඒ දෙක ඉවත්කළාම, ඉතිරිවෙන හැඩරුව තුලටම ගැළපෙන්නේ කාටද දන්නවද? ප්‍රින්ස්ටවුන් බන්ධනාගාරයෙන් මාස දෙකකට උඩදී පැනගිය කර්නල් සෙබස්ටියන් මොරාන්ට. මොරියාටිගේ දකුණු අත වගේ ඉන්නා කර්නල් මොරාන්, මේ අපරාධයට සම්බන්ධ නැත්නම් ඒක තමා පුදුමෙ."

"ජේම්ස් බ්ලැන්ඩ් මේකට සම්බන්ධ වෙන්නෙ කොහොමද හෝම්ස්?" මම ඇසීමි.

"පළමුවැනි දවසේ අපි ලිවර්පූල්හි කරුණු විමසලා ආපහු ලන්ඩනයට ආවනේ" හෝම්ස් කීය. "එදා මම දුම්රිය මූලස්ථානයට ගියා. ලිවර්පූල් සහ මැංචෙස්ටර් අතර ඉන්නා දුම්රිය නිලධරයන්ගේ අතීත වතගොත මං විමසා බැලුවා. දුම්රිය අධිකාරී ජේම්ස් බ්ලැන්ඩ්ට තියෙනවා අලංකාර ලිපිගොනුවක්. දැනට අවුරුදු පහළොවකට පමණ ඉහත, ඔහු දුම්රිය ස්ථානාධිපතිවරයෙක් ලෙස සේවය කරල තියෙනවා. ඒ කාලයේ ඔහු සමග එකට හිටි තවත් ස්ථානාධිපති වරයෙකුගේ නම මට දකින්න ලැබුණා. ඒ තමයි වෝල්ටර් සයිරස් මොරියාටි. කවුද මේ පුද්ගලයා? මහාචාර්ය ජේම්ස් මොරියාටිගේ එකකුස උපන් සහෝදරයා.

මේ කාලයේ තමයි එඩිංබ්‍රෝ සිට ලන්ඩන් බලා එන රාත්‍රී තැපැල් දුම්රියක් මංකොල්ල කෑවෙ. එඩිංබ්‍රෝ ඇතුළු ස්කොට්ලන්තයේ නගර කිහිපයක, බැංකුවල තිබූ විශාල රත්රන් තොගයක්, මේ දුම්රියේ ප්‍රවාහණය කෙරුණා. එංගලන්ත මහ බැංකුවේ ස්කොට්ලන්ත බැංකුවල නිලධරයන් සහ දුම්රිය සේවයේ නිලධරයන් කිහිපදෙනෙකු ඇරෙන්න, එංගලන්තයේ කිසිකෙනෙකු දැනහිටියේ නෑ ඒ රහස. මෙක නිතිපතා සිදුකෙරුණු කටයුත්තක් නෙමෙයි. නමුත් හොරු ඒක මංකොල්ලකාල රන්පවුම් ලක්ෂයකට කිට්ටු මුදලක් හොරකම් කරගත්තා. හොරු ඒක මංකොල්ල කෑවෙ



www.sinhalaelibrary.com

ජේම්ස් බිලැන්ඩ් සේවය කළ දුම්රියපොළට හැතැක්ම කාලක් නුදුරින්. ඒ පිළිබඳ විභාගයේදී සාක්ෂි දීමට බිලැන්ඩ්ව කැඳවා තිබුණා. හොර කල්ලිය අහුවුණේ නෑ.

ඊට අවුරුදු හතරකට පස්සේ වින්චෙස්ටර් දුම්රියපොළේ මහා පරිමාණ මුදල් වංචාවක් සිද්ධවුණා. එතකොට ජේම්ස් බිලැන්ඩ් එතැන. නමුත් මේ අවස්ථා දෙකේදිම ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරන්න තරම් සාක්ෂි තිබුණේ නැහැ. ඒත් මේ සැරේ නම් ඔහුට ලෙහෙසියෙන් ගැළවෙන්න ලැබෙන්නේ නෑ. මං විශ්වාස කරනවා ග්‍රෙග්සන් ඔබේ නිලධාරියන් මේ වන විටත් ඔහුව අත්අඩංගුවට අරගෙන ඇති කියලා?"

"හෝම්ස් මහත්මයා. ඔබේ විදුලි පුවත ලැබුණු වහාම ඔවුන් ක්‍රියාත්මක වෙන්න ඇති" ග්‍රෙග්සන් පිළිතුරු දුන්නේය.

අත්අඩංගුවට ගත් ජේම්ස් බිලැන්ඩ්ගෙන් තොරතුරු රැසක්ම හෙළිකර ගැනීමට හෝම්ස් සමත් විය. ඔහු ඒ විස්තර ප්‍රංශ පොලිස් සේවයේ- සුරෙට් හි ක්ලෝඩ් කිලි මහතා වෙත ලබාදුන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රංශයේ මහත් කලබලයක් ඇතිවිය. ඒ පිළිබඳව "ලෙ ෆිගාරෝ" පුවත්පතේ පළවූ විස්තරයට ඔබේ අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි.

## "පැරිසිය ගිනිගනී!"

### මුදල් හා වාණිජ ඇමැති පොලිස් අත්අඩංගුවේ

ඊයේ දහවල් සුරෙට් - ප්‍රංශ පොලීසිය මගින් මුදල් හා වාණිජ කටයුතු ඇමැති ෂෝන් කාටියර් මහතා අත්අඩංගුවට ගනු ලැබිණ. මෑතකදී එංගලන්තයේ දුම්රියක් අතුරුදන් කොට ලුවි කරටාල් සහ ගෝමස් නම් මහත්වරු දෙදෙනා මරාදැමීමේ අපරාධයේ මූලිකයා ෂෝන් කාටියර් මහතා බැව් හෙළිවී තිබේ. එංගලන්තයේ සුප්‍රසිද්ධ අපරාධ පරීක්ෂක ෂර්ලොක් හෝම්ස් මහතා විසින් ප්‍රංශ පොලීසියට සැපයුණු තොරතුරු අනුව අපරාධකරු අත්අඩංගුවට ගැනිණ. ඒ වහාම දේශපාලන ක්ෂේත්‍රයේත් ව්‍යාපාරික ලෝකයේත් මහ කැළැඹීමක් හටගෙන තිබේ. තවත් ඇමැතිවරු දෙදෙනෙක්, බැංකු



http://sherlockholmesinvestigations.blogspot.com



අධ්‍යක්ෂකවරයෙක්, සුප්‍රකට නළුගනක් හා ඇමැති බිරිඳක් ද හෙටම අත්අඩංගුවට ගැනීමට නියමිත බව පත්‍රය මුද්‍රණයට සූදානම් වන අවස්ථාවේ උසස් පොලිස් නිලධාරියෙකුගෙන් ඒ බැව් අපට දැනගන්නට ලැබිණි.

මේ සිද්ධිය ගැන දැනට හෙළිවී ඇති තොරතුරු මෙසේයි. ෂෝන් කාටියර් නමින් මෙතෙක් කල් පෙනීසිට ඇත්තේ අන් කිසිවෙකු නොව, අවුරුදු පහළොවකට පෙර ටූලෝං බන්ධනාගාරයෙන් පලාගිය හර්බට් ද ලර්නැක් නම් කුප්‍රසිද්ධ අපරාධකරුවාය. මිනීමැරුම් ගණනකට වරදකරු වී මරණ දඬුවමට නියම වී සිටි ඔහු, මරණදඬුවමට යැවීමට කලින් දිනයේ අධි ආරක්ෂිත සිරකුටියෙන් පැනගියේය. ශල්‍යකර්මයක් මගින් මුහුණේ පෙනුම වෙනස් කරගෙන, ආදාස පැමිණ, දේශපාලන ලෝකයේ බලවතෙකු වූ ඔහු, පාතාල ලෝකයේ සිටි දරුණුම අපරාධකරුවෙකු බව, මහජනයාට තෙක ඇතුවා නිසැකය....."

"ලෙ ෆිගාරෝ" පුවත්පතේ ගැටී ෂෝන් කාටියර් ඇමැතිතුමා හෙවත් හර්බට් ද ලර්නැක් නම් අපරාධකරුවා පිළිබඳ තවත් විස්තර පළවිය. ඔහු මෑත කාලයේ කළ දේශපාලන මිනීමැරුම් රැසක් එළියට ඇදුණේ ඔහු අත්අඩංගුවට පත්වීමත් සමගයි.

අවුරුද්දක නඩු විභාගයකින් පසු ඔහුට එළිඳ මරණ දඬුවම නියමවිණි. මෙවර ඔහුට පැන යාමට කිසිදු ඉඩක් නොමැති බව දත් ලර්නැක් පාපෝච්චාරණයක් කළේය. විශේෂ දුම්රිය පිළිබඳ අභිරහස හොඳින් වටහාගැනීම සඳහා හර්බට් ද ලර්නැක් ගේ පාපෝච්චාරණය, එලෙසම ඉදිරිපත්කිරීම වඩාත් සුදුසුවේ යයි විශ්වාස කරමි.

"..... මා අතින් සිදුවූ අවසන් අපරාධය ගැනත් නොකිව්වොත් මගේ මේ පාපෝච්චාරණය අසම්පූර්ණයි."

පහුගිය කාලේ ප්‍රංශ ආණ්ඩුවට මහා අභියෝගයක් එල්ල වෙමින් තිබූ බව මම දන්නවා. මහා පරිමාණයේ මුදල් වංචා හා බැඳුණු දේශපාලන කුටපට නිසා, රට ඇතුළේ ඉහළම පෙළේ පුහුවරුන් කිහිපදෙනෙකු සම්පූර්ණයෙන්ම ඇදවැටෙන තත්ත්වයකුයි පැවතුණේ. කරටාල් මහත්මයා පැරිසියට ළඟාවුණා නම් මේ ඔක්කොම එළිවෙනවා. අපි විශාල ගණනක් හිරගෙටත් අනෙත් අය මරණීය දඬුවමටත් කල්වෙන බව අපට සක්සුදක් සේ පැහැදිලි

http://sherlockholmesinvestigations.blogspot.com

වුණා. ඒ නිසා කරටාල් ක්‍රිසිමස් ප්‍රංශයට ළඟා නොවිය යුතු බව තීරණය වුණා.

මේ කටයුත්තට අපි හොඳින් සංවිධානය වුණා. ඒ සඳහා සීමාරහිත මුදල් සම්භාරයක් අපට වෙන් කෙරුණා. කරටාල් දකුණු ඇමරිකාවෙන් පිටත්වෙන්න කලින් අපි අධිවේගී බෝට්ටුවකින් පුද්ගලයෙකු එහි යැව්වා. ඔහු කල්වේලා ඇතුව එහේ ගියා නම්, කරටාල් රැගත් නැවට කවදාවත් ලිවර්පූල් වරායට ළඟාවෙන්න ලැබෙන්නේ නෑ. නමුත් අවාසනාවක මහත! අපේ නියෝජිතයා එහෙට යද්දි කරටාල් රැගත් නැව එහෙන් පිටත්වෙලා.

අපේ කටයුත්තට අතරමගදී නොයෙක් විධියේ බාධක එල්ල විය හැකි බව අපි හොඳින් තේරුම් ගෙනයි හිටියේ. අපේ අරමුණ සාර්ථක කරගැනීමට, විකල්ප ක්‍රියා පිළිවෙත් රැසක්, අපි සූදානම් කරගත්තා. එතකොට අඩුම වශයෙන් එයින් එකක් හෝ සාර්ථක කරගන්න හැකිවෙන බව අපට විශ්වාසයි. අප සතුව තිබුණු බැරෑරුම් වගකීම අපි නිතර නිතර මතක් කරගත්තා. කරටාල් පමණක් නොවෙයි. ඔහුගේ සගයාත්, ඔවුන් ළඟ තිබූ වැදගත් ලියවිලි රාශියත් අප විසින් විනාශ කළ යුතුව තිබුණා.

කරටාල් ලන්ඩනයට ළඟාවූ පසු, ඔහුගේ ආරක්ෂාව සඳහා සාර්ථක වැඩපිළිවෙළක් සූදානම් කරගෙන ඇතිබව අපට දැනගන්න ලැබුණා. ඒ නිසා කළ යුතු හැමදෙයක්ම කරන්න, අපට තිබුණේ සීමාසහිත කාලයක්. ඒ කියන්නේ ඔහු ලිවර්පූල් වරායට පය ගැහුවාලේ පටන්, ලන්ඩනයට ළඟාවෙන අවස්ථාව දක්වා. අපි ඒකට සැලසුම් හයක් සූදානම් කරගෙනයි හිටියේ. එයින් ක්‍රියාත්මක කළ යුතු මොන එකද යන්න තීරණය වුණේ කරටාල් ගන්නා පියවරට අනුව. ඔහු ලිවර්පූල් හි නැවතුණා නම් අපි ඒකට ලෑස්තියි. ඔහු ලන්ඩනය බලා පිටත්වුණේ සාමාන්‍ය දුම්රියකද, ශීඝ්‍රගාමී දුම්රියකද, විශේෂ දුම්රියකද, ඒ හැමටකටම අපේ සූදානමක් තිබුණා.

ඔබ හිතනවා ඇති මේ හැමදෙයක්ම, මං තනියෙන් කළේ කොහොමද කියලා. මට කොහොමටවත් මට තනියෙන් කරන්න බෑ. එංගලන්තයේ දුම්රිය ගමන් ගැන මං දන්නේ මොනවාද? මට උදව්කාරයින් රැසක් සිටියා. සල්ලි වලට ගන්න පුළුවන් මිනිස්සු ලෝකයේ කොහෙත් ඉන්නවා. එංගලන්තයේ ඉන්න තීක්ෂණම බුද්ධිය ඇති පුද්ගලයෙක් මගේ සහයට ගන්න එතරම් අපහසුවුණේ



http://sherlockholmesinvestigations.blogspot.com



නැහැ. ඔහු එහේ හැමදෙයක්ම සංවිධානය කළා. බටහිර වෙරළබඩ දුම්රිය මාර්ගය ඔහු තමන්ගේ අත්ල වගේ දැනහිටියා. ඔහුගේ අණ අකුරටම පිළිපැද්ද, ඉතාම බුද්ධිමත්, ක්‍රියාශීලි සහචරයන් කල්ලියක් ඔහුට හිටියා. මේ සේවකයන් බොහොම විශ්වාස කටයුතු නිර්භය අය. විශේෂ දුම්රියට කළයුතු දේ පිළිබඳව අදහස ඔහුගේ. එය ක්‍රියාත්මක කරන සැලසුම ඔහුගේ. මාව උදව්වට ගත්තේ, ඉතා සියුම් තැන් කිහිපයක, කුඩා ගැටලු නිරාකරණය කරගැනීමට පමණයි.

දුම්රිය නිලධරයන් කිහිපදෙනෙකුම මුදලට ගැනීමට අපට හැකිවුණා. ජේම්ස් බැලැන්ටයින් එක් අයෙක්. නමුත් වැදගත්ම පුද්ගලයා මැක්ෆර්සන්. දුම්රියේ ගාඩ්වරයා. පලස පත්කිරීමට හොඳ අවස්ථාවක් තිබුණේ ඔහුට. ජයර්මන් ස්මිත්වත් අපි මුදලට ගත්තා. දුම්රියේ රියැදුරා ජෝන් ස්ලෝටර්ටත් කතාකරල බැලුවා. ඔහු මුදලට කෑදර නැති අවංක නමුත් මුරණ්ඩු කෙනෙක්. ඒ නිසා ඔහු නම්මා ගැනීමට අපි තවදුරටත් උත්සාහ කළේ නැහැ.

කරටාල් මහත්මයා ලිවර්පූල් වලින් විශේෂ දුම්රියක් ගැනීමට බොහෝ දුරට ඉඩ ඇති බව අපි දැනහිටියා. ඒ මොකද ඔහුට අප්‍රමාදව පැරිසියට ළඟාවෙන්න උවමනා වෙලා හිටියේ. ඒ වගේම තමන්ට එල්ල වී තිබුණු අවදානම ගැන, ඔහු හොඳින් දැන හිටියා. ඒ නිසයි ඔහු ගෝමස් නම මහා භයානක දාමරිකයා, තමන්ගේ ආරක්ෂකයා හැටියට අරගෙන ආවේ. ගෝමස් ළඟ කොයි වෙලෙත් ගිනිඅවි තිබුණා. ඔහු ඒවා ඕනෑම මොහොතක පාවිච්චිකරන්නත් සූදානමින් හිටියේ. කරටාල්ගේ අතිශය වැදගත් ලියකියවිලි මල්ල තිබුණේ ගෝමස් අතේ. ඒ නිසා මේ දෙදෙනා ලියවිලි මල්ල සමග විනාශ කර දැමීම අපට අත්‍යවශ්‍ය වුණා. ඔවුන් විශේෂ දුම්රියක් යොදා ගැනීමෙන් අපට වුණේ ලොකු පහසුවක්.

මගේ එංගලන්තයේ නියෝජිතයා අතිදක්ෂයෙක් බව මං ඔබට කලිනුත් කිව්වා. ඔහු ලිවර්පූල් දුම්රියපොළෙත් අනෙක් තැන් වලත් හැමදෙයක්ම, ඉතා සියුම් ලෙස සූදානම් කරලයි තිබුණේ. ඔහු ලිවර්පූල් වල රැඳී සිටිද්දී මං කෙන්යොන් වල හෝටලයක ලැගුම් ගත්තා. ඒ ඔහුගේ රහසිගත සංඥාව ලැබුණු ගමන් ක්‍රියාත්මක වෙන්න සූදානමින්. මගේ නියෝජිතයා, තමන්ගේ සේවකයෙක් හොරේස් මුවර් යන නමින් යැව්වා. ඔහුට නියමවී තිබුණේ කොහොම හරි කරටාල් ගිය දුම්රියටම නැග ගැනීමයි. නමුත්

http://sherlockholmesinvestigations.blogspot.com

තමන්ට ඇති අවදානම ගැන කල්පනාවෙන් සිටි කරටාල්, මෙක ප්‍රතික්ෂේප කළා. එතකොට මුවර් නමින් සිටි අර තැනැත්තා, වේදිකා නැති පැත්තෙන් ගිහින්, ගාඩ්වරයාගේ මැදිරියට නැගලා, ඔහු සමග දුම්රියෙන් ගමන් කළා.

මගේ මේ දක්ෂ නියෝජිතයා විසින් දුම්රිය අතුරු මාර්ගයට හැරවීමේ හැම කටයුත්තක්ම, කල්තබා තුලටම සූදානම් කරලයි තිබුණේ. දුම්රිය එන්න මිනිත්තු 20කට කලින්, ඔවුන් හාටසීස් මාර්ගයට දුම්රිය යොමුවෙන විධියට, රේල් පීලි, ෆිෂ් ප්ලේට්, රිවට්, ඔක්කොම සවිකරලා අවසන්. පරණ සිල්පර ඉතාට එහෙමම තිබුණු නිසා, ඒ වැඩේ හරිම පහසුවුණා. දුම්රිය ඒ පැත්තට ගමන් කළ බව කරටාල්ට හෝ ගෝම්ස්ට තේරුණේවත් නැහැ.

අපේ සැලැස්ම වී තිබුණේ දුම්රියේ රියැදුරු ජෝන් ස්ලේටර්ට ක්ලෝරෆෝම් අල්ලා සිහි නැතිකිරීමටයි. එය භාරව තිබුණේ එන්ජිමේ ගල් අඟුරු දමන්නා ස්මිත්ට. එයින් පසු ස්ලේටර්වත් කරටාල් සමග අතුරුදන් කිරීමටයි. නමුත් ස්මිත් මහා අදක්ෂයෙක්. ඔහු ඒ කටයුත්ත හරිහැටි කළේ නැහැ. ස්ලේටර් ස්මිත්ගේ ග්‍රහණයෙන් ගැළැවී පොරබදන්න පටන්ගත්තා. නමුත් අපේ වාසනාවකට වගේ, එසේ පොරබදනඅතරේ ස්ලේටර්, වේගයෙන් යන දුම්රියෙන් පහළට ඇදවැටුණා. එයින් ඇතිවූ තුවාල බරපතල නිසා ඔහු එවෙලේම මියයන්න ඇතිබව අප තේරුම් ගත්තා. මේ අපේ සැලැස්ම තුලටම හරිනොගිය එක් තැනක්.

කොහොම හරි විශේෂ දුම්රිය හාටසීස් අතුරු දුම්රිය මාර්ගයට ගන්න අපි සමත්වුණා. වරක් එංගලන්තයේ විශාලතම ගල් අඟුරු ආකරය වූ මෙය, අත්හැර දමලා බොහෝ කල්. මෙපමණ කලක් ගමන් නොකළ පාරක, දුම්රියක් හිටිහැටියේ ගමන් කරද්දි කෙනෙකු නුදුටුවේ කොහොමද කියල ඔබ අහයි. නමුත් ඒ පාර වැටී තිබුණේ ඝනව වැඩී තිබුණු කැලෑව මැදින්. කවුරුහරි රේල්පාර අයිනේ ඉඳල බලාගෙන හිටියා නම්, දුම්රියක් ගියබව ඔහුට දකගන්න තිබුණා. ඇත්තෙන්ම රේල්පාරේ අයිනේ කෙනෙක් හිටියා. ඒ මම.

දුම්රිය නැවැත්වූ වහාම මං එයට නැග්ගේ, ආයුධ සන්නද්ධ මගේ උදව්කරුවෙකු සමඟ. සෑහෙන කාලෙකින් අලුත්වැඩියාවක් නොකළ මේ මාර්ගයේ දුම්රිය, පීලි පැන බිමට පෙරළෙයිද කියල අපේ හිතේ භයක් තිබුණා. බාගවෙලාවට මේක මැදිරි දෙකක





සැහැල්ලු එකක් නිසා වුණා ඇති; ඒක පීලි පැන්නෙ නෑ. ගල් අඟුරු ආකරයේ කටට ළංවෙද්දී දුම්රියේ වේගය අඩුකරලා, මැක්ෆර්සන් හා අපේ අනෙක් අය දුම්රියෙන් බිමට පැනගත්තා. අන්තිමට එන්ජිමේ වේගය වැඩිකරන ලීවරය කරකවලා ස්මිත් බිමට පැනගත්තා.

ඔවුන් අසුවී ඇති උගුලෙ හැටි කරටාල් හා ඔහුගේ සගයා තේරුම් ගනිද්දි ඔවුන් ප්‍රමාද වැඩියි. මා දක්කා භීතියෙන් කම්පනයට පත් කරටාල්, කුරුසියක් අරගෙන යාච්ඤා කරනවා. ගෝම්ස් ඔහු අතේ තිබූ බෑගය අප වෙත විසිකළා. ඒ එහෙම කළාම වත් ඔවුන්ගේ ජීවිත ගළවා දේවි යන බලාපොරොත්තුවෙන්. නමුත් ප්‍රමාද වැඩියි. වේගයෙන් ඉදිරියට ගිය දුම්රිය නවත්වන්න අපට ක්‍රමයක් තිබුණේ නෑ.

ගල් අඟුරු ආකරයේ කට, මෙතෙක් කල් වසා තිබූ ලෑලි ඉවත්කර තබන්න, සේවකයින්ට උපදෙස් දීලයි තිබුණේ. අනෙක කලින් රේල්පාර තිබුණේ ආකරය අසලට පමණයි. නමුත් අපි සේවකයන් ලවා ඒක කල්තබා වෙනස් කළා. ඔවුනට අලුතෙන් සවිකිරීමට සිදුවුණේ අඩිහර රේල් පීලි හයක් පමණයි. එතකොට රේල් පාර අවසන් වුණේ මහා මකර කටක් වැනි, ගල් අඟුරු පතලේ කට ඇතුළට.

කරටාල් හා ගෝමස් දෙදෙනා ජනේලයෙන් එළියට හිස දමා බලන හැටි අප දුටුවා. ඔවුනට කෑගැසීමටවත් හැකියාවක් තිබුණේ නෑ. අන්තිමට තිබුණු බිහිසුණු ඉරණම දුටු ඔවුන්, භීතියෙන් ගල්ගැසී සිටියා.

වේගයෙන් ගිය එන්ජිමේ ඉහළ තිබූ දුම්පයිප්පය පතලේ කටේ ගැටී කැඩීගියා. ඒ සමගම එන්ජිම, හා මැදිරි සියල්ල බිහිසුණු හඬක් නංවමින් අඳුරු අගාධයට ඇද වැටුණා. තත්පර කිහිපයකින් භූමිකම්පාවකින් පොළොව දෙදරන්නාක් මෙන් කම්පනයක් අපට දැනුණා. එය අවසන්වුණේ ගෙණ පුපුරන්නාක් වැනි බිහිසුණු හඬකින්. ඒ දුම්රියේ එන්ජිම හා පෙට්ටි, ගල් අඟුරු පතලේ අඩියේ වැදුණු ශබ්දය වෙන්න ඇති. නැත්නම් එන්ජිමේ බොයිලරය පුපුරාගිය හඬ වෙන්නත් පුළුවනි. කොහොම වුණත්, සෑහෙන වෙලාවක් යන තුරු පතල් කටින් ගල්අඟුරු දුම හා වාෂ්ප පිටවුණා. පැය කාලක් පමණ පැවැති සඝන කළු වලාව සුළඟෙන් තුනී වී ගියා. ගල් අඟුරු පතල යළිත් වරක් නිහඬවුණා.

www.sinhalaelibrary.com

අපේ අරමුණ සාර්ථකව ඉටුකරගත් පසු ඉතිරිව තිබුණේ සලකුණු මකා දැමීමයි. ඒකත් සාර්ථකව කෙරුණා. ඉන්පසු අපි බොහොම දෙනෙක් පැරිසියට පැනගියා. මැක්ෆර්සන් ඇමරිකාව වෙත යවන්න සවුත්හැම්ටන් වෙත ගෙනයනු ලැබුවා. එංගලන්තයේ සිටි අපේ නියෝජිතයා මැංචෙස්ටර් වල නැවතුණා. අපි කොයිතරම් සූක්ෂම අන්දමට සෙය කළත්, සලකුණු ඔක්කොම මකාදැම්මත්, හවුරුන් හෝ අපරාධයේ සුලමුල ඉතා දක්ෂ ලෙස සොයාගෙන ඇති බවයි මට පේනියන්නේ. වැරැදි ආශ්‍රය නිසා මං වැරැදි මගකට වැටුණා. ඒ නිසා මා අතින් අපරාධ රැසක් සිදුවුණා. දැන් ඉතින් මට ගැළවීමක් නෑ. මා කළ අපරාධ වලට ජීවිතයෙන් වන්දිගෙවන්න මම දැන් සූදානම්."


http://sherlockholmesinvestigations.blogspot.com

චන්දන මෙන්ඩිස්ගේ පරිවර්තනයකි

# "පුද්ගලිකයි රහසිගතයි"




- අති විශේෂ දුම්රියේ අභිරහස
- උගා දූපතේ කළු අවහාරය
- පැටලුණු ගැටලුව
- ඇඟිලි හයේ අත
- ප්‍රංශ වීණා වාදකයා

සහ තවත් කථා

A wonderfully enjoyable collection of new Sherlock Holmes stories, published since Sir Arthur Conan Doyle laid down his pen. Identifying the gaps in the canon, presenting new and hitherto unrecorded cases..........

195/-

COVER ILLUSTRATION - BANDHULA HARISCHANDRA


ISBN 955-97776-4-5

PUBLISHED BY
WARD LOCK & COMP